Maxim Gorky
IN THE WORLD



මක්සිම් ගෝර්කි
මිනිසුන් අතර

AUTOBIOGRAPHY 2
ස්වයං චරිතාපදානය 2

RUSSIAN
CLASSICS



1868-1936

මක්සිම් ගෝර්කි

මිනිසුන් අතර

ස්වයං චරිතාපදානය ❷

මක්සිම් ගෝර්කි

මිනිසුන් අතර

අනුවාදය (රුසියන් බසින්)

දැදිගම වී. රුද්රිගු

ISBN 978-624-5937-29-5

පරිගණක සකැසුම
මාලක ලලනජීව

මුද්‍රණය සහ ප්‍රකාශනය

සී/ස. කැනොල් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

2023
ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරන ලදි

'මිනිසුන් අතර', රුසියන් මහා ගත්කරු මක්සිම් ගෝර්කිගේ (1868-1936) ජීවන චරිතය සැකෙවින් දැක්වෙන කතා තුනක දෙවැන්නයි මේ. සාමාන්‍ය මිනිසා කෙරෙහි ඉමහත් භක්තියක් දක්වන මේ තුන් ඇඳුතු ස්වයං චරිතාපදානය මිනිස් අධ්‍යාත්මයේ සුන්දරත්වය හා ශ්‍රේෂ්ඨත්වය ඔප් නංවයි.

I

මා දැන් මිනිසුන් අතරට හෙවත් සමාජයට පිවිස ජීවනෝපායෙහි යෙදෙන්නට වූයේ, නගරයේ ප්‍රධාන වීදියෙහි පිහිටා ඇති 'සපත්තු මාලිගාවෙහි' ආවතේවකම් කරන කොල්ලකු ලෙසිනි.

මගේ හාම්පුතා මිටි, වටකුරු මිනිහෙකි. ඔහුගේ මුහුණ දම් පැහැතිය, මුඛය, දත් කොළ පැහැතිය, නෙත්වල බොර පැහැති ජලය පිරී ඇතිවාක් මෙනි. ඔහු අන්ධයෙකැයි මට සිතේ, මගේ එම සැකය තහවුරු කරනු වස්, මම මුහුණ විකෘති කිරීමට පටන් ගතිමි.

"විරිත්තන්නේ නැතුව ඉඳපිය," ඔහු පහත් හඬින් නමුදු, දැඩි ලෙස පැවැසීය.

ඔහුගේ බොර පැහැති නෙත්වලින් මා දකින විට මට අපහසුවක් දැනේ. ඔහුගේ දෙනෙත් අඳ නොවන බව විශ්වාස කිරීමට මම මැළිවෙමි. මා විරිත්තන බව හාම්පුතා අනුමාන කරනවා නේද?

"මම නුඹට සැරයක් කිව්වා, විරිත්තන්න එපයි කියලා" ඔහු වඩාත් දැඩි ලෙස කිව්වේ දෙතොල් යම්තමින් සොලවමිනි.

"අත කැසීම නවත්වාපන්," ඔහුගේ අණ කිරීම මට ඇසෙයි. "නුඹ මේ නගරයේ ප්‍රධාන වීදියෙහි තියෙන උසස් වෙළඳ හලක සේවය කරනවා. එය මතක තබා ගත යුතුයි! කොල්ලා දොර ළඟ හිටගෙන ඉන්න ඕන ඉටි රූපයක් වගේ..." හාම්පුතා මට දෙසා බාන්නේ දෙතොල් නටවමිනි.

ඉටි රූපය යනු කුමක්දැයි හරි හැටි නොදන්නා මට අත් කැසීම නොකර සිටිය නොහැකිය. මගේ දෑතේ

වැළමිට දක්වා රතුවන් ලප සහ කුඩා තුවාලය. මකුණෝ මේ තුවාලවලින් හැමදාම ලේ උරා බොති.

"නුඹ ගෙදර හිටි කාලෙ මොනවා කළාද?" හාම්පුතා මගේ දෑත බලා දැඩි ලෙස ප්‍රශ්න කරයි.

මම ගෙදරදී කළ වැඩ ගැන ඔහුට විස්තර කළෙමි. ඔහු හිස වනයි. ඔහුගේ පැසුණු හිසකේ තදට ඇලී සිටින සේ පීරා ඇත. ඔහු මා අමනාපයට පත් කරමින් මෙසේ කියයි:

"ගෙවල් ගානේ ගිහින් පරණ බඩු එකතු කිරීම හිඟාකෑමටත් වැඩිය නරකයි. සොරකම් කිරීමට වඩා නරකයි."

මා පිළිතුරු දුන්නේ උඩඟුවෙන් තොරව නොවේ:

"මම සොරකම් පවා කරලා තියෙනවා."

එවිට ඔහුගේ අත් බළලකු සේ ලියන මේසය මත තබාගෙනැ බියගත් නෙතින් මා දෙස බලා මුමුනන්නට විය:

"මොනවා? හොරකම් කළාද?"

මම ඔහුට විස්තර කළෙමි.

"ආ, ඒවා බොහොම සුළු වැඩ. හැබැයි නුඹ මගේ සපත්තු හරි, සල්ලි හරි හොරකම් කළොත් නුඹව මම කොල්ලන්ගේ හිර ගෙට යවනවා..."

ඔහු එසේ කිව්වේ සන්සුන් ලෙසින් වුවද, මම බොහෝ සේ බියවූයෙමි. ඔහුට වඩාත් අකැමැති වීමි.

වෙළඳ හලේ අයිතිකරුවා හැරුණු විට, එහි යාකොව් මාමාගේ පුත් සාෂාද, දක්ෂ, ඇලෙනසුලු රතු පැහැති මිනිහකු වූ කළමනාකරුද (ප්‍රධාන වෙළඳ සේවකයාද) සේවය කළහ. සාෂා රතු දුඹුරුවන් අත් කොට කබායක්ද, පපුව පමණක් වැසෙන සුදු පැහැති සැට්ටයක් සහ කරපටියක්ද, දිග කලිසමක්ද හැඳ ආඩම්බර ලෙස හැසිරෙන්නේ, මා නොදුටු, නොදකින විටෙක මෙනි.

මා කැටුව අයිතිකරු වෙත පැමිණි සීයා, මට උදව්කරන ලෙසත්, වැඩ උගන්වන ලෙසත් සාෂාගෙන් ඉල්ලා සිටියේය. සාෂා වැදගත් ලෙස මුහුණ ඇඹුල් කරගෙන මෙසේ කීවේය.

"එයා මට කීකරු විය යුතුයි!"

මගේ හිසට අතක් තැබූ සීයා බලෙන් මගේ ගෙල නවා අවවාද කළේය:

"නුඹ සාෂාට කීකරු වෙයන්, ඔහු නුඹට වඩා වැඩිමල්, ඒ වගේම තනතුරෙන් පවා උසස්..."

සාෂා දෙනෙත් මහත් කරගෙන මට ඒත්තු ගැන්වීය.

"මතකද සීයා නුඹට කියාපු දේ!"

ඔහු පළමුවැනි දවසේ සිටම ඔහුගේ ජ්‍යෙෂ්ඨත්වයෙන් ප්‍රයෝජන ගැනීමට ඉදිරිපත් විය.

"කෂිරීන්, ඇස්ගෙඩි දොට්ට දැමීම නවත්වාපන්" අයිතිකරු සාෂාට උපදෙස් දුන්නේය.

"හොඳමයි සර්." ඔහු හිස නමා ඔහුට පිළිතුරු දුන්නේය. එහෙත්, අයිතිකරු සතුටු වූයේ නැත:

"නුඹ උඩ පනින්න එපා, සපත්තු ගන්න එන අය සිතාවි නුඹ එළුවෙක් කියලා...."

කළමනාකරුවා ගරු කටයුතු ලෙස මඳ සිනා පෑවේය. අයිතිකරුවා දෙතොල් විකෘති කැරැ ගත්තේය. දම් පැහැගත් සාෂා ලජ්ජාවෙන් සපත්තු රාක්කයට මුවාවිය. මට ඒ කතා නොරිසි විය. අයිතිකරුගේ මුවින් පිටවන බොහෝ වචන මා නොදත් හෙයින්, ඔවුන් විදෙස් බසකින් කතා කරතියි මට සිතුණු වාර අපමණය.

සපත්තු ගැනීමට කාන්තාවක් පැමිණි විට, අයිතිකරුවා දෑත් සාක්කුවෙන් ඉවතට ගෙන උඩු රැවුළ අතගාමින්, සුමිහිරි මඳ සිනාවකින් මුහුණ සරසා ගත්තේය. එවිට ඔහුගේ මුහුණේ කුඩා වක රැලි ඇති වුණද, අඳ නෙත්වල ස්වරූපය වෙනස් නොවීය. කළමනාකරුවා වැළමිටි දෙපැත්තට තද කැරැගෙන ඇඟිලි අපූරු තාලයකට නවාගෙනැ සීරුවෙන් සිටී. සාෂා, දොට්ට පැන ඇති ඔහුගේ ඇස්ගෙඩි සඟවා ගැනීමට මෙන් බියෙන් ඉගි මරයි. මම දොර අසල සිටගෙන ඔවුනට නොපෙනෙන සේ දෑත් කසමින් සපත්තු වෙළඳාමේ උත්සවය දෙස බලා සිටිමි.

කළමනාකරුවා සපත්තු ගැනුම්කාරිය ඉදිරියේ දණින් වැටී ඇගේ පාදවලට පාවහන් ඔබමින් මවිතවන ආකාරයට අතේ ඇඟිලි මෙහෙයවයි. ඔහුගේ අත් යම්තමින් වෙවුලයි. ඔහු ගැහැනියගේ පාදය යම්තමින් අල්ලන්නේ

එය බිඳෙතියි යන බියෙනි. එහෙත්, ඇගේ පාදය කට පහතට හැරවූ වක ගැසුණු බණ්ඩි බෝතලයකට සමානය.

වරක් එක් ගැහැනියක් පය ගස්සමින් මෙසේ පැවසුවාය.

"අනේ ඔයා කිති කවනවා නොවැ....."

"අනේ මිස්.... ඒ ආචාරශීලිකම් නිසා," කළමනාකාර තැන ඉක්මනින් සහ උණුසුම් ලෙස විස්තර කළේය.

වෙළඳ හලේ කළමනාකරුවා වන ඔහු ගැහැනියකගේ ඇඟට ඇලී සිටින සැටි බැලීම හිනා ගැන්වෙන දෙයකි. සිනා මැඩ ගැනීම පිණිස මම වීදුරු දොර දෙසට හැරෙමි. විකිණීමේ කලාව දෙසට මගේ නෙත් ඇදී ගියේ නිතැතින්මය. ඔහුගේ වාණිජ කලා නිපුණත්වය මගේ අතිමහත් විනෝදයට හේතු විය. ගැනුම්කරුවන්ට මෙතරම් ආචාරශීලී ලෙස කතා කිරීමටත්, දකින්නකු මවිත කරවන ආකාරයට දෑතේ ඇඟිලි මෙහෙයැවීමටත්, අනුන්ගේ පාදවලට මෙතරම් දක්ෂ ලෙස පාවහන් දැමීමටත් මම කිසිදිනක සමත් නොවන බව දැන සිටියෙමි.

නිතර පාහේ වෙළඳ හලට යාබද කුඩා කාමරයට යන අයිතිකරුවා, සාෂාටද අඬ ගසයි. එවිට කළමනාකරුවාත්, සපත්තු ගැනීමට පැමිණි ගැහැනියත් පමණක් ඉතිරි වෙති. වරක් සපත්තු ගැනීමට පැමිණි රතු කොණ්ඩකාරියකගේ පාදයක් අතින් ගත් ඔහු එයට 'තොත්තුවක්' දුන්නේය.

"ආහ්!" යැයි මිහිරි ලෙස සුසුම් ලමින් ගැහැනිය මෙසේද කිව්වායඃ "ඔයා හරිම දඟකාරයෙක් නොවැ!"

ඔහු දෙකම්මුල් පුම්බාගෙනැ මෙසේ කිව්වේය.

"ම්ම්. උහ්!"

එහිදී මට ඉබේටම සිනා ගියේය. බිම වැටෙතියි යන බිය නිසා මම දොර අල්ලා ගෙන සිනාසෙන්නට වූ විට, දොර ගැලවී මගේ හිසේ හැප්පිණි. දොරෙහි වීදුරු පළුව බිඳිණි. කළමනාකරුවා විත්, තර්ජනය කළේය. ඔහුගේ රන් පේරැස් මුදුව සහිත ඇඟිල්ලෙන් මට ටොක්කක් ඇන්නේය. ඒ අතර සාෂාද මගේ කනින් ඇදීමට උත්සාහ කළේය. සවස අප ගෙදර යද්දී, ඔහු මට දැඩි ලෙස අවවාද කිරීමට විය.

"ඔය වගේ වැඩ හන්දා නුඹව පන්නා දමාවි. ඔතන හිනාවෙන්ට තියෙන වුවමනාව මොකක්ද?"

අනතුරුව හේ විස්තර කළේය: වෙළඳ සේවකයා නෝනලාගේ සිත් දිනාගත්තා නම්, වෙළඳාම ජයට සිදු වෙනවා.

"නෝනට සපත්තු ඕන නැහැ. එයා වැඩිපුර සපත්තු කුට්ටමක් ගන්නා අතර, සිත සතුටු කරන වෙළඳ සේවකයාව ආයෙමත් හමුවෙනවා. නුඹට ඒ වගේ දෙයක් තේරුම් ගන්න බැහැ. නුඹව නළවන්න ලෙහෙසි නැහැ!"

ඔහුගේ කතාව මගේ අමනාපයට හේතු විය. විශේෂයෙන් ඔහු ප්‍රමුඛ කිසිවෙක් මා නැළවීමට ඉදිරිපත් නොවූහ.

හැමදාම උදෑසන රෝගී සහ කෝපාන්විත ගැහැනියක් වූ කුස්සි අම්මා සාෂා අවදිවීමට පැයකට කලින් මා අවදි කළාය. අයිතිකරුගේත්, කළමනාකරුගේ සහ සාෂාගේත් පාවහන් සහ කබා පිරිසිදු කිරීම මා සතු කාර්යයෙකි. අනතුරුව සියලු ළිප් සහ උදුන්වලට අවශ්‍ය දර ගෙනැවිත් සමවාරය සූදානම් කැර, දවල් බතට හැළි වළන් සුද්ද කරමි. වෙළඳ හලට විත් බිම ඇමද, දූවිලි පිසදමා, තේ සූදානම් කොටැ, සපත්තු මිලදී ගත්තන්ගේ ගෙවල්වලට ගොස් ඒවා බාරදෙමි. ඉන් අනතුරුව දවල් බත ගෙදර සිට කඩයට ගෙන එන මා, මේ වැඩ අවසන් කරන තුරු සාෂා දොර ළඟ සිටගෙනැ සේවය කළ යුතුය. එලෙස දොර අසල සිටීම ඔහුගේ තත්ත්වයට නින්දාවක් සේ සලකන ඔහු මට බැණ වදියි:

"කම්මැළියා, නුඹ වෙනුවට මම වැඩ කරනවා...."

මගේ සිතට පාළු ගතියක් සහ දුකක් දැනිණි. උදේ සිට රෑ වනතුරු වැලි සහිත කුනාවිනො වීදිවලැ ඇවිද, බොර පැහැති ඔකා නදියේ වෙරළේත්, කැලෑවලත් විනෝද වූ මම ඉස්සර ස්වාධීන ජීවිතයක් ගත කළෙමි. ආච්චිත්, මගේ සගයනුත් නැති පාළුව මට දැනිණි. කතා කිරීමට පවා කෙනෙක් නැත. ඒ අතර ජීවිතය මා කුප්පා ලූයේ, එහි අවලස්සන පැති සහ කණපිට පෙන්වාලමිනි.

බොහෝ විට කඩයට ගොඩ වදින ගැහැනියක් ආපසු ගියේ කිසිවක් මිලදී නොගනිමිනි. එවිට තිදෙන

අමනාපයට පත්වෙති. අයිතිකරු ඔහුගේ සුමිහිරි මඳ සිනාව සාක්කුවේ දමාගනිමින් කෑගසයි.

"කෂිරීන් සපත්තු අහුරපන්!"

අනතුරුව ඔහු බැණවදී:

"මදෑ ඊරියක් කඩේ ඇවිත්. ඒ මෝඩ ගෑනිට ගෙදර නැවතිලා ඉන්න බැරිලු බොහොම පාළුයිලු. ඉතින් ඒකි සාප්පු ගානේ රස්තියාදු වෙනවා. තෝ මගේ ගෑනි වුණානම්, මම තිට යස පාඩමක් උගන්වනවා..."

ඔහුගේ බිරිඳ වියළිය. ඇගේ දෙනෙත් කළුවන්ය. නැහැය විශාලය. මෙහෙකරුවකුට මෙන් ඇය ඔහුට කෑ ගසා බැණ වදිමින් පාද හප්පාලන්නට වූ සැටි මම දුටිමි.

ඔහු හඳුනන ගැහැනියක සාප්පුවේදී හමු වූ විට, ඔහු ඇයට හිස නමා හිතවත්කම දක්වන වචනවලින් සංග්‍රහ කොට, ඇය ගිය පසු ලජ්ජා රහිත ලෙස ඇයට ඉතා කැත වචනවලින් බැණ වදී. එය ඇසෙන මට එම ගැහැනිය සොයා ගොස් ඔවුහු ඇයට කියන දේ දන්වා සිටීමට සිත් විය.

මිනිසුන් නැති තැන ඔවුන් එකිනෙකා ගැන නරක දේ කියන බව මා අසා ඇතත්, මොවුන් එවැනි ගැහැනුන් ගැන ඉතා කැත විදිහට කතා කරමින් හැසුරුණේ, ලෝකයේ ජීවත් වන ඉතාම හොඳ මිනිසුන් ඔවුන් බවත්, ජගත් විනිශ්චයකින් ඔවුන් එලෙස පත්කර ඇති බවත් අඟවාලමිනි. බොහෝ දෙනෙකුට නපුරු සිතින් ඊර්ෂ්‍යා කළ ඔවුහු කිසිම කෙනෙකු ගැන හොඳක් නොකීහ. ඔවුන් හැම මිනිහකු ගැනම දැන සිටියේ නරක දෙයක් පමණකි.

වරක් අපේ සපත්තු සාප්පුවට රතුවන් කොපුල් සහ දිලිසෙන නෙත් ඇති තරුණියක් ආවාය. ඇය ඇඳ සිටියේ වෙල්වට් ගවුමකි. වටකුරු කරපටිය කළුවන් ලොමින් නිමවී තිබිණි. කරපටියට ඉහළින් ඇගේ මුහුණ පෙනෙන්නට වූයේ මවිතය දනවන කුසුමක් මෙනි. ඇගේ ගෙල ඔතා තිබුණු සත්ත්ව ලොම් මුවා 'රොතොන්දය' හෙවත් වටකුරු කරපටිය සාෂාගේ අත තැබූ විට ඇගේ ලස්සන වඩාත් වැඩි විය. ඇගේ නිල් පැහැති සැට්ටය සේද රෙද්දෙන් නිමැවී තිබිණි. ඇගේ කන්වල දිලිසෙන බෙරලියන්තු ආභරණය. ඈ

ළමා කතාවල එන ලස්සන වසිලීස්සාට සමාන යැයි මට සිතිණි. ඈ නගරයේ ආණ්ඩුකාරයාගේ භාර්යාව බව මගේ දැඩි විශ්වාසයය. සාප්පුවේ තිදෙනා ඇය පිළිගත්තේ අති මහත් ගෞරවයෙනි. ඇය ඉදිරියේ හිසත්, කඳත් නමාගෙන තිදෙන යුහුසුලු වූහ. ඉතාමත්ම ලස්සන වචනවලින් ඇයට ස්තුති කළහ. ඇය ඉදිරියේ ඉටි මෙන් උණු වී යන ඔවුහු යළි යළිත් නව රූපාකාරයන් ගත්හ.

ඒ කාන්තාව ඉක්මනින් වටිනා පාවහන් යුගලක් මිලදී ගෙන හණිකට පිටවී ගිය විට, අයිතිකරුවා කට තොල ලෙවකා, උරුවම් බාමින් මෙසේ පැවසීය:

"බැල්ලි!"

"එක වචනයකින් කියතොත් නිළියක්" කළමනාකරු කිව්වේ අවඥා සහගත ලෙසිනි.

ඉන් ඉක්බිතිව ඔවුහු එකිනෙකා අමතා ගනිමින් ගැහැනියගේ ආදරවන්තයන් ගැනත්, ඇගේ වැඩ ගැනත් කියන්නට වූහ.

දිවා ආහාරයෙන් පසු අයිතිකරුවා සාප්පුවට යාබද කාමරයට වී නිදාගත්තේය. එදින ඔහුගේ රත්තරන් ඔර්ලෝසුවේ පියන ගැලවූ මම එහි යන්ත්‍රණය තුළට ඇසිඩ්, විනාකිරි වක් කළෙමි. නින්දෙන් පසු අවදි වූ ඔහු සාක්කු ඔර්ලෝසුව අතින් ගෙන අන්දමන්දව මුමුනන්ට විය:

"මදෑ පුදුමයක හැටි? හිටි ගමන්ම, ඔර්ලෝසුවට දාඩිය දාලා. මීට ඉස්සෙල්ලා කවදාවත් නොවෙච්ච දෙයක් ඩාදිය දාලා. වැඩේ තවත් නරක් වේවිද?"

වෙළඳ හලේ කලබැගෑනිය සහ ගෙදර ඇති වැඩ ගොඩ නොතකා මට මහා පාළු ගතියක් දැනෙන්නට විය. වෙළඳ හල අයිතිකරුවා මා පන්නා දැමීම සඳහා මවිසින් කුමක් කළ යුතුදැයි මම කල්පනා කරන්නට වීමි.

හිම වැස්සකට අසු වූ මිනිසුන් අපේ සපත්තු හල අසලින් ගමන් කරන සැටි මට පෙනේ. ඔවුන් කිසිවකුගේ අවමඟුල් උත්සවයකට සහභාගි වන හැඩකි. නියම වේලාවට මිනිය සුසාන භූමියට ගෙනයාමට නොහැකි වීම නිසා ඔවුහු ඉක්මනින් පා තබති. මහ පාරේ ගොඩ ගැසී ඇති හිම ගොඩැලි පාගමින් අවමඟුල් රියේ

අශ්වයෝ ඉදිරියට ඇදෙති. සපත්තු සාප්පුවට පසු පසින් ඇති සණ්ටාර කුලුනේ සණ්ටාර පාස්කු කාලය මතක් කරවමින් හඬ නඟයි. එහි හඬ කොට්ටයකින් හිසට පහර ගසන්නාක් මෙනි. එම පහර වේදනාවක් නොදුන්නද, එය දෙකන් බිහිරි කරවයි. කෙනෙකු මුග්ධයකු බවට පත් කරයි.

වෙළඳ හලට ගෙනා බඩු පෙට්ටි මා පිරික්සමින් සිටි විට, පල්ලියේ මුරකරුවා වන කුදු මහල්ලෙක් මවෙතට ළංවිය. ඔහු කොතරම් කුදුද යත්, රෙදිවලින් තැනූ පාන්කඩ රූකඩයක් මෙනි. ඔහුගේ සිරුර බල්ලන් සපා කෑ විටෙක මෙන් වැරහැලිවලින් එතිලාය.

"කොල්ලෝ, දෙවියන්ගේ මෙහෙකරුවකු වන මා සඳහා කලෝෂි[1] කුට්ටමක් හොරකම් කරලා මට දීපන් හොඳද?" මහල්ලා යෝජනා කළේය.

මම නිහඬව සිටියෙමි. එවිට ඔහු හිස් පෙට්ටියක් මත වාඩි වී, ඈනුමක් හැර කුරුසියේ ලකුණ ඇඳගෙන යළිත් ඉල්ලා සිටියේය:

"හොරකම් කරපන්, හොඳද?"

"හොරකම් කිරීම තහනම්", මම ඔහුට කිව්වෙමි.

"ඒ වුණාට හොරකම් කරනවා නොවැ. වැඩිහිටියන්ට ගරු කරපන් ළමයා!"

මා දන්නා අඳුනන මිනිසුන්ට වඩා මේ මහල්ලා අමුතු පුද්ගලයෙක් විය. එය මගේ සතුටට හේතුවකි. මා ඔහු වෙනුවෙන් සොරකම් කිරීමට සූදානම් බව ඔහු ඉතා ස්ථිර ලෙස දැන සිටියාක් මෙනි. ඔහුට අවශ්‍ය කලෝෂි කුට්ටම ජනේලයේ ඇති කුඩා කවාටයෙන් ඔහුට දීමට මම කැමැති වුණෙමි.

"ඉතින් හොඳයි" ප්‍රීතියෙන් තොරව එහෙත්, සන්සුන්ව ඔහු පැවසීය. "නුඹ මාව රවටන්නේ නැත්ද?"

ඔව්, ඔව්, මට පේනවා නුඹ මාව රවටන්නෙ නැති බව...

ඔහු විනාඩියක් පමණ නිහඬවී, හිම සපත්තුවේ තැවරී ඇති හිම කැටි සහ කුණු පිසලමින්, මැටි දුම් කෝවයකින් දුමක් ඇද හිටි හැටියේම මා බිය ගන්වමින් කතා කළේය:

1 කලෝෂි - සපත්තුවලට උඩින් අඳින රබර් කවරයකි. අනුවාදක

"මම නුඹව රැවැට්ටුවොත්? නුඹ මට දෙන කලෝෂි කුට්ටමත් අරගෙන නුඹලෑ හාම්පුතාට එය පෙන්නලා කියනවා නුඹ මට එය කොපෙක් පනහකට විකුණුවා කියලා. එතකොට කොහොමට හිටීවිද? ඒවායේ නියම මිල රූබල් දෙකක් විතර ඇති. නුඹ සීනිබෝල කන්න ඒවා මට කොපෙක් පහකට විකුණුවා. ආ?"

මා ගොළුවකු මෙන් නිහඬව ඔහු දෙස බැලුවේ, ඔහු පොරොන්දු වූ පරිදි මා පාවාදුන්හයි සිතමිනි. ඔහු හිම සපත්තු දෙස බලමින් නහයෙන් අඬන්නාක් මෙන් ඇද-පැද කතා කළේය. ඒ අතර දුම් කෝවය උරමින් නිල්වන් දුම් ගුළි අහසට පිම්බේය.

"හොඳයි, මා නුඹ ළඟට ආවේ නුඹේ හාම්පුතා මට කිව්වා ගිහිල්ලා මේ කොල්ලා හොරෙක්ද නැත්ද කියලා පිරික්සා බලාපන් කියලා. ඉතින් මම නුඹ ළඟට ඇවිත් කලෝෂි ඉල්ලා හිටියා. ආන්න එතකොට වැඩේ කොහොමට හිටීවිද?"

"සීයේ, මම නුඹට කලෝෂි දෙන්නෙම නැහැ."

මම කෝපයෙන් කිව්වෙමි.

"දැන් ඉතින් නොදී බැහැ! නුඹ පොරොන්දු වුණා."

ඔහු මා ඔහු වෙතට ඇද ගෙන, ඔහුගේ ශීතල ඇඟිලිවලින් මගේ නළලට තට්ටු කරමින් කුසීත ලෙස කතා කළේය:

"නුඹ කිසිම වග විභාගයක් නැතුව පොරොන්දු වෙන්නෙ කොහොමද?"

"සීයාම නේද මගෙන් ඉල්ලුවේ."

"මට මොනවා ඉල්ලන්න බැරිද! මම නුඹෙන් ඉල්ලා හිටිනවා පල්ලිය බිඳලා හොරකම් කරන්නයි කියලා. ඉතින් මගේ ඉල්ලීම ඉටු කරනවද? එහෙමත් මිනිසුන් කෙරෙහි විශ්වාසයක් තියන්න පුළුවන්ද? අනේ කොල්ලෝ, නුඹ මෝඩ පැටියෙක්...."

ඔහු මා පසෙකට තල්ලු කොට නැගිට සිටියේය.

"හොරකම් කරපු කලෝෂි මට වුවමනා නැහැ. කලෝෂි දාන්න මම හාමු මහත්තයෙක් නොවෙයි. මම විහිළුවක් කළා විතරයි. නුඹේ චාම් ගති මගේ හිතට ඇල්ලුවා. පාස්කු කාලයේදී සණ්ටාර කණුවට නඟින්න මම නුඹට

අවසර දෙන්නම්. සීනු හඬවලා නගරය බැලීමට නුඹට පුළුවන් වේවි..."

"මම නගරය දන්නවා."

ඝණ්ටාර කණුවේ සිට බලන විට නගරය බොහොම ලස්සනයි..." මහල්ලා පැවසීය.

සපත්තු හිම ගොඩට ඔබමින් ඔහු දේවස්ථානය දෙසට ගමන් කරන්නට වූ අතර, ඔහු දෙස බලමින් මම බියගත් සිතින් කල්පනා කරන්නට වීමි. මහල්ලා හැබෑටම විහිළු කළාද, නැතිනම් වෙළඳ හලේ අයිතිකරුවා විසින් මා පිරික්සුමට භාජනය කිරීමට ඔහු එවන ලද්දේද? සාප්පුව තුළට යාමට පවා මම බියවීමි.

ආලින්දයට පැමිණි සාෂා මට බැණ වදින්නට විය.

"නුඹ මොන යකාට ගියාද!"

හිටි හැටියේම කෝපයට පත් මම, ඔහුට පෙට්ටිවල යකඩ ඇණ ගලවන අඬුව පෙන්වමින් තර්ජනය කළෙමි.

කළමනාකරුත්, සාෂාත් සපත්තු සොරකම් කරන බව මම දැන සිටියෙමි. අයිතිකරු නැති වෙලාවක් බලා ඔවුහු සපත්තු කුට්ටමක් පෝරනුවේ බටය තුළ සඟවති. අනතුරුව ගෙදර යන විට හිම කබායේ අතකට ඔබා එය සඟවා ගෙනගොස් විකුණයි. මෙය මා සිත් නොගත් අතර, මා බියට පත් කළේය. අයිතිකරු වරක් මට කළ තර්ජනය මට මතක් විය.

"නුඹ හොරකම් කරනවද?" මම සාෂාගෙන් ප්‍රශ්න ඇසුවෙමි.

"මම නොවෙයි, හොරකම් කරන්නෙ කළමනාකාරයා. මම ඔහුට උදව් කරනවා විතරයි. ඔහු මට කිව්වා ඔහුට උදව් කරන්නයි කියලා. මා ඔහුට කීකරු විය යුතුයි. නැතිනම් ඔහු මාව අමාරුවේ දමාවි. කළමනාකාරයා, මෑතක් වන තෙක් වෙනත් සාප්පුවක වැඩ කරපු කෙනෙක්. ඒවා ගැන අයිතිකරුවා හොඳට දන්නවා. නුඹ කාටවත් නොකියා කට වහගෙන හිටපිය!" සාෂා මට තර්ජනාත්මක ලීලාවෙන් පැවසීය.

මට තර්ජනය කරන අතර, සාෂා මූණ බලන කණ්ණාඩියෙන් තමා දෙස බලා, කළමනාකරු හෙවත් ජ්‍යෙෂ්ඨ වෙළඳ සේවකයා කරන පරිදි කෘත්‍රිම ආකාරයට

ඇඟිලි නටවා ටයිපටිය හරිගැස්සවීය. ඔහු නිතරම ඔහුගේ ජ්‍යෂ්ඨත්වය මට විඳහා පෙන්වීය. බැරැඬ් හඬින් කෑගසමින්, ඔහු මට අණ කළේ මා තල්ලු කර දැමීමට මෙන් දෑත් විදහාගෙනය. මම සාෂාට වඩා උසින් හා ශක්තියෙන් වැඩි වුවද, කෙට්ටු වීම්. ඔහු මට වඩා මහතින් වැඩිය. ඝනැතිය, තෙල් බේරෙන සමකින් යුක්ත විය. කබායක් හා පිම්බුණු කලිසමක් හැඳ සිටි ඔහු, වැදගත් ලෙස මට පෙනිණි. එහෙත්, ඒ අතරම ඔහු කෙරෙහි එක්තරා අප්‍රියජනක සහ හාස්‍ය ජනකතාවයක් පෙනෙන්න තිබිණි. ඔහු කුස්සි අම්මාට දැඩි ලෙස වෛර කළේය. ඒ ගැහැනියද පුදුම ගති ඇත්තියක් වූවාය. ඇය කරුණාවන්ත්ද, නැතිනම් දුෂ්ටද යන්න කිව නොහැකිය.

"මම වැඩියෙන්ම ආසා කරන්නේ පොරකෑම් බැලීමටයි. කුකුළු පොරකෑම්, බල්ලන්ගේ පොරකෑම් නැතිනම් පිරිමින්ගේ පොරකෑම් මොනවා වුණත් මට එකයි. ඒවා බැලීමට මම බොහොම කැමතියි." ඈ කළුවන්, උණුසුම් දෙනෙත් මහත් කැරැගෙන කිව්වාය.

හවස ගෙවත්තේ කුකුළන් නැතිනම්, පරෙවියන් පොර කෑවොත්, ඈ සියලු වැඩ නවත්වා නෙත්, සිත් යොමා ඒ දෙස බලන්නී, අන් සියලු දේ අමතක කරයි. හවස්යාමෙට ඈ මටත් සාෂාටත් මෙසේ කියයි:

"කොල්ලනේ නුඹලා මොකද 'බකන් නිලාගෙන ඉන්නේ?' පොරකාපියව්!"

එවිට සාෂා කෝපවෙයි:

"මෝඩ ගෑනියේ, මම කොල්ලෙක් නොවෙයි. දෙවැනි කළමනාකරුවා."

"ඒ ගැන මම දන්නෙ නැහැ. කසාද බැඳලා නැති නම් හැම එකෙකුවම මා පිළිගන්නෙ කොල්ලකු හැටියටයි!"

"නුඹ පල් මෝඩ ගෑනියක්...!"

"යකාට නුවණ තියෙනවා. නමුත්, දෙවියන් වහන්සේ ඌට කැමති නැහැ."

සාෂා ඇගේ කතා නිසා විශේෂයෙන්ම කිපුණේය. ඔහු ඇය කුප්පාලීය. ඈ ඔහු දෙස අවඥා සහගත ලෙස බලමින් මෙසේ කිව්වාය:

"අනේ බාං නුඹ කැරපොත්තෙක්. නුඹව මැවීමෙන්

දෙවියෝ වරදක් කළා!"

ඇය නිදා සිටින විට ඇගේ මුහුණේ සපත්තු 'පොලිෂ්' ආලේපය නැතිනම් අළු ගාන ලෙස සාෂා මගෙන් කීප වරක්ම ඉල්ලා සිටියේය. නැතිනම් ඇගේ කොට්ටයේ අල්පෙනෙත්ති ඇන තබන ලෙසත්, කිසියම් වෙනත් ආකාරයෙකින් ඇයට 'විහිළුවක්' කරන ලෙසත් කීප වරක්ම ඔහු මට කිව්වේය. එහෙත්, මම කුස්සි අම්මාට බිය වූයෙමි. ඇරත් ඇය නිදාගත්තත් නිතර අවදිවෙයි. මහ රෑ නැඟිට පහන දල්වාගෙන කිසියම් මුල්ලක් දෙස බලාගෙන සිටීමේ පුරුද්දක් ඇයට තිබිණි. සමහර දාට ඈ මා නිදා සිටින පෝරනුවේ මැස්ස ළඟට විත්, මා අවදි කොට බැරැඩි හඬින් මෙසේ ඉල්ලා සිටී:

"මට නින්දක් නැහැ, ලෙක්සේයිකා, මට බයක් දැනෙනවා. මා සමඟ කතා කරපන්."

නින්දෙන් මම ඇයට කිසියම් කතාවක් කියමි. ඈ නිහඬව මට සවන් දෙමින් හිස වනයි. ඇගේ උණුසුම් සිරුරෙන් ඉටි සහ දේවරූප ඉදිරියේ තබා ඇති පහන්වලින් නික්මෙන තෙල් සුවඳක් වහනය වෙතියි ද, ඈ ඉක්මනින් මිය යතියි ද මට සිතිණි. සමහර විට මේ දැන් ඈ මුණින් අතට වැටී මිය යනු ඇත. එම හැඟීමෙන් මම බිය වූයෙන් හඬ නඟා කතා කරන්නට වීමි. එවිට ඈ මට බාධා කරමින් මෙසේ පැවසුවාය:

"ෂ්-ෂ්! අර නීචයෝ අවදිවෙන්න පුළුවනි. එතකොට උන් හිතාවි නුඹ මගේ ආදරවන්තයා කියලා..."

ඇය මා අසලට වී වාඩි වී සිටියේ හැමදාම එකම ඉරියව්වකිනි. පිටකොන්ද නමාගෙන දෑතේ ඇඟිලි දෙදණ අතර තබාගෙන, කෙට්ටු දෙදණින් අත්ල හිර කර ගෙනය. ඇගේ පියයුරු වැඩී නැත. ඇය ඇඳ සිටින හැට්ටය විනිවිද ඇගේ ඉළ ඇට පෙනෙයි. එය වියළි පීප්පයක ලී පටි සිහියට නංවාලයි. නිහඬව සිටින ඈ හිටි හැටියේ මුමුනයි:

"අඩු ගණනේ මැරිලාවත් යනවා නම්, හිතට මහා ලොකු දුකක්..."

නැතිනම් ඈ කිසිවකුගෙන් මෙසේ ප්‍රශ්න කරයි.

"ජීවත් වුණා මදැ ඉතින්?"

"නිදා ගනින්!" මගේ කතාවට බාධා කරමින් ඕ පැවසුවාය. එසේ කියන ඈ නැඟිට සිටී. ඈ කළු පැහැතිය. ඈ කුස්සියේ අඳුරට වැද නොපෙනී යයි.

"යකින්න!" යැයි සාෂා ඇය නැති තැන ඇයට කියයි.

"නුඹ ඇය ඉදිරිපිට එහෙම කියාපන්!" මම සාෂාට යෝජනා කළෙමි.

"මම බයයි කියල නුඹ හිතනවද?"

එහෙත්, ඔහු වහාම මුහුණ රැලි ගන්වා ගෙන මෙසේ පැවසීය:

"ඒකි ඉස්සරහ පිට එහෙම කියන්න බැහැ. සමහර විට ඒකි හැබෑටම යකින්නක් වෙන්න පුළුවනි..."

හැම දෙනා ගැනම නොසැලකිලි දැක්වූ ඈ, නිතර කෝපවී සිටි අතර, මටත් කරුණාවක් නොපෙන්වූවාය. හැමදාම උදේ පාන්දර හයට මගේ කකුලකින් අදින කුස්සි අම්මා කෑගසයි.

"නිදාගත්තා ඇති! දර ගෙනෙන්! සමවාරය ලෑස්ති කරපන්! අර්තාපල් සුද්ද කරපන්!...."

සාෂා අවදි වී නහයෙන් අඬයි:

"නුඹ මොකද නාහෙන් අඬන්නෙ? නිදාගන්න ඉඩ දෙන්නෙ නැතැයි කියල මම හාම්පුතාට පැමිණිලි කරනවා..."

කෙට්ටු ගැහැනියක් වූ ඈ, කුස්සියේ ඉතා ඉක්මනින් ගමන් කරමින් නිදි නැති ඉදිමුණු ඇස්වලින් ඔහු දෙස බැලුවාය.

"මේක දෙවියන්ට වැරැදීමක්! නුඹ මගේ අවජාතක පුතෙකු වෙලා හිටියා නම් මම නුඹව කෝටු මස් කරනවා."

සාප්පුවට යන ගමන් සාෂා ඇයට ශාප කරමින් මට ඒත්තු ගැන්වීමට උත්සාහ කළේය: "කාලකණ්ණි ගෑනි! ඒකිව පන්නා දමන විදිහට වැඩක් කරන්න ඕන. ඒකි හදන කෑමවලට හොරෙන් ලුණු වැඩිපුර දමන්න ඕන. ඔක්කොම කෑමවලට වැඩියෙන් ලුණු දාපුවාම ඒකිව පන්නා දමාවි. භූමිතෙල් දැම්මාම වඩාත් හොඳයි. නුඹ ඈනුම් අරින්නෙ මොකද?"

"නුඹත් ඈනුම් අරින්නෙ මොකද?"

සාෂා කෝපයෙන් ගොරවන්නට විය:

"බියගුල්ලා!"

කුස්සි අම්මා අපේ ඇස්පනාපිටම මිය ගියාය. සමවාරය එසවීම පිණිස ඈ දවසක් දා පෙරට නැමිගත්තද ඇගේ පපුවෙන් යමෙක් තල්ලු කළ විටෙක මෙන් ඈ නිහඬව බිම වැටී පැත්තකට ඇල වුණාය. ඇගේ දෑත් ඉදිරියට ඇදී තිබිණි. ඇගේ කටින් ලේ කැටි සහිත පෙණ උතුරා යන්නට විය.

ඇය මිය ගිය බව දෙදෙනා එකවර තේරුම් ගත් නමුදු, එය හඬ නඟා කීමට අපට ශක්තියක් නොතිබුණේ, ඉමහත් ලෙස අප බිය වූ බැවිනි. අපි ගල්ගැසුණාක් මෙන් ඇය දෙස බලා සිටියෙමු. අවසානයේදී සාෂා නැඟිට කුස්සියෙන් පිටතට දිව ගියේය. මම එළිය වැටෙන ජනේල මුල්ලකට හේත්තු වුණෙමි. හාම්පුතා විත් කලබලයෙන් උක්කුටියෙන් වාඩි වී, කුස්සි අම්මාගේ මුහුණ ඇඟිල්ලකින් අල්ලා කතා කළේය:

"හැබෑටම මැරිලා.... මක් වුණාද?"

ඔහු නැඟිට හාස්කම් පෙන්වූ නිකොලායි මුනිගේ පින්තූරය තබා ඇති මුල්ලට හැරී කුරුසියේ ලකුණ ඇඳ ගන්නට විය. අනතුරුව පියවි සිහිය ලැබ අණ දුන්නේය:

"කෂිරින් දුවලා ගිහිල්ලා පොලීසියට දන්වාපන්!"

පොලිස්කරුවා පැමිණ වටයක් කරකැවී හාම්පුතාගෙන් පොඩි පගාවක් ලබාගෙන පිටව ගොස්, අස්රියකරුවකු සමඟ පැමිණ මිය ගිය කුස්සි අම්මාගේ සිරුර දෙපාවලින් සහ දෙවුරෙන් අල්ලා ගෙන මහපාරට ගෙන ගියේය. පිළිකන්නේ සිට ඒ දෙස බලා සිටි හාම්පුතාගේ බිරිඳ මට මෙසේ අණ කළාය:

"කුස්සි බිම හෝදාපන්!"

අනතුරුව හාම්පුතා මෙසේ පැවසීය:

"ඒ ගැනි හවස මැරිච්ච එක හොඳට හිටියා..."

එය හොඳට හිටියේ කෙසේදැයි තේරුම් ගැනීමට මට නොහැකි විය. එදින රෑයෙහි නිදාගැනීමට අප සැරසුණු විට, සාෂා බැරැඩි හඬින් මුමුනන්න විය:

"ලාම්පුව නිවන්න එපා!"

"නුඹ බයද?" මම ඇසීමි.

ඔහු කම්බිලියෙන් මුහුණ වසාගෙන බොහෝ වේලාවක්

නිහඬව සිටියේය. රාත්‍රිය නිහඬ වූයේ යම් කිසිවකට සවන් දෙන්නාක් මෙනි. එය යමක් බලාපොරොත්තු විය. තව මොහොතකින් දේවස්ථානයේ සීනු හැඬවෙන බවත්, ඉමහත් බියකින් මුළු මහත් නගර ජනතාව කෑ ගසන බවත් මට සිතිණි.

සාෂා කම්බිලියෙන් යම්තමින් නහය පමණක් පිටතට දමා සෙමින් කතා කළේය:

"පෝරනුවේ මැස්ස උඩ අපි දෙන්නා ළං වෙලා නිදා ගනිමු, හොඳද?"

"එතැන බොහොම රස්නෙයි."

නිහඬව සිටි ඔහු යළිත් කතා කරන්නට විය:

"කුස්සි අම්මා හිටි හැටියේම මැරුණු හැටි, ආ? මදැ හරිම යකින්නක්... මට නිදාගන්ට බැහැ..."

"මටත් නින්ද යන්නෙ නැහැ..."

සාෂා මිය ගිය ප්‍රාණකරුවන් ගැන විස්තර කරන්නට පටන් ගත්තේය. මිනීවළින් පිටතට එන ඔවුන්ගේ ආත්ම රෑ යාමය වනතුරු නගරයේ ඇවිදිමින්, ඔවුන් පදිංචිව සිටි ගෙවල් සහ ඔවුන්ගේ නෑයන් සොයන සැටි ඔහු කිව්වේය.

"මිය ගිය පරාණකාරයන්ට මතක නගරය විතරයි. ගෙවල් දොරවල්, නෑයන් ගැන මතක නැහැ. ඔන්න ඔහොමයි..."

නිහඬතාව වඩාත් පැතිරුණු අතර, වඩාත් කළුවර විය. සාෂා හිස ඔසවා මගෙන් මෙසේ ඇසීය:

"මගේ පෙට්ටගම බලන්න නුඹ කැමතිද?"

ඔහුගේ පෙට්ටගමෙහි ඔහු සඟවා තබන්නේ කුමක්දැයි දැන ගැනීමට මා තුළ ඇත්තේ දිගු කලෙක සිට වැඩෙමින් පවතින ආසාවෙකි. පෙට්ටගම යතුරු ඉබ්බෙක් දමා වසා තිබුණු අතර, එය ඔහු විවෘත කළේ විශේෂ සුරක්ෂිතතාවයෙකිනි. මා ඇතුළට එබී බැලීමට තැත් කළොත්, ඔහු ගොරහැඩි ලෙස මගෙන් මෙසේ අසයි:

"නුඹට ඕන මොනවද? ඉතින්?"

මා එකඟවූයෙන්, ඔහු ඇදෙන් බිමට නොබැසම, පෙට්ටගම ගෙනැවිත් ඇඳ මත තබන ලෙස මට කිව්වේ අණ කරන ලීලාවෙනි. මම එය ඔහුගේ දෙපා අසලින්

තැබීමී. ඔහුගේ කරේ දමා ඇති කුරුසිය බැඳි ලණුවට පෙට්ටගමේ ඉබි යතුරු අමුණා තිබිණි. ඔහු කුස්සියේ ඇදිරි මුලුවලට වැදගත් බැලුම් හෙළා, පෙට්ටගමේ ඉබ්බා ගලවා, එහි පියනට කටින් පිම්ඹේ පෙට්ටගම් පියන ගිනියම් වී තිබෙන විටෙක මෙනි. පියන ඔසවා යට ඇඳුම් කට්ටල දෙක තුනක් එළියට ගත්තේය.

එම පෙට්ටගම අඩක් පිරෙන තුරු හිස් බෝතල් පෙට්ටිවලින් පිරී තිබිණි. තේ කොළ ඔතන විවිධ පාටැති කඩදාසි වර්ගද, හිස් සපත්තු 'පොලිෂ්' ටින්ද, හිස් සාඩින් ටින්ද එහි විය.

"මේ මොකක්ද?"

"නුඹට බලන්න පුළුවන් වේවි" ඔහු වැදගත් ලෙස කියුවේය.

ඔහු පෙට්ටගම කකුල්වලින් තද කර ගෙන සෙමින් ගායනය කළේය:

"පරමණ්ඩලයේ වැඩ සිටි දෙව් රදුනි..."

මා බලාපොරොත්තු වූයේ සෙල්ලම් බඩු දැකීමටය. සෙල්ලම් බඩු කෙරෙහි මා බාහිර වශයෙන් අවඥා සහගත ආකල්පයක් දැක්වුවද, මට කිසිදිනෙක සෙල්ලම් බඩු නොතිබුණෙන් ඒවා අයිති ළමයින් කෙරෙහි මම සුහද ඊර්ෂ්‍යාවක් දැක්වීමි. සාෂා වැනි ලොකු කොල්ලෙක් ළඟ සෙල්ලම් බඩු තිබීමත්, ඔහුට ලජ්ජාවෙන් ඒවා සඟවා ගැනීමට හැකි වුවත්, එය මගේ සොම්නසට හේතු විය.

ඔහු කුඩා පෙට්ටියක් හැර එයින් වීදුරු කාච රහිත කණ්ණාඩියක් ගෙන ඇස්වල ලාගෙන මා දෙස දැඩි ලෙස බලා මෙසේ පැවසීය:

කණ්ණාඩි නැතුවට කමක් නැහැ. මේවා අපූරු කණ්ණාඩි රාමු. හේ උදම් ඇනීය.

"මටත් පොඩ්ඩක් දීපන්" මම ඉල්ලූවෙමි.

"නුඹේ ඇස්වල පාටට මේවා ගැළපෙන්නෙ නැහැ. මේ කණ්ණාඩි කළු පාට ඇස්වලට විතරයි ගැළපෙන්නෙ. නුඹේ ඇස් අළු පාටයි." හාම්පුතා සේ කෑ ගසා කතා කළ ඔහු වහාම උගුර පාදා ගෙන බිය වී කුස්සිය අවට බැලීය.

තවත් බෙලෙක් පෙට්ටියකින් ඔහු විවිධ වර්ගවලට

අයත් බොත්තම් මට පෙන්වමින් ආඩම්බරයකින් කතා කළේය. "මම මේවා මහ පාරෙන් එකතු කළේ. දැන් බොත්තම් තිස් හතක් තියෙනවා..."

තුන්වැනි කුඩා පෙට්ටියේ තඹවන් ලොකු අල්පෙනෙත්තිද, සපත්තු අඩිවලට සවිකරන විවිධ කුඩා ලාඩම් වර්ගද (මේවා අතර ගෙවීගිය, බිඳුණු ඒවාද විය) සපත්තුවලට අමුණන ලේස් පටිද, පිත්තල දොර මිටක් ද, කටුවලින් නිමැවූ සැරයටියක උඩු කොටසද, ගෑනු නැමි පණාවක්ද. එවැනිම වර්ගවලට අයත් බඩුද එහි විය. මේවා සියල්ල ඔහු අහුලා ගත්තේ මහ පාරෙනි.

ගෙයක් පාසා යමින්, පරණ රෙදි කඩ සහ සුන්බුන් එකතු කළ මට, එක මසක් තුළදී, සාෂා සතු "සෙල්ලම් බඩු" මෙන් දසගුණයක් වැඩියෙන් එකතු කළ හැකි බව අවබෝධ වූයෙන්, සාෂාගේ 'වස්තුව' නිසා මා කෙරෙහි කලකිරීමක් ඇති විය. එමෙන්ම, ඔහු නිසා මා තුළ ලජ්ජාවක් සහ අනුකම්පාවක්ද හට ගත්තේය. ඔහු ඒවා එකින් එක ගෙන ඉමහත් අවධානයකින් ඒවා දෙස බලමින්, ඒවා ඉතා ආදරයෙන් අතගාමින් දෙතොල් වැදගත් ලෙස නවා ගනිමින් සිටි විට, මොරගෙඩි වැනි ඔහුගේ ඇස්වල සොම්නසක් සහ සැලකිල්ලක් දක්නට තිබිණි. එහෙත්, කාච රහිත කණ්ණාඩි කුට්ටම ඔහුගේ ළමා මුහුණට හාස්‍යයක් එකතු කළේය.

"නුඹට ඔය දේවල් මොකටද?" මම ඇසුවෙමි.

ඔහු සැණෙකින් කණ්ණාඩි රාමුවෙන් මා දෙස බලා බිඳුණු හඬෙකින් කතා කළේය.

"නුඹට මොනවා හරි තෑගි කරන්නද?"

"නැහැ. ඕන නැහැ..."

ඔහුගේ වස්තුව කෙරෙහි මා දැක්වූ අල්ප අවධානය සහ එය ප්‍රතික්ෂේප කිරීම නිසා ඔහු අමනාපයට පත් වූවා විය යුතුය. ඔහු මොහොතක් නිහඬව සිට සෙමින් මෙසේ ඇසුවාය.

"තුවායක් ගෙනෙන්, අපි මේවා පිහදමමු. නැතිනම් දූවිලි පිරෙනවා..."

ඔහුගේ වස්තුව පිසදැමූ පසු, ඔහු ඇඳ මත දිග ඇදී,

බිත්තිය දෙසට මුහුණ හරවා ගත්තේය. වැහි බින්දු වහලට වැටී හඬ නැංවීය. ජනේලවලින් කුස්සියට සුළං හමන්නට විය.

සාෂා මා දෙස නොබලා කතා කළේය.

"ගෙවත්තේ වතුර බැහැලා ගියාම මම නුඹට බඩුවක් පෙන්වන්නම්, නුඹ කට හැර ගෙන පුදුමයට පත්වේවි!"

මම නිහඬව නිදාගැනීමට සැරසුණෙමි.

තත්පර කීපයක් ගෙවීයන්නටත් පෙර ඔහු වහාම ඇඳෙන් නැඟිට සිට, බිත්තිය ඇඟිලිවලින් සූරමින් ඉමහත් ස්ථිර ගතියෙකින් කෑගැසීය.

"මට බයයි... දෙවියනි, මට බයයි! දෙවියනි මට සමාවන සේක්වා! මේ මොකක්ද?"

එවිට මමද ගත සිත හිරිවැටෙන තරම් බියට පත්වීමි. ගෙවත්තෙහි ජනේලය අසල මට පිටුපා කුස්සි අම්මා සිටින සැටි මට පෙනිණි. ඈ ජීවත්ව සිටින විට කුකුල් පොර නරඹන පරිදි ජනේල වීදුරුවට නළල හේත්තු කරගෙන ඈ සිටී.

සාෂා සුසුම් ලමින් බිත්තිය සූරමින් දෙපා වේගයෙන් වනයි. මම ගිනි අඟුරු ගොඩක් උඩින් ගමන් කරන විටෙක මෙන් ඇවිද කුස්සිය හරහා විත්, ඔහුගේ ඇඳට පැන ඔහු අසලින් නිදා ගතිමි.

බිය නිසා හති වැටෙන තුරු කෙදිරි ගෑ අපි අවසානයේදී නිදා ගතිමු.

ඊට දවස් කීපයකට ඉක්බිතිව කිසියම් උත්සවයක් වූයෙන්, දවල් දොළහට අපේ වෙළඳ හල වසා ගෙදර විත් අපි දිවා ආහාරය ගතිමු. හාමිපුතා දිවා කාලයේ සැප නින්දට ගිය පසු, සාෂා මට ගුප්තමය ලෙස මෙසේ පැවසීය:

"යමු!"

මා ඉමහත් ලෙස මවිත වන දේ දැන් මම දකිමියි, මට සිතිණි.

අපි ගෙවත්තට ගියෙමු. ගෙවල් දෙකක් අතර පටු බිම් තීරුවෙහි ලීපා ගස් පහළොවක් පමණ විය. ඒවායේ යෝධමය රුක් කඳ නිල් පැහැති පෙඳ පාසිවලින් වැසිලාය. ඒවාගේ අතු මිය ගොසිනි. එම අතු නග්නය,

කළු පැහැතිය. එහි එකද කපුටු කුඩුවක් වත් නොතිබිණි. මේ ලීපා ගස් හැරුණු විට එහි තණ පඳුරු හෝ වෙනත් යමක් හෝ නොවීය. එහි පස තදය, කළු පැහැතිය, යකඩ මෙනි. ඉකුත් වසරේදී බිම වැටුණු කොළ දිරාපත් වී, පස් තට්ටුව විනිවිද පෙනෙයි. එහිද පල්වෙන වතුර වළක මෙන් පාසිවලින් වැසී තිබිණි.

සාෂා පාර පැන්නෙන් වැටේ මුල්ලට ගොස් ලීපා ගසක් අසල නැවතී දෙනෙත් මහත් කැරැගෙන අල්ලපු ගෙදර අපැහැදිලි ජනේල දෙස බැලීය. අනතුරුව ඔහු උක්කුටියෙන් වාඩි වී, බිම වැටී ඇති ලීපා කොළ අහුරක් දෑතින් අවුස්සා ඈත් කොට, ලීපා ගහේ මුල සොයාගත්තේය. එය අසල මහ පොළොවට ඔබා ඇති ලොකු ගඩොල් කැට දෙකකි. ඔහු එම ගඩොල් කැට දෙක ඉවත් කළ විට, එතැන යකඩ තහඩුවකි. එම තහඩුවට යටින් හරි හතරැස් ලී කෑල්ලකි. ඔහු එම ලීයද ඉවත් කළ විට ගස මුල තෙක් ඇති ගැඹුරු සිදුරකි.

සාෂා ඉටිපන්දම් කොටයක් පත්තු කොට එම සිදුර අල්වා මට මෙසේ කිව්වේය.

"බලාපන්! බය වෙන්න විතරක් එපා..."

ඔහු බියවී ඇති බවක් පෙනෙයි. ඔහු අත ඇති ඉටිපන්දම් කොටය සැලෙන්නේ ඔහුගේ අත වෙවුලන බැවිනි. අනික් අත ඔහු සෙමෙන් පිටි කොන්ද දෙසට යැවීය. සාෂාගේ බිය මටද බෝ විය. මම ලීපා ගහ මුල ඇති මහා කුහරය දෙස බැලීමි. ගසේ මුල එම කුහරයට පියස්සක් මෙනි. සාෂා එම කුහර ගැඹුරෙහි ඉටිපන්දම් තුනක් දැල්වීය. එවිට එය නිල්වන් ආලෝකයෙන් පිරිණි. එය සෑහෙන තරම් විශාල කුහරයක් වූ අතර, හැඩයෙන් පනිවිටුවකට සමාන විය. එම කුහරයේ අභ්‍යන්තර බිත්තිය සාෂා විසින් විවිධ පාටැති වීදුරු කෑලි සහ පිඟන් කටු කැබැලිවලින් සරසනු ලැබ තිබිණි. එහි මැද වූ පස් ගොඩැල්ල මත රතු පාට රෙදි කෑල්ලකි. ඊයම් කොළවලින් සෑදූ කුඩා පෙට්ටියක් එහි විය. එම පෙට්ටිය අඩ වශයෙන් වසා තිබුණේ වැඩ දමා මැසූ සේද රෙදි කැබැල්ලකිනි. එම රෙදි කැබැල්ලට යටින් අළු පැහැති කුරුලු පාද දෙකක් සහ කුරුලු හොටක් ඉදිරියට නෙරා

තිබිණි. කුරුලු සිරුර බහා තිබුණු පෙට්ටියට ඉහළින් යම්තමින් උස් තැනෙක මිනිසුන්ගේ කරේ දමන කුඩා කුරුසියක් සිටුවා තිබිණි. එය වටේට ඉටිපන්දම් කොට තුන ඔතා තිබුණේ, චොකලට් වැනි පැණි රස කෑම ඔතන රිදී සහ රන් පැහැති කොළවලිනි.

ඉටිපන්දම්වල ගිනි සිළු කුහරයේ මුඛය දෙසට හැරී තිබිණි. කුහරයේ අභ්‍යන්තර බිත්තිවලට සවිකර තිබුණු විවිධ පාටැති වීදුරු කැබැලි ඉටිපන්දම් ආලෝකය නිසා දිලිසිණි. කුහරයේ සිට මා සිප ගැනීමට ඉහළට නැගුණේ උණුසුම සහ කුණු ගඳ සහිත හුමාලයකි. නටන ගිනිසිළුවල ප්‍රතිබිම්බය මගේ නෙත්වල චලනය විය. මේ සියල්ල නිසා මසිතෙහි දොම්නස මුසු මවිතයක් ඇති වූයෙන්, මගේ බිය යටපත් විය.

"හොඳද?" සාෂා ඇසුවේය.

"මේක මොකටද?"

"පුංචි පල්ලියක්. ඒ වගේ නේද?" ඔහු විස්තර කරන ගමන්ම ඇසුවේය.

"මා දන්නෙ නැහැ."

"මෙතැන මැරිච්ච වී කුරුල්ලෙක්. එයාට දෙවියන් ගේ කරුණාව ලැබේවි. ඌ මළේ අහිංසක විදිහට..." හේ පැවසීය.

"නුඹ මැරිච්ච කුණක් හොයාගත්තද?" මම ඇසීමි.

"නැහැ. ඌ මඩුවට ආවා. ඌව තොප්පියකින් වහලා මම ඌව මැරුවා."

"මොකටද නුඹ ඌව මැරුවෙ?"

"නිකම් මැරුවා."

සාෂා මගේ දෙනෙත් දෙස එක එල්ලේ බලා යළිත් ඇසීය.

"හොඳද?"

"නැහැ!"

එවිට ඔහු ඔහුගේ කුඩා බිම්ගෙය ලෑල්ලෙන් සහ යකඩ තහඩුවෙන් වසා එය මත ගඩොල් කැට දෙක තබා නැඟිට සිට දෙදණේ ගෑවී ඇති පස් සහ වැලි පිස දමමින් ඇසීය:

"නුඹ අකමැති මොන හේතුවක් නිසාද?"

"වී කුරුල්ලාව මරාපු නිසා"

ඔහු මා දෙස අන්ධයකු මෙන් බලා මගේ පපුවට දෑත් තබා මා තල්ලු කරමින් කෑ ගැසීය.

"මෝඩයා, නුඹ එහෙම කියන්නෙ ඉරිසියාව හන්දා! නුඹ කනාත්තයා වීදියේ හිටපු දවස්වලදී එහි ගෙවත්තේ හදාපු කුටිය ලස්සනද?"

මම ඒ කාලයේදී සැදූ කුටිය සිහි කළෙමි, මෙසේ පිළිතුරු දුනිමි:

"සත්තකින්ම මීට වැඩිය හොඳයි!"

එවිට සාෂා ඇඳගෙන සිටි කබාය ගලවා බිම දමා කමිස අත් නවාගෙන, අත්ලට කෙළගසා වහසි බස් දෙඩවීය:

"එහෙනම් ගහ ගනිමු!"

එහෙත්, ඔහු සමඟ පොරකෑමට මට සිතක් නොවූයේ, මගේ සිත විශාල පාළු ගතියකින් දුබලව තිබුණු බැවිනි. කෝපයෙන් උතුරන ඔහුගේ මුහුණ බැලීම මට නොරිසි විය.

ඔහු ඉදිරියට පැන මගේ පපුවට හිසෙන් ඇණ මා බිම වට්ටවා මගේ ඇඟ උඩ නැඟී කෑ ගසන්න විය.

"ජීවිතයද නැතිනම් මරණයද?"

එසේවතුදු මා ඔහුට වඩා ශක්තිමත් වූ බැවින් හා ඉමහත් ලෙස කෝප වූ බැවින්, මම ඔහු පෙරළා දමා පහර දුනිමි. තත්පර කීපයකින් ඔහු මුණින් අතට වැටී ගෙනැ, දෑතින් හිස අල්ලාගෙන ගොරවන්නාක් මෙන් කෙදිරි ගාන්නට විය. බිය වූ මම ඔහු නැඟිට්ටුවා ලීමට තැත් කළෙමි. ඔහු දෙපා සහ දෑත් වනමින් මා වඩාත් බිය කළේය. කුමක් කළ යුතුදැයි නොදත් මම පැත්තකට වී බලා සිටියෙමි. බිම වැටී සිටි ඔහු සිය හිස ඔසවා මෙසේ පැවසීය:

"නුඹට පේනවද? හාම්පුතා මාව දකින තුරු මම මෙතැන වැතිරිලා ඉන්නව දැක්කාම නුඹව පන්නා දමාවි!"

ඔහු ශාප කරමින් තර්ජනය කළ නිසා මගේ කෝපය ඇවිස්සිණි. මම ඔහුගේ බිම්ගෙයට දුවගොස් එහි තිබූ ගල් කැට සහ වී කුරුල්ලාගේ මළකුණු සහිත පෙට්ටිය ඇද ඒවා වැටෙන් එහා මහපාරට විසි කොට, ගුහාව පයින්

පාගා පොඩි කර දැමීමි.

"ඔන්න නුඹ දැක්කද?"

මගේ කෝපාන්විත ක්‍රියාව කෙරෙහි ඔහු දැක්වූයේ පුදුමය දනවන ආකල්පයෙකි. ඔහු බිම වැතිරගෙන තරමක් කට විවෘත කර බැම සඟළ ඔසවාගෙන නිහඬව මා දෙස බලාගත්වනම උන්නේය. මා ඔහුගේ බිම්ගෙයි තිබූ සියලු දේ පාගා දැමූ ඉක්බිතිව ඔහු නැඟිට කබාය උරෙහි දමා ගනිමින්, සන්සුන් එමෙන්ම, ඉතා නපුරු ලෙස මෙසේ කිව්වේය:

"දැන් ඉතින් තව පොඩ්ඩක් හිටපිය! මම නුඹව අමාරුවේ දැමීමට හූනියමක් කළා! තේරුණාද?"

ඔහුගේ වචන මට පිහි පාහරකට සමාන වූයෙන්, මා ඉබේටම ඉන්දෙවිණි. මගේ උදරය හා අතුනුබහන් දැඩි ශීතලයකට හසුවිය. ඔහුගේ සන්සුන් ලීලාවෙන් මා වඩාත් දැඩි පෑගීමකට හසුකොට, ඔහු ඉවත් වී ගියේය.

හෙටම මේ නගරයෙනුත්, සපත්තු සාප්පුව අයිතිකරුවාගෙනුත්, සාෂාගේ හූනියම්වලිනුත් ඒකතානමය මෝඩ ජීවිතයෙනුත් පැන යාමට මම අදහස් කළෙමි.

පසුදා උදෑසන මා අවදි කළ අලුත් කුස්සි අම්මා මවිතය පළ කරමින් කෑ ගැසුවාය:

"අප්පචියේ නුඹේ මුහුණක හැටි!"

"හූනියම හරිගිහිල්ලා!" යැයි මම මටම කියා ගතිමි.

එහෙත්, කුස්සි අම්මා බක බක ගාමින් සිනාසුණු විට, මටද, ඉබේටම සිනා පහළ විය. කණ්ණාඩියෙන් මූණ බැලූ විට මට කරුණු පැහැදිලි විය. මගේ මූණ පුරා අළු ගා තිබිණි.

"මේක සාෂාගේ වැඩක්ද?"

"නුඹ සිතුවේ මගේ කියලාද?" කුස්සි අම්මා හඬ නඟමින් සිනා සුණාය.

මා සපත්තු පිසදැමීම පිණිස සපත්තුවකට අත දැමූ විට මගේ ඇඟිල්ලකට අල්පෙනෙත්තක් ඇනිණි.

"හූනියම වැඩ පටන් අරගෙන!"

හැම සපත්තුවකම අල්පෙනෙත්ති සහ ඉදිකටු කොතරම් දක්ෂ ලෙස අමුණා තිබුණේද යත්, ඒවා මගේ

අත්ලෙහි ඇනීම වළක්වාලිය නොහැකි විය. එවිට මම වතුර ජෝගුවක් පුරා ගෙන තවමත් සැප නින්දේ පසුවන කට්ටඩි සාෂාගේ හිසට වත් කළෙමි.

කෙසේවතුදු මගේ මනෝභාවය අයහපත් විය. වී කුරුල්ලාගේ මළකුණත්, උගේ පාදත්, උඩට හැරවුණු උගේ දොම්නස් බර හොටත් මගේ මනස ඉදිරියෙහි නොමැකිණි. දෙනෙත් ඉදිරියේ නිතර, නිතර ගිනි පුපුරු හටගන්නාක් මෙන් දැනිණි. දැන් දැන් දෙනෙත් ඉදිරියේ දේදුන්නක් ඇතිවීමට යන විටෙක මෙනි. මනැස ඉදිරියෙහි මැවුණු වී කුරුල්ලාගේ මිනී පෙට්ටිය විශාලත්වයෙන් වඩාත් වැඩි විය. උගේ පාද විශාල වී ඒවා සෙලවෙමින් ඉහළට ඇදෙයි.

එදින හවස මම ගෙදරින් පැන යාමට තීරණය කළෙමි. එහෙත්, දවල් බත සඳහා මාළු සහිත සුප් හොද්දක් භූමිතෙල් ළිප මත තබා රත් කරමින් සිටින විට, එය උතුරා නටන්න පටන් ගත්තෙන් මම ළිප නිවන්න ඉදිරිපත් වූයෙමි. එවිට සුප් හැළිය මගේ අතක් මත වැටී පිලිස්සුණෙන් මා රෝහලට ගෙන ගියේය. රෝහල එවකට නපුරු සිහිනවලින් පිරි භයානක ස්ථානයක් විය. අළු පැහැති සහ සුදු පැහැති මිනිස්සු කෙදිරිගාමින් හඬ නැඟුහ. උසැති රෝගියෙක් කිහිලිකරුවල ආධාරයෙන් ගමන් කරමින් ඔහුගේ දිගැති විශාල කළු පැහැති යටි රැවුළ නටවමින් කෑගැසීය:

"උතුමාණන් වහන්සේට වාර්තා කරමි!"

ඔහුගේ බැම සඟළ උඩු රැවුළ තරම්ම විශාලව වැඩිලා ය.

රෝහලේ ඇඳන් මිනී පෙට්ටිවලට සමාන විය. ඇඳන් මත උඩුබැලි අතට වැතිර සිටින රෝගීහු මිය ගිය කුරුල්ලන්ට සමාන බවක් දැරූහ. රෝහලේ කහ පැහැති බිත්ති සෙලවේ. සීලිම රුවලක් මෙන් වැනෙයි. පොළොව සෙලවෙන්නේ ඇඳන් එහා මෙහා යවමිනි. හැම දෙයකම බලාපොරොත්තු රහිත භාවයකි, බියජනක ස්වරූපයකි. වත්තේ සිට රෝහල තුළට ගස්වල අතු ඇතුළු වූයේ, අපට විඳීමට සැරසෙන කැටපල්කරු මෙනි. අදිසි කිසිවෙක් ඒවා සෙලවූහ.

මළමිනියක මෙන් සුදු රෙද්දක් පොරවාගත් ඉතා කෙට්ටු මිනිහෙක් දොරෙහි එල්ලී ගෙනැ සිහින් හඬින් කෑ ගැසීය:

"මට පිස්සන්ගේ වාට්ටුවට යන්න බැහැ!"

කිහිලි කරුවල ආධාරයෙන් ගමන් කරන මිනිහා ඔහුගේ කනට කට ළං කොටැ කෑ ගැසීය:

"උතුමාණන්-හට-සැල කරමි...!"

රෝහල මිනිසුන් මරා දමන මස් මඩුවක් ලෙස ආච්චිත් සීයාත් නිතර මට කිව්වෝය. මගේ ජීවිතය අවසන් වූ බව මම සිතාගතිමි. සුදු රෙද්දක් පොරවා ගත් ගැහැනියක් විත්, මගේ ඇඳෙහි ඉහ ඉද්දර සවි කර තිබුණු කළු ලෑල්ලේ සුදු හුනු කැටයකින් මොනවා දෝ ලියන්නට වූවාය.

රටහුනු කැල්ල කැඩී හුනු කුඩු මගේ හිසට වැටිණි.

"නුඹේ නම මොකක්ද?" ඕ ඇසුවාය.

"මොකවත් නැහැ."

"නුඹට නමක් තියෙනවා නේද?"

"නැහැ."

"මෝඩියක් වෙන්න එපා. නැතිනම් නුඹව කෝටුමස් කරාවි!"

ඇය පැමිණීමට පෙර සිටම මට පහර දෙන බව මා දැන සිටි බැවිනි, මා ඇයට එලෙස පිළිතුරු දුන්නේ. ඈ බැළලියක සේ මුරු-මුරු ගා හඬ නගා, බැළලියක සේ නිහඬව පිටවී ගියාය.

පහන් දෙකක් දැල්වීය. කහ පැහැති ඒවා කාගේදෝ නැතිවුණු ඇස් මෙන් නැටවිණි. ඒවා එකිනෙකට ළං වීමට තැත් කරන විටෙක මෙනි.

මුල්ලක සිටි කෙනෙක් කතා කළේය:

"කාඩ් අතක් බලමුද?"

"අත් බැඳලා තියෙන කොට කාඩ් බලන්නේ කොහොමද?"

"ආ! නුඹ අතක් කපලා දැම්මද?"

එවිට මට මෙසේ සිතිණි. මේ මිනිහා කාඩ් සෙල්ලම් කරපු හන්දා ඔහුගේ අතක් කපලා දාලා. මා මරා දැමීමට පෙර රෝහල් සේවකයෝ කුමක් කරතිද?

මගේ අත දැවිල්ලෙන් හා වේදනාවෙන් පෙළුණේ අතේ කටු ඉවතට ඇද දමන විටෙක මෙනි. බිය සහ වේදනාව විසින් මා සෙමින් අඬවන්නට විය. කඳුළු පිටතට නොපෙන්වනු පිණිස මා ඇඬුවේ දෙනෙත් වසාගෙනය. එහෙත්, කඳුළු ගලා ගොස් දෙකන්වලට වැටිණි.

රෑ වත්ම මිනිස්සු තමන්ගේ ඇඳන්වලට වී අළු පැහැති කම්බිලි පොරවාගෙන නිදාගන්නට වූහ. ගතවන සෑම විනාඩියක් පාසාම නිහඬතාවය වැඩි වූ අතර, එක් රෝගියෙක් මුල්ලකට වී මුමුනන්නට විය.

"ඒ වැඩ හරියන්නෙ නැහැ. ඌත් බල්ලා, අරකිත් බැල්ලී..."

මා තවම ජීවත්වන නිසා ආච්චි ඇවිත් මා රෝහලෙන් සොරකම් කැරැගෙන යා යුතු යැයි ඇයට ලියුමක් ලියන්න මට අවශ්‍ය වුවද, පිලිස්සුණු අත වෙළුම් පටිවලින් බැඳ තිබෙන නිසා එයද කළ නොහැකි විය. ලිවීමට අවශ්‍ය කඩදාසි හා පැන්සල්ද නැත. රෝහලින් පැන යාමට උත්සාහ කළ යුතු නේද?

රාත්‍රිය වඩාත් මියගිය බවෙක ලක්ෂණ ඉදිරිපත් කරන්නේ එය සදහටම ස්ථිර කිරීමට මෙනි. රාත්‍රී අඳුර පැතිර යත්ම, මම නිහඬව දොර අසලට පැමිණියෙමි. දොර පළුවක් තවමත් වසා නැත. රෝහල් කොරිඩෝරයේ බංකුවක වාඩිවී මිනිහෙක් දුම් බොමින් සිටී. දුම් වලා ඔහුගේ හිස වටා ගෙතිලාය. වළ ගැසුණු කළුවන් නෙත්වලින් මා දෙස බැලූ ඔහු මට කතා කළේ මා සැඟවීමටත් කලිනි.

"ඇවිදින්නෙ කවුද? මෙහෙ වරෙන්!"

කටහඬෙහි බිය දැනවීමක් නොතිබිණි. එය පහත්ය. කෙස් වැටිය සහිත හිස දෙසත්, ඔහුගේ වටකුරු මුහුණ දෙසත් මම බැලීමි. මුහුණේ රැවුළු ගස් කෙටිය, හිසේ කෙස් දිගට වැවිලාය. ඔහුගේ කෙස්වැටිය රිදී පැහැතිය. ඔහුගේ බඳපටියට යතුරු කැරැල්ලක් අමුණා තිබිණි. ඔහුට දිගැති යටි රැවුළක් සහ වඩාත් දිගැති කෙස්වැටියක් තිබුණේ නම්, ඔහු පාවුලු අපෝස්තුළු තුමාට සමාන වනු ඇත.

"නුඹේ අත පිච්චිලාද? නුඹ මේ මහ රෑ හොල්මන්

කරන්නෙ මොකටද? කාගේ නීතියක් අනුවද?"

ඔහු මගේ පපුවටත්, මුහුණටත්, දුම් ගුළි පිට කොටැ, උණුසුම් අතකින් මගේ ගෙල අල්ලා තමා වෙතට ඇද ගත්තේය.

"බයද?" හේ ඇසීය

"බයයි."

"මෙහාට එන මිනිස්සු මුලදී බය වෙනවා. නමුත් බයවීමට කිසි දෙයක් නැහැ. විශේෂයෙන්ම මාත් සමග. මම කිසිම කෙනෙකු අමනාපයට පත් කරන්නෙ නැහැ. දුමක් අදින්න කැමතිද? ඔව්. දුම් බොන්න එපා. නුඹ තවම ළපටි වැඩියි. තව අවුරුදු දෙකකට විතර පස්සෙ පුළුවනි. අම්මයි, තාත්තයි කොහිද? දෙදෙනාම මැරිලාද? දැන් ඉතින් ඒකට කමක් නැහැ. ඒ ගොල්ල නැතුව ජීවත් වෙන්න පුළුවනි බයවෙන්න විතරක් එපා! තේරුණාද?"

චාම් ලෙසත්, මිතුරු ලෙසත් තේරුම් ගත හැකි බස් වහරකින් කතා කළ හැකි මිනිසුන් මම බොහෝ කලෙක සිට නොදුටිමි. ඔහුගේ කතා විලාසය මට අති මහත් සතුටක් ගෙන දුන්නේය.

ඔහු මගේ ඇඳ වෙතට මා ගෙන ගිය විට මම ඔහුගෙන් මෙසේ ඉල්ලා සිටියෙමි.

"මාත් සමඟ කතා කරන්න!"

"හොඳයි මම එකඟයි," හේ පැවසීය.

"ඔබ කවුද?"

"මමද? මම සෙබළෙක්. නියම කොකේසියානු සෙබළෙක්. මම යුද්දෙට ගිහිල්ලා තියෙනවා. එහෙම නැතුව කොහොමද? සෙබළා ජීවත්වන්නෙ යුද්ද කරන්න. හංගේරියානුන්ට විරුද්ධව, චෙර්කෙස්වරුන්ට විරුද්ධව, පෝලන්තයන්ට විරුද්ධව ඕන තරම් යුද්ධ කරලා තියෙනවා. පොඩි මල්ලී, යුද්ධය කියන්නෙ මහා ලොකු දඟ කිරීමකට!"

මම විනාඩි කීපයකට දෙනෙත් වසාගතිමි. මා දෙනෙත් හැර බලන විට, සෙබළා වෙනුවට කළු පාට ගවුමක් ඇඳගත් මගේ ආච්චි වාඩිවී සිටියාය. සෙබළා ඇය අසල සිටගෙන ඇගෙන් ප්‍රශ්න අසයි.

"ඉතින් එහෙනම් ඔක්කොමල්ලා මළා! එහෙමද?"

වාට්ටුව තුළට හිරු රැස් වැටී තිබිණි. කුඩා ළමයකුගේ දඟකාරී ක්‍රීඩාවක් සිහි ගන්වමින් වාට්ටුව තුළ වරෙක කහවන් හිරු රැස් නිසා ආලෝකයක් ඇතිවෙයි, තවත් වරෙක නැතිවෙයි.

ආච්චි මා දෙසට නැමී ඇසුවාය.

"ඉතින් මගේ පුංචි පරෙවියෝ, අත පුච්චා ගත්තද? රතු පාට හිසකේ තියෙන නාකි යකාට මම ඔය ගැන කිව්වා..."

"මේ ළමයව ගෙදර ගෙනයාමට අවශ්‍ය දේ දැන් මම නීතිය අනුව කරලා දෙන්නම්" යැයි සෙබළා පිටව යමින් කිව්වේය. ආච්චි දෙනෙත්වල කඳුළු කැට පිසදමා ගනිමින් "එයා අපේ සෙබළෙක්. බලහ්නාවල කෙනෙක්..." යැයි කිව්වාය

මා දකින්නේ සිහිනයෙකැයි සිතූ මම නිහඬව සිටියෙමි. දොස්තර විත් මගේ පිලිස්සුම් තුවාලවලට බෙහෙත් තබා වෙළුම් පටිවලින් බැන්දේය. ඊළඟට මම ආච්චිත් සමග අස් රියෙක වාඩි වී ගෙදර යමින් සිටියෙමි. ඈ විස්තර කතා කියන්නට වූවාය:

"අපේ සීයාට පිස්සු හැදීගෙන එනවා. ඔහු කොතරම් කෑදර පෙරේතයෙක් වෙලාද කිව්වොත්, ඔහු දිහා බැලීම පවා දුකක්. එයාගෙ ප්ලස්තීර් යාච්ඤා පොතේ තිබිලා රූබල් සීයේ නෝට්ටුවක් ලොම්වලින් හිස් වැසුම් සාදා හිලීස්ට් හොරකම් කළා. ඔහු තමා සීයාගේ අලුත්ම යාළුවා. ඉන් පස්සේ හරිම කලබලයක් ඇති වුණා!"

හිරු රැස් පැහැදිලිය. අහසේ පාවෙන වලාකුළු සුදු පැහැති ලප මෙනි. වොල්ගා ගඟ හරහා ඇති පාලමක් උඩින් අපේ අස්රිය ගමන් කරයි. ගඟ වැසී තිබුණු අයිස් තට්ටුව තුනීවී, බිඳී පිම්බිලාය. රතු පැහැති ගෝලාකාර පියස්ස සහිත දේවස්ථානය මත සිටුවා ඇති රන්වන් කුරුස හිරු රැස්වලින් දිලිසේ, අප ඉදිරියට පුළුල් මුහුණක් ඇති ගැහැනියක් එයි. ඇය අත වේර්බා පොහොට්ටු සහිත අත්තකි. වසන්තය පැමිණ ඇත. ඉක්මනින්ම පාස්කු උත්සවය පැවැත්වේ.

හදවත මිහිරි ලෙස ගැස්සිණි.

"ආච්චියේ, මම ආච්චිට ගොඩාක් ආදරෙයි!"

එනිසා ඈ මවිත නොවූවා, සන්සුන් හඬකින් මෙසේ පැවසුවාය:

"නුඹ මගේම මුනුපුරා හන්දා තමයි එහෙම ආදරය. මට මගේ අය විතරක් නොවෙයි, පිට අයත් ආදරය කරනවා. දේව මැණියනි, ඔබට සදා කීර්තිය අත්වේවා!"

මඳ සිනා පාමින් ආච්චි මෙසේද එකතු කළාය:

"දේව මැණියෝ ඉක්මනින්ම සතුටු වේවි. එතුමිය ගේ පුතා ජේසු තුමා මළවුන්ගෙන් නැඟිටින[1] හන්දා. අනේ ඉතින් මගේ දුව වර්වාරා...."

අනතුරුව ඕ නිහඬ වූවාය.

II

සීයා ගෙවත්තේදී මා හමුවිය. ඔහු දණ ගසාගෙන කිසියම් ලීයක් අත්පොරවකින් රහිමින් සිටියේය. මගේ හිසට අත්පොරව වීසි කිරීමට මෙන් අත්පොරව එක අතකින් ඔසවා ගත් ඔහු, අනික් අතින් හිසේ ඇති සිය තොප්පිය ගලවා හාස්‍ය ලෙස මට ආචාර කරමින් මෙසේ පැවසීය:

"ආයුබෝවන් ගරු කටයුතු උතුමාණෙනි! සේවය අවසන් කළාද? ඉතින් කැමති විදිහට ජීවත් වෙයන්. ඔව්! අනේ බාං නුඹලා...!"

"අපි ඒ ගැන දන්නවා, දන්නවා" යැයි අතක් වනමින් කාමරය තුළට ගිය ආච්චි සමවාරය රත් කරමින් සීයාට වූ දේ විස්තර කරන්න වූවාය.

"දැන් ඉතින් සීයා ලෑල්ලටම බංකොලොත් වෙලා. එයාගෙ ඥාන පුතා නිකොලායිට පොලියට සල්ලි දුන්නා. පොරොන්දු පත්‍රයකට අත්සන් අරගෙන නැහැ. ඔය ගනුදෙනු ගැන කියන්න මා කොහෙත්ම දන්නෙ නැහැ. සල්ලි අතුරුදහන් වෙලා. මේ වගේ විපතක් සිද්ධ වුණේ අපි දුප්පතුන්ට උදව් නොකළ නිසා. දුප්පතුන්ට අනුකම්පා කළේ නැහැ. දෙවියෝ මෙහෙම කල්පනා කළා. මම කෂීරින්ලාව පොහොසත් කළේ කුමක් නිසාද? දෙවියෝ එහෙම කල්පනා කරලා දුන්නු සියලු දේ ආපහු

1 පාස්කු ඉරිදා - අනුවාදක

ගත්තා..."

වට පිට බලා ආච්චි මෙසේද කිව්වායඃ

"මම දෙවියන් වහන්සේගේ හිත සනසන්නට සුළු, සුළු දේවල් කරනවා. අපේ නාකියාගේ දුක තුනී කිරීමට. මම හම්බ කරන දේවලින් සුළු සුළුවට පිනට දෙනවා. රාත්‍රී කාලෙට නුඹ කැමති නම් වරෙන් මාත් සමඟ. මා ළඟ සල්ලි තියෙනවා..."

සීයා පැමිණ දෙනෙත් හකුළුවා ගෙන ප්‍රශ්න කළේයඃ

"බඩජහරිකමට කන්ඩ ලෑස්ති වෙනවද?"

"නුඹේ කෑම නොවෙයි. නුඹට ඕන නම් අපත් සමග එකට වාඩිවෙයන්. නුඹටත් ඇති."

ඔහු මේසයට වාඩි වී සෙමින් ඉල්ලා සිටියේයඃ

"තේ වත්කරාපන්..."

කාමරයේ හැම දෙයක්ම පෙර තිබූ පරිදිමය. අම්මා පදිංචි වී සිටි මුල්ලේ පමණක් දුක්බර හිස් බවෙකි. සීයාගේ ඇඳට ඉහළින් විශාල අකුරුවලින් මුද්‍රණය කළ දැන්වීම් කොළයක් අලවා තිබිණි.

"ජේසුතුමා පමණක් මළවුන්ගෙන් නැඟී සිටි සේක! ඔබ වහන්සේගේ ශ්‍රී නාමය මට නිරන්තරයෙන්ම ආරක්ෂාව සලසා දෙනු ඇත."

"මේක ලියුවේ කවුද...?"

සීයා නිහඬව සිටි අතර, ස්වල්ප වේලාවකට ඉක්බිතිව ආච්චි මඳ සිනා පාමින් කතා කළාය.

"ඔය කඩදාසියේ වටිනාකම රූබල් සීයයි!"

"ඒක නුඹට අයිති වැඩක් නොවෙයි! මගේ සල්ලි සියල්ල පිට මිනිසුන්ට බෙදලා දෙනවා! සීයා ගුගුළේය.

"දැන් ඉතින් බෙදලා දෙන්න දෙයක් නැහැ නෙව. වස්තුව තිබුණු කාලෙදි බෙදා දුන්නෙ නැහැ." ආච්චි සන්සුන්ව තෙපලාය.

"කට වහපිය!" සීයා බෙරිහන් දුන්නේය.

මෙහි හැම දෙයක්ම නිසි ලෙස පරණ තාලෙට සිදුවන සැටි මම පසක් කර ගතිමි.

පෙට්ටගම මත තබා ඇති රෙදි දමන පැසෙහි නිදා සිටි පුංචි කෝල්යා ඈත සිට බැලීය. ඔහුගේ සුනිල් වන් දෙනෙත් ඇසිපියවලට යටින් පෙනුණේ යම්තම්නි. ඔහු

වඩාත් අළු පැහැ ගෙන, කෙට්ටු වී සිටින අතර, දියවී යාමටද පටන් ගෙන ඇත. ඔහු මා නොහඳුනන්නේ නිහඬව මගෙන් ඈත්ව, දෙනෙත් පියා ගත්තේය.

මහ පාරේදී මගේ සගයන් අරබයා වූ පුවත් ඉතා කනගාටුදායක විය. ව්‍යහීර් මිය ගොසිනි. ජේසුතුමා කුරුසියේ ඇන ගැසූ සතියේදී ඔහු සුළං මෝලකට හසුවීමෙන් මිය ගියේය. හබී ජීවත්වීම සඳහා නගරයට ගියේය. යාස්ගේ දෙපා පණ නැතිව ගියෙන්, ඔහු ඇවිදීමට පිටතට නොඑයි. මේ සියලු පුවත් මට කී කළුවන් ඇස් ඇති කොස්ත්‍රොමා කෝපයෙන් මෙසේ කිව්වේය:

"අපේ කොල්ලො ඔක්කොමලා ඉක්මනට මැරිල යාවි."

"ඒ වුණාට මළේ ව්‍යහීර් විතරයි නේද?" මම ඇසුවෙමි.

"කොහොම වුණත් එකයි. මහ පාරෙන් ඉවත් වෙලා ගිය එවුන් පවා මළා වගෙයි. යාළුකම පටන් ගන්නවා විතරයි. එක්කෝ කොහාට හරි වැඩකට පිටත් කරනවා. නැතිනම් මැරිලා යනවා. නුඹලෑ ගෙවත්තේ, වෙස්නකොච්චලාගේ ගෙදර අලුත් අය පදිංචියට ඇවිල්ලා. යෙව්සේයෙන්කොලා. කොලුගැටයාගේ නම නෑෂ්කා, ඔහු දක්ෂයි. එයාට නංගිලා දෙදෙනෙක් ඉන්නවා. පුංචි නංගී කෙනෙක් ඉන්නවා. අනික් ළමයා නොණ්ඩි ගහනවා. එයා හැරමිටියක් අරගෙන තමයි යන්නෙ. ඒ වුණාට ලස්සනයි."

තරමක් කල්පනා කොට ඔහු මෙසේද පැවසීය:

"ඉතින් අයියෙ, මමයි, චූර්කායි දෙන්නාම ඇයට ආලය කරනවා. අපි සණ්ඩු දබරත් කරගන්නවා."

"කෙල්ලත් සමඟද?"

"ඒ මොකටද? අපි දෙන්නා අතර, ඇයත් සමඟ අමනාප වෙන්නෙ කලාතුරකින්!"

ලොකු කොල්ලන් පමණක් නොව, වැඩිහිටි මිනිසුන්ද ආලය කරන බව සත්තකින්ම දැන සිටි මට එහි ගොරහැඩි අදහස රහසක් නොවීය. කොස්ත්‍රොමා නිසා මා තුළ අප්‍රියජනක හැඟීමක් ඇති වූ අතර, මම ඔහුට අනුකම්පා කරන්නට වූයෙමි. කොස්ත්‍රොමාගේ නුහුරු සිරුර දෙසත්, කෝපය මුසු කළුවන් දෙනෙත් දෙසත් බැලීම මට අසීරු දෙයක් විය.

එදින හවස මම නොණ්ඩි ගසන ඒ තරුණිය දුටිමි.

ඈ එළිපත්තේ සිට පඩිපෙළ දිගේ බිමට බසිත්ම, ඇගේ අත තිබුණ සැරයටිය බිම වැටිණි. ඈ අසරණව, විනිවිද පෙනෙන අත්වලින් පඩි පෙළේ වැට අල්ලා ගනිමින් බලා සිටියාය. ඕ සිහින්ය, දුබලය. මම ඇයට උදව් වීමට ඉදිරිපත් වූයෙමි. මගේ දෑත් වෙළුම් පටිවලින් බැඳ තිබුණු නිසා හැරමිටිය අහුලා ඇයට දීමට මම බොහෝ වේලාවක් ගත කළෙමි. ඈ මට වඩා පඩි දෙක තුනකට ඉහළින් සිටගෙන නිහඬව මඳ සිනා පාමින් ඇසුවාය:

"ඔයාගෙ අත්වලට මක් වෙලාද?"

"පිච්චිලා."

"පේනවා නේද මම නොණ්ඩි ගහනවා. ඔයත් මේ ගෙදරමද නැවතිලා ඉන්නෙ? ඉස්පිරිතාලෙ ගොඩක් දවස් හිටියද? මම නම් ඉස්පිරිතාලෙ මහා ගොඩක් දවස් හිටියා!"

සුසුමක් හෙළා ඕ යළි මෙසේද පැවසුවාය:

"හුඟ දවසක්..."

ඈ හැඳ සිටියේ නිල් පැහැති අශ්වලාඩම් සලකුණු සහිත සුදු ගවුමකි. ඇඳුම පරණ වුවද, පිරිසුදුය. ඈ මනා ලෙස හිස පීරලාය. ඝනැති කෙස් කැරැලි උරහිස හරහා පපුවට වැටී තිබිණි. ඇගේ නුවන් විශාලය. බැරෑරුම්ය. ඒවායේ ගැඹුරෙහි සන්සුන්ව දිලිසෙන සුනිල්වන් ආලෝකයෙකි. තියුණු නාසයකින් යුත් ඇගේ කෙට්ටු මුහුණට ඉන් එළියක් ලැබිණි. ඇගේ මඳ සිනාව ප්‍රියංකර වුවද, ඈ මගේ සිත් නොගත්තාය. ඇගේ රෝගී සිරුර මෙසේ කියන්නාක් මෙනි:

"කරුණාකර මට අත නොතබනු!"

මගේ සගයන් ඇයට ආලය කරන්නේ කෙසේද?

"මම නොණ්ඩි ගහන්නේ බොහොම කාලයෙක ඉඳලා," ඇය කැමැත්තෙන් කිව්වේ වහසි බස් දොඩවන විටෙක මෙනි. "අපේ අල්ලපු ගෙදර හිටිය ගෑනි මට කොඩිවිනයක් කළා. මගේ අම්මාත් සමඟ ඒ ගෑනි සණ්ඩු වෙලා. ඇගෙන් පළිගන්නට මට මේ වගෙ අපරාධයක් කළා. ඉස්පිරිතාලෙ බොහොම භයානකයි නේද?"

"ඔව්..."

ඇයත් සමඟ කතා කිරීම නිසා මට අපහසුවක් දැනුණෙන්, මම මගේ කුටියට ගියෙමි.

මහ රෑ යාමෙට ආච්චි මා සුරතල් ලෙස අවදි කළායඃ

"එහෙනම් අපි යමුද? මිනිසුන්ට සේවය කළාම ඉක්මනට නුඹේ තුවාල සනීප වේවි."

අන්ධකාරයෙහිම ඈ මගේ අතක් අල්ලාගෙන, අන්ධයකුට මඟ පෙන්වන විටෙක මෙන් මට සහායවෙමින් ගමන් කළාය. එදින රාත්‍රිය කළු පැහැතිය, තෙතමනය සහිතය, කුණාටු හමන්නට වූයේ වැලි කැට දෙපාවලට තදින් වීසි කරමින්, වේගයෙන් ගලා බසින ගංගාවක් සිහි නංවමිනි. ආච්චි පහළ මධ්‍යම පන්තිකයන්ගේ ගෙවල්වල ජනේල වෙත ගොස් තෙවරක් කුරුසියේ ලකුණ ඇඳගෙන ජනේල පඩි මත කොපෙක් පහේ කාසියක් බැගින්ද, ක්‍රෙන්ඩේල් පාන් ගෙඩි තුනක් බැගින්ද තබා යළිත් කුරුසියේ ලකුණ ඇඳ ගනිමින්, සෙමින් යාච්ඤා කළාය.

"අති පාරිශුද්ධ දේවමෑණියනි, මිනිසුන්ට ආධාර කරන සේක්වා! මෑණියෙනි, ඔබ වහන්සේ ඉදිරියේ සෑම කෙනෙක්ම පව්කාරයෝ වෙති!"

අපේ ගෙදරින් වඩාත් ඈතට අප ගමන් කරත්ම, ගොළු නිහඬතාව සහ අඳුර වඩාත් වැඩි විය. කෑලි කැපිය හැකි ඝන අන්ධකාරයෙන් පිරි අහස සඳ හා තරු සඳහටම සඟවාගත්තාක් මෙනි. කොහේදෝ සිට බල්ලෙක් එළියට විත් අපට විරුද්ධව නැඟී සිට ගොරවන්නට විය. අඳුර බිඳ උගේ දෙනෙත් දිලිසෙන සැටි අපට පෙනිණි. මම බියගුලු ලෙස ආච්චි දෙසට ළං වීමි.

"ඒකට කමක් නැහැ. මූ නිකම් බල්ලෙක්. යකෙක් නොවේ. යකෙකුට නම් පමා වුණා වැඩියි. දැනටමත් කුකුළා හඬලා ඉවරයි!"

බල්ලාට කතා කළ ආච්චි උගේ ඔළුව අත ගා සුරතල් ලෙස උපදෙස් දුන්නායඃ

"නුඹ බලු රාලහාමි, මගේ මුනුපුරාව බය කරන්න එපා!"

බල්ලා අපේ නඩයට එකතු වූයෙන්, අපි තිදෙනාම ගමන් කළෙමු. ජනේල දොළහකට ළංවී, දොළොස් වරක්

මෙසේ "පින් පිණිස පරිත්‍යාග" කොට යාච්ඤා කළ විට, යම්තමින් එළිය වැටෙන්නට පටන් ගත්තේය. අළු පැහැති ගෙවල්ද, සීනි මෙන් සුදු පැහැති නපොල්නයා දේවස්ථානයේ සීනු කණුවද අඳුර බිඳ නැඟී සිටින්නට විය. සුසාන භූමියේ ගඩොලින් කළ වැට වඩාත් තුනියට පෙනිණි.

"මහලු මට මහන්සියි. හෙට උදේට නැඟිට්ටාම ගෑනු සහ පුංචි පැටව් සන්තෝස වේවි. ඔන්න දේව මැණියෝ ආධාර කළැයි කියල! හැම තැනම මොනවත් නැතිවිට, යම්තමින් තිබුණත් ඒත් ඇති. අනේ ඔලේෂා, මිනිස්සු බොහොම දුප්පත් විදිහට ජීවත් වෙනවා. ඔවුන්ට උදව් දෙන්න කිසිවෙක් නැහැ." යි ආච්චි කිව්වාය.

පොහොසතා නැත වඳින්නේ දෙවියන්ට
නැත සූදානම් අවසන් නඩු විභාගෙට
ගන රන් ගොඩ ගසයි ඔහු ගිජු කමට
ඒවා හැරෙයි, ඔහු පුච්චන දර බවට!

මිනිස්සු ජීවත් වෙන්න ඕන මිතුරුකමෙන්. දෙවියන් වහන්සේ ඔවුන් සියලු දෙනාට අනුකම්පා කරාවි! මුනුපුරේ, නුඹ මා ළඟට ආ නිසා මා සතුටු වෙනවා..."

මමද සන්සුන් ලෙස සතුටු වීමි. මට කිසි දිනෙක අමතක නොවන යමක් ඉගෙන ගැනීමට මම සමත් වෙමි යන හැඟීමක් ඇතිවිය. මා අසලින් රතු දුඹුරුවන් බල්ලා ගමන් කරයි. උගේ හොම්බ හිවලෙකුගේ මෙනි, ඇස් කරුණාවන්තය, වරදක් කළ එකකුගේ මෙනි.

"මේ බල්ලාවත් අපි හදාගන්නවද?"

"ඉතින් ඒකට මොකද? උෆ අප ළඟ හිටියාවේ. මම උෆටත් පාන් ගෙඩියක් දෙන්නම්, මා ළඟ පාන් ගෙඩි දෙකක් ඉතුරු වෙලා තියෙනවා. අපි මේ බංකුවේ වාඩි වෙමු. මට මහන්සියි..."

අපි දෙදෙනා බංකුව මත වාඩි වීමු. බල්ලා අප පාද අසල ලැග පාන් ගෙඩිය සපා කන්නට විය. ආච්චි කතාවක් කියන්නට වූවාය:

"ඔන්න එක යුදෙව් ගැහැනියක් ඉන්නවා. එයාට දූ පුතුන් නව දෙනෙක්: පුංචි, පුංචි ළමයි. මම ඇගෙන් අහනවා: මොයිසේවිනා ජීවිතේ කොහොමද? එතකොට

එයා මෙහෙම කියනවා: දෙවියන් වහන්සේගේ කරුණා මහිමයෙන් ජීවත් වෙනවා. වෙන කොහොමද?"

මම ආච්චිගේ උකුළට හිස තබාගෙන උණුසුම් වී නිදා ගත්තෙමි.

ජීවිතය යළිත් වේගයෙන් ගලා යන්නට විය. හැමදාම වින්දනය කරන හැඟීම් සම්භාරය නිසා අධ්‍යාත්මයට දිනපතාම අලුත් දෙයක් ලැබිණි. ඒවා නිසා උද්දාමයත්, බියත්, අමනාපයත් ඇතිවූයෙන් මට කල්පනා කිරීමට සිදුවිය.

ඉක්මනින් මමත් කොර ගසන තරුණිය නිතර මුණ ගැසීමට උත්සාහ කළෙමි. ඇයත් සමඟ කතා කිරීමට හෝ ඇය අසලින් බංකුවේ වාඩි වී සිටීමට හෝ ඉදිරිපත් වුණෙමි. එලෙස නිහඬව ඇය අසලින් වාඩිවී සිටීම ප්‍රිය උපදවන දෙයකි. ඈ පිරිසුදු කිරිල්ලියක මෙන් වූවාය. දොන් පෙදෙසේ කොසාකයන් ජීවත්වන්නේ කෙසේදැයි ඇය විස්තර කළේ සිත් ඇද ගන්නා ආකාරයටය. ඈ දොන් පෙදෙසේ ඇගේ මාමා කෙනෙකු වන යාන්ත්‍ර ශිල්පියකු ළඟ නැවතී සිට යකඩ වැඩ ශිල්පියකු වන ඇගේ පියාත් සමඟ පසුව නිෂ්නි නගරයට පැමිණියාය.

ඇගේ තවත් මාමා කෙනෙක් සාර් රාජ මාලිගාවේ සේවය කරයි.

උත්සව දවස්වලදී හවස් කාලයට නගර වැසියෝ මහා මගට බසිති. තරුණ තරුණියෝ සුසාන භූමියට ගොස් සමූහ ගීත ගයති. වැඩිහිටි පුරුෂයෝ තැබෑරුම් ගානේ යති. මහ පාරේ ඉතිරි වන්නේ ගැහැනුන්, කොල්ලන් සහ කෙල්ලන් පමණකි. ගැහැනු වැලි පොළොවේ වාඩිවී නැතිනම් බංකු මත වාඩිවී, අල්ලාපයෙහි යෙදී සිටිති. කෑ කෝ ගසති. බැණ ගනිති. කොල්ලෝ හැංගි මුත්තන් කෙළිති. මවුවරු පුතුන්ගේ ක්‍රීඩා නරඹමින්, දක්ෂ අයට පසසමින්, අලස අයට විහිළු කරමින් දිරි දුන්හ. දෙකන් බිහිරි කරවන ඝෝෂාවක් සහ ප්‍රීතියක් දසත පැතිරිණි. වැඩිහිටි අයගේ 'අවධානය' නිසා අප තුළ උද්දාමයක් ඇති විය. ක්‍රියාවල ඉතා සුළු දෙයක් වුවද, විශේෂ ජීවයක් ඇති කෙනෙක් උග්‍ර තරගයක් හට ගත්තේය. අප සිත් කොතරම් තදින් ක්‍රීඩාවට ඇදී ගියද, අපි කොස්ත්‍රොමා,

චූර්කා සහ මම හිටි හැටියේම කොර ගසන තරුණිය ඉදිරියට ගොස් වහසි බස් දොඩවමින් හපන්කම් ගැන කීමට අමතක නොකළෙමු.

"ලුද්මීලා දැක්කද ලී කෑලි පහක් එක ලී කැල්ලෙන් ගහල වට්ටපු හැටි?"

ඈ මිහිරි ලෙස මඳහස පා කීප වරක්ම හිස වනයි.

ඉස්සර අපේ කොලු රැළ එකට එක්වී සමඟිව ක්‍රීඩා වල යෙදුණද, දැන් චූර්කා සහ කොස්ත්‍රොමා එකිනෙකාට ප්‍රතිමල්ලව කණ්ඩායම්වලට වැටී කඩිසරකම, ශක්තිය ආදිය එකිනෙකාට එරෙහිව පෙන්වමින් කඳුළු වගුරවමින් සහ පොරකමින් තරඟ කළහ. දවසක් දා ඔවුන් දෙදෙනා කොතරම් නපුරු දරුණු ලෙස පොරකෑ හෙයින්, ඔවුන් නතර කිරීමට වැඩිහිටියන්ට සිදුවිය. මේ දෙදෙනාට බල්ලන්ට මෙන් වතුර වත් කළහ.

ලුද්මීලා බංකුවේ වාඩිවී, නිරෝගී පය පොළොවේ හප්පන්නට වූවාය. පොර කුකුළන් දෙදෙනා ඇය ළඟට ගිය විට, ඈ සැරයටියෙන් ඔවුන් දෙදෙනා තල්ලු කරමින් බියෙන් කෑ ගැසුවාය.

"පොරකෑම නවත්වා පල්ලා!"

ඇගේ මුහුණ සුදු නිල් පැහැගෙන තිබුණු අතර, ඇගේ දෙනෙත් පහතට වැටී මලානික විය. ඈ කෑගැසුවේ බියජනක ලෙසිනි.

වරක් චූර්කාත් සමඟ ගරද්කී ක්‍රීඩාවක යෙදී අන්ත පරාජයකට පත්වූ කොස්ත්‍රොමා ධාන්‍ය වර්ග විකුණන කඩයක බාර්ලි දමන විශාල ලී පෙට්ටියකට පසුපසින් රිංගා ගෙන, එහි සැඟවී නිහඬව අඬන්නට විය. එය බැලීම පවා ත්‍රාසජනක සිද්ධියකි. ඔහුගේ දත් එකට ගැටී තිබිණි. හකු ඇට ඉදිරියට නෙරා ගොසිනි. කෙට්ටු මුහුණ ගල් ගැසිලාය. ඔහුගේ කළුවන් විශාල දෙනෙතින් කඳුළු කැට කඩා වැටිණි. මා ඔහු අස්වසාලීමට තැත් කළ විට ඔහු ඉකි ගසමින් මුමුනන්නට විය:

"ඉඳපන්... මම උගේ ඔළුවට ගඩොල් කැටයකින් ගහනවා.... බලාපන්කෝ!..."

චූර්කා අධිමානයක් ඇතිකරගෙන, ඉක්මනින් විවාහ වීමට සූදානම් වන මනමාල තරුණයන් මෙන් පාර

මැදින් ගමන් කළේ, කබායේ කරපටිය ඔසවා ගෙන, දෑත් සාක්කුවල ඔබා ගෙනය. දත් දෙපෙළ තදින් වසාගෙන කතා කිරීමට උගත් ඔහු වරක් මෙසේ පොරොන්දු විය:

"ඉක්මනින් සිගරැට් බොන්න ඉගෙන ගන්නවා. දෙපාරක්ම සිගරැට් බිව්වා. මට වමනෙ ගියා, බඩ දඟලන්නට වුණා..."

මේ සියල්ල මගේ සිත් නොගත්තේය. මගේ සගයකු නැතිවන සැටි දුටු මම මෙයට වරදකාරිය ලුද්මිලා බව තීරණය කළෙමි.

වරක් හවස මිදුලට වී මවිසින් ගෙවල් ගානේ ගොස් එකතු කරන ලද ඇට කටු, පරණ රෙදි කැලි සහ සුන්බුන් වෙන් කරමින් සිටින විට, ලුද්මීලා මා ළඟට විත්, දකුණු අත වනා කතා කළාය:

"ආයුබෝවන්!" යැයි කී ඕ තෙවරක්ම හිස වැනුවාය. "කොස්ත්‍රොමා ඔයත් සමඟ ගියාද?"

"ඔව්..."

"චුර්කාත් ගියාද?"

"චුර්කා දැන් අපිත් එක්ක මිත්‍රකම් පවත්වන්නෙ නැහැ. මෙයට වරදකාරිය ඔයා තමයි. උන් දෙන්නාම ඔයාට ආදරය කරන්න පටන් අරගෙන පොරකනවා..."

ඇගේ මුහුණ රතු වූ අතර, ඇය පිළිතුරු දුන්නේ හාස්‍යජනක ලෙසිනි:

"මදෑ කොළා! මා කළ වරද කුමක්ද?"

"ඔයා ඒගොල්ලන් ලවා ආලය කරවා ගන්නෙ මොකටද?" මම ඇසුවෙමි.

"මට ආලය කරන්නයි කියල මම ඒ ගොල්ලන්ට කිව්වේ නැහැ." කෝපයෙන් එසේ කී ඈ ඉවත යන අතර මෙසේ ද පැවසුවාය. "මේවා සේරම මහා මෝඩ වැඩ. මම ඒ දෙන්නට වැඩිමල්. මගේ වයස අවුරුදු දාහතරයි. වැඩිමල් කෙල්ලන්ට බාල කොල්ලෝ ආලය කරන්නේ නැහැ..."

"ඔයා දන්න ඉලව්වක් නැහැ! හ්ලීස්ට්ගෙ නංගී කඩකාරිය ඔයාට වැඩිය කොච්චර වැඩිමල්ද, ඒ වුණාට ඒකි බාල වයස්කාර කොල්ලන් සමඟ ඇවිදිනවා නොවැ!" මා කිව්වෙ ඇය කුප්පාලන අටියෙනි.

ලුද්මීලා නොණ්ඩි ගසමින් මා ළඟට ආවේ හැරමිටිය වැලි සහිත බිමට අනිමිනි.

"නුඹ දන්න කෙහෙල්මලක් නැහැ" යි ඇය කිව්වේ වේගයෙනි. ඇගේ කටහඬෙහි දොම්නසක් තිබිණි. ඇගේ සුන්දර දෙනෙත් අලංකාර ලෙස දිලිසිණි. 'කඩකාර ගෑනි, වල් ගෑනියක්. මාත් ඒ වගේද? මම වයසින් බාලයි. මාව අත ගෑම කොනිත්තාලීම තහනම්...' නුඹ 'කම්වදාල්කා' නව කතාවේ දෙවැනි කොටස කියැව්වා නම්, ඔහොම කතාකරන්නෙ නැහැ!" ඕ පැවසුවාය.

ඈ පිටවී ගියේ තරමක කෝපයෙනි. මම ඇයට අනුකම්පා කළෙමි. මා නොදත් සත්‍යයක් ඇගේ වචනවල තිබෙන බව මට හැඟිණි. මගේ සගයන් ඇය කොනිත්තන්නේ මන්ද? ඒ ගොල්ල කියනව ආලය කරනවලු.

පසු දින මා ඇයට කළ වරදට වන්දි ගෙවීමක් වශයෙන්, කොපෙක් හතකට බාර්ලි සීනිවලින් සෑදූ ලොසින්ජර (මේ ලොසින්ජරවලට ලුද්මීලා බොහෝ කැමැතිය) මිලදී ගෙන ඇය හමුවීමට ගියෙමි.

"ඔයාට ඕනද?" මම ලුද්මීලාගෙන් ඇසුවෙමි.

ඈ බොරු කෝපයකින් කතා කළාය.

"යනවා යන්න, මම ඔයත් සමඟ යාළු නැහැ!"

එහෙත්, එසේ කියන අතරම ලොසින්ජර මගේ අතින් ගෙන, මෙසේ කිව්වාය:

"අඩු ගණනේ කඩදාසියකවත් ඔතලා ගෙනාවා නම්, ඔයාගේ අත් කොයිතරම් කිලුටුද!"

"මම සබන් දාලා අත් සේදුවට පැල්ලම් යන්නේ නැහැ."

ලුද්මීලා මගේ අතක් අල්ලා ගත්තේ ඇගේ වියළි, උණුසුම් සහිත අත්වලිනි.

"අත් නරක් වෙලා තියෙන හැටි..." පිරික්සමින් ඕ පැවසුවාය.

"ඔයාගෙ අතේ ඇඟිලිවල පුංචි තුවාල වගේ පැල්ලම් තියෙන්නෙ මොකද?"

"ඒ ඉදිකටු පාරවල්. මම ගොඩාක් මහනවා."

විනාඩි කීපයකට ඉක්බිතිව වට පිට බලා ඈ මට මෙසේ

යෝජනා කළායඃ

"අපි දෙන්නා කොහේ හරි මුල්ලක හැංගිලා 'කම්වදාල්කා' නව කතාව කියවමුද?"

සැඟවීමට ස්ථානයක් බොහෝ වේලාවක් තිස්සේ සෙවූ නමුදු, සොයාගත නොහැකි විය. නාන ගෙදර සෙවූ නමුදු සොයාගත නොහැකි විය. නාන ගෙදර ඉස්සරහ කාමරය ඉතාම උචිත ස්ථානය බව අපි අවසානයේදී තීරණය කළෙමු. එය ඇඳිරි වුවද, ජනේලය අසල වාඩිවිය හැකිය. එම ජනේලය ලෑලි මඩුව සහ බැටළුවන් මරන මස් මඩුව අතර පිහිටි කිලිටි මුල්ලට මුහුණ ලා පිහිටියේය. මේ පැත්තට මිනිසුන් ආවෙ ඉඳ හිටලාය.

ඇගේ රෝගී පය බංකුව මත තබාගෙන නිරෝගී පය බිම දමාගෙන පරණ නවකතා පොත මුහුණට ළං කරගෙන, පොතින් මුහුණ වසාගත්තාක් මෙන් ඈ පොත කියවයි. මට නොතේරෙන එමෙන්ම, කාන්සිය ගෙනදෙන වචන ගොඩක් ඈ වේගයෙන් කියවයි. එහෙත්, මම කැලඹී සිටිමි. බිම වාඩිවී සිටින මට ඈ පොත බැරෑරුම් ලෙස කියවන සැටි පෙනෙයි. ඇගේ සුනිල්වන් දෙනෙත් වේගයෙන් දිවෙයි. සමහර විට දෙනෙත්වල යම්තමින් කඳුළු තිබෙන සැටි දැකිය හැකිය. වරෙක ඇගේ කටහඬ සැලෙයි. තවත් වරෙක තේරුම් ගත නොහැකි ලෙස එකට බැඳුණු වචන ඇය කියවන්නේ වේගයකිනි. එසේ වුවද, මම ඒ වචන අහුලාගෙන ඒවායින් කවි ගෙතීමට යුහුසුලු වෙමි, ඒ වචනවලින් නොයෙක් හරඹ කරමි. ඇය කියවන කතාව කුමක් ගැනද යනු වටහා ගැනීමට මගේ කවි පබැඳුම මටම බාධාවෙකි.

මගේ දණහිස් මත ඔළුව තබාගෙන බල්ලා නිදි කිරා වැටෙයි. මා උෆට ව්යේතර් (සුළඟ) යන නම තබා ඇත්තේ උෆ දිගැති ලොමින් වැසුණු, සුළඟ මෙන් වේගයෙන් දුවන. සරත් සමයේ බටයකට වදින සුළඟ මෙන් හඬ නඟන බැවිනි.

"ඔයා අහගෙන ඉන්නවද?" ඈ මගෙන් අසයි.

මම නිහඬව හිස වනමි. ඇගේ කටින් පිටවන වචන නිසා මගේ හැඟීම් කිපෙයි. අහසේ දිලිසෙන තරු මෙන් ලස්සන වචන සහිත ගීතවල ඇති ආකාරය පරිදි ඈ

කියවන වචන පෙළ වෙනස් කිරීම සඳහා මසිතෙහි පැන නඟින අභිලාෂය වඩාත් වැඩිවෙයි.

හවස ඇඳිරිය වැටෙත්ම, පොත මුහුණ දෙසට අල්ලා ගෙන සිටීම නිසා සුදු පැහැගත් ඇගේ දෑත් පහතට දැමූ ලුද්මිලා මෙසේ ඇසුවායඃ

"හොඳයි නේද?..., ඔන්න පේනවද..."

එදා සිට අපි දෙන්නා නාන ගෙදර ඉස්සරහ කාමරයෙහි නිතර වාඩි වී සිටියෙමු. ලුද්මීලා ඉක්මනින්ම 'කම්වදාල්කා' නව කතාව කියැවීම අවසන් කිරීම මගේ සතුටට හේතුවිය. අවසානයක් නැති එම කෘතියෙහි කතා ශරීරය කුමක්ද යන්න ගැන ලුද්මීලාට කීමට මම අපොහොසත් වීමි. එය අවසානයක් නැති කතාවක් වූයේ, අප දෙවැනි කොටසින් පටන් ගෙන තෙවැනි කොටස ආරම්භ කළද, තවත් හතරවන කොටසක් තිබෙන බව ඇය කී බැවිනි.

අයහපත් කාලගුණය ඇති දවසක් වී නම්, එදවස නාන ගෙදර උදුන් රත් කොට, ස්නානය සඳහා පිළියෙල කරන සෙනසුරාදා දවසක් නොවිණි නම්, එය අපේ විශේෂ සතුටට හේතු විය.

වැසි වසින බැවින් කිසිවෙක් ගෙවත්තට නොපැමිණෙති, අප වාඩිවී සිටින ඇඳිරි මුල්ල දෙස නොබලති. අප එසේ මුලුගැසී සිටින සැටි 'දකිතියි' ලුද්මීලා බොහෝ සේ බිය වූවාය.

"එහෙම දැක්කොත් ඒ ගොල්ල සිතන හැටි දන්නවද?" ඕ සෙමින් ඇසුවාය.

පිට මිනිසුන් දකිතියි දැනගත් මමද බිය වීමි. අපි ඒ මුල්ලේ සමහර විට පැය ගණනක් වාඩිවී සිටියෙමු. සමහර දාට මම ඇයට ආච්චි කී කතන්දර කිව්වෙමි. ලුද්මිලා මිද්වියෙදිත්සා නදීබඩ කොසාක්වරුන්ගේ ජීවිතය ගැන විස්තර කළාය.

"අනේ එහි කොච්චර හොඳදැයි" කී ඈ සුසුම් ලෑවායඃ "මෙහෙ මොනවද? මෙහෙ හිඟන ජීවිතය..."

මා වැඩිහිටියකු වූ පසු මිද්වියෙදිත්සා නදී බඩ පෙදෙස බැලීමට අනිවාර්යෙන්ම යමියි මම එදා තීරණය කළෙමි.

ඉක්මනින්ම අපට නාන ගෙදර ඉස්සරහ කාමරය

අවශ්‍ය නොවිය. ලුද්මීලාගේ අම්මා සත්ත්ව ලොම්වලින් හිස් වැසුම් සාදන ස්ථානයක රැකියාවක් සොයාගත්තී, හැමදාම උදෑසන පිටවී ගියාය. ඇගේ නංගී පාසල් ගියාය. ඇගේ අයියා පිඟන් මැටිවලින් තැටි සාදන කම්හලක වැඩ කරයි. වැසි සහිත අයහපත් කාලගුණය ඇති දවස්වලදී මම ඇය පදිංචි කාමරවලට විත් ආහාර පිසීමටත්, කාමර සහ කුස්සිය ඇමදීමටත් ඇයට උදව් වෙමි. එවිට ඈ සිනාසී මෙසේ කියයි:

"ඔයයි මායි ජීවත් වන්නේ හරියට ගෑනියි, මිනිහයි වගේ. එකම වෙනස දෙන්නා දෙපොළක නිදා ගැනීම විතරයි. අපි උන්ටත් වැඩිය හොඳයි, මොකද දන්නවද වෙන පිරිමි උන්ගේ ගෑනුන්ට උදවු කරන්නෙ නැහැ...."

මා ළඟ මුදල් තියෙන දවසක මම සීනි බෝල ආදිය මිලදී ගතිමි. අපි එකතුව තේ බී අනතුරුව සමවාරයට ඇල්වතුර වත්කොට එය හීතල කරමු. සමහර දාට ආච්චිත් පැමිණෙයි. ඇය අපත් සමග වාඩිවී රේන්ද ගොතයි. නැතිනම් යමක වැඩ දමා මසයි. ඉතා ලස්සන කතාන්දර කියයි. සීයා නගරයට ගිය දාට අපේ කාමරයට ලුද්මීලා එයි. එවිට අපි තිදෙන එක්වී ජයට තේ පානය කරමු.

ආච්චි මෙසේ කියයි:

"අපි හොඳට ජීවත්වනවා! අපේ කාසි අපට ඕනෑ හැටියට වියදම් කරනවා!"

ආච්චි අපේ මිත්‍රත්වයට අනුබල දුන්නාය.

"කොල්ලෙක්, කෙල්ලක් සමඟ යාළු වෙන්න ඕන. ඒක හොඳ වැඩක්... නමුත් 'දඟ කරන්ට' එපා."

ඈ 'දඟ කිරීම' යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි අපට ඉතා සරල වචනවලින් විස්තර කළාය. ඈ සුන්දර ලෙසත්, ආස්වාදයෙන් යුතුවත් කතා කළාය. මලක් පිපීමට පෙර එය පොඩි නොකළ යුතුය, නැතිනම් එයින් සුවඳක් වහනය නොවන්නාක් සේම, පලතුරු හට නොග නී. මෙය මට යසට වැටැහිණි.

අප දෙදෙනාට දඟ කිරීමට සිතක් නොවීය. එහෙත්, සාමාන්‍යයෙන් කවුරුත් නිහඬ වන දේ ගැන ලුද්මීලා සමඟ කතා කිරීමට එය මට බාධාවක් නොවීය. අප කතා කළේ සත්තකින්ම අවශ්‍යතාව පැන නැඟීම අනුවය.

මන්දයත්, ලිංගික සබඳතාවන් එහි ඉතාම ගොරහැඩි ස්වරූපය අනුව නිතර පාහේත්, දැඩි ලෙසත් අපි ඉදිරියේ පෙනුණු අතර, එය අපට ඉතා බරපතළ ලෙස හිත් අමනාපයක් ගෙන දුන් බැවිනි.

ලුද්මිලාගේ පියා වයස හතළිහක් පමණැති කඩවසම් මිනිසෙකි. උඩු රැවුළකින් හෙබි ඔහු එක්තරා අපූරු තාලයකට ජයග්‍රාහි ලෙස ඇහි බැමි නැටවීය. ඔහුගේ හිසකේ කැරැලි ගැසිලාය. ඔහු පුදුමාකාර ලෙස නිහඬවී සිටියේය. ඔහු කටහැර කතාකළ වචනයක්වත් මට නම් මතක නැත. ළමයින් සුරතල් කරන විට පවා ඔහු ගොළුවකු සේ හඬ නැඟීය. ඔහු බිරිඳට තැළුවෙත් නිහඬවය.

උත්සව දවස්වලදී හවසට ඔහු නිල් පැහැති කමිසයක් සහ වෙල්වට් කලිසමක් හැඳ, ඉතා හොඳින් මැද්ද 'සපගී' පාවහන් පය ලා ගෙන හම් පටියක් සහිත විශාල 'ගර්මෝනිකා' ඇකෝඩියනයක් කරේ දමා ගෙන මහ මඟට ගොස්, සෙබළකු 'රැකවල් මුර සේවයේ' යෙදෙන පරිදි සිට ගනී. එවිටම වාගේ අපේ ද්වාරය අසලින් ගී ගයමින් ඇවිදින්නෝ පිය නඟති. තරුණියෝ සහ ගැහැනු ඔහු අසලින් තාරාවියන් සේ ගමන් කළෝ, සමහරු යෙව්සේයෙන්කෝ දෙස යැටැසින්ද, අන් සමහරු ගිජු නෙතින්ද බැලූහ. පහළ තොල දිගු කරගෙන යෙව්සේයෙන්කෝ ඔවුන් දෙස බලන්නේ, ඔහුගේ කළුවන් දෙනෙත් නටවමිනි. ඔවුන් නිහඬව දෙනෙතින් කරන මෙම සම්භාෂණයෙහි කිසියම් අප්‍රියජනක සුනඛ ගතියක් තිබිණි. ඔහු අසලින් සෙමින් ගමන් කරන ඒ කාන්තාවන්ගෙන් ඕනෑම එකියක්, ඔහු අධිපති ලෙස ඇසක් අඩවන් කළහොත්, මහ පාරේ කුණු සහ වැලි කැට නොතකා සම්පූර්ණයෙන්ම වහලියක් සේ යටත්වී දණ ගැසීමට සූදානම් බවක් පෙන්නුම් කළාය.

"ඇස් දෙක නෙරවා ගෙන බලන හැටි ලජ්ජා නැති බලු හොම්බා!" ලුද්මීලාගේ මව ඔහුට බැණ වදියි. දිගැති අපිරිසිදු මුහුණක් සහිත ඈ සිහින්ය, උසැතිය. උණසන්නිපාතයෙන් ඉක්බිතිව ඇගේ කොණ්ඩය කොටට කපලාය. ඈ අතුගෑම නිසාම ගෙවී ගිය ඉදලකට සමාන වූවාය.

මහ පාරෙන් ඇගේ අවධානය වෙනත් අතකට යොමු කිරීමට අසාර්ථක ප්‍රයත්නයක් දරන ලුද්මීලා මුරණ්ඩු ලෙස යමක් ගැන විමසයි.

"අහකට පල, නපුරු නොණ්ඩි අවාසනාවන්ත කෙල්ලේ!" ඒ වර ඇය දියණියන්ට බැණ වැදුණේ නොසන්සුන් ලෙස ඇසිපිය හෙළමිනි. මොන්ගෝලියානු හැඩය ඇති ඇගේ දෙනෙත් පුදුමාකාර ලෙස සුදු පැහැතිය, අචංචලය. ඒවා යම් කිසිවක පැටලී සදහටම එකතැන රැඳී ඇතිවාක් මෙනි.

"අම්මා තරහ වෙන්න එපා! කොහොම වුණත් බලන්නකෝ අර වෙළෙන්දිය ඇඳලා ඉන්න හැටි!" ලුද්මීලා ඇයට කියයි.

"තොපි තුන්දෙනා මට නොහිටින්න මාත් හොඳට අදිනවා. නුඹලා මගේ මස් කාලා ලේ බීවා" යැයි අනුකම්පා විරහිතව ඇය කිව්වේ අඬන්නාක් මෙනි. රෙදි වෙළෙන්දාගේ විශාල, තරබාරු වැන්දඹුව දෙස දෙනෙත් මහත් කැරැගෙන ඕ බැලුවාය.

ඇය හැඩහුරුකමින් කුඩා නිවෙසකට සමානය. ඇගේ දෙතන පියස්සක හැඩයට පහත වැටී ඉදිරියට නෙරා ඇත. ඇගේ රතුවන් මුහුණ අඩක් වැසෙන සේ කොළ පැහැති ලේන්සුවක් බැඳලාය. ඇගේ එම මුහුණ හිරු රැස් වැටෙන පියසි කවුළුවට සමාන බවක් දැරීය.

යෙව්සේයෙන්කෝ ඇකෝඩියනය වාදනය කරයි. එහි සංගීත යතුරු බොහෝය. ඒවායින් පිටවෙන හඬ කොහේදෝ ඈතට දිවෙයි. මහ පාරේ ගමන් කරන ළමයි සංගීතකාරයාගේ පාමුලට විත් වාදනයට සවන් දෙමින් අති මහත් වින්දනයක් ලැබ ගල් ගැසුණාක් මෙන් සිටිති.

"හිටපිය. මම තොගේ බෙල්ල කඩා දමන්නම්" යෙව්සේයෙන්කෝගේ බිරිඳ සැමියාට පොරොන්දු වෙයි.

ඔහු නිහඬව ඇය දෙස බලා ඔරවයි.

වෙළෙන්දාගේ බිරිඳ හ්ලීස්ට්ගේ කඩය අසල වූ ගලක වාඩිවී හිස පාත්කරගෙන රාගාන්විත ලෙස සංගීතයට සවන් දෙයි.

සුසාන භූමියට එහා හවස සූර්යාලෝකය කෙමෙන් අඩුවීමට පටන් ගෙන ඇත. ලස්සනට හැඳ පැලඳගෙන

මිනිසුන් ගඟෙක පාවී යන කුට්ටි මෙන් ගමන් කරති. උණුසුම් වාතය බී සුරතල් ලෙස මත් වූ ළමයි කරකැවෙමින් පා නඟති. හිරු රැස් නිසා රත්වූ පස් කැට තියුණු ලෙස හුස්ම ගන්නාක් මෙනි. මස් මඩුවේ ලේවල සුවඳ විශේෂයෙන් දැනිණි. සත්ත්ව ලොම් පදම් කරන්නන් පදිංචි ගෙවල් පෙළෙහි තියුණු මේදස් ගඳක් වහනය විය. ගැහැනුන්ගේ කතාබහද, බේබදු පුරුෂයන්ගේ ගෙරවිලිද, රැව්දෙන ළමා හඬද, ඇකෝඩියනයේ බැරැඩ් වාදනයද හැම දෙයක්ම එකට කැටිවී හඬක් ඇති කරවයි. විඩාවෙන් තොරව නිර්මාණයෙහි යෙදී සිටින පෘථිවිය බලවත් ලෙස ආශ්වාස කරන සැටියෙකි. ගොරහැඩි හැම දෙයක්ම දොට්ට පැනලාය. ලජ්ජා රහිත ලෙස මෘග ඒ අධම ජීවිතයට විශාල ශක්තිමත් හැඟීමක් ඇද ගන්නාක් මෙනි. ඒ අධම ජීවිතය ස්වයං ශක්තියෙන් එය බදා අල්ලා ගනිමින් පාළු ගතියෙන් සහ නොසන්සුන්තාවකින් යුතුව එය තම අතිරේක ශක්තිය කොහේ යෙදවිය යුතු දැයි සොයා බලයි.

අවට කෑකෝ ගැසීම් මැඩගෙන පැන නඟින විශේෂ බිහිසුණු වචන හඳවතට ඇතුළු වන්නේ සඳහටම හඳවතෙහි සහ මතකයෙහි ඒවා තැන්පත් කරවමිනි:

"හැම දෙනා, එකකුට පහර දිය යුත්තේ එකවර නොවේ. එක, එකා බැගින් පෙළ ගැසෙමිනි..."

"අපට අප හැරුණු විට අනුකම්පා කරන්නෝ වෙනත් කවරහුද?"

"දෙවියන් වහන්සේ ගැහැනිය මැව්වේ විහිළුවට නේද?"

රාත්‍රිය ළංවත්ම වාතය සිසිල් වෙයි, හඬ තුනී වෙයි. ලීමුවා ගෙවල් සෙවණැල්ලේ ආවරණය ලබමින් වැඩී පිම්බුණු විටෙක මෙනි. සමහර ළමයින් නිදි ඇඳට දැමීම පිණිස ගෙනගිය අතර, සමහර ළමයි ගෙවැට අසල තම මවුවරුන්ගේ දෙපා ළඟ නැතිනම් දණහිස් මත නිදාගත්හ. ලොකු ළමයි රාත්‍රි වත්ම වඩාත් සන්සුන්ව, මෘදු බවට පත්වෙති. යෙව්සේයෙන්කෝ කාටත් නොපෙනීම අතුරුදහන් වෙලාය. වෙළෙන්දාගේ බිරිඳද පෙනෙන්නට නැත. බැරැඩ් ඇකෝඩියනයේ හඬ සුසාන භූමියටත්

එපිටින් ඇසෙන්නට විය. ලුද්මීලාගේ මවු පිටි කොන්ද දෙකට නමාගෙන බැළලියක සේ බංකුව මත වාඩිවී සිටී. මගේ ආච්චි අසල්වැසි වින්නඹු අම්මා කෙනෙකු සහ ඇගේ දුර නෑයකු වන නැබුළු විශාල ගැහැනිය වෙත තේ පානය සඳහා ගියාය. ඇගේ නහය තාරාවියකගේ මෙනි. මිනිහකුගේ මෙන් ඇගේ පෙතැලි පපුවේ "මියයන මිනිසුන් බේරා ගැනීම නිසා" ඇයට ලැබුණු රන් පදක්කම එල්ලා ඇත. වීදියේ හැම දෙනෙක්ම ඇයට බිය වූහ. ඇය විජ්ජාකාරියක් ලෙස සිතූහ. විශාල ගින්නක් හටගෙන තිබුණු වේලාවකදී ඈ ළමයින් තිදෙනකු හා යුද්ධ හමුදාවේ කර්නල්වරයකුගේ රෝගී බිරිඳක් බේරාගත් බව කියති.

ආච්චිත් ඇයත් අතර ඇත්තේ මිත්‍රත්වයෙකි. ඔවුහු මහ පාරේදී මුණ ගැසෙන විට, ඇත සිටම එකිනෙකා දෙස බලා ගෙන ඉතා සුහද සිනා පාති.

කොස්ත්‍රොමා ලුද්මීලා සහ මමත් ගෙවැට අසල බංකුවෙක වාඩි වී සිටිමු. චූර්කා ලුද්මීලාගේ සොහොයුරාට මල්ලව පොර ක්‍රීඩාවට එන ලෙස යෝජනා කරයි. ඔවුහු එකිනෙකා බදාගනිමින් වැලිගොඩ මත දඟලමින් දූලි නංවති.

"නවත්වාපල්ලා!" යැයි ලුද්මිලා ඉල්ලා සිටින්නේ බියෙනි.

ඇය දෙස තමාගේ කළුවන් දෙනෙත් එල්ල කරගත් කොස්ත්‍රොමා පැසුණු හිසකේ සහ කපටි නෙත් ඇති, මුළු මහත් කම්කරු ජනවසමේම අපකීර්තියක් ලබා සිටින කලීනින් නමැති දඩයක්කාරයා ගැන කියයි. ඔහු මේ නොබෝදා මිය ගියේය. ඔහුගේ මළ සිරුර සහිත පෙට්ටිය වළ දැම්මේ නැත. ඒ වෙනුවට, අනික් අය වළලා ඇති පෙදෙසට ඈතින් පස් උඩ තැබීය. ඔහුගේ සිරුර බහා ඇති මිනී පෙට්ටිය උසැති පාද මත තබා ඇත. එහි පියනේ සුදු තීන්තෙන් කුරුසියක්ද, හෙල්ලක්, පොල්ලක් සහ මිනී කටු දෙකක්ද ඇඳලාය.

සෑම රාත්‍රියකදීම, දඩයක්කාර මහල්ලාගේ සිරුරට පණ ලැබේ. එවිට එය සුසාන භූමිය පුරා ඇවිදිමින් කුකුළා හඬලන තුරු යමක් සොයයි.

"ඔය වගේ භයානක කතා කියන්න එපා!" ලුද්මීලා ඉල්ලා සිටියි.

"පොඩ්ඩකට ඉඩ දීපන්!" යැයි මල්ලවපොර බදිමින් සිටින චූර්කා ලුද්මීලාගේ සහෝදරයාගෙන් අයැද. කොස්ත්‍රොමා දෙස උපහාසාත්මක ලෙස බලා මෙසේ කියයි: "මොකටද පල්බොරු ඇද බාන්නෙ? මම මගේම ඇස් දෙකින් දැක්කා එයාගේම මිනී පෙට්ටිය වළ දාපු හැටි. වළ උඩ හිස් මිනී පෙට්ටියක් තියල. එය සිහිවටනයක් හැටියටයි. මළ මිනිහා ඇවිදිනවායි කියන කතාව බේබදු යකඩ කම්මල්කාරයෝ හදාපු එකක්..."

කොස්ත්‍රොමා ඔහු දෙස නොබලාම කතා කළේ කෝපයෙනි:

"එහෙමනම් මිනී පිට්ටනියට ගිහිල්ලා මිනීවළ උඩ නිදාගනින්!"

කොල්ලෝ දෙදෙනා තර්ක කරන්න ගූහ. ලුද්මීලා පාළු ගතියකින් හිස වැනුවා, මවුගෙන් විමැසුවාය:

"අම්මේ, රෑට මළ මිනී ඇවිදිනවද?"

"ඇවිදිනවා." ඇය කීවේ ස්ථිර ලෙසිනි. ඇගේ කටහඬ ඈත සිට රැව්දිණි.

කඩේ මුදලාලිගේ තරබාරු පුත් වල්යොක් පැමිණියේය. විසි හැවිරිදි තරුණයකු වන ඔහුගේ දෙකොපුල් රත් පැහැතිය. ඔහු අපේ විවාදයට සවන් දී මෙසේ යෝජනා කළේය:

"නුඹලා තුන්දෙනා අතරෙන් එළිවන තුරු මිනී පෙට්ටිය උඩ ලැගලා ඉන්න කැමැති කවුද, ඔහුට මම කොපෙක් දහයේ කාසි දෙකකුයි, පැපිරොස් සිගරට් දහයකුයි දෙනවා. බිය වුණොත් කැමැති තරම් කනේ පාර කන්න පුළුවනි. කවුද කැමති?"

ලජ්ජාවට පත් හැම දෙනම නිහඬව සිටියෝය:

"මොන මෝඩ කතාද? ළමයින්ව ඔය වගේ වැඩකට පොලඹවන්න පුළුවන්ද?" එසේ කිව්වේ ලුද්මීලාගේ අම්මාය.

"රූබලයක් දෙනවානම් මම ලෑස්තියි" චූර්කා බැරෑරුම් ලෙස යෝජනා කළේය.

එවිටම කොස්ත්‍රොමා නපුරු ලෙස ප්‍රශ්න කළේය.

"කොපෙක් විස්සකට බයද?" ඔහු අනතුරුව වල්යොක්ට මෙසේ කිව්වෝය: "නුඹ එයාට රූබලයක් දීපන්. කොහොමටත් ඔහු යන එකක් නැහැ. නිකම් බොරුවට පිම්බෙනවා විතරයි..."

"හොඳයි, ගනින් මෙන්න රූබලය!"

චූර්කා නිහඬව යන්නට ගියේය. කොස්ත්‍රෝමා කටට ඇඟිල්ලක් දමා දෙකන් බිහිරි කැරවෙන සේ උරුවම් බෑවේය. එවිට ලුද්මීලා බියගත් සිතින් කතා කළාය:

"අනේ දෙවියනි, කොයිතරම් ලොකු පුරසාරම් කාරයෙක්ද.... මෙහි තේරුම කුමක්ද?"

"මොන නිවටකමක්ද!" වල්යොක් නරුම ලෙස කියා මෙසේද එකතු කළේය: "මේ බළල් පැටවු මේ වීදියේ ප්‍රධාන පොර කුකුළන් හැටියට සිතා සිටිනවා."

ඔහුගේ නරුමාලාප ඇසීම අපේ ඉමහත් අමනාපයට හේතු විය. බඩ කට පුරා කා බී සිටි මේ තරුණයා අපේ සිත් නොගත්තේය. ඔහු නිතරම අපේ කොලුරැළ එකිනෙකාට විරුද්ධව කෙටවීය. තරුණියන් සහ ගැහැනුන් ගැන ඉතා නින්දිත කතා කියමින් ඔවුන් කුපිත කැරැවීමට ඔහු අපට උගැන්වීය. බාලයෝ ඔහුගේ අණ පිළිගෙන ක්‍රියා කිරීමට ගොස් සෑහෙන වන්දි ගෙවූහ. ඔහු කිසියම් හේතුවක් නිසා මගේ බල්ලාට වෛර කළ අතර, උෆට ගල් ගැසීය. වරක් උෆට ඉදිකටු සහිත පාන් කෑල්ලක් දුන්නේය.

ඉවත යන චූර්කා නිසා මසිත ඇතිවූයේ වඩාත් විශාල අනුකම්පාවෙකි.

"මට රූබලයක් දීපන්. මා යනවා...." මම වල්යොක්ට කිව්වෙමි.

ඔහු මා සිනාවට ලක් කරමින් මා බිය කරන්නේ ලුද්මීලාගේ මවට රූබලයක් දීමට තැත් කළේය. එවිට ගැහැනිය දැඩි ලෙස කතා කළාය.

"මට ඕනත් නැහැ. මම යන්නෙත් නැහැ..."

ඕ කෝපයෙන් ඉවතට ගියාය. ලුද්මීලාත් මුදල් ගැනීමට ඉදිරිපත් නොවූවාය. එවිට වල්යොක්ගේ නරුමවාදී හැසිරීම තවත් වැඩිවිය. ඔහුගෙන් මුදල් නොඉල්වා මා යාමට සැරසෙන විට, ආච්චි පැමිණ තතු විමසා බලා, රූබලය ගෙන මා අමතා සන්සුන් ලෙස කතා කරන්නී,

මෙසේ පැවසුවායඃ

"නුඹ ශීත කබාය ඇඳ ගනින්, කම්බිලියකුත් අරගනින්, නැතිනම්, උදේ පාන්දර වන විට හීතල වැඩි වෙන්න පුළුවනි"

මට කිසි නරකක් සිදු නොවන බවට දැඩි විශ්වාසයක් ආච්චිගේ කතාව නිසා මට ඇති විය.

මිනීපෙට්ටිය උඩ වැතිරගෙන හෝ වාඩි වී හෝ මා සිටිය යුතු යැයිද, මහලු කලීනින් මිනීවළෙන් නැඟිට්ටත් මා සිටි තැනම සිටිය යුතු යැයිද, කියමින් වල්යොක් මට කොන්දේසි ඉදිරිපත් කළේය. මිනීවළ මත සිටින මා පස් ගොඩැල්ලෙන් පහතට පැන්නොත් පරාජය වන බවද හේ මට දැනුම් දුන්නේය.

"නුඹ පරෙස්සම් වෙයන්. මුළු රෑය තිස්සේම මම නුඹ ගැන හෝදිසියෙන් ඉන්නවා."

මා සුසාන භූමියට ළංවත්ම, ආච්චි මට උපදෙස් දුන්නායඃ

"නුඹට හොල්මනක් එහෙම පෙනුණොත් නුඹ හෙළවෙන්නවත් එපා. දේව මෑණියන්ට යාච්ඤා කරපන්..."

මම ඉක්මනින් ගමන් කරමින් එය වේලාසනින් පටන්ගෙන, වේලාසනින් අවසන් කිරීමට ඉටා ගතිමි. වල්යොක්, කොස්ත්‍රොමා සහ තවත් කොල්ලෝ කීපදෙනෙක් මාත් සමඟ ගමන් ගත්හ. මා සුසාන භූමියේ ගඩොල් බැම්ම උඩට නගින විට මා ගෙන ගිය කම්බිලියට පැටලී මම බිම වැටුණෙමි. එහෙත්, මම හණිකට නැඟී සිටියෙමි. වැටට එහා සිටියහු සිනාසුණහ. මගේ පපුවට යමක් ඇනුණු බවක් දැනුණු අතර පිට දිගේ හිරිගඩු පිපෙන්නාක් වැනි හැඟීමක් ඇති විය.

ගාටමින් මිනීපෙට්ටිය වෙත ළං වූයෙමි. ඒ මිනී පෙට්ටිය එක් පැත්තකින් පස් දමා යට කර තිබිණි. අනික් පැත්තෙන් මිනීපෙට්ටියේ පාද එළියට විත් තිබුණේ, කිසිවෙක් එය ඉහළට ඇදීමට තැත් කළ විට එය බිම වැටුණාක් මෙනි. මම එහි ගැට්ට මත වාඩි වීමි. අවට බැල්මක් හෙළීමි. මිනීවළ සහිත පස් ගොඩැලි මත සිටුවා ඇති කුරුස අළු පැහැතිය. ඒ කුරුසවල සෙවණැලි විශාල වී, මිනීවළ

මත වැටී ඇත්තේ ඒවා බදා ගැනීමට මෙනි. මේ කුරුස අතර ඉඳ හිට කඳ සිහින් බිරියෝසා ගස් වැවිලාය. වෙන්, වෙන්ව ඇති මිනීවළ මේ බිරියෝසා ගස්වල අතු නිසා එකට එක්කළාක් වැන්න. මේවායේ සෙවණැලි පොළොව මත ගෙත්තමක් සේ වැටී පැතිරී තිබෙන අතර, බිලින්කි පැළ පොළොවෙන් මතුවී ඉතා බියජනක දර්ශනයක් මවා පායි. දේවස්ථානයේ කුපෝලය හිම ගොඩක් සේ අහස දෙසට නෙරා සිටී. නොසෙල්වෙන වලා සහිත අහසේ හඳ ඉතා කුඩා ලෙස දිලිසෙයි.

යාස්ගේ පියා "මහලු මනුස්සයා" කුසීත ලෙස මුර සේවයේ සීනුව හඬවයි. ඔහු සීනුවේ ලණුව අදින හැම වාරයකදීම, පියස්සේ යකඩ තහඩුවට එය වැදී දුක් ගැනවිල්ලක් වැනි හඬක් පිටකර අනතුරුව කුඩා සීනුවේ වියළි හඬ පැතිරේ. එය කෙටිය, පාළු ගතියක් ගෙන දෙයි.

"නින්ද විතරක් නැති කරන්නට එපා, දෙවියනේ."

මුරකරු නිතර කියන සැටි මට මතක් විය.

ඉතා බියජනකය. රාත්‍රීය සිසිල් වුවද, මගේ මුළු මහත් සිරුරම ඩහදියෙන් නෑවිලාය. මහලු කලීනින් මිනී වළෙන් ගොඩ එන්නට පටන් ගත්තොත්, මම මුරකරු කුටිය දක්වා දිවීමට සමත් වෙමිද?

මේ සොහොන් පිටිය මම ඉතා හොඳින් දනිමි. යාස් සහ අනිකුත් සගයන් සමඟ මම මෙහි දහ දොළොස් වරක් ක්‍රීඩා කළෙමි. "අන්න අතන දේවස්ථානය ළඟ මගේ මවගේ සිරුර වළලා ඇත."

ජනවසමේ රාත්‍රි නින්දට නොගිය අයද සිටිති. එහි සිට සුසාන භූමිය දක්වා අත්පුඩි ගැසීම්, සිනාසීම්, ගීතවල කොටස් ඇසෙයි. පස් ගොඩැලි මතද, වැලි ගෙනෙන ගල්වල පිහිටා ඇති දුම්රිය මඟෙහි කතීසොච්කා ගමෙහි ඇකෝඩියනයක් හඬ නගයි. වැටට එහා හැමදාම බීගෙන ගමන් කරන යකඩ තළන මියාවෙව් ගීයක් ගයයි. ඔහු ගයන ගීය අනුව මම ඔහු හඳුනා ගනිමි:

අපෙ අම්මත් කළා පවක්,
එහි නම් නැත බරපතළක්.
කිසිවකුට නොකර ආලය,
තාත්තාට පිදුවා ආදරය.

ජීවමය හුස්ම ගැනීම අවසන් වරට ඇසීම පවා සිතට සතුටකි. එහෙත්, සීතුව හඬවන හැම වරකටම ඉක්බිතිව නිහඬතාව වැඩිවෙයි. තැනිතලා ඔස්සේ ගලා බසිමින් හැම දෙයක්ම පාගා ගංගාවක් සේ නිහඬතාව පැතිරේ. සිත ඉමක් නැති, පතුලක් නැති හිස් බවෙහි පාවෙයි. අන්ධකාරයේ නිවීයන ගිනිකුරක ආලෝකයක් සේ එය නිවී අතුරුදහන් වෙයි. ශූන්‍යතාව නමැති මෙම මහා සාගරයේ අපට ළඟා විය නොහැකි තරු පමණක් බැබළෙන අතර, මහ පොළොවේ හැම දෙයක්ම සටහන් නොතබා දිය වී ගොසිනි. ඒවා මිය ගොසිනි. අනවශ්‍යය.

කම්බිලිය පොරවාගෙන දෙපා එරමිණිය ගොතා ගෙනම මිනීපෙට්ටිය මත වාඩිවී සිටියෙමි. බුරුල් වන පස නිසා මිනීපෙට්ටිය පහළ බසින විට මම මුහුණ පල්ලිය දෙසට හරවා ගතිමි.

මට පසුපසින් යමක් හැප්පෙන හඬක් ඇසිණි. දෙවන වරටත් එවැනිම හඬක් ඇසිණි. ඉන් ඉක්බිතිව මා අසලටම ගඩොල් කැටයක් වැටුණේය. එය මා තුළ ඇති කළේ අති මහත් බියෙකි. එය වැටෙන් එහා සිටගෙන මා බිය ගැන්වීමට තැත් කරන වල්යොක් සහ ඔහුගේ නඩයේ ක්‍රියාවක් බව මම වහාම වටහා ගතිමි. එසේවුවද, ඔවුන් මා අසලින් සිටින නිසා මට ඇතිවූයේ සතුටකි.

මට ඉබේටම මගේ මවු ගැන සිහිවිය. දවසක් දා මා සිගරැට් දුම් ඇදීමට තැත් කළ විට, ඈ මට තැළීමට පටන් ගත්තාය. මම ඇයට මෙසේ කිව්වෙමි:

"මට අත තියන්න එපා! ගුටි නොකෑවට මට දැනටමත් අමාරුයි. සිගරැට් බීපු හන්දා මට වමනෙ යන්න එනවා."

දඬුවම් ලැබූ මම පෝරනුවේ පියස්ස මත වාඩිවී සිටියෙමි. අම්මා ආච්චිට මෙසේ තෙපලාය:

"මේ කොල්ලට කිසිම හැඟීමක් නැහැ. කිසිවකුට ඔහු ආදරය කරන්නෙ නැහැ."

එම වචන ඇසීම මගේ අමනාපයට හේතු විය. අම්මා මට දඬුවම් කරන විට ඇය නිසා මසිතෙහි අනුකම්පාවක් උපණි. එමෙන්ම, ඇය නිසා අපහසුවක් දැනිණි. මන්දයත් ඇය සාධාරණ ලෙසත්, වරදෙහි බරපතළකම අනුවත් මට ඉතා කලාතුරකින් දඬුවම් කළ බැවිනි.

පොදුවේ බලන විට ජීවිතයේ අමනාපයට පත්විය හැකි කරුණු බොහෝය. වැටට එහා සිටින නඩය ගැන බලමු. සුසාන භූමියේ මහ රෑ තනිවම ඉදීම බිය ගෙන දෙන වැඩක් බව ඔවුහු ඉතා හොඳින් දනිති. එසේ වුවද, ඔවුන් මා වඩාත් වැඩියෙන් බිය කිරීමට උත්සාහ කරන්නේ කුමක් නිසාද?

ඔවුන්ට ඇසෙන සේ කෑගැසීමට මට සිත්විය:

"යක්ෂයාට පලයව්!"

එය මහා භයානක ක්‍රියාවකි. මන්දයත්, ඒ ගැන යක්ෂයාගේ ආකල්පය කුමක්දැයි දන්නේ කවුරුන්ද? සමහර විට යක්ෂයා මේ ළඟ අහල පහල ඉන්නවා විය හැකියි.

පසෙහි වීදුරු කැට මෙන් විනිවිද පෙනෙන ඛනිජ ද්‍රව්‍යයක් වන ස්ලුඩ් බොහෝය. ඒවා හඳ එළිය නිසා දිලිසෙයි. දවසක් දා ඔකා නදියේ පහුරක් මත වැතිර ගෙන නදී ජලය දෙස බැලූ සැටි මට මතක් විය. එවිට හිටිහැටියේම මගේ මුහුණ අසලට මුහුදු බූවල්ලෙක් ආවේය. එය පැත්තකට හැරුණු විට මිනිස් කම්මුලකට බෙහෙවින් සමාන විය. අනතුරුව එය වටකුරු කුරුලු ඇසකින් බලන විටෙක මෙන් මා දෙස බැලීය. බිම වැටෙන මේපල් කොළයක් සේ එය පසුව වතුරට කිදා බැස යන්නට ගියේය.

මගේ මනැස වඩාත් නොසන්සුන් ලෙස වේගයෙන් ක්‍රියාකාරී විය. ජීවිතයේ විවිධ සිද්ධීන්වලට එය පණ ලබා දුන්නේ මුරණ්ඩු ලෙස බියජනක චිත්‍ර මවා පෑමට විරුද්ධව මා ආරක්ෂා කරන විටෙක මෙනි.

ඔන්න දැන් කුඩා ඉත්තෑවෙක් සෙමින් ඇවිත් පසට උගේ දැඩි අතකින් ගසයි. ඌ ගෙවල්වලට අරක්ගෙන සිටින්නේ යැයි විශ්වාස කරන ගෙවලයාට සමානය. එමෙන්ම, කුඩාය, ගොරසැඩිය.

පෝරනුව ඉදිරිපිට උක්කුටියෙන් වාඩිවුණු ආච්චි ගෙවලයාට අඬගසමින් මැතුරූ සැටිද මට තවමත් මතකය:

"කරුණාබර හාම්පුතේ, කැරපොත්තන් පන්නා දමන්න..."

නගරයට බොහෝ ඈතින් මට නොපෙනෙන පෙදෙසින් අරුණෝදයේ ලකුණු යම්තමින් පෙනෙන්නට විය. උදෑසන ශීත සුළං නිසා කම්මුල් හැකිළිණි. දෙනෙත් වැසිණි. මම කම්බිලිය නවා හිස ඇතුළු සිරුර වටා ඔතා ගත්තෙමි. මොනවා වුණත් කමෙක් නැත.

මා අවදි කළේ ආච්චිය. ඈ මා අසලින් සිටගෙන මගේ කම්බිලිය අදිමින් කතා කරයිඃ

"නැඟිටපන් හීතල හැදුණේ නැත්ද? ඉතින් නුඹ බය වුණේ නැතිද?"

"බය වුණා. ආච්චි කාටවත් කියන්න එපා. කොල්ලන්ට එහෙම කියන්නම එපා"

"නිහඬවන්නේ මොකටද? බයක් නැතිනම් පුරසාරම් දොඩවන්න හේතුවක් නැහැ" යි මවිතයට පත් ආච්චි පැවසුවාය.

අපි ගෙදර බලා ගියෙමු. අතරමඟදී ආච්චි සුරතල් බසින් මා ඇමතුවායඃ

"මගේ හොඳ කොලුපැටියට හැම දෙයක්ම තමා විහින්ම අත්හදා බලන්න ඕන. තමාම ඉගෙන ගන්නේ නැත්නම් කවුරුවත් උගන්වන්න එන්නෙ නැහැ..."

හවස් වන විට වීදියේ 'වීරයා' බවට මම පත්වීමි, හැම දෙනෙක්ම මට ප්‍රශ්න ඉදිරිපත් කරමින් කරුණු විමැසූහඃ

"ඇත්තටම බය වුණේ නැත්ද?"

"බය වුණා" යැයි මා කී විට, හිස් වනමින් ඔවුහු හඬ නැඟූහඃ

"ආ ඔන්න පේනවා නේද?"

කඩකාරිය හඬ නඟමින් සහ ඒත්තු ගන්වමින් කතා කළායඃ

"එහෙනම් කලීනින් නාකියා රෑට නැඟිටිනවා කියපු කතාව අලිබොරුවක්. නැඟිට්ටා නම් කොල්ලා නිසා බයවෙන්නෙ නැහැ නේද? නාකියා කොල්ලාව මිනී පිට්ටනියේ ඉඳලා නොදන්නා තැනකට පන්නා දමාවි." ලුද්මිලා මා දෙස බැලුවේ සුරතල් නෙත්වලිනි. එහි මවිතයක්ද දක්නට තිබිණි. සීයා පවා මගේ ක්‍රියාව නිසා සතුටු වන සැටියක් පෙන්වීය. ඔහු මා වෙත එක්තරා

කරුණාවක් දැක්වීය. චූර්කා පමණක් බැරෑරුම් ලෙස මෙසේ කිව්වේය:

"එයාට ඒ වැඩේ ලේසියි. එයාගෙ ආච්චි මායා කාරියක් නිසා!"

III

අරුණාලෝකය ඇතිවත්ම අහසේ පෙනෙන කුඩා තරුවක් සටහන් නොතබාම නිවී යන පරිදි මගේ මල්ලී කෝල්යා මිය ගියේය. මඩුවේ දර ගොඩ මත නොයෙක් රෙදි කෑලි දමා පිළියෙල කෙරුගත් ස්ථානයෙක අපි තිදෙනා (මම, ආච්චි සහ මල්ලී) නිදාගතිමු. අප අසලින්ම අයිතිකරුගේ කුකුළු කොටුව තිබිණි. හවස් වන විට බඩ පුරා කෑම ගිලගත් කුකුළන් නිදන සැටි අපට පෙනෙයි. උදේ පාන්දර අප අවදි කරනු ලැබුවේ රන් පැහැති කුකුළාගේ හැඬලීම විසිනි.

"කුකුළෝ, තොට හෙණ වදින්න ඕන!" ආච්චි නින්දෙන් අවදිවී බැණ වැදුණාය.

මා නිදා සිටින තැනට මඩුවේ සිදුරු අතුරින් වැටෙන හිරු එළිය දෙස මා බලා සිටින්නේ වැතිර ගත්වනමය. එම ආලෝකයට හසුව රිදීවන් කුඩා දූලි කැට නටයි. එය හරියට සුරඟන කතාවෙක මෙනි. දර ගොඩ යට මීයෝ දඟලති. අවට රතු පැහැති පිට කටුවක් සහ කළු තිත් ඇති බිංකුඩෝ දුවති.

සමහර දාට දර මඩුවේ කුකුළු බෙටි දුගඳ නිසා වේලාසනින් මම මඩුවෙන් පිටතට විත් වහල උඩට නැඟ ගනිමි.

ඔරුකරුවකු හා මූසල සුරා සොඬකු වූ පෙර්මානව්ගේ අවුල්වූ හිසකෙස් වැටිය සහිත හිස ජනේලයෙන් දොට්ට පනී. නිදිබර නිසා තවමත් ඇසි පිය වැසී තිබුණද, හිඬැස් අතරින් හිරු දෙස බලමින් වල් ඌරකු සේ ඔහු නහයෙන් හඬ නගයි. රතු පැහැති හිසකේ අත ගාමින් ගෙයින් පිටතට පැමිණි මගේ සීයා ඇල්වතුරෙන් ඇඟ සෝදාගනු පිණිස නාන ගෙදර දෙසට ගියේය. මුහුණ පුරා වසන්ත ලප ඇති, ගිරා හොටක් වැනි නහයක් ඇති, ගෙදර ස්වාමියාගේ වාචාල කුස්සි අම්මා කොහා පක්ෂියකුට

සමානය. ගෙය අයත් ස්වාමියා තරබාරු මහලු පරවියකුට සමාන යැයි මට සිතේ, හැම මිනිහෙක්ම පක්ෂියකුට, සතකුට නැතිනම් ගොදුරු ගසා කන වන මෘගයකුට සමානය.

උදෑසන මිහිරිය, පැහැදිලිය. එසේ වුවද, මට තරමක දොම්නසකි. කිසිවකු නැති තණ පිටියට යාමට මට සිත්දෙයි. හැමදාම මෙන්ම, අද වැනි පැහැදිලි දවසක් මිනිසුන් දූෂණය කරන බව මම දැන සිටියෙමි.

එක් දවසක මම මඩුවේ වහල උඩ ලැග සිටින විට, ආච්චි මට අඬගසන්නී, හිසෙන් කෝල්යා නිදා සිටි තැන පෙන්වා මෙසේ පැවසුවාය:

"කෝල්යා මැරිලා නොව....!"

මගේ මල්ලීගේ හිස කොට්ටෙන් පහළට රෑටා ගොස්, රෙද්ද මත වැටී ඇත. ඔහුගේ ඇඟ නිල් පැහැතිය. ඔහුගේ මළ සිරුර නිරුවත්ය. ඔහුගේ කමිසය බෙල්ල දක්වා ඉහළට ඇදී තිබිණි. ඉදිරියට නෙරා ඇති බණ්ඩිය උසට පෙනුණු අතර, තුවාල කැළැල් සහිත පාද බකල් ගැසිලාය. ඔහුගේ දෑත් තුනටිය යටට දමා තිබුණේ, ඔහු නැඟිටීමට උත්සාහ ගත් විටෙක මෙනි. හිස යම්තමින් පැත්තකට නැමිලාය.

"දෙවියන්ට පින් අයිති වේවා, ඔහු මිය ගියා." යැයි ආච්චි කිව්වේ හිස පීරමිනි. "ඔහු ජීවත්වුණේ කොතරම් ලොකු දුගී දුප්පත්කමකින්ද?"

සීයා උඩ පැන පැන ආවේ නැට්ටුවකු මෙනි. ඔහු ළංවී මියගිය මල්ලීගේ වැසුණු දෙනෙත් අත ගා බැලීය. එවිට ආච්චි තරහෙන් කතා කළාය:

"අත් හෝදන්නෙ නැතුව අත ගාන්නේ මොකද?"

හේ මුමුනන්ට වූයේය:

"ඔන්න උපන්නා.... ජීවත් වුණා.... කෑවා.... තේරුමක් නැහැ...."

"අවදිවෙනවා," ආච්චි ඔහුට බාධා කරමින් කිව්වාය.

ඔහු අන්ධයකු සේ බලා ගෙවත්තට පා නගන අතර මෙසේ කිව්වේය:

"මිනියේ කටයුතු කරන්න මා අත තඹයක්වත් නැහැ. නුඹට පුළුවන් හැටියට කරගනින්...."

"තුෑ විතරක්! අවාසනාවන්තයා!" ආච්චි සීයාට බැණ වැදුණාය.

එවේලෙහි ගෙයින් පිට වූ මා යළි ආවේ රාත්‍රී වූ පසුවය.

පසු දින උදෑසන කොල්යාගේ මළ සිරුර භූමදාන කළේය. මම අවමංගල්‍ය දේවමෙහෙය සඳහා පල්ලියට නොගොස් යළි හෑරූ අම්මාගේ වළ අසලට වී සිටියෙමි. මාත් සමඟ මගේ බල්ලා සහ යාස්ගේ තාත්තාද සිටියහ. ඔහු මියගිය මල්ලී වළ ලෑම සඳහා ලාබෙට වළ පිළියෙල කර දීමට පොරොන්දු වී, ඒ ගැන උදම් අනන්න විය.

"අඩු මුදලට මේ වගේ වැඩ කරන්නේ ඇඳුනුම්කමට නැතිනම් රූබලයක් අය කරනවා."

මිනී ගඳ වහනය වූ කහවන් මිනීවළ දෙස බැලූ මට, එහි එක් පැත්තක කළු පැහැති, තෙතමුසු ලෑලි කැබැලි පෙනිණි. මා සිට ගෙන සිටි තැනින් යම්තම්වත් සෙලවුණොත්, වළ වටේට ඇති පස් කැට වළ පතුලට වැටේ. මම වුවමනාවෙන්ම දෙපා ඒ මේ අත යැව්වෙමි, පස් වැටෙන්නට සැලැස්වූයෙමි. මගේ අභිලාෂය වූයේ අම්මාගේ මිනී පෙට්ටියේ කැබැලි පසින් වසා දැමීමය.

දුමක් අදිමින් සිටි යාස්ගේ තාත්තා දඟ නොකරන ලෙස මට කීය.

ආච්චි මල්ලීගේ සිරුර බහා ලූ කුඩා සුදු පැහැති මිනී පෙට්ටියක් ගෙනාවාය. යාස්ගේ පියා එය රැගෙන මිනී වළට පැන එය කළු පැහැති ලී කැබැලි අසලින් තබා පිටතට විත්. උදැල්ලෙන් සහ පයින් පස් දමමින් වළ වසා දමන්නට විය. ඔහුගේ දුම් කෝවයෙන් දුම් පිටවූයේ පූජා භාණ්ඩයෙකින් මෙනි. ආච්චිත්, සීයාත් නිහඬව ඔහුට උදව් කළහ. පූජකයෝ හෝ සිඟන්නෝ හෝ නොවූහ. කුරුස ගොඩක් මැද අපි සතර දෙනෙක් පමණක් සිටියෙමු.

සොහොන්පල්ලාට මුදල් දෙමින් ආච්චි දොස් පැවරුවායඃ

"නුඹ මගේ දුවගේ සොහොනට කරදර කළා..."

"එහෙම නැතුව කොහොමද? අනුන්ගේ සොහොන හාරපු නැති එක හොඳා!"

ආච්චි මල්ලීගේ සොහොනට හිස නමා ආචාර කොට සුසුම් ලා අඬා ඉවතට ගියාය. සීයාද ඇය පසු පසින් ගමන්

ගත්තේය. ඔහුගේ හිස නළල දක්වා කැප් තොප්පියකින් වැසිලාය. ඔහු පා නැඟුවේ ගෙවී ගිය උඩු කබාය අදිමිනි.

"සකස් නොකළ බිමෙහි ධාන්‍ය ඇට පැළ කළා වගෙයි." ඔහු කිව්වේය. ඔහු කුඹුරක සිටින කපුටකු සේ ඉදිරියට පනිමින් යන්නට විය.

"සීයාට මක් වෙලාද?" මම ආච්චිගෙන් ඇසුවෙමි.

"එයාට දෙවි පිහිටයි. එයාට අමුතු අදහස් පහළ වෙනවා." ආච්චි පිළිතුරු දුන්නාය.

එදින ගිම්හානයේ උණුසුම් දවසක් වූයෙන්, ආච්චි වැලි ගොඩේ එරෙමින්, දෙපා ගාටමින් අමාරුවෙන් ගමන් කළාය. ඈ හති ලමින් ගමන නවත්වා, ලේන්සුවෙන් මුහුණ පිස දමා ගත්තාය.

මම පරිශ්‍රමයක් දරමින් ඇගෙන් මෙසේ ඇසුවෙමි:

"මිනී වළේ කළු පාටින් පෙනුණේ අම්මාගේ මිනී පෙට්ටිය නේද?"

"ඔව්, ඇගේ එල්ලෙන්න හදන බලුපැටියා... කල් ගතවෙන්නත් ඉස්සෙල්ලා වර්වාරාගේ මිනිය කුණුවෙලා. පස හොඳ නැති නිසා තමයි එහෙම වෙන්නෙ. පස වතුරට ඉඩ දෙනවා. මැටි තිබුණා නම් ඔයිට වැඩිය හොඳට ආරක්ෂා වෙනවා."

"හැම දෙනාම කුණු වෙනවාද?"

"ඔව්. හැම දෙනාම. සුද්දවන්තයන් හැර..."

"ආච්චි නම් කුණු වෙන්නෙ නැහැ!"

ඈ නැවතී මගේ හිස්වැස්ම හරි ගස්වා බැඳුරුම් ලෙස මට උපදෙස් දුන්නාය.

"ඔය වගේ දේ ගැන සිතන්නටවත් එපා. ඇහුණද?"

එසේ වුවද, මම ඒ ගැන සිතුවෙමි.

"මරණය කොතරම් සිත් කලකිරවන වැඩක්ද!"

මගේ සිත ඉමහත් වේදනාවෙකින් පෙළිණි.

ගෙදර පැමිණි පසු සීයා තේ පානය සඳහා මේසය පිළියෙල කළේය.

"බොහොම රස්නෙයි. තේ බොමු. අද මගේ ගානෙ සියලු දෙනාටම තේ දෙනවා."

ඔහු ආච්චි ළඟට වීත්, ඇගේ උරහිසට තට්ටු කොට කතා කළේය.

"ඉතින්, අම්මේ, කොහොමද?"

ආච්චි පිළිතුරු දුන්නේ අතක් ගස්සා දමමිනි:

"ඉතින් මොනවද!"

"ඔන්න ඔහොම තමා! දෙවියන් වහන්සේ අප කෙරෙහි කෝප වෙලා. අපේ කෑල්ලෙන් කෑල්ල කඩා ගන්නවා. අපේ දරු පවුල එක අතක ඇඟිලි වගේ බොහොම ශක්තිමත් ලෙස එකට හිටියා." සීයා දොඩවන්නට විය.

මෙතරම් මුදු ලෙසත්, සාමකාමී ලෙසත් ඔහු කතා කළේ මීට බොහෝ කලකට පෙරදීය. ඔහු මගේ අමනාපය තුනී කරතියිද, මා මිනීවළේදී දුටු කළු පැහැති මිනීපෙට්ටිය ගැන අමතක කිරීමට උදව් වෙතිද මම සිතමි.

එහෙත්, ආච්චි දැඩි ලෙස ඔහු නවත්වාලූවාය:

"තාත්තේ ඕක නවත්වන්න, මුළු ජීවිතේම ඔහොම තමා නුඹ කිව්වේ. ඒ නිසා ලේසි කාටද? නමුත් නුඹ හැම දෙනාවම කෑවේ හරියට මලකඩ යකඩ කන්නා වගෙයි...."

සීයා උගුර පාදා ඇය දෙස බලා නිහඬ වූයේය.

එදින සවස වැව අසලදී ඉමහත් දොම්නසකින් යුතුව මම උදේ දුටු දේ ලුද්මීලාට විස්තර කළෙමි. එහෙත්, එයින් ඇගේ සිත කම්පනයට පත් නොවීය.

"අම්මා, අප්පා නැතිව ජීවත්වීම වඩාත් හොඳයි. මගේ අම්මයි, තාත්තයි මළොත් මම නංගීව අයියට බාර දීලා කන්‍යාරාමයකට ඇතුළු වෙනවා. මම වෙන කොහේ යන්නද? මට දීග යන්න බැහැ. මම නොණ්ඩි කෙල්ලක්. ගෙදර වැඩ කරන්න මට පුළුවන්කමක් නැහැ. මට ඉපදෙන ළමයින් පවා අබ්බගාතයෝ වේවි..."

ඇය කතා කළේ අපේ වීදියේ පදිංචි වෙනත් ගෑනුන් මෙන් ප්‍රඥා ගෝචර ලෙසිනි. එදින සිට ඇය පිළිබඳ වූ මගේ උනන්දුව අතුරුදහන් වූවා විය යුතුයි. අනතුරුව හටගත් සිදුවීම් අනුව මගේ මිතුරිය මම කලාතුරකින් හමුවීමි.

මල්ලීගේ මරණයෙන් දින කීපයකට ඉක්බිතිව, සීයා මට කතාකොට මෙසේ පැවසීය:

"අද වේලාසනින් නිදාගනින්. හෙට දර කඩන්න කැලෑවට යන්න ඕන...."

"එහෙනම් මම බෙහෙත් පැළෑටි කඩාගන්නම්." ආච්චි

පැවසුවාය.

අපේ ජනවසමේ සිට හැතැප්ම තුනක් පමණ ඈතින් පිහිටි කැලෑව යේල් සහ බිරියෝසා ගස්වලින් ගහන විය. ළිපට දැමිය හැකි වියළි ගස් වර්ග බොහොමයක් ඔකා නදියේ අනික් ඉවුරෙහි වැවී තිබිණි. අනික් පසින් කැලෑව මොස්කව් නගරය දක්වා වැටී ඇති මාර්ගය ඔස්සේ පැතිර තිබිණි. කැලෑවටත් ඉහළින් වැවී ඇති සොස්නා ගස්වල මුදුන් මව්ල්වලින් ගහන සතුන්ගේ ශ්‍රීවයන් සිහියට නැංවීය. මේ මහා වනය ෂුවාලොව් සිටුවරයාට අයත් වූ අතර, එය ආරක්ෂා කළේ ඉතා දුබල ලෙසිනි. පහළ මධ්‍යම පන්තික අවරසිකයෝ මේ වනය ඔවුන්ගේ බූදලයක් සේ සලකා, වියළි දර හා අතු කෝටු කඩා ගත් අතර, අවශ්‍ය වූ විට හොඳ ගස් පවා කපා ගැනීමට පසුබට නොවූහ. හිම කාලයට අවශ්‍ය දර එකතු කැර ගැනීම සඳහා සරත් සමය වනවිට මිනිස්සු පොරෝ, කෙටේරි, කඹ සහ පටි රැගෙන වනයට වැදුණෝය.

හරිත රිදීවන් පිනි බිඳුවලින් බැබළෙන අරුණෝදයේ අපි තිදෙන වනයට පිවිස සිටිමු. අපට වම්පසින් ඔකා නදියට එහා ද්‍යාත්ලව් කන්දය. එය රතුවන් පැත්තට එපිටින් පිහිටා ඇත. සුදුවන් නිෂ්නි නිව්ගොරොද් නගරයටත්, හරිත වර්ණ උයන් වතු සහිත කුඩා කඳු ගැටවලටත්, දේවස්ථානවල රන්මුවා කුපෝලවලටත් ඉහළින් රුසියානු කුසීත හිරු පායයි. නිහඬ බොර පැහැති ඔකා නදිය පිසගෙන සන්සුන් සුළඟත් නිදිබර ලෙස හමයි. රන්වන් තුරු අතු පිනි බිඳුවල බර නිසා වැනෙයි. දම්පැහැති කුඩා සීනු වැනි මල් බිමට බරවී ඇත. විවිධ පාටින් යුත් බෙස්මේර්ත්නික් කුසුම් වියළිය. 'රාත්‍රී සුන්දරිය' හැටියට ප්‍රසිද්ධ රතු තරු වැනි කානේෂන් මල්වලින් වනය අලංකාර වෙලාය.

වනයට අප මුහුණ දෙන්නේ අන්ධකාර රාජධානියක් ලෙසිනි. පියාපත් සහිත යේල් ගස් විශාල පක්ෂීනට සමානය. බිරියෝසා තුරු නව යොවුන් තරුණියන් සිහි ගන්වයි. මඩ ගොහොරුවෙන් පැන නඟින ඇඹුල් මුසු සුවඳ වනයේ පැතිරේ. කට හැරගෙන, රෝස පැහැති දිව එළියට දමාගෙන, මා අසලින් දුවන බල්ලා වරෙක

නැවතී, ඉව අල්ලා මවිතයෙන් මෙන් උගේ හිවල් ඔළු ගෙඩිය සොලවයි.

සීයා ආච්චිගේ අත් කොට හැට්ටය දමාගෙන, පැරණි තොප්පියක් හිස ලා ගෙන දෙනෙත් හකුළුවා ගෙන යමකට මඳ සිනා පායි. ඔහු සිහින් පාදවලින් පරෙස්සමින් ගමන් කරන්නේ 'හොර' ගමනක් යන්නාක් මෙනි. ආච්චි නිල්පාට හැට්ටයක් සහ කළුපාට සායක් ඇඳගෙන, සුදු පැහැති ලේන්සුවක් හිස බැඳ ගෙන වේගයෙන් ගමන් කරයි. ඇය පසුපසින් ගමන් කිරීම ලෙහෙසි නැත.

වනයට ළංවත්ම සීයාගේ ප්‍රබෝධයද වැඩිවෙයි. ඔහු නාසයෙන් දීර්ඝ ලෙස ආශ්වාස කොට උගුර පාදා මුලදී කඩින් කඩ, නවත්වමින් අපැහැදිලි ලෙස කතා කළද, අනතුරුව ඔහුගේ කටින් වචන පිට වූයේ ඔහු මත් වී, ප්‍රීති වූ විටෙක මෙනි. ඔහුගේ කතාව එවිට අලංකාර බවක් දැරිය.

"කැලෑ දෙවියන් වහන්සේගේ උද්‍යානයයි. ඒවා කවුරුවත් වැව්වේ නැත. දෙවියන්ගේ අභිප්‍රායය අනුව කැලෑ වැවුණා. උන්වහන්සේ කටින් පිඹපු සුළංවලින් තමයි, කැලෑ ඇතිවුණේ... මම බුර්ලාකයකු හැටියට පාරු ඇදගෙන ගිය කාලයේදී ෂිගුලී කැලෑවට ගිහින් තියෙනවා... අනේ ලෙක්සේයි. මා දුටු, මා විඳපු දේ නුඹට අත්දැකීමට පුළුවන්කමක් ඇතිවන්නේ නැහැ. ඔකා ගංගා තීරයේ කසීමොව් ඉඳලා මූරම් දක්වා දිගට වැවිලා තියෙන්නේ මහා කැලෑව. වොල්ගා සිට උරාල කඳුවැටිය දක්වා එක දිගට මහ කැලෑව. මෙය කටින් කියල විස්තර කරන්න බැරි තරම් අපූරු වනාන්තරයක්..."

ආච්චි ඔහු දෙස හොරැහින් බලා අනතුරුව මවෙත නෙත් යොමු කොට ඉඟිමැරුවාය. සීයා ගල් මුල්වල හැප්පෙමින් වියළි හඬින් කතා කරන්නට විය. ඔහු කී දෑ මසිතෙහි සටහන් වන්නට විය.

"ඔන්න අපි සරාතව් ඉඳලා මකාරි දක්වා පාරුවල තෙල් පටවා ගෙන ආවේ, එහෙ සල්පිලේ විකුණන්න, අපේ කළමනාකරුවා පුරේහාවල කිරිල්. පාරු නඩේ නායකයා කසීමොව්වල තතාරින් ජාතික අසාප් වෙන්න ඕන, ෂිගුලී දක්වා අපි ආවා. එතැනදි අපේ පාරු ටික උඩු සුළඟට

අහු වුණා. අපට ශක්තිය නැතුව ගියා. පාරු එක තැනක හෙල්ලෙන්නේවත් නැතිව තියෙනවා. අපි ගං ඉවුරට ආවා කැඳ පිහන්න. මැයි මාසයේදී තමා මෙය සිදු වුණේ. වොල්ගාවේ ජලය පිරිලා, හරියට මුහුද වගෙයි. පුංචි දිය රැලි හරියට දහසක් හංසයන් කැස්පියන් මුහුද දෙසට පියාඹන්නා වගෙයි. ෂිගුලිවල කඳු, බැලූ බැල්මට කොළ පාටයි. ආකාසේ බොහොම උසයි, වලාකුළු සුදු පාටයි. හිරු රැස් රත්තරන් පාටයි. අපි විවේක ගනිමින් වටපිට බලා සන්තෝෂ වුණා. අපේ නඩයේ හැම කෙනෙක්ම වඩාත් කරුණාවන්ත වුණා වගෙයි. ගඟේ වතුර හීතලයි. නමුත්, ගං ඉවුරේ හොඳ උණුසුමයි, හොඳ සුවඳයි. හවස් වුණාම අපේ කළමනාකාරයා කිරිල් නැඟිට්ටා. එයා වයස්ගත වුණාට මහා දැඩි මිනිහා. කිරිල් නැඟිටලා තොප්පිය අතට අරගෙන මෙහෙම කිව්වා: "කොල්ලනේ, මම නුඹලාගෙ නායකයාවත්, සේවකයාවත් නොවෙයි. නුඹලාට ඕන තැනකට පලයල්ලා. මම කැලෑවට යනවා!" "අපි මේ මොකද?" කියල තරමක කලබලයට පත්වුණා. ස්වාමියාට වගකියන කළමනාකාරයා නැතුව අපට ගමන් කිරීම තහනම්! නායකයා නැතුව මිනිසුන් යන්නේ නැහැ. අපේ මාර්ගය වොල්ගා ගංගාව ඔස්සේ වැටිලා තිබුණත්, අපට මාර්ගය වරදින්න පුළුවනි. මිනිසුන් හරියට මොළේ නැති වන මෘගයන්ට සමානයි. උන්ට කනගාටුවක් තියෙනවද? උන් බයවෙලා. අපේ කළමනාකාරයා එයාගෙ මතය දිගින් දිගටම මෙහෙම කියන්නට පටන් ගත්තා. "නුඹලගේ එඬේරා හැටියට තවදුරටත් ජීවත්වීමට මම කැමති නැහැ. මම වනගත වෙනවා!" අපේ සමහර අයගේ මුල් අදහස තිබුණේ කළමනාකාරයට පහර දීමටයි. නමුත්, අනික් අය මෙහෙම කිව්වා: "නවතින්න!" කියල කෑ ගැසුවා. ඒ වන විට අපේ නඩේ නායකයා තතාරින් ජාතිකයාත් මෙහෙම කියාපි. මාත් යන්න යනවා! මහා පාඩුවක්. තතාරින් ජාතිකයාට හාම්පුතා ගමන් දෙකකටම සල්ලි ගෙවලා තිබුණෙ නැහැ. මේ තුන්වැනි වතාව. ඒ කාලෙ හැටියට ඔහුට ලැබෙන්න තිබිය යුතු වැටුප් විශාල මුදලක්. මුළු රෑ තිස්සේම කෑ ගසමින් හෙව්වා. හෙව්වා. උදේ වන විට අපේ නඩයෙන් හත් දෙනෙක්ම කැලෑවට

ගිහින්. ඉතුරු වුණේ දහහතර දෙනෙක් නැතිනම් දහසය දෙනෙක් පමණයි. ඔන්න කැලෑව මිනිහා මත බලපාන සැටි!"

"ඒ ගොල්ල පල්හොරුන් බවට පත්වුණාද?"

මම සීයාගෙන් ඇසුවෙමි.

"සමහර විට පල්හොරුන් හැටියට, නැතිනම් තාපසයන් හැටියට, ඒ කාලෙදි ඔය දෙක අතර වෙනස ඒ තරම් කැපිල පෙනුණෙ නැහැ..."

ආච්චි කුරුසියේ ලකුණ ඇඳ ගත්තාය.

"ශුද්ධ වූ දේව මෑණියනි! මිනිසුන් දිහා බලනකොට කොයිතරම් අනුකම්පාවක් උපදිනවද" ආච්චි තෙපලාය.

"ඔක්කෝටම දීලා තියෙන්නේ එක බුද්ධියක් තමයි. නමුත් යක්ෂයා උගේ දිෂ්ටියට සමහරුන්ව ඇද ගන්නවා!..." සීයා කිව්වේය.

තෙතමනය සහිත අඩිපාර ඔස්සේ මඩ ගොහොරු සහ දුබල ලෙස වැවී ඇති යේල් ගස් අතරින් අපි කැලෑවට පිවිසියෙමු. පුරෙහ්වල කිරිල් වනගත වූ පරිදි, සදහටම වනගත වීම යෙහෙකැයි මට සිතිණි. වනයෙහි වාචාලයෝ, බේබද්දෝ නැත්තාහ. ගුටිබැට හුවමාරුවීම් නොමැත. සීයාගේ අල්ජ්ජ, ගිජු බව එහිදී අමතක වෙයි. අම්මාගේ සොහොන සහ එහි වැලි පොළොවද, හදවත පාගන පාළුබව සහ අමනාපයද ආදිය හැම දෙයක්ම එහිදී අමතක කළ හැකිය.

වියළි බිමකට පැමිණි පසු ආච්චි මෙලෙස යෝජනා කළාය:

"කෑම පොඩ්ඩක් කමු. වාඩිවෙයල්ලා!"

ඇගේ මල්ලෙහි රයි (කළු) පාන්, රට ලූනු කොළ, කැකිරි, ලුණු සහ ගෙදර සෑදූ මුදවපු කිරිද තිබිණි. සීයා ඒවා දෙස ව්‍යාකූල ලෙස බලා දෙනෙත් ගටා මෙසේ පැවැසීය:

"මම කෑම කිසිවක් ගෙනාවේ නැහැ. අපොයි, අම්මේ, මට අමතක වුණා...."

"ඔක්කොටම සෑහෙන්න කෑම තියෙනවා...."

සොස්නා ගහක තඹ පැහැති කඳට පිටදී අපි වාඩි වුණෙමු. ගස් ලාටු මිශ්‍ර සුවඳක් දැනේ. තණ පිටියේ නිහඬ

සුළඟක් නිසා තණපත් යම්තමින් සැලෙයි. ආච්චි ඇගේ කළුවන් දෑතින් කුඩා පැළෑටි උදුරමින්, ඒවායින් සුව කළ හැකි රෝග ගැන විස්තර කරයි.

සීයා ළිපට දැමිය හැකි දර කපන්නට විය. මා එම දර එක තැනකට ගොඩ ගැසිය යුතු විය. එහෙත්, මම ආච්චි පසුපසින් නොදැනුවත්ම ඈතට ගියෙමි. ආච්චි යෝධමය ගස් අතුරෙන් පියාඹන්නාක් මෙන් ගමන් කරයි. ඈ ජලයේ කිමිදෙන්නාක් මෙන් පහත්වී බෙහෙත් පැළෑටි උදුරයි. අවට හැම තැනම හ්වොයි තුරු අතුය. එසේ ගමන් කරන ඈ තනිවම කතා කරයිඃ

"බිම්මල් අවාරෙට වැවිලා. එනිසා බිම්මල් බොහොම ටිකයි. අනේ දෙවියනේ, නුඹ වහන්සේ දුප්පතා ගැන සලකනවා මඳි! දුප්පතාට බිම්මල් පවා රස කෑමක්!"

මා ආච්චි පසුපසින් නිහඬව ගමන් කරන්නේ ඈ මා නොදකිනු පිණිස පරෙස්සමිනි. ඈ ගස් හා පැළෑටි සමඟත්, ගෙම්බන් සමඟත් දෙවියන් අරබයා කරන කතාවට බාධා කිරීමට මම අකැමැති වීමි...

එහෙත්, ඈ මා දකියි.

"සීයාට උදව් නොකර පැනල ආවද?"

ඈ බෙහෙත් පැළ සහ බිම්මල් සොයන අතර, වරක් මිනිසුන් කෙරෙහි කෝප වූ දෙවියෝ ජල ගැල්මක් ඇති කොට ලෝකය විනාශ කළ සැටි විස්තර කළාය.

"ඒ වුණත් අති භාග්‍යවත් දේව මෑණියෝ සියලු ගස්වැල් සහ පැළෑටිවල ඇට ආදිය එකතු කරලා සඟවා ගත්තා. ජලගැල්ම ඉවර වුණායින් පස්සේ සූර්යාට කතා කරල මෙහෙම කිව්වාඃ "මහ පොළොව වේළා දමන්න. එහෙම කළාම මිනිස්සු ඉරුට කෘතඥ වේවි!" සූර්යා ලෝකය වේළුවා. දේව මෑණියෝ ඇට පැළ කළා. දෙවියෝ ලෝකය දිහා බලන විට ආයෙමත් ගස්, වැල් වැවිලා, සතුන් ඇති වෙලා, මිනිස්සු එහෙම ඉන්නවා. 'කවුද මගේ අභිප්‍රායට විරුද්ධව ක්‍රියා කළේ?' කියලා දෙවියෝ ප්‍රශ්න කළා. එතකොට දේව මෑණියෝ ඇත්ත කීවාලු. ලෝකය පුහු මුඩු බිමක්ව තියෙන විට දෙවියන්ටම ලොකු දුකක් හිතිලා දේව මෑණියෝ කරපු වැඩේ හොඳයි කියලා පිළිගත්තලු!"

ඇගේ කතාව මා සිත් ගත්තද, මවිතයට පත් මම බැරෑරුම් ලෙස කිව්වෙමි:

"ඇත්තටම එහෙමද? ජල ගැල්මෙන් ලෝකය විනාශ වෙලා බොහෝ කලකට පසුවයි දේව මෑණියෝ උපන්නේ."

ඒවර ආච්චි මවිතයට පත්වූවාය.

"නුඹට ඔය ගැන කිව්වෙ කවුද?"

"ඉස්කෝල පොත්වල ලියල තියෙනවා..."

එවිට ඈ සන්සුන් වී මට උපදෙස් දුන්නාය:

"ඔය කතා අමතක කරපන්. පොත්වල බොරු ලියලා. මදෑ පොත්වල හැටි!"

නිහඬව සහ සතුටු සිතින් සිනා පාමින් ආච්චි මෙසේද තෙපලාය:

"මෝඩයන්ගේ මෝඩ කල්පනාවක හැටි! දෙවියන් වහන්සේ හිටියා එයාගෙ මවුතුමී හිටියේ නෑ, මදෑ! එහෙනම් දෙවියෝ උපන්නේ කොහොමද?"

"මම දන්නෙ නැහැ!"

"අන්න හොඳා. නුඹ දන්නෙ නැහැයි කියන තරමට උගතෙක් වෙලා."

"දේවමෑණියන්ගේ පියා ජෝකීම්, මවු ආන්නා කියලා පූජකයා කිව්වා" යැයි මම ආච්චිට කීවෙමි.

ආච්චි දැන් නම් කෝපයෙනි. ඈ මට එරෙහිව මූණ ලා සිටගෙන මා වෙත එක එල්ලේ දැඩි ලෙස බැලුවාය.

"එහෙනම් ජෝකීම්ගේ දුව මරියා, එහෙමද? නුඹ ඔය විදිහට කල්පනා කළොත් මම නුඹට ටොකු අනිනවා!"

එහෙත්, මොහොතක් ගතවත්ම ඈ මට විස්තර කළාය:

"දේව මෑණියෝ හැමදාම හිටියා. ඔක්කොටම ඉස්සෙල්ලා. දෙවියෝ උපන්නේ දේවමෑණියන්ගෙන් ඔන්න ඊට පසුව තමයි..."

"එහෙනම් ජේසු ක්‍රිස්තු ගැන කොහොමද?"

ආච්චි දෙනෙත් වසා ගෙන ලැජ්ජාශීලී ලෙස නිහඬව සිටියි.

"එහෙනම් ක්‍රිස්තු තුමා... ඔව්. ඔව් එහෙමද?"

දේව අබිරහස් පිළිබඳ ප්‍රශ්නයේදී ඇය ව්‍යාකූලත්වයට

පත්කොට මා ජයගත් බව මට දැනුණද, එය මට නොරිසි විය.

අපි වඩ වඩාත් කැලෑව තුළට ගියෙමු. එහි නිල් පැහැති අඩ ඇඳිරිය තැනින් තැන බිඳලමින් රන්වන් හිරු රැස් වැටිණි. වනයෙහි උණුසුම සහ සැප පහසුවත්, කන්කලු විශේෂ ශබ්දයත් සුහද සිහින පණගැන්වෙන පරිසරයක් මවා පෑවේය. වනයේ විවිධ පක්ෂීහු හඬ නඟති, නද දෙති, ගී ගයති, ශබ්ද කරති. අපූරු කුරුල්ලෙක් වන ෂුර්ගේ ගීතය කල්පනාකාරී බවක් පෙන්වයි. හරිත වර්ණ ගෙඹි පැටව් තෙතමුසු බිමෙහි පැන පැන යති. ගැරඬියෙක් උගේ කහවන් හිස ඔසවා ගෙන ගෙම්බන් දෙස බලා සිටින්නේ උන් ගොදුරට ගැනීමටය. ලේනෙක් ටිංටිං ගා හඬ නඟයි. සොස්නා ගසක මුදුනේ සිටින ඌ ලොමින් ගහන වලිගය සුරතල් ලෙස වනයි. තවත් බොහෝ දේ දැකීමටත්, කැලෑව තුළට වැදීමටත් ඉමහත් ආසාවක් උපනි.

යෝධමය සොස්නා ගස් අතරින් විනිවිද පෙනෙනසුලු විශාල රූප මැවී හරිත වර්ණ ඝනත්වයෙහි වැද අතුරුදහන් වේ. මහා වනය බිඳ තැනින් තැන නිල්වන් සහ රිදීවන් අහස පෙනෙයි. දෙපයට පෑගෙන්නේ සිනිඳු පලසක් වැනි පෙඳ වර්ගය. පලු හා දන් වර්ගවලට අයත් ගස් වැල් එකට එතිලාය. සමහර පලු වර්ග රක්ත වර්ණ රුධිර බින්දු මෙන් නිල්වන් තණ පිටියෙහි දිලිසේ. බිම්මල් සුවඳ විසින් නහය කිතිකවනු ලබයි.

"අහෝ දයාබර පාරිශුද්ධ දේවමෑණියනි, අප උදෙසා යාච්ඤා කළ මැනවි." ආච්චි හුස්ම ඉහළට ඇද ගනිමින් දෙවියන් යැද්දාය.

ආච්චි හැසිරෙන්නේ හරියට වනයේ අධිපතිනිය ලෙසිනි. ඈ හැමදෙයක්ම දකිමින්, හැම දෙයක් ගැනම උදම් අනමින් ආශීර්වාද කරයි. ඇගෙන් මුළු මහත් වනයට උණුසුමක් ලැබෙන්නාක් මෙනි. ඇගේ පයට පෑගෙන කුඩා පන් ගස් යළි නැඟිට සිටින විට, ඒවා දෙස බැලීම පවා මට සතුටක් ගෙන දෙයි.

වනයෙහි ගමන් කරන මම කල්පනා සයුරෙහි ගිලෙමි. කැලෑවේ පල්හොරෙක් වෙලා කෑදර, පොහොසතුන්ගේ

ධනය කොල්ලකා, ඒවා දුප්පතුන් අතර බෙදාදීම ඉතා හොඳ ක්‍රියාවකි. හැමදෙනෙකුම බඩ කට පුරා කාලා, සතුටු වී සිටියාවේ. එවිට ඔවුන් එක එකාට විරුද්ධව කුළල් කා ගන්නා නපුරු බල්ලන්ට සමාන නොවනු ඇත. එලෙසම ආච්චිගේ දෙවියන් සහ දේවමෑණියන් වෙතට ගොස් දුප්පතුන් අග හිඟකමින් ජීවත් වන සැටිත්, වැලි පස සහිත භූමියෙහි මිනී වළවල් හාරා මළවුන් වළලන සැටිත් කියා ඔවුනට සත්‍යය පහදා දිය යුතුය. මේ මහ පොළොවේ සිත් කලකිරවන දේ කොතරම්ද! එවැනි දුක් කරදර මිනිසාට කොහෙත්ම අවශ්‍ය නැත. දේවමෑණියෝ මාව විශ්වාස කරති නම්, දැනට පවතින මේ ක්‍රමය වඩාත් හොඳ විදිහට වෙනස් කිරීම සඳහා මට හොඳ බුද්ධි මහිමයක් එතුමිය ලබා දුන්නාවේ. වඩාත් හොඳ ජීවිතයක් සඳහා මා ඉදිරිපත් කරන දේ අසන මිනිසුන් එය විශ්වාස කළ යුතුයි. මා පුංචි වුණාට කමක් නැහැ. ජේසුතුමා වයසින් මට වැඩියෙ වසරක් වැඩිමල් ව සිටි කාලයේදී වයස්ගත පණ්ඩිතයෝ එතුමාට සවන් දුන්හ.

මෙවන් සිතුවිලි ලෝකයෙක ගිලී, කැලෑවේ ගමන් කරමින් සිටියදී වරෙක මම ගැඹුරු වළකට ඇද වැටුණෙමි. මගේ පැත්තක ඉළ ඇට වසා ඇති සමද, හිස පසුපස කොටසෙහි සමද සීරිණි. වළ පතුල හීතලය, ඇලෙනසුලු මැලියම් වැනි මැටිටෙන් සහ කුණුවලින් ගහනය. තනියම වළෙන් ගොඩ ඒමට නොහැකිවීම මා හඟින්නට වූයේ ඉමහත් ලජ්ජාවකිනි. ආච්චි බියගැන්වීමට මට සිත් නොදුන්නද ඇයට අඬගැසීමට සිදුවිය.

ඈ ඉක්මනට මා වළෙන් ගොඩගෙන කුරුසියේ ලකුණ ඇඳගනිමින් මෙසේ කිව්වාය:

"දෙවියන්ට පින්සිදු වේවා! හොඳ වෙලාවට හිස්. මේ වලස් ගුහාවේ අයිතිකාර වලසා හිටියා නම් නුඹට මොනවා වේවිද?"

සිනාවන අතරම ඈ ඇඬුවාය. ඉන් ඉක්බිතිව ඈ මා දිය කඩිත්ත වෙතට ගෙන ගොස් මුහුණ සහ අත් පා සෝදා තුවාල වෙළා බැන්දාය. ඇගේ කමිසය ඉරා වෙළුම් පටි සෑදූ ඈ වේදනා නාශක කොළ වගයක් තුවාලයට තැබුවේ වෙළුම් පටිවලින් වෙළීමට පෙරය. නිවස දක්වා

පයින් යාමට තරම් ශරීර ශක්තියක් මට නොමැති වූයෙන්. අසල පිහිටි දුම්රිය ස්ථානයට අයත් කුඩා මඩුවෙක මට වාඩි වීමට සැලැස්වූවාය.

හැමදාම පාහේ "වනයට යමු" යි මම ආච්චිට යෝජනා කළෙමි.

ඇය කැමැති වූයේ ඉමහත් සතුටිනි. එදා සිට අපි සරත් සමයේ අවසානය එළඹෙන තුරු මුළු ගිම්හානයේම වනයට ගියෙමු. බෙහෙත් පැළෑටි, පලු සහ දන් වර්ග, බිම්මල් සහ කොට්ටන් ඇට වර්ග අපි එකතු කළෙමු. ආච්චි මේවා විකුණා ලබාගන්නා මුදල්වලින් අපි දෙදෙනා යැපුණෙමු.

"පිනට කන බඩ ජහරියෝ!" සීයා අපට බැණ වැදුණේය. එහෙත්, අපි දෙදෙනා ඔහුගේ ආහාර කොහෙත්ම ලබා නොගතිමු.

වනය මට ආධ්‍යාත්මික සැප පහසුවක් සහ සන්සුන්තාවක් ගෙන දුන්නේය. එම හැඟීම විසින් මගේ බලාපොරොත්තුව කඩවීම හා අසතුට අතුරුදන් විය. ඒ අතරම මගේ හැඟීම්වල සහ චින්දනයෙහි දියුණුවක් ඇති විය. ශ්‍රවණය සහ දෘෂ්ටිය තීව්‍ර විය. මතකය වඩාත් සියුම් වී ගැඹුරු විය. හැඟීම්ද තීව්‍ර විය.

ආච්චි මා වඩ වඩාත් මවිතයට පත් කළ අතර, ඇය මිනිසුන් අතුරින් ඉතාම උසස්, මිහිපිට ඉතාම දයාන්විත හා බුද්ධිමත් තැනැත්තිය ලෙස මම හඟින්නට වීමි. ඈ නොකඩවාම ක්‍රියා කළේ මගේ මෙම හැඟීම ශක්තිමත් වන ආකාරයටය. දවසක් දා අපි සුදු බිම්මල් අහුලා ගෙන වනයේ පිටතට විත්, නැවතුණෙමු. ආච්චි ගසක් මුල වාඩි වී, විවේක ගත් අතර, මම ගස්වලට පසුපසට ගොස් බිම්මල් සොයන්නට වීමි.

හිටි හැටියේම ඇගේ කඩහඬ ඇසී මම ඇය දෙස බැලීමි. ඈ වාඩිවී ගත්වනම බිම්මලක් කපයි. ඇය අසල දිව දිගු කර ගත් විශාල බල්ලෙකි.

"පලයන් යන අහක. දෙවියන්ගේ නාමෙට පලයන්!" ආච්චි ඌට කියන්නේ සන්සුන් ලෙසිනි.

ඊට ටික කලකට පෙර වල්යොක් මගේ බල්ලාට වස දී ඌ මරා දැමුවෙන්, මට තවත් බල්ලකු ඇති කිරීමේ

විශාල ආසාවක් ඇති විය. මා අඩි පාර දිගේ ඌ වෙත දිව ගියද ඌ බෙල්ල හරවන්නේ නැතිව අපූරු විදිහකට කොළ පැහැති බඩගිනි ඇස්වලින් මා දෙස බලා නගුට හකුළුවා ගෙන කැලයට වැදුණේය. උගේ ගමන් විලාසය බල්ලකුගේ මෙන් නොවීය. මා උරුවම් බෑ විට ඌ හණිකට පඳුරු අස්සට වැදුණේය.

"දැක්කද?" ආච්චි ප්‍රශ්න කළේ මඳ සිනා පාමිනි. " ඉස්සෙල්ලා මට වැරදුණා. මා සිතුවේ ඌ බල්ලෙක් කියල. බැලින්නම්, උගේ දත් බලු දත් නෙවි, වෘක දත්, බෙල්ලත් බල්ලකුගේ වගේ නෙවී, මම බය වුණා. ඉතින් නුඹ වෘකයෙක් නම් යන අහක පලයන්! කියල ඌට කිව්ව. ගිම්හාන කාලෙදි වෘකයෝ නපුරු නැහැ...."

ඈ කිසිම දවසෙක කැලෑවේදී වල්මත් නොවූවාය. නිසි ලෙස පාර සොයැගැනීමෙහි ලා සමත් වූවාය. තණ ගස්වල පුසුඹ අනුව කිනම් ස්ථානයෙක කිනම් වර්ගයට අයත් බිම්මල් තිබිය යුතුද යන්න ඕ දත්තාය. ඒ අනුව නිතර මා පිරික්සුම භාජන කළාය.

"රතු පාට බිම්මල් මොන ගහ ළඟද වැවෙන්නේ? කෑමට සුදුසු බිම්මල්. විෂ බිම්මල්වලින් තෝරා බේරා ගන්නේ කොහොමද? පාපරත්නික් ගහ ළඟ වැවෙන බිම්මල් මොනවාද?"

ගසක බැලූ බැල්මට නොපෙනෙන තරම් සුදු පැල්මක ඇති ලේන ගුහාවක් ඈ මට පෙන්වූවාය. එයට අත දැමූ විට එහි හිම කාලයට ආහාර පිණිස ගැනීම සඳහා ලේනුන් විසින් එකතු කරන ලද කොට්ටන් ඇට වර්ග තිබෙනු දැනිණි. සමහර ලේන බෙණවල රාත්තල් දහයක් තරම් විශාල ප්‍රමාණයක් කොට්ටන් ඇට වර්ග එකතු කර තිබිණි.

වරක් මා මෙලෙස ලේනුන්ගේ බෙණ වෙත රිංගන සැටි දුටු කිසියම් දඩයක්කාරයෙක් කුඩා සතුන්ට වෙඩි තියන ඉතා කුඩා වෙඩි උණ්ඩ සහිත පතොරමකින් මට වෙඩි තැබූයෙන් මගේ දකුණු ඇලයට කුඩා උණ්ඩ කැබැලි විසි හතක් වැදිණි. හමට කා වැදී තිබුණු කුඩා උණ්ඩ කැබැලි එකොළහක් පිටතට ඇද දැමීමට ආච්චි සමත් වූවාය. ඉතිරි කෑලි සමට කා වැදී බොහෝ කල්

තිබුණද, අනතුරුව ඉවත්විණි.

මට වේදනාව උහුලාගෙන සිටීමට ශක්තියක් තිබීම ගැන ආච්චි සතුටු වූවාය.

"දක්ෂයා!, ඉවසීම තියෙනවා. එහෙනම් හැකියාවත් ලැබේවි!"

බිම්මල් සහ කොට්ටන් ඇට විකුණා වැඩිපුර මුදලක් ලැබුණු විගස, ආච්චි ගෙයක් පාසා යමින් ජනේල පඩිවල පාන්ගෙඩි සහ කාසි තැබුවාය. උත්සව දවස්වලදී පවා ඈ ඉරීගිය, අණ්ඩ දැමූ ඇඳුම්වලින් සැරසී සිටියාය.

"හිඟන්නන්ටත් වැඩියෙ අන්ත විදිහට අඳිනවා. මාව නින්දාවට පත් කරනවා." සීයා දොඩවන්නට විය.

"ඒකට කමක් නැහැ. මම නුඹේ දුවවත්, මනාලියවත් නොවේ."

මේ දෙදෙනාගේ අඬදබරය වඩා වැඩි විය.

"මම අනික් අයට වඩා වැඩියෙන් පව් කරලා නැහැ. නමුත්, දෙවියෝ මට වැඩියෙන් දඬුවම් කරලා!" අමනාපයෙන් සීයා කෑ ගැසීය

"වැරැදිවල බරපතළකම දන්නේ යකුන් විතරයි:

අනතුරුව ඕ මට මෙසේ තෙපලායඃ

"නාකියා මා කියන යකුන්ට බයවෙලා. බය නිසාම එයා ඉක්මනට නාකි වෙලා... අනේ පව් අසරණ මනුස්සයා..."

ගිම්හානයේදී හොඳින් හැදී වැඩුණු මම කැලෑවේදී හීලෑ නොවූ ගති ලබා ගතිමි. සමකාලිකයන්ගේ ජීවිත ගැන සැලකිලි නොදැක්වූ මම ලුද්මීලා පාළු ගතියක් ඇති කරන නුවණැත්තියක් සේ සැලකීමි.

සරත් සමයේ වැසි සහිත දවසක සීයා හොඳටම තෙමී ගෙදර විත්, සතකු මෙන් වතුර ගසා දමා මට මෙසේ පැවසීය.

"ඉතින් දඟකාර කොල්ලා. හෙට ඉඳලා වැඩට යන්න ලෑස්ති වෙයන්!"

"කොහේ යන්නද?" ආච්චි ප්‍රශ්න කළේ කෝපයෙනි.

"නුඹේ නංගි මත්රියෝනාගේ පුතා ළඟට..."

"අනේ තාත්තේ, නුඹ නරක වැඩක් කරන්නයි යන්නේ!"

"මෝඩියේ කට වහගන්! උන් අපේ කොල්ලාට සැලැස්ම අඳින වැඩ උගන්වාවි."

ආච්චි නිහඬවූවා, හිස පාත් කැරැ ගත්තාය.

හවස ලුද්මීලා හමුවූ විට, මම නගරයට ගොස් එහි වාසය කිරීමට යන බව ඇයට කිව්වෙමි.

"මාවත් මෙතැනින් ඉක්මනට ගෙනියාවි. මගේ කොරවුණු කකුල එහෙම පිටින්ම කපා දමන්න ඕනැයි කියලා තාත්තා කිව්වා. එතකොට මම මහත් වෙයිලු" ඈ කල්පනාකාරී ලෙස කීවා ය.

ගිම්හානයේ දී තවත් කෙට්ටු වූ ලුද්මීලාගේ හම නිල් පැහැ ගෙන තිබිණි. ඇගේ දෙනෙත් විශාල වෙලාය.

"ඔයා බයද?" මම ඇසුවෙමි.

"බයයි." ඈ නිහඬව හැඬුවාය.

ඇය අස්වසා ලීමට මා අසමත් වූ අතර, නගරයේ පදිංචි වීමට මම ද බිය වීමි. අපි එකිනෙකා ඉතා ළංවී වාඩිවී බොහෝ වේලාවක් දොම්නස මුසු නිහඬතාවකින් පසුවීමු.

අප ඉදිරියේ ගිම්හානය වී නම් හිඟා කෑම සඳහා යාමට ආච්චි කැමති කරවා ගැනීමට ඉඩ තිබිණි. ඈ කෙල්ලකව සිටි කාලයේදී එලෙස සිඟා කෑමට ගියාය. එවිට අපට ලුද්මීලාවද ගෙනයා හැකියි. මට ඇය කුඩා ගැලක තබා ගෙන යාමට පිළිවන.

එහෙත්, සරත් සමය ආරම්භ වෙලාය. තෙතමනය මුසු සුළං හමයි. අහස වලාවලින් පිරිලාය. මහ පොළොව හැකිළී කිලිටි වී, අවාසනාවන්ත වී ඇත.

IV

මම යළිත් නගරයේ මිනී පෙට්ටියකට සමාන තට්ටු දෙකකින් යුත් සුදු පාට නිවාසයක වාසය කරමි. එම ගොඩනැඟිල්ල බොහෝ දෙනෙකුට පොදුය. ඒ ගොඩනැඟිල්ල අලුත්ය, කලාත්මකය, හිටි හැටියේම පොහොසත් වූ හිඟන්නෙකුට සමානය. මේ හිඟන පොහොසතා මහා ගොඩක් කෑම ගිලදැමීම නිසා තෙල් මන්ද ආරා ගිය මහත මිනිහකු මෙනි. එය වීදිය පැත්තකින් පිහිටා ඇත. එක් තට්ටුවෙක ජනේල අටක් බැගිනි. ඒ ගොඩනැඟිල්ලේ මූණත පිහිටිය යුතු තැන

ජනේල හතරක් බැගිනි. පහළ තට්ටුවේ ජනේල හතර පටු අතුරු පාර දෙස බලන්නාක් මෙනි. ඉහළ තට්ටුවේ ජනේල හතර ගෙවැටට එහා ඇති රෙදි සෝදන්නියට අයත් කුඩා ගෙය සහ කුණු පිරි ගල්වළ දෙස බලයි.

මා දැක පුරුදු මාදිලියේ වීදි මෙහි නැත. ගෙය ඉදිරිපිට කුණු පිරි කඳුරකි. එය හරහා පටු වේලි දෙකකි. කඳුරේ වම්පසින් සිර කඳවුරකි. කඳුරේ වූ වළට සියලු ගෙවල්වලින් කුණු රොඩු දමති. එම වළ පතුලේ කුණු සහිත, කොළ පැහැති උකු වතුර තට්ටුවකි. කඳුරේ දකුණු පසින් ආඳන් සහිත ස්වේස්දින් පොකුණය. කඳුරේ මැද කොටස ගොඩනැඟිල්ලට ප්‍රතිවිරුද්ධව පිහිටා ඇත. මෙහි එක් පැත්තක කුණු ගොඩේ ක්‍රුපීවා, ලපුහ් සහ විවිධ තණ වර්ග වැවිලාය. අනෙක් පස දොරිමෙදොන්ත් පක්රොව්ස්කි පූජකයාගේ වත්තය. එම වත්ත මැද කුඩා පිළිසඳර ශාලාවකි. එය සිහින් ලෑලිවලින් සාදා කොළ පැහැති තීන්ත ගා ඇත. එම පිළිසඳර ශාලාවට ගලක් ගැසුවොත් ලෑලි පට පට ගා පුපුරන ශබ්දය ඇසිය හැකිය.

ඉවක් බවක් නැති පාළු ගතියකින් ගහන වූ මේ ස්ථානය කුණුවලින් පිරිලාය. සරත් සමය මැටි සහිත පස විකෘති කොට ඇත. එම මැටි දැන් පාවහන් දැඩි ලෙස බදා අල්ලා ගන්නා රතු මැලියම් වැනි ද්‍රව්‍යයක් බවට පත්වී තිබේ. කෙත්වතුවල සහ වනයෙහි පවිත්‍ර බවට පුරුදු වී ඇති මම මෙතරම් කුඩා පෙදෙසක මෙතරම් විශාල ප්‍රමාණයක් කුණු කසළ මීට පෙර නොදුටුවෙමි. නගරයේ මෙම කුණු පිරි මුල්ල මා සිතෙහි පාළු ගතියක් කුප්පාලීය.

කඳුරේ සිට අළු පැහැති පරණ වැටවල් ආරම්භවේ. ඒ වැට අතුරෙන් රතු පැහැති කුඩා ගෙයක් මට පෙනෙයි. පසුගිය ශීත සමයේ සපත්තු කඩයෙහි මා වැඩ කරන විට පදිංචිව සිටියේ එහිය. ඒ නිවෙස මට ළංවීම නිසා මසිතෙහි පාළු ගතිය වඩාත් වැඩිවිය. එම වීදියෙහි යළිත් පදිංචි වීමට මට සිදු වූයේ කුමක් නිසාද?

දැන් මා සේවයට පැමිණි ස්ථානයෙහි ස්වාමියා මම හඳුනමි. ඔහු, ඔහුගේ මල්ලීත් සමඟ මගේ මවු බැලීමට පැමිණි සැටි මට මතකය. එදින ඔහුගේ මල්ලී විහිළු සහගත ලෙස මෙසේ කෑගැසීය:

"අන්ද්‍රෙයි-පාපා, අන්ද්‍රෙයි-පාපා..."

ඔවුන්ගේ හැඩ රුව දැනුදු වෙනස් වී නැත. වැඩිමලා වක් වූ නැහැයක් සහ දිගැති හිසකේවලින් යුක්තය. ප්‍රියමනාපය. ඔහු කරුණාවන්ත කෙනෙකැයි සිතේ. බාලයා වික්තර් පෙර මෙන් අශ්වයකුගේ බඳු මුහුණකින් සහ ලපවලින් යුක්තය. ඔවුන්ගේ අම්මා මගේ ආච්චිගේ නංගීය. ඈ නිතර කිපෙයි. කෑගසයි. වැඩිමහලු බෑයා විවාහකයෙකි. ඔහුගේ බිරිඳ පාන් ගෙඩියක් මෙන් සුදු පැහැතිය. ඇගේ දෙනෙත් විශාලය, කළුවන්ය.

මුල් දවස්වලදී ඈ දෙතුන් වරක් මට මෙසේ කිව්වාය:

"මම නුඹේ අම්මාට වීදුරු පබළු අල්ලපු සේද සළුවක් තෑගි කළා..."

ඇගේ කතාව විශ්වාස කිරීමට මගේ සිත ඉඩ නොදුන්නේය. එමෙන්ම, මගේ මවු එම තෑග්ග පිළිගත්හයි මම විශ්වාස නොකළෙමි. එම තෑග්ග ගැන ඈ යළිත් වරක් මතක් කළ විට, මම ඇයට හරස් කැපුවෙමි.

"තෑගි කළා නම්, පුරසාරම් දොඩවන්නෙ නැතුව ඉඳපන්!"

ඈ බියවූවාක් මෙන් ඉවතට පැන කෑ ගසා ඇසුවා ය.

"මොනවද? තෝ කා සමඟද කතා කරන්නෙ?"

ඇගේ මුහුණෙහි රතු ලප මැවිනි. දෙනෙත් දොට්ට පැනීමට තරම් මහත් විය. ඈ ඇගේ සැමියාට අඬ ගැසුවාය.

ඔහු කුස්සියට ආවේ බෙදන කටුව අතැතිව සහ පැන්සලය කනේ ගසාගෙනය. ඇගේ කතාවට සවන් දුන් ඔහු මට අවවාද කළේය:

"ඇයටත් ගෙදර අනික් අයටත් ගරු සරු ඇතිව කතා කළ යුතුයි. වනචර විදිහට කතා කරන්න එපා."

ඉන් ඉක්බිතිව ඔහු බිරිඳට කතා කළේ ඉවසුම් රහිතවය:

"පුහුදේවලට නුඹ මට කරදර කරන්න එපා!"

"මේකත් පුහුදෙයක්ද? ඔයාගෙ නෑයෝ..."

"නෑයො යකාට ගියාදෙන්!" යැයි කෑ ගැසූ හාම්පුතා වැඩ කරන කාමරය වෙත හණිකට දිව ගියේය.

මේ මිනිස්සු ආච්චිගේ නෑයන් වීම මගේ සිත් නොගත්තේය. මගේ නිරීක්ෂණ අනුව නෑයන් එකිනෙකා

කෙරෙහි දක්වන ආකල්ප පිට එවුන් කෙරෙහි දක්වන ආකල්පයට වඩා අයහපත්ය. පිට මිනිසුන්ට වඩා තමන්ගේ මිනිසුන්ගේ නරක හා හාස්‍යජනක ගති ගැන දන්නා නෑයෝ ඒවා නිතර කියමින් ඒවා වටා නපුරු ඕපාදූප ගොතා පතුරුවමින් නිතර බැණගනිති, සණ්ඩු කරති.

ගෙදර ස්වාමියා මා සිත් ගත්තේය. ඔහුගේ දිගැති කෙස්වැටිය කන්වලට එහා යවමින් ඔහු ඉතා ලස්සනට කෙස්වැටිය ගස්සා දැම්මේය. ඔහු මා ඉස්සර හැඳින ගෙන සිටි 'හොඳ වැඩේ' නමැති මිනිසා සිහි නැංවීය. ඔහු නිතර පාහේ සතුටු සිතින් කොක් හඬ ලා සිනා සෙයි. ඔහුගේ අළුවන් දෙනෙත් දයාන්විත බවක් පළ කළේය. රාජාලියකුගේ වැනි නාසය අවට තිබූ රැලි හාස්‍යජනක ලෙස නැටවිණි.

"නපුරු කිකිළියනේ ඔය මදෑ සණ්ඩු කළා!" ඔහු අම්මාට සහ බිරිඳට කියන්නේ කුඩා ශක්තිමත් දත් පෙන්වා මඳසිනා පාමිනි.

නැන්දම්මා සහ ලේළි හැමදාම සණ්ඩු කැරගනිති. ඔවුන් ඉතා ලෙහෙසියෙන් හා සැණෙකින් දබර කර ගැනීම මගේ මවිතයට හේතු විය. උදේ සිටම මේ දෙදෙනා අවාසනාවන්තයන් ලෙස ගෙයි කාමරයක් පාසා දුවමින්, මුළු මහත් ගෙයම ගිනි ගත් විටෙක මෙන් හැසිරෙති. මුළු දවස තිස්සේම දුව පැන ඇවිදින මොවුන් විවේක ගන්නේ දවල් බත, හවස තේ සහ රාත්‍රී ආහාරය ගන්නා වේලාවේදීය. ඔවුහු බොහෝ සේ කති, බොති, එනිසාම ඔවුහු මත් වීමට සහ විඩාවට පත්වෙති. දිවා ආහාරය ගන්නා අතර, කෑම වර්ග ගැන කතා කරමින් ලොකු සණ්ඩුවකට සූදානම්වන්නේ කම්මැළි ලෙස එකිනෙකා දෙස බලමිනි. නැන්දම්මා කිනම් ආහාරයක් පිළියෙල කළද, ලේළි අනිවාර්යයෙන්ම මෙසේ කියයි:

"මගෙ අම්මා ඔය කෑම පිළියෙල කරන්නෙ ඔය විදිහට නොවේ."

"එහෙනම් වඩාත් නරක විදිහට!" නැන්දම්මා කියයි.

"නැහැ, වඩාත් හොඳට!"

"එහෙනම් තොගෙ අම්මා ළඟට පල!"

"මම මේ ගෙදර අයිතිකාරි!"

"එහෙනම් මම කවුද?"

එවිට හාම්පුතා කට දමයි.

"නපුරු කිකිළියනේ, නවත්වාපල්ලා! නුඹලාට පිස්සු හැදිලද?"

මේ ගෙදර හැම දෙයක්ම තේරුම් නොකළහැකි ආකාරයට පුදුම සහ හාස්‍ය බවක් දැරීය. කුස්සියේ සිට ආහාර ගන්නා මේසය තිබෙන කාමරය දක්වා යා යුත්තේ පටු සහ කුඩා එකම වැසිකිළිය හරහාය. මෙය විහිළු කතාවලට සෑහෙන විෂයයක් විය. එමෙන්ම එය හාස්‍යජනක පැටලිලිවලට මූලාශ්‍රයක්ද වූයේය. වැසිකිළියේ වතුර ටැංකියට වතුර පිරවීම මට අයත් එක් කාර්යයකි. මා කුස්සියේ නිදාගත් අතර, එහි දොර ආලින්දයට මුහුණ ලා පිහිටියේය. මගේ හිසට උණුසුමක් දැනුණේ කුස්සියේ පෝරනුව නිසාය. දෙපාවලට ආලින්දයෙන් සුළං හමන්නට වූ නිසා, ශීතල දැනිණි. මම බිමට දමන විවිධ රෙදි පාපිසි එකතු කොට ඒවායින් දෙපා ඔතා ගතිමි.

ගෙයි විශාල කාමරයේ බිත්තියේ එල්ලා ඇති කැඩපත් දෙකකි. රන්මුවා රාමුවල පින්තූරය. කාඩ් සෙල්ලම් කිරීම සඳහා මේස දෙකක් සහ වියානා පුටු දොළසකි. ඒ හැරුණු විට එහි හිස් බවක් සහ පාළු ගතියකි. විසිත්ත කාමරය විවිධ පාටවලින් යුත් ගෘහ භාණ්ඩවලින් පිරිලාය. දෑවැද්දට දුන් රිදී බඩු සහ පිඟන් බඩු එහිම තබා ඇත. එහි එකිනෙකට වඩා විශාල පහන් තුනක් එල්ලා ඇත. ජනේල රහිත නිදන කාමරයෙහි පුළුල් ඇඳක් හැරුණු විට, පෙට්ටගම් සහ අල්මාරි තිබිණි. ඒවායින් දුම්කොළ සුවඳක් සහ පර්සියානු රොමාෂ්කා සුවඳක් වහනය විය. මේ කාමර තුන හැමදාම හිස්ව තිබුණු අතර, ගෙයි අයිතිකරුවෝ ආහාර ගන්නා කුඩා කාමරයෙහි එකිනෙකාට බාධා කරමින් තෙරපුණහ. උදෑසන තේ බී අවසන් වූ විගස හාම්පුතා සහ ඔහුගේ මල්ලී කෑම මේසය දිගහැර ඒ මත කඩදාසි එළා සැලසුම් ඇඳීමට අවශ්‍ය කවකටු, පැන්සල්, සුදු කඩදාසි, ඉන්දියානු කළු තීන්ත ආදිය තබා එකිනෙකාට මූණ ලා මේසය දෙපස සිට

ගෙන ඇඳීමට පටන් ගනිති. මේසය සෙලවුණු අතර, එය කාමරය අවහිර කරමින් තිබිණි. ළමයින්ගේ කාමරයේ සිට මෙහෙකාරිය සහ බිරිඳ එහි පැමිණි විට ඔවුහු නිතැතින්ම මේසයේ හැප්පුණහ.

"බාධා නොකර පලයල්ලා!" වික්තර් ඔවුන්ට කෑ ගැසීය.

ගෙහිමි කාන්තාව අමනාපයෙන් සැමියාට පැමිණිලි කළාය.

"වාස්යා එයාට කියන්න මට කෑගහන්න එපයි කියල."

"ඔයා මේසය හොලවන්න එපා." ගෙහිමියා සාමකාමී ලෙස පැවසීය.

"මම බඩින් නොවැ. මෙතන ලොකු තදබදයක්...."

"එහෙනම් අපි වැඩ කරන්න ශාලාවට යනවා."

එවිට ගැහැනිය කෝපයෙන් කෑ ගැසුවාය.

"දෙවියනේ. ශාලාවේ වැඩ කරන්නෙ කවුද?"

වැසිකිළි පැත්තෙන් දොර හැරගෙන කෑම කාමරයට මැහැල්ල මුහුණ ඔබයි. ඇගේ මුහුණ කුස්සියේ ගිනි උදුන නිසා රත් පැහැගෙන ඇත. මත්රියෝනා ඉවානව්නා කෝපයෙන් කෑගසයි.

"ඔන්න බලාපන් වාස්යා පුතේ, නුඹ වැඩ කරනවා. අරකිට අනික් කාමර හතර ඉඩ මදි. මහ ලොකු සිටු කුමාරියක්!"

වික්තර් නපුරු සතුටකින් සිනාසෙන විට, ගෙහිමියා කෑගසයි: "ඔය ඇති නවත්වාපල්ලා!"

එවිට ලේළි නැන්දම්මාට නොයෙක් ඇනුම්පද එල්ල කොට බැණ වදිමින් පුටුවෙක වාඩි වී, සුසුම් හෙළයි:

"යනවා යන්න, සිය පණ නහගන්නවා!"

"යකින්නි, මගේ වැඩට බාධා නොකරනු!"

ගෙහිමියා කෝපයෙන් බෙරිහන් දෙයි. "මේක මහ පිස්සන් කොටුවක්. කොන්ද නමාගෙන වැඩ කරන්නෙ නුඹලට කෑම, ඇඳීම සපයන්න නොවේද! නපුරු කිකිළියනේ..."

මුලදී මේ ජවනිකා නිසා මම බිය වූයෙමි. ගෙහිමි කාන්තාව මේස පිහිය අතට ගෙන වැසිකිළියට ගොස් දොර වසාගෙන මර හඬ දෙන්නට වූ විට, මගේ බිය වැඩි විය. විනාඩියකට ගෙදර නිහඬතාවක් ඇති විය.

අනතුරුව ගෙහිමියා දැතින් දොර අල්ලාගෙන දෙකට නැමී මට කෑගැසීය:

"ජනේල වීදුරුව කඩලා ඇතුළට ගිහින් දොරේ කොක්ක ගලවපන්!"

මම ඔහුගේ පිටට පැන දොරට ඉහළින් ඇති ජනේල වීදුරුව කඩා පහළට නැමුණු විට ගැහැනිය අතැති පිහියේ මිටින් මට ලෝබ නැතිව පහර දෙන්නට වූවාය. මම පහර කමින් දොර අගුල ගලවා දැමීමි. එවිට ගෙහිමියා වේගයෙන් එහි ඇතුළු වී ගැහැනිය පිටතට ඇදගෙන විත් කෑම කාමරයෙහි වාඩි කරවා පිහිය උදුරා ගත්තේය. කුස්සියට වී හිසට වැදුණු පහරවල පැල්ලම් අතගාමින් සිටි මට ඇය ගලවා ගැනීමට ඉදිරිපත් වීම මෝඩ වැඩක් බව වැටහුණේ පාන් කැල්ලක්වත් කැපීමට නොහැකි තරම් මොට්ට පිහියක් ඇය අත තිබුණු බව දැනගත් විටය. ගෙහිමියාගේ පිට උඩට නැඟ ජනේල වීදුරුව බිඳීමට කිසිදු වුවමනාවක් නොතිබිණි. පුටුවෙන් ගසා වීදුරුව බිඳීමට හැකියාවක් තිබිණි. එපමණක් නොව, වැඩිහිටියකුට දොර අගුල ගලවා දැමීම වඩාත් ලෙහෙසියි, මන්දයත් ඔහුගේ අත් වඩාත් දිග බැවිනි. එම සිද්ධියෙන් ඉක්බිතිව ගෙදර අඬදබර නිසා තව දුරටත් මම බිය නොවීමි.

ඒ සොයුරෝ දෙදෙනා පල්ලියේ ගායක කණ්ඩායමේ ගැයූහ. ඉඳහිට ඔවුහු සෙමින් ගීතයක් ගැයීම අරඹති. අනතුරුව වැඩිමල් බෑයා බරිති හඬින් ගයයි:

හඳවත ඇගේ රන් මුදුවය.
වැටුණා සාගරයේ මුදුව....

එවිට මල්ලී මධ්‍යම හඬින් ඉතිරි පදය ගයන්නට වී:

වාසනාව ඇගේ ලෞකික
විනාශ වුණා සඳහටම....

ළමයින්ගේ කාමරයේ සිට ගෙහිමි කාන්තාව කෑගසයි:

"නුඹලාට පිස්සුද? පොඩි එකා නිදි...."

නැතිනම් ඈ මෙසේ කියයි:

"වාස්යා, ඔයා කසාද බැඳලා නොවැ. කෙල්ලන් ගැන සින්දු කියන්නෙ මොකටද? ඉක්මනටම හවස දේව

මෙහෙයට සීනුව ගහවි..."

"අපි ගීතිකා ගයමු...."

පල්ලියේ ගීත වෙනත් තැන්වල ගායනා කිරීම සුදුසු නැතැයි කීමට උත්සාහ ගත් ගෙහිමි කාන්තාව, කුඩා කාමරයේ දොර දෙසට අතක් දිගු කොට පෙන්වූයේ බහු අරුත් අඟවමිනි.

"වෙනින් ගෙයක් කුලියට ගන්න ඕන. නැතිනම් මොනවා වේවිදැයි මොන යකාද දන්නෙ!" ගෙහිමියා පැවසීය.

එමෙන්ම, ඔහු වැඩ කිරීමට වෙනත් මේසයක් ගත යුතු යැයි ඉකුත් වසර තුනක් තිස්සේ නිතර, නිතර කියා ඇත.

මේ ගෙදර හාම්පුතාලා මිනිසුන් ගැන කතා කරන සැටි ඇසූ මට සපත්තු කඩේ අයිතිකාරයා සිහියට නැංවීය. සපත්තු කඩේ හිමියාද කතා කළේ ඒ ලෙසින්මය. මේ ගෙදර අයිතිකරුවන් නගරයේ ඉතාම හොඳ අය ලෙස සිතා ගෙන සිටින බවත්, හැසිරීම පිළිබඳ ඉතාම හොඳ රීති දන්නේ ඔවුන් පමණක් බවත්, ඔවුන්ගේ කතාවලින් මට පැහැදිලි විය. මා නොදත් ඒ නීතිරීති පදනම් කරගෙන ඔවුහු අනික් මිනිසුන් නිර්දය ලෙසත්, අනුකම්පා විරහිත ලෙසත් විවේචනයට ලක් කරති. ඔවුන්ගේ එම විනිශ්චය මසිතෙහි නපුරු පාළු බවක් ඇති කළේය. ඔවුන්ගේ නීතිරීතිවලට විරුද්ධව එය මා කුප්පාලීය. මගේ සතුටේ මූලාශ්‍රයක් වූයේ එම නීතිරීති උල්ලංඝනය කිරීමය.

මා කළ යුතු වැඩ කටයුතු බොහෝ විය. ගෙදර මෙහෙකරුගේ වැඩ මා කළ යුතුය. බදාදා දවස්වලට කුස්සියේ බිම සෝදා සමවාරය සහ තඹ හැඳි ආදිය පවිත්‍ර කළ යුතුය. සෙනසුරාදා දවස්වලට මුළු නිවසෙහිම බිමත් පියගැට පෙළ දෙකත් සෝදා පවිත්‍ර කිරීම මට භාර විය. පෝරනුවලට අවශ්‍ය දර පැළීම සහ ඒවා කුස්සියට ගෙනඒම, පිඟන් කෝප්ප සුද්ද කිරීම, එළවළු කැපීම, ගෙහිමි මැහැල්ලත් සමඟ කුඩයත් රැගෙන කඩයක් පාසා යාම, බෙහෙත් කඩේට සහ වෙළඳ හලට යාම ආදී සියල්ලක්ම මවිසින් කරන ලදි

මගේ ළඟම අධිපතිනිය ආච්චිගේ නංගිය. නිතර කෑකෝ ගසන, සීමා රහිත කෝපයකින් යුත් ඒ මැහැල්ල

හැමදාම උදෑසන හයට අවදි වෙයි. ඉක්මනට මූණ සෝදා ගන්නා ඈ, රාත්‍රී ඇඳුම පිටින්ම දෙවියන් යදින්න පටන් ගනියි. දණ ගසා ගෙන දේව රූප ඉදිරියේ ඈ දුක් ගැනවිලි කියන්න පටන් ගන්නී, තම ජීවිතය ගැනත්, ළමයින් ගැනත්, ලේළියට විරුද්ධවත් දෙවියන්ට දුක් ගැනවිලි ඉදිරිපත් කළාය.

"දෙවියනි, දෙවියනි, මා ඔබෙන් කිසි දෙයක් ඉල්ලන්නේ නැහැ. මට විවේකයක් ගැනීමට විතරක් ඉඩ දෙන්න. ඔබ වහන්සේගේ ශක්තිය යොදා මා සන්සුන් කරවන්නැ" යි මැහැල්ල කඳුළු පිරි දෙනෙතින් යුතුව යාච්ඤා කළාය.

ඇගේ මේ වැලපීම නිසා මම අවදිවීමි. පොරෝනයට යටින් හිස පිටතට දමා මම ඇගේ දුක් ගැනවිලිවලට සවන් දෙමි. සරත් සමයේ උදෑසන ආලෝකය මලානික බොර පැහැති ලෙසින් කුස්සියේ ජනේලයට වැටේ. ජනේල වීදුරු ඉමක් නැති වැසි නිසා තෙතබරි වෙලාය. හීතල පිරි අඩ අඳුරේ මැහැල්ල දෑත් වනමින් සැලෙයි. ඇගේ කුඩා හිස බැඳි ලේන්සුව යටින් පැසුණු තුනී හිසකේ උරහිසට වැටී ඇත. හිස බැඳි ලේන්සුව නිතර, නිතර උරහිසට වැටේ. එවිට ඈ ඉතා දැඩි ලෙස වමතින් ලේන්සුව යළිත් හිසට යවයි. ඒ අතර ඈ මුමුනයි:

"ඒකිට හෙණ වැදුණාදෙන්!"

ඈ කුරුසියේ ලකුණ ඇඳගන්නේ නළලටත්, බඩටත්, දෙඋරයටත් පහර ගසා ගන්නාක් මෙනි.

"දෙවියනි, මා අමනාපයට පත් කළාට ඇගෙන් පළි ගන්න! ලොකු පුතාගේ නෙත් පාදන්න. ඔහුට ලේළිගේ නියම තතු පෙන්වා දෙන්න. ඔහුට මගේ වික්තර් පුතු කෙරෙහි කරුණාව පෙන්වීමට ලොකු පුතාගේ සිත සදන සේක්වා! මගේ වික්තර් පුතුට දයාව පෙන්වන සේක්වා...!"

ඇගේ වික්තර් පුතු කුස්සියේ පොලාතිය හෙවත් ලී ඇඳ මත නිදාගෙන සිටී, අම්මාගේ සුසුම් ලෑම් නිසා වික්තර් පුතු අවදිවී අඩ නින්දෙන් කෑ ගසයි:

"අම්මේ, ගිරිය පුප්පාගෙන කෑගහන්නේ මොකද! මහා ගෝත කරුමයක්!"

"ඉතින් පුතා නිදාගන්න." ඈ වරදක් කළ එකියක මෙන් මුමුනයි. විනාඩි දෙකක් පමණ හිස වනමින්

යාච්ඤා කොට හිටි හැටියේම පළි ගන්නාසුලු හඬකින් කෑ ගසයි: "උන් සුනු විසුනු වෙලා, මකබෑ වෙලා යන්න සලස්වන්න, දෙවියනි..."

මෙතරම් භයානක ලෙස මගේ සීයා පවා දෙවියන්ට යාච්ඤා නොකළේය.

ඉන් අනතුරුව ඕ මා අවදි කළාය:

නැඟිටපිය! නිදාගන්නද නුඹ මෙහෙ ආවෙ...!

"සමවාරය ලෑස්ති කරපන්, දර ගෙනෙන්. ඊයේ නුඹ ලුවීනා ලෑස්ති කළේ නැහැ නොවේද? ආ"

මැහැල්ලගේ බැණීම්වලට ඉඩ නොතබා හැම දෙයක්ම ඉක්මනින් කිරීමට මම මහන්සි ගනිමි. එසේ වුවද, ඇගේ සිත් ගැනීම කළ නොහැකි දෙයකි. ඇය කුස්සිය තුළ කැරකෙන්නේ හීත කාලයේ හිම කුණාටුවක් මෙනි. කුටු, කුටුගාමින් ඈ බැණ වදියි:

"යක්පැටියා, හෙමිහිට! තෝ මගේ වික්තර් පුතුව අවදිකරනවා. හිටපිය මම තොට දෙන්නම්! කඩේට දුවපිය...."

සාමාන්‍ය දවස්වලට උදේ ආහාර සඳහා පාන් රාත්තල් දෙකක්ද, ගෙහිමි තරුණ කාන්තාවට කොපෙක් දෙකකට බනිස් ගෙඩි දෙකක්ද මිලදී ගනිමි. මා පාන් ගෙනා විට, ගැහැනු මා සැක කරමින් එය අල්ල මත තබා කිරා බලමින් ප්‍රශ්න කරති:

"බරට හරියන්න තවත් පුංචි කෑල්ලක් දුන්නේ නැත්ද? නැහැ? කට ඇරපිය! මා කට හැර පෙන්වූ විට ඔවුහු ජයග්‍රාහී ලීලාවෙන් කෑ ගැසූහ. "වැඩිපුර පුංචි කෑල්ල මූ කාලා! ඔන්න පාන් කෑලි දත් අස්සේ හිර වෙලා!"

මා වැඩ කළේ ඉමහත් ආසාවෙකිනි. ගෙදර කුණු කසළ සුද්ද පවිත්‍ර කර දැමීම මට සතුටක් ගෙන දුන්නේය. සතුටු සිතින් ඉන්නා විට ගැහැනුන් මා ගැන කතා කරන සැටි මා නිතර අසා ඇත.

"වැඩට කම්මැළි නැහැ."

"පිරිසිදුයි."

"මහ මුරණ්ඩු කොල්ලා, එච්චරයි."

"ඉතින් අම්මේ උඟව හදාවඩා ගත්තෙ කවුද?"

ගැහැනුන් දෙදෙනාම මා ඔවුන්ට ගරු කළ යුතු යැයි

කියමින් මට උගැන්වීමට මහන්සි ගත්තද, ඔවුහු මඳ නුවණ ඇත්තන්හයි මම සිතීමි. ඔවුනට ගරු නොකළ මා කතා කළේත්, ගරු සරු නැතිවය. ගෙහිමියාගේ තරුණ බිරිය ඇගේ සමහර උපදෙස් මා ගණන් නොගන්නා බව දැනගත්තී, එනිසාම මට නිතර, නිතර මෙසේ කිව්වාය:

"නුඹ මතක තියාගනින්, නුඹ අරන් තියෙන්නේ හිඟන පවුලක ඉඳලා! මම නුඹේ අම්මට වීදුරු පබළු අල්ලපු සේද සළුවක් තෑගි කළා!"

දවසක් දා මම ඇයට මෙසේ කිව්වෙමි.

"ඉතින් ඔය කෙහෙම්මල තෑගි කළැයි කියල නුඹට මගේ හම ගලවල දෙන්නද?"

"අනේ දෙවියනේ මූ ගෙදර ගිනි තියාවි!"

බිය වූ ඈ කෑ ගැසුවාය.

ගිනි තියන්නේ කුමක් නිසාද? යන්න වටහාගත නොහැකි වූ මම ඉමහත් ලෙස මවිතයට පත්වීමි.

ගැහැනු දෙදෙනා නිතර පාහේ මට විරුද්ධව ගෙහිමියාට පැමිණිලි කළහ. ඔහු මට දැඩි ලෙස තරවටු කළේය.

"නුඹ ප්‍රවේසමින් හිටපන්!"

ඔහු දවසක්දා මන්දෝත්සාහී ලෙස බිරිඳට සහ අම්මාට මෙසේ පැවසීය:

"නුඹලා දෙන්නත් බොහොම අපූරුයි! බූරුවකු පිට නැඟලා යනවා වගේ ඒ කොල්ලාගේ පිට උඩ යනවා. වෙනින් කොල්ලෙක් නම් මෙලහකට පැනලා ගිහින්. නැතිනම් වැඩ කරලාම මැරිලා ගිහින්..."

මේ නිසා දෙදෙනාම කෝපවී අඬන්නට වූහ. ඔහු ගේ බිරිඳ දෙපා පොළොවේ හප්පමින් කෝප වී කෑගැසුවාය. "කොල්ලා ඉදිරියේ ඔහොම කතා කරන්න වටිනවද, හිසකේ දිග මෝඩයා!" ඔය කතාවෙන් පස්සේ ඒ කොල්ල මට කොහොම සලකාවිද? මම ළමයකු හම්බවීමට ඉන්න කෙනෙක්!"

ඔහුගේ අම්මා අඬමින් කන්නලව් කළාය:

"වසීලි, නුඹට දෙවියෝ සමාව දේවි, නුඹ මගේ වචන මතක තබා ගනින්, නුඹ කොල්ලාව නරක් කරනවා!"

ඔවුන් ගිය පසු ගෙහිමියා කෝපයෙන් මට බැණ වැදුණේය.

"යක්පැටියා, තෝ නිසා කරදර කොච්චර ද කියල පේනවද? ඔන්න මම නුඹව සීයා ළඟට ආපහු යවන්නම්. එතකොට තොට මස්කටු එකතු කර කර ගෙවල් ගානෙ රස්තියාදු වෙන්න පුළුවනි!"

අමනාපය උහුලා ගත නොහී මම ඔහුට පිළිතුරු දුනිමි.

"මස් කටු එකතු කිරීම මීට වැඩිය හොඳයි. මාව වැඩට ගත්තෙ, ප්ලෑන් අඳින්න උගන්වනවා කියල, නමුත් උගන්වන්නේ මොනවාද? කුණු සුද්ද කරන්න...."

ගෙහිමියා මගේ කෙස්වැටියෙන් අල්ලා ගත්තේ වේදනාව නොදැනෙන ලෙසත්, පරෙස්සමෙනුත්ය. ඔහු මගේ නෙත් දෙස බලා මවිතයෙන් මෙසේ පැවසීය:

"නුඹ පාෂාණ්ඩයෙක්!, මල්ලී නුඹව නම් මට කොහොමටවත් අල්ලන්නෙ නැහැ..."

ඔහු මා පන්නා දමතැයි මම සිතුවෙමි. එහෙත්, දවසකට පසු ඔහු වටකුරු ලෙස බටයක් මෙන් එතූ අඳින කඩදාසියක්, පැන්සලක්, රූල් පොල්ලක් සහ ත්‍රිකෝණයක් රැගෙන විත් මට මෙසේ පැවසීය:

"පිහියා සුද්ද කරල ඉවර වෙලා මෙන්න මේක ඇඳපන්!"

කඩදාසියේ දෙමහල් නිවාසයක මූණත ඇඳ තිබිණි. එහි වූ කවුළුවල ලස්සන කැටයම් වැඩ ඇඳලාය.

"මෙන්න නුඹට අඳින කවකටු! සියල්ල රේඛා නිසි ලෙස මැනලා තිත් ලකුණු කරපන්. ඉන් පසුව තිත් අතර පැන්සලෙන් ඉරි ඇඳපන්. මුලදී දිගට ඒ කියන්නේ හරස් අතට, ඊට පස්සෙ හරහට අතට, ඒ කියන්නේ සිරස් අතට. පටන් ගනින්!"

පවිත්‍ර වැඩක් ලැබීම සහ ඉගෙනීම ආරම්භ වීම නිසා මම ඉමහත් සේ ප්‍රීතියට පත්වීමි. එහෙත්, මා කඩදාසිය දෙසත්, කවකටු ආදිය දෙසත් බැලුවේ සුභද භීතියෙකිනි. මන්දයත්, මා කිසිවක් අවබෝධ කර ගැනීමට අසමත් වූ බැවිනි.

එසේවතුදු, මම වහාම දෑත් සෝදා ගෙන ඉගෙන ගැනීමට වාඩිවුණෙමි. හරස් අතට ඇති සියලු රේඛා ඇඳ

ඒවා පිරික්සා බැලීමි. සියල්ල නිවැරැදිය! එහෙත්, රේඛා තුනක් දිගින් වැඩි වී ඇත. ඊළඟට සිරස් අතට රේඛා තුනක් දිගින් වැඩි වී ඇත. ඊළඟට සිරස් අතට රේඛා ඇන්දෙමි. මා පුදුමයට පත් වූයේ මා ඇඳි නිවස අමන ලෙස ඇදකුදුව තිබෙන සැටි දුටු විටය. කවුළු තිබිය යුතු තැන්වල ඒවා නොවීය. එක් කවුළුවක් බිත්තියටත් එහා ගොසිනි. එය සිතියමට එපිටින් තිබිණි. ගෙට ඇතුළු වන ප්‍රධාන දොරටුව දෙවැනි මහල දක්වා උඩ ගොසිනි. කර්නීසය පියස්ස මැදට වී ඇති අතර, අට්ටාල කවුළුව දුම් බටය උඩ නැඟලාය.

කඳුළු පිරි දෙනෙතින් යුතුව, මම මගේ නිර්මාණ චිත්‍රය දෙස බලා ඉමහත් මවිතයට පත් වූයෙමි. මෙවැන්නක් කෙසේ ඇති වී දැයි වටහා ගැනීමට උත්සාහ කෙළෙමි. එය සිදුවූ සැටි වටහා ගැනීමට අපොහොසත් වූ නිසා මනඃකල්පිත ලෙස වැරැදි හරිගැස්සවීමට වෑයම් කළෙමි. ගෙයි පියස්සේත්, කර්නීසවලත්, කවුළුවලත් කපුටන්, පරෙවියන් සහ වී කුරුල්ලන් ඇන්දෙමි. ජනේල ඉදිරිපිට බකල ගැසුණු කකුල් සහිත මිනිසුන් කුඩ ඉහළාගෙන සිටින සැටි රූපයට නැඟූ මම ඔවුන්ගේ විකලාංග සැඟවීමට තැත් නොකළෙමි. ඉන් ඉක්බිතිව, එය උඩින් ඇද අතට ඉරි වැටෙන සැටි එනම් වැසි වසින සැටි ඇඳ මගේ රේඛා චිත්‍රය ගුරුවරයා වෙත ගෙන ගියෙමි.

ඔහු බැම සඟළ ඔසවාගෙන කෙස්වැටිය අතගාමින් බැරෑරුම් ලෙස ප්‍රශ්න කළේය:

"මේ මොනවද ඇඳලා තියෙන්නෙ?"

"මේ වැස්ස වහිනවා. වහින කොට ගෙවල් පේන්නෙ ඇද වෙලා වෙගෙයි! මොකද දන්නවද වැස්සක් ඇද වෙලා පොළොවට වැටෙන නිසා. ඔන්න මේ කාක්කෝ, පරෙවියෝ, කුරුල්ලෝ උන් වැහි වහින කොට හැමදාම කර්නීසවල වහලා ඉන්නවා. මිනිස්සු ගෙවල්වලට දුවන සැටි, නෝනා කෙනෙක් බිම වැටිලා. මේ ඉන්නේ, දෙහි ගෙනයන මිනිහෙක්," මම විස්තර කළෙමි.

"මම නුඹට අප්‍රමාණ ලෙස ස්තුතිවන්ත වෙනවා."

ඔහු චිත්‍රය දෙස හිස පහත් කර බලත්ම ඔහුගේ දිගු කෙස්වැටිය චිත්‍රය මත වැටිණි. ඔහු සිනාසී කෑගැසුවේය:

"අනේ බොල වල් වී කුරුල්ලෝ තෝ කෑලි, කෑලිවලට පුපුරන්න ඕන. මේ වගේ වැඩක් කළාට!"

කුඩා පීප්පයක් බඳු බඩගෙඩිය ඉදිරියට දමා ගෙන ගෙහිමියාගේ බිරිඳ විත්, මගේ චිත්‍රය දෙස බලා සැමියාට මෙසේ කිව්වාය.

"ඔයා මූට තළන්න!"

එහෙත්, ගෙහිමියා සාමකාමී ලෙස මෙසේ කිව්වේය:

"කමක් නැහැ. මාත් පටන් ගත්තේ ඔයට වැඩිය හොඳින් නොවේ."

මා කළ වැරැදි රතු පැන්සලකින් සටහන් කළ ඔහු, තවත් කඩදාසියක් දී අණ කළේය:

"තවත් වරක් ඇඳපන්! හරියට ඇඳීමට ඉගෙන ගන්නා තුරු මෙයම කීපවරක් අඳින්න ඕන..."

මගේ දෙවැනි චිත්‍රය පළමුවැන්නට වඩා බෙහෙවින් උසස් විය. ජනේලයක් පමණක් එළි පත්තට වැටී තිබිණි. එහෙත්, ගෙය හිස්ව තිබීම මගේ නොසතුටට හේතු වූයෙන්, මම එය විවිධ මිනිසුන්ගෙන් පිරවීමි, පවන් සලන විජිනි පත් අතින් ගත් කාන්තාවක්ද, සිගරැට් කටේ රුවාගත් තරුණයන්ද, සිගරැට් රහිත එක් මිනිහෙක් ජනේලයෙන් බලා විහිළු කරන සැටි, මම ඇන්දෙමි. ගෙයි ප්‍රධාන දොරටුව අසල අස්රියකරුවෙක්ද, හතර ගාතෙන් වැටී සිටින බල්ලකුද මගේ නිර්මාණයට අයත් විය.

"නුඹ ආයෙමත් කුණු ගොඩවල් ඇන්දේ මොකද?" ගෙහිමියා ප්‍රශ්න කළේ කෝපයෙනි.

"මිනිසුන් නැතුව බොහොම පාළුයි වගේ" යැයි මා ඔහුට කී විට ඔහු මට බැණ වැදුණේය.

"නුඹට ඉගෙන ගැනීමට ඕන නම්, ඉගෙන ගනින්! මුරණ්ඩු වැඩ නොකරන්!"

තෙවැනි වර මට නිසි පරිදි ඒ මූණත ඇඳීමට හැකි විය. එවර එය ඔහුගේ සිත් ගත්තේය.

"ඔන්න දැක්කද, නුඹට අඳින්න පුළුවනි. ඉතින් නුඹට ඉක්මනට හැකිවේවි, හොඳට අඳින්න...."

අනතුරුව ඔහු මට අභ්‍යාස පාඩමක් නියම කළේය.

"මේ ගෙයි සැලැස්මක් ඇඳපන්, කාමර පිහිටා තියෙන හැටි, දොරවල් හා ජනේල තියෙන තැන්, ගෘහ භාණ්ඩ

තියෙන තැන්, මම නුඹට සටහන් දෙන්නේ නැහැ. නුඹම කල්පනා කරලා ඇඳපන්!"

මම කුස්සියට විත්, කොතැනින් ආරම්භ කළ යුතු දැයි කල්පනා කරන්නට වීමි.

එහෙත්, සැලැස්ම ඇඳීමේ ශිල්පය එතැනින් අවසන් විය.

ගෙහිමියාගේ අම්මා - මැහැල්ල මා වෙත විත්, නපුරු ලෙස ප්‍රශ්න කළාය.

"අදින්ට ඕනද?"

සැණෙකින් ඈ මගේ කෙස්වැටියෙන් අල්ලා කොතරම් වැරෙන් මගේ මුහුණ මේසයට හැප්පුවේද යත්, මගේ නහයත්, දෙතොලුත් පැළිණි! ඈ වියරු ලෙස උඩ පනිමින් කඩදාසිය ඉරා, කවකටු, පැන්සල් ආදිය විසිකොට දමා, ජයග්‍රාහී ලීලාවෙන් දෑත් ඉණේ ගසාගෙන කෑ ගැසුවාය.

"ඉතින් ඔය පැලෑන් ඇන්දද? ඒවා හරි යන්නෙ නැහැ. පිට එකකුගෙන් වැඩ ගන්න. එතකොට එක කුස උපන් සහෝදරයාගේ බඩට වදීවි!"

ගෙහිමියා සහ ඔහුගේ බිරිඳ පැමිණියෙන් තිදෙනා එක එකාට බැණ වදිමින් මහා ගාලගෝට්ටියක් ඇති කරගත්හ. අනතුරුව ඇඬීම පිණිස ගැහැනුන් දෙදෙනා ඉවත ගිය විට, ගෙහිමියා මට මෙසේ පැවසීය.

"අදින්ට ඉගෙන ගැනීම දැනට අතහැර දාපන්. පේනවා නේද ගෙදර ඇතිවෙන කලබලයක හැටි."

ගෙහිමියා කෙරෙහි මා තුළ අනුකම්පාවක් උපනි. පැගී, පොඩිවී සිටින ඔහු ආරක්ෂා රහිතය. ගැහැනුන් ගේ බෙරිහන්දීම නිසා ඔහු සදහටම බිහිරි වූවාක් මෙනි.

මා ඉගෙන ගන්නවාට මැහැල්ල අකැමැති බවත්, වුවමනාවෙන්ම මට ඇය බාධා කරන බවත් මම මුල සිටම දැන සිටියෙමි. ඇඳීම ආරම්භ කිරීමට පෙර මම ඇගෙන් හැමදාම අවසර ඉල්ලා සිටියෙමි.

"කරන්ට වැඩක් නැත්ද?"

මැහැල්ල මූසල ලෙස පිළිතුරු දුන්නාය.

"වැඩ තියෙන කොට කියන්නම්, දැන් මේසය ළඟට වෙලා හිටපන්,"

විනාඩි කීපයකට ඉක්බිතිව ඈ මා වෙනත් වැඩකට යැව්වාය. නැතිනම් මෙසේ අණ කළාය:

"නුඹ ඉස්සරහ කාමරේ පඩි පෙළ හෝදල තියෙන හැටි දැක්කද? අහු මුලුවල දූවිලි, ගිහින් හොඳට පිහිදාපිය...."

මම එහි ගොස් බැලීමි. එහෙත් දූවිලි කිසිවක් එහි නොවීය.

"තෝ මා සමඟ තර්ක කරන්න එනවද?" මැහැල්ල ගුගුළාය.

දවසක් දා ඈ මගේ අඳින කඩදාසිවලට ක්වාස් පානය වත්කළාය. තවත් දවසක දේව රූප ඉදිරියේ තබා ඇති පහනෙන් තෙල් ගෙන කඩදාසිවලට හැලුවාය. ඇය හැසුරුණේ මුරණ්ඩු කෙල්ලක මෙනි. ඇගේ කපටිකම්වල ළාමක බවක් තිබුණු අතර, එම කපටිකම් වසා ගැනීමට ඇය අසමත් වූයේත් ළාමක ලෙසිනි. මෙතරම් ඉක්මනින් සහ ලෙහෙසියෙන් කිපෙනසුලු සහ එමෙන්ම, හැම කෙනෙකුටත්, හැම දෙයකටත් විරුද්ධව ආවේගයකින් යුතුව දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමටත් කැමැති මිනිස් ප්‍රාණියකු මීට පෙර මම කිසි දිනෙක නොදුටුවෙමි. හැම මිනිහෙක්ම දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට කැමතිය. එහෙත්, ඈ දුක් ගැනවිලි ඉදිරිපත් කළේ විශේෂ සතුටකින් හා ගීතයක් ගයන විටෙක මෙනි.

ඈ ඇගේ බාල පුතුට ආදරය කළේ පිස්සියක ලෙසිනි. ඇගේ එම ආවේණික උම්මත්තක ආදරය නිසා මම හාස්‍යයට හා බියටද පත්වීමි. ඇගේ එම ආදරය කෝපාන්විත බලයක් හැටියට මිස වෙනත් ලෙසකින් එය හැඳින්විය නොහැකිය. උදෑසන යාච්ඤාවලින් ඉක්බිතිව, ඈ පෝරනුවේ පඩිය මතට නැඟ ඇගේ බාල පුතු නිදා සිටින ලීමුවා මැස්ස හෙවත් පොලාතියේ අද්දරට වැළමිට තබා උණුසුම් ලෙස මෙසේ මුමුනයි:

"දේව කුමාරයෙකු වැනි පුතුනි, මගේ පිරිසිදු, පවිත්‍ර, දියමන්ති කැටයක් වැනි දේව දූතයා! නිදාගන්න, මගේ පුතුනි, මගේ ආදර පුතාට හොඳ හීනයක් පේන්න ඕන. මගේ පුතුට ඉතාම ලස්සන, ඉතාම පොහොසත් රාජ කුමාරිකාවක් වැනි සිටු දුවක් ලැබෙන්න ඕන! මගේ පුතුගේ සතුරන් බල්ලන් වගේ මැරිලා, මකබෑ වෙලා

යන්න ඕන! මගේ පුතුගේ මිතුරන් අවුරුදු සීයයක් ආයු ලබන්න ඕන! ලස්සන තරුණ කෙල්ලන් මගේ පුතුගේ පස්සෙන් දැපනෙ වැටිලා එන්නට ඕන!"

මෙය ඇසෙන විට මම නිම්හිම් නැති හාස්‍ය රසයක් විඳිමි. ඇගේ ආදරණීය පුත් වික්තර් ගොරහැඬි, කම්මැළියෙකි: ඔහු කොට්ටෝරුවකුට සමානය. ඔහුගේ නැහැය මහ විශාලය, වෛර්ණය, මුරණ්ඩුය. එමෙන්ම මුග්ධයෙකි.

මැහැල්ලගේ අඳෝනාව නිසා අවදිවන වික්තර් ඇයට ගොරහැඬි ලෙස බැණ වදියි:

"අම්මේ, නුඹ යකාට පලයන්. අහවල් ඉළව්වකටද මේ කන්දොස්කිරියාව!.... නිදා ගන්නවත් ඉඩ දෙන්නෙ නැහැ!"

සමහර දවස්වලට ඈ යටත් පහත් ලෙස පෝරනු පඩියෙන් බැස සිනාසෙයි.

"ඉතින් නිදාගනින්, ගොරහැඬි කොල්ලා..."

එහෙත්, මෙසේ සිදුවන අවස්ථාද තිබිණි: පෝරනුවේ අයිනට යන ඈ කකුල් නවයි. අනතුරුව ඇය කට හැරගෙන හුස්ම ගන්නේ දිව පිලිස්සුණු විටෙක මෙනි. ඇගේ කටින් නපුරු වචන පිටවිය:

"එහෙමද? තෝ බැල්ලිගෙ පුතා! වදාපු අම්මව යකාට යැව්වද? තෝ මගේ ශාපලත් ලජ්ජාව. යක්ෂයා තමයි තෝව මගේ ආත්මය ඇතුළට දැම්මේ! තෝ ඉපදෙන්න ඉස්සෙල්ලා මළා නම්!"

ඈ බේබද්දකු සේ ඉතා අසභ්‍ය වචන කී අතර ඒවා අසා සිටීම පවා ඉතා නින්දා සහගත විය.

මැහැල්ල නිදා ගත්තේද මඳ වශයෙනි. පෝරනු වහලේ නිදාගන්නා ඈ රෑට කීපවරක්ම නැඟිටින්නේ අසහනයෙනි. සමහර දාට මා නිදා සිටින දිවානයට ඇවිත් මා අවදි කරවයි.

"ඔබට මක් වෙලාද?"

"කට වහපිය." ඈ කළුවරේම යමක් දෙස බලමින් කුරුසියේ ලකුණ ඇඳගනිමින් මුමුනන්න පටන් ගනියි: " අහෝ දෙවියනි, දිවැස් ඇති ඉල්යා මුනි තුමනි.... අපමණ

දුක් විඳපු බාර්බරා මුනි තුමියනි... මාව හදිසි මරණයෙන් ගලවාගන්න.

වෙවුලන අතින් මැහැල්ල ඉටිපන්දම් පත්තු කළාය. විශාල නැහැයක් සහිත ඇගේ වටකුරු මුහුණ නොසන්සුන් ලෙස ඉදිමිලාය. ඇගේ අළුවන් දෙනෙත්, අඳුර නිසා විකෘති වී පෙනෙන දේ දෙස බියෙන් බලමින් සැලෙයි. කුස්සිය විශාලය. එසේවතුදු, මෙහි අල්මාරි, පෙට්ටගම් මේස ආදිය තිබිණි. රාත්‍රී අඳුරට කුස්සිය කුඩාවට පෙනෙයි. සඳරැස් කුස්සියට වැටී ඇත. දේව රූප ඉදිරියේ දෙවියන්ට තබා ඇති පහනේ ගිනි සිළුව නැටවෙයි. බිත්තියේ එල්ලා ඇති පිහි ආදිය පෙනෙන්නේ දිගැති අයිස් කැට හා අයිස් කරල් මෙනි. රාක්කයේ තබා ඇති ලෝහ තාච්චි ඇස් නැති අඳ මුහුණුවලට සමානය.

මැහැල්ල සෙමින් පෝරනු මැස්සෙන් බිමට බැස ගඟ අද්දර සිට ජලයට බසින්නාක් මෙන්, පාවහන් රහිතව කුස්සිය මුල්ලේ තබා ඇති අත සෝදන මෙවලම ඇති තැනට ගියාය. ඒ මෙවලම් හැඩය අනුව කඳින් කපා වෙන් කළ හිසකට සමානය. වතුර පිරි පීප්පය තබා ඇත්තේත් ඒ මුල්ලේය.

හඬ නගමින් සහ සුසුම්ලමින් ඈ වතුර බී, හිම මල් රටාවක් පිපී ඇති ජනේල වීදුරුවෙන් පිටත බැලුවාය.

"මට සමාවෙන්න දෙවියනි, මට සමාවෙන්න."

ඈ සෙමින් තොල් මතුරයි.

සමහරදාට ඈ ඉටිපන්දම් නිවා දමා දණින් වැටී, අමනාපයෙන් යුතුව යාච්ඤා කරයි:

"දෙවියනි මට ආදරය කරන්නේ කවුද? මා අවශ්‍ය කාටද?"

නැවත පෝරනු මැස්ස උඩට නගින මැහැල්ල, පෝරනු බටයේ ඇති කුඩා දොර වසා තිබේදැයි බලා එයට කුරුසියේ ලකුණ අඳියි. කුඩා දොරෙහි කොක්ක අතගෑම නිසා අළු අතේ ගා ගන්නා ඇය, බැණ වදිමින් සිට වහාම නිදි ලොවට වදින්නේ කිසියම් අදිසි බලවේගයක් විසින් ඇය මඩලනු ලැබූ විටෙක මෙනි. ඈ මා අමනාපයට පත් කළ විට, මගේ සීයා ඇය සරණ පාවා නොගැනීම

ගැන මම දුක්වීමි. එහෙනම් මේ මැහැල්ල අපේ සීයාව කා දමනු ඇත. ඇයටද සීයා නිසා සෑහෙන කරදරවලට මූණ පෑමට සිදුවනු ඇත. ඈ මා නිතර අමනාපයට පත් කළාය. එහෙත්, ඇගේ මුහුණද දුකෙන් පිරී ඉදිමී තිබෙන අවස්ථාද තිබිණි. ඇගේ දෙනෙත් කඳුළුවල ගිලෙයි. එවිට ඈ ඒත්තු ගැන්වෙන ලෙස කතා කළාය.

"නුඹ හිතන්නෙ මට ලේසියි කියලද? ළමයින් වැදුවා, උන්ව ඇති දැඩි කළා, උන්ගේ තත්ත්වය උසස් කළා, මේ සියල්ලම කුමක් සඳහාද? දැන් ඉතින් උන් ළඟම කුස්සි අම්මා හැටියට ජීවත් වෙනවා. මේ ජීවිතය මට සැපතක් කියල නුඹ සිතනවද? මගේ ලොකු පුතා ගෑනියක් ගෙනාවා. දැන් එයා මට වෙනස්කම් කරනවා! මේක හොඳ වැඩක්ද? ඉතින්!"

"හොඳ වැඩක් නොවේ"යැයි මම ඇයට අවංක සිතින් කිව්වෙමි.

"පේනවද? ඔන්න ඔහොමයි..."

ඊළඟට මැහැල්ල ඇගේ ලේළිය ගැන ලජ්ජා නැති අධම කතා කියන්නට වූවාය.

"මම ඒකින් එක්ක එකට නාන ගෙදර නෑවා. අපොයි ඒකිගෙ ඇඟේ හැටි! ලස්සන ගෑනු ඔහොමද?"

පිරිමින් හා ගැහැනුන් අතර ඇති සබඳකම් ගැන ඇය කතා කළේ ඉතා නින්දිත සහ ගොරහැඩි ලෙසිනි. මුලදී ඇගේ ජඩ කතා නිසා මා තුළ පිළිකුලක් ඇති වුවද, අනතුරුව මා ඒ කතා සැලකිල්ලෙන් සහ වුවමනාවෙන් අසන්නට වූයේ, ඇගේ එම කතාවල එක්තරා දුක්භරිත සත්‍යයක් ඇති බව මට හැඟුණු බැවිනි.

"ගැහැනිය ශක්තිමත්, ඒකි දෙවියන් වහන්සේව පවා රැවැට්ටුවා. ඔන්න ඔහොමයි!" මැහැල්ල එසේ කියමින්, මිටින් මේසයට තට්ටු කළාය. "ආදම්ගේ ගෑනි යේවා නිසා සියලු මිනිස්සු නරකාදියට යනවා. ඔන්න ඔහොමයි!"

ගැහැනියගේ ශක්තිය සහ බලය ගැන ඇයට අවසානයක් නැතිව වුවද, කතා කළ හැකිය. එම කතාවලින් ඇය අදහස් කරන්නේ කිසිවකු බිය ගැන්වීමට බව මට සිතිණි. "යේවා දෙවියන් වහන්සේව රැවැට්ටුවා." යන්න මට අමතක නොවන ලෙස සිතෙහි සටහන් විය.

අප වාසය කළ නිවස අසල තවත් උප නිවාසයක් විය. එයද අපේ නිවෙස තරම්ම විශාලය. මේ නිවාස දෙකෙහි පවුල් අටක් පදිංචිව සිටියහ. එයින් හතර දෙනෙක් යුද්ධ නිලධාරියෝය. පස්වැන්නා යුද්ධ බළකායක සූජකවරයෙකි. ගෙවත්ත යුද්ධ නිලධාරීන්ගේ ආවතේවකරුවන්ගෙන් පිරී තිබිණි. යුද්ධ නිලධාරීන්ගේ වැඩ කටයුතු කිරීම සඳහා රෙදි සෝදන්නියෝ, මෙහෙකාරියෝ, කුස්සි අම්මලා ආවෝය. හැම කුස්සියකම පෙම් හබයෙකි. කඳුළු වැගිරවීම්, බැණ ගැනීම්, ගුටිබැට හුවමාරු කර ගැනීම් නොකඩවා කෙරිණි. සෙබළු ඔවුන්, ඔවුන් සමඟත් අගල් හාරන්නන් සමඟත්, නිවාස අයිතිකරුවාගේ වැඩකාරයන් සමඟත් ගුටි බැට හුවමාරු කර ගත්හ. ගැහැනුන්ට පහර දුන්හ. දුරාචාරය, මෘගයන්ගේ නොසිඳෙන කාමාග්නිය, ආදිය මෙහි පිරී තිබිණි. ක්‍රෑර හැඟීම්, තේරුම් විරහිත වේදනා විඳීම්, ජයග්‍රාහකයන්ගේ නින්දා සහගත පුරසාරම් දෙඩීම්, සවිස්තර සහිතවත් අවඥා සහගත ලෙසත් මගේ ස්වාමිවරුන් විසින් දිවා ආහාරය, හවස තේ සහ රාත්‍රී ආහාරය ගන්නා විට සාකච්ඡා කරන ලදි. මැහැල්ල සියලු පදිංචිකරුවන්ගේ තොරතුරු ඉතා හොඳින් දැන සිටි අතර, දුෂ්ට ප්‍රබෝධයෙන් සහ ඉමහත් වුවමනාවෙකින් ඒවා ගැන විස්තර වාර්තා ඉදිරිපත් කළාය.

ගෙහිමියාගේ තරුණ බිරිඳ ඒ කතා අසන්නී, මහතැති දෙතොල්වලින් මඳ සිනා පෑවාය: වික්තර් කොක්හඬ ලමින් සිනාසුණු අතර, ගෙහිමියා මුහුණ ඇඹුල් කර ගනිමින් මෙසේ කිව්වේය.

"අම්මේ ඔය ඇති නවත්වන්න..."

"අනේ දෙවියනි, මට වචනයක් කට ඇරලා කියන්න නරකයි," කතාකාරිය දුක් ගැනවිලි කිව්වාය.

වික්තර් අම්මාට දිරි දුන්නේය:

"අම්මේ දිගටම කියන්න. ලජ්ජාවෙන්ට දෙයක් නැහැ! සියල්ලෝම අපේ අය මිස පිට අය නොවෙයි..."

වැඩිමහලු පුතා අම්මාට සැලකුවේ එක්තරා අනුකම්පාවෙකිනි. ඇයත් සමඟ තනිව සිටීමට ඔහු නිතර අකැමැති විය. බැරිවෙලාවත්, ඈ ඔහු තනිකර අල්ලා ගතහොත් ඈ ඔහුගේ බිරිඳට විරුද්ධව දුක් ගැනවිලි

ඉදිරිපත් කොට, අනතුරුව ඔහුගෙන් මුදල් ඉල්ලුවාය. ඔහු හණිකට ඇය අතට රූබල් තුනක පමණ රිදී කාසි දුන්නේය.

"අම්මා සල්ලි ඉල්ලන්නෙ තේරුමක් නැතිවයි. මට මුදල්වලට විශේෂ කෑදර කමක් නැහැ. නමුත්, ඔබේ ඉල්ලීම නිකරුණේ, තේරුමක් නැති වැඩක්!" ලොකු පුතා කියයි.

"මම හිඟන්නන්ට දෙන්නයි, ඉටිපන්දම් ගන්නයි, පල්ලියට දෙන්නයි..."

"මොන හිඟන්නන්ටද! ඔබ වික්තර්ව අන්තිමටම නරක් කරනවා..."

"නුඹ මල්ලීට ආදරේ කරන්නෙ නැහැ. ඒක ලොකු පාපයක්!"

ඔහු අතක් වනා ඇගෙන් ඉවතට යයි.

වික්තර් ඔහුගේ අම්මාට සැලකුවේ ගොරහැඩි සහ උපහාසාත්මක ලෙසිනි. ඔහු ඉතා ගිජු ලෙස ආහාර ගිල දැමූ අතර, නිතර බඩගින්නේ සිටියේය. ඉරිදා දවස්වලදී අම්මා ඇගේ වික්තර් පුතුට විශේෂයෙන් වෙල්ලවැහුම් පිස මා නිදාගන්නා දිවානය යටැති හැළියක සඟවා තැබුවාය. ඉරිදා දේව මෙහෙයෙන් ඉක්බිතිව ගෙදර එන වික්තර් හැළියේ ඇති වෙල්ලවැහුම් කමින් අම්මාට බැණ වදියි:

"හරි පොඩ්ඩයි නෙව. මීට වැඩිය බැරි වුණාද මළ ඉලව්වක් නෙව!"

"අර දෙන්නා දකින්න ඉස්සෙල්ලා නුඹ ඉක්මනට කාපන්..."

"මම කියන්නම් අම්මා මා වෙනුවෙන් වෙල්ලවැහුම් හොරකම් කරලා තිබ්බයි කියලා. මගේ කනේ යකඩ ඇණේ!"

දවසක් දා මම හැළියෙන් වෙල්ලවැහුම් දෙකක් කෑවෙන්, වික්තර් එය දැනගෙන මට ඉතා නපුරු ලෙස පහර දුන්නේය. ඔහු මට කැමති වූයේවත්, මා ඔහුට කැමති වූයේවත් නැත. දවසකට තෙවරක් ඔහුගේ සපත්තු මා ලවා සුද්ද කරවමින් ඔහු මා අවඥාවට ලක් කළේය. ඔහු නිදා සිටින ලී මැස්සේ ලෑලි අතරින් මගේ හිසට

කෙළ ගැසීමට ඔහු නිතර මහන්සි ගත්තේය.

වික්තර් ඔහුගේ අයියාට සමාන වීමට සිතා ඔහු මෙන් 'මෘග කිකිළියනේ' වැනි වචන හා ප්‍රස්ථාව පිරුළු දෙසා බෑමට මහන්සි ගත්තද, ඒවා ඉතා මුග්ධ එමෙන්ම, තේරුම් විරහිත බවක් කියා පෑවේය.

"අම්මේ, දකුණට හැරෙන්, මගේ මේස් කුට්ටම කොහෙද?"

ඔහු මගෙන්ද නිතර අමන ප්‍රශ්න ඇසීය:

"නව ලෝකය කියන්නේ ලෝක නවයකටද? මවුබිම කියන්නේ අම්මාගේ බිම නිසාද? මයිනහම කියන්නේ මයිනගේ හමටද? විස්තර කරපන් අලෝෂා!"

ඔවුන් සියලු දෙනාගේ කතාබහද මා සිත් නොගත්තේය. ආච්චි සහ සීයා කතා කළ භාෂාව ලස්සන වූයෙන්, මම එයට හුරු පුරුදු වූයෙමි. එහෙත්, මේ ගෙදර හාම්පුතුන් වචන එක් කරන ආකාරය මට මුලදී තේරුම් ගත නොහැකි විය. "භයානක ලෙස හිනායන වැඩක්," " මැරෙන තුරු කන්න ඕන," "බියජනක සතුටකි." හිනායන වැඩක් බියජනක විය නොහැකි යැයිද, බියජනක දෙයක් සතුටක් විය නොහැකි යැයිද, මරණ මොහොත දක්වා ආහාර ගැනීම කළ නොහැකි යැයිද මම සිතීමි.

"එහෙම වචන ගළපන්න පුළුවන්ද?" මම ඔවුන්ගෙන් ඇසුවෙමි.

එවිට ඔවුහු මට බැණ වැදුණහ.

"මදෑ හරිම ගුරෙක්! හිටපිය තොගෙ දෙකන් උගුල්ලන්නම්..."

"දෙකන් උගුල්ලනවා!" යන කීම වැරැදි බව මගේ අදහස විය. ගහක් මුලක් වැනි දෙයක් උගුල්ලා දැමිය හැකිය.

දෙකන් උගුල්ලා දැමිය හැකි බැව් ඔප්පු කිරීමට ඔවුහු උත්සාහ ගත්හ. එය මට ඒත්තු නොගියෙන් මම ජයග්‍රාහී ලෙස මෙසේ පැවසීමි:

"කොහොම වුණත් දෙකන් උගුල්ලා දමන්න බැහැ!"

කුනාවිනොහි වීදිවලට වඩා මිණිය නොහැකි තරම් විශාල ලෙස මේ නගරයෙහි ක්‍රෑරකම්ද, නින්දිත ලජ්ජා නැති ක්‍රියාද බොහෝ විය. මෙහි ගණිකා මඩම් බොහෝය.

"වේස" ගෑනුන්ගේ සංඛ්‍යාවද විශාල විය. කුනාවිනොහි මුරණ්ඩුකම් සහ ජඩකම් නිසා හැඟුණේ ඒ මුරණ්ඩුකම් සහ ජඩකම් නොවැළැක්විය හැකි දේ ලෙසිනි. අමාරු, අඩක් කුසගිනි සහිත බරපතළ වැඩ නිසා හටගත් විපාක ඵලයක් හැටියටය. මෙහි බඩපුරා කාපු මිනිස්සු සැහැල්ලු ලෙස ජීවත් වූහ. වැඩ වෙනුවට තේරුම් විරහිත අනවශ්‍ය කලබැගෑනියක් මෙහි විය. එමෙන්ම, මෙහි හැම දෙයකම කිසියම් තියුණු, කුප්පනසුලු පාළු ගතියක් තිබිණි.

මා ජීවත් වුණේ අයහපත් ලෙසිනි. එහෙත්, ආච්චි පැමිණි විට මගේ අයහපත් ජීවිතය තවත් නරක අතට හැරිණි. ආච්චි ගෙට ඇතුළු වුණේ කුස්සිය පැත්තෙනි. ඈ දේවරූප ඉදිරියට ගොස් කුරුසියේ ලකුණ ඇඳගෙන අනතුරුව හිසත්, උඩුකයත් බොහෝ සේ බිමට පාත්කොට තෙවරක්ම ඇගේ නංගීට ආචාර කළාය. ඇගේ එම නිවට, නියාලූ ආචාරය මගේ ගතත්, සිතත් පාගාලීය.

ගෙහිමි මැහැල්ල "ආ ඒ නුඹද, අකුලීනා?" යැයි ප්‍රශ්න කළේ නොසැලකිල්ලෙනි, සිත් පිත් නැති ලෙසිනි.

ආච්චි හැඳින ගැනීම පවා මට අපහසු විය. ඈ දෙතොල් තදකොට පියාගෙන සිටියාය. ඒ නිසා ඇගේ මුහුණ හඳුනා ගැනීමට නොහැකි තරම් වෙනස් විය. කුස්සියේ කුණු බක්කිය අසල, දොර ළඟ තිබූ මිටි බංකුව මත ඈ වාඩි වුණාය. ඇය නිහඬව සිටියේ වරදක් කළ එකියක මෙනි. නංගීගේ ප්‍රශ්නවලට ඇය පිළිතුරු දුන්නේ නිහඬවය. බැගෑපත්වය.

එයින් මගේ වේදනාව වැඩිවිය. මම ඇයට තරහෙන් කතා කළෙමි.

"ආච්චි වාඩිවෙලා තියෙන්නෙ කොහිද?"

ඈ මා දෙස බලා මඳ සිනා පාමින් ඉඟි මරා වශීකරණසුලු හඬකින් මෙසේ කිව්වාය:

"නුඹ කට වහගනින්, ගෙදර හාම්පුතා නුඹ නොවෙයි."

"මේ කොල්ලා හැමදාම ඕන නැති වැඩවලට අත දානවා. කොච්චර ගැහුවත්, බැන්නත් පලක් නැහැ." ගෙහිමි මැහැල්ල මට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරමින් කතාව පටන් ගත්තාය.

නිතර පාහේ දුෂ්ට ලෙස සතුටුවෙමිනි. ඇය ආච්චිගෙන් ප්‍රශ්න කරන්නේ:

"ඉතින් අකුලීනා හිඟා කනවද?"

"ඒක ලොකු විපතක් නොවේ."

"විපතක් නෑ. ලැජ්ජාවකුත් නෑ."

"පේසු තුමාත් හිඟා කෑවයි කියල කියනවා නොවැ..." ආච්චි තෙපලාය.

"එහෙම කියන්නේ මෝඩයෝ, පාෂාණ්ඩයෝ, නුඹ නාකි මෝඩ ගෑනි ඒවා විශ්වාස කරනවා. පේසු තුමා දේව පුත්‍රයා, එතුමා මළගිය එවුන්ගෙත් ජීවත් වන එවුන්ගෙත් නඩු ඇසීමට එනවා. මතක තියා ගනින්, මළ ගිය එවුන්ගේත්! අළු වෙන්න පිච්චුවත් පේසු තුමාගෙන් කිසිවක් සැඟවීමට බැහැ... ඔහු නුඹටත්, වසීලිටත් ආඩම්බරකමට අච්චු කරාවි. මම නුඹලාගෙන් සල්ලි කාරයන්ගෙන් උදවු ඉල්ලා තියෙනවා..."

"නංගියේ, මම නුඹට උදවු කළා. අපේ ආඩම්බරකමට දෙවියන් වහන්සේ අපට අච්චු කළ බව නුඹ දන්නවා."

"දුන්නා මදි... මදි..."

මැහැල්ල කියතක් වැනි ඇගේ දුෂ්ට දිවෙන් ආච්චි වෙත වාග් ප්‍රහාර එල්ල කරන්නී ප්‍රශ්න පිට ප්‍රශ්න ඇසුවාය. ඇගේ කටින් පිටවන දුෂ්ට වචන ඇසූ මම කාන්සියෙන් වෙහෙසට පත්වීමි. මේ සියල්ල ආච්චි උහුලා සිටින්නේ කෙසේද? එවන් වේලාවලදී මම ආච්චිට ආදරය නොකළෙමි.

කාමරයේ සිට ගෙහිමියාගේ තරුණ බිරිඳ විත්, ආච්චි දෙස බලා සුහද සිතින් හිස පාත් කොට ආචාර කළාය.

"කෑම කන කාමරයට ඇවිත් වාඩි වෙන්න. ඒකට කමක් නැහැ" යි ඈ ආච්චිට කිව්වාය.

මැහැල්ල ආච්චි දෙස බලා කෑ ගැසුවාය:

"කකුල් පිහදාගනින්, කැලේ හැදිච්ච පිටිසර ගෑනි!"

ගෙහිමියා ආච්චි පිළිගත්තේ සතුටිනි:

"ආ, බොහොම නුවණ ඇති අකුලීනා අම්මේ ජීවිතය කොහොමද? කෂිරින් මහල්ලා තවම ජීවත් වෙනවද?"

ආච්චි ඔහු දෙස බලා සුහද සිතින් මඳ සිනා පාන්නී, ඇසුවාය:

"කොන්ද දෙකට නමාගෙන වැඩ කරනවද?"

"ඔව්, වැඩ කරනවා. හරියට හිරගෙට වැටිච්ච මිනිහෙකු වගේ."

ගෙහිමියා සමඟ ආච්චි ඉතා සුහද සිතින් හා වැඩිමහලු කෙනෙකු ලෙස කතාබහ කළාය. ඉඳහිට ගෙහිමියා මගේ මවු මතක් කරමින් මෙසේ කිව්වේය:

"ඔව්, වර්වාරා වසිල්යෙව්නා... කොහොමට හිටිය ගැහැනියක්ද, යෝධ ගැහැනියක් නේද?"

ගෙහිමියාගේ බිරිඳ කතාවට මැදිහත් වූවාය.

"මතකද මම එයාට සළුවක් තෑගි දුන්නා කළු සේද පටියක් සහ වීදුරු පබළුත් එක්ක."

"ඔව්, මතකයි."

"බොහොම හොඳ තෑග්ග..."

"ඔව්, තෑග්ග තිළිණය, ජීවිතය තිළිණය" යැයි ගෙහිමියා පැවැසීය.

"ඔයා කියන්නෙ මොනවද?" බිරිඳ සැක සිතින් ඇසුවාය.

"මමද ඔහේ නිකං... හොඳ දවස් ගෙවෙනවා. හොඳ මිනිස්සු මැරෙනවා..."

"ඔහොම කතා කරන්නේ මොකද? මට තේරුම් ගන්න බැහැ..." බිරිඳ නොසන්සුන් ලෙස ඇසුවාය.

අනතුරුව අලුත උපන් බිලිඳා ආච්චිට පෙන්වීමට ගෙහිමියාගේ බිරිඳ ඇයත් සමඟ යාබද කාමරයට ගියාය. මම මේසය උඩ තිබුණ තේ පෝච්චිය, පීරිසි, කෝප්ප ආදිය පවිත්‍ර කිරීමට පටන් ගතිමි. ගෙහිමියා පහත් හඬින් සහ කල්පනාකාරී ලෙස මට මෙසේ කිව්වේය:

"නුඹේ ආච්චි, බොහොම හොඳ මහලු මනුස්සයා..."

ඔහුගේ වචන නිසා මම මුළු සිතින් ඔහුට කෘතඥවීමි. ඉනික්බිතිව ආච්චිත් මාත් තනිවූ විට, ඉමහත් සිත් වේදනාවකින් මම ඇයට මෙසේ පැවසීමි:

"ආච්චි මෙහාට ආවෙ මොකටද? උන්ගේ හැටි ආච්චි දන්නවා නොවැ...."

"අනේ අලෝෂා මම දන්නවා. මට පේනවා..." යැයි ආච්චි කිව්වේ ඇගේ අපූරු මුහුණෙහි උපහාසාත්මක සිනාවක් මවා ගනිමිනි. එවිට මගේ හෘදය සාක්ෂිය මටද

දොස් පැවරීය. ආච්චිට හැම දෙයක්ම පෙනෙයි. ඈ හැම දෙයක්ම දනියි. එසේනම් මගේ සිතේ ඇති වේදනාවද ඕ දත්තාය.

කිසිවෙක් පැමිණෙත්දැයි වට පිට බලා ආච්චි හණික මා වැලඳගෙන සුහද සිතින් කතා කළාය:

"නුඹ නැතිනම්, මම මෙහාට එන්නෙ නැහැ. උන්ගෙන් මට ඇති පලය කුමක්ද? සීයා අසනීප වුණා. මම එයාට සාත්තු කළා. වැඩක් කළේ නැහැ. ඉතින් මගේ අතේ සල්ලි සතයක්වත් නැහැ. මිහයිල් එයාගෙ පුතා සාෂාව පන්නා දැම්මා. දැන් ඒ කොල්ලත් අපේ ළඟ. උෆටත් කෑම දෙන්න ඕන. නුඹ මේ ගෙදර වැඩ කරනවට ඒ ගොල්ල අවුරුද්දකට රූබල් හයක් ගෙවන්න පොරොන්දු වුණා. ඉතින් මම ආවෙ රූබලයක්වත් දෙයිද කියල දැනගන්නයි. නුඹ මේ ගෙදර දැන් මාස හයක් විතර වැඩ කරලා තියෙනවා නොවැ...." අනතුරුව ආච්චි මට රහසක් කියන්නාක් මෙන් මෙසේද පැවසුවාය: "ඒ ගොල්ල නුඹට දොස් පවරනවා. නුඹට බැණලා අවවාද කරන්නයි කිව්වා. අනේ මගේ හොඳ කොල්ලෝ, අවුරුදු දෙකක් විතර ඉවසා ගෙන ඉඳපන්, නුඹට ශක්තිය ලැබිලා වැඩෙන කල් හොඳද?"

මම ඉවසාගෙන ඉන්නා බවට ආච්චිට පොරොන්දු වීමි. එය අති දුෂ්කර කාර්යයකි. මේ හිඟන හා අමන පාළු ජීවිතය මා පාගා දමයි. හැම කලබලයක්මත්, කරදරයක්මත් බත් වේල සඳහාය. මෙහි මා ජීවත්වන්නේ සිහිනයකින් මෙනි.

මේ ගෙදරින් මා පැන යා යුතු යැයි සමහර දාට මට සිතෙයි. එහෙත්, ශීත සමය ඉතා දරුණුය. රාත්‍රී කාලයේ හිම කුණාටු ප්‍රචණ්ඩය. අට්ටාලය අසල ඇති මැස්සෙහි ලී සහ කණු ඉතා තද ශීත උහුලා ගත නොහී පිපිරේ. එවන් හිම කාලයෙක කෙසේ නම් පැන යන්නද?

ඇවිදින්න යාමට මට අවසර නොලැබිණි. ඒ සඳහා වේලාවක් පවා නොතිබිණි. හිම කාලයේදී දිවා කාලය ඉතා කෙටිය. ගෙදර වැඩ කටයුතු හා බැළමෙහෙවරකම් කිරීමෙහි මා යෙදෙන විට දිවා කාලය ගෙවී ගොසිනි.

එහෙත්, මා දේවස්ථානයට යායුතුය. සෙනසුරාදා දවස්වලට බෑස්පර දේවමෙහෙයටත්, උත්සව දවස්වලට පමාවූ මංගල්‍ය පූජාවටත් මා යාම මගේ යුතුකමක් විය.

දේවස්ථානයට යාම මගේ සිත් ගත්තේය. පල්ලියේ ඉඩ පහසු ඇති, තරමක් ඇඳිරි මුල්ලක සිට දේව රූප තබා ඇති මණ්ඩපය දෙස බැලීමට මම ආසා කළෙමි. ඉටිපන්දම්වල ආලෝකය නිසා ඒවා දීප්තිමත්ව දැල්විණි. රන්වන් ආලෝකධාරා කළුවන් සුරුවම් මත වැටී නටන්නාක් මෙන් විය. දේව පින්තූරවල ඇති රත්රන් ගෙත්තම්වලට වැටෙන ඉටිපන්දම් ආලෝකය දිලිසෙයි. ඉටිපන්දම්වල ගිනිසිළු නිසා වාතයෙහි එක්තරා නිල් පැහැති ආලෝකයක් හටගෙන ඇත. ඒ ගිනිසිළු රන්වන් මී මැස්සන් මෙනි. ගැහැනුන්ගේ සහ තරුණියන්ගේ ශීර්ෂ කුසුම්වලට සමානය.

අවට හැම දෙයක්ම දේව ස්තෝත්‍ර ගායනය සමඟ සංගතික ලෙස සංකලනය වී ඇත. හැම කෙනෙක්ම සුරඟනා කතාවෙක ජීවත්වන චරිත මෙනි. මුළු මහත් දේවස්ථානයම ඔරුවක් සේ සෙමින්, සෙමින් පැද්දෙයි. සනැති ලාටු වැනි යමක් හිස් තැනෙක එය පැද්දෙයි.

සමහර විටෙක මට සිතෙන්නේ මුළු මහත් දේවස්ථානයම කිසියම් විලක ගැඹුරෙහි මහපොළොවෙන් සඟවා ඇති බවය. සැබෑ ජීවිතයට කිසිසේත්ම සමාන නොවන විශේෂ ජීවිතයක් සඳහා සැඟ වූ විටෙක මෙනි. මට මෙම හැඟීම ඇතිවූයේ ආච්චි මට කීතෙෂ් නගරය පිළිබඳ කී කතාව නිසා විය හැකිය. පල්ලියේ දේව ගීතිකා වලට සවන් දෙන මා වටපිටාවත් සමඟ නැළවෙමින් දෙවියන්ට යාච්ඤා කරන බැතිමතුන්ගේ හඬින් සුහද හැඟීමක් ලබමින් ආච්චි මට කියා ඇති කීතෙෂ් නගරය පිළිබඳ දුක්මුසු කවි කතාව මට පමණක් ඇසෙන ලෙස කියාගන්නට වීමි:

තතාර වනචරයෝ වට කළෝ නගරය.
යුද්ධ ම්ලේච්ඡ හමුදා යොදවා
සතුරු පහරට මූණ පෑවා නගරය කීතෙෂ්.
අරුණෝදයේ යදිති වැසියෝ දෙවියන්...

සර්ව බලධාරී දෙවියනි,
භාග්‍යවත් දේව මෑණියනි,
ගලවා ගත මැනව ඔබගේ වහලුන්
දේව මෙහෙයට උදෑසන
දේව ස්තෝත්‍ර ගායන !

කිරීමට අපහාස දෙව් මැදුරට,
ගැහැනුන්, කෙල්ලන් දූෂණය කිරීමට
පොඩි දරුවන් මරා දැමීමට,
මහල්ලන්ට දස වධ දීමට
නොදෙනු මැන ඉඩ තතාරයන්ට !

ඇසුණා කන්නලව් දෙවියන්ට
දේව මෑණියෝ සැල කළෝ දෙව් පුතුට
මෙලෙස අණ කළෝ දෙවියෝ
අග්‍ර දූතයනි, මිහයිලෝ,
කීතෙෂ් පුරය මහ පොළොවෙන් ගෙන උදුරා
පිරිසුදු පොකුණේ ගිල්වනු රහිතව අනතුරු.
යාච්ඤා කිරීමට කිතුනන්ට පිවිතුරු
විඩා නැතිව, දුකක් නැතිව නිරතුරු
කරති යාච්ඤා උදේ සිට හවස් වනතුරු.

සදාකල්හි වැජඹේවා දෙව් මෙහෙය
පවතීවා සැමදා කිතු සමය !

ඒ කාලයේදී මගේ මතකය පිරී තිබුණේ ආච්චි මට කියා දුන් කවි කතාවලිනි. ඇගේ කවිවල ලතාව සහ ආකාරය ගැන ද මා කල්පනා කළ බව මම හඟිමි.

දේවස්ථානයේදී මම දෙවියන්ට යාච්ඤා නොකළෙමි. ආච්චිගේ සුන්දර දෙවියන් ඉදිරියේ සීයාගේ කටුක යාච්ඤා කිරීම හෝ අඬනසුලු දේව ගීත ගැයීම හෝ කිරීම නොවටියි. ආච්චිගේ දෙවියන්ටත් එවැනි දේ යෝග්‍ය නොවන බව මා දැන සිටියේ ඒවා මටද රිසි නොවූ බැවිනි. එපමණක් නොව, මේ දේව ගීත ස්තෝත්‍ර

පොත්වල මුද්‍රණය කර ඇත. අකුරු දන්නා හැම මිනිහකු මෙන්ම, දෙවියෝද ඒ යාච්ඤා දනිතියි මම සිතමි.

එබැවින් මා දේවස්ථානයේ ගත කරන කාලයේදී, හදවත සුමිහිරි දොම්නසක් විසින් පාගා දැමුණු විටදීත්, එදිනෙදා වැඩවලදී අමනාපයක් සහ සිත් රිදවීමක් ඇති වූ විටදීත් මා විසින්ම ගොතන ලද යාච්ඤා කීමට මම මහන්සි ගත්තෙමි. මගේ කටුක ජීවිතය ගැන මා කල්පනා කළ විගසම ඉබේටම මෙන් පරිශ්‍රමයෙන් තොරව දුක්ගැනවිලි දෙවියන්ට ඉදිරිපත් කිරීමට මම සමත්වීමි.

දෙවියනි, දෙවියනි සිත මගේ පාළුයි !
දෙනු මැනවි ශක්තිය ඉක්මනින් වැඩෙන්නට !
මගේ දුක ඉවසා සිටිය නොහැකි මට,
දිවි හානි කැරගැනීමට කියයි සිත මට.

දෙවියනි වෙන්න සමා !
වැඩ ඉගෙන ගන්නට කිසිම ඉඩක් නැත.
ගෙහිමි මැහැල්ල මත්‍රියෝනා, යකින්නකි.
ඈ මා සපා කයි, එය මට මහ දුකකි.
ජීවිතය එපා වෙයි. විපතක් ළඟා වෙයි.

මවිසින් මෙලෙස ගොතා කියන ලද 'යාච්ඤා' මට තවමත් මතකය. ළමා බුද්ධිය අධ්‍යාත්මය මත ගැඹුරු සලකුණු තබයි. බොහෝ විට මුළු ජීවිත කාලය තුළම ඒවා නොමැකේ.

දේවස්ථානයේදී මා විවේක ගත්තේ වනයේදී සහ කුඹුරේදී විවේක ගත් පරිදිමය. මගේ පුංචි හදවත මේ වන විටත් සෑහෙන තරමක් ජීවිතයේ නපුරු ගොරහැඩි අමනාපකම් විඳ දරා ඇති අතර, අපැහැදිලි, උණුසුම් සිහිනවල ගිලී තිබිණි.

එහෙත්, මා පල්ලියට ගියේ ඉතා දැඩි හිම තුෂාරය පවතින කාලයේදීය, නැතිනම් නගරයට ඉතා බියජනක ලෙස හිම කුණාටු පහර දෙන විටදීය. එවිට අහස පවා ඉතා දැඩි ලෙස ශීතට හසුවූ සැටියක් දැනේ. දැඩි හිම කුණාටුව අහසේ වලා පවා දෙබෑ කළේය. මහ පොළොවත් කොතරම් දැඩි ශීතලකට හසුවී, හිම හා අයිස් තට්ටුවලට

යටවී තිබේදයත්, එය යළිත් කිසිකලෙක උණුසුමක් හෝ ජීවයක් හෝ නොලබන බවකි.

නිසල රාත්‍රීවලදී මා වඩාත් කැමති නගරයේ වීදියෙන් වීදියට යමින් ජනයා රහිත පාළු අහුමුලුවල ගමන් කරමින්, සංචාරය කිරීමටය. එවිට දැනෙන්නේ මා පියාඹන සැටියෙකි. අහසේ හුදෙකලාව සිටින සඳට මම බෙහෙවින් සමාන වෙමි. මා ඉදිරියේ ඇත්තේ මගේ සෙවණැල්ල පමණකි. එම සෙවණැල්ල වැටෙන විට, හිම මත ඇති ආලෝකය තාවකාලිකව නිවීයයි. ගෙවැටවල් ආදිය හාස්‍ය ජනක ජවනිකා මවා පායි. මහ පාර මැදින් ගමන් කරන්නේ නගරයේ රාත්‍රී මුරකරුවාය. ඔහු පසු පසින් ඔහුගේ බල්ලාද ගමන් කරයි.

විශාල තුලුප් හිම කබායක් ඇඳගෙන ගමන් කරන මේ නුහුරු මිනිසා බල්ලකුගේ බලු කුඩුවට සමානය. බලු කුඩුව ගෙවත්තේ සිට මාර්ගය ඔස්සේ අරමුණු රහිතව ඉදිරියට යෙයි. බල්ලාද එය පසු පස යන්නේ බලාපොරොත්තු කඩ වූ විටෙක මෙනි.

සමහරදාට ප්‍රීතිමත් ගැහැනුන් සහ ඔවුන් කැටුව යන පුරුෂයෝ මට හමුවෙති. ඔවුන්ද බෑස්පර දේව මෙහෙයට නොගොස් රස්තියාදු වන්නන් බව මට සිතෙයි.

පහන් ආලෝකය සහිත ජනේලවල ඇති කුඩා කවාටවලින් පිටතට එන වාතය මා නොදත් ජීවිතය ගැන තොරතුරු කියන සියුම් සුවඳක් ගෙන එයි. එවිට මම එම ජනේලය අසල සිටගෙන එම වාතයෙහි සුවඳ ඉව අල්ලමින් ඒ ගැන අනුමාන වශයෙන් දැන ගැනීමට තැත් කරමි.

මගේ විශේෂ අවධානයට ලක් වූයේ ජන ශූන්‍ය තීහනව් සහ මර්තීනව් වීදි කෙළවරෙහි පිහිටි එක් මහල් නිවෙසකි. පාස්කු මංගල්‍යයට පෙරාතුව හිම දියවී අයිස් තට්ටු බවට පත්වූ සඳ එළියෙන් බබළන රාත්‍රියෙක මම ඒ නිවෙස දුටුවෙමි. ජනේලයේ ඇති කුඩා කවාටයෙන් උණුසුම් සුළං පහරක් සමඟ අපූරු හඬක් ඇසිණි. කිසිවකු කට වසාගෙන ඉමහත් වේගයකින් සහ සුහදතාවකින් ගයන සැටියෙකි. වචන නෑසුණද ඒ ගීතය මවිතය දනවන තරම් මා හඳුනන, එමෙන්ම, වැටහෙනසුලු එයට මම සවන්

දුනිමි. එසේවතුදු, නිතර එම ගීතයට බාධා කරමින් වීණා තත්වලින් කර්කශ හඬක් නැඟිණි. එය ඉතා අවලස්සන ලෙස ගීතයට බාධා කළේය. මම එම නිවෙස අසල වූ කුඩා පුළුල් කණුව මත වාඩි වුණෙමි. කිසිවෙක් විශාල හඬක් නැංවෙන වයලීනයක් වාදනය කරන අතර, එයට සවන් දීම සොම්නස මුසු වේදනාවකට පරිවර්තනය වෙයි. සමහර විට වයලීනය කොතරම් උස් හඬකින් වාදනය කළේදයත්, මුළු මහත් නිවෙසම සෙලවී, ජනේල වීදුරු දෙදරුම් කන සැටියෙක් දැනිණි. ගේ පියස්සෙන් හිම කැටි දියවී බිමට වැටුණු අතර, මගේ දෙනෙතින්ද කඳුළු කැට වැටෙන්නට විය.

රාත්‍රී මුරකරුවා මට නොදැනුවත්ම මා ළඟට විත් මා තල්ලු කොට ප්‍රශ්න කළේය.

"නුඹ මෙතැන රස්තියාදු වෙන්නෙ මොකද?"

"සංගීතය" මම විස්තර කළෙමි.

"ඉතින් මොකෝ, පලයන් යන්න..."

මා නැඟිට ඒ නිවාස පන්තිය වටා රවුමක් දිව ගොස් යළිත් එම ගෙය අසලට පැමිණියෙමි. එහෙත්, ඒ වනවිට ගීත ගායනය නවත්වා තිබිණි. ජනේල කවාටයෙන් ගෙතුළ සිට ප්‍රීතිමත් සෝෂාව ඇසෙන්නට විය. එය දුක්මුසු ගායනයට කොතරම් වෙනස්වීදයත්, මට එම හඬ ඇසුණේ මා සිහින ලොවෙක පසුවන විටකදී මෙනි.

හැම සෙනසුරාදාවකම පාහේ බෑස්පර දේව මෙහෙය වෙනුවට මම එම නිවෙස වෙත දිව ගියෙමි. එහෙත්, වසන්තයේදී පමණකි. මට එම නිවෙසින් වෙල්ලෝ-වයලීන වාදනයක් අසන්නට ලැබුණේ. එදින වයලීනය මැදියම් රෑ වනතුරුම වාදනය විය. එහෙත්, එදින රාත්‍රී පමාවී මා ගෙදර පැමිණි විට ස්වාමිවරු මට පහර දුන්හ.

හිම තුෂාරය සහිත රාත්‍රියේදී අහසේ තරු දෙස බලමින්, නගරයේ ජන ශූන්‍ය මාර්ගවලැ ඇවිදීම නිසා මගේ අධ්‍යාත්මය පොහොසත් විය. මා නගර මධ්‍යස්ථානයෙන් ඈත මාර්ග තෝරා ගත්තේ වුවමනාවෙන්මය. ප්‍රධාන වීදිවල පහන් කණු බොහෝ විය. එම වීදිවල ඇවිද්දොත් මගේ ස්වාමිවරුන්ගේ මිතුරන් මා දැක පල්ලි යනවා වෙනුවට මා රස්තියාදු වන බව ඔවුන්ට කියනු ඇත.

නගරයේ ප්‍රධාන වීදිවල ඇවිදින විට පොලිස්කාරයෝත්, බේබද්දෝත්, වෙසඟනෝත් මට බාධා කරති. එහෙත්, ඈත අහුමුලු ජනයා රහිත මාර්ගවල ඇවිදිමින් තනි මහල් ගෙවල්වල ජනෙල නැරඹිය හැකිය. එය කළ හැක්කේ ජනේල තද ශීතලට හසුවී නැති නම්, එමෙන්ම ඒවා ආවරණවලින් මුවා කර නැතිනම් පමණකි.

ඒ ජනේල මට දර්ශන රාශියක් මවා පෙන්වීය. මිනිසුන් යාච්ඤා කරන සැටිත්. සිප වැලඳ ගන්නා සැටිත්, ගුටි ඇනගන්නා සැටිත්, කාඩ් සෙල්ලම් කරන සැටිත්, සමහරුන් විවේක සුවයෙන් කතා සල්ලාපයෙහි යෙදී සිටින සැටිත් පෙන්වන ජීවිත සන්දර්ශනයක්ද තඹයක් ගෙවා බලන්නාක් මෙන් මා ඉදිරියේ දිස් විය.

පොළොවෙන් යට තට්ටුවෙන් ජනිත වූ දර්ශනයක්ද මා නෙත ගැටිණි. තරුණියක් සහ මැද වයසේ ගැහැනියක් වාඩිවී සිටි අතර, ඔවුන් ඉදිරියේ විද්‍යාල ශිෂ්‍යයෙක් පොතක් හඬනඟා කියවයි. තරුණිය එය අසා බැම සඟළ හකුළුවා ගත්තී. පුටු ඇන්දට හේත්තු වුණාය. මැදි වයසේ ගැහැනිය සිහින්ය, ඇගේ හිසකේ විහිදිලාය. ඈ හිටිහැටියේම දෑතින් මුහුණ වසා ගත් විට, ඇගේ දෙඑර නැටවිණි. විද්‍යාල ශිෂ්‍යයා පොත විසිකර දැම්මේය. තරුණිය පුටුවෙන් නැගිට ඉවතට ගිය විගසම, ශිෂ්‍යයා මැදි වයසේ ගැහැනිය ඉදිරියෙහි දණ ගසා ඇගේ අතක් ගෙන සිපගත්තේය.

ඊළඟ ජනේලය දෙස මම බැලීමි. එහි විශාල යටි රැවුළක් ඇති මිනිහෙක්, රතු ගවුමක් හැඳි ගැහැනියක දණහිස් මත තබා ගෙන ඇය නැළෙව්වේ බිලිඳෙකු නළවන ලෙසිනි. ඔහු කට පුළුල් ලෙස හැරගෙන, දෙනෙත් දොට්ට දමාගෙන, යමක් ගායනා කළා විය යුතුය. ගැහැනිය කොක් හඬ ලා සිනාසෙමින් ඔහුගේ දණහිස් මත උඩුබැලි අතට දිගාවී, දෙපා වනන්නට වූවාය. ඔහු ඇය සිරස් අතට වත්තම් කොට, යළිත් ගයන්නට වූ විට, ඈ නැවත කොක් සන් දෙමින් මහ හඬින් සිනාසෙන්නට වූවාය. මා ඔවුන් දෙස බොහෝ වේලාවක් බලා සිට එතැනින් ඉවත් වූයේ, ඔවුහු මුළු රැයටම ඇති වන්නට සතුටු වූහයි සිතූ ඉක්බිතිවය.

ගෙවල්වල ජනෙල් තුළින් මම මෙවැනි දර්ශන බොහොමයක් දැක ඇත්තෙමි. බොහෝ විට මේවා දෙස බලමින් කල් ගත කළ නිසා ගෙදර යාමට පවා පමාවීමි. මේ නිසා මගේ ගෙදර ස්වාමිවරු මගේ හැසිරීම ගැන සැක කළෝ, මගෙන් ප්‍රශ්න කරන්නට වූහ.

"මොන පල්ලියටද ගියේ? පූජාව තියපු සුවාමි කවුද?"

නගරයේ සියලු පූජකයන් ගැන සියලු තොරතුරු දැන සිටි ගෙහිමියෝ කිනම් පූජකයා කවදා පූජාව තැබීද යන්න ආදිය දැන සිටියහ. ඒ නිසා මා කියන බොරු ලෙහෙසියෙන්ම දැන ගැනීමට ඔවුහු සමත් වූහ.

හැම දෙනාම තමා නිසා බියවී සිටිය යුතු යැයි ඉල්ලා සිටින සීයාගේ දෙවියන්ට යාච්ඤා කළ ගැහැනු දෙදෙනා සමාව ඉල්ලා සිටියහ. ඔවුන් දෙදෙනා එකිනෙකාට තර්ජනය කර ගනිමින් බැණ ගන්නා විටදී පවා, ඔවුන්ගේ මුවින් නිතර ඒ බියජනක දෙවියන්ගේ නම කියැවිණි.

"හිටපිය ! දෙවියෝ තොට දඬුවම් දේවි. තෝව මිරිකලා දමාවි, නීව ගැහැනිය !...."

පාස්කු සමයේ ප්‍රථම ඉරිදා දවසෙහි මැහැල්ල වෙල්ලවැහුම් පිසන්නට වූවාය. එහෙත්, ඇගේ වෙල්ලවැහුම් සියල්ල පිලිස්සිණි. රත් පැහැගත් ඈ කෝපාන්විතව බෙරිහන් දුන්නාය:

"වෙල්ලවැහුම් සියල්ල යකාට ගියාවෙ..."

හිටිහැටියේම ඈ වෙල්ලවැහුම් පිසන භාජනය පිරික්සා බලා කළු පැහැ ගත්තී, යකඩ භාජනය බිම දමා උඩු බුරලන්නාක් මෙන් කෑ ගැසුවාය.

"අහෝ, දෙවියනි ! පාස්කු කාලය පටන් ගන්න ඉස්සෙල්ලා මේ හට්ටියේ මස් බැදපු තෙල් මණ්ඩි සෝදලා ගින්නට දාලා සුද්ද කළේ නැහැ!"

ඈ කඳුළු පිරි දෙනෙතින් යුතුව දණගසා මෙසේ කිව්වාය:

"අනේ අප්පේ, දෙවියනි, ශාපලත් මට සමාවන සේක්වා! මා වැනි නාකි මෝඩ ගෑනියකුට දඬුවම් නොදෙන සේක්වා..."

පිලිස්සුණු වෙල්ලවැහුම් බල්ලන්ට දුන්නේය. ඒ තාච්චිය පිලිස්සුවේය. එදා සිට ලේළිය ඇයත් සමඟ

බැණගන්නා විට නැන්දම්මාට දොස් කියන්නට වූවාය.

"පාස්කු කාලයේත් මස් බදින තාච්චියෙන් වෙල්ල වැහුම් පිහනවා නෙව..."

ඔවුහු ගෙදර හැම වැඩකටම දෙවියන්ව ඇද ගනිති. තම අල්පමය ජීවිතයේ හැම දෙයටම ඔවුන්ට දෙවියන් කොටස්කරුවෙකි. එම හිඟන ජීවිතයෙන් බාහිර වැදගත්කමක් සහ බැරෑරුම්කමක් මවා ගත්හ. පැයක් පාසාම ඔවුහු දෙවියන්ගේ උත්තරීතර බලයට සේවය කරන බව පෙන්වා ලූහ. කාන්සිය මුසු පුහු වැඩවලට දෙවියන් ඇද ගෙන මා පාගා දැම්මේය. ඒ නිසා මා අහුමුලු දෙස බැලුවේ ඉබේටම මෙනි. මට නොපෙනෙන අදිසි බලයක් මා දෙස බලා සිටින බව මට හැඟුණු අතර, රාත්‍රියේදී ඒ බිය මා කම්බිලියක් මෙන් වට කරගත්තේය. ඇදිරි දේව රූප ඉදිරියෙහි නිතර දැල්වෙන පහනින්, එනම් කුස්සියේ මුල්ලෙන් ඒ අදිසි බියජනක බලවේගය ක්‍රියාකාරී විය.

රාක්කය අසල විශාල කවුළුවකි. ඒ කවුළුවට රාමු දෙකකි. මැද ලීස්තරයෙන් එය බෙදී ඇත. එහි සිට බලන විට නිමක් නැති අහස පෙනෙයි. මේ නිවසත්, කුස්සියත්, මාත්, හැම දෙයක්මත් එල්ලා ඇති බවක් දැනෙයි. එය ඇද දැම්මොත් මේ සියල්ල නිමක් නැති අනන්තයක් වැනි පුස්සෙහි වැටී තරු අසලින් සදහටම පහළට ගිලා බසිනු ඇත. වතුරට විසි කළ ගලක් මෙන් එය නිහඬව වැටෙනු ඇත. එක් පැත්තක සිට තවත් පැත්තකට හැරීමට පවා බිය වූ මම, බොහෝ වේලා නොසෙල්වී වැතිර සිටියෙමි. බියජනක ජීවිතාවසානය බලාපොරොත්තු වීමි.

ඒ බියෙන් මා සුවය ලැබුවේ කෙසේදැයි කීමට නොදත්තද, ඉක්මනින්ම සුව ලැබූ බව කිව යුතුය. මට එහිදී ආච්චිගේ දයාබර දෙවියන් උදව් වූ බවට සැක නැත. ඒ කාලයේදීම මට සරල සත්‍යය අවබෝධ වූ බව මම සිතමි. මා තවමත් කිසිම නරක දෙයක් කර නැත. වරදක් නැතිව මට දඬුවම් දීම නීති විරෝධීය. අනුන්ගේ පව්වලට වගකීම මා සතු කාර්යයක් නොවේ.

විශේෂයෙන්ම වසන්ත කාලයේ දේව මෙහෙයට යනවා වෙනුවට මැඩලිය නොහැකි බලයක් විසින් මා

පල්ලියට යැවීම තීරණාත්මක ලෙසින්ම වළක්වා රස්තියාදු වීමට සලස්වන ලදී. ඉටිපන්දමක් ගැනීමට සෙමිෂ්නික් කාසියක් හාම්පුතා දුන්නේ නම්, එය මගේ අවසාන විනාශය බවට පත්විය. මා ඒ වෙනුවට බාබ්කි ක්‍රීඩාව සඳහා බට්ටන් මිලදී ගෙන, කොල්ලන් සමඟ සෙල්ලම් කිරීම නිසා ගෙදර යාමට පමා වීමි. මිය ගිය අය වෙනුවට පවත්වන දුක් පූජාව සඳහා පූප ගැනීමට මට හාම්පුතා දුන් කොපෙක් දහයේ කාසිය පවා මම සෙල්ලම් කොටැ පරාජය වූ නිසා නැති කර ගතිමි. පල්ලියේ සන්ක්‍රිස්තියන් අල්තාරයෙන් පිටතට ගෙන ගිය පිට කෙනෙකුගේ පූප සොරකම් කර ගැනීමට මට සිදුවිය.

ක්‍රීඩා කිරීමට මගේ ඇති ආසාව සීමා රහිත විය. මැඩලිය නොහැකි ආසාවකින් යුක්තව මම ක්‍රීඩාවලට සහභාගි වීමි. සෑහෙන තරම් කඩිසර කොල්ලකු වූ මම ශක්තිමත් එකෙකු වීමි. බාබ්කි ක්‍රීඩාවෙන් බෝල සහ ගරද්කී ක්‍රීඩාවලත් ශූරයකු ලෙස ඉක්මනින්ම මම ප්‍රසිද්ධියට පත්වීමි.

පාස්කු කාලයේ නිරාහාරව සිටීමට මට බල කළේය. අපේ අසල්වැසියා වන දොරිමෙදොන්ත් පක්රොව්ස්කි පූජක තැන වෙත මා ගියේ පාපෝච්චාරණය කිරීමටය. මගේ නිගමනය අනුව, ඔහු ඉතා දැඩි මිනිහකු විය යුතුය. එමෙන්ම, ඔහුට විරුද්ධව මම පව්කළ කෙනෙකි. පූජකයාට අයිති වත්තේ පිහිටි ලතා මණ්ඩපයට මම ගල් ගසා ඇත්තෙමි. ඔහුගේ ළමයිනට සතුරුකම් කර ඇත්තෙමි. පූජකයාගේ අසතුටට හේතුවන දඟකාරී ක්‍රියා බොහොමයක් කළ කෙනෙකි. මම, එම දුප්පත් දේවස්ථානයේ පාපෝච්චාරණය කිරීමේ පෝලිමට වන්මා, මගේ වාරය එළැඹෙන තුරු බලා සිටියද, මගේ හදවත ගැහෙන්නට විය.

එහෙත්, දොරිමෙදොන්ත් පූජක තැන මා පිළිගත්තේ සුහද එමෙන්ම, දොඩමලු ලීලාවෙකිනි.

"ආ අසල්වැසියා.... දණගහපන්, කරපු පව් මොනවාද?"

ඔහු මගේ හිස බරැති වෙල්වට් රෙද්දකින් වැසුවේය. ඉටිපන්දම් සහ තෙල් සුවඳක් එයින් වහනය වූයෙන්, කතා කිරීමට අපහසු වූ අතර, ඒ සඳහා සිතක්ද නොවීය.

"වැඩිහිටියන්ට කීකරු වෙනවද?"

මම නිහඬව සිටියෙමි

"පව්කාරයා කතා කරනු !"

මා පවා බලාපොරොත්තු නොවූ අන්දමින් මම දිගින් දිගටම පල්හැලි දොඩවන්නට වීමි:

"පල්ලියේ තියෙන පූප හොරකම් කළා."

"ඒ කොහොමද? කොහිද?" පූජකයා තරමක් කල්පනා කොට සන්සුන් ලෙස ප්‍රශ්න කළේය.

"ශුද්ධ වූ ත්‍රිත්ව පල්ලියෙන්, පක්රෝව් පල්ලියෙන්, නිකොලායි පල්ලියෙන්..."

"අපොයි, අපොයි, ඔක්කොම පල්ලිවලින්ද, ළමයා ඒ ක්‍රියාව නරකයි, පව්, තේරුණාද?"

මම යළිත් නිහඬ වීමි.

"පව්කාරයා කතා කරනු !" "අමන කොල්ලා, හොරකම් කළේ බඩගිනි නිසාද?"

"සමහරදාට ඒ සල්ලිවලින් කෑවා, වෙනත් දවස්වලට බාබ්කි ක්‍රීඩාව සෙල්ලම් කළා. ගෙදර ගේන්න ඕන පූප මම හොරකම් කළා."

අපැහැදිලි ලෙසත්, විඩාපත් දොරිමෙදොන්ත් පූජක තැන මුමුනන්නට විය. තවත් ප්‍රශ්න කීපයක් ඇසූ ඔහු හිටි හැටියේම දැඩි ලෙස මෙසේ ප්‍රශ්නයක් නැඟීය:

"නුඹ නීති විරෝධී ලෙස මුද්‍රණය කරපු පොත් කියවල තියෙනවද?"

සත්තකින්ම ඒ ප්‍රශ්නය මට නොතේරුණු නිසා මම ප්‍රති ප්‍රශ්නයක් නැඟුවෙමි.

"ඒ මොකක්ද?"

"තහනම් කරපු පොත් කියවල තියෙනවද?"

"නැහැ. කිසිවක් කියවලා නැහැ."

"නුඹ කළ පව්වලට මම නුඹට සමාව දෙනවා. නැඟිටපන් !"

මම ඉමහත් ලෙස මවිතයට පත්වී ඔහු දෙස බැලීමි. ඔහුගේ මුහුණේ කල්පනාකාරී බවක් සහ සුහදතාවක් තිබෙන සැටි මම දුටිමි. මට අපහසු බවක් දැනුණු අතර, එක්තරා ලජ්ජාවක්ද ඇති විය. පාපෝච්චාරණය කිරීම සඳහා මා යැවූ විට ගෙදර ස්වාමිවරු මා තුළ බියක් සහ

අසහනයක් ඇති කළෝ, අවංක ලෙස සියලු පව් කියා පසුතැවිලි විය යුතු බැව් මට කියා සිටියහ.

"මම ඔබතුමාගේ වත්තේ වැටටත් ගල් ගැහුවා. බල්ලටත් ගල් ගැහුවා" යැයි මම කිව්වෙමි.

පූජකයා හිස ඔසවා මා දෙස බලා මෙසේ පැවසීය:

"ඒවා නරක ක්‍රියා ! ඉතින් පලයන් !"

"බල්ලටත් ගල් ගැහුවා ...!"

"ඊළඟ එක්කෙනා එනවා" යැයි දොරිමෙදොන්ත් පූජක තැන කිව්වේ මා අසලින් බලමිනි.

රැවටීමට සහ අමනාපයට පත්වූ මම පිටවී ගියෙමි. මා පාපෝච්චාරණය කරමින් කොතරම් බියට පත්වූයේදයත්, එය කිසිදු බියකින් තොරව සහ යටත්පිරිසෙයින් සිත් ඇද ගැනීමකින් තොරව අවසන් වීම මට නොරිසි විය. මා සිත් ගත් එකම ප්‍රශ්නය වූයේ මා නොදත් පොත් ගැන ඇසූ ප්‍රශ්න පමණකි. පොළොවෙන් යට තට්ටුවේ ගැහැනුන් දෙදෙනකු ඉදිරියේ පොතක් කියැවූ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා ගැනත්, මීට වසර කීපයකට පෙර අපේ ගෙයි පදිංචි වී සිටි 'හරොෂයෙ දෙලෝ' හෙවත් 'හොඳ වැඩේ' ගැනත් මට සිහිවිය. ඔහු ළඟ කළු පාට, මහත, නොතේරෙන රූප සහ සිතුවම් සහිත පොත් බොහොමයක් තිබිණි.

ඊට පසු දින මට කොපෙක් පහළොවක් දී, දිව්‍ය සත්ප්‍රසාදය බලලා එන ලෙස මා පිටත් කර යැවීය. පාස්කු මංගල්‍යය පමාවී සිදුවූ අතර, මාර්ගවල හිම දියවී බොහෝ කල් ගෙවී ගොසිනි. වීදි අව්වට වේළී දූවිලිවලින් වැසිලාය. එදින හිරු එළිය සහිත ප්‍රීතිමත් දවසක් විය.

පල්ලිය අසල වූ තැනෙක ශිල්පියෝ සහ සිප්කැමියෝ මුදල් ඔට්ටුවට බාබ්කි ක්‍රීඩාවේ යෙදී සිටියහ. සත්ප්‍රසාදය ලැබීමට වේලාව ඇතැයි මා සිතුවෙන් මාත් ක්‍රීඩාවට ඇතුළු කර ගන්නා ලෙස ක්‍රීඩකයන්ගෙන් ඉල්ලා සිටියෙමි.

"මාත් කැමතියි ඔට්ටුවට සෙල්ලම කරන්න..."

"ඇතුළු වීමේ ගාස්තුව කොපෙක් එකයි." ආඩම්බරකාරි ලෙස මුහුණේ ලප සහිත රතු හිසකේ ඇති තරුණයෙක් පැවසීය. මාත් ඔහුට නොදෙවැනි ආඩම්බර ස්වරයෙකින් මෙසේ කිව්වෙමි:

"වම් පැත්තේ ඉත්තන් දෙකටම ගහනවට කොපෙක් තුනක් ඔට්ටුයි !"

"සල්ලි තෝන් පිටියට දාපන් !"

එතැන් සිට ක්‍රීඩාව ආරම්භ විය !

මම කොපෙක් පහළොවේ කාසිය මාරු කොට තෝන් පිටියට කොපෙක් තුනක් දැමුවෙමි. මා කී ඉත්තන් දෙන්නාට පහර දෙන ක්‍රීඩකයා මගේ කොපෙක් තුන දිනා ගනු ඇත. ඔහුට නොහැකි වුණොත් ඔහුගෙන් කොපෙක් තුනක් මට ලැබේ. මගේ ඔට්ටුව දිනා ගැනීමට දෙදෙනෙක් ඉදිරිපත් වූ නමුදු, ඔවුහු පරාජය වූ නිසා මට වැඩිහිටි මිනිසුන්ගෙන් කොපෙක් හයක් දිනාගත හැකි විය. එයින් මගේ ආත්ම ධෛර්යය වැඩි විය.

ක්‍රීඩකයන්ගෙන් එකෙක් කෑ ගසා අනතුරු ඇඟවීමක් කළේය.

"ඔය කොල්ලා දිහා ඇහැ ගහගෙන ඉඳපල්ලා. නැතිනම් ඕකා දිනාපු සල්ලිත් අරගෙන පැනලා දුවයි."

ඔහුගේ ඒ කීම නිසා අමනාප වූ මම හඬනඟා ඔට්ටු ඇල්ලුවෙමි.

"වම් පැත්තේ බට්ටන් දෙදෙනාට ගහන්න බැරුවට කොපෙක් නවයක් ඔට්ටුයි !"

ක්‍රීඩකයෝ එය ගණන් නොගත්හ. එහෙත්, මගේ වයසැති කොල්ලෙක් පිරිස අමතා කෑ ගැසීය.

"බලාගනිල්ලා, මේ කොල්ලා වාසනාවන්තයෙක්. මම එයාව අඳුනනවා. ස්වෙස්දින් පොකුණ අසල ගෙදර පැලෑන් අදින්නන් ළඟයි මේ කොල්ලා ඉන්නෙ !"

සත්ත්ව ලොම් පදම් කරන්නකු බව ඇඟවෙන සුවඳක් ඇති, කෙට්ටු සිරුරකින් හෙබි ශිල්පියා නපුරු ලෙස මෙසේ පැවසීය.

"මූ යක්පැටියෙක්ද කොහේදැයි? හොඳයි..."

ඔහු ඊයම් බට්ටා අතට ගෙන කුරුමානම් අල්ලා මා කී ඉත්තන්ට පහර දී මගේ ඔට්ටුව අතට ගනිමින් කඳ නමා මා වෙතට කිට්ටු වී ප්‍රශ්න කළේය.

"අඬනවද?"

මම පිළිතුරු දුනිමි.

"දකුණු කෙළවරේ ඉත්තට කොපෙක් තුනයි !"

"දෙන්නම් බැටේ !" යැයි වහසි බස් කී ඒ ශිල්පියා පරාජය විය.

තෙවරකට වඩා ඔට්ටු අල්ලා තෝන් පිටියට කාසි දැමිය නොහැකිය. අනුන්ගේ ඔට්ටුවලට අනු ඔට්ටු අල්ලා තවත් කොපෙක් හතරක් පමණ දිනා ගතිමි. එමෙන්ම බට්ටන් ගොඩක් මට දිනුම් හැටියට ලැබිණි. එහෙත්, ඔට්ටු ඇල්ලීමට මගේ වාරය පැමිණි විට, මම තෙවරක්ම පිට, පිට ඔට්ටු අල්ලා පරාජය වීමි. මෙලෙස මා අත තිබූ මුදල් සියල්ල පරාජය විය. මේ වන විට දේව මෙහෙය අවසන් වූයෙන් බැතිමත්හු පල්ලියෙන් පිටවීමට පටන් ගත්හ.

"බැඳලද?" මගෙන් එලෙස ප්‍රශ්න කළ ලොම් පදම් කරන ශිල්පියා මගේ කෙස්වැටියෙන් අල්ලා ගැනීමට තැත් කළද, මම ඉතා කඩිසර ලෙස ඔහුගේ එම වෑයමෙන් ගැලවුණෙමි. ඉතා හොඳට ඇඳගෙන පල්ලියෙන් ඉවතට ආ ගැටවරයකු වෙත ගිය මම දිව්‍ය සත්ප්‍රසාදය ලැබීම ගැන තොරතුරු විමසන්නට පටන් ගතිමි.

"ඔබ සත්ප්‍රසාදය ලැබුවද?"

"ඔව්, ඉතින් මොකෝ?" ඔහු මගෙන් පෙරළා ප්‍රශ්න කළේ සැක සිතිනි.

සත්ප්‍රසාදය ලබන විට කළ යුත්තේ මොනවාද?, පූජකයා කියන දේ මොනවාද ආදිය ගැන තොරතුරු මම ඔහුගෙන් විමසන්නට වූයෙමි.

ගැටවරයා සෑහෙන ලෙස කෝපයට පත් වූ අතර, මට බියජනක ලෙස ගොරවන්නට විය.

"පාෂාණ්ඩයා සත්ප්‍රසාදය ලබනවා වෙනුවට රස්තියාදු වුණාද? මම නුඹට ඒ ගැන කිසිම තොරතුරක් කියන්නේ නැහැ. නුඹේ තාත්තා නුඹේ හම ගලවාපුදෙන් !"

මා ගෙදර ගියේ දැන් මගේ ස්වාමිවරුන් මා දිව්‍ය සත්ප්‍රසාදය ලැබූ සැටි අරබයා විස්තර තොරතුරු අසා මා එය ලබනවා වෙනුවට රස්තියාදු වූ බැව් දැනගනිතියි යන ස්ථිර හැඟීමෙනි.

එහෙත්, මැහැල්ල මට සුබ පතමින් ඇසුවේ එක් ප්‍රශ්නයක් පමණකි:

"නුඹ අන්නවිරාලට කීයක් දුන්නද?"

"කොපෙක් පහක් දුන්නා."

"නුඹ එළවළු කොටුවේ පඹයෙක් නොවැ! අන්නවියට කොපෙක් තුනක් දුන්නම හොඳටම ඇති. කොපෙක් හතක් නුඹට තියාගන්න තිබුණා."

...වසන්තය. හැමදාම අලුත් ඇඳුමකින් සැරසුණු කුමරියක මෙනි. වසන්තය, හැම දවසක්ම වඩාත් පැහැදිලිය, වඩාත් සුන්දරය. ළපටි තණ පඳුරුවලින් නැවුම් සුවඳක් වහනය වෙයි. බිරියෝසා දලුවලින් වහනය වන්නේ සිසිල් සුවඳකි. උණුසුම් පොළොවෙහි උඩුබැලි අතට දිගාවී පක්ෂීන්ගේ ගීතමය හඬ ඇසීමට මා සිතෙහි අතිමහත් ආසාවක් උපනි. හිම කාලයට අදින හිම කබා ශුද්ධ කොට පෙට්ටගම්වල අහුරා තැබීමටත්, දුම්කොළ කුඩු කිරීමටත් මම උදව් වෙමි. ගෘහ භාණ්ඩවල දූලි පිස දැමීමටත්, උදේ සිට රෑ වනතුරු මට අසතුටු, වුවමනා නොවන දේ කිරීමටත් මම වෙහෙසෙමි.

වැඩ නොකරන වේලාවලදී මට ජීවත් වීමට සිත්ගත් කිසිදු දෙයක් නැත. අපේ වීදියේ මහා පාළු බවකි. එතැනින් එහාට යාමට මට අවසර නැත. ගෙවත්තෙහි කෝපයෙන් පිරි, විඩාපත් අගල් හාරන්නෝය. කුණු තවරාගත් කුස්සි අම්මලාය. රෙදි සොදන ගැහැනුන්ය. හැම සැන්දෑවකම බලු මඟුල්ය. මෙය කෙතරම් මසිත විඩාපත් කරන්නේදයත්, දෙනෙත් අන්ධ කර ගැනීමට පවා සිතෙයි.

මම පාට කඩදාසි සහ කතුරක් රැගෙන අට්ටාලයට යමි. විවිධ මල් කපා බාල්කවල එල්ලා අට්ටාලය සරසමි. එය මගේ පාළු බව මකන එක්තරා සැනසීමකි. වඩාත් අඩුවෙන් නිදාගන්නා, වඩාත් අඩුවෙන් ගහ බැණ ගන්නා, දෙවියන්ට වඩාත් අඩුවෙන් දුක් ගැනවිලි ඉදිරිපත් කරන, වඩාත් අඩුවෙන් කෝපාන්විත ලෙස මිනිසුන් විනිශ්චය කරන තැනකට පැන යාමට මා සිතෙහි ඇත්තේ අති මහත් ආසාවකි.

සෙනසුරාදා පාස්කු මංගල්‍යය නිමිත්තෙන් ඔරාන්ස්කි පූජකාරාමයේ සිට විලදිමීර් දේවමෑණියන්ගේ හාස්කම් පෙන්වන ප්‍රතිමාව ගෙනෙනු ඇත. එය ජූනි මාසයේ මැද වන තෙක් නගරයේ තබා ගෙන, හැම ගෙයකටමත් සෑම

තට්ටු නිවාසයකටමත් ගෙන යනු ඇත.

මගේ ගෙහිමියන් වෙත ඒ ප්‍රතිමාව ගෙනාවේ සතියේ දවසක උදෑසනදීය. මම කුස්සියේ තඹ හැළි සුද්ද කරමින් සිටියෙමි. ගෙහිමියාගේ තරුණ බිරිඳ බියගත් ලෙසින් කාමරයේ සිටගෙන කෑ ගැසුවායඃ

"විසිත්ත කාමරයේ දොර ඇරපන්, ඔරාන්ස්කි දේව මෑණියන්ව ගේනවා!"

මම අළු සහ ගඩොල් කුඩු සහිත අත් ඇතිව, පඩි පෙළ දිගේ පහළට දිව ගියෙමි. එක් අතකින් ලන්තෑරුමක් සහ අනික් අතින් සුවඳ දුම් පූජාව සඳහා ලෝහ බඳුනක් ගත් තරුණ පූජකයෙක් අසැබි බසින් පහත් හඬින් කතා කළේය.

"තොපි නිදිද? උදව් කරපියව්..."

ස්ථීර පදිංචිකාරයෝ ප්‍රතිමාව සහිත බරැති ප්‍රතිමා කුඩුව කර ගහගෙන පටු ඉණිමඟ දිගේ නඟිති. මමද ප්‍රතිමා කුඩුව කුණු සහිත අතින් අල්ලා ගෙන එයට උර දුන්නෙමි. පසු පසින් තරබාරු පූජකයන් දෙදෙනෙක් අලස ලෙස ගී ගයමින් එතිඃ

"අති පාරිශුද්ධ දේව මෑණියෙනි, අප උදෙසා යාච්ඤා කළ මැනවි..."

මම දොම්නස සහිත විශ්වාසයකින් කල්පනා කළෙමි.

"මම කුණු තවරාගෙන දේවමෑණියන්ගේ ප්‍රතිමාව ඔසවා ගෙන යන නිසා ඈ අමනාප වනු ඇත. මගේ අත් වියළී පණ නැතිව යනු ඇත. මන්දයත්, ඇගේ ප්‍රතිමා කුඩුව කුණු තැවරුණු අත්වලින් ඔසවා ගෙන යන බැවිනි."

ප්‍රතිමාව සුදු රෙද්දෙන් වැසූ පුටු දෙකක් මත තබා එය දෙපැත්තෙන් තරුණ, දේවදූතයන් මෙන් ලස්සන රූප සම්පත්තියෙන් යුත්, පැහැදිලි නෙත් සහිත බූසියක් වැනි හිසකේ සහිත ප්‍රීතිමත් පූජකයෝ දෙදෙනෙක් සිට ගත්හ.

යාච්ඤා වාරය ආරම්භ විය.

"අහෝ අති පාරිශුද්ධ මංගල්‍ය මෑණියනි," උස් හඬකින් මහ පූජකයා ගායනය පටන් ගත්තේය. එසේ ගයන අතරම, ඔහු ඔහුගේ දම් පැහැති ඇඟිල්ලකින් හිස කේ වැටියට වැසී තිබෙන ඉදිමුණු කන් පෙත්ත අතගාන්නට

විය.

"ජන්ම පාපයෙන් නිර්දෝෂ දේව මෑණියනි, අප උදෙසා යාච්ඤා කළ මැනවි," තරුණ පූජකවරු විඩාපත් හඬින් ගායනා කළෝය.

මම දේවමෑණියන්ට භක්තියෙන් ආදරය කළෙමි. ආච්චිගේ කතා අනුව දුප්පත් මිනිසුන්ගේ සතුට සඳහා මෙලොව සියලු මල් පැළ කරන්නේත්, ශුභ සිද්ධිය සහ සුන්දරත්වය ළඟා කරනු ලබන්නේත් ඇය විසිනි. ප්‍රතිමාවේ අත සිපීමේ වාරය පැමිණි විට, වැඩිහිටියන් එය කරන සැටි ගණන් නොගෙන, ගැහෙන හදවතින් යුතුව මම ප්‍රතිමාවේ දෙතොල් සිප ගතිමි.

යම් කිසි බලසම්පන්න හස්තයක් විසින් මම දොරකඩ මුල්ලට විසි කරනු ලැබීමි. පූජකයන් ප්‍රතිමාව ගෙනගිය සැටි මට හරි හැටි මතක නැති වුවද, ගෙහිමියන් මා වට කැරැගෙන මට සිදුවනුයේ මොනවාද යන්න ගැන අතිමහත් බියකින් හා සැලකිල්ලකින් කතා කළ සැටි නම් මට යසට මතකය.

"වඩාත් උගත් පූජකයකු සමඟ කතා කරන්න ඕනෑ" යැයි මට කෝප විරහිතව බැණ වැදුණු ගෙහිමියා කිව්වේය.

"අමනයා, දෙතොල් සිප ගැනීම නරක දෙයක් බව නුඹට තේරුම් ගන්න බැරිද? ඒ වුණාට ඉස්කෝලෙටත් ගිහිල්ල ඉගෙන ගත්තා."

දවස්කීපයක්තිස්සේමම විනාශයබලාපොරොත්තුවෙන් සිටියෙමි. දැන් ඉතින් මොනවා වේද? කුණු තවරාගත් අත්වලින් ප්‍රතිමා කුඩුව ඇල්ලීම, නීතිවිරෝධී ලෙස සිප ගැනීම යන මේ පව්වලට මට දඬුවම් ලැබෙනු නියතය. එයින් බේරීමට නොහැකිය.

එහෙත්, ඉමහත් ආදරය නිසා සිතා මතා නොකළ පව්වලට දේව මෑණියෝ මට සමාව දුන් සේක. එසේත් නැතිනම් දේවමෑණියන් මට දුන් දඬුවම් කොතරම් සුළු වී ද යත්, යහපත් මිනිසුන්ගෙන් මට නිතර ලැබුණු දඬුවම් නිසා ඇගේ දඬුවම් නොපෙනිණි.

ගෙහිමි මැහැල්ල කෝපයට පත් කරනු පිණිස සමහර දාට ඇය ඉදිරියේ මම මෙසේ පවසමි.

"දේව මෑණියන් මට දඬුවම් කිරීමට අමතක කරලා වගෙයි..."

"තෝ ඉක්මන් නොවී හිටපිය. අපි මතුවට බලමු."

යි ඈ කෝපාන්විත ලෙස කිව්වාය.

...අට්ටාලයේ බාල්ක සහ බිත්ති රෝස පාට තේ කඩදාසි, ඊයම් කොළ, ගස්වලැ කොළ, ආදියෙන් සැරසූ මම එම ක්‍රියාවෙහි යෙදී සිටි අතර, පල්ලියේ දේව ස්ත්‍රෝත්‍ර ගායනා කරන තාලෙට කටට ආ හැම දෙයක්ම කියන්නට පටන් ගත්තෙමි. කල්මීක්වරු පාරේ යන විටද මම තාලයටම ගායනා කරති.

ඉඳගෙන මම අට්ටාලේ
ගීත ගයමි සොඳ තාලේ
කතුරක් ඇත මගේ අතේ
මල් කපනව, වැඩ දමනව...
වුණා නම් මම බල්ලෙක්
දුවමි රට පුරා,
එහි හැම එකාම මට ගහන්න,
සැඟවෙමි මම උන්ගෙන් බේරෙන්නට,
මගේ පණ තිබෙන තුරු
මල් වැඩ දමමි විසිතුරු.

මැහැල්ල මගේ මල් වැඩ දෙස බලා සිනා පා හිස වැනුවාය.

"නුඹ කුස්සියත් එය විදිහට සරසාපන්!"

දවසක් දා ගෙහිමියා අට්ටාලයට විත් මා කළ වැඩ දෙස බලමින්, හුස්ම ඉහළට ඇදගෙන මෙසේ කිව්වේය:

"නුඹ පුදුම කොල්ලෙක්! පෙෂ්කොව්, මහ යක් පැටියෙක්, නුඹ ලොකු වුණාම විජ්ජාකාරයෙක් වෙයිද? ඒකත් හරියට කියන්න බැහැ...."

ඔහු ලොකු නිකොලායි රජුගේ රූපය සහිත පහේ කාසියක් මට තෑගි කළේය.

මම කුඩා කම්බිවලින් එය බැඳ පදක්කමක් ලෙස එල්ලා සැරසිලිවල ප්‍රධාන තැනක එය තැබීමි.

එහෙත්, දවසක් ගතවත්ම, පහේ කාසිය කම්බි සැරසිලිත් සමඟ අතුරුදහන් විය!. මැහැල්ල එම කාසිය සොරාගත් බව මම විශ්වාස කරමි.

V

කෙසේවතුදු, වසන්තයේදී මම ඒ නිවසින් පැන ගියෙමි. දවසක් දා උදැසන මම පාන් සහ තේ කොළ මිලදී ගෙනෙනු පිණිස කඩයට ගියෙමි. කඩකාරයා තම බිරිඳ සමඟ කලහයක් ඇති කර ගනිමින්, ඇගේ නළලට යකඩ පඩියකින් ගැසීය. ඈ මහ පාරට දිව ගියද එහිදී බිම ඇද වැටුණාය. මිනිස්සු රැස්වූහ. ගැහැනිය රියක නංවාගෙන රෝහලට ගෙන ගියහ. මම අස්රියකරු පසු පසින් දිව ගියෙමි. අනතුරුව මා නොදැනුවත්ම වොල්ගා නදී බඩට පැමිණ සිටින සැටි මම දුටිමි. මා අත කොපෙක් විස්සකි.

එදින හිරු රැස් ඉතා කාරුණික, සතුටක් ගෙන දුන්නේය. වොල්ගා නදියේ ජලය උතුරා යයි. මිනිස්සු ප්‍රබෝධයෙන් කෑකෝ ගසති. වටපිට ඉඩකඩ බොහෝය. මීට පෙර මා ජීවත් වුණේ ගුලක වාසය කළ මී පැටවකු මෙනි. යළිත් මා බැළමෙහෙවර කම් කළ ගෙදරට යාමට හෝ ආච්චි ළඟට එනම් කුනාවිනෝවලට යාමට හෝ මම තීරණය නොකළෙමි.

දවස් දෙක තුනක් මම වොල්ගා නදී තීරයෙහි කරුණාවත් කුලීකරුවන්ගේ ආහාරවලින් යැපෙමින් ජීවත් වුණෙමි. ඔවුන් සමඟ තොටුපළට ගියෙමි. එහිම රෑ ගත කළෙමි. එක් කුලීකරුවෙක් මට මෙසේ පැවසීය:

"පොඩි එකා, නුඹ මෙතැන රස්තියාදු වීමෙන් වැඩක් නැහැ. "දෝබ්රී" නැවට පිඟන් හෝදන කොල්ලකු ඕන වෙලා තියෙනවා. එහෙ පලයන්."

මම එම නැවට ගියෙමි. එහි 'බුපේ' අවන්හලේ ආහාර විකුණන මිනිහා උසය, කළු පාට රවුම් තොප්පියක් දමාගෙන සිටියේය. ඔහු බොර පැහැති ඇස්වලින් මා දෙස බලා මෙසේ පැවසීය:

"පඩිය මාසෙට රූබල් දෙකයි. පාස්පෝට් බල පත්‍රය දීපන්."

මා ළඟ පාස්පෝට් බල පත්‍රයක් නැතැයි කී විට ඒ මිනිහා, තරමක් වේලා කල්පනා කොට මෙසේ පැවසීය:

"අම්මාව අඬ ගහගෙන වරෙන්."

මම කුනාවිනොවලට ආච්චි සොයා ගියෙමි.

ආච්චි මගේ ක්‍රියාවට පක්ෂ වූවාය. මා වෙනුවෙන් පාස්පෝට් බල පත්‍රයක් ලබා ගැනීම සඳහා කර්මාන්ත කාර්යාලයට යන ලෙස සීයාට යෝජනා කළ ආච්චි මාත් සමඟ ගංගා තරණය කරන "දෝබ්රි" නැවට ගියාය.

අප දෙස බැලූ 'බුපේ' අවන්හලේ ආහාර විකුණන මිනිහා "හොඳයි, යමුයි" පැවසීය.

ඔහු මා නැවේ ඇණියට ගෙන ගියේය. එහි මේසයක් අසල වාඩිවී සිටි නැබුලු කෝකියා සුදු කබායක් හැඳ, සුදු තොප්පියක් හිස ලා ගෙන, තේ පානය කරන අතරම මහතැති පැපිරොස් සිගරැට්ටුවක් උරමින් උන්නේය. 'බුපේ' වෙළෙන්දා මා පෙරට තල්ලු කොට මෙසේ කීවේය:

"පිඟන් හෝදන්න කොල්ලෙක්."

ඔහු එසේ පවසා ඉවත ගිය අතර, කෝකියා උඩු රැවුළ අතගාමින් ඉවත යන වෙළෙන්දාට ඇසෙන සේ කතා කළේය.

"ඕනෑම යකෙකුව වැඩට ගනින්, හැබැයි අඩු පඩියට..."

කොටට හිසකේ කපා ඇති හිස තරහෙන් මෙන් වැණූ ඔහු, කළුවන් දෙනෙත් මහත් කොට හුස්ම ඉහළට ඇද කෑගැසීය.

"නුඹ කවුද?"

ඒ මිනිහා මගේ සිත් නොගත් බව මට එකවර වැටහිණි. ඔහු සුදු ඇඳුමක් ඇඳ සිටියද, කුණු තවරා ඉන්නා සැටි පෙනිණි. ඔහුගේ දෑතේ ඇඟිලි මවිල්වලින් ගහනය. දෙකන්වලද දිගැති මවිල් වැවිලාය.

"මට බඩගිනියි" මම ඔහුට පැවසීය.

ඔහු ඉඟිමරත්ම, ඔහුගේ රෞද්‍ර මුහුණ එකවර පුළුල් මඳ සිනාවෙකින් වෙනස් විය. ඔහුගේ මහතැති දෙකොපුල් දෙකන් දක්වා පුළුල් විය. අශ්වයකුගේ වැනි විශාල දත් දෙපෙළ දිස්විය. ඔහුගේ උඩු රැවුළ මෘදු ලෙස පහළට වැටුණු අතර, තරබාරු, යහපත්, අම්මණ්ඩි කෙනෙකුට ඔහු සමාන බවක් දැරීය.

ඔහු, ඔහුගේ ඉතිරි තේ ටික විසි කොට, අලුතින් තේ වක් කර ප්‍රංශ පාන් ගෙඩියක් සහ කොල්බසා නමැති මස්

වර්ගයෙන් කැල්ලක් මා වෙතට දිගු කර අණ කළේය.

"කාපන්. අම්මයි තාත්තයි ඉන්නවද? හොරකම් කරන්න පුළුවන්ද? කමක් නැහැ. බයවෙන්න එපා. මෙහෙ ඉන්න ඔක්කොමල්ලා හොරු. නුඹට හොරකම් ඉගෙන ගන්න පුළුවනි."

ඔහු කතා කළේ බුරන්නාක් මෙනි. ඔහුගේ විශාල මුහුණේ නාසය අසල රතු පැහැති තිත්වලට සමාන ලේ නහර ඉලිප්පී තිබිණි. ඉදිමුණු දම් පැහැති විශාල නැහැයට යටින් උඩු රැවුළ විහිදිලාය. යටි තොල එල්ලා වැටේ. දුම් වලා නැගෙන සිගරැට් කොටය කට කොනෙහි ඇලී තිබිණි. ඔහු උණු වතුර නා ගෙන මේ දැන් පැමිණියාක් මෙනි. ඔහුගෙන් බිරියෝසා අතුවල සුවඳක් සහ මිරිස් මිශ්‍ර වොඩ්කා සුවඳක් වහනය විය.

මා පාන්, කොල්බසා කා තේ පානය කළ විට ඔහු මවෙත රූබලයේ නෝට්ටුවක් දිගු කොට මෙසේ කිව්වේය:

"ගිහිල්ලා පපුවට දාන කවර සහිත ඉණට ඔතන කවර දෙකක් අරගෙන වරෙන්. නැවතියන්. මම ඒවා සල්ලිවලට අරගන්නම්.!"

හිස පැලඳි කෝකි තොප්පිය හරි ගස්වා ගෙන ඔහු ගමන් කරන්නට වූයේ වලසකු මෙන් පා තබමිනි.

..... රාත්‍රිය, හඳ බැබළෙයි. දුවන නැවට වම්පසින් විශාල දිය කඩිත්තකි. නැව පරණය, රතු පාටය. එහි දුම් බටයේ සුදු පාට තීරුවක් ඇඳලාය. නැව සෙමින් වැනෙමින් රිදීවන් දියකඳ දෙබෑ කරගෙන දුවයි. ඇදිරි ගං ඉවුරු දෙපසින් ඇත. ගං ඉවුරේ ඇති ගෙවල්වල ජනේල පහන් එළිය නිසා රතු පැහැයෙන් දිලිසෙයි. ගම්බද තරුණියෝ ගී ගයමින් තාලය අල්ලති. ඔවුන් ගයන "අයිලුලි" පදය ඇසෙන්නේ අලේලුයා ලෙසිනි.

නැවට අමුණා ඇති විශාල පාරු-බත්තලද රතුවන්ය. එහි ඩෙක් තට්ටුව වටා යකඩ වැටකි. ඈත පළාත්වල පිටුවහල් කළ සහ බරපතළ වැඩ සහිතව සිරගෙට නියම වූ සිරකරුවෝ මේ යකඩ වැටට කොටුවී සිටිති. බත්තලේ ඇණියෙහි ඉටිපන්දමක් මෙන් දිලිසෙන්නේ මුර සෙබළාගේ අතැති බයිනෙත්තුවය. නිල්වන් අහසේ කුඩා තරුද ඉටිපන්දම් ආලෝකයට සමානය. බත්තල

තුළ නිහඬතාවකි. එය සඳ රැසින් නැවිලාය. කළු පැහැති යකඩ වැටට එහා මිනිසුන්ගේ මුහුණු අළු පැහැති ලප මෙනි. සිරකරුවන් වොල්ගා නදිය දෙස බලන සැටිය. ඒ වොල්ගා නදී ජලය නඟන හඬ කෙනෙකුගේ ඇඩීමට නැතිනම් දුබල මඳ සිනාවකට සමාන වේ. අවට හැම දෙයක්ම පල්ලියෙක මෙනි. දේවස්ථානයේ මෙන්ම මෙහිද තෙල් සුවඳ තදින් දැනෙයි.

බත්තල දෙස බලන මට මගේ ළමා විය සිහියට නැගෙයි. ආස්ත්‍රහාන් සිට නිෂ්නී දක්වා අපි ගමන් කරමින් සිටියෙමු. අම්මාගේ අයෝමය මුහුණත්, සිත් ගන්නාසුලු, එනමුදු අසීරු ජීවිතයට හෙවත් මිනිසුන් අතරට මා ගෙනා ආච්චිගේ මුහුණත් මා ඉදිරියේ මැවී පෙනෙයි. මා ආච්චි ගැන මතක් කරන විට, මගේ සියලු අමාරු අසීරුකම් සහ අමනාපයන් අතුරුදහන් වෙයි. හැම දෙයක්ම සිත් ගන්නාසුලු ප්‍රිය උපදවන දේ බවට පත්වේ. මිනිස්සු එවිට වඩාත් හොඳ මිහිරි අය බවට පත්වෙති.

රාත්‍රි අලංකාරය විසින් මගේ දෙනෙතට කඳුළු උනනු ලැබීමට තරම් මගේ සිත කැලඹිලාය. පාරු-බත්තල නිසාද මසිත කැලඹී ඇත. ඒ පාරු-බත්තල මිනී පෙට්ටියකට සමානය. ඒ උණුසුම් රාත්‍රිය සහිත කල්පනාකාරී නිහඬතාවෙහි, පුළුල් නදියේ ඒ බත්තල අමතර මෙවලමක් ලෙස මට පෙනිණි. ඇද පලුදු සහිත වෙරළ වරෙක උස්වී තවත් වරෙක පාත් වෙයි. හදවතෙහි මිහිරි ගැස්මෙකි, මිනිසුන්ට අවශ්‍ය දයාන්විත පුද්ගලයකු බවට පත්වීමට මසිතෙහි ආසාවක් උපනි.

අපේ නැවේ ගමන් කරන මිනිසුන්, පිරිමින් සහ ගැහැනුන්ද, තරුණයන් සහ මහල්ලන්ද මේ හැම දෙනකුම එක හා සමාන යැයි මට සිතේ. අපේ නැව සෙමින් ගමන් කරයි. ව්‍යාපාරිකයෝ ඉක්මන් ගමන් සඳහා තැපැල් (ශීඝ්‍රගාමී) නැව්වලින් යති. කෙසේවතුදු, අපට එකතු වන්නේ සන්සුන්තාවෙන් යුත් නිකමුන්ය. උදේ සිට රෑ වනතුරු ඔවුහු කති, බොති. පිඟන්, පීරිසි, කෝප්ප, හැඳි, ගෑරුප්පු සහ පිහි අති විශාල සංඛ්‍යාවක ඉඳුල් ගාති. මගේ රස්සාව මේ සා විශාල සංඛ්‍යාවක් වන පිඟන්, පීරිසි, කෝප්ප, හැඳි, ගෑරුප්පු ආදිය සෝදා පවිත්‍ර කිරීමය. උදේ

හයේ සිට මධ්‍යම රාත්‍රිය දක්වා මම එම කාර්යයෙහි නියුක්තව සිටිමි. දහවල් දෙකේ සිට හය දක්වාත්, රාත්‍රී දහයේ සිට මධ්‍යම රාත්‍රිය දක්වාත් මට තරමක් වැඩ අඩුය. ඒ වේලාවට විකා කන ආහාරවලින් තරමක් ඈත්වන මඟීහු තේ, බීර සහ වොඩ්කා පමණක් පානය කරති. මගේ ලොක්කන් වන ආහාර වෙළඳාමේ යෙදී සිටින්නන්ටද මේ කාලය විවේකීය. සේවකයන්ගේ මේසයට වාඩිවී ස්මූරි කෝකියාද, ඔහුගේ අත් උදවු කාරයා වන යාකොව් ඉවානිච්ද, කුස්සියේ පිඟන් බඩු භාර මක්සීම්ද, ඩෙක් තට්ටුවේ මඟීන්ගේ වේටර්, වක ගැසුණු පිටි කොන්දක් සහ නෙරාගිය හකු ඇට සහිත මුහුණක් ඇති, තෙල් බඳු දෙනෙත් සහ වසූරිය කැළැල් සහිත සෙර්ගේයිද තේ බොති. යාකොව් ඉවානිච් නොයෙක් ජඩ කතා කියන අතර, දිරාපත්ව කොළ පැහැ ගැන්වුණු දත් විරිත්තමින් බක, බක ගා සිනාසෙයි. සෙර්ගේයි ගෙම්බකු මෙන් දෙකන් දක්වා කට පළල් කරගනියි. බැරෑරුම් වෙසක් මවා ගෙන සිටින මක්සීම්, අසුවල් පාටට අයත් යැයි කිව නොහැකි දෙනෙත්වලින් ඔවුන් දෙස දැඩි බැලුම් හෙළයි.

"ආස් - සියානුවෝ, වල් සත්-තු!" යැයි බොල් හඬකින් ජ්‍යෙෂ්ඨ කෝකියා ඉඳහිට ගොරවයි.

මේ මිනිස්සු මගේ සිත් නොගත්හ. තට්ට හිසක් සහ තරබාරු සිරුරක් ඇති යාකොව් ඉවානිච් කතා කරන්නේ ගැහැනුන් ගැන පමණකි. එයද කැත කතාය. ඔහුගේ මුහුණ පුස්සක් මෙනි. එය නිල්වන් ලපවලින් ගහනය.

ඔහුගේ එක කම්මුලකට රතු වන් කෙස් සහිත ඉන්නෙකි. ඔහු අල්පෙනෙත්තක් සේ ඒ කෙස් රොද ඔතා ඇත. නැවට කීකරු හා කාමුක ගැහැනියක් පැමිණියහොත් යාකොව් ඉවානිච් ඇය වටේ විශේෂ දුබල ගතියකින් සහ බියකින් ගමන් කරයි. ඔහු ඇය සමග කතා කරන්නේ හිඟන්නෙකු සේ මිහිරි ලෙසින් දුක් ගැනවිලි ඉදිරිපත් කරන ලීලාවෙනි. ඔහුගේ තුච්ඡ දිව මෙහෙයවා ඉක්මනින් ඔහු සෙවල කතා දොඩවන්නට පටන් ගනී. මෙවැනි තරබාරු පුද්ගලයන් අලුගෝසුවන් විය යුතු යැයි මට යම් හේතුවක් නිසා සිතෙයි.

"ගෑනිව රත්කරල ගන්න දැන ගන්න ඕන" ඔහු සෙර්ගේයිට සහ මක්සීම්ට ගුරු කම් දෙයි. ඔවුන් දෙදෙන ඉමහත් අවධානයෙකින් සවන් දෙමින් දෙකොපුල් පුම්බා ගෙන, රත් පැහැ ගනිති.

"ආසියානුවෝ!" යැයි ගොරවන ස්මූරි බැරෑරුම් ලෙස නැඟිට සිට මට විධානය කරයි: පෙෂ්කොව් පලයන් යන්න!"

නැවේ නිදාගන්නා කාමරයේදී ඔහු මට පොතක් දෙයි. එය සම් බැම්මක් සහිතය. ඔහු අයිස් පෙට්ටිය අසල ඇඳෙහි වැතිර ගනී.

"කියාපන්!" ඔහු අණ කරයි.

මම මැකරෝනි අහුරා ඇති පෙට්ටියක් මත වාඩිවී ඉමහත් වුවමනාවෙකින් ඒ පොත කියවන්නට පටන් ගනිමි.

"අහසේ උම්බ්‍රාකුල් නමැති තරු මඬල දුටුවොත්, එහි තේරුම දිව්‍ය ලෝකය සමඟ සබඳකම් පවත්වා ගත හැකි බවය. මෙය මෝඩයන්ටත් දිවැස් කියන්නන්ටත් තේරුම් ගත නොහැකි දෙයකි."

ස්මූරී කෝකි තැන සිගරට්ටුවක් ඇද දුම් ගුළි පිට කරන ගමන් මෙසේ කියන්නට විය.

"මෝඩ ඔටුවන් ලියාපු පොතක්..."

"පපුවේ වම් පස නිරුවත්වීම යනු හදවතේ පිරිසුදු බව දන්වන්නකි...."

"කාගේ නිරුවත් බවද?" හේ ප්‍රශ්න කරයි.

"මේ පොතේ කියලා නැහැ."

"එහෙනම් ගැහැනුන්ගේ වෙන්න ඕන. අනේ මුන් වගේ වල් බල්ලෝ," කෝකියා බැණ වදියි.

ඔහු දෑත් හිස යටින් තබා ගෙන, දෙනෙත් වසා ගෙන ඇඳේ වැතිර සිටී.

ඔහුගේ කටේ ඇති සිගරට්ටුවෙන් දුම් වලාවක් නඟී. දෙතොලට ඇලී ඇති සිගරට්ටුව දිවෙන් හරිගස්සාගෙන ඔහු දුමක් ඉහළට අදිත්ම, ඔහුගේ පපුවෙන් සිහින් උරුවම් බෑමකට සමාන ශබ්දයක් පැන නඟී. ඔහුගේ විශාල මුහුණ දුම් වලාවල ගිලිලාය. සමහර විට ඔහු නිදන බව

මට සිතෙයි. එවිට මම, ඒ ශාපලත් පොත පෙරළා බලමි. මන්දයත්, ඒ පොත මට තිත්ත වී ඇති බැවිනි.

එහෙත්, ඔහු ගොරවමින් කතා කරයි.

"කියවාපන්!"

"වෙනොරාබිල පිළිතුරු දෙයි." "මිත්‍රය, මගේ ප්‍රේර්සුවෙර්යාන්..."

"සෙවෙර්යාන්..." යැයි කෝකියා මා නිවැරැදි කරයි.

"පොතේ මුද්‍රණය කරලා තියෙන්නේ සුවෙර්යාන් කියලා..."

"මොන පිස්සු කතාද? පොතේ අන්තිම පිටුවලැ කවි වගයක් තියෙනවා. එතැන ඉඳලා පටන් ගනින්..."

මම කියවමි.

වැඩ ගැන අපේ දැනගන්ට කැමති,
මෝඩයනි,
ඇස්වලට නුඹලා ගේ දුබල,
නොපෙනෙයි, ඒවා
ප්‍රේර්වරුන් ගයන සැටි කන්වලට
නුඹලාගේ නොම ඇසේ..."

"නැවතියන්, මොන කොහෙම්මල් කවිද, පොත මෙහෙ දීපන්!" ස්මූරි අණ කරයි.

ඔහු කෝපයෙන් පොතේ නිල්වන් පිටු පෙරළයි. අනතුරුව පොත මෙට්ටය යටට විසි කරයි.

"වෙනින් පොතක් ගනින්..."

මගේ අවාසනාවට මෙන් ඔහුගේ කළු පැහැති යකඩ පෙට්ටියේ පොත් බොහොමයකි. 'ඔමීර්ගේ දේශනා', 'කාලතුවක්කු හමුදාවේ මතක සටහන්', 'ලෝඩ් සෙඩන්ගෙල්ගේ ලියුම්', 'උකුණන්ගෙන් සහ මකුණන් ආදීන්ගෙන් ඇති වන හානිය සහ උන් වඳ කිරීමට අවශ්‍ය උපදෙස්', එමෙන්ම, අගක්, මුලක් නැති පොත්ද ඒවා අතර විය. සමහරදාට ඔහු මා ලවා ඔහුගේ පොත් මිටිය අස්පස් කරවාගත් අතර, ඒවායේ නම් හඬ නඟා කියවන ලෙස මගෙන් ඉල්ලා සිටියේය. ඒ අතර ඔහු කෝපයෙන් ගෙරවීය.

"පල් හෑලි ලියනවා. බූරුවෝ.. හරියට දත්වලට පහර දෙනවා වගේ! නමුත්, කිසිම දෙයක් තේරුම් ගන්න

බැහැ. ගෙර්වාසි! ගෙර්වාසි කියන එය පොතේ තේරුම කුමක්ද! උම්බ්‍රාකුල්...."

ඉතා පැරණි වචන, නාඳුනන නම්, ගම්, මට මතක සිටි අතර, ඒවා නිසා දිව කිති කැවිණි. ඒවා නිතර නිතර කීමට මට සිත් විය. සමහර විට ඒවායේ තේරුම් මට දැන ගත හැකි වේද? නැවේ කවුළුවට එහා ජලය කැලැත්තෙන හඬක් මතුවිය. නැවේ ඇණියට යාම මට රිසිවිය. එතැන පෙට්ටි අතර නැවියෝත්, ගිනි උදුන්කරුවෝත් පැමිණ මඟීන් සමඟ කාඩ් සෙල්ලම් කොට ඔවුන් පරදවති. ඔවුහු ගී ගයති, සිත් ඇද ගන්නාසුලු කතා කියති. ඔවුන් සමඟ වාඩි වී ඔවුන් කියන සරල කතා ඇසීමටත්, කාමා නදියේ ඉවුර සහ සොස්නා ගස් බැලීමටත් මම ප්‍රිය කරමි. ඒවා ඉහළට ඇදී ඇත්තේ හරියට තඹවන් තත් මෙනි. වසන්ත හිම දියවී යන බැවින් තැනින් තැන කුඩා වතුර වළවල්ය. පුංචි පොකුණු බඳු මේවායින් නිල්වන් අහස පිළිබිඹු වන්නේ වීදුරු කැලිවලින් මෙනි. අපේ නැව ගං ඉවුරුවලින් වඩාත් ඈතට හෙවත් ගඟ මැදට දුවයි. ගං ඉවුරේ සිට අපට නොපෙනෙන සීනු කුලුනකින්, විඩාපත් දවසේ නිහඬතාව බිඳ ගෙන හඬක් ඇසේ. එම හඬ අප තුළ ගම් සහ ගම්මුන් පිළිබඳ මතකයක් ඇති කරයි. ගං රැල්ලට අසුවී නැළවෙන ධීවරයකුගේ ඔරුව යෝධමය පාන් වාටියක් සිහි නංවයි. දැන් අපට කුඩා ගම්මානයක් පෙනේ. කොලු රංචුවක් ගඟට බැස නාමින් දිය කෙළිති. කහවන් ගං ඉවුරේ රතු කමිසයක් ඇඳගත් ගොවියෙක් ගමන් කරයි. ඈත සිට බලන විට හැම දෙයක්ම ඇස පිනවන කෙළි බඩුවලට සමානය. සිත පිනවන විවිධ පාටින් යුක්තය. ගං ඉවුර අමතා, එමෙන්ම, පාරු-බත්තලේ සිරකරුවන් අමතා යම් කිසි සුරතල්, එමෙන්ම, දයාන්විත වචන කීමට විශාල අවශ්‍යතාවක් දැනෙයි.

රතු පාටට හුරු ඒ පාරු බත්තල මගේ ගත සිත ඇද ගත්තේය. ඇසිපිය නොහෙළා පුරා පැයක් වුව මට ඒ දෙස බැලිය හැකිය. කාමා නදියේ බොර පැහැති ජලය පාරු බත්තලේ මොට්ට ඇණිය විසින් දිය පීරා ගෙන ඉදිරියට යනු ලබන සැටි, උඟරකු ඇදගෙන යන්නා සේ නැව ඒ පාරු-බත්තල ඇද ගෙන යෙයි. වරෙක නැවට ඈඳා ඇති

කඹය දුබල වී එය වතුරට වැටේ, එහෙත්, එය යළිත් ගොඩ ආ විට එයින් වතුර බිංදු වෑස්සෙයි. යකඩ කූඩුව තුළ සතුන් මෙන් වාඩි ගෙන ඉන්න මිනිසුන්ගේ මුහුණ දැකීම මගේ ආසාව විය. පෙර්ම්වලදී මේ සිරකාරයන් ගං ඉවුරට ගෙන ගිය විට, මම පාරු බත්තලට ළං වූයෙමි. සිරකරුවෝ ඔවුන්ගේ පාදවලට අමුණා ඇති බරැති විලංගු හඬවමින්, කරින් ගත් මලුවල බර නිසා දෙකට නැවීගෙන ගමන් කළහ. ගැහැනුද, පිරිමිද, මහල්ලෝද, තරුණයෝද, රූප සම්පත්තියෙන් හෙබියෝද, විරූපියෝද, අනිකුත් සාමාන්‍ය මිනිසුනට බෙහෙවින්ම සමාන වුවද, ඇන්ද ඇඳුම් නිසාත්, විරූපී වන ලෙස හිස මුඩු කැර ඇති නිසාත් වෙනස් වූහ. සත්තකින්ම ඔවුන් පල්හොරුන්ය. එහෙත්, පල්හොරුන් ගැන බොහෝ හොඳ කතාන්දර ආච්චි කියා ඇත.

අන් අයට වඩා රෞද්‍ර පල්හොරකුට බෙහෙවින් සමාන වන ස්මූරි මූසලයකු මෙන් බත්තලේ සිරකරුවන් දෙස බලා ගොරවන්නාක් මෙන් මෙසේ පැවසීය:

"දෙවියනි, මෙවන් ඉරණමකින් මා ගලවා ගනිත්වා!"

වරක් මම කෝකියාගෙන් ප්‍රශ්න කළෙමි.

"ඔබ මොකද කෑම උයන්නෙ, අනික් අය මිනී මරනවා, මංකොල්ල කනවා නේද?"

"මම කෑම උයන්නෙ නැහැ. පිළියෙල කරනවා. කෑම උයන්නේ ගෑනු." ඔහු සිනාසෙමින් මගේ පැනයට පිළිතුරු දෙන්නේ, මඳක් කල්පනා කොට මෙසේද කීවේය. " මිනිසුන් අතර වෙනස රඳා පවතින්නේ මෝඩකම අනුවයි. සමහරු බොහොම බුද්ධිමත්, තවත් සමහරු තරමක් බුද්ධිමත්, වෙනත් අය බොහොම මෝඩයි. මෝඩයාට නුවණ ලබා ගන්න ඕන නම්, සුදුසු පොත් කියවන්න ඕන. අපූරු විජ්ජා ගැන කියන පොත්, තවත් මොනවාද? සියලු පොත් කියවන්න ඕන. අන්න එවිට සුදුසු පොත් හොයාගන්න පුළුවනි..."

ඔහු නිතර, නිතර එකම දෙයක් ගැන කිව්වේය.

"නුඹ පොත් කියවපන්! තේරුම් ගන්න බැරි නම් හත් පාරක් කියවාපන්. ඒත් තේරුම් ගන්න බැරි නම් දොළොස් පාරක් කියවාපන්..."

නිහඬව සිටින 'බුජේ' අවන්හලේ වෙළෙන්දා ඇතුළු සියලු දෙනා සමඟ ස්මූරි කතා කළේ වචන කඩමිනි, නරුම ලෙසිනි, යටි තොල පහළට දමා ගෙන, උඩු රැවුළ කැටි කොට ගෙන මිනිසුන් වෙත ගල් දමා ගසන්නාක් මෙනි. ඔහු මා කෙරෙහි දැක්වූයේ මෘදු, අවධානය සහිත ආකල්පයෙකි. එහෙත්, ඔහුගේ එම අවධානයෙහි මා තරමක බිය ගැන්වෙන කිසිවක් ගැප් වී තිබිණි. මගේ ආච්චිගේ නංගී මෙන් මේ කෝකියාද ඔල්මාද කෙනෙකු ලෙස මට සමහර විට හැඟිණි.

සමහරදාට ඔහු මට මෙසේ පැවසීය:

"කියවීම පොඩ්ඩකට නවත්වාපන්..."

ඔහු ඇඳේ වැතිර ගෙන, දෙනෙත් වසා ගෙන එකම ඉරියව්වකින් බොහෝ වේලාවක් සිටිමින් නහයෙන් හඬ නංවයි. ඔහුගේ විශාල බඩගෙඩිය නැටවෙයි. විශාල පපුව මත දෑත්වල ඇඟිලි බැඳ ඇත්තේ මළමිනියක් සිහියට නංවමිනි. ඔහුගේ අත්වල මවිල් ගින්නට පිලිස්සිලාය.

හිටිහැටියේම ඔහු දොඩවන්නට පටන් ගනී.

"ඔන්න නුඹට බුද්ධිය ලැබිලා තියෙනවා. ජීවත් වෙයන්, ඔක්කෝමල්ලාට එකම විදිහකට නුවණ තිබුණා නම්, නැහැ එහෙම වෙන්නෙ නැහැ. කෙනෙකුට වැටහෙනවා. තවත් කෙනෙකුට වැටහෙන්නෙ නැහැ. තවත් එවුන් ඉන්නවා, උන්ට කොහොමටවත් වටහා ගන්න උවමනාවක් නැහැ. ආ!"

වචන ගොත ගසමින් ඔහු සිය සෙබළ ජීවිතයේ ඉතිහාසය ගැන විස්තරයක් කරයි. ඔහු කී සිද්ධිය අරබයා වූ තේරුම වටහා ගැනීමට මම අපොහොසත් වීමි. එය මගේ සිත් නොගත්තේය. ඔහු ඒ සිද්ධිය ගැන විස්තර කළේත් මුල සිටම නොවෙයි. ඔහුගේ සිතට කා වැදුණු දේ ගැන පමණකි.

"...සේනාංකය භාර ලොකු නිලධාරියා ඒ සෙබළාට අඬගසා ප්‍රශ්න කරනවා. උප ලයිතන් නුඹට කිව්වේ මොනවාද? සෙබළා ඇත්ත ඇති සැටියේම විස්තර කළා. සෙබළා සත්‍යය කීමට බැඳී සිටිනවා. උප ලයිතන් සෙබළා දිහා බැලුවේ හරියට බිත්තියක් දිහා බලන්නා වගෙයි. ඊට පස්සෙ උප ලයිතන් අහක බලා ගෙන හිස

පහත දමා ගත්තේය. ඔව්...."

"කිවයුතු දේ මොනවාද, නොකිව යුතු දේ මොනවාද කියල මා දන්නෙ කොහොමද? ඔන්න ඉන් පස්සෙ උප ලයිතන්ව බළකොටුවක සිර භාරයට යැව්වා. එයාගේ අම්මා මෙහෙම කියනවා. අනේ දෙවියනි, මම කිසිවක් දන්නා කෙනෙක් නොවේ..."

දැඩි උෂ්ණයකි. අවට හැම දෙයක්ම සෙමින් සෙලවෙයි. හඬ නඟයි. නැවේ නිදන කුටියේ බිත්තියට එහා ජලය හඬ නැංවෙන සැටි ඇසෙයි. නැවේ විශාල රෝදය ශබ්ද නඟමින් භ්‍රමණය වෙයි. කවුළුව අසලින් කාමා නදිය පුළුල් ලෙස ගලා බසී. ඈත තුරු ලතාවලින් යුත් ගං ඉවුර පෙනේ. කනට හැම ශ්‍රවණයක්ම හුරු පුරුදුය. මට දැනෙන්නේ නිහඬතාවක් පවතින බවකි. එහෙත්, නැවේ ඇණියේ සිටගෙන නැවියෙක් නහයෙන් අඬන්නාක් මෙන් ගයයි.

"මී-ඉ-ටර හතයි, මී-ඉ-ටර හතයි..."

කිසි දෙයකට සහභාගි නොවී, කිසිවකට සවන් නොදී, වැඩ නොකර සිටීමට සිත් දෙයි. තෙල් සහිත කුස්සියේ උණු සුවඳ නැති සෙවණක වාඩි වී අඩ නින්දෙන් කිරා වැටෙමින්, විඩාපත් මේ ජීවිතය නදී ජලය මත දිවෙන සැටි බැලීමට ආසාවකි.

"කියවාපන්!" කෝකියා කෝපයෙන් කෑ ගසයි.

උසස් වේටරවරු පවා ඔහුට බියවෙති. මාළුවකුට සමාන, සාමකාමී, අල්ප භාෂිත 'බුපේ' අවන්හලේ ආහාර විකුණන්නාත් ස්මූරි කෝකි තැනට බියවී සිටින සැටියෙකි.

ඔහු 'බුපේ' අවන්හලේ සුළු සේවකයාට බැණවදී, පරිභව කරයි.

"මෙහෙ වර බොල උෆරා! මෙහෙ වර හොර දෙටුවා! ආසියානුවා, උම්බ්‍රාකුල්...."

නාවිකයෝත්, ගිනි උදුන්කරුවෝත් කෝකියාට ගරු කරති. ඔහු ඔවුනට බුලියොන් තැම්බූ පසු ඉතිරි වන මස් බෙදා දී, ඔවුන්ගෙන් උපන් ගම-රට ගැනත්, පවුල් ගැනත් තොරතුරු විමැසුවේය. ඇඟපත පුරා මැෂින් තෙල් සහ දුඹුටු තවරා ගත් ගිනි උදුන්කරුවෝ බෙලොරුසියානුවෝය. නැවේ අනික් අය ඔවුනට

සැලකුවේ පහත් මිනිසුන් ලෙසිනි. ඔවුන් යගුත්වරුන් ලෙස හඳුන්වමින් ඔවුනට පරිභව කළහ.

ස්මූරිට එය ඇසුණු විට ඔහු ක්‍රෝධයෙන් ලේ පැහැ ගෙන, ගිනි උදුන්කරුවකුට කෑ ගැසීය.

"ඇයි මෝඩයෝ උන් නුඹට හිනාවෙනවා. නුඹ ඒකට ඉඩ දෙනවද? රුසියානු ගොරහැඩියාගේ මූණත් තහඩුව කුඩු කරපිය!"

වරෙක නැවේ වගකිව යුතු නාවිකයා වූ කඩවසම් පෙනුමක් ඇති නපුරු මිනිහෙක් කෝකියාට මෙසේ කිව්වේය.

"යගුතයයි, හහොලයයි[1] එකම ජාතියේ පල්හොරු!"

එවිට කෝකියා ඔහුගේ කරින් සහ ඉණෙන් අල්ලා ඔහු හිසට ඉහළින් ඔසවා වැරෙන් සොලවමින් ඔහුගෙන් ප්‍රශ්න කළේය.

"තෝව පොළොවේ ගහන්නද?"

නිතර පාහේ කලහ කර ගත් අතර, සමහරදාට ගුටි බැට හුවමාරු වුණද කිසිවෙක් කෝකියාට පහර නොදුන්හ. ස්මූරි සතුව තිබුණේ අධි මානුෂික කාය බලයකි. එපමණක් නොව, නැවේ කපිතාන්වරයාගේ බිරිඳ නිතර සුරතල් ලෙස ඔහු සමග කතාබහ කළාය. ඕ උසය, යහතින් වැඩිලාය. ගැටවරයකුගේ මෙන් මුහුණක් ඇත්තියකි, ඇගේ හිසකේ කොටට කපලාය.

ඔහු බොහෝ සේ වොඩ්කා පානය කළද, කිසි දිනෙක වෙරි නොවීය. උදේ සිට බීමට පටන් ගන්නා ඔහු බෝතලයක් උගුරු හතරට බී අවසන් කරයි. ඉන් ඉක්බිතිව රෑ වන තුරු බීර බොන්නට පටන් ගනී. ඔහුගේ මුහුණ කෙමෙන් දම් පැහැ ගත්තේය. ඔහුගේ කළුවන් දෙනෙත්වල කනීණිකා අපූරු ලෙස මහත් විය.

හවස් කාලයට සමහර දවස්වලදී ඔහු පැය ගණනක් වුවද එක එල්ලේ වාඩි වී සිටී. සුදුවන් ඇඳුමෙන් සැරසුණු විශාල සිරුරක් ඇති මේ මිනිහා නිහඬව, මූසල ලෙස ඈත බලයි. එවන් මොහොතේදී විශේෂයෙන් ඔහුට බොහෝ දෙනෙක් බිය වූහ. එහෙත්, මම ඔහුට අනුකම්පා කළෙමි.

1. හහොලයා - උක්‍රයින ජාතිකයා - අනුවාදක

යාකොව් ඉවානිච් කුස්සියේ සිට එළියට විත්, තට්ටය කසමින් සිටගෙන සිටී. රත්වූ ඔහුගේ සිරුර ඩහදියෙන් නැහැවිලාය. සමහර විට ඔහු අතක් වනා යළි කුස්සියට යයි. නැතිනම් ඈත සිට කතා කරයි.

"කළුකුමා මැරිලා..."

"සොල්යාන්කා හොද්දට උෆව දමාපන්..."

"මාළු සුප් හොදි නැතිනම් තම්බපු මාළු ඉල්ලුවොත්?"

"ඒවාත් උයාපන්. උන් ඒවා සේරම කාවි."

සමහරදාට එසේ වාඩි වී සිටින ස්මූරි ළඟට යාමට තරම් මම බිය නොවීමි. ඔහු අසීරු ලෙස මා දෙස නෙත් එල්ල කරයි.

"මොකද?"

"මොකවත් නැහැ."

"යසයි..."

එක් දවසක් මෙවන් වේලාවකදී මම ඔහුගෙන් මෙලෙස ඇසුවෙමි.

"ඔබ හැම දෙනාවම බය කරන්නෙ මන්ද? ඔබ කරුණාවන්ත කෙනෙක් නේද?"

මා කලින් නොසිතූ පරිදි ඔහු කෝප නොවීය.

"මම කරුණාව පෙන්වන්නෙ නුඹට විතරයි."

එවිටම වාගේ ඔහු වාම් ලෙසත්, කල්පනාකාරී ලෙසත් මෙසේද තෙපලේය.

"ඇත්ත තමයි, මම හැම එක්කෙනාටම කරුණාවන්තයි. නමුත්, මම එය පිටට පෙන්වන්නෙ නැහැ. එහෙම කරුණාව පෙන්වන්නට ගියොත් උන් ආඩම්බර වෙනවා. කරුණාවන්ත මිනිහගේ ඇඟට හැම එකාම ගොඩවෙන්න එන්නේ මඩ ගොඩේ ඉන්න අය වියළි බිමට එන්න හදනවා වගෙයි. එසේ ඇවිත් වියළි බිමත් මඩ ගොඩට ඔබා දමනවා .....! පලයන් ගිහිල්ලා මට බීර ගෙනෙන්...."

උගුරු දෙක තුනට බීර බෝතලය බී, උඩු රැවුළ සපමින් ස්මූරි කතා කළේය.

"නුඹ ඔයිට වැඩියෙ ටිකක් ලොකු වුණා නම්, නුඹට බොහෝ දේ උගන්වන්න මට පුළුවන්. මිනිහකුට කිව යුතු දේ මම දන්නවා. මා මෝඩයකු නොවේ. නුඹ පොත් කියවාපන්, පොත්වල ගත යුතු දේ තියෙනවා. පොත්

කියන්නේ බොරු, පුහුදේවලට නොවේ. නුඹට බීර ඕනද?"

"මම බීරවලට කැමැති නැහැ."

"හොඳයි, බීර බොන්න එපා. බේබදුකම මහ විනාශයක්. වොඩ්කා යකාගේ බීම, මට සල්ලි තිබුණා නම් මම නුඹව පාසල් යවනවා. නූගත් මිනිහා මීහරකා, උගේ කරේ වියගහ බැන්දත්, ඌව මස් මඩුවට යැව්වත් ඌට කමක් නැහැ. ඌ වලිගය වනනවා විතරයි..."

කපිතාන්ගේ බිරිඳ ඔහුට ගෝගොල්ගේ කෙටි කතා පොතක් දුන්නාය. මා කියැවූ "බියජනක පළි ගැනීම" නම් වූ කෙටි කතාව මා සිත් ගත්තද, ස්මූරි කෝපයෙන් කෑ ගැසීය.

"ඔය නවකතා පල්බොරු! වෙනත් පොත් තියෙන බව මම දන්නවා...."

මා අතින් පොත උදුරා ගත් ඔහු කපිතාන් බිරිඳගෙන් තව පොතක් ගෙනාවේය. බැරෑරුම් ලෙස මට අණ කළේය.

"අර තරාස් බුල්බා[1] ගැන කතාව කියවාපන්. කපිතාන් නෝනා පොත හොඳයි. කියනවා. හොඳ කාටද? එයාට හොඳයි. සමහර විට මට ඒ පොත හොඳ නැතුවා වෙන්න පුළුවනි. එයා කොණ්ඩෙ කොටට කපලා. කන් දෙකක් කපලා නැත්තෙ මොකද?"

තරාස් ද්වන්ද සටනකට ඔස්තාප් කැඳවූ විස්තරය කියවන විට, ස්මූරි කෝකියා මහ හඬින් සිනාසෙන්නට විය.

"ඒක එහෙමයි! ඉතින් මොකද? නුඹ උගතා, මට ශක්තිය තියෙනවා. මේ ඔටුවෝ අච්චු ගහන පොත්වල හැටි!"

ඔහු සාවධානව සවන් දුන්නද, බොහෝ විට දොඩවන්නට විය.

"ඒවා පල්බොරු! අස්වයා පිට නැඟලා ඉන්න මිනිහකුගේ කඳ දෙපළු කිරීම බැරි වැඩක්. රිට දිග හෙල්ලෙන් ඇන්නට පස්සේ ඔසවන්න බැහැ. එතකොට රිට කැඩිලා යනවා. මම සෙබළෙක්..."

1. "තරාස් බුල්බා" ගෝගොල් ලියූ නවකතාවකි. - අනුවාදක

අන්ද්රිගේ පාවා දීම නිසා ස්මූරි ඉමහත් ලෙස කලකිරීමට පත්විය.

"නීච පවුලක් නේද? ගෑනියක් හින්දා. තෑ නොදකින්..."

එහෙත්, තරාස් තම පුතාට වෙඩි තැබූ විට ස්මූරි කෝකි තැන දෙපා ඇදෙන් බිමට දමා ඇඳ අයින දෑතින් අල්ලා ගෙනැ කුදු ගැසී, අඬන්නට විය. ඔහුගේ දෙනෙතින් පිටවූ කඳුළු කැට සෙමින් නැවේ ලී පොළොවට වැටිණි. හේ සුසුම් ලමින් මුමුනන්නට වූයේය.

"අනේ දෙවියනි, මගේ දෙවියනි....."

හිටිහැටියේම ඔහු මා අමතා කෑ ගැසීය.

"ඉතින් කියවාපන්, යක්පැටියෝ!"

ඔස්තාප් මරණයට පෙර ඔහුගේ පියා අමතා කෑ ගැසුවේය. "තාත්තේ! නුඹට ඇහෙනවද?" මා පොතේ ඒ කොටස කියවත්ම ඔහු වඩාත් වැඩියෙන් කඳුළු වගුරවමින් අඬන්නට විය.

"ඔක්කෝමල්ලා විනාශයි. ඔක්කෝමල්ලා, ඉතින් ඉවරද? මදෑ ශාපලත් වැඩක්! මිනිසුන් හිටියා. තරාස්, එයාත් නේද? ඔව්. අර අනික් මිනිස්සු..." සුසුම්ලමින් ස්මූරි පැවසීය.

ඔහු ඒ පොත මා අතින් උදුරා ගෙන එය ඉතා ඕනෑකමින් බලා ඒ පොතේ කවරය මත කඳුළු වගුරුවා සිය හැඟීම පැවසීය.

"බොහොම හොඳ පොත! හරියට උත්සවයක් වගේ!"

ඉනික්බිතිව අපි 'අයිවන්හෝ' කියවීමු. රිචඩ් ප්ලැන්ටගෙනේට් ස්මූරිගේ සිත් තදින් ගත් චරිතයකි.

'රිචඩ් හැබෑ රජ කෙනෙක්! ඔහු වශීවනසුලු හඬකින් මට කිව්වේය. එහෙත්, මට 'අයිවන්හෝ' පාළු ගතිය මුසු කාන්සියක් ගෙන දුන්නේය.

රුචිය විසින් අප දෙදෙනා එකිනෙකාට වෙනස් වීමු. ටෝමස් ඉඔනෙස් පිළිබඳ කතාව, හෙවත් 'ටොම් ජෝන්ස්' නමැති 'අනාත කොල්ලාගේ කතාව' නමින් පළවූ එහි පැරැණි පරිවර්තනය බෙහෙවින් මා සිත් ගත් නමුදු, ස්මූරි තරහෙන් දොඩවන්නට විය.

"මෝඩ කතාවක්. ටෝමස් සමඟ මට ඇති ගනුදෙනුව මොකක්ද? ඔහුගෙන් මට ඇති පලය කුමක්ද? වෙනත්

පොත් තියෙන්න ඕන...."

රහස්, නීති විරෝධී පොත් තියෙන බව මම දනිමියි වරක් ඔහුට පැවසීමි. ඒවා මහ රෑ, පොළොව යට බිම් ගෙවල්වලට වී කියැවිය යුතුය.

ඔහුගේ දෙනෙත් මහත් වූ අතර, පහතට නැවී තිබුණු රැවුළ උඩු අතට හැරිණි.

"ඒ මොනවද? නුඹ බොරු දොඩවනවද?"

"මම බොරු කියන්නෙ නැහැ. මා පාපෝච්චාරණය කරන විට පල්ලියේ සුවාමි තමයි මට තහනම් කරපු පොත් ගැන කිව්වේ. ඒ පොත් කියවලා අඬන සැටි මම දැකලා තියෙනවා."

කෝකියා බැරෑරුම් ලෙස මා දෙස බලා ප්‍රශ්න කළේය. "අඬන්නෙ කවුද?"

"ඒ පොත කියවනවා අහගෙන හිටිය නෝනා. අනික් නෝනා බයවෙලා යන්න ගියා..."

"ඇහැ ඇරපන්. නුඹ පිස්සු දොඩවනවා." යැයි කී ස්මූරි සෙමින් දෙනෙත් පියාගෙන තරමක් වේලා නිහඬව සිට මුමුනන්නට විය. "සත්තකින්ම කොහේ හරි තියෙනවා. රහස් පොත් තියෙන්න ඕන. ඒවා නැතුව යන්න බැහැ... මගේ වයස නිසා මට ඒවා දැන් හොයන්න බෑ.... නමුත්, ඒ වුණාට...."

ඔහුට එවැනි ඊනියා අලංකාර බසින් පැයක් වුවද කතා කළ හැකි විය.

මටම නොදැනුවත්ම මම කියැවීමට පුරුදු වීමි. මා පොතක් අතට ගත්තේත් ඉමහත් සතුටකිනි. පොතින් කියන ජීවිතය, සැබෑ ජීවිතයට වඩා ප්‍රීතිමත් ලෙස වෙනස්විය. එහෙත්, සැබෑ ජීවිතය වඩාත් කටුක විය.

ස්මූරිද වඩාත් වැඩියෙන් කියවන්නට වූ අතර, මගේ වැඩටද බාධා කළේය.

"පෙෂ්කෝව් ඇවිල්ලා පොතක් කියවපන්..."

"හෝදන්න ඕන පිඟන් ගොඩ ගැහිලා."

"මක්සිම් හෝදලා දාවි."

ඔහු රළු ලෙස ජ්‍යෙෂ්ඨ සේවකයාව පිඟන් සේදීමට යැවූ අතර, ඒ මිනිහා කෝපය උහුලා ගත නොහී වීදුරු බින්දේය. 'බුපේ' අවන්හලේ වෙළඳ සේවකයා සන්සුන්

ලෙස මට අනතුරු ඇඟවීය.

"නුඹව නැවෙන් දොට්ට දානවා."

දවසක් දා මක්සීම් කුණු වතුර පිරි බේසමකට වුවමනාවෙන් තේ බොන වීදුරු කීපයක් දැමීය. මම ඒ වතුර වීදුරුත් සමඟ ගඟට වීසි කළෙමි.

"ඒක මගේ වරද. වීදුරුවලට ගෙවිය යුතු ගණන මම ගෙවන්නම්." ස්මූරි 'බුපේ' අවන්හලේ අයිතිකරුවාට කිව්වේය.

එහි සේවකයෝ මා දෙස යටැසින් බලා මෙසේ කියන්නට වූහ:

"ඒයි පොත් කියවන කොල්ලා, නුඹ පඩි ගන්නෙ මොනවා කරලද?"

ඔවුහු වුවමනාවෙන්ම පිඟන්වල ඉඳුල් ගා මට සේදීමට දුන්හ. මේවා සියල්ල නිසා මට අයහපතක් වන බව මම වටහා ගතිමි. මගේ එම නිගමනය නිවැරැදි විය.

හවස් වත්ම, කිසියම් කුඩා තොටුපළකදී අපේ නැවට රතුවන් මුහුණක් ඇති මැදිවියේ ගැහැනියක් සහ කහ පාටැති සායක් සහ ළා රතු පාටැති අලුත් හැට්ටයක් ඇඳගත් තරුණියක් ඇතුළු වූහ. මේ දෙදෙනම මත්පැන් බී සිටි අතර, මැදි වයසේ සිටි ගැහැනිය හැම දෙනාටම හිස පාත් කරමින් පල්ලියේ අන්නවිරාල කතා කරන විටදී මෙන් කතා කළාය.

"සමාවන්න, මිතුරනි. මම අද පොඩ්ඩක් බිව්වා. මම අද නඩුවෙන් නිදහස් වුණ සන්තෝසෙට පොඩ්ඩක් බිව්වා..."

තරුණියද බොර පැහැති ඇස්වලින් මිනිසුන් දෙස බලා සිනා පෑවාය.

"පිස්සු නැන්දේ, ඔයා ගිහින් බලා ගෙන එන්න."

යැයි කියමින් තරුණිය අනික් ගැහැනිය ඉදිරියට තල්ලු කළාය.

යාකොව් ඉවානිච් සහ සෙර්ගෙයි නිදා ගන්නා ස්ථානයට යාබද, දෙවැනි පන්තියේ මඟීන්ගේ ඇඳන් ඇති ස්ථානය අසල තැනක් ඔවුනට පිළියෙල කර දුන්හ. ඉක්මනින්ම ගැහැනිය කොහාටදෝ ගියෙන්, සෙර්ගේයි තරුණියගේ ඇඳ ළඟ වාඩි වී, ඔහුගේ ගෙඹි කට කෑදර ලෙස පළල් කර ගත්තේය.

රාත්‍රියේ වැඩ මුරය අවසන් වී මේසය මත නිදා ගැනීමට මා සැරසෙන විට, සෙර්ගේයි මා ළඟට විත් මගේ අතින් ඇල්ලීය.

"වරෙන් යන්න, අපි නුඹට කසාදයක් බන්දවන්නම්..."

ඔහු මත්පැන් බී වෙරි වී සිටියේය. මා ඔහුගෙන් මිදීමට තැත් කළ විට ඔහු මට පහරක් ගැසීය.

"පලයන්!"

මත්පැන් බීගත් මක්සීම්ද පැමිණියෙන් දෙදෙනා ඩෙක් තට්ටුවේ නිදා සිටින මඟින් අසලින් මා ඇදගෙන ගියහ. එහෙත්, දොර අසල ස්මූරි සිටගෙන සිටියේය. දොරෙහි මිට යාකොව් ඉවානිච් අල්ලා ගෙන සිටි අතර, තරුණිය ඔහුගේ පිටට මිට මෙළවූ අත්වලින් අනිමින් වෙරි මරගාතේ කෑ ගසන්නට වූවාය.

"මාව අතහැරපියව්!"

ස්මූරි සෙර්ගේයිගෙන් සහ මක්සීම්ගෙන් මා මුදා ගත්තේය. ඔවුන් දෙදෙනාගේ කෙස්වැටියෙන් අල්ලා ගත් ස්මූරි ඔවුන්ගේ ඔළු එකට හැප්පවීය. පසුව ඔවුන් තල්ලු කළ විට දෙදෙනාම බිම පතිත වූහ.

"ආසියානුවා!" යැයි ඔහු යාකොව් දෙස බලා ගෙරෑවීය. අනතුරුව ඔහුගේ මුහුණට වැදෙන - නොවැදෙන තරමට තදින් දොර වසා මා තල්ලු කැරමින් සැර කළේය.

"පලයන් යන්ට!"

මම නැවේ අවරයට දිව ගියෙමි. රාත්‍රිය වලා සහිත විය. නදිය කළු පැහැතිය. මම එතැන දිය පාර දෙබෑ වී අනතුරුව සටහන් නොතබා අතුරුදහන් වන සැටි බලා සිටියෙමි. පාරු - බත්තල ඉදිරියට ඇදෙයි. ගං ඉවුරු දෙපැත්තේ තැනින් තැන රතුවන් ලප වැනි පහන්ය. ඒවා බලාපොරොත්තු රහිත වංගුවල දී අතුරුදහන් වෙයි. ඒවා නොපෙනී ගිය පසු කළුවර තවත් වැඩි වී ඒ සමඟම හිත් අමනාපයද වැඩි වෙයි.

ස්මූරි කෝකි තැන විත් මා අසලින් වාඩි වී බැරෑරුම් ලෙස හුස්ම ගෙන සිගරැට්ටුවක් උරන්නට විය.

"අරුන් දෙන්නා නුඹව අර ගෑනි ළඟට ඇදගෙන ගියා නේද? නීචයෝ! උන් ඇයට බලහත්කාරකම් කරන්න ගිය හැටි මට ඇහුණා...."

"ඔබ ඒ තරුණියව ඔවුන්ගෙන් බේරා ගත්තද?"

"ඒකිවද?" එසේ ප්‍රශ්න කළ ඔහු ගොරහැඩි ලෙස ඒ තරුණියට බැණ වැදී බැරැඩ් හඬින් කතා කළේය. " මෙතැන ඉන්න හැම එකාම නීචයෝ, මේ නැව ගමකටත් වඩා අන්තයි. නුඹ ගමක ජීවත් වෙලා තියෙනවද?"

"නැහැ"

"ගම එහෙම පිටින්ම දුප්පත්. ශීත කාලෙදි බොහොම නරකයි...."

සිගරැට් කොටය ගඟට වීසිකොට ඔහු තරමක් වේලා නිහඬව සිට යළිත් කතා කරන්නට විය.

"නුඹ මේ උෆරු කොටුවේ නැත්තටම නැති වේවි. පැටියෝ, නුඹ හින්දා මට කනගාටුයි. හැමදෙනා නිසාත් මට දුකයි. සමහර වේලාවට මම දන්නෙ නැහැ මොනවා කරන්න ඕනද කියල. උන් ඉස්සරහපිට දණගහලා ඉල්ලා හිටින්න සිතෙනවා. බැල්ලිගෙ පුතුනි, තොපි මොනවා කරනවද? ආ? තොපි පොට්ටයොද? ඔටුවනි..."

නැව ඇදෙමින් හඬ නැඟීය. කඹය වතුරට හැප්පෙන ශබ්දය ඇසිණි. තොටුපළ තිබෙන තැන පෙන්වන ලැන්තෑරුමේ පහන් සිළුව නැටිණි. තොටුපළේ තවත් පහන් ආලෝකය පෙනෙන්නට විය.

"බේබදු තොටුපළ, බේබදු ගඟක්ද තියෙනවා. අවි භාර සෙබළෙක් හිටියා එයාගේ වාසගම පින්කොච්,[1] හමුදාවේ ලියන්නෙක් හිටියා එයාගෙ වාසගම සපිවෝහින්.[2]" කෝකියා එසේ දෙඩෙවීය. "මම ගං ඉවුරට යනවා."

කාමා පෙදෙසේ ශක්තිමත් ගැහැනුන් සහ තරුණියන් මැසිවල තබා ගං ඉවුරේ සිට දර පටවා ගෙන යන සැටි පෙනිණි. දර සහ දැව දඬුවල බර නිසා ඔවුන්ගේ පිටි කොන්ද යම්තමින් නැමුණද, ඔවුන් දෙදෙනා බැගින් මැසි ඔසවා ගෙන ගමන් ගත්තේ නටන ලතා විලාසයකිනි. මෙලෙස දෙදෙනා බැගින් විත් නැවේ ඉන්ධන බක්කියට දැව දඬු විසි කරමින් හඬ නඟා කෑ ගැසූහ.

"තරුෂ්ෂා!"

"දෑතින් දර මැස්ස ඔසවාගෙන එන ගැහැනුන්ගේ

1. පින්කොච් - බේබදුරාල - අනුවාදක
2. සපිවෝහින් - මත්පැන් ගුඩ්ඩා - අනුවාදක

තනයක්, නැතිනම් නිතඹය අල්ලා ගන්නා නාවිකයෝ එය මිරිකමින් ආස්වාදයක් ලැබූහ. ගැහැනු කෑගසමින් ඔවුනට කෙළ ගැසූහ. දැව දඬු සිස් කොට ආපසු එන ගැහැනුන් ඇල්ලීමට නාවිකයන් ඉදිරිපත් වුවොත්, ඔවුහු අතැති මැස්සෙන් නාවිකයන්ට පහර දෙමින් ආරක්ෂා වූහ. මම මෙය කීප වාරයක්ම දැක ඇත්තෙමි. හැම තොටුපළකම නැවට දැව දඬු සහ දර පටවන ගැහැනුන්ට එකම ආකාරයකට සලකන ලදී.

මම මහල්ලකු බවත්, මේ නැවේ වසර බොහෝ ගණනක් ජීවත් වූ බවත්, නැවේ හෙට, තවත් සති කීපයකින් නැතිනම් සරත් සමයේ හෝ ලබන වසරේ හෝ සිදුවන්නේ මොනවාද යන්න ගැනත් හොඳින් දනිමියි මට සිතිණි.

දැන් එළිය වැටෙන්නට පටන් ගෙන ඇත. තොටුපළ අසල බෑවුමෙහි විශාල සොස්නා ගස් සහිත වනයෙකි. කන්දට සහ වනයට ගමන් කළ ගැහැනු සිනාසෙමින් ගීත ගැයූහ. ඔවුන් අතැති දිගැති මැසි නිසා ඔවුන් සෙබළුනට සමාන බවක් දැරීය.

මට ඇඬීමට සිත්විය. සිත පුරා දුකක් ඇති වූ අතර, හදවත උතුරා නටන සැටියක් දැනුණේ දැඩි දුකක් නිසාය.

එහෙත්, මම ඇඬීමට ලැජ්ජා වූ නිසා ඩෙක් තට්ටුව සෝදමින් සිටි බ්ලැහින්ට උදව් වීමට ඉදිරිපත් වුණෙමි.

බ්ලැහින් කැපී නොපොනෙන නාවිකයෙකි. ඔහු කැපී නොපෙනෙන පැහැදිලි බවකින් තොර හිමිජ්ජෙකි. ඔහු නිතර මුලුගැහී ඔහුගේ දීප්තිමත් දෙනෙතින්, එම මුලුවල සිට බලයි.

"ඇත්ත කියනවානම් මගේ නියම නම නැතිනම් මට මේගොල්ල දමලා තියෙන නම බ්ලැහින් (තහඩුව) නොවේ, බ්ලැහින් (වේසිගේ පුතා) ය. ඔන්න නුඹට මම කියන්නම් මගේ අම්මා නරක ජීවිතයක් ගත කළා. මගේ අක්කාත් අම්මා වගේමයි. ඒ දෙදෙනාගේම ඉරණම එහෙමයි. පොඩි මල්ලී, ඉරණම හරියට නැංගුරමක් වගේ. නුඹ යන්නද, පොඩ්ඩකට නැවතියන්...."

ඩෙක් තට්ටුව බුරුසුවෙන් මදිමින් ඔහු පහත් හඬින් කතා කළේය.

"ගෑනුන්ට මුන් කරන දේ දැකලා තියෙනවද? ඔන්න ඔහොමයි අමු දරුවල බොහෝ වේලාවක් ගිනි තැබුවොත්, ඒකත් ඇවිළේවි. ගෑනුන්ට අපහාස කරන වැඩවලට මම කැමති නැහැ. මම ගෑනියෙක් වෙලා හිටියානම් ගඟට පැනලා මැරෙනවා. ජේසු ක්‍රිස්තු පල්ල, සහතික ඇත්ත!" කාටවත් නිදහසක් නැහැ. ඒ මදිවට අපහාස කරනවා. කප්පාදු කරපු එවුන් මෝඩයන් නොවෙයි. නුඹ ඔවුන් ගැන අහලා තියෙනවද? බොහොම නුවණ ඇති මිනිස්සු වගයක්. ඒ ගොල්ලන්ගේ නිගමනය බොහොම නිවැරැදියි. නොවැදගත් දේ කපා දමා පවිත්‍ර ලෙස දෙවියන් වැඳීම..."

ඩෙක් තට්ටුවේ වතුර වළවල් අතරින් කපිතාන්ගේ බිරින්දෑ ගමන් කළාය. අප ළඟින් ගිය ඇය සාය තරමක් උස්සා ගත්තේ, ඩෙක් තට්ටුවේ වතුර ඇති නිසාය. ඈ උසය, හීන්දැරිය. ඇගේ මුහුණ කොතරම් චාම්ද, පැහැදිලිද, ඇය පසුපසින් ගොස් ඇගෙන් මෙසේ ඉල්ලා සිටීමට මගේ මුළු සිත අණ කරයි.

"අනේ කරුණාකරලා මොනවා හරි කියන්න. කියන්න !"

නැව තොටුපළින් සෙමින් ඈත් විය. බ්ලැහින් නාවිකයා කුරුසියේ ලකුණ ඇඳ ගනිමින් මෙසේ පැවසීය:

"ගමන් පටන් ගත්තා !"

VI

සරාපුල්හිදී මක්සීම් නැවෙන් බැස ගියේ කිසිවකුගෙන් සමු ගනිමින් නොවේ. ඔහු නිහඬව, බැරෑරුම් ලෙසින් හා සන්සුන් ලෙසින් පිට විය. ඔහු පසු පසින් සිනා පාමින් මැදි වියේ ගැහැනියද, පොඩිවුණු ඇඳුම් සහ ඉදිමුණ දෙනෙත් සහිත තරුණියද ගියහ. සෙර්ගේයි නැවේ කපිතාන්ගේ දොර අසල බොහෝ වේලාවක් දණින් සිට, දොරෙහි රාමුව සිප ගනිමින් නළල බිම ගසා ගනිමින් කන්නලව් කරන්නට විය.

"කපිතාන් තුමනි, මට සමාවන්න ! වරද මා අත නොවේ වරදකරු මක්සීම්...."

ඔහු බොරු කියන බව නාවිකයෝද, 'බුපේ' අවන්හලේ සේවකයෝද පමණක් නොව, සමහර මඟියෝද දැන සිටියහ. එසේවතුදු ඔවුහු ඔහුට ත්‍යාගශීලී ලෙස උපදෙස් දුන්හ.

"ඉල්ලා හිටපිය ! නුඹට සමාව දේවි !"

කපිතාන් ඔහු එළවා දැමූ අතර, වරක් ඔහු පයින් තල්ලු කර දැමීය. සෙර්ගේයි එවිට බිම පෙරළිණි. කෙසේවතුදු, ඔහුට සමාව ලැබිණි. සැණෙකින්ම සෙර්ගේයි තේ වීදුරු සහිත බන්දේසි ඩෙක් තට්ටුවේ මඟීන් වෙත ගෙන යමින් බල්ලකු මෙන් සානුකම්පිත ලෙස මිනිසුන් දෙස බලන්නට පටන් ගත්තේය.

මක්සීම් වෙනුවට ව්‍යාත්කාහි සෙබළ පුංචකු වැඩට ගත්තේය. ඔහු කෙට්ටුය, ඔහුගේ හිස ප්‍රමාණයට වඩා කුඩාය. දෙනෙත් රත් පැහැතිය. කෝකියාගේ දෙවෙනියා කුකුළන්ගේ බෙලි කපා මසට පිළියෙල කරන ලෙස ඔහුට අණ කළේය. සෙබළ පුංචා කුකුළන් දෙදෙනකුගේ බෙලි කැපීමට සමත් වූ නමුදු, ඉතිරි කුකුළන් ඇල්ලීමට පටන් ගත්හ. එයින් ඇති වූ කලබැගෑනිය නිසා කුකුළෝ තුන්දෙනෙක් ගඟට වැටුණෝය. එවිට සෙබළ පුංචා කුස්සිය අසල දර ගොඩ මත වාඩි වී කටුක ලෙස අඬන්නට විය.

"ඇයි මිනිහෝ, නුඹ මෝඩයෙක්ද?" මවිතයට පත් ස්මූරි ඔහුගෙන් ඇසුවේය. "සෙබළුන් අඬනවද?"

"මම ආවතේව හමුදාවේ මිස යුද්ධ හමුදාවේ සේවය කළේ නැහැ." යි ඔහු සෙමින් පැවසීය.

එය ඔහුට විනාශය ළඟා කළාක් මෙනි. අඩ පැයක් ගතවත්ම, ඩෙක් තට්ටුවේ සිටි මඟීහු සිනාවට ලක් කරමින්, ඔහු ඉදිරිපිටට විත්, ඔහු දෙස ඇස් මහත් කරගෙන බලා අසන්නට වූහ.

"මේකාද?"

ඔහු අවඥාවට ලක් කරන අමන හිනාවෙකින් ඔවුහු හති වැටෙන තුරු සිනාසෙන්නට වූහ.

සෙබළා මුලදී මිනිසුන් දුටුවේවත්, ඔවුන්ගේ කතාවලට සවන් දුන්නේවත් නැහැ. ඔහු හැඳ සිටි පරණ කපු කමිසයෙන් කඳුළු පිසදා ගත් විට ඔහුගේ දුක්බර දෙනෙත්

අතුරුදහන් වූවාක් මෙනි. එහෙත්, වැඩි වේලා යන්නට පෙර ඔහුගේ රතුවන් නෙත් ගිනි පුලිඟු මෙන් දිලිසෙන්නට වූයේ කෝපය ඇවිස්සුණු නිසාය. ව්‍යාත්කා පෙදෙසේ බස් වහර අනුව ඔහු ඉක්මනින් කතා කරන්නට විය.

"තොපේ ඇස්ගෙඩි මා දිහාවට හැරවිලා තියෙන්නෙ මොකද? අපොයි, ඔව් තොපි හැදිගෑවිලා යන්න ඕන...."

ඔහුගේ බැණ වැදීම නිසා මඟීහු තවත් ප්‍රීතියට පත්වූහ. එකෙක් ඔහුට ඇඟිල්ලෙන් ඇන්න අතර, තවත් එකෙක් ඔහුගේ කමිසයෙන් ඇද්දේය. තෙවැන්නා ඔහුගේ ඒප්රනයෙන් ඇද්දේය. මෝඩ එළුවකුට මෙන් ඔහුට විහිළු කරන්නට වූ අතර, එය දහවල් ආහාරය තෙක් නොකඩවා පැවැතිණි. දිවා ආහාරයෙන් ඉක්බිතිව කවුදෝ කෙනෙක් ලී හැන්දකට දෙහි ලෙල්ලක් අමුණා එය සෙබළාගේ ඒප්රනයේ පිටුපස කොටසේ එල්ලීය. සෙබළා ගමන් කරන විට ඔහුගේ පිටුපසින් හැන්ද සහ දෙහි ලෙල්ල වැනෙයි. මිනිස්සු එය බලා සිනාසෙති. මිනිසුන්ගේ නරුම සිනාවට හේතු නොදන්නා ඔහු මීයකු මෙන් කලබල වෙයි.

ස්මූරි ඔහු දෙස පිරික්සුම් බැලුම් හෙළන්නේ නිහඬවය. ඔහුගේ බැරෑරුම් මුහුණ ගැහැනියකගේ මෙනි.

සෙබළා නිසා මසිතෙහි අනුකම්පාවක් ඇති විණි.

"එයාට හැන්ද ගැන කියන්නද?" මම කෝකියාගෙන් විමැසුවෙමි.

ඔහු නිහඬව අනුමත කරමින් හිස වැනීය.

මිනිසුන් හිනා වෙන්නේ ඔහුගේ ඒප්රනයෙහි හැන්දක් බැඳ තිබෙන බැවිනැයි මා කී විට, සෙබළා වහාම අත ගා හැන්ද සොයා ගෙන එය ගලවා බිම දමා පෑගීය. අනතුරුව මා වෙත කඩා පැන දැතින් මගේ කෙස්වැටියෙන් අල්ලා ගත්තේය. සැණෙකින් අපි දෙදෙනා පොර කා ගන්නට වීමු. ඩෙක් තට්ටුවේ සිටි මඟියෝ අති මහත් සතුටකින් අප වට කරගත්හ.

ස්මූරි මඟීන් තල්ලු කොට අප දෙදෙනා දෙපැත්තට ඇද දමා මගේ කන මිරිකා දමා, සෙබළාගේ කනින් අල්ලා ගත්තේය. කුඩා සෙබළා කෝකියාගේ අත යටට වී, හිස සලමින් කැරකැවෙන සැටි දුටු නැවේ මඟීහු මහත් වූ

සතුටෙකින් කෑගසමින්, උරුවම් බාමින්, පොළොවේ අඩි හප්පමින්, වැනි, වැනී සිනාසෙන්නට වූහ.

"සෙබළ පැංචාට ජයවේවා! ඔළුවෙන් ඇනපිය කෝකියාගේ තඩි බඩට!"

මඟීන්ගේ මේ තිරිසන් ප්‍රීතිය නිසා ඔවුනට පහර දීමටත්, ඔවුන්ගේ කිලිටි ඔළුගෙඩිවලට දර කොටයෙකින් ගැසීමටත් මට විශාල අභිලාෂයක් ඇති විය.

ස්මූරි සෙබළාගේ කන මුදාහැර දෑත පිටිතලහා කොට බැඳගෙන, උඩු රැවුළ නටවමින්, විරිත්තමින් කොටියකු සේ මඟීන් ඉදිරියට ගියේය.

"නුඹලාගේ ස්ථානවලට පලයල්ලා! ආසියානුවෝ!"

සෙබළා යළිත් වරක් මා වෙත කඩා පැන්නේය. එවිට ස්මූරි සෙබළා එක් අතකින් අල්ලා ඔසවාගෙන, වතුර පොම්පය ළඟට ගෙන ගොස්, ඔහුගේ හිසට වතුර වත්කරමින් ඔහුගේ දුබල ශරීරය හරවන්නට වූයේ, ඔහු මිනිසකු නොව, රෙදි බෝනික්කකු හැටියට සලකමිනි.

නාවිකයෝද, බෝට්ස්මන්ද, උප කපිතාන් තැනද දිව ආවෝය. 'බුපේ' අවන්හල්කරුවා අන් අයට වඩා උසට සිට ගෙන සිටියද, හැමදාම ගොළුවකු මෙන් නිහඬව උන්නේය. මඟීහු යළිත් වරක් එක් රැස්වූහ.

සෙබළා කුස්සිය අසල වූ දරගොඩ මත වාඩි වී, පාවහන් ගලවා මේස් ඉවත් කොට ඒවා මිරිකා දමන්නට වුවද, ඒවා වතුරට නොතෙමී තිබිණි. ඔහුගේ සිහින් හිසකේවලින් දිය බිංදු ගලන්නට විය. මෙය මඟීන්ගේ සිනාව යළි පණ ගැන්වීමට හේතුවක් වූයේය.

"කොහොම වුණත් එකයි!" යැයි සෙබළා කෑ ගැසුවේ යටි ගිරියෙනි. "කොල්ලාව මම මරා දමනවා!"

ස්මූරි මගේ උරහිසින් අල්ලා ගෙන උප කපිතාන්වරයාට යමක් කී විට, නාවිකයෝ මඟීන් එළවා දැමූහ. මිනිසුන් ගිය පසු කෝකියා සෙබළාගෙන් ඇසුවේය.

"නුඹට කරන්න ඕන මොනවද?"

සෙබළා නිහඬව මා දෙස නපුරු බැල්මක් හෙළමින්, කෝපයෙන් වෙවුලන්නට විය.

"සීරුවෙන් සිටපන්, ගිරිය පුප්පන්නා!" යැයි ස්මූරි ඔහුට අණ කළේය.

"ඒ කෙළි මඟදී. මේ යුද්ධ හමුදාව නොවෙයි." සෙබළා පිළිතුරු දුන්නේය.

කෝකියා කලබල වූ සැටි මම දුටුවෙමි. පිම්බුණු ඔහුගේ කොපුල් පහතට වැටිණි. ඔහු බිමට කෙළ ගසා මාත් ඇදගෙන ඉවත ගියේය. අන්දමන්ද වූ මම ඔහු පසුපසින් ගමන් කරමින් සෙබළා දෙස බලන්නට වීමි.

"මදෑ හරිම නරිපැටියකු නෙව ආ? හිටපන් නුඹට..."

හණිකට අප වෙත පැමිණි සෙර්ගේයි මුමුනමින් කතා කරන්නට විය.

"සෙබළා සිය පණ හානි කරගන්න යනවා!"

"ඌ කොහෙද?" එසේ ප්‍රශ්න කරන ගමන්ම ස්මූරි දිව්වේය.

සේවකයන්ගේ කාමරයේ දොර අසල සිටි සෙබළාගේ අත පිහියක්ද තිබිණි. එම පිහියෙන් කුකුළන්ගේ බෙලි කැපීමද, ළිපට දමන දර කැපීම නැතිනම් පැළීමද කරයි. එය මොට්ට පිහියක් වූ අතර, තැනින් තැන එය කඩ තොලු වීම නිසා කියතකට සමාන විය. තෙම්බිච හිසක් සහිත මේ හාස්‍යජනක කුඩා මිනිහා දෙස බලමින්, සේවකයන්ගේ කාමරය ඉදිරිපිට මඟීහු රැස්ව සිටියහ. පෙතැලි නාසය සහිත ඔහුගේ මුහුණ වෙවුලන්නට විය. විඩාපත් කට හැරී තිබුණු දෙතොල් සැලිණි. ඔහු නහයෙන් අඬන්නට විය.

"වධකයෝ... වධකාරයෝ..."

මම යමකට නැඟී රැස්වූවන්ගේ මුහුණු දෙස බැලීමි. මිනිස්සු මඳ සිනා පාමින්, 'හිකි-හිකි' ගාමින් එකිනෙකා අමතා ගත්හ.

"බලාපල්ලා, ආං බලාපන්..."

සෙබළා ඔහුගේ කුඩා වියළි අතින් කලිසමින් දොට්ට පැන තිබුණු කමිසය හරිගස්සා ගත් විට, මා අසල සිටි මිනිහෙක් හුස්ම ඉහළට ඇද ගනිමින් ඇනුම් පදයක් එල්ල කළේය.

"මැරෙන්න ලෑස්ති වුණාට කමිසය හරි ගස්වා ගන්නට ඉදිරිපත් වෙලා...."

එවිට රැස්ව සිටියහු වඩාත් හයියෙන් කෑගසන්නට වූහ. මාත් ඇතුළු රැස්ව සිටියවුන් සෙබළා සිය පණ හානි කර

ගනිතියි විශ්වාස නොකරන බව පැහැදිලිය. ස්මූරි හණික ඔහු දෙස බලා, ඔහුගේ බඩ ගෙඩියෙන් මිනිසුන් තල්ලු කරමින් ඉදිරියට විත්, කෑගැසීය.

"අහකට පල, මෝඩයා!"

ඔහු මෝඩයා යැයි කියන්නේ මෝඩයන් බොහෝ ගණනකටය. රැස්ව සිටියවුන් ඉදිරියට විත් ඔහු යළිත් කෑ ගසයි.

"තොපට අයිති තැනට යනු, මෝඩයා!"

ඔහුගේ එම කතාව හාස්‍යජනක වුවද එය සත්‍යයකි. අද උදේ සිට සියලු මිනිසුන් එකම එක මෝඩයකු මෙනි.

රැස්ව සිටියවුන් පන්නා දැමූ ස්මූරී සෙබළා වෙත අතක් දිගු කොට කතා කළේය.

"පිහිය මෙහෙ දීපන්..."

"කොහොම වුණත් එකයි." කියමින් සෙබළා පිහියේ තුඩ ස්මූරි වෙතට දිගු කළේය. අනතුරුව ඔහු පිහිය මට භාරදී සෙබළාට මෙසේ කීවේය:

"ගිහිල්ලා නිදා ගනින්! නුඹේ වැඩවල තේරුම කුමක්ද?, ආ?"

සෙබළා නිහඬව ඇඳෙහි වාඩි විය.

"මොහු නුඹට කෑම ගෙනේවි, වොඩ්කාත් ගෙනේවි. නුඹ බොනවද?"

"ඔව් පොඩ්ඩක් බොනවා..."

"නුඹ බලාගනින්. මොහුට අත තියන්න එපා, නුඹගේ ඒප්රනයට හැන්දක් බැන්දේ මොහු නොවෙයි. තේරුණාද? ඔහු නොවෙයි...."

"මට වධ දෙන්නෙ මක් නිසාද?" සෙබළා සෙමින් ඇසුවේය.

ස්මූරි තරමක් කල්පනා කොට බැරෑරුම් ලෙස පිළිතුරු දුන්නේය.

"ඉතින් මම කොහොමද ඒ ගැන දන්නෙ?"

ස්මූරි මාත් සමඟ කුස්සියට යමින් මුමුනන්ට විය.

'හ්ම්.... ඇත්තටම, ඒ දුප්පතාට උන් වධ දෙනවා. පේනවා නේද? ඔන්න ඔහොමයි. මිනිසුන්ට පුළුවනි ඕනෑම කෙනෙකුව පිස්සකු කරවන්ට.... උකුණෝ වගේ ඇඟේ එල්ලුණාම, වැඩේ ඉවරයි. උකුණා මොකාද?

මිනිහා ඊටත් වැඩිය නපුරුයි...."

මම සෙබළාට පාන් මස් සහ වොඩ්කා ගෙනැවිත් දුන්නෙමි. ඔහු ඇඳෙහි වාඩිවී ඉස්සරහට හා පස්සට වැනෙමින් අඬන්නට විය. මම කෑම පිඟාන කනප්පුව මත තබා ඔහුට කතා කළෙමි.

"මේ කෑම කාපන්..."

"දොර වහපන්..." යැයි හේ පැවසීය.

"එතකොට කළුවරයි."

"වහපන්, නැතිනම් උන් ආයෙමත් රිංගන්න පටන් ගනීවි."

මම පිටවී ගියෙමි. සෙබළා මට ප්‍රිය නොවීය. ඔහු නිසා මසිතෙහි අනුකම්පාවක් උපන්නේ නැත. එනිසා මගේ හදවත නොසන්සුන් විය. මන්දයත්, ආච්චි මට බොහෝ වාරයක් මෙසේ උපදෙස් දී තිබුණු බැවිනි.

"මිනිසුන්ට අනුකම්පා කරන්න ඕන. ඔවුන් අවාසනාවන්තයි. හැම දෙනාටම අමාරුයි...."

"කෑම ගෙනිච්චද? මිනිහා කරන්නෙ මොනවද?" කෝකියා ඇසීය.

"අඬනවා"

"අපොයි හරිම චපලයෙක්. ඒකා මොන සෙබළෙක්ද?"

"මට නම් ඔහු ගැන අනුකම්පාවක් නැහැ." යි මම කිව්වෙමි.

"ඇයි? මොන හේතුවක් නිසාද?"

"මිනිසුන්ට අනුකම්පා කරන්න ඕන නෙව...."

ස්මූරි මගේ අතින් අල්ලා ඔහු වෙතට ඇදගෙන, වශීකරනසුලු හඬකින් මෙසේ කිව්වේය.

"බලහත්කාරයෙන් අනුකම්පා කරන්න බැහැ. ඒ වුණාට බොරු කියන්න එපා. තේරුණාද? නුඹ දියාරු වෙන්න එපා. ඒ අතර තමාගේ හැටි දැනගන්න ඕන..."

මා ඉවතට තල්ලු කරමින් ඔහු මෙසේත් එකතු කළේය:

"නුඹට මෙතන සුදුසු තැනක් නොවෙයි. ඉඳා දුමක් ඇදපන්..."

මම ඉමහත් ලෙස නොසන්සුන් වූයෙමි. මඟීන්ගේ හැසිරීම නිසා ඉමහත් කලකිරීමට පත් වූයෙමි. ඔවුන් සෙබළා අවඥාවට ලක් කළ සැටි දුටු මගේ සිත විස්තර

නොකළ හැකි සේ අමනාපයට සහ පැරීමට හසුවිය. ස්මූරි සෙබළාගේ කනින් අල්ලා ගත් විට මිනිස්සු ඉමහත් ලෙස ප්‍රීතියට පත්වූහ. එතරම් කනගාටුදායක දෙයක් ඔවුන්ගේ සිත් ගත්තේ කෙසේද? මෙය සිනහ ඉපැදවීමට සහ ප්‍රීතියක් ඇති කිරීමට හේතුවක් වූයේ කෙසේද?

ඔන්න දැන් ඔවුන් කුඩාරම යට වාඩිවී, බොමින්, කමින්, කාඩ් සෙල්ලම් කරමින්, බැරෑරුම් ලෙස කතාබහ කරමින්, ගඟ දෙස බලා සිටින්නේ මීට පැයකට පෙර උරුවම්බාමින්, සෙබළා අවඥාවට ලක් කරමින් ගාලගෝට්ටියක් ඇති කළේ ඔවුන් නොවෙතියි අඟවමිනි. ඔවුන් හැමදාම මෙන් අදත් නිහඬය. කම්මැළිය. ඔවුන් උදේ සිට රෑ වන තුරු නැවේ අතන මෙතන රස්තියාදු වන්නේ හරියට මැස්සන් මෙනි. නැතිනම් හිරුරැස්වලට හසු වී පාවෙන දූලි මෙනි. සමහර මඟීහු කුරුසියේ ලකුණ ඇඳගෙන නැවෙන් පිටවී, තොටුපළට යති. එතැන් සිට වට්ටි පෙට්ටි කර ගහගත් මිනිස්සු පිටිකොන්ද දෙකට නමාගෙන නැවට ගොඩ වෙති. මොවුන් දෙගොල්ලම එක හා සමාන ලෙස ඇඳ පැලඳගෙන සිටිති.

නිතර, නිතර මඟීන් වෙනස් වුණද නැවේ ජීවිතය වෙනස් නොවෙයි. අලුත් මඟීහුද පැරණි මඟීන් මෙන්ම, ලෝකය ගැනත්, රස්සාව ගැනත්, දෙවියන් ගැනත්, ගැහැනුන් ගැනත් පැරණි මඟීන් කතා කළ තාලයටම එම වචනම භාවිත කරමින් කතා කරනු ඇත්තාහ.

"ඉවසන්ටයි කියල දෙවියන් වහන්සේ නියම කරලා තියෙනවා. ඉතින් මිනිහා ඉවසන්න ඕන! වෙන කළ හැකි දෙයක් නැහැ. ඒක තමයි අපේ ඉරණම..."

මේ වචන ඇසෙනවිට පාළු ගතියක් ඇති වන අතර, සිතේ කිපීමක්ද ඇති වේ. කැත කුණු ඉවසා සිටීමට මට නොහැකිය. මා කෙරෙහි නපුරු, අසාධාරණ සහ සිත් කලකිරවන ආකල්පයක් දැක්වීමද මට රිසි නොවේ. සෙබළා එවැන්නකට සුදුස්සෙකු නොවේ. සමහර විට ඔහු හාස්‍යජනක පුද්ගලයකු වීමට කැමැති ඇති.

බැරෑරුම් එමෙන්ම, දයාවන්ත තරුණයකු වන මක්සීම් නැවෙන් පන්නා දමා, නීචයකු වන සෙර්ගේයි නවත්වා ගත්තේය. එය එසේ විය යුතු නොවේ. මිනිහකු අවඥාවට

සහ සරදමට ලක් කොට, ඔහු පිස්සකු කිරීමට තරම් හැකියාවක් ඇති මේ මඟීන් නාවිකයන් ගේ කෝපාන්විත කෑගැසීම්වලට යටත් වන්නේ මන්ද, බැණවැදීම්වලට යටත් ලෙස සවන් දෙන්නේ මන්ද?

"නැවේ පැත්තකට රොක්වෙලා ඉන්නේ මන්ද?" බෙට්ස්මන් ඔහුගේ ලස්සන එනමුදු කෝපාන්විත නෙත් හකුළුවාගෙන කෑගසයි. "නැව එක පැත්තකට බරවෙලා විසිර පලයල්ලා යක්ෂයිනි!"

එවිට යක්කු එක් පැත්තක සිට නැවේ අනික් පැත්තට යති. එහෙත්, ඔවුන් එතැනින්ද එළවා දමති. හරියට බැටළු රැළක් මෙනි.

"ශාපලත් මිනිස්සු...."

දිවා කාලයේ හිරු රැස් නිසා රත්වන යකඩ පියස්ස සහිත කුඩාරම යට රෑට වුවද, දැඩි උණුසුම් ගතිය පහ වී නොයයි. මඟීහු කැරපොත්තන් සේ ඩෙක් තට්ටුව හැම තැනම විසිර යති. හැම තැනම වැතිර නිදා ගනිති. තොටුපළකට නැව ළංවත්ම නාවිකයෝ නිදා සිටින්නන්ගේ පස්සා පැත්තට පා පහර දෙමින් ඔවුන් අවදි කරවති.

"ඒයි මොකද පාර මැද නිදාගෙන ඉන්නේ පලයන් අහකට!"

ඔවුහු නැඟිට නිදිමතින්ම අණ කළ තැනට කීකරුව යති.

නාවිකයන්ද අනිකුත් මිනිසුන් මෙනි. එහෙත්, ඔවුහු පොලිස්භටයන් මෙන් අණ කරති.

නිහඬ, නියාලු, දුක්මුසු ලෙස යටත් මිනිසුන් තුළ අන් හැමටම පෙර පුදුමාකාර ලෙසත්, බියජනක ලෙසත් පැන නගින එක් ගුණයක් ඇත. එනම් යටත්වීමේ ලක්ෂණය නමැති ඒ පිට පොත්ත බිඳගෙන නපුරු, තේරුම් විරහිත, නිතර පාහේ ප්‍රීතිය රහිත මුරණ්ඩු ගතියක් මතුවීමය. මඟීන් කොහේ යති දැයි ඔවුන්ම නොදන්නා බව මගේ හැඟීමය. කිනම් තොටුපළේදී ඔවුන් එළියට දැම්මත් ඔවුනට කමක් නැත. ඔවුන් කොහේ ගොඩ බැස්සුවත් ඔවුන් ඉවුරට ගොස් එහි ටික වේලාවක් නැවතී සිට යළිත් මේ නැවට නැතිනම් වෙනත් නැවකට නැඟී කොහේ

නමුත් යනු ඇතැයි මට සිතේ. ඔවුන් වල්මත්වූ නෑ මිතුරන් නැති මිනිස් කොටසකි. මුළු මහත් මිහිතලයම ඔවුන්ට පිටත්තර දෙයකි. ඔවුන්ගේ බියගුලු ගතිය ඉහ වහා ගොසිනි.

දවසක් දා මහ රෑ නැවේ යන්ත්‍රයකින් හඬක් පිට වූයේ කාලතුවක්කුවකින් වෙඩි තැබූ විටෙක මෙනි. ඩෙක් තට්ටුව පීරා සුදු පැහැති දුම් වලාය. එම දුම් මැෂින් කාමරයෙන් පිටතට ආවේය. නොපෙනෙන කෙනෙක් දෙකන් බිහිරි කරවමින් කෑගැසීය.

"ගව්රිල, සුරික්, වොයිලොක්..."

මම මැෂින් කාමරය හෙවත් යන්ත්‍රාගාරය අසල තිබූ මේසය මත නිදාගනිමි. මා පිඟන් සෝදන්නේ මෙම මේසය උඩ තබාගෙනය. විශාල ශබ්දයක් සමග කම්පනයක් ඇතිවීම නිසා මම අවදිවීමි. ඩෙක් තට්ටුවේ නිහඬතාවකි. යන්ත්‍රවලින් දුම් දමමින් වාෂ්ප පිටවිය. මිටිවලින් ගසන හඬ නිතර ඇසිණි. එහෙත්, විනාඩියක් ගතවත්ම ඩෙක් තට්ටුවේ සිටි මිනිස්සු විවිධ කටහඬින් කෑ ගසන්නටත්, කන්නලව් කරන්නටත් පටන් ගත්හ. එය බිය ජනක විය.

සුදුවන් මීදුමක් ඇතිවී ඉක්මනින් අතුරුදහන් විය. මඟියෝ ඒ මේ අත දුවමින්, එකිනෙකාගේ ඇඟේ හැප්පෙමින්, වැටෙමින්, කලබැගෑනියක් කළහ. කොණ්ඩ කඩාගත් ගැහැනු, ඇඳුම් පොඩි කරගත් පිරිමි බියගත් සිතින් බලමින්, තමන් සතු වට්ටි, පෙට්ටි එක් මුල්ලක සිට තවත් මුල්ලකට ඇදගෙන ගියහ. එකිනෙකාගේ ඇඟේ හැප්පෙමින් බිම වැටුණහ. දෙවියන්ගෙන් පිහිට ඉල්ලා සිටියහ. නිකොලායි මුනිවරයාට යාච්ඤා කළහ. එකිනෙකාට පහර දී ගත්හ. මේවා සියල්ල දෙස බැලීම බියජනක නමුදු, ඒ අතරම සිත් ගන්නාසුලු දෙයක් විය. මම මිනිසුන් පසුපසින් දුවමින් ඔවුහු කුමක් කරතිද? යන්න බැලීමි.

රාත්‍රී කාලයේ අනතුරු ඇඟවීමක් මා දුටු ප්‍රථම වතාව එය විය. මිනිසුන් ඔවුන්ගේ වැරැද්ද නිසා එබන්දක් ඇති කළ සැටි මට එකවරම අවබෝධ විය. නැව තම ගමන් වේගය අඩු නොකළේය. නැවට දකුණු පැත්තෙන් ඉතා

ළංව, වියළි තණ කපන්නන් ඇති කර තිබෙන ගිනිමැල දක්නට ඇත. එදින පුරා හඳ ඇති දවසක් වූයෙන් සඳ රැස් දසත විහිදී තිබිණි.

ඩෙක් තට්ටුවේ මඟීන්ගේ දිවීම වඩාත් වේගවත් විය. පළමුවැනි, දෙවැනි පන්තිවල ගමන් කරන මඟීන් එළියට පැමිණි අතර, එකෙක් ගඟට පැන්න විගස කීප දෙනෙක් එය අනුකරණය කළහ. ඩෙක් තට්ටුවට සවි කර තිබුණු බංකුවක් මඟීන් දෙදෙනෙකු සහ පූජකයකු විසින් පොලුවලින් ගසා කඩා බිඳ දමන ලදි. නැවේ අවරයේ තිබුණු කුකුළන් සහිත විශාල කූඩුවක් ගඟට විසි කරන ලදී. කපිතාන්ගේ ස්ථාන වෙත යන පඩිපෙළ අසල මිනිහෙක් දණින් වැටී ඔහු අසලින් දුවන අයට හිස පාත් කරමින් බෙරිහන් දෙන්නට විය.

"ක්‍රිස්තියානිකාරයෙනි, මම පවුකාරයෙක්!"

"යක්ෂයිනි, බෝට්ටුවක් දීපියව්!" යැයි කලිසමක් පමණක් ඇඳගෙන සිටි තරබාරු හාමු කෙනෙක් කෑගැසීය. ඔහු කෑ ගසන අතර, ඔහුගේ නග්න පපුවට මිටින් පහර දී ගත්තේය.

නාවිකයෝ ඩෙක් තට්ටුවේ ඒ මේ අත දුවමින් මඟීන්ගේ බෙල්ලෙන් අල්ලමින් හිසට පහර දෙමින් ඔවුන් තල්ලු කර දැමූහ. ස්මූරි බරැති ලෙස පාද තබමින් ගමන් කළේය. ඔහුගේ රාත්‍රී ඇඳුමට උඩින් ඔහු දිගැති කබායක් ඇඳ සිටියේය. බැරැඩ් හඬින් ඔහු මිනිසුන්ට කතා කළේ ඔවුනට ඒත්තු ගැන්වීමට මෙනි.

"නුඹලා ලජ්ජාවෙයල්ලා! යකා වැහිලා නටන්නේ මොකද? නැව යසට තියෙනවා නොවැ. ආන්න ගං ඉවුර. මෝඩයෝ වතුරට පැන්නා. තණකොළ කපන මිනිස්සු උන්ව අල්ලා ගත්තා. අන්න අර බෝට්ටු දෙක පේනවද?"

තුන්වැනි පන්තියේ ගමන් කරන මඟීන්ගේ ඔළුගෙඩි වලට ඔහු පහර දුන්නේ මිට මෙළවූ අත ඉහළ සිට පහළට යවමිනි. ඔවුහු නිහඬව බිම ඇද වැටුණහ.

මේ කලබලය යම්තමින් තුනීවත්ම, තල්මා මාලයක් කරේ දමාගත් නෝනා කෙනෙක් ස්මූරිගේ ඇඟට කඩා පැන්නාය. ඈ හැන්දක් ඔහුගේ නාසය ඉදිරිපිට වනන්නට වූවා. කෑ ගැසුවාය.

"නුඹට එහෙමත් කරන්න පුළුවන්ද?"

සිරුර තෙමාගත් මහත්මයෙක්. උඩු රැවුළ කටේ දමා ගෙන උරමින් නෝනාව අල්ලා ගෙන පසුතැවිල්ලකින් කතා කළේය.

"ඒ මෝඩයාව අත හැරලා දාන්න!...."

ස්මූරි දෑත් විදහාගෙන. ව්‍යාකූලව මා දෙස බලා ඉඟි මරමින් ඇසීය.

"මේකේ තේරුම මොකක්ද. ආ? ඒ ගෑනි මට කඩා පැන්නේ මොකටද? මම ඒ ගෑනිව පළමු වතාවටයි දුටුවේ!"

තවත් මිනිහෙක් නහයෙන් ලේ පෙරමින් කෑ ගැසීය.

"අම්මපා, මුන් මිනිස්සුද! පල්හොරු!"

ඒ ගිම්හාන කාලයේදී එවැනි කලබලවීම් දෙකක් මම දුටුවෙමි. ඒ දෙකම ඇති වූයේ, අනතුරුදායක තත්ත්වයකට මූණ පෑම නිසා නොවේ. අනතුරක් ඇති වෙතියි යන බිය විසිනි. තෙවැනි වාරයේදී එවැන්නක් පැන නැංගේ මඟින්, සොරුන් දෙදෙනෙකු අල්ලා ගත් බැවිනි. එක් සොරෙක් තාපසයකු මෙන් සැරසී සිටියේය. මඟියෝ නාවිකයන්ට නොපෙනෙන සේ ඔවුනට පුරා පැයක් තිස්සේ පහර දුන්හ. නාවිකයන් සොරුන් මඟින්ගෙන් වෙන් කළ විට, මඟීහු කෝපවී නාවිකයන්ට බැණ වැදුණහ.

"නුඹලත් හොරු. ඒ නිසා හොරුන්ව ආරක්ෂා කරනවා."

හොරු කොතරම් ගුටි බැට කා සිටියෝදයත්, ඔවුනට සිට ගැනීමට පවා නොහැකි විය. ඔවුන් තොටුපළකදී පොලීසියට භාර දුන්හ.

මිනිසුන් නපුරුද? නැතිනම් කරුණාවන්තද? සන්සුන්ද? නැතිනම් දඟකාරද? යන්න හරි හැටි වටහා ගැනීමට නොහැකි තරම් උණුසුම් නොසන්සුන්තාවන් බොහෝ විය. මිනිසුන් නපුරු ලෙසත්, කෑදර ලෙසත් කුරිරු වන්නේ මන්ද? අනික් අතට ඔවුන් ලජ්ජාශීලී ලෙස සන්සුන් වන්නේ මන්ද?

මම මේ ගැන ස්මූරිගෙන් ඇසුවෙමි. ඔහු දුම් ගුළි පිට කරමින් නිතර පාහේ දොම්නසින් මෙසේ පැවසීය.

"නුඹට ඒවා ගැන දැනගන්නට ඕන! මිනිසුන්ගේ හැටි ඔහොම තමයි. සමහරුන්ට නුවණ තියෙනවා. සමහරු මෝඩයෝ. නුඹ දොඩවන්නෙ නැතුව පොත් කියවාපන්. නියම පොත්වල ඔය ප්‍රශ්න සියල්ලටම පිළිතුරු තියෙනවා."

ඔහු යාච්ඤා පොත්වලට කැමති නොවිය.

"ඒ පොත් පූජකයන්ටයි, ඒ ගොල්ලන්ගේ පුත්තුන්ටයි."

ඔහුගේ සිත සතුටු කරවන යමක් කිරීමට මට සිත්විය. ඔහුට පොතක් තෑගි කිරීමට මම අදහස් කළෙමි. කසාන් නගරයේ තොටුපළේදී, මම කොපෙක් පහක් ගෙවා, 'සොබළෙක් මහා ප්‍රයෝතර් රජුගේ පණ බේරාගත් සැටි' නමැති පොත මිලදී ගත්තෙමි. එදින කෝකියා මත් පැන් බී වෙරිමත්ව කෝපයෙන් සිටියෙන් මම ඔහුට ඒ පොත තෑගි නොකර එය කියැවීමි. ඒ පොතේ හැම දෙයක්ම ලෙහෙසියෙන් තේරුම් ගත හැකිය. සිත් ඇද ගන්නාසුලුය. වාක්‍ය සරලය. කෙටිය, මගේ ගුරුවරයා ඒ පොත නිසා සතුටු වෙතියි මම සිතීමි.

එහෙත්, මා ඒ පොත ඔහුට දුන් විට, ඔහු නිහඬව එය අත්ල මත තබා ගුළියක් සේ පොඩි කොටැ ගඟට විසි කළේය.

"මෝඩයා, ඔන්න නුඹේ පොතට ගිය කල දසාව! මම නුඹට බලුපැටියකුට වගේ උගන්වනවා. නුඹ ජරාව කන්න තමයි කැමති. එහෙම නේද?" ඔහු තරහෙන් ඇසීය. හේ පයක් බිම ගසා කෑ ගැසීය.

"ඔයත් පොතක්ද? මම මෝඩකමට ඒවා සේරම කියෙව්වා. ඒකේ ලියලා තියෙන්නෙ ඇත්තද? ඉතින් කියාපන්!"

"මම දන්නෙ නැහැ."

"එහෙනම් නුඹ දන්නෙ නැහැ. මිනිහකුගේ බෙල්ල කපාපුවම, ඔහුගේ කඳ පඩිපෙළින් බිමට වැටෙනවා. එතකොට අනික් අය පිදුරු මඩුවට රිංගන්නෙ නැහැ.! සෙබළු මෝඩයෝ නොවේ. උන් පිදුරු මඩුවට ගිනි තියාවි. තේරුණාද?"

"ඔන්න ඔහොමයි. මහා ප්‍රයෝතර් රජු ගැන මම දන්නෙ, ඒ පොතේ තියෙන්නේ බොරු. පලයන් යන්න....."

කෝකියා නිවැරැදි බව මට වැටහුණද, පොත මගේ සිත් ගත් නිසා, දෙවැනි වරටද ඒ පොත මිලදී ගෙන මම කියැවීමි. සත්තකින්ම එය අසතුටුදායක ලෙස ලියා ඇති බැව් මට එවර වැටහිණි. එයින් මසිත පෑරුණෙන්, කෝකියා කෙරෙහි වඩාත් වැඩි විශ්වාසයකින් සහ සැලකිල්ලකින් මම කටයුතු කළෙමි. ඔහු කිසියම් හේතුවක් නිසා නිතර පාහේ මහත් වූ සිත් තැවුලෙකින් මෙසේ කියන්නට විය:

"නුඹට උගැන්විය යුත්තේ කොහොමද! නුඹට මේ නැව සුදුසු තැනක් නොවේ."

මෙය මට සුදුසු තැනක් නොවන බව මටද හැඟිණි. සෙර්ගේයි මට සතුරුකම් දක්වන සැටි මම දුටිමි. තේ බීමට පාවිච්චි කරන කෝප්ප, පීරිසි ආදිය මගේ මේසයෙන් සොරා ගන්නා සෙර්ගේයි. බුපේ අවන්හලේ මිනිහාට හොරෙන් මඟින්ට දෙන සැටි මා දැක ඇත. ඔහු සොරකම් කරන බව මම දැන ගතිමි. ස්මූරි නිතර නිතර මට අනතුරු හැඟවීය.

"වේටරයන්ට නුඹේ මේසෙන් කෝප්ප, පීරිසි ආදිය දෙන්න එපා. පරෙස්සම් වෙයන්!"

මේ නැවේ මගේ සිත් කලකිරවන බොහෝ දේ විය. නැව තොටුපළකට පැමිණි විගස මට පැනයාමට සිත් වූ වාර අපමණය. කැලෑවක ජීවත්වීමට මම අදහස් කළෙමි. එහෙත්, එසේ පැනයාමට එකම බාධාව වූයේ ස්මූරිය. ඔහු වඩාත් කාරුණික ලෙස මට සලකන්නට විය. නැවේ ස්ථාවර චලනය නිසා මගේ සිත ඇදිණි. නැව කිසියම් තොටුපළක නැවැත්වූ විගස දැන්, දැන් යම් කිසිවක් සිදුවෙතියි සිතූ මම කාමා ගඟේ සිට බේලයා සහ ව්‍යාත්කා ගඟ ඔස්සේ නැතිනම් වොල්ගා ගංගාව ඔස්සේ අපේ නැව යාත්‍රා කරන සැටියක් සිතින් මවා ගතිමි. එවිට මට අලුත් ජවනිකා සහ නගර දැකීමටත්, අලුත් මිනිසුන් මුණ ගැසීමටත් හැකි වනු ඇත.

එහෙත්, එවැන්නක් සිදු නොවූ අතර, මගේ නාවික ජීවිතය බලාපොරොත්තු රහිත ලෙසත්, ලජ්ජා සහගත ලෙසත් අවසන් විය. හවස අපේ නැව කසාන් සිට නිෂ්නි බලා යමින් සිටිද්දී අවන්හල අයිතිකරුවා මා ඔහු වෙත

කැඳවා, මා කාමරයට ඇතුළු වූ පසු දොර වසා, පලසකින් වැසූ කුඩා බංකුවක බැරෑරුම් ලෙස වාඩි වී සිටි ස්මූරි අමතා මෙසේ කීවේය:

"ඔන්න."

ස්මූරි ගොරහැඩි ලෙස මගෙන් ප්‍රශ්න කළේය.

"නුඹ සෙර්ගේයිට කෝප්ප, පීරිසි දෙනවද?"

"මට නොපෙනෙන්න ඔහු ඒවා ගන්නවා."

එවිට අවන්හල් අයිතිකරුවා සෙමින් මෙසේ කීවේය:

"දකින්නෙ නැහැ. නමුත් දන්නවා."

ස්මූරි ඔහුගේ දණහිසට තට්ටු කොට, අනතුරුව දණහිස කැසීය.

"පොඩ්ඩකට නවතින්න, ඒ වැඩේ කරන්න පුළුවනි." යි ඔහු අවන්හල්කරුට කීය.

ඔහු කල්පනාවක නිමග්න විය. මා අවන්හල්කරු දෙස බැලූ අතර, ඔහු මා දෙස බැලීය. ඔහුගේ ඇස් කණ්ණාඩි කුට්ටමට පසුපසින් ඇස් නැතිවාක් මෙනි.

ඔහු නිහඬව ජීවත්විය. හඬ නොනඟා ගමන් කළේය. ඔහු කතා කළේත් පහත් හඬිනි. සමහර දාට ඔහුගේ පැසුණු යටි රැවුළත්, පාට රහිත ඇස් දෙකත් මුල්ලක සිට පෙනී සැණෙකින් අතුරුදහන් වෙයි. රාත්‍රී නින්දට පෙර ඔහු අවන්හලේ දේවරූප ඉදිරියෙහි දණින් වැටී බොහෝ වේලාවක් සිටියේය. ඒ දේව රූප ඉදිරියේද කිසි දවසක නොනිමෙන පහනකි. මා ඔහු දුටුවේ දොරෙහි යතුරු සිදුරෙනි. එය කාඩ් කුට්ටමේ හාරත ආසියාට සමාන විය. එහෙත්, ඔහු යාච්ඤා කරන සැටි ඇසීමට මට නොහැකි විය. ඔහු නිහඬව දේව රූප සහ පහන දෙස බලමින්, සුසුම්ලමින්, යටි රැවුළ අත ගාමින් බොහෝ වේලාවක් දණින් සිටියේය.

නිහඬව සිට ස්මූරි මගෙන් ප්‍රශ්න කළේය.

"සෙර්ගේයි නුඹට සල්ලි දුන්නාද?"

"නැහැ."

"කිසිම දාක දුන්නෙ නැත්ද?"

"කිසිමදාක දුන්නෙ නැහැ" යි මම පිළිතුරු දුන්නෙමි.

"ඔහු බොරු කියන්නෙ නැහැ" යි ස්මූරි කී විට අවන්හල්කරුවා පහත් හඬින් මෙසේ පැවසීය:

"කොහොම වුණත් එච්චර තමයි."

"යමු" යි මා දෙස බලා කෑ ගැසූ කෝකියා මා පිඟන් සෝදන මේසය වෙත විත්, මගේ හිසට සෙමින් ගසා කතා කළේය.

"මෝඩයා, මමත් මෝඩයා, මට නුඹව බලාගන්න තිබුණා...."

නැව නීෂ්නි නගරයට පැමිණි විට අවන්හල්කරුවා මගේ පඩි මුදල් දුන්නේය. එය මුදලින් රූබල් අටක් පමණ විය. මවිසින් ප්‍රථම වරට උපයන ලද විශාල මුදල එය විය.

ස්මූරි මගෙන් සමු ගනිමින් බැරෑරුම් ලෙස මෙසේ උපදෙස් දුන්නේය.

"ඔන්න, ඉතින්... දැන් ඉතින් ඇස් දෙකම ඇරල වටපිට බලන්න ඉගෙන ගනින්. ඈනුම් අරින්න එපා...."

ඔහු මට පලාවන් දුම්කොළ මල්ලක් තෑගි කළේය. එයට කුඩා පබළු අල්ලා වැඩ දමා තිබිණි.

"මෙන්න මේ තෑග්ග අරගනින්. මේක ලස්සනයි. මගේ ඥාන දුව මට මේක මහලා දුන්නා... ඉතින් නුඹට ආයුබෝවන්! පොත් කියවපන්. ඒක තමයි ඉතාම හොඳ වැඩේ!"

ඔහු මා කිහිලිවලින් ඔසවා සිපගෙන, තොටුපළේ පාලම මත තැබීය. මට මා නිසාත්, ඔහු නිසාත් කනගාටුවක් උපනි. ඔහු කම්කරුවන් තල්ලු කැරමින්, බැරෑරුම් ලෙස පා තබමින් හුදෙකලාව නැවට යන සැටි බලා සිටි මට කෑගසා අඬන්නට සිත් විය.

මෙවැනි දයාන්විත, හුදෙකලා, ජීවිතයෙන් ඈත්වුණු මිනිසුන් මම පසුකලෙක කොතරම් හමු වුණෙම්ද.....

VII

සීයාත් ආච්චිත් යළිත් නගරයෙහි වාසය කරති. මා ඔවුන් වෙත ආවේ කෝපයෙන් සහ කලහකාරී හැඟීමෙකිනි. මගේ හදවත දුකින් පිරිලාය. නැවේදී ඔවුන් මා සොරකු ලෙස ගණන් ගත්තේ මක්නිසාද?

ආච්චි මා ආදරයෙන් පිළිගෙන තේ පානය සඳහා වහාම සමවාරය පිළියෙල කිරීමට පටන් ගත්තාය. සීයා හැමදා මෙන්ම, එදත් උපහාසාත්මක ලෙස ප්‍රශ්න කළේය.

"රත්තරන් ගොඩක් හම්බ කළාද?"

"හම්බ කරපු ඔක්කොම සල්ලි මගේ තමයි." ජනේලය මුල්ලේ වාඩිවී මම පිළිතුරු දුන්නෙමි. ජයග්‍රාහී ලීලාවෙන් සිගරැට් පෙට්ටියක් එළියට ගෙන වැදගත් ලෙස සිගරැට්ටුවක් උරන්නට වීමි.

"ආ එහෙමද?" සීයා මා දෙස වුවමනාවෙන් බලමින් අසා මෙසේද කීවේය. "ඒකත් එහෙමද? යක්පැටියා දුම් බොනවද? නුඹ තවම ළපටියි නේද?"

"මට දුම්කොළ මල්ලකුත් තෑගි දුන්නා." මම පුරසාරම් දෙඩවීමි.

"දුම්කොළ මල්ලක්! නුඹට මක්වෙලාද? නුඹ මට ඔච්චම් කරනවද?"

සීයා ඔහුගේ ශක්තිමත් කෙට්ටු දෑත් දිග හැරගෙන, කොළ පැහැති නෙත්වලින් රවා බලමින් මා වෙත කඩා පැන්නේය. මම නැඟිට සිට මගේ හිසින් ඔහුගේ උදරය තල්ලු කළෙමි. සීයා බිම ඉන්දෙවිණි. ඔහු අසීරු ලෙස තත්පර කීපයක් මා දෙස බලමින්, පුදුම වී ඇස් නටවමින්, දත් නැති කට අරිමින් සිට අනතුරුව සන්සුන් ලෙස මෙසේ ඇසීය.

"නුඹ, නුඹේ සීයාව තල්ලු කළේ මොකටද? නුඹේ මවුගේ පියාව?"

"මට ගැහැව්වා මදිද, මීට පස්සෙ ඒවා බැහැ" යි මා කීවේ මා කළ දෙය අශෝභන බව වටහා ගනිමිනි.

වියළි, සැහැල්ලු සීයා නැඟිට මා අසලින් වාඩි වී, ඉතා දක්ෂ ලෙස මගේ කටේ තිබුණු සිගරැට්ටුව උදුරා ගෙන, ජනේලයෙන් පිටතට විසිකොට, බියමුසු කට හඬකින් කතා කළේය.

"මෝඩ කොල්ලා. නුඹේ මුළු ජීවිතයටම මේ කළ ක්‍රියාවට නුඹට දෙවියෝ සමාව නොදෙන බව නුඹ දන්නවාද? අම්මේ" යැයි ඔහු ආච්චි ඇමතීය. "ඔන්න නුඹ බලාපන්. මේ කොල්ලා මට ගැහැව්වා. නොවැ? ඌ මට ගැහැව්වා. උගෙන් අහපන්!"

ආච්චි මගෙන් ප්‍රශ්න නොකර මගේ කෙස්වැටියෙන් අල්ලා ගනිමින්, මගේ හිස සොලවමින් මෙසේ කියන්නට වූවායඃ

"ඒ වගේ වැඩකට, මෙන්න මෙහෙම. මම නුඹට දඬුවම් කරනවා."

ඇගේ එම දඬුවම වේදනාවක් නොදුන්නද, එය අතිමහත් සිත් අමනාපයක් ඇති කළේය. එම හැඟීම වඩාත් උග්‍ර වූයේ සීයාගේ නපුරු සිනාවෙනි. කුඩා පුටුවේ වාඩිවී සිටි ඔහු දෑතින් දෙදණට තට්ටු කරගනිමින් සිනා සෙමින් හඬ නැඟීය.

"අහා අන්න ඔහොම...."

මම ඉදිරිපස පිහිටි ගබඩා කාමරයට ගොස්, ඉමහත් සිත් වේදනාවකින් සහ පාළු බවකින් යුතුව සමවාරයෙන් පිටවන හඬට සවන් දෙමින් සිටියෙමි.

ආච්චි ඇවිත් ඇගේ කට මගේ කනට ළං කොට යම්තමින් ඇසෙන සේ තෙපලාය.

"නුඹ මට සමාවෙයන්, මට නුඹට නොරිදෙන විදිහටයි කෙස්වලින් ඇද්දේ. මම එහෙම කළේ වුවමනාවටයි. එහෙම නැතුව හොඳ නැහැ. සීයා බොහොම නාකියි නොවැ. එයාට ගරු කරන්න ඕන. එයාත් දැන් බොහොම තෙහෙට්ටු වෙලා ඉන්නවා. ඒ වගේම බොහොම දුක් විඳිනවා. ඉතින් නුඹ එයාගෙ හිත නරක් කරන්න එපා. නුඹ දැන් පුංචි එකෙක් නොවෙයි. නුඹට තේරුම් ගන්න පුළුවනි... අලෝෂා එය තේරුම් ගත යුතුයි. දැන් සීයා පුංචි ළමයකු වගෙයි."

ඇගේ වචන මගේ හිතට විශාල සැනසිල්ලක් විය. ඇගේ එම කෙදිරිල්ල නිසා මා සිතෙහි ලජ්ජාවක්ද එමෙන්ම, ආච්චි කෙරෙහි අපරිමිත දයාවක්ද හට ගත්තේය. ආච්චිත්, මාත් සිප වැලඳගතිමු.

"නුඹ සීයා ළඟට පලයන්, එයා ඉස්සරහ පිට සිගරැට් බොන්න එපා. එයාට නුඹේ දුම් බීමට පුරුදු වීමට ඉඩ දීපන්..."

මා කාමරයට ගොස් සීයා දෙස බැලීමි. මට සිනහ නොවී සිටිය නොහැකි විය. ඔහු ඇත්ත වශයෙන්ම කුඩා ළමයකු මෙනි. දෙපා පොළොවේ හප්පමින් ඔහු ළමයකු

මෙන් ඉමහත් ලෙස ප්‍රීති විය.

"මොකද එළවා? නුඹ ආයෙමත් අංවලින් පොර බදන්ට ආවාද? පල්හොරා! හරියට නුඹේ තාත්තා වගේමයි. ගෙදරට ආපු හැටියේ දේවරූප ඉදිරියේ නමස්කාර කරලා කුරුසියේ ලකුණ ඇඳ ගත්තේ නැහැ. මිථ්‍යා දෘෂ්ටිකයා, දැන් සිගරට් බොනවා. තුට්ටු දෙකේ බොනපාට් කෙනෙක්!"

මම නිහඬවීමි. ඔහුගේ වචන මල්ලද කෙමෙන් හිස් වූයෙන් විඩාපත් ඔහුද නිහඬ විය. තේ බොන ගමන් ඔහු මට උගන්වන්ව පටන් ගත්තේය.

"දෙවියන්ට බය වෙන්න ඕන. ඒ බිය හරියට අශ්වයාට කට කලියාව වගේ. දෙවියෝ තමයි මිනිහාගේ එකම මිතුරා, මිනිහෙක් මිනිහෙකුට පරම හතුරෙක්."

"මිනිස්සු මිනිස්සුන්ට හතුරෝය" යන මතයෙහි ඇති නිදොස්භාවය තරමක් දුරට මසිතෙහි බලපාන්නට විය. ඔහුගේ වෙනත් උපදෙස් ගැන මා දැක්වූයේ උදාසීනත්වයෙකි.

"දැන් ඉතින් නුඹ ආපසු මත්‍රියෝනා ළඟට පලයන්. වසන්තය ආපුවාම නැවේ වැඩට පලයන්. හිම කාලෙ මත්‍රියෝනාලාගේ ගෙදර ඉඳපන්. උන්ට නොකියා වසන්ත කාලයේදී නැවේ වැඩට පලයන්..." සීයා කියන්නට විය.

"මිනිසුන්ව රවට්ටන්නේ මොකටද?" මේ දැන් මගේ හිසෙන් බොරුවට අදිමින් සීයාව රැවැට්ටූ ආච්චි ප්‍රශ්න කළාය.

"රැවැටීමෙන් තොරව ජීවත්වෙන්න බැහැ. හොඳයි. කියාපන් රැවැටීමෙන් තොරව ජීවත්වන්නේ කවුද? කියලා" සීයා ඇසීය.

හවස සීයා ප්සල්තීර් යාච්ඤා පොත කියවන්න පටන් ගත්තේය. මාත් ආච්චිත් ගෙවත්තෙන් පිටවී, පිටියට ගියෙමු. සීයාත්, ආච්චිත්, දැන් ජීවත්ව ඉන්නේ කුඩා මඩුවක් වැනි ගෙපැලකය. එහි ඇත්තේ ජනේල දෙකකි. මේ ගෙපැල කනාත්තයා වීදියේ පසු පස පිහිටියේය. ඉස්සර සීයා කනාත්තයා වීදියේ ලොකු ගෙයක අයිතිකරුව සිටියේය.

"ඔන්න අපි ආපු පළාත. නාකියාට හිත වාවාගන්න බැහැ. ඒ නිසා තැනින් තැන යනවා. මෙතැනත් එයාට හොඳ නැහැ. නමුත් මට හොඳයි." ඕ තෙපලාය.

අප ඉදිරියේ හැතැප්ම තුන හතරක් දිගට අතරින් පතර කුඩා ගස් සහිත පිටියකි. ඉඳහිට මාකඳුරු දැක්ක හැකිය. තැනින් තැන බිම් මල්වලින් ගහන පෙදෙස්ය. කසානය දක්වා වැටී ඇති මග ඔස්සේ බිරියෝසා ගස්ය. මාකඳුරුවල පොකුරු ලෙස කුස්තාර්නික් පඳුරුය. බැස යන හිරුගේ සිසිල්වන් රැස් ධාරා නිසා ඒ පඳුරු රන් පැහැයෙන් දිලිසෙයි. මඳ සුළඟට බිලීන්කි පඳුරුවලැ අතු වැනෙයි. මාකඳුරුවලට එහා නගරයේ පහත් මැද පන්තියට අයත් තරුණයන්ගේ සහ තරුණියන් ගේ රූප වැනෙන්නේ බිලීන්කි ගස්වල අතු මෙනි. පැරණි ආගමික සිරිත්වලට ගරු කරන්නන්ගේ මළ සිරුරු වළලන 'බුග්රොව්ස්කි ස්කිට්' නමින් හඳුන්වන සොහොන් බිම් වටා ඇති රතු පැහැති තාප්පය අපට දකුණු දෙසින් පිහිටා ඇත. මාකඳුරට එහි කාල වර්ණ වෘක්ෂ සහිත ප්‍රදේශයකි. ඊට එපිටින් යුදෙව්වන්ගේ සුසාන භූමියය. මෙහි ඇත්තේ පාළු ගතියකි. හැම දෙයක්ම නිහඬව නිසරු බිම බදාගත් විටෙක මෙනි. නගර තදාසන්නයෙහි පිහිටි කුඩා ගෙවල්වල ඇති කවුළු බියෙන් යුතුව මග දෙස බලයි. ගෙවතුවල ඇවිදින කුකුළන් කෙට්ටුය. ආහාර හිඟයක් උන්ගේ සැටියෙන් පෙනෙයි. කන්‍යාරාමයේ වත්ත හරහා උම්බෑ ගාමින් එළදෙන්නු යති. ඈත පිහිටා ඇති යුද කඳවුරෙන් යුද්ධමය සංගීතය ඇසෙයි. පිත්තල මුවා නළාවලින් නැඟෙන හඬ මහත් වූ ඝෝෂාවක් ඇති කරයි.

බී ගත් මිනිහෙක් දැඩි ලෙස ඇකෝඩියනය නටවමින් ගල් මුල් වලැ හැප්පෙමින් යයි.

"නුඹ වෙත එමි මම... කොහොම හරි..."

"මෝඩ මනුස්සයා..." යැයි සුරාසොඬාගේ ගීතයට සවන් දෙන ආච්චි සුරතල් ලෙස කියන්නේ, හිරු රැස් නිසා දෙනෙත් හකුළුවා ගනිමිනි. "නුඹ කොහේ යන්නද? වෙරි මරගාතේ බිම වැටිලා එතැනම නිදා ගනීවි. නුඹේ ඇකෝඩියනය කවුරුන් හරි හොරකම් කර ගනීවි..."

ආච්චි කිව්වාය.

නැවේදී මා ගත කළ ජීවිතය ගැන මම ආච්චිට විස්තර කරමින් වට පිට බලන්නට වීමි. මට මේ පරිසරය දොම්නසක් ගෙන දෙන බව දුටු පසු මගේ හැඟීම් වඩාත් තීව්‍ර විය. මා ආච්චිගේ කතාවලට ඉමහත් ඕනෑකමකින් සවන් දෙන ආකාරයටම, ආච්චිද මගේ කතාවලට සවන් දෙන්නී. මා නැවේ ස්මූරි කෝකියා ගැන කියන විට, ඈ කුරුසියේ ලකුණ ඇඳ ගනිමින් මෙසේ පැවසුවාය:

"එයා හොඳ මනුස්සයෙක්. දේව මෑණියනි ඔහුට උදව්, කරන සේක්වා. නුඹ ඔහු ගැන අමතක කරන්න එපා. හොඳ දේ කිසිමදාක අමතක නොකර හොඳින් මතක තබා ගනින්. නරක දේ ඉක්මනට අමතක කරලා දාපන්..."

මා නැවේ සේවයෙන් අස්කළ හේතුව ඇයට කීම මට ලෙහෙසි නොවීය. එනමුදු, හදවත දැඩි කොට ගෙන මම ඇයට විස්තර කළෙමි. එය ඇගේ හදවතට නොදැනිණි. ඈ මන්දෝත්සාහි ලෙස මෙසේ කීවාය.

"නුඹ පුංචියි, ජීවත්වීමට දන්නෙ නැහැ..."

"ඔන්න ඔක්කොමල්ලා එකිනෙකාට මෙහෙම කියනවා. නුඹ ජීවත් වෙන හැටි දන්නෙ නැහැ. ගොවියෝ, නාවිකයෝ, මත්‍රියෝනා ආච්චි ඇගේ පුතාටත් එහෙම කියනවා. හරිහැටි ජීවත්වන්නේ කොහොමද?"

ඇය මට පිළිතුරු දුන්නේ දෙතොල් තද කරගෙන හිස වනමිනි.

"ඒ ගැන කියන්නට මා දන්නෙ නැහැ."

"එහෙමනම් ඒ ගැන කියන්නෙ මොකටද?"

"නොකියා ඉන්නෙ කොහොමද?" යි ඇසූ ආච්චි සන්සුන් ලෙස කතා කළාය. "නුඹ අමනාප වෙන්න එපා. නුඹ තවම පුංචියි. ඒ හින්දා ජීවත්වන සැටි නුඹ දන්නෙ නැහැ. ඇත්තට දන්නෙ කවුද? සමහරු කපටි හොරු. ඔන්න බලාපන් සීයා, එයාට මොළේ තියෙනවා. අකුරු දන්නවා. නමුත් කිසි දෙයක් ලබා ගත්තෙ නැහැ...."

"ආච්චි හොඳට ජීවත්වුණාද?"

"මමද? හොඳට ජීවත්වුණා. නරකටත් ජීවත්වුණා. හැම ආකාරයටම...."

අප අසලින් ගමන් කළ මිනිසුන්ගේ සෙවණැලි දිගැති

ලෙස බිමට වැටිණි. ඔවුන්ගේ පාදවලින් නැඟෙන දූලි ඒ සෙවණැලි යටපත් කළේය. හවස් වත්ම දොම්නස තවත් වැඩිවිය. සීයාගේ දොඩමලු කටහඬ අපට ඇසේ.

"දෙවියනි, ඔබවහන්සේගේ සාධාරණ කෝපය මා වෙත එල්ල නොවේවා."

සීයාගේ කන්නලව් අසන ආච්චි මඳ සිනා පාමින් ඇගේ අදහස් කියයි.

"දෙවියන්ට වුණත් අපේ සීයාව තිත්ත වෙලා ඇති. හැමදාම හවසට කන්නලව් කරනවා. මොනවා ගැනද? දැන් සීයා නාකියි. එයාට මොනවත් ඕන නැහැ. නමුත් දුක් ගැනවිලි කියනවා. හවස කරන ඉල්ලීම්වලට දෙවියෝ කන් දෙනවලු. සීයාගේ කන්නලව් අහලා දෙවියෝ හිනා වෙනවා ඇති. ඔන්න ආයෙමත් වසීලි කෂිරින් නහයෙන් අඬන්න පටන් අරගෙන! දැන් අපි ගෙදර යමු...."

මම ගී ගයන කුරුල්ලන් ඇල්ලීමට තීරණය කළෙමි. එය අපට තුන්වේල සොයාදෙන රැකියාවක් ලෙසය, මට හැඟුණේ. මා ගී ගයන කුරුල්ලන් අල්ලනු ඇත. ආච්චි උන් විකුණනු ඇත. මම කුරුල්ලන් ඇල්ලීමට අවශ්‍ය දැලක් මිල දී ගෙන, කුඩුවක්ද සාදා ගතිමි. අරුණෝදයට ඔන්න මෙන්න කියා තිබියදී, මම මාකඳුර අසල තැනෙක දැල විදහා බලා සිටිමි. ආච්චි මල්ලක් සහ කුඩයක් ගෙන අවට බැද්දේ බිම්මල්, පලු වර්ග සහ කොට්ටන් ඇට වර්ග එකතු කරයි.

සැප්තැම්බර් මාසයේ විඩාපත් හිරු අහස ගත්තා පමණකි. වලා අතරින් සුදු පැහැති හිරුරැස් මාකඳුර සහ මා දක්වා විහිදෙයි. මාකඳුරේ අගාධයේ පතුලින් සුදු පැහැති මීදුමක් මතුවෙයි. අගාධයේ මැටි සහිත වටය කළු පැහැතිය, නග්නය, පහළ කුස්තාර්නික් පඳුරු කහ, රතු හා දුඹුරු පාටින් යුක්තය. සිසිල් සුළං පහර නිසා ඒ පඳුරු වැනෙයි.

පහළ රෙපේයි පඳුරු අස්සේ ෂෙගොල් කුරුලු පැටවු කීචි බීචි ගාති. බුරියාන් පඳුරු අස්සෙන් කුරුල්ලන්ගේ රතු පැහැති හිස පෙනෙයි. මා වටේට සිනීට්සා කුරුල්ලෝ කුතුහලයෙන් යුතුව බලති. උන් සුදු පැහැති උන්ගේ බෙලි පුප්පා ගෙන වටපිට බලමින් හැසිරෙන්නේ කුනාවිනො

ගමේ තරුණ මාධ්‍යම පන්තිකයන් සිහියට නංවමිනි. කඩිසර, බුද්ධිමත්, කෝපාන්විත උහු හැම දෙයක්ම දැන ගැනීමටත්, හැම දෙයක්ම හොට ගෑමටත් කැමැතිය. දැලට උන් එකවර දෙතුන් දෙනා බැගින් අසුවේ. උන් දැලෙන් බේරී පලායාමට දඟලන සැටි බලන විට දුකක් ඇතිවේ. එහෙත්, මගේ කාර්යය වෙළඳාමය. එය දැඩි රැකියාවකි. මම දැලට අසුවන කුරුල්ලන් කූඩුවට දමා එය මල්ලක් තුළට ඔබාලමි. එවිට උහු නිහඬව සිටිති.

බයාරිෂ්නික් පඳුරකට චිෂ් කුරුල්ලෝ වැසූහ. ඒ පඳුර හිරු රැස්වලින් නැහැවී ඇති නිසා උහු තවත් සතුටුව කීචි බීචි ගාති. උන්ගේ හැසිරීම අනුව නම් උහු පාසල් කොල්ලනට සමාන වෙති. කෑදර, ගෘහමය, සොරකපුත් කුරුල්ලෙක් ශීත කාලයට පෙර, උණුසුම් රටවල් බලා පියාඹා යෑමට පමා වී ඇත. උෆ ෂිපොව්නික් අත්තක වාඩිවී, හොට ශුද්ධ පවිත්‍ර කිරීමෙහි යෙදී සිටී. ඒ අතර, ගොදුරක් සොයමින් උගේ කළුවන් දෙනෙත් ඒ මේ අතට යොමු වෙයි. උෆ ෂාවරනොක් පක්ෂියාට වඩා ඉක්මනින් ගොස් ගොදුරක් ඩැහැගෙන. ඒ ගොදුර නියවලින් අල්ලාගෙන, හිස හරව හරවා වටපිට බලයි. ෂූර් කුරුල්ලෙක් හඬ රහිතව මා අසලින් පියාඹා ගියේය. මගේ කෑදර බලාපොරොත්තුව ඒ කුරුල්ලන් අල්ලා ගැනීමය. උෆ අල්ලා ගැනීමට ඇත්නම්! රැනෙන් ඈත්වූ ස්නිගීර් කුරුල්ලෙක් ගසක අත්තක වාඩි වී වටපිට බලන්නේ යුද්ධ හමුදාවෙක අණ දෙන ජනරාල් කෙනෙකු මෙනි. උගේ බෙල්ල රතු පාටය. උගේ කළුවන් හොට වනමින් උෆ තරහෙන් කෑ ගසයි.

හිරු කෙමෙන් අහස නගිත්ම, කුරුල්ලන්ගේ සංඛ්‍යාවද වැඩිවේ. උන්ගේ හඬ නැගීමද වඩාත් ප්‍රියංකර වේ. අගාධය පුරා සංගීතමය හඬය. එහෙත්, එහි මූලික හඬ සුළඟට හසුවී වැනෙන කුස්තාර්නික් පඳුරු නඟන ශබ්දයය. කුස්තාර්නික් පඳුරුවලින් නැඟෙන දොම්නස මුසු මිහිරි ශබ්දය පරදවා කීචි බීචි ගෑමට කුරුල්ලෝ අසමත්හ. ගිම්හානයට ආයුබෝවන් කියන ගීතය මට ඇසෙයි. එයට විශේෂ වචන ඇත. ඒ වචන ඉබේටම මෙන් ගීතයකට හැරෙයි. ඒ අතර මට නොදැනුවත්ම අතීතය සිතුවම් පටක් සේ මසිතෙහි මැවී පෙනෙයි.

ඈත සිට ආච්චි කෑ ගසයි.

"මුනුපුරෝ, නුඹ කොහිද?"

ආච්චි අගාධය අසල වාඩිවී, ලේන්සුවක් දිග හැර, ඒ මත පාන්, කැකිරි, රේපා අල, ඇපල් ආදිය තැබුවාය. ඒවා මැද හිරු රැසින් දිලිසෙන කුඩා ඩිකැන්ටරය ඉතා ලස්සනය. වීදුරුමුවා ඒ බඳුන අලංකාර කැටයමින් යුක්තය. එහි මූඩිය වෙනුවට නැපෝලියන්ගේ හිසට සමාන රූපයෙකි. ස්වෙරබොයි නමැති තෘණවලින් පෙරා සාදාගත් වොඩ්කා කාලක් එම බඳුනෙහි ඇත.

"දෙවියනි, කොතරම් අගේද!" ආච්චි ප්‍රීතියෙන් පවසයි.

"ආච්චියේ මම සින්දුවක් හැදුවා!"

"ඇත්තද?"

කවිවලට සමාන යමක් මම ඇයට කියමි.

ශීත සමය ළඟ ළඟ එන බව කියලා
හිරු කුමරිය වැඩි වැඩියෙන් ඇදිරි වෙලා...!

ආච්චි මගේ කවිවලට සවන් නොදී ඇගේ අදහස් කියන්නට වූවාය.

"ඒ වගේ ඇත්තෙ එක සින්දුවක් විතරයි. ඒක බොහොම හොඳ සින්දුවක්."

ආච්චි ගයන්නට වූවාය.

ගිම්මානයේ හිරු කුමරා ඈත යති,
අඳුරු රැයෙහි මහ කැලයෙහි සැඟවී යති!
තරුණිය තනිවුණා අයියෝ මහ දුකකි,
වසන්තයේ ප්‍රීතිය නැතිවුණා වැනි...

හිමිදිරි පාන්දර කවුළුව ළඟ සිටලා,
මැයි මස රෑ විනෝද ගැන සිහි කරලා.
ප්‍රීතිය රහිත පිරිසුදු කුඹුර දෙස බලා.
නැතිවුණු මගේ යෞවන විය ගැන සිතලා.

අනේ මගේ යෙහෙළියනි සුන්දර,
නැවුම් හිම වැටෙනවා අත්තෙන් බිමට,
පපුවෙන් මගේ ඇදගෙන හදවත ලේ පෙරෙන
නැවුම් හිමෙහි වැළලීමට අවසර දෙන්න...!

මගේ කාව්‍ය නිර්මාණයට ආච්චි සවන් නොදීම ගැන දුක් නොවූ, මම ආච්චිගේ ගීතයේ තරුණිය නිසා දුක් වූයෙමි.

ආච්චි තව දුරටත් මෙසේද කිව්වාය:

"ඔන්න ඔහොමයි ගීතයෙන් ගැයෙන්නේ! වසන්ත කාලයේදී තරුණිය ඇගේ ආදරවන්තයා සමඟ ප්‍රීතියෙන් ඇවිද්දා, ශීත සමය ආ විගස තරුණයා අර කෙල්ලව අත හැරලා ගියා. සමහර විට ඒ තරුණයා වෙනත් කෙල්ලක් හොයා ගත්තා වෙන්න ඕන. ඉතින් අර තරුණියගේ හදවත අඬා වැලපුණ හැටි තමයි ඔය ගීතයෙන් ගැයෙන්නේ. තමන්ගෙ හිතට හැඟෙන්නේ නැති දෙයක් ගැන ගීතයෙන් කියන්න බැහැ. නමුත්, තරුණිය එයාගෙ දුක ගැන යසට විස්තර කරනවා!"

ප්‍රථම වරට ආච්චි මා ඇල්ලූ කුරුල්ලන් කොපෙක් හතළිහකට විකුණූ විට ඈ ඉමහත් ලෙස මවිත වූවාය.

"ඔන්න බලාපන් වැඩක හැටි! මුලින් මම කල්පනා කළේ නුඹේ ඔය වැඩේ නිකම් පුංචි කොල්ලකුගේ සෙල්ලම් වැඩක් කියලා. දැන් බලාපන්කො ආදායම කොහොමද කියලා!"

"ආච්චි ලාබෙට අර කුරුල්ලන්ව වික්කා...."

"හැබෑටමද?"

කඩපොළ පැවැති දවස්වලදී කුරුල්ලන් රුබලයකට වැඩියෙන් විකිණීමට ආච්චි සමත් වූවාය. ඒ නිසා ඇගේ මවිතය වඩාත් වැඩි විය. පුහු දේවලින් කොතරම් මුදලක් හම්බ කළ හැකිද!

"ගෑනියක් මුළු දවස පුරාම රෙදි හෝදනවා. නැතිනම් ගෙබිම හෝදනවා. එයට මුළු දවසටම ලැබෙන්නේ කොපෙක් විසිපහක් විතරයි. ඉතින් පුළුවන් නම් තේරුම් ගනින්! කොහොම වුණත් ඔය වැඩේ හොඳ නැහැ! කුරුල්ලන්ව කුඩුවල දාලා හිර කිරීම හොඳ වැඩක් නොවේ. කුරුල්ලන් ඇල්ලීම නවත්වාපන් ඔලෝෂා."

එහෙත්, මම කුරුල්ලන් ඇල්ලීම සඳහා සිතත්, කයත් දෙකම යොදන්නට වීමි. එය මගේ සිත් ගත් කාර්යයක් විය. එයින් කුරුල්ලන්ට හැර අන් කිසිවකුට හිරිහැරයක් නොවීය. කුරුල්ලන් ඇල්ලීම හොඳ හැටි දත් අයත් සමඟ

සබඳකම් ඇති කර ගත් මම ඔවුන් ගෙන් ගුරු උපදෙස් ලබා ගතිමි. ඔවුහු මට බොහෝ දේ උගැන්වූහ. කුරුල්ලන් ඇල්ලීම පිණිස මම තනිවම හැතැප්ම විස්සක් තිහක් දුර ගියෙමි. වොල්ගා නදීබඩ පිහිටි ක්සතොව් කැලෑව දක්වා ගියෙමි. එහි ක්ලෙස්ට් කුරුල්ලෝ සහ කුරුල්ලන් ඇතිකරන්නන් අගය කරන අපොලොන් සිනීට්සා හෙවත් ඉතා ලස්සන දිගු වල්ගා සහිත සුදු පැහැති කුරුල්ලෝ වාසය කළහ.

හවසට ගෙදරින් පිටත්වන මම මුළු රාත්‍රිය පුරා කසාත් මහා මාර්ගය ඔස්සේ ගමන් කරමි. සමහර දවස්වලට සරත් සමයේ වැසි නොකඩවා වසී. සමහර තැන්වල මඩ ගොහොරු දණක් ගැඹුරුය. මගේ පිටෙහි වැසිවලින් ආරක්ෂාවන රෙද්දෙන් වසන ලද කුරුලු කූඩු සහිත මල්ලකි. එහි ඇමට පාවිච්චි කරන කුරුල්ලාද සිටී. අතේ ශක්තිමත් සැරයටියකි. සරත් සමයේ ඇදිරිය ශීතලය, බිය සහිතය, බොහෝ බිය සහිතය! මග දෙපස හෙණ පහරවලින් හානි ලැබූ බිරියෝසා ගස්ය. තෙතබරිවූ බිරියෝසා අතු මගේ හිසට උඩින් එල්ලෙයි. වම් පස කඳු පාමුලින් ගලා බසින වොල්ගා නදිය කළු පැහැතිය. හිම කාලය ආරම්භ වීමට පෙර කුඹ ගස්වල කණමැදිරි පහන් ආලෝකය සහිතව නැව් සහ පාරු ආදිය දුවති. නැව්වල විශාල රෝදය හඬ නඟමින් භ්‍රමණය වෙයි.

යකඩ වැනි පොළොවෙන් සාදා ඇති මහ මඟ අයිනේ ගම් දනව්වල කුඩා ගෙවල්ය. බඩගින්නේ ළතැවෙන නපුරු බල්ලෝ දෙපාවල හැප්පෙති. මුරකරුවා බියෙන් කෑ ගසා ප්‍රශ්න කරයි.

"ඔතන කවුද? මේ මහ රෑ හොල්මන් කරන්නේ මොන යකාද?"

කුරුල්ලන් ඇල්ලීමට භාවිත කරන දැල මගෙන් උදුරා ගනිතියි බිය වූ මම, ගම්වලැ මුරකරුවන්ට දීම සඳහා කොපෙක් පහේ කාසි ගෙන ගියෙමි. පෝකින ගමේ මුරකරුවා මා සමඟ මිත්‍ර වූයෙන්, මා දකින සෑම වාරයකදීම ඔහු මෙසේ පවසන්නට විය:

"ආයෙමත් යනවද? මදෑ නුඹ බය නැති කොල්ලෙක්, රෑට හොල්මන් කරනවා නේද?"

ඔහුගේ නම නීපන්ත්ය, ඔහු මිටිය, පැසුණු හිසකේ සහිතය. ආගමික මුනිවරයකුට සමානය. ඔහු නිතර පාහේ කමිසයට යටින් ඇති කුහරයෙන් රේපා ගෙඩියක්, ඇපල් ගෙඩියක්, තැම්බූ ධාන්‍ය අහුරක් මට දෙයි.

"යාළුවා, මේ කෑම ටික ගනින්. සතුටින් කාපන්."

ඔහු මාත් කැටුව ඔහුගේ ගමේ සීමාව දක්වා ගොස් මට සුබ පැතීය.

"ඉතින් දෙවි පිහිටෙන් පලයන්!"

අරුණෝදයේ කැලෑවට වැදෙන මම කුරුල්ලන් ඇල්ලීම සඳහා වූ දැල් නිසි තැන තබා, කුරුලු කෑම දමා, උදෑසන වන තුරු බලා සිටිමි. දැඩි නිහඬතාවකි. අවට හැම දෙයක්ම සරත් සමයේ දැඩි නින්දට හසුවෙලාය. අළු පැහැති මීදුම අතරින් කඳු පාමුල පිහිටි පුළුල් තණ පිටි යම්තමින් පෙනෙයි. ඒවා හරහා වොල්ගා නදියේ දිය පාරවල් වැටී ඇත. ඒවා අතරින් මීදුම යම්තමින් තුනීවෙලාය. කැලෑවට ඇතින් තණ පිටි තිබෙන පැත්තෙන් සෙමින් සෙමින්, හිරු අහස ගනී. සතුන්ගේ ග්‍රීවයනට සමාන ගස්වලට ඉහළින් ගිනි දලු සිහි නංවන ආලෝකයක් ඉහළ යත්ම, සිතට කාවදින පුදුම සහගත චලිතයක් හට ගනී. හිරු රැස්වල රිදීවන් රේඛා තණ පිටි සිප ගනී. මෙතෙක් සෙවණැලි ගොඩට හසුව තිබුණු තුරු, ලතා, පඳුරු ආදියත්, මිනිසුන් ගොඩ ගැසූ විශාල පිදුරු මිටිත්, හිරු රැස් නිසා දිය වන දියකඩිතිත්, වෙන්, වෙන්ව පෙනෙයි. ඉකුත් රෑයෙහි ශීතලට හසුවී ඝනව තිබුණු දිය දැන් ගලා බසින විට හිරු රැස් නිසා ඒවා රන්වන් දුඹුරු පැහැයෙන් දිලිසෙයි. ඔන්න දැන් හිරු රැස් වොල්ගා නදියට වැටී ඇත. නදී ජලය හිරු පිළිගැනීමට ඉදිරියට යන්නාක් මෙනි. හිරු කෙමෙන් අහස නඟී. ඉමහත් සතුටින් හිරු ඉකුත් රෑයෙහි දැඩි ශීතලට හසුවූ හැම දෙයකටම ආශීර්වාද කරමින් හැම දෙයක්ම උණුසුම් කරලයි. වනය සහ අවට බිමෙන් සරත් සමයේ සුවඳ වහනය වෙයි. විනිවිද පෙනෙන වාතය මහපොළොවේ විශාලත්වයත්, එහි අසීමිත පුළුල්තාවත් පෙන්වාලයි. මේ නිසා වඩාත් ඈතට, මහ පොළොවේ ඈත ක්ෂිතිජයට යාමට කෙනෙකුට සිතෙයි. මේ වනයේ සිට හිරු අහස

නඟින සැටි මම කීප වරක්ම දැක ඇත්තෙමි. ඒ හැම වරකදීම මා ඉදිරියේ නව ලෝකයක්, නව අලංකාරත්වයක් දුටුවෙමි.

හිරු මගේ විශේෂ ආදරයකට පාත්‍ර වී ඇත. හිරුගේ නමට පවා මම ඇලුම් කරමි. සූර්යයා යන නමෙහි ගැබ්වී ඇති සුහද ශබ්ද ශ්‍රවණය මගේ ප්‍රීතියට හේතුවකි. දෙනෙත් පියාගෙන හිරු රැස්වලට මුහුණ දීමටත්, වැටක සිදුරකින් නැතිනම් තුරු අතු අතරින් වැටෙන හිරු රැස් අත්ලෙන් ඇල්ලීමටත් මම ආසා කරමි. 'හිරුට නමස්කාර නොකළ මිහයිල් චෙර්නීගොව්ස්කි කුමාරයා සහ ආදිපාද ප්‍රයෝදර්' යන මේ දෙදෙනා සීයාගේ ගරුත්වයට පාත්‍ර වී ඇත. එහෙත්, මේ මිනිසුන් මට පෙනෙන්නේ අභිගුණ්ඨිකයන් මෙන් කළුවන් මිනිසුන් හැටියටය. ඔවුන් මූසලය, නපුරුය. දුප්පත් මොර්ද්වින් ජාතිකයන් මෙන් ඔවුහු හැමදාම ඇස් රෝගවලින් පෙළෙති. හිරු තණ පිටිවලට එහා අහස ගත් විට, ප්‍රීතිය විසින් මම ඉබේටම සිනහ ගන්වනු ලැබේ. මගේ හිසට ඉහළින් හ්වොයි වනයේ අතු සැලෙත්ම එහි පිනි බිඳු බිම වැටේ. පාපරත්නික් ගසෙහි කොළ වැඩ දැමූ ගෙත්තම් වැනිය. එහි රැඳී ඇති පිනි බිඳු රිදී ගෙත්තම් සිහියට නංවයි. වැසි වතුරෙන් තෙමුණු තණපත් බිම නැමී නොසෙල්වී සිටී. එහෙත්, ඒවාට හිරු රැස් වැටුණු විට පණ ලැබුණු විටෙක මෙන් ඒවා යම්තමින් සෙලවෙයි. යළි ජීවය ලැබීමට දරන අවසාන පරිශ්‍රමයකට එය සමානය.

කුරුල්ලෝ අවදි වූහ. මොස්කොව්කා නමැති අළු පැහැති කුරුල්ලෝ පුලුන් බෝල මෙන් ගුළිවී අත්තෙන් අත්තට පැන, පැන යති. සොස්නා ගස් මුදුන්වල වසා සිටින ක්ලෙස්ත් කුරුල්ලෝ රතු පැහැතිය. උහු වක් වූ හොටින් සොස්නා ගෙඩිවලට අනිති. සොස්නා ගසක අතු අග වසා සිටින සුදුවන් අපොලොන් කුරුල්ලෙක් දිගැති පියාපත් වනයි. කළු පබළු ඇට බඳු උගේ නෙත් මගේ දැල දෙස අවිශ්වාසයෙන් බලයි. හිටි හැටියේම මුළු මහත් වනයේ සිටින කුරුල්ලන් කල්පනාකාරී ලෙස දහසක් මිහිරි නාදයෙන් ගයන්නට වූ විටෙක මෙනි. ලොව ජීවත්වන ඉතාම පවිත්‍ර සතුන් වන පක්ෂීන්ගේ අවශ්‍යතාවන් උන්

පවසන විටෙක මෙනි. මෙලොව සුන්දරත්වයේ පිතෘවන මිනිසා පක්ෂීන්ගේ රූපය ආදර්ශයට ගෙන සිත සනසාග නු පිණිස එල්ප්, හෙරුවීම්, සෙරපිම් වැනි දේව දූත චරිත නිර්මාණය කළේය.

කුරුල්ලන් ඇල්ලීම මට තරමක් දුක් ගෙනදෙන වැඩකි. උන් මම කුඩුවලට දමන්නේ හෘදය සාක්ෂියට විරුද්ධවය. මා වැඩියෙන්ම කැමති වන්නේ උන් නැරඹීමටය. එහෙත්, උන් ඇල්ලීමේ ආසාව, මුදල් උපයා ගැනීමේ අවශ්‍යතාව නිසා මගේ හැඟීම් යටපත් විය.

කුරුල්ලෝ උන්ගේ කපටිකම් නිසා මා හිනස්සති. නිල් පැහැති සිනීට්සා කුරුල්ලා මා දෙස බැලුවේ සැලකිල්ලෙනි. අනතුරුව ඌ දැල දෙස සවිස්තරව බලා එය ඌට තර්ජනය කරන බව වටහා ගෙන එය මඟහැර ගොස් වෙනත් පෙදෙසක ඇට වර්ග අහුලා ගෙන කන්නට විය. සිනීට්සා කුරුල්ලෝ නුවණ ඇත්තෝය. එමෙන්ම, වුවමනාවට වඩා කුතුහලයකින් උහු පෙළෙති. ආඩම්බරකාර ස්නෙගීර් කුරුල්ලෝ මෝඩයෝය. උන් රෑන් පිටින් මගේ දැලට අසුවන්නේ බඩ පුරා ආහාර ගත් මධ්‍යම පන්තික අවරසිකයන් පල්ලියට යන්නාක් මෙනි. දැලෙන් ඔවුන් වසා අල්ලා ගන්නා විට උහු බොහොසේ මවිත වී දෙනෙත් මහත් කැරැගෙන බලමින්, හොටෙන් මගේ ඇඟිලිවලට කොටති. ක්ලෙස්ත් කුරුලු වර්ගය දැලට අසුවන්නේ කලබල රහිතවයි. ස්ථිර ලෙසිනි. පෝපල්සෙන් කුරුලු වර්ගයද අනික් වර්ගවලට වඩා හාත්පසින්ම වෙනස්ය. දැල ඉදිරියේ උහු බොහෝ වෙලාවක් බලා ගෙන සිටිති. උන් අතුවල ලැග ඉන්නේ වලිගය ආධාර කර ගනිමිනි. උන් ගස්වල යන්නේ කොට්ටෝරුවන් ලෙසිනි. හැමදාම සිනීට්සා කුරුල්ලන් පිරිවරාගෙනය. අළු පැහැති ඒ කුරුල්ලන් දුකට වැටී ඇතියවුනට සමානය. පෝපල්සෙන් කුරුල්ලන්ට අනික් පක්ෂීහු අකැමතිය. උහුද අනික් එවුනට ආදරයක් නොදක්වති. කාක්කන් මෙන්ම, මේ කුරුල්ලෝද දිලිසෙන කුඩා දේ සඟවා තැබීමට ආසා කරති.

දහවල් වන විට මම කුරුල්ලන් අල්ලාගෙන කැලෑ ඔස්සේ ගෙදර යමි. මහ පාර සහ ගම් හරහා ගමන්

කළහොත් කොල්ලෝ සහ ගැටවරයෝ මගේ කුරුලු කූඩු ආදිය උදුරා ගනිති. මගේ දැල් ආදිය ඉරා උගුල් ඇටවීමේ උපකරණ කඩා බිඳ දමති. මෙවැනි කරදරවලට මම මුහුණ දී ඇත්තෙමි.

විඩාපත් වී, කුසගින්නෙන් පෙළෙමින් රාත්‍රි වන විට මා ගෙදර පැමිණියද, එම එක් දවසක නිසා මා වැඩි, අලුත් දේ දැනගෙන ශක්තිමත් වී තිබෙන සැටියක් මට දැනෙයි. මේ අලුත් ශක්තිය නිසා මට සීයාගේ කටුක උපහාසයට සවන් දී, සන්සුන්ව කෝප නොවී සිටිය හැකිය. මගේ හැසිරීම දකින සීයා එවිට බැරෑරුම් ලෙස කතා කිරීමට පටන් ගනී.

"ඔය පුහු වැඩේ අතහැරලා දාපන්, කුරුල්ලන් අල්ලලා කාටවත් හරි ගියෙ නැහැ. මා දන්නා එහෙම සිද්ධියක් ඇත්තේම නැහැ. නුඹේ ස්ථානය හොයාගෙන නුවණක්කාර විදිහට වැඩ කරපන්, මිනිහා ජීවත්වන්නේ පුහුවැඩවලට නොවෙයි. මිනිහා දෙවියන්ගේ ධාන්‍ය ඇටය වගෙයි. ඔහු යහපත් ධාන්‍ය කරලක් මැවිය යුතුය. මිනිසා රූබලයක් වගෙයි. නිසි පරිදි සංසරණය වුණොත් රූබල් තුනක් බවට පරිවර්තනය වෙනවා! නුඹ හිතන්නේ ලෙහෙසියෙන් ජීවත්වෙන්න පුළුවන් කියලද? නැහැ. ජීවත්වීම කොහෙත්ම ලෙහෙසි නැහැ! ලෝකය මිනිහාට අන්ධකාර රාත්‍රියක් වගෙයි. එක් එක් මිනිහෙක් එය ආලෝකවත් කළ යුතුයි. හැම මිනිහකුටම ඇඟිලි දහයක් දීලා තියෙනවා. හැම මිනිහාගේම ආසාව හැකි තරම් විශාල ගොඩක් බදා ගන්නයි. ශක්තිය තියෙන්න ඕන, ශක්තිය නැතිනම් කපටිකම තියෙන්න ඕන. පුංචි එකාටයි, දුබල එකාටයි ලෝකය සුරපුරයක් නොවෙයි. නරකයක්! එකට හැම දෙනා සමඟ එක්වී ජීවත් වුණත්, තනියම ජීවත්වන බව මතක තබා ගනින්. හැම දෙනාටම කන් දීලා අහපන්, නමුත්, කිසිම කෙනෙකුව විශ්වාස නොකරන්. පෙනීමට පමණක් විශ්වාස කළහොත්, ඇද කුදු විදිහට මනිවි. නිහඬව ඉඳපන්. ගෙවල් හා නගර ගොඩ නඟන්නේ කටින් නොවෙයි. සල්ලිවලින් සහ උපකරණවලින්. නුඹ බෂ්කීරි හෝ කල්මික් හෝ ජාතිකයෙක් නොවෙයි. උන්ට ඉන්නෙ එළුවොයි, උකුණොයි විතරයි."

මෙවැනි දේ ඔහු හවස සිට රෑ වනතුරු කීමට සමත්ය. මම ඔහුගේ උපදෙස් කට පාඩමින් දැන සිටියෙමි. ඔහුගේ වචනවලට මා කැමැති වුවද, ඔහුගේ අදහස් කෙරෙහි මම අවිශ්වාස සහගත ආකල්පයක් දැක්වීමි. මිනිසාට ජීවත්වීමට බලවේග බාධා කරන බවත්, එකක් දෙවියන් සහ අනික මිනිසුන් බවත් මම වටහා ගතිමි.

ආච්චි කවුළුව අසල වාඩිවී, බීරළු රේන්ද සඳහා නූල් සකස් කරමින් සිටියාය. නූල් අඹරන බඹරය ඇගේ අතින් භ්‍රමණය වන විට හඬක් පිට විය. ආච්චි සීයාගේ කතාවට නිහඬව සවන් දී සිටින්නී, හිටි හැටියේම මෙසේ පැවසුවාය:

"දේව මෑණියන් සිතන විදිහට තමා සියල්ල සිදු වන්නේ."

"ඔය කතාව මොකටද?" යි ප්‍රශ්න කළ සීයා කෑ ගැසුවේය. "දෙවියන් ගැන මට අමතක වෙලා නැහැ. දෙවියන්ව මම දන්නවා. මෝඩ නාකිච්චි, මෝඩයන්ව මැව්වේ දෙවියෝද?"

...මිහිපිට අන් හැමටම වඩා හොඳට කොසාකයන් හා සෙබළුන් ජීවත්වෙතියි මම සිතමි. ඔවුන්ගේ ජීවිතය සරලය, ප්‍රීතිමත්ය. යහපත් කාලගුණ ඇති දවස්වලදී ඔවුහු අපේ නිවස ඉදිරිපිට ගල්වළට එහා පිහිටි එළිමහන් පිටියට හිමිදිරි පාන්දර පැමිණෙති. සුදුවන් බිම්මල් මෙන් පිටිය පුරා පැතිර සිටගන්නා ඔවුහු ඉතා අසීරු, එමෙන්ම සිත් ගන්නා ක්‍රීඩාවල යෙදෙති. දක්ෂ, ශක්තිමත් ඔවුන් ඇඳ සිටින්නේ සුදු කමිසය, ඔවුහු තුවක්කු රැගෙන සතුටු සිතින් දුවමින් ගල්වළට වැද සැඟවෙති. නළා හඬ ඇසෙත්ම යළිත් පිටියෙහි පෙනී සිටිති. "හුරා" යන හඬ නඟමින්, භේරි නාදය අනුව කෑ ගසමින්, බයිනෙත්තු අමුණාගත් තුවක්කු ඉදිරියට දිගු කරගෙන අපේ නිවස දෙසට දිව එති. ඔවුන් දැන්, දැන් අපේ නිවස පිදුරු මිටියක් සේ තළා පොඩි කොට දමතියි මට සිතිණි.

මමද ඔවුන් පසු පස දුවමින් ඉමහත් උද්යෝගයකින් "හුරා" කියා කෑගැසීමි. භේරි නාදය නිසා මා තුළ උපන්නේ යමක් විනාශ කිරීමේත්, ගෙවැට කඩා දැමීමේත්, කොල්ලනට පහර දීමේත් ආසාවකි.

විවේක වේලාවලදී සෙබළු මට දුම්කොළවලින් සංග්‍රහ කළහ. බරැති තුවක්කු පෙන්වූහ. හිටිහැටියේ එකෙක් බයිනේත්තුව මගේ බඩ දෙසට දිගු කොට මෘග විලාසයෙන් කෑ ගසයි.

"මේ කැරපොත්තාගේ බඩට අනිව්!"

බයිනෙත්තුව දිලිසෙන්නේ පණුතිි සතකු, නයකු මෙනි. ඌ දැන් දෂ්ට කරනු ඇත. ඉන් මා තරමක් බිය වුණද, වඩාත් සතුටු විය.

මෝර්ද්වින් ජාතික බෙර වයන්නා මට බෙර ගසන සැටි උගැන්විය. ප්‍රථමයෙන් ඔහු මගේ අත් ගෙන වේදනාව ඇති වන තුරු ඒවා මිරිකා දැමීය. අනතුරුව ඔහු මට බෙර ගසන කෝටු දෙක දුන්නේය.

"ගහපන් එකයි, දෙකයි. ත්‍රම් තා තා තම්, වමතින් හෙමිහිට තට්ටු කරපන්! දකුණතින් හයියෙන් ගහපන්!" ඔහු කෑගසමින් ඔහුගේ කුරුලු නෙත් විදහා ගත්තේය.

මම පිටියේ හැම තැනම දුවමින් සෙබළුන්ගේ අභ්‍යාස අවසන් වනතුරු ඔවුන් පසු පස යමින්, ඔවුන්ගේ බැරැක්ක දක්වා නගරය පුරා ඇවිදිමින් ඔවුන් කැටුව ගියෙමි. ඔවුන්ගේ ගීතවලට සවන් දෙමින්, ඔවුන්ගේ දයාන්විත මුහුණ දෙස බැලීමි. ඒ මුහුණු අලුත්ය. මේ දැන් ටංකනයෙන් පිටවූ අලුත් කාසිවලට ඒවා සමානය.

එක හා සමාන මිනිස්සු ගොඩක් එක්සත් බලයක් ලෙස සතුටින් ගමන් කරති. ඔවුන්ගෙන් ඇතිවන උද්යෝගය නිසා ඔවුන් අතරට යාමට මට සිතෙන්නේ, ගඟට පැන නෑමට නැතිනම් වනයකට යාමට ඇති ආසාවෙකිනි. මේ මිනිස්සු කිසිවිට බියක් නැත. හැම දෙයක් දෙසම නිර්භය ලෙස බලති. ඔවුනට හැම දෙයක්ම ජය ගත හැකිය. හැම දෙයක්ම ලබාගත හැකිය. එහෙත්, ප්‍රධාන දේ ඔවුන් සාමාන්‍ය මිනිස්සු වීමය.

එහෙත්, දවසක් දා තරුණ උප නිලධාරියෙක් විවේක වේලාවේදී මට අඬ ගසා මහතැති සුරුට්ටුවක් දී මෙසේ කීවේය:

"මෙන්න දුමක් ඇදපන්! මගේ ළඟ මේ වගේ සුරුට්ටු ඇත්තේ එකක් පමණයි. නුඹ ඉතා හොඳ කොල්ලකු නිසා මම නුඹට මේක තෑගි කරනවා."

මම සුරුට්ටුව පත්තු කරගන්නා විටම වාගේ නිලධාරියා පියවරක් ආපස්සට තැබීය. හිටිහැටියේම ඉන් පිටවූ ගිනි දැල්ල මගේ නෙත් මොහොතකට අන්ධ කළේය. මගේ ඇඟිලි පිලිස්සිණි. නහයද, ඇහි බැමිද ගින්නට දැවිණි. අළු පැහැති ලුණු රසයෙන් යුත් දුම නිසා මම කිඹුහුන් ඇරියෙමි. එමෙන්ම, කහින්නටද වීමි, අන්ධ වූ ඇස් ඇතිව බිය වූ මම එක තැන සිටගෙන උඩ පනින්නට වීමි. මා වට කර ගෙන වළල්ලක් සේ සිටි සෙබළු මහ හඬින් හා ප්‍රීතියෙන් සිනාසෙන්නට වූහ. මා ගෙදර යාමට පා නඟත්ම, සෙබළුන්ගේ හූ හඬ සහ උරුවම්බෑම් මා පසු පසින් ආවේය. කෙනෙක් අත්පුඩි තැළුවේ එඬේරකුගේ කස පහරකින් නගන හඬක් මෙනි. පිලිස්සුණු ඇඟිලි වේදනාවක් ගෙන දුන් අතර, මුහුණේ හම දැවෙන්නට විය. දෙනෙතින් කඳුළු කැට කඩා වැටිණි. එහෙත්, මගේ සිත පෑරුණේ වේදනාව නිසා නොවේ. මොට්ට මවිතය නිසාය. ඔවුන් මට එසේ කළේ මක් නිසාද? යහපත් තරුණ සෙබළුන්ට එය විනෝදයක් වූයේ මන්ද?

ගෙදර අට්ටාලයට නැඟගත් මම එතැනට වී බොහෝ වේලාවක් සිටියෙමි. මට මුහුණ පෑමට සිදුවූ විස්තර නොකළහැකි අති මහත් දුෂ්ටකම ගැන මගේ සිත යොමු විය. මට 'විශේෂයෙන් පැහැදිලි ලෙසත්, ජීවමාන ලෙසත් සරපුල් තොටුපළේ මා වැඩ කළ නැවට පැමිණි කුඩා සෙබළකු සිහි විය. ඔහුගේ සේයාව ජීවමානව සිටගෙන මගෙන් ප්‍රශ්න කරන්නාක් මෙනි.

"ඉතින්? නුඹට තේරුණාද?"

එහෙත්, වැඩිකල් යන්නට මත්තෙන් වඩාත් බරපතළ සහ වඩාත් මවිත වන දෙයකට මට මූණ පෑමට සිදුවිය.

මම කොසාක් සෙබළුන්ගේ බැරැක්කවලට යාමට පටන් ගතිමි. ඒවා පෙළොර්ස්කය ගම අසල පිහිටා තිබිණි. කොසාකයන් අනික් සෙබළුන්ට වඩා කැපී පෙනුණේ, ඔවුන් ඉතා දක්ෂ ලෙස අසුන් පිට ගිය නිසා පමණක් හෝ ලස්සන ඇඳුමින් සැරසී සිටි නිසා පමණක් හෝ නොවේ. ඔවුන් වෙනත් බසකින් කතා කිරීමත්, වෙනත් ගී ගැයීමත්, ඉතා ලස්සනට නැටීමත් නිසාය. හවසට ඔවුහු අසුන් පීරා පවිත්‍ර කළ පසු එක්රැස් වෙති. රතු පැහැති

හිසකේ ඇති කුඩා කොසාකයෙක් හිස නටවමින් තඹවන් බටයකින් නිකුත් වන හඬක් සේ උස් හඬකින් ගයන්න පටන් ගනී. ඔහු නොසන්සුන් ලෙස ඇද පැද ගයන්නේ නිසල දොන් නදිය ගැන නැතිනම්, නිල්වන් දුනායි නදිය ගැන ගීතයකි. මැරී අත්තෙන් බිමට වැටීමට තරම් උද්‍යෝගයකින් සොරියාන්කා කුරුල්ලා ගයන පරිදි ඔහු දෙනෙත් වසාගෙන ගයයි. කසාක් සෙබළ ගායකයාගේ කමිස කර විවෘත වී ඇති නිසා ඔහුගේ උර ඇට පෙනෙයි. ඒවා තඹවන් බට මෙනි. සෙබළාද තඹවලින් වාත්තු කළාක් වැන්න. ඔහුගේ පයට පැගී ඇති මහ පොළොව නොසන්සුන් වූ විටෙක මෙන් ඔහු දෙපා වනයි. දෑත් සොලවමින් දෙනෙත් වසාගෙන ගයන ඔහු මිනිසකුට වඩා එඬේරකුගේ බට නළාවට සමාන වෙයි. සමහර විට ඔහු සොරියාන්කා කුරුල්ලා මෙන් උඩුබැලි අතට ඇද වැටී මිය යතියි මට සිතෙයි. මන්දයත්, ඔහු ඔහුගේ මුළු මහත් ආධ්‍යාත්මික ශක්තියත්, කායික ශක්තියත් ගීතය සඳහා වැය කළ බැවිනි.

ඔහුගේ සගයෝ දෑත් පිටිතලහා කොට බැඳගෙන කවාකාරව සිටගෙන, ගායකයාගේ තඹවන් මුහුණ දෙස බලමින්, ඒ අතර ඔහුගේ සෙමින් සෙලවෙන දෑත් නිරීක්ෂණයට හසු කරති. පල්ලියේ ගයන විටෙක මෙන් ඔවුහුත් වැදගත් ලෙස ගයති. හැම කෙනෙක්ම යටි රැවුළු ඇත්තෝ සහ නැත්තෝ දැන් පල්ලියේ සුරුවම්වලට සමානය. එමෙන්ම, ඔවුහු මිනිසුන්ගෙන් ඈත් වූ බියජනක බවක් දරති. මහා මාර්ගය මෙන් දිගැති ගීතය, සමවන්ය. පුළුල්ය. එමෙන්ම, නැණවත්ය. ඒ ගීතය අසන විට, දැන් පෘථිවියට උදේද, නැතිනම් හවසද යන්නත්, මා කොල්ලෙක්ද නැතිනම් මහල්ලෙක්ද යන්නත්, අනික් හැම දෙයක්මත් අමතක වෙයි. ගායකයන්ගේ කටහඬ නැවැත්වේ. අශ්වයන් සුසුම්ලන හඬ ඇසේ. සරත් සමයේ රැයෙක රාත්‍රිය නිහඬව පැතිර යන්නාක් මෙන්ම, අශ්වයන් ස්ටෙප්ස් භූමිය කෙරෙහි දැඩි කාන්සියකින් පසුවන බවක් දැනේ. හදවතෙහි කිසියම් අපැහැදිලි හැඟීම් පැන නඟී. ලෝකයේ සියලු ලොකු කුඩා මිනිසුන් වෙත මොවුන් ආදරයක් ඇතිවේ.

ඒ කුඩා තඹ පැහැති කොසාකයා මිනිහකු නොව, වෙනත් වැදගත් කෙනෙකු ලෙස මට පෙනිණි. ඔහු පුරවෘත්තයක එන චරිතයකට සමානය. ඔහු ලෝකයේ අන් සියලු මිනිසුන්ට වඩා උසස්ය. මට ඔහු සමඟ කතා කිරීමට නොහැකි විය. ඔහු මගෙන් යමක් ඇසූ විට, මම ඉමහත් සතුටකින් මඳසිනා පා ලජ්ජාශීලී ලෙස නිහඬවීමි. ඔහු නිතර දැකීමටත්, ඔහු ගයන සැටි ඇසීමටත් බල්ලකු මෙන් කීකරුව ඔහු පසු පස යාමටත් මම නිතර සූදානමින් සිටියෙමි.

වරක් ඔහු අශ්ව ඉස්තාලයේ මුල්ලක සිටගෙන, අතක් මුහුණ වෙත ළං කර ගෙන ඇඟිල්ලක පැලඳ තිබුණු සිනිඳු රිදී මුද්ද දෙස බලමින් සිටින සැටි මට පෙනිණි. ඔහුගේ රතුවන් ලස්සන දෙතොල් නැටවිණි. දුඹුරුවන් උඩු රැවුළ ගැස්සිණි. ඔහුගේ මුහුණේ කනගාටුව මුසු අමනාපයකි.

දවසක් දා අඳුරු සැන්දෑවක මම කුරුලු කූඩුත් රැගෙන තැබෑරුම අයිතිකරු වෙත ගියෙමි. තැබෑරුම්කරුවා ගී ගයන කුරුල්ලන්ට ඉමහත් ලෙස ආදරය කළ අතර, ඔහු මගෙන් නිතර කුරුල්ලන් මිලදී ගත්තේය.

කෙසාක් සෙබළා තැබෑරුමේ ගිනි උදුන අසල ඇති බංකුවක වාඩි වී සිටියේය. ඔහුත් සමඟ විශාල දේහයක් ඇති ගැහැනියක් වාඩි වී සිටියාය. ඈ ඔහුට වඩා දෙගුණයක් විශාලය. ඇගේ වටකුරු මුහුණ පදම් කළ එළු සමක් සේ රත් පැහැයෙන් දිලිසේ. ඈ ඔහු දෙස තරමක බියෙන් යුතුව මාතාවකගේ සුරතල් නෙත්වලින් බැලුවාය. කට ගොන්නක් බී ගෙන සිටි ඔහු දෙපා දිග හැරගෙන බිම අද්දා ශබ්ද නඟමින් උන්නේය. ඔහුගේ එම ක්‍රියාව නිසා ගැහැනියගේ කකුල්වලට ඔහුගේ පාද හැප්පුණෙන් ඈ තිගැස්සී, මුහුණ රැලි ගන්වා ගනිමින් සෙමින් ඉල්ලා සිටියාය.

"මෝඩ වැඩ කරන්න එපා..."

කොසාකයා ඉතා අමාරුවෙන් බැම ඔසවා බැලුවද, ඒවා යළිත් පහළ වැටිණි. ඔහුට දැඩි උෂ්ණත්වයක් දැනුණු නිසා ඔහු කබායේත්, කමිසයේත් බොත්තම් ගලවා දැමූයෙන්, ඔහුගේ ගෙල නග්නව පෙනිණි. ගැහැනිය හිස බැඳි ලේන්සුව දෙඑර මත දමාගෙන, ඇගේ ශක්තිමත් සුදු

පැහැති දෑත් මේසය මත තැබුවාය. ඈ දෑතේ ඇඟිලි තදින් පටලවා ගත්තෙන් ඒවා රතු විය. මා ඔවුන් දෙස වැඩි වැඩියෙන් බලත්ම, ඔහු දයාබර මාතාවක් ඉදිරියේ වරදක් කළ පුතකු ලෙස මට හැඟිණි. ඈ ඔහුට දයාන්විතව සහ දොස් පවරන්නාක් මෙන් යමක් කිව්වාය. ඔහු ලජ්ජාවෙන් මෙන් නිහඬ විය. නිසි ලෙස දොස් පැවරීම්වලට පිළිතුරු දීමට ඔහුට නොහැකිය.

එහෙත්, ඔහු හිටි හැටියේම යමකින් ඇනුණු විටෙක මෙන් හණික නැඟී සිට ඔහුගේ තොප්පිය නළල වැසෙන සේ දමා ගත්තේය. අනතුරුව ඔහු තොප්පිය අත්ලෙන් ගසා, කබායේ බොත්තම් පියවා නොගෙන දොර වෙතට ගියේය. ගැහැනියද නැඟිට තැබෑරුම් අයිතිකරුට කතා කොට මෙසේ කීවාය:

"වැඩි වෙලා යන්න ඉස්සෙල්ලා ආපසු එනවා. කුස්මිව්...."

තැබෑරුමේ සිටියහු ඔවුන් පිටතට යත්ම සිනහසුණහ, විහිළු කතා කීහ.

"නාවිකයා ආවාම, ඒකිට යස පාඩමක් උගන්වාවි!"

මම ඔවුන් පසු පසින් ගමන් ගතිමි. කොසාක් සෙබළා සහ ගැහැනිය මට පියවර දහයකින් පමණ ඉස්සරහින් ගමන් ගත්හ. ඔවුන් පල්ලම දක්වා ගිය පසු, සෙබළා පියවරක් ඈතට ගොස් ඉදිරියට පැන ගැහැනියගේ කම්මුලට වැරෙන් පහරක් ගැසීය. ඈ මවිතයට හා බියට පත්ව කෑ ගැසුවාය.

"අපොයි. මේ අපරාදේ කළේ මොකටද?"

මමද බියවූයෙමි. ඔවුන් අසලටම දිව ගියෙමි. සෙබළා ගැහැනියගේ ඉඟටියෙන් අල්ලා පල්ලම අසල ඇති වැටට උඩින් ඇය පෙරළා දැමීය. අනතුරුව ඔහුත් හණිකට වැටට උඩින් පැන්නේය. දැන් දෙදෙනාම එකට ගුළිවී පල්ලම දිගේ පෙරළෙන්නට වූහ. එවිට ඒ දෙදෙනා එකම කළු පැහැති ගුළියක් බවට පත්වූහ. මවිතයට පත් වූ මම ගල් ගැසුණෙමි. පහළට පෙරළෙන ඒ මිනිස් ගුළිය දෙස බලා සිටියෙමි. හඬ නඟමින් ගැහැනියගේ ඇඳුම් ඉරාදමමින් කොසාක් සෙබළා ගොරවයි. ගැහැනිය පහත් හඬින් මුමුනයි. ඉක්කා ගසයි.

"මම කෑ ගහනවා. කෑගහනවා...."

ඈ වේදනාවෙන් හඬනඟා "ඕග්" යන හඬින් කෑ ගසා නිහඬ වූවාය. මම ගලක් ගෙන පල්ලම දිගේ රෑට්ටා යැවීමි. තණකොළ සරසර ගාන හඬකි. චතුරශ්‍රයේ පිහිටි තැබෑරුමේ වීදුරු දොර තදින් වැසෙන හඬ ඇසිණි. මිනිහෙක් වේදනාවෙන් කෑ ගැසුවේ බිම වැටුණු නිසා විය යුතුය. තත්පරයක් පාසාම බිය ගෙන දෙන නිහඬතාවකි.

පල්ලම පාමුල සුදු පැහැති විශාල ගුළියක් පෙනිණි. එය සුසුම් ලමින් නැඟිට සිටියාක් මෙනි. දැන් එය පල්ලම දිගේ ඉහළ නඟී. ඒ ගැහැනිය බව මම හඳුනා ගතිමි. ඈ කන්ද නඟින්නේ බැටළුවකු මෙන් හතර ගාතෙනි. ඇගේ උඩුකය සම්පූර්ණයෙන්ම නග්නය. ඇගේ පයෝධර විශාලය. ඇයට මුහුණු තුනක් ඇතිවාක් මෙනි. ඈ වැට දක්වා ඉහළ නැඟ මා අසලින්ම වාගේ වාඩි වී වෙළඹක මෙන් හති ලන්නට වූවාය. ඇය, තම අවුල් වූ හිසකෙස් අත ගාන්නට වූවාය. ඇගේ සුදුවන් සිරුරේ කළුවන් මඩ සහිත ලප ඇත. ඈ අඬයි. දෙනෙතින් රෑරා වැටෙන කඳුළු කැට ඇය පිස දමන්නේ බැළලියක මෙනි. ඈ මා දැක විස්මයට පත්වූවා, සෙමින් කතා කළාය.

"දෙවියනි, මෙතන කවුද? පලයන් යන්න ලජ්ජා නැති කොල්ලා!"

මා විස්මයට පත්වීම හා අන්දමන්ද වීම නිසා මට සෙලවීමට පවා නොහැකිය. මසිතෙහි පැන නැඟුණේ කටුක වේදනාවක් හා පාළු ගතියකි. ආච්චිගේ නංගී කී කතාවක් මට මතක් විය.

"ගැහැනිය ලොකු බලයකි. ආදම්ගේ බිරිඳ ඒවා දෙවියන් වහන්සේව පවා රැවැට්ටුවා..."

ගැහැනිය නැඟිට ඉරුණු ඇඳුම්වලින් පපුව වසා ගෙන ඉක්මනින් ඉවත ගියාය. කඳු පාමුල සිටි කොසාක් සෙබළා ඇගේ අඳුම් සුළඟේ වනමින්, සෙමින් උරුවම්බාන්නට විය. අවට හඬට සවන් දී ඔහු පසන් හඬකින් කතා කළේය.

"දාරියා, මොකද? කොසාකයා හැමදාම ඔහුට ඕන දේ ලබා ගන්නවා. නුඹ සිතුවේ මම බීලා කියලද? එය නුඹට පෙනිච්ච හැටි.... දාරියා!"

ඔහුගේ ගමන ස්ථිරය, ඔහුගේ කටහඬ දැඩිය, උපහාසාත්මකය, ඔහු දෙකට නැවී අත තිබුණු රෙදි කඩින් ඔහුගේ සපත්තුවල තැවරී තිබුණු මඩ පිසදා මෙසේද පැවසීය:

"ඒයි, මෙන්න මේ හැට්ටය අර ගනින්, දාරියා! නිකං බොරුවට කනගාටු වෙන්න එපා...."

අනතුරුව, ඔහු ගැහැනියට නින්දා අපහාස කරමින් නොසරුප් බසින් බැණ වැදුණේය.

කුණු ගොඩ අසල වාඩි වූ මම රාත්‍රී නිහඬතාවෙහි හුදෙකලාව ඔහුගේ කටහඬට සවන් දෙමින් පෑගුණු තත්ත්වයෙකින් පීඩා වින්දෙමි.

ඈත චතුරශ්‍රයේ පහන් කණු දිලිසේ. කළුවන් ගස් අතරින්, සුදුවන් ගොඩනැඟිල්ලක් පෙනේ. එය කුලීන කාන්තාවන්ගේ ආයතනයකි. සුදු පැහැති රෙදිකඩ වනමින් කොසාක් සෙබළා කම්මැළි ලෙස නොසරුප් බසින් බැණ වදිමින් චතුරශ්‍රය දෙසට ගමන් කොට නොපෙනී ගියේ, නරක සිහිනයක් අතුරුදහන් වන පරිදිය.

ඈත කඳු පාමුල වතුර ඉහළට අදින යන්ත්‍රයේ බටය වාෂ්ප පිට කරමින් හඬ නඟයි. පල්ලම දිගේ රියක් පහළ බසී. අවට මිනිස් ප්‍රාණයක් පවා නැතිය. දුටු දේ නිසා මත්වූ මිනිහෙක් මෙන් මා ගමන් කරන්නේ ගලක් අත ඇතිවය. කොසාක් සෙබළාට ඒ ගලින් දමා ගැසීමට මට නොහැකි විය. ජයග්‍රාහී ගියෝර්හි මුනිතුමාගේ දේවස්ථානය අසලදී රාත්‍රී මුරකරුවා මා නවත්වාලීය. මා කවුද, මගේ උරේ එල්ලා ඇති මල්ලේ තියෙන්නේ මොනවාද ආදිය ගැන ඔහු කෝපයෙන් ප්‍රශ්න කළේය.

මා ඔහුට කොසාක් සෙබළා ගැන විස්තර සහිතව කරුණු කී විට ඔහු හඬ නඟා සිනාසෙන්නට විය.

"හරිම දක්ෂයා, කොසාක් සෙබළා! උන් කපටි මිනිස්සු, අපිට උන් එක්ක වැඩ කරන්න බැහැ. අර ගැහැනිය නම් බැල්ලියක් වෙන්න ඕන..."

මුරකරුවා එසේ කියා නොනවත්වාම බක බක ගා සිනාසෙන්නට විය. මා ඔහු වෙතින් ඈත්ව ගියේ ඔහු එසේ සිනාසෙන්නේ කුමක් නිසා දැයි වටහා ගැනීමට අපොහොසත් වෙමිනි.

මම අති මහත් බියකින් කල්පනා කරන්නට වූයෙමි. මගේ අම්මාට, නැතිනම් ආච්චිට එවැනි දෙයක් සිදු වූවොත් මොනවා වේද?

VIII

නැවුම් හිම වැටෙත්ම, සීයා යළිත් මා කැඳවාගෙන ආච්චිගේ නංගීගේ ගෙදරට ගියේය.

"මේකෙන් නුඹට නරකක් වෙන්නෙ නැහැ. නරකක් වෙන්න ඉඩක් නැහැ." සීයා මට පැවසීය.

ඒ ගිම්හානයේදී මා බියජනක සිද්ධීන් බොහොමයක් දුටු බවත්, මා වයසට පත්ව, මට නුවණ වැඩිවූ බවත් මට සිතිණි. එහෙත්, මේ ගෙදර ස්වාමිවරුන්ගේ හැසිරීම විසින් මට වඩාත් වැඩි පාළු බවක් ඇති කරන ලදි. බඩ පිරී උගුරට එන තෙක් ආහාර ගොඩක් ගිල දමන ඔවුහු, නිතර නිතර ලෙඩ වූහ. ඔවුන්, ඔවුන්ගේ ලෙඩ රෝග ගැන අනිකාට පැහැදිලි කළේ විස්තර සහිතවය. මැහැල්ල පෙර මෙන්ම, බියජනක ලෙසත්, නපුරු ලෙසත් දෙවියන් වදින්නට වූවාය. තරුණ ගැහැනිය දරුවකු වැදීමෙන් ඉක්බිතිව කෙට්ටු වූවද, ඈ වැදගත් බවක් ආරූඪ කරගෙන සෙමින් ගමන් කරන්නේ, ගැබිනි මවක්ව සිටි කාලයේදී මෙනි. ඈ තම ළමයිනට යට ඇඳුම් මසන විට හැමදාම එකම ගීතයක් එකම තාලෙකට සෙමින් ගයයි.

ඉස්පිරි, ඉස්පිරි, ඉස්පිරිදොන්
ඉස්පිරි මගේ මල්ලි රත්තරන්
හිම යානයෙ මම හැංගිලා
මල්ලී හැම තැනම හොයල

මා කාමරයට ගිය විගස ඈ ගායනය නවත්වා කෝපයෙන් කෑගසයි.

"නුඹට ඕන මොනවද?"

ඇය ඒ එකම ගීතය හැරුණු විට, වෙනත් ගීත නොදන්නා බව මට සහතිකය.

හවස් වූ පසු ගෙදර අයිතිකරුවෝ කාමරයට අඬ ගසා නියෝග කරති.

"ඉතින් කියාපිය, නුඹ නැවේ ගතකරපු ජීවිතය ගැන."

මම වැසිකිළියේ දොර අසල වූ කුඩා පුටුවේ වාඩි වී, විස්තරය පටන් ගතිමි. මගේ හිතට විරුද්ධව දැන් මම ගත කරන ජීවිතයට වඩා නැවේ ජීවිතය යහපත් වූයෙන්, එය සිහි කිරීම මගේ ප්‍රීතියට හේතුවක් විය. මගේ අසන්නන් අමතක කරමින් මම නොයෙක් දේ කියන්නට පටන් ගනිමි. එයද වැඩි වේලාවක් නොවේ. ගැහැනු දෙදෙනා කිසි දිනෙක නැවකින් ගමන් කර නැති නිසා බියවී මගෙන් ප්‍රශ්න අසති.

"කොහොම වුණත් නැවකින් යාම හිතට බයක් නේද?"

බයක් ඇතිවන්නේ කෙසේදැයි මට වටහා ගත නොහැකිය.

"හිටිහැටියේම නැව ගැඹුරු තැනකට ගිහිල්ලා ගිලුනොත්!"

ගෙහිමියා මහ හඬින් සිනාසෙයි. ගැඹුරු තැන්වල නැව යාත්‍රා කළද නොගිලෙන බව මා දැන සිටියද, ගැහැනුන්ට ඒත්තු ගැන්වීමට මට නොහැකිය. නැව යාත්‍රා නොකරන අතර, මහ පොළොවේ ගමන් කරන ගැලක් සේ එය ගඟේ පතුලට උඩින් රෝදවලින් ගමන් කරන බව මැහැල්ල තරයේ කියා සිටී.

"නැව යකඩ නොවැ, ඉතින් යාත්‍රා කරන්නේ නැහැ නොවැ..." මැහැල්ල කියයි.

"කළ ගෙඩිය වතුරේ ගිලෙන්නේ නැහැ නොවේද."

"හැබෑ සන්සන්දනයක්. කළගෙඩිය පුංචියි. ඇතුළෙ හිස්...."

මා ස්මූරි කෝකියා සහ ඔහුගේ පොත් ගැන කී විට ඔවුහු මා දෙස සැක සිතින් බැලූහ. පොත් ලියන්නේ මෝඩයන් හා පාෂාණ්ඩයන් බව මැහැල්ල කියයි.

"එහෙනම් දාවිත් රජ්ජුරුවෝ ලියාපු ප්සල්තීර් යාච්ඤා පොත?"

"ප්සල්තීර් ශුද්ධ වූ පොතක්, දාවිත් රජතුමා ඒක ලියුවයි කියලා දෙවියන්ගෙන් සමාව ඉල්ලා හිටියා." මැහැල්ල කියයි.

"කොහෙද එහෙම ලියලා තියෙන්නෙ?"

"මගේ අත්ලෙ, මෙහෙ වර, මම තොට ටොක්කක්

ඇන්නාම, තොට තේරේවි, කොහෙද කියල!"

මැහැල්ල හැම දෙයක්ම දන්නා බවක් අඟවමින් හැමදාම ස්ථිර ලෙසත්, අමන ලෙසත් කතා කරයි.

"පෙළෝර්කාවල තතාරින් ජාතිකයෙක් මළා. උගේ ආත්මය කටින් පිට වුණා හරියට කළු තාර වගේ," ඕ පැවසුවාය.

"ආත්මය කියන්නේ නොපෙනෙන දෙයට, හුළං වගේ දේකට" මා එසේ කී විට මැහැල්ල සාවඥ ලෙස කෑ ගසයි.

"තතාරිනයාට කොහෙන්ද බොල එහෙම ආත්මයක්, මෝඩයා!"

තරුණ ගැහැනියද පොත් කියවීමට බිය වූවාය.

"පොත් කියවීම බොහොම නරක පුරුද්දක්. විශේෂයෙන්ම තරුණ කාලෙ දී, අපේ ග්‍රෙබෙඡොක්වල හිටියා හොඳ වැදගත් පවුලකට අයත් ගෑනු ළමයෙක්. එයා බොහොම ගොඩක් පොත් කියවලා අන්තිමේදී පල්ලියෙ අන්නවිරාල කෙනෙකුට ආලය කළා. ඉතින් අන්නවිරාල ගෙ කසාද ගෑනි ඒ ගෑනු ළමයාට මහ පාරෙදී දෙනෝ දහක් මැද අපහාස කළා. හරිම භයානකයි."

සමහර දවස්වලදී ස්මූරිගේ පොත්වලින් මම වචන ඇද බෑවෙමි. මුලක් හෝ අගක් හෝ නැති එක් පොතක මෙසේ කියා තිබිණි." ඇත්තටම කියන්නේ නම් කිසි කෙනෙක් වෙඩි බෙහෙත් සොයා ගත්තේ නැත. රීතියක් හැටියට වෙඩි බෙහෙත් ඇතිවුණේ කුඩා නිරීක්ෂණ හා සොයා ගැනීම් වැලක ප්‍රතිඵලයක් ලෙසිනි."

කිනම් හේතුවක් නිසාදෝ එම වැකිය මගේ සිත් ගත්තේය. එමෙන්ම, එය මට මතක තිබිණි. 'ඇත්තටම කියන්නේ නම්' යන වචන දෙකත් සමඟ නොයෙක් වෙනත් දේ කීමට මම බෙහෙවින් ආසා කළෙමි. එහි කිසියම් ශක්තියක් තිබෙන බව මට හැඟිණි. එහෙත්, ඒ වචන නිසා දුක් විඳීමට හාස්‍යය මුසු දුක් විඳීමට මට සිදුවිය. එය පටන් ගත් සැටි මෙසේය:

ගෙදර අයිතිකරුවන් මට නැවේ සිද්ධින් ගැන යමක් කියන ලෙස වරක් කියූ විට මම ඔවුනට මෙසේ කිව්වෙමි.

"ඇත්තටම කියන්නේ නම්, මට ඒ ගැන කියන්න

දෙයක් නැහැ."

එය ඔවුන්ගේ පුදුමයට හේතු විය.

"මොනවද? නුඹ කියාපු හැටි කොහොමද?"

සතර දෙනාම එකවර සිනාසෙන්නට වූහ. ඒ අතර ඔවුහු මෙසේ කිව්වෝය:

"ඇත්තටම කියන්නේ නම්. අනේ අපොයි!"

හාම්පුතා පවා මට බැණ වැදුණේය.

"නුඹේ කතාව හොඳ නැහැ. මෝඩ කොල්ලා."

එදා සිට ඔවුහු බොහෝ දවසක් යනතුරු මට කතා කළ සැටි මෙසේ විය.

"ඒයි, 'ඇත්තටම කියන්නේ නම්' මෙහෙවර, මේ පොඩි ළමයා කැත කරපු බිම සුද්ද කරලා දාපන්, ඇත්තටම කියන්නේ නම්...."

තේරුම් විරහිතව ඔවුන් කරන නින්දාව නිසා මම අමනාපයට පත් නොවීමි. එනමුදු, මහත් සේ පුදුමයට පත්වීමි.

එවැනි දේවලට විරුද්ධව සටන් කිරීමේ තත්ත්වයෙක නොව, මා පසුවූයේ, අන්ධකාරයෙක සිත කලකිරවන පාළු බවකිනි. මගේ පරිශ්‍රමය වූයේ හැකි තරම් වැඩියෙන් වැඩ කිරීමය. වැඩපළ නම් අඩුවක් නොවීය. ගෙදර පොඩි එවුන් දෙදෙනෙක් සිටියහ. ගෙදර ස්වාමිවරුන්, ළමයින් බලා ගන්නා ආයම්මලා නිතර නිතර මාරු කළෙන්, පොඩි එවුන්ගේ වැඩ කටයුතු මට පැවරිණි. උන්ගේ හාන් රෙදි හැමදාම සේදුවෙමි. සතියකට වරක් රෙදි සේදීම සඳහා ෂන්දාර්ම්ස්කි උල්පත වෙත ගියෙමි. රෙදි අපුල්ලන ගැහැනු එහිදී මා සිනහවට ලක් කළහ.

"නුඹ ගෑනුන්ගේ වැඩ බාරගත්තේ මොකද?"

සමහර දාට ඔවුන්ගේ විහිළු උසුලාගත නොහී, මම ඔවුනට තෙත රෙදිවලින් පහර දුන්නෙමි. ඔවුහු ලෝබ නැතුව මට පෙරළා පහර දුන්හ. එසේ වුවද, ඔවුන් සමඟ ගත කරන කාලය ප්‍රීතිමත්, සිත් ඇද ගන්නාසුලු විය.

ෂන්දාර්ම්ස්කි උල්පත අගාධයේ පතුල දක්වා ගලා ගොස්, අනතුරුව ඔකා නදියට වැටෙයි. අගාධයට එපිටින් විශාල තණ පිටියකි. එය පෞරාණික දෙවියකු වන යරිල නමින් හැඳින්විණි. මේ පිටියෙහි සෙමිකි

උත්සව දවස්වලදී නගරයේ පහළ මැද පන්තිය විනෝද වෙයි. ආච්චි තරුණ කාලයේදී මිනිසුන් යරිල දෙවියන් විශ්වාස කළ බැවින්, ඔහුට පුද පඬුරු ඔප්පු කළ සැටි ඈ මට විස්තර කළාය. රෝදයක් ගෙන එයට ලාටු තවරා ගිනි තබා කෑ ගසමින් ගී ගයමින් ඒ ගිනි ගන්නා රෝදය අගාධය දිගේ පහළට යැවීම එදා සිරිතක් විය. රෝදය අතරමඟ නොනැවැතී ඔකා නදිය දක්වා ගියේ නම්, යරිල දෙවියෝ පුද පඬුරු පිළිගත් බවකි. එවිට ගිම්හානයේදී සූර්යාලෝකය ලැබෙන අතර, එය වාසනාවක් වෙයි.

රෙදි අපුල්ලන්නියන්ගේ බහුතරය යරිල ගමින් පැමිණි අය වෙති. ඔවුහු කටමැත දොඩන, කඩිසර ගැහැනුය. ඔවුන් මුළු මහත් නගරයම දැන සිටි අතර, වෙළෙන්දන්, සිවිල් නිලධාරීන් ගැන කියන කතා ඇසීම සිත් ගන්නාසුලු විවිධ පන්තියේ ඔවුන්ගේ රෙදි අපුල්ලන අය වෙති. හිම සහිත ශීත කාලයේදී ශීතල වතුරේ රෙදි සේදීම බරපතළ දඬුවමක් වැන්න. ගැහැනුන්ගේ අත්වල සම පවා පිපිරී ඉරිතැළී තිබුණේ ඉතා දැඩි ශීතල නිසාය. ලීවලින් සැදූ විශාල වතුර බක්කියට නැමී ගෙන ඔවුහු රෙදි සෝදති. ඒ බක්කියට උඩින් ඇති පියස්ස සුළං පහරින් හෝ ශීතලින් හෝ ඔවුන් ආරක්ෂා නොකරයි. ගැහැනු රෙදි සෝදති. ඔවුන්ගේ මුහුණු දැඩි හිම තුෂාරයේ ඉදිකටු මෙන් තියුණු හිම කැටවලින් පීඩා ලබන නිසා ඒවා රතුවෙලාය. ඉතා දැඩි ශීතල නිසා ඇඟිලි පිලිස්සෙයි. එවිට ඇඟිලි පුරුක් නොනැමී, දරදඬු වේ. ඇසින් කඳුළු ගලයි. ගැහැනු නොනවත්වා කතා කරති. හැම කෙනෙකු ගැනත්, හැම දෙයක් ගැනත්, ඔවුන් කතා කරන්නේ කිසියම් විශේෂ නිර්භය ගතියෙකිනි.

ඉතාම හොඳ කතාකාරිය නතාලියා කස්ලොව්ස්කයාය. වයස අවුරුදු තිහක් පමණැති ඈ සුන්දරය, ශක්තිමත්ය. උපහාසාත්මක නෙත්වලින් යුක්තය. ඇගේ දිව විශේෂ නම්‍යතාවකින් යුක්තය. ඇගේ කටින් පිටවන වචන තියුණුය. අනික් ගැහැනු අයට සැලකිලි දැක්වූහ. බොහෝ දේ ගැන ඔවුහු ඇගෙන් උපදෙස් ලබාගත් අතර, රෙදි සේදීමේදී ඇය දක්වන දක්ෂතාව නිසාත්, ඈ, ඇගේ දුව විද්‍යාලයකට යවා උගන්වන නිසාත් ඇයට ගරු කළහ. ඈ

තෙත රෙදි පිරුණු කූඩ දෙකක් ඔසවාගෙන කන්ද දිගේ පල්ලම් බහින විට ඇය හමුවන අය සිනහ මුහුණෙන් හා සැලකිල්ලෙන් ඇයත් සමඟ කතා කරති.

"දුව කොහොමද?"

"වරදක් නැහැ. දෙවියන්ට පින් සිද්ධ වෙන්න ඉගෙන ගන්නවා!"

"බලාගෙන ලොකු නෝනා කෙනෙකු වේවි!"

"ඒකට තමා මම ඒකිට උගන්වන්නේ. ලොකු ලොක්කන්ට මේ තරම් සුර සැප කොහෙන්ද? අපි නිසා නොවැ, වෙන කවුරු නිසාද? වැඩියෙන් ඉගෙන ගත්තම උන්ගෙ අත් වඩාත් ලොකු වෙනවා. ඉතින් උන් වැඩියෙන් ගන්නවා. වැඩියෙන් ගන්න තරමට හොඳයි. දෙවියන් වහන්සේ මේ ලෝකෙට මෝඩ පුංචි ළමයින්ව එවනවා. උගත් මහලු අයව ආපසු ඉල්ලනවා. එහෙම නම් ඉගෙන ගන්න ඕන!"

නතාලියා කතා කරන විට හැම දෙනෙක්ම නිහඬ වෙති. ඇගේ අධිෂ්ඨාන සහගත ලස්සන කතාවට සවන් දෙති. ඇය ඉදිරියේත්, ඇය නැති තැනත් ඇයට පැසසූහ. ඇගේ ඉවසීමේ ශක්තියටත්, බුද්ධියටත් ගරු කළහ. එහෙත්, කිසිවෙක් ඇය අනුකරණය නොකළෝය. ඈ දණහිස දක්වා උසැති 'සපගී' නමැති සපත්තුවලින් අතේ මැණික් කටුවේ සිට වැළමිට දක්වා වැසෙන සේ සම් කවර මසාගෙන ඒවා අත්වල ලා ගෙන රෙදි සේදුවාය. මේ නිසා ඇගේ ඇඳුම්වල අත් වැසී ඇති කොටස් නොතෙමිණි. ඇගේ සම් කවර ඉතා හොඳ යැයි කියමින් ඇයට හැම දෙනාම පැසසූහ. එහෙත්, ඇය අනුකරණය කිරීමට කිසිවෙකු ඉදිරිපත් නොවීය. මාත් ඇය මෙන් සම් කවර සාදා ගත් විට, ඔවුහු මට සිනාසුණෝය.

"අනේ බාං, නුඹ ගෑනුන්ගෙන් නුවණ ලබා ගන්නවා!"

ඇගේ දුව ගැන නොයෙක් කතා කියති. "ඒක බොහොම වැදගත් වැඩක්! එක නෝනා කෙනෙක් වැඩිවේවි. ලේසි වැඩක්ද? සමහර විට ඉගෙන ගන්න ඉස්සෙල්ලා ඒකි මැරිලා යාවි...."

"උගත් අයගේ ජීවිතයක් ලෙහෙසි නැහැ. බහීලව්ගෙ දූ ඉගෙන ගත්තා. ඉගෙන ගත්තා. ඊට පස්සෙ ඉස්කෝල

ගුරුවරියක් වුණා. ගුරුවරියක් වුණයි කියන එකේ තේරුම, නාකි ළමිස්සියක් වීමයි."

"සත්තකින්ම උගත්කමක් නැතුවට දීගෙ යන්න පුළුවනි. හැබැයි ගෑනිට රූපය තියෙන්න ඕන."

"ඔව්, ගෑනිගෙ මොළේ තියෙන්නෙ ඔළුවේ නොවෙයි...."

ගෑනුන් ඔවුන් ගැනම ලජ්ජා නැති කතා කියන සැටි අහගෙන සිටීම පවා මට ලජ්ජාවෙකි. නාවිකයන්, සෙබළුන්, පස් කපන කම්කරුවන්, ගෑනු ගැන කතා කරන හැටි මම අසා ඇත්තෙමි. ගෑනුන් රැවැට්ටීමේ සමත්කම ගැනත්, ඔවුන් සමඟ දීර්ඝ වේලාවක් රමණයෙහි යෙදීමට ඇති ශක්තිය ගැනත් මිනිසුන් එකා පරයමින් අනිකා පුරසාරම් දොඩන සැටිත් මම දැක ඇත්තෙමි. ඔවුන් ගැහැනුන් කෙරෙහි සතුරු ආකල්පයක් දක්වන බව මගේ හැඟීම විය. එහෙත්, ඔවුන්ගේ කතාවල හැමදාම පුරුෂයන් ජයගන්නා සැටිත්, ඒ සමඟම ඔවුන්ගේ පුරසාරම් දෙඩවීමකුත් ගැබ්වී තිබිණි. මෙම හේතුව නිසා ඔවුන්ගේ එම කතා සත්‍යයට වඩා අතිශයෝක්තිය සහ සිතින් මවා ගත් දේ යැයි මට සිතිණි.

රෙදි අපුල්ලන ගැහැනුන් ඔවුන්ගේ ආලය පිළිබඳ පුවත් එකිනෙකාට නොකී අතර, ඔවුන් පොදුවේ මිනිසුන් ගැන කතා කරන සැටි මම අසා ඇත්තෙමි. ඔවුන්ගේ එම කතාවල උපහාසය, දුෂ්ටත්වය ගැබ් වී තිබුණු නිසා එය සත්‍යය බව මට වැටහිණි. ගැහැනිය යනු ශක්තියයි!

"කොහේ ගියත්, කා සමඟ මිතුරු වුණත්, අන්තිමේදී අප ළඟට තමයි එන්නේ, ඒක වළක්වන්න බැහැ" යි එක් දවසකදී නතාලියා කිව්වාය. එවිටම වාගේ මැහැල්ලක් සරල හඬින් පිළිතුරු සැපයුවාය.

"වෙන කොහේ යන්නද? දෙවියන් ළඟ ඉඳලා ගැහැනිය ළඟට තමයි එන්නේ. පූජකයන් හා තාපසයන් වුණාට පසුවත්..."

අගාධයේ පතුලෙහි සිට, රෙදි සෝදන හඬ සහ ජලය කැලෙත්තෙන හඬ අස්සේ සියලු ගණ ගෝත්‍ර හා ජනතාව කොහෙන් ආවෝද යන්න අරබයා වූ රහස ගැන කෙරෙන ලැජ්ජා රහිත, නපුරු කතා නිසා මට බිය මුසු පිළිකුලක් ඇති විය. මා දැඩි ලෙස වටකොට තිබුණු

"ආලයෙන් " අහකට තල්ලු වී යාමේ හැඟීමක් ඒ නිසා මසිත උපනි. "ආලය" යනුවෙන් මසිතෙහි දැඩි ලෙස ඇතිවූයේ අපවිත්‍ර අවිචාරවත් ජීවිතයකි. ගැහැනුන්ගේ එම ලජ්ජා රහිත නපුරු කතා හිම කාලයේ පිරිසුදු නැවුම් හිමවලට පවා වසාලිය නොහැකි විය.

ඒ කෙසේ වතුදු, රෙදි අපුල්ලන ගැහැනුන්, මුළුතැන්ගෙවලදී යුද්ධ නිලධාරීන්ගේ ආවතේවකාරයන් වන දෙන්ෂික් සෙබළුන්, බිම් ගෙවල්වලදී පස් කපන, වළවල් හාරන කම්කරුවන් ආදීන් සමඟ කතාබහ කිරීම, ඒකතානමය කතා බහ සහ වැටහීමත්, සිත කලකිරවන පාළු ගතියක් ඇති කරන ගෙදර සිටිනවාට වඩා ඉමහත් ලෙස සිත් ඇද ගන්නාසුලු විය. ගෙදර ස්වාමිවරුන් ජීවත් වූයේ ආහාර ගැනීම, ලෙඩ රෝග, ලහිලහියේ ආහාර පිසීමට සූදානම් වීම, නිදා ගැනීමට එලෙසින්ම ලැහැස්ති වීම ආදී දේවලිනි. ඔවුහු පවු ගැනත්, මරණය ගැනත් කතා කළ අතර, එයට බියවූහ. ඔවුන් හැසුරුණේ වංගෙඩියට හසු වුණු ධාන්‍ය ඇට මෙන් කොයි වේලේ මෝල්ගහට යටවී විනාශ වෙතිද යන බියෙනි.

නිවාඩු වේලාවලදී මා මඩුවට ගියේ දර පැළීමට සහ හුදෙකලාව සිටීමටය. එහෙත්, එලෙස තනිව සිටීමට ඉඩක් ලැබුණේ කලාතුරකිනි. දෙන්ෂික් සෙබළු විත් ගෙවත්තේ සිදුවීම් ගැන විස්තර කළෝය.

අන් අයට වඩා මඩුවට පැමිණියෝ යෙර්මෝහින් සහ සීදරව්ය. යෙර්මෝහින් උසය, කුදුය, ඔහු කලුගා පෙදෙසේ උපන්නෙකි. ඔහුගේ සිරුර ශක්තිමත් මස් පිඬුවලින් පිරිලාය. හිස කුඩාය, දෙනෙත් පැහැදිලිය. කම්මැළියකු වූ ඔහු, පල්මෝඩයෙකි. ඔහු ගමන් කළේ සෙමිනි. නුහුරු ලෙසිනි. ගැහැනියක දුටු විට ඔහු වස්සෙකු මෙන් හඬ නඟා ඇගේ දෙපා ඉදිරියෙහි ඇද වැටීමට මෙන් ඉදිරියට නැමෙයි. ඔහු ඉතා ඉක්මනින් කුස්සි අම්මලා, මෙහෙකාරියන් අබිබවා ක්ෂණික ලෙස ජය ගන්නා සැටි දකින අනික් මෙහෙකරු පිරිස් මවිත වෙති. එමෙන්ම, වලසකු බඳු ඔහුගේ කාය ශක්තිය නිසා ඔහුට බිය වූහ. තුලා පෙදෙසේ උපන් සීදරව් කෙට්ටු, කටු ගොඩකි. ඔහු නිතර දොම්නසිනි, කතා කළේ සෙමිනි,

කැස්සේද පරෙස්සමිනි. ඔහුගේ දෙනෙත් බිය නිසාම දිලිසිණි. පාළු, ඇඳිරිමුලු බැලීමට ඔහු ප්‍රිය කළේය. යමක් ගැන ඔහු පහත් හඬින් මුමුනා කියයි. නැතිනම් නිහඬව සිටී. වඩාත් ඇඳිරි මුල්ල දෙස ඔහු හැමදාම බලයි.

"නුඹ බලන්නෙ මොනවද?"

"සමහර විට මීයෙක් දුවයි. මීයන් සද්ද නොකර දුවන හැටි බැලීමට මා කැමතියි." හේ පවසයි.

මේ දෙන්ෂික් සෙබළුන්ගේ ලියුම්, ආලය පිළිබඳ හොර ලියුම් ආදිය ලියන්නේ මාය. එය මගේ සිත් ගත්තේය. අනික් අයට වඩා සීදරව්ගේ ලියුම් ලිවීම මා සිත්ගත් වැඩකි. ඔහු සෑම සෙනසුරාදාවක් පාසාම නොකඩවා ඔහුගේ නංගීට ලියුමක් බැගින් යැවීය.

ඔහු ඔහුගේ කුස්සියට මා කැඳවා මා අසලින් පුටුවෙක වාඩිවී, හිසකේ කොටට කපා ඇති ඔහුගේ හිස තදින් පිරිමදිමින්, මගේ කනට ඔහු කට ළං කොට පටන් ගනී.

"ඉතින් ලියාපන්, ඉස්සෙල්ලාම ලියුමක් ලියන විට ලියන දේවලින් පටන් ගනින්, ආදරණීය මගේ නංගියේ, නුඹට දීර්ඝායු පතනවා. ඒ වගේ දේ ලියාපන්, නංගි එවාපු රූබලය ලැබුණා. බොහොම ස්තුතියි. නමුත්, මට සල්ලි එවන්න එපා. මට කිසි දෙයක් ඕන නැහැ. අපි හොඳට ජීවත් වෙනවා. මොන හොඳක්ද බල්ලන් වගෙයි ජීවත් වන්නේ. නුඹ එහෙම ලියන්න එපා. හොඳින් කියලා ලියාපන්. මගේ නංගි පුංචියි. වයස අවුරුදු දාහතරයි. එයාට ඒ ගැන දැනගන්න ඕන නැහැ නෙවද? දැන් ඉතින් ලියාපන් නුඹට උගන්වපු හැටියට..."

ඔහුගේ හිසත්, කඳත් මගේ ඇඟට හේත්තු වෙයි. ඔහුගේ උණුසුම් සුවඳ මගේ කනට දැනෙයි. ඔහු කතා කරන්නේ රහසක් කියන්නාක් මෙනි.

"ඇයව බදා ගැනීමටත්, ඇගේ පපුව අත ගෑමටත් කොල්ලන්ට ඉඩ දෙන්න එපයි කියල ලියාපන්. කවුරු හරි ඇයට ලස්සන වචනවලින් කතා කරනවා නම් ඌව විශ්වාස කරන්න එපයි කියල ලියපන්. එහෙම කතා කරන එකා ඇයව රවටලා ඇයව විනාශ කරන්න හදනවා..."

ඔහුට ඇතිවූ කැස්ස මැඩ ගැනීමට ඔහු පරිශ්‍රම දැරීම නිසා, අළු පැහැති ඔහුගේ මුහුණ රත් පැහැ ගත්තේය.

ඔහු දෙකොපුල් පුප්පා ගත් විට, දෙනෙත් කඳුළින් පිරිණි. ඔහු මා තල්ලු කරමින් පුටුවේ පැද්දිණි.

"නුඹ මට බාධා කරනවා!"

"ඒකට කමක් නැහැ. නුඹ ලියපන්! හාමු මහත්තුරුන්ව විශ්වාස කරන්න එපා. උන් ලොකුම බොරුකාරයෝ. උන් නුඹව දූෂණය කරලා අත් හැරලා දාවි. මහත්තුරු නුඹව රැවටීමට ලස්සන වචන කියාවි. උන් ඒවා හොඳට දන්නවා. නුඹ උන්ව විශ්වාස කළොත්, නුඹ විනාශයි. නුඹට යන්න වෙන්නේ ගණිකා මඩමටයි. රූබලයක් එහෙම එකතු කර ගත්තොත් පල්ලියෙ සුවාමිට දීපන්, වඩාත් හොඳයි පොළොවේ කොතැන හරි වළලාපන්. වළලපු තැන හොඳට මතක තබා ගනින්."

බෙලෙක්කයකට හුළං පහර වදින විට නැගෙන හඬට සමාන එම හඬ ඇසීමෙන් දැඩි කනගාටුවක් උපදී. මම ගිනි උදුනේ දුම් බටය දෙසත්, පිඟන් කෝප්ප තබා අති අල්මාරිය දෙසත් බලමි. අල්මාරියේ මැස්සන් පිරිලාය. කුස්සිය සිතන්න බැරි තරම් කුණුවලින් පිරී පවතී. හැම තැනම මකුණෝය. බැදපු තෙල්වලත්, බූමි තෙල්වලත්, දුම්වලත් ගඳ දැනෙයි. උදුන අසල කැරපොත්තෝ දුවති. සිත කය දුකෙන් පිරේ. මේ සෙබළාත්, ඇගේ නංගිත් නිසා ඇඬීමට තරම් සිත් වේදනාවෙකි. මෙවන් තත්ත්වයක් යටතේ හොඳින් ජීවත් වීමට පුළුවන්ද?

සීදරව්ගේ වචනවලට සවන් නොදී ජීවිතය හා ජීවත්වීම කොතරම් පාළුද, දුකක්ද යන්න ගැන මම ලියමි. ඔහු සුසුම් ලමින් මට මෙසේ පවසයි:

නුඹ ගොඩක් ලියනවා. නුඹට ස්තුතියි. දැන් නංගි දැනගන්න ඕන බිය විය යුත්තේ මොනවාටද කියල...."

"කිසි දේකට බය වෙන්න ඕන නැහැ." යි මා තරමක කෝපයෙන් කියන්නේ බොහේ දේවලට මාත් බියවීම නොතකමිනි.

සීදරව් කහිමින් සිනාසෙයි.

"පුදුම කොල්ලෙක්! බය නොවී පුළුවන්ද? ලොකු මහත්තුරු? දෙවියන් වහන්සේ? ඒ විතරක්ද!"

නංගීගෙන් ලියුමක් ලැබුණු විගස ඔහු මා සොයා විත් නොසන්සුන් ලෙස ඉල්ලා සිටී.

"කරුණාකරලා කියවාපන් ඉක්මනට..."

කුරුමිණි අත් අකුරුවලින් ලියූ ඒ ලියුම් ඉතා කෙටිය. අදහස් අතින් හිස්ය. එනමුදු, ඔහු එය මා ලවා තෙවරක් කියවා ගනී.

ඔහු කරුණාවන්ත, මෘදු මිනිහකු වුවද, අනික් හැම දෙනකු මෙන්ම, ගැහැනුන් කෙරෙහි දැක්වූයේ බල්ලකු මෙන් ගොරහැඩි සරල ආකල්පයෙකි. මවිත වන එමෙන්ම, පිළිකුල් සහගත ක්ෂණිකතාවකින් මුල සිට අග දක්වා වර්ධනය වන එම සබඳතාවන් කෙරෙහි කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ නිරීක්ෂණය කරන මා දුටුවේ සීදරව් ගැහැනුන් කෙරෙහි තම සෙබළ ජීවිතය අරබයා අනුකම්පාවක් දක්වාලීමට ඔවුන්ගේ දයාබර හදවත් උසිගන්වන සැටිය. ඔහු හුරතල් වචනවලින් ගැහැනිය මත් කොට, ඉන් ඉක්බිතිව ඔහුගේ ජයග්‍රහණය ගැන යෙර්මෝහින්ට කියන සැටිය. එවිට, ඔහු තිත්ත කසායක් පානය කළ පරිදි මුහුණ ඇඹුල් කරගෙන කෙළ ගසයි. ඒ නිසා මා කිපුණෙන්, ඔවුන් ගැහැනුන් රවටන්නේ මන්ද, ඔවුනට බොරු කියා පසුව ඔවුන් අවඥාවට ලක් කරන්නේ මන්ද, ඔවුන් පාවාදී, ඔවුන්ට ගුටි බැට දෙන්නේ මන්ද? ආදි ප්‍රශ්න සීදරව්ගෙන් ඇසීමි.

ඔහු සෙමින් සිනාසී මෙසේ පැවසීය:

"නුඹ ඒ ගැන සැලකිලි දක්වන්න එපා. ඒවා සියල්ල නරක වැඩ. පව්! නුඹ තවම පුංචියි, ඒවාට තව කල් තියෙනවා.

දවසක් දා මම ඔහුගෙන් වඩාත් නියත උත්තරයක් ලබා ගත් අතර, එය මගේ සිතෙහි නොමැකෙන සේ රැඳිණි.

"නුඹ හිතන්නේ මා ඒකිව රවටන බව ඒකි දන්නෙ නැතැයි කියලද?" ඔහු මගෙන් ඇසීය. මා දෙස බලා ඇසක් අඩවන් කොට කහිමින් ඔහු මෙසේද කිව්වේය:

"ඒකි ඒ ගැන දන්නවා! ඒකි කැමතියි. ඒකිව රවට්ටනවාට. ඒ වැඩේදි හැම දෙනාටම ලජ්ජාවක් දැනෙනවා. කිසිකෙනෙක් කාටවත් ආදරයක් නැහැ. නිකම් ආසාව පිරිමහ ගන්නවා විතරයි. මේක මහා කැත ලජ්ජා ඇති වැඩක්. නුඹ ලොකු වුණාම නුඹටම දැනගන්න ඇහැකි වේවි. ඕන කරන්නේ රාත්‍රිය විතරයි.

දවල්ට නම් අන්ධකාරය තියෙන තැනක ගබඩා කාමරය වගේ තැනක්. ඔය වැඩේ නිසා දෙවියෝ මිනිහාව දිව්‍ය ලෝකයෙන් පන්නා දැම්මා. සියලු අවාසනාවට මුල ඔය දේ තමයි."

ඔහු කොතරම් යහපත් ලෙස සහ කනගාටුවෙනුත්, පසුතැවිල්ලෙනුත් කතා කළේදයත්, ඔහුගේ "ගෑනු හුටපට" ගැන මම තරමක සාමකාමී ලෙස බැලීම්. මම සීදරව් කෙරෙහි දෙර්මොහින්ට වඩා වැඩි මිත්‍ර ආකල්පයක් දැක්වීම්. යෙර්මෝහින්ට මා දැඩිව වෛර කළ අතර, ඔහු අවඥාවට ලක් කිරීමට හා කුප්පාලීමට මම වෑයම් කළෙම්. එසේ කිරීමට මා සමත් විය. ඔහු සමහරදාට මාත් සමඟ ගෙවත්තට දිව ගියේ, නරක අදහසක් ඇතිවය. ඔහුගේ නුහුරුකම නිසා ඔහුට එවැනි දේ කිරීමට හැකි වූයේ ඉඳ හිටලාය.

"ඒ වැඩ කිරීම තහනම්" සීදරව් පැවසීය.

තහනම් දේ මොනවාද යන්න මම දැන සිටියෙමි. ඒ නිසා මිනිසුන් අවාසනාවන්තයන් වූහයි යන්න මම විශ්වාස නොකළෙමි. ඔවුන් අවාසනාවන්තයන් බව මා දැන සිටියද එය විශ්වාස නොකළේ ආලයෙන් පසුවුණු මිනිසුන්ගේ නෙත්වල අපූරු ප්‍රකාශනයක් නිතර පාහේ දුටු බැවිනි. ආලයෙන් පසුවන අයගේ විශේෂ දයාබර ගති මට හැඟිණි. එවැනි දේ දකින විට හදවත පිනා යයි.

ඒ කෙසේවුවද, ජීවිතය කාන්සියත්, ක්‍රෑරත්වයත් ගෙන දෙන බව මට හැඟුණු සැටි මට මතකය. මා දිනපතාම දුටු ඒ හැඩයන් හා සබඳතාවන් තුළ එය අඛණ්ඩව පැවැතිණි. මෙය යහපත් කිරීමේ හැකියාවක් එදා මම නොදිටිමි. හැමදාම දෙනෙත් ඉදිරිපිට දකින දේ එලෙසින්ම පවතිනු ඇතැයි යන්න මගේ හැඟීම විය.

එහෙත්, දවසක් දා මගේ සිත බෙහෙවින් කැලඹෙන කතාවක් සෙබළු මට පැවසූහ. අපේ නිවසේ එක් කාමර පන්තියක නගරයේ ඉතාම හොඳ ඇඳුම් මසන්නාට ඇඳුම් කපා දෙන දක්ෂ ශිල්පී කෙනෙක් සහ ඔහුගේ බිරිඳ ද වාසය කළහ. ඔහු රුසියන් ජාතිකයෙක් නොවීය. ඔහුගේ බිරිඳ ප්‍රමාණයෙන් කුඩා, මිටි එකියකි. ඇයට ළමයින් නොසිටියේය. ඈ උදේ සිට රෑ වන තුරු පොත්

කියැවුවාය. මිනිසුන් පිරී ඇති ගෙවත්ත, බේබද්දන්ගෙන් පිරී ඉතිරී ඇති කාමර ආදිය නොතකා මේ දෙදෙනා අන් අයට නොපෙනෙන පරිදි නිහඬව වාසය කළහ. ඔවුන් බැලීමට අමුත්තන් නොපැමිණි අතර, උත්සව දවස්වලදී නෘත්‍ය බැලීම හැරුණු විට, වෙනත් දේවලට ඔවුහු සහභාගි නොවූවෝය.

රෙදි කපන ශිල්පියා උදේ සිට හවස් වනතුරු රෙදි සාප්පුවේ වැඩ කළේය. ඔහුගේ බිරිඳ බාහිර පෙනුම අනුව ගැටවරියකට සමාන වූවාය. සතියකට දෙවරක් දිවා කාලයේදී පුස්තකාලයට ගියාය. පටියකින් බැඳි පොත් මිටියක් ඇතැතිව ළඟ ළඟින් පියවර තබමින් වේල්ල දිගේ යන මේ කාන්තාව විද්‍යාල ශිෂ්‍යාවක් මෙනි. ඇගේ පෙනුම සරලය, ප්‍රියංකරය, අලුත්ය. ඇගේ කුඩා අත් වසා තිබුණේ පවිත්‍ර අත්වැසුම්වලිනි. ඇගේ මුහුණ කිරිල්ලියකගේ මෙනි. දෙනෙත් කඩිසරය. කණ්ණාඩි මේසයක තබා ඇති පිඟන් බෝණික්කකුට ඈ සමානය. ඇය වැනි, වැනී ගමන් කරන්නේ ඇගේ දකුණුපස ඉළ ඇටයක් නැති බැවිනැයි සෙබළු පැවසූහ. එහෙත්, ඇගේ ගමන අනික් කාමර පන්තිවල සිටින යුද්ධ නිලධාරීන්ගේ බිරියන්ගේ ගමන් විලාසයට අසමාන නිසා එය මගේ සිත් ගෙන තිබිණි. මෙය මෙසේ වූයේ ඔපිසර බිරියන්ගේ උස් කටහඬ, හැඩ වැඩ සහිත ඇඳුම් පැලඳුම් ආදිය නොතකාය. ඔවුන් බොහෝ කලක් තිස්සේ ඇඳිරි පෙට්ටගම්වල දමා පසුව එළියට ඇදගත් පරණ බඩුවලට සමාන විය.

අලුත් ඇඳුම් සඳහා රෙදි කපන ශිල්පියාගේ බිරිඳ ඔල්මාදකාරියෙකැයි සෙබළු සිතූහ. ඈ බොහෝ ගොඩක් පොත් කියවා ඇති බැවින් ඇගේ සිහිය විකල් වී ඇති නිසා ඇයට ගෘහ පාලනය කළ නොහැකි යැයිද, මෙම හේතුව නිසා ඇගේ ස්වාමිපුරුෂයා කඩපොළට ගොස් ආහාර පානාදිය මිලදී ගෙන දවල් හා රාත්‍රී ආහාරයට පිළියෙල කළ යුතු දෑ ගැන කුස්සි අම්මාට නියම කරන්නේ යැයිද, ගෙවත්තේ යුද්ධ නිලධාරීන්ගේ මෙහෙකාර සෙබළු කියන්නට වූහ. කුස්සි අම්මාද රුසියානු නොවන, විශාල සිරුරැති ගැහැනියකි. මූසල පෙනුමක් ඇති ඇගේ එක ඇසක් රත් පැහැතිය. අනික් ඇස වෙනුවට තිබුණේ කුඩා

සිදුරකි. ගෙදර නෝනාට හරක් මස් සහ ඌරු මස් අතර ඇති වෙනස තෝරා ගත නොහැකි බවත්, දවසක් දා ඈ සලාද කොළ වෙනුවට කරපිංචා කොළ මිලදී ගත් බවත් මිනිස්සු පැවසූහ.

ඔන්න බලන්න කොතරම් ලොකු පැටලිල්ලක්ද!

මේ තිදෙනා මෙම නිවසට අයත් නොවන පිට අය වූහ. හිම කාලයේදී හිම තුෂාරයෙන් බේරීමට සිනීට්සා වර්ගයට අයත් කුරුල්ලන් තිදෙනෙකු විශාල කුකුළු කුඩුවකට රිංගූ සැටියක්, මිනිසුන් වසන විශාල අපවිත්‍ර ගෙයකට ජනේලයේ කුඩා කවාටයෙන් රිංගූ සැටියක් ඔවුන් දෙස බලන විට සිතෙයි.

හිටිහැටියේම මේ දෙන්ෂික් සෙබළු මට ඇය ගැන කතාවක් කීවෝය. ඇඳුම්වලට රෙදි කපන ශිල්පියාගේ කුඩා බිරිඳ අමනාපයට පත් කරවන දුෂ්ට ක්‍රීඩාවක් යුද්ධ නිලධාරීහු පටන් ගෙන ඇත්තාහ. මොවුන් එකා බැගින් එක්, එක් දවස් පාසා ඇයට ලියුම් ලියමින්, ඇයට ආලය කරන බවත්, ඇය නිසා ඔවුන් දුක් විඳින බවත්, ඇගේ රූපය ඉතා සුන්දර බවත් දන්වයි. ඇගේ පිළිතුරු ලියුම්වලින් ඇය අමතක කර දමන ලෙස ඉල්ලා සිටින ඈ, ඔවුනට කරදරයක් වීම ගැන සමාවන ලෙසත්, ඇයට ආලය නොකරන ලෙස දෙවියන් ඔවුනට සලස්වාලන බවත් ලියා දන්වයි. මෙවැනි පිළිතුරක් ලබන මේ ඔපිසරයෙක් තම සගයන් ඉදිරිපිට එය හඬ නඟා කියවයි. එවිට සියල්ලෝම සිනාසෙති. ඊළඟට ඔවුහු එක්වී ඊළඟ ලියුම සාමූහිකව ලියා එකෙකුගේ නමින් ඇයට එය තැපැල් කරති.

මේ සිද්ධිය මට විස්තර කළ නිලධාරීන්ගේ මෙහෙකාර සෙබළු අර ගැහැනියට බැණ වැදුණහ:

"ඒ නොණ්ඩිච්චි අවාසනාවන්ත මෝඩියක්." යෙර්මෝහින් බැරැඬි හඬින් පැවසීය. සීදරව් ඔහුගේ මතයට එකඟ වෙමින් සෙමින් කතා කළේය.

"හැම ගෑනියකුම කැමතියි, ඒකිව රවට්ටනවට. ඒකි හැම දෙයක්ම දන්නවා...."

ශිල්පියාගේ බිරිඳ ඒ ගැන දන්නා බවක් විශ්වාස නොකළ මම, ඇය සිනහවට ලක් කරන සැටි ඇයට දන්වා සිටීමට

තීරණය කළෙමි. ඇගේ කුස්සි අම්මා ආහාර ගබඩා කර ඇති බිම් ගෙයට ගිය අවස්ථාවක් බලා මම ගෙයි පසු පස ඇති 'හොර' පඩිපෙළ දිගේ ඇගේ කුස්සියට වැදුණෙමි. එය හිස් බැවින් කාමරයට ගියෙමි. ඈ මේසය අසල වාඩි වී සිටියාය. එක් අතක රත්තරන් වැඩ දැමූ කෝප්පයකි. අනික් අතේ දිග හැරිය පොතකි. බිය වූ ඈ පොත පපුවට ළං කර ගෙන සෙමින් නමුදු කෑ ගැසුවාය.

"ඒ කවුද? අව්ගුස්තා! නුඹ කවුද?"

මා ඇයට ඉදිරියට ගොස් ඉක්මනින් කතා කළේ ඇය දැන්, දැන් පොතින් නැතිනම් කෝප්පයෙන් මට දමා ගසතියි යන හැඟීමෙනි. ඈ දම් පැහැති විශාල පුටුවක වාඩිවී සිටියාය. ඇය ඇඟ ලා සිටියේ නිල් පැහැති දිගු කබායක් වැනි ගවුමකි. එහි දෑත් සහ කර රේන්ද ගෙත්තම්වලින් සරසා ඇත. දුඹුරු පැහැති ඇගේ හිසකෙස් කැරැලි ගැසී උරහිසට වැටිලාය. ඈ පුටුවට හේත්තු වී වටකුරු නෙත්වලින් පළමුව කෝපයෙන්ද, අනතුරුව මඳ සිනාව සහිත මවිතයෙකින්ද මා දෙස බැලුවාය. සුරලොව දොරටුව අසල සිටින දේව දූතියකට ඕ සමාන වූවාය.

කීමට අවශ්‍ය වූ දේ මා කී පසු, මගේ චිත්ත ධෛර්යය සිදී ගියෙන්, මම දොර දෙසට පා නැඟුවෙමි. එවිට ඕ කෑ ගැසුවාය.

"නැවතියන්!"

කෝප්පය බන්දේසිය මත තබා, පොත මේසය දෙසට විසිකළද, ඈ දෑත් බැඳගෙන වැඩිහිටි කෙනෙකුගේ හඬින් කතා කළාය.

"කොතරම් අමුතු කොල්ලෙක්ද.... මා ළඟට වරෙන්!"

මම පරිස්සෙමින් ඇයට ළංවීමි. ඈ මගේ අතක් ඇගේ ශීතල ඇඟිලිවලින් අතගා ඇසුවාය.

"මෙහෙම මට කියන්නයි කියලා නුඹට කවුරු හරි ඉගැන්නුවේ නැහැ නේද? හොඳයි මට එය පේනවා. නුඹව විශ්වාස කරනවා. නුඹම සිතලා ආවා."

ඈ මගේ අත මුදා හැර දෙනෙත් වසා ගෙන ඇද පැද සෙමින් මෙසේ කිව්වාය:

"ඉතින් ඔය කිලුටු සොල්දාදුවො ඔහොම කතා කරනවා!"

"ඔබ මේ ගෙය අතහැර දාලා යන්නැ"යි මම ඇයට දැඩි ලෙස කියා සිටියෙමි.

"මක්නිසාද?"

"එවුන් ඔබව යටකර ගනීවි."

ඈ සතුටු ලෙස සිනාසී, පසුව මගෙන් මෙසේ ඇසුවාය:

"නුඹ අකුරු දන්නවද? පොත් කියවීමට ආසද?"

"මට පොත් කියවීමට වේලාවක් නැහැ."

"නුඹ පොත් කියවන්න ආසා නම් නුඹට වේලාවක් හොයා ගන්න පුළුවනි. ඉතින් නුඹට ස්තුතියි!"

ඈ ඇඟිලි තුඩින් රිදී කාසියක් මා වෙත දිගු කළාය. ඒ ශීතල කාසිය ගැනීම මට ලැජ්ජාවෙකි. එසේවතුදු, ඇය ඉදිරියෙහි ප්‍රතික්ෂේප කිරීමට මට ධෛර්යක් නොතිබිණි. පිටවී යන ගමන් මම ඒ රිදී කාසිය පඩිපෙළ දෙපස වූ උසැති ලීස්තරයක් මත තැබීමි.

මට අලුත් වූ කිසියම් හැඟීමක් මම ඒ කාන්තාවගෙන් ලබාගතිමි. මා ඉදිරිපිට අරුණාලෝකයක් ඇති වූ විටෙක මෙන් දවස් කීපයක්ම මා ජීවත්වූයේ ප්‍රීතියකිනි. ඇය වාඩිවී සිටි විශාල කාමරයද, දේවදූතියකට සමාන වූ ඈ හැඳ සිටි නිල් පැහැති ගවුමද සිහිපත් කළෙමි. එම කාමරයෙහි අවට හැම දෙයක්ම මා නොදත් පරිදි ලස්සන විය. ඇගේ දෙපාවලට යටින් රන් නූලින් කළ පලසකි. රිදීවන් වීදුරු තුළින් හිම සහිත ඒ ශීතල දිනය ඇය නිසා උණුසුම් විය.

මට ඇය දෙස තවත් වරක් බැලීමට අවශ්‍ය විය. ඇය හමුවීමට ගොස් ඇගෙන් පොතක් ඉල්ලුවොත් මොනවා වේද?

මා එලෙසම කාමරයට ඇතුළු වූ විට ඈ පෙර දවස සිටි තැනම වාඩි වී සිටියාය. එදා මෙන්ම, අදත් ඇය අත පොතක් විය. එහෙත්, ඇගේ කම්මුල් කිසියම් රතු පැහැති ලේන්සුවකින් වෙළා තිබිණි. ඇසක් ඉදිමිලාය. කළු පැහැති බැම්මක් සහිත පොතක් මට දුන් ඈ අපැහැදිලි යමක් කියමින් මුමුනන්න වූවාය. මා බෙහෙත් සුවඳ සහිත එම පොත අත ඇතිව ඉවත ගියේ ඉමහත් දොම්නසකිනි. මම එම පොත පිරිසුදු කමිසයකින් සහ කඩදාසියෙකින් ඔතා අට්ටාලයේ සැඟවීමි. ගෙදර අයිතිකරුවන් එම පොත

උදුරා ගනිතියිද, නැතිනම් එයට හානි කරතියි ද යන බියක් මසිතෙහි උපනි.

මේ යුවළ 'නිවා' සඟරාවේ දායකයන් වී සිටින්නේ එහි ඇති අලුත් මෝස්තර සහ තෑගි ප්‍රහේලිකා නිසාය. එහෙත්, එය ඔවුන් කියැවූයේ නැත. මෝස්තර චිත්‍ර බලා සඟරාව නිදන කාමරයේ අල්මාරියේ අසුරා වසර අවසානයේදී ඒවා කවරය සහිත බැම්මකින් බැඳ ඇඳ යට තැබීම මොවුන්ගේ සිරිත විය. එහිම 'චිත්‍ර සහිත විමර්ශනය' නමැති කෘතියේ කාණ්ඩ තුනක් තිබිණි. මම ගෙබිම සෝදන විට කිලිටි වතුර එම පොත්වලට වැටිණි. ගෙදර අයිතිකරුවා 'රුස්කි කුරියර්' පුවත්පතට දායකයෙකි. හවස එය කියවන ඔහු බැණුවදී.

"මොවුන් මේ පල් හැලි ලියන්නේ මන්දැයි දන්නේ යක්ෂයා විතරයි. පල් හැලි..."

සෙනසුරාදා රෙදි සෝදා අට්ටාලයේ රෙදි වනන විට මට ඒ පොත ගැන මතක් වූයෙන්, මම එය ගෙන කියවන්නට වීමි. "ගෙවල්ද මිනිසුන් වගේය. ඔවුනට මෙන්ම, ඒවාටද මුහුණුවරක් ඇත." එහි ඇති සත්‍යතාවෙන් මම මවිතයට පත්වීමි. මා හුළං හමන කුඩා කවුළුව ඉදිරිපිට සිටගෙන පොත කියවන්නට වූ අතර, එය නැවැත්වූයේ, තද ශීතල නිසා මා ගැහෙන්නට පටන් ගත් ඉක්බිතිවය. හවස ගෙදර ස්වාමිවරුන් දේව මෙහෙයට ගිය පසු පොත කුස්සියට ගෙන ගොස් මා කියවන්නට වූයේ අවට හැම දෙයක්ම අමතක කර දමමිනි. සරත් සමයේ ගස්වල කොළ මෙන් කහ පැහැති ඒ පොතේ කොළවල මම ගිලුණෙමි. ඒ පොතේ කතා මා ඉතා ලෙහෙසියෙන් වෙනත් ලෝකයකට ගෙන ගියේය. මා අලුත් නම්, අලුත් සබඳතාවක් දැනගත් අතර, එය මට සුහද වීරයන් සහ මා දුටු මිනිසුනට සමාන නොවන නපුරු දුෂ්ටයන් හඳුන්වාලීය. එය ක්සවියේ දෙමොන්තෙපේන්ගේ නවකතාවකි. ඔහුගේ අනික් නවකතා මෙන්ම, මෙයද දිගුය. මා නොදන්නා ප්‍රබෝධවත් ජීවිත ගත කරන මිනිසුන්ගෙන් හා සිද්ධීන්ගෙන් එය ගහනය. එම නවකතාවේ හැම දෙයක්ම මවිතය දනවන තරම් සරලය. පැහැදිලිය. හරියට වෙනත් ලෝකයෙක මෙනි, පේළි අතරින් දයාව සහ දුෂ්ටත්වය කැපී පෙනිණි.

ආදරය කිරීමටත්, වෛර කිරීමටත් ආධාර කරමින්, එකම අවුලෙක පැටලී සිටින මිනිසුන්ගේ ඉරණම ගැන නොසන්සුන් ලෙස සොයා බැලීමට ඒ නවකතාව බල කරයි. මේ ජීවිත සියල්ල කඩදාසිවලින් පැන නැඟි බවක් අමතක කරමින්, එකකුට ආධාර කිරීමටත්, තවත් එකකුට අවහිර කිරීමටත් මා තුළ උපන්නේ අති මහත් ආසාවකි. නවකතාවේ සටන් අරගල නිසා හැම දෙයක්ම අමතක විය. එක් පිටුවක් කියවන විට ප්‍රීති සයුරෙක ගිළුණු මම, අනික් පිටුව කියවන විට ඉමහත් දුකකින් තැවුණෙමි.

ගෙයි දොරේ සීනුව නාදවන තුරුත් පොත කියැවූ මට සීනුව හඬවන්නේ කවුද, කුමක් නිසාද යන්න එකවර වටහා ගැනීමට නොහැකි විය.

ඉටිපන්දම සම්පූර්ණයෙන්ම පාහේ දැවී ගොසිනි. අද උදෑසන මවිසින් සුද්ද කරන ලද ඉටිපන්දම් සිටුවන තැටිය පුරා ඉටි වැහිරිලාය. දේවරූප ඉදිරියේ නොකඩවා දැල්විය යුතු පහන නිමිලාය. එය නොනිවා තබා ගැනීම මා සතු එක් කාර්යයකි. මම මගේ අපරාධ සඟවා ලීමට තැත් කළෙමි. පොත උඳුන යට ඇති කුහරයෙහි සඟවා. නිවී ගිය පහන යළිත් පත්තු කිරීමට මහන්සි ගත්තෙමි. එහා කාමරයේ සිට ළමයින් බලා ගන්නා ආයා ගැහැනිය විත් මට කෑගැසුවාය.

"නුඹ බිහිරි වෙලාද? සීනුව හඬවනවා!"

මම ඉදිරියට පැන දොර හැරියෙමි.

"නිදාගත්තද? දැඩි ලෙස ගෙහිමියා ඇසුවේය. හතිලමින් පඩිපෙළ නැඟගෙන ආ ඔහුගේ බිරිඳ මා නිසා ඇයට හෙම්බිරිස්සාව හැදුණු බව කියමින් මට බැණ වැදුණාය. මැහැල්ලද මට දොස් පවරන්නට වූවාය. කුස්සියේ ඇති ඉටිපන්දම් කොටය දුටු මැහැල්ල වහාම මගෙන් ප්‍රශ්න කිරීම ආරම්භ කළාය.

ඔවුන් මගේ පොත සොයා ගනිතියි යන භීතිය නිසා අඩපණ වූ මම, නිහඬව සිටියෙමි. මා ගෙට ගිනි තබතියි ඈ චෝදනා කරමින් බැණ වැදුණාය. ගෙහිමියා සහ ඔහුගේ බිරිඳ රාත්‍රී ආහාරය ගැනීමට කුස්සියට පැමිණි විට මැහැල්ල මට විරුද්ධව චෝදනා ඉදිරිපත් කරන්නට වූවාය.

''ඔන්න බලාපල්ලා මුළු ඉටිපන්දමක් ඉවර වෙන තුරු පත්තු කරලා. මූ මේ ගෙටත් ගිනි තියාවි.''

ආහාර ගැනීමෙන් ඉක්බිතිව ඔවුහු සතර දෙනාම මා දැනුවත්ව හා නොදැනුවත්ව කළ වැරැදි ගැන සඳහන් කරමින් මට විනාශය අත්වන බව කියමින් දොඩවන්නට වූහ. මොවුන් මෙතරම් පල්හැලි දොඩවන්නේ ඔවුන්ගේ දුෂ්ටත්වය නිසා හෝ දයාන්විතභාවය නිසා හෝ නොවන බවත්, එයට හේතුව ඔවුන් පාළු ගතියකින් පෙළීම බවත්, ඒ වනවිට මම පසක් කරගෙන සිටියෙමි. මන්දයත්, පොතින් මා දැනගත් මිනිසුන් සමඟ මොවුන් සන්සන්දනය කරන විට මොවුන් කොතරම් පුහු මිනිසුන්ද යන්න දුටු මා පුදුමයට පත් වූ බැවිනි.

බඩ කට පුරා ආහාර ගත් පසු කුසීතයන් බවට පත්වූයෙන්, ඔවුහු නිදා ගැනීමට ගියහ. මැහැල්ල ඇගේ දුක්ගැනවිලි මගින් දෙවියන්ට කරදර කොට උදුනේ මැස්සට නැඟ නිදාගන්නට වූවාය. එවිට මම උදුනේ කුහරයට යටින් ඇති පොත අතට ගෙන ජනේලය අසලට ගොස් සඳ එළියේ ආධාරයෙන් පොත කියවන්නට පටන් ගතිමි. එහෙත්, අකුරු ඉතා කුඩා වූ නිසා එය කියවීමට නොහැකි විය. කියවීමට ඇති ආසාව සීමා රහිතය. තඹවන් හැළියක් ගෙන එය සඳරැස්වලට අල්වා පොත කියැවීමට තැත් කළද, එය නොහැකි වූයේ සඳරැස් වඩාත් ඇදිරි වූ බැවිනි. එවිට මම දේව රූප ඉදිරියේ තබා ඇති පහන් අසලට නැඟ එම ආලෝකයේ ආධාරයෙන් කියවන්නට පටන් ගතිමි. විඩාපත්වූ මා මටම නොදැනුවත්ම මෙන් බංකුව මත වාඩිවී නින්දට වැටී සිටි අතර, මැහැල්ලගේ කෑගැසීම හා තල්ලු කිරීම නිසා අවදිවුණෙමි. මැහැල්ල මගේ පොත උදුරාගෙන මගේ උරහිස්වලට වැරෙන් ගැසුවාය. කෝපයෙන් රතු වූ ඇ පිස්සියක මෙන් හිස සලමින්, පාවහන් රහිතව, රාත්‍රියට අදින ලෝගු කමිසය පිටින් මා ඉදිරියේ සිටී. කුස්සියේ ලී ඇඳෙහි නිදා සිටි ඇගේ බාල පුත් වික්තර් ඇයට සැරවී කෑගසයි.

"අම්මේ, බෙරිහන් දෙන්න එපා! මෙතැන ජීවත්වීමට බැහැ...."

"පොත විනාශ වුණා... ඉරලා දමාවි." මම සිතීමි.

උදෑසන ආහාර ගනිද්දී මට විරුද්ධව නඩු විභාගය පැවැත්විණි. ගෙහිමියා මගෙන් දැඩි ලෙස ප්‍රශ්න කළේය.

"පොත ලබා ගත්තේ කොහින්ද?"

ගැහැනු දෙදෙනා කෑගසන්නට වූහ. වික්තර් සැක සිතින් පොත සිඹිමින් කතා කළේය.

"සැන්ට් පුසුඔයි. දෙවියම්පා ඇත්ත."

මේ පොත මට ලැබුණෙ පූජකයාගෙනුයි මා කී විට ඔවුහු එම පොත බලමින්, පූජකයා නවකතා කියවතියි පවසමින් මවිතයට පත් වූහ. කෙසේවුවද, එය තරමක් ඔවුන් සන්සුන් කළේය. එහෙත්, පොත් කියැවීම නරක එමෙන්ම භයානක දෙයක් බව මට බොහෝ වේලාවක් තිස්සේ ගෙහිමියා ඒත්තු ගැන්වීය.

"ඔය පොත් කියවන අය දුම්රිය පාර පුපුරුවා දැමුවා. උන්ට ඕන වුණා මිනී මරන්න...."

එවිට ඔහුගේ බිරිඳ කෝපයෙන් සහ බියෙන් ඔහුට බැණ වැදුණාය.

"ඔයාට පිස්සු හැදිලද? ඔයා මේ කොල්ලට කියන්නෙ මොනවාද?"

මම සීදරව් වෙත මොන්තෙපේන්ගේ නවකතාව ගෙන ගොස් ඔහුට සිදුවූ දේ විස්තර කළෙමි. ඔහු පොත ගෙන එය පිරිසුදු තුවායකින් ඔතා, ඔහුගේ පෙට්ටගමෙහි සඟවා මෙසේ පැවසීය:

"නුඹ ඒ ගොල්ලන්ගේ කතා අහන්න එපා. නුඹ මා ළඟට ඇවිත් කියවාපන්. මම කිසිවකුට ඒ ගැන කියන්නේ නැහැ. නුඹ ආ විටෙක මා නැති නම් පෙට්ටගමේ යතුර දේව පින්තූරයට පිටිපස්සෙන් තියෙනවා. පෙට්ටගම ඇරලා කියවාපන්..."

ගෙදර ස්වාමිවරුන් පොත් කෙරෙහි දැක්වූ ආකල්පය නිසා පොතට මම වඩාත් ගරු කරන්නට වීමි. පොත් වැදගත් බවත්, එයින් ඉතා ගැඹුරු රහස් දැනගත හැකි බවත් මට අවබෝධ විය. කිසියම් කියවන්නන් නැතිනම් පාඨකයන් පිරිසක් කිසියම් තැනෙක දුම්රිය මාර්ගයක් පුපුරුවාලීම මම ගණන් නොගත්තෙමි. පව් සමාකර ගැනීමට ගිය විට පූජකයා මගෙන් ඇසූ ප්‍රශ්නයත්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයා බිම් ගෙයි පොත් කියවූ සැටිත්, 'නියම පොත්' තිබෙන

බව ස්මූරි පැවසූ සැටිත්, පර්මසොන්වරුන්ගේ කළු පොත් ගැන සීයා කළ විස්තරයත් මට මතක් විය.

"දේවාශීර්වාද ලත් අලෙක්සාන් දර්පාව්ලිච්ගේ රාජ්‍ය සමයේදී රදල කුලීනයෝ කළු පොතටත්, පර්මසොන්වාදයටත් යට වෙලා. රුසියානු ජනතාව රෝමයේ පාප්තුමාට පාවාදීමට කුමන්ත්‍රණය කළා. උන් ජේසු ගැතියො. එතැනදී අරක්චේයෙව් යුද්ධ සෙනෙවියා උන්ව අල්ලා ගත්තා. උන්ගේ රදල කුලීන පට්ටම් සියල්ල නොතකා, උන්ව සයිබීරියාවට පිටුවහල් කළා. බරපතළ වැඩ ඇතිව. එහෙදී උන් ගැරඬියෝ වගේ මළා."

"තරු සහිත උම්බ්‍රාකුල්." "ගෙර්වසී" සහ අනිකුත් ශබ්ද උපදවන උපහාසාත්මක වචන මට සිහිවිය.

"අපේ වැඩ ගැන කුතුහලය දක්වන විකටයනි! නුඹලාගේ දුර්වල ඇස්වලට ඒවා බලනු නොහැකිය!"

ශ්‍රේෂ්ඨ රහස් දැනගැනීමට මා ළංවී සිටිතියි යන හැඟීමක් මට ඇතිවූයෙන්, මම පිස්සකු මෙන් හැසුරුණෙමි. පොත කියැවීමට ආසාවක් උපන් අතර, සෙබළා එය නැති කරතියි යන බියක් මට ඇති විය. නැතිනම් ඔහු ඒ පොත ඉරනු ඇත. එසේ වුවහොත් ශිල්පියාගේ බිරිඳට මා කුමක් කියන්නද? මා සෙබළා වෙත යනු වැළැක්වීම සඳහා මැහැල්ල අති මහත් ආයාසයක් දැරුවාය. ඒ අතර ඈ බැණ වැදුණාය.

"පොත් ගුල්ලා!" පොත් නරක වැඩවලට පොලඹවනවා. අන්න අර පොත් කියවන ගැනිට කඩපොළට යාමටවත් දන්නෙ නැහැ. ඒකි අර ඔපිසරයන් එක්ක හුටපට ඇතිකරගෙන, දවල්ට ගෙදරට ඔපිසරලාව ගෙන්න ගන්නවා. ඒක මම දන්නවා!"

මට කෑගැසීමට සිත්විය.

"ඒක ඇත්ත නොවේ. ඈ නිලධාරීන් එක්ක හැසිරෙන්නෙ නැහැ."

එහෙත්, මම ශිල්පියාගේ බිරිඳ ආරක්ෂා කිරීමට ඉදිරිපත් නොවීමි. මා පොත් ලබා ගන්නේ කොහින්ද යන්න මැහැල්ල දැනගත්තොත්?

දවස් කීපයක් තිස්සේ මම ඉමහත් කරදරයකින් ජීවත් වුණෙමි. මා ඉමහත් පාළු ගතියකින් සහ අසහනයකින්

පෙළුණු අතර, මොන්තෙපේන්ගේ නවකතාවලට මොනවා වෙතිද යන බියෙන් මට නිදාගැනීමට පවා නොහැකි විය. දවසක්දා ඇඳුම් කපන ශිල්පියාගේ කුස්සි අම්මා ගෙවත්තේදී මා හමුවූවා, මෙසේ කිව්වාය:

"පොත ගෙනැවිත් බාරදීපන්!"

අපේ ගෙදර ස්වාමිවරුන් දිවා ආහාරය ගෙන නිදාගත් විට, මා මට පොත දුන් කාන්තාව හමුවීමට ගියේ ව්‍යාකූලත්වයකින් සහ දුක්බර හැඟීමෙකිනි.

ඇය මා පිළිගත්තේ පළමුවර පිළිගත් ආකාරයටමය. ඇගේ ඇඳුම පමණක් වෙනස් විය. අළු පැහැති සායකින් හා කළු වෙල්වට් හැට්ටයකින් ඕ සැරසී සිටියාය. ඇගේ නග්න ගෙල සරසා තිබුණේ බිර්යුසා කුරුසියෙකිනි. මේ නිසා ඈ ස්නෙගිර් කිරිල්ලියකට සමාන වූවාය.

පොත කියවා හමාර කිරීමට නොහැකි වූ අතර, ඔවුන් මට පොත් කියැවීම තහනම් කර තිබෙන බව මම ඇයට පහදා දුන්නෙමි. මසිතෙහි අමනාපයක් සහ මේ කාන්තාව දැකීම නිසා ප්‍රීතියක් ඇති වූයෙන් දෙනෙත් කඳුළින් පිරිණි.

"අපොයි! කොයිතරම් මෝඩ මිනිස්සුද!" ඈ එසේ කියා සිහින් බැම සඟළ එක් කර ගත්තාය. "ඒ වුණාට නුඹේ ගෙදර අයිතිකරුවාගේ මුහුණ වැදගත්. නුඹ සිත් කලකිරවා ගන්න එපා. මම කල්පනා කරලා නුඹේ හාම්පුතාට ලියන්නම්!"

ඒ නිසා මම බියවීමි. මම මගේ හාම්පුතුනට බොරු කී බවත්, ඒ පොත ලබා ගත්තේ පූජකයාගෙන් යැයි මා කී බවත් ඇයට විස්තර කළෙමි.

"ඔබ ලියන්න එපා! ඒ ගොල්ල ඔබට හිනාවේවි. ඔබට බණීවි. ගෙවත්තේ හැම දෙනෙක්ම ඔබත් සමඟ තරහයි. ඒගොල්ල කියනවා ඔබ මෝඩ කෙනෙක් කියලා. ඔබේ ඉළ ඇටයක් අඩුයි කියලා."

ඒ සියල්ල එක ගොඩට ඇද බෑ පසු වුවමනාවටත් වඩා කතා කළ බවත්, ඇය අමනාපයට පත් කළ බවත් මට වැටහිණි. ඈ උඩුතොල විකාගෙන දණහිසට තට්ටු කරගත්තාය. එය අසකු පිට යන විට මෙනි. පොළොව පළා ගෙන යාමට මට සිතුණෙන්, මම ලජ්ජාවෙන් හිස

පහතට දමා ගත්තෙමි. එහෙත්, කාන්තාව පුටුවෙහි හාන්සි වී මහ හඬින් සිනාසෙන්නට විය. අනතුරුව මෙසේ කිව්වායඃ

"අපොයි, කොයිතරම් මෝඩ වැඩක්ද... කොයිතරම් මෝඩද! ඉතින් මම මොනවා කරන්නද?" ඈ එසේ ඇසුවේ ඇගෙන්ම වුවද, මා දෙස දැඩි ලෙස බලාගත් ගමන්ය. අනතුරුව හුස්ම ඉහළට ඇදගෙන කතා කළාය. "නුඹ මහ පුදුම කොල්ලෙක්. බොහොමත්ම..."

ඇය අසලින් සිටගෙන කණ්ණාඩිය දෙස බැලූ මට ඉදිරියට නෙරා ගිය හකු ඇට සහ පුළුල් නහයක් සහිත මගේ මුහුණ පෙනිණි. එහි නළලේ නිල්වන් ලපයකි. බොහෝ කලක් තිස්සේ කොණ්ඩය නොකැපීම නිසා කෙස්වැටි හැම තැනින්ම දොට්ට පැනලාය. මෙවන් මුහුණක් ඇති මට "මහා පුදුමාකාර කොල්ලෙකු" යැයි කියති. මා අසල සිටින පිඟන් බෝනික්කකු බඳු කාන්තාවට මා නමැති කොල්ලා කොහෙත්ම සමාන නොවේ.

"මා එදා නුඹට දීපු කාසිය නුඹ නොගත්තේ මන්ද?"

"මට සල්ලි ඕන නැහැ."

එවිට ඕ සුසුම් ලෑවාය.

"ඉතින් මොනවා කරන්නද? නුඹට පොත් කියැවීමට අවසර දෙනවානම් මා ළඟට වරෙන්, මම නුඹට කියැවීමට පොත් දෙන්නම්."

කණ්ණාඩි මේසය මත පොත් තුනක් තිබිණි. මා ගෙනා පොත ඉන් වඩාත්ම ලොකු එක විය. මම ඇය දෙස දොම්නසින් යුතුව බැලීමි. ශිල්පියාගේ බිරිඳ මට අතක් දිගු කළාය. එය කුඩාය. රෝස පැහැතිය.

"ඉතින් නුඹට ආයුබෝවන්!" ඕ තෙපලාය.

මම පරෙස්සමින් ඇගේ අත යම්තමින් අල්ලා හණිකට ගෙයින් පිටවීමි.

ඇය කිසිවක් දන්නේ නැතැයි කීම සත්‍යයකි. කොපෙක් විස්සේ කාසිය ගැන ඇය කිව්වේ පොඩි ළමයකු මෙන් නිකම් කාසියක් කියාය.

එහෙත්, එසේවුවද, ඇගේ එම හැඳින්වීම මසිත ගත්තේය.

IX

මා තුළ ඉක්මනින් ඇති වූ පොත් කියැවීමේ ආසාව නිසා කොතරම් බරපතළ අවඥාවලට, අමනාපවීම්වලට සහ අවදානම්වලට මට මුහුණ පෑමට සිදුවීද යන්න දැන් කල්පනා කරන විට කනගාටුවක් මෙන්ම සිනාවක්ද ඇති වේ.

ඇඳුම් කපන ශිල්පියාගේ බිරිඳ මට දුන් පොත් බොහෝ වටිනා ඒවා මෙනි. මා බැළමෙහෙවරකම් කරන ගෙදර මහලු ස්වාමිදූව ඒවා උදුනට දමා පුලුස්සා දමතියි යන බියෙන් මම පසුවීමි. මා ඇගෙන් පොත් ලබා ගැනීමේ අදහස අතහැර දමා, උදේ තේ සඳහා පාන් මිල දී ගන්නා කඩෙන් විවිධ පාටැති කුඩා පොත් කුලියට ගෙන කියවන්නට පටන් ගත්තෙමි.

කඩකාරයා සිත් කලකිරවනසුලු මිනිහෙක් විය. නෑබුලු තොල් ඇති ඔහුගේ මුහුණ සුදුමැලිය. ඉදිමිලාය. ඔහුගේ සිරුරෙන් නිතර ඩහදිය ගලන්නට විය. ඔහුගේ මුහුණේ ලප හා තුවාල කැළැල්ය. ඉදිමුණු ඔහුගේ අත්වල ඇඟිලි කෙටිය. ඔහු කඩිසර බවෙන් තොරය. හවසට ඔහුගේ කඩයට ගැටවරයෝ සහ අපවිත්‍ර චරිත ඇති තරුණියෝ පැමිණෙති. මගේ ස්වාමියාගේ මල්ලී වික්තර්ද බීර බීමට සහ කාඩ් සෙල්ලම් කිරීමට හැමදාම හවස මේ කඩයට පැමිණියේය. රාත්‍රී ආහාර ගැනීමට පැමිණෙන ලෙස වික්තර්ට දන්වා සිටීමට මා නිතර පාහේ එහි යැවීය. කඩ කාමරයට යාබද කුඩා කාමරයෙහි වික්තර්ගේ නැතිනම් වෙනත් ගැටවරයකුගේ දණහිස් මත කඩකාරයාගේ බිරිඳ වාඩි වී සිටින සැටි මම දැක ඇත්තෙමි. මෝඩ පෙනුමක් ඇති ඈ, රතු පැහැතිය. මේ නිසා කඩකාරයා අමනාපයට පත් නොවන හැඩයි. ඔහුගේ නංගීත් බොහෝ විට වෙළඳ කටයුතුවලට සහභාගි වෙයි. ඇය පල්ලියේ ගී ගයන්නන්, සෙබළුන් සහ අනිකුත් එවැනි තරුණයන් බදාගෙන සිප ගන්නා විට, කඩකාරයා මන්දෝත්සාහී ලෙස ඒ දෙස බලා සිටී. කඩේ වෙළඳ බඩු තිබුණේ ස්වල්පයෙකි. ජාවාරම අලුතින් පටන් ගත් නිසා තවම සෑහෙන තරම් බඩු ගෙන්වීමට නොහැකි වී යැයි කඩකාරයා කිව්වද,

කඩය පටන් ගත්තේ පසුගිය සරත් සමයේදීය. කඩයට එන අයට ඔහු අශෝභන චිත්‍ර පෙන්වූ අතර, අසභ්‍ය කවි පිටපත් කර ගැනීමට කැමති අයට ඉඩ දුන්නේය.

මීෂා යෙව්ස්තිග්නේයෙව්ගේ පුහු පොත් කියැවීම සඳහා මම කොපෙක් එකක් බැගින් ඔහුට ගෙව්වෙමි. කුලිය ඉතා අධික වූ අතර, ඒ පොත් කියැවීම නිසා මට කිසිදු තෘප්තියක් ඇති නොවීය. 'ගුඅාක් හෙවත් නොබිඳෙන විශ්වාසය', 'ප්‍රැන්සිල් වෙනෙට්සිඅාන්', 'කබර්දීන්වරුන්ට විරුද්ධ රුසියානුන් කළ යුද්ධය හෙවත් තම ස්වාමියාගේ සොහොන මත දිවි පිදූ සුන්දර මුස්ලිම් තරුණිය' සහ මෙයට සමාන අනිකුත් පොත් මට කිසිදු තෘප්තියක් නොදිණි. එහෙත්, ඊට ප්‍රතිපක්ෂව ඒවා කියවීම නිසා මම අසහනයකින් පෙළෙන්නට වීමි. සිදු නොවිය හැකි දේ ඉතා බරපතළ වචනවලින් විස්තර කළ ඒ පොත් මා මෝඩයකු මෙන් සලකා මා අවඥාවට ලක්කරන සැටියක් මට හැඟිණි.

'ස්ත්‍රෙල්ට්සි', 'යූරි මිලස්ලාව්ස්කි', 'ගුප්ත පූජකයා', 'යපන්චාතතාර් ජාතික අසරුවා' සහ එවැනි පොත් මගේ සිත් ගත්තේය. එයින් සමහර දේ මසිතෙහි රැඳිණි. 'ශුද්ධවන්තයන්ගේ ජීවිතය' නමැති පොත වඩාත් බැරෑරුම් කෘතියක් වූයෙන්, එහි සමහර දේ මා විශ්වාස කළ අතර, සමහර දේ නිසා මම බොහෝ සේ කැලඹීමට පත්වීමි. ආගම නිසා දිවි පිදූ සියලු ශුද්ධවන්තයන් කිසියම් හේතුවක් නිසා මට හොරෝෂයේ දේලෝ (හොඳ වැඩේ) නමින් හැඳින්වූ පුද්ගලයා සිහිගැන්වූ අතර, සියලු ශුද්ධවන්තියන් ආච්චිට සමාන වී යැයිද, ඉතිරි පුද්ගලයන්, යහපත් මනෝභාවයකින් සිටින විට සීයාට සමාන වී යැයිද මට සිතිණි.

දර පැළීමට මඩුවට ගිය විට, එහිදී පොත් කියවීමත්, සැප පහසුවක් නැති එමෙන්ම, දැඩි ශීතලක් සහිත අට්ටාලයේ සිට පොත් කියවීමත් එක සේ අපහසු විය. එහෙත්, යම් කිසි පොතක් මා සිත් ගතහොත් මම මහ රෑ නැඟිට ඉටිපන්දම පත්තු කරගෙන ඒ පොත කියවීමි. උදේ වන විට ඉටිපන්දම කොට වන සැටි දකින මැහැල්ල හැමදාම රෑට නින්දට යාමට පෙර ඉටිපන්දමේ උස ප්‍රමාණය

මැන, ඒ සඳහා කෝටුව මෙන් පාවිච්චි කළ ලුවීනා කෝටුව සඟවා තැබුවාය. උදේ නැඟිට මැන බලන විට ඉටිපන්දම කෙටි වී තිබුණොත්, නැතිනම් මැහැල්ලගේ කෝටුව හෙවත් ලුවීනා කෝටුව මා සොයාගෙන එය නිසි ප්‍රමාණයට කඩා දැමීමට අසමත් වුවහොත්, ඈ බෙරිහන් දී කෑ ගැසීමට පටන් ගනී. දවසක් දා ඇගේ බාල පුත් වික්තර් ඇඳෙහි වැතිරගෙන කෝපයෙන් කෑ ගැසීය.

"අම්මේ, නුඹ බුරන්නේ නැතුව ඉඳපන්!" මෙතන නිවිහැනේ ඉන්න බැහැ නෙව! සත්තකින්ම ඒ කොල්ලා රෑට ඉටිපන්දම පත්තු කරලා පොත් කියවනවා. ඌ කඩ කාරයාගෙන් පොත් ඉල්ලා ගන්නා බව මම දන්නවා. අට්ටාලයට ගිහින් බලන්න."

මැහැල්ල සැණෙකින් අට්ටාලයට දිවගොස් එහි තිබුණු පොතක් තු, තු කොට ඉරා දැම්මාය.

එයින් මගේ බලාපොරොත්තු සුන් වුවද, පොත් කියැවීමට ඇති අධිෂ්ඨානය තවත් ශක්තිමත් විය. මේ ගෙදරට, ශුද්ධවන්තයෙක් වැඩියොත්, ඔහුට පවා ගුරුහරුකම් දීමට මගේ හාම්පුතා ඉදිරිපත් වන බව මම වටහා ගතිමි. ඔවුන් එසේ කරන්නේ පාළු ගතියකින් පීඩා විඳින බැවිනි. ඔවුන් මිනිසුන්ට විරුද්ධව නඩු තීන්දු දෙන්නේ නැති නම්, මිනිසුන්ට කෑ ගසා ඔවුන් අවඥාවට ලක් කරන්නේ නැති නම්, ඔවුනටම නොපෙනී යනු ඇත. මිනිසා තමාටම අවශ්‍ය යන හැඟීම ඇති කර ගැනීමට නම්, ඔහු මිනිසුන් කෙරෙහි කිසියම් ආකල්පයක් දැරිය යුතුය. මගේ හාම්පුතුන් අසල්වැසි මිනිසුන් කෙරෙහි දැක්වූයේ, ඔවුනට ගුරුකම් කියා දෙන, ඔවුන් හෙළා දකින ආකල්පයෙකි. අනික් මිනිසුන්ද ඔවුන් මෙන් ජීවත්වී, ඔවුන් මෙන්ම, කල්පනා කරමින්, හිඟන්නට පටන් ගත්තද, මගේ හාම්පුතාලා ඔවුන් ඒ හේතුව නිසාම හෙළා දකිනු ඇත්තාහ. ඔවුන්ගේ හැටි එසේය.

මම නොයෙකුත් උපා යොදමින් පොත් කියැවීමට මහන්සි ගතිමි. මැහැල්ල කිප වරක්ම මගේ පොත් ඉරා දැමූ නිසා කඩකාරයාට කොපෙක් හතළිස් හතක් තරම් විශාල මුදලක් මා ණය වී ඇති බව හිටි හැටියේම දැන ගතිමි. මා ණය ගෙව්වේ නැති නම් ඔහු හාම්පුතුනට

අයත් මුදල් මා අතින් උදුරා ගන්නා බව කීවේ තර්ජනය කරමිනි.

"එතකොට නුඹට මොනවා වෙයිද?" ඔහු මට නින්දා කරමින් ඇසුවේය.

ඔහු මට විඳ දරා ගත නොහැකි තරමට මා කුප්පාලීය. මගේ හැඟීම් වටහා ගත් ඔහු, විවිධ තර්ජනයන් කළේ එයින් ඉමහත් සතුටක් ලබමිනි. මා බඩු ගැනීම සඳහා ඔහුගේ කඩයට පැමිණි විට ලප සහිත ඔහුගේ මුහුණ පිම්බෙයි. එවිට ඔහු සුරතල් ලෙස මෙසේ අසයි.

"ණය සල්ලි ගෙනාවද?"

"නැහැ."

එවිට ඔහු බුම්මා ගෙන බිය විය.

"ඉතින් මොනවා කරන්නද? නුඹට විරුද්ධව නඩුවක් දාන්නද? එතකොට නුඹව හිර කඳවුරකට දමාවි, තේරුණාද?"

මුදල් ලබා ගැනීමට තැනක් නැත. මගේ මෙහෙකාර සේවය සඳහා මුදල් ගෙවන්නේ සීයාටය. කුමක් කළ යුතු දැයි නොදැන මම ළතැවීමි. ණය ගෙවීමට කල් දෙන ලෙස මා ඉල්ලා සිටි විට, කඩකරුවා තෙල් තැවරුණු වෙල්ලවැහුමක් බඳු ඔහුගේ අතක් දිගු කොට මෙසේ පැවසීය.

"ඉඳා මගේ අත සිපගනින්! එතකොට කල් දමන්නම්"

කඩ බක්කියේ තිබුණු බඩු කිරන යකඩ පඩියක් අතින් ගත් මා ඔහුට ගැසීමට සැරසුණු විට, ඔහු බියෙන් වාඩිවෙමින්, කෑගැසීය.

"නුඹට මක්වෙලාද, මක්වෙලාද, මම විහිළුවටයි කිව්වේ!"

කඩකරුවා විහිළු නොකරන බව වටහා ගත් මා ඔහුගේ ණය ගෙවීම පිණිස සොරකම් කිරීමට ඉටා ගතිමි. හැමදාම උදෑසන මා හාම්පුතුගේ ඇඳුම් සුද්ද කරන විට, සමහර දවස්වලදී ඔහුගේ කලිසම් සාක්කුවලින් කාසි බිමට වැටේ. එක් වරක් එසේ වැටුණු කාසියක් බිම දිගේ රෑටා ගොස් පඩිපෙළේ සිදුරක් තුළින් දර ගොඩට වැටිණි. ඒ ගැන ඔහුට දැනුම් දීමට මට අමතක වූ අතර, දවස් කීපයකට පසු ඒ කාසිය මම දර ගොඩේ තිබී අහුලා

ගතිමි. මා එම කාසිය හාම්පුතුට දුන් විට එය දුටු ඔහුගේ බිරිඳ මෙසේ කිව්වාය:

"ඔන්න ඔයාට පේනවා නේද? සල්ලි ගණන් කරන්න ඕන. සුද්ද කරන්න දෙන්න ඉස්සෙල්ලා..."

එහෙත්, හාම්පුතු මා දෙස බලා මඳ සිනා පාමින් පිළිතුරු දුන්නේය.

"ඔහු හොරකම් කරන්නේ නැහැ. මා ඒ ගැන දන්නවා."

දැන් ඉතින් සොරකම් කිරීමට ඉටාගත් මට ඔහු එදා කී වචනත්, ඔහුගේ විශ්වාසවත් මඳ සිනාවත් සිහිවිය. ඔහුගෙන් මුදල් සොරකම් කිරීම කොතරම් අමාරුද යන්න මම හඟින්නට වීමි. කීප වරක්ම ඔහුගේ සාක්කුවෙන් රිදී කාසි එළියට ගත් මා ඒවා ගණන් කොට ආපසු සාක්කුවට දැම්මේ සොරකම් කිරීම පිණිස සිත එකලස් කර ගත නොහැකි වූ බැවිනි. දවස් තුනක් තිස්සේ මෙම හැඟීමෙන් මා වේදනා විඳිමින් සිටින විට, ඒවා සියල්ල ඉක්මනින් සහ සරල ලෙස අතුරුදහන් විය. හාම්පුතා මගෙන් හිටිහැටියේ ඇසුවේය.

"පෙෂ්කොව්, නුඹට මක්වෙලාද? කාන්සියෙන් පෙළෙනවද, නැතිනම් නුඹ ලෙඩ වෙලාද?"

මගේ දොම්නසට හේතුව මම ඔහුට විවෘත ලෙස කිව්වෙමි. ඔහු බුම්මා ගත්තේය.

"ඔන්න පේනවද පොත් කියැවීම නිසා වෙන දේවල හැටි! පොත්වලින් කෙළින්ම නැතිනම් වක්‍ර විදිහට මහ කරදර තමයි..."

ඔහු මට කොපෙක් පනහක් දී දැඩි ලෙස උපදෙස් දුන්නේය.

"පරෙස්සම් වෙයන්, මගෙ පවුල හරි, අම්මා හරි දැනගත්තොත් කලබල ඇති වේවි!"

අනතුරුව ඔහු හිතවත් මඳ සිනාවක් පාමින් කතා කළේය.

"නුඹ මහ ස්ථිර ගති ඇති යක්පැටියෙක්. කමක් නැහැ, ඒක හොඳයි. ඒ වුණාට පොත් කියවීම නවත්වාපන්. අලුත් අවුරුද්දේ ඉඳලා මම හොඳ පත්තරයකට දායක වෙනවා. අන්න එතකොට නුඹට කියවන්නට පුළුවනි.

හවස තේවලින් පසුව, රාත්‍රී ආහාරය ගන්නා තුරුම

හාම්පුතුනට 'මොස්කොව්ස්කි ලිස්තොක්' පුවත්පත දිනපතා කියැවීම මට පැවරිණි. වෂ්කොව්, රොක්ෂානින්, රුද්නිකොව්ස්කි ආදීන්ගේ නව කතාද, වෙනත් සාහිත්‍ය කෘතිද මා හාම්පුතුනට කියැවූයේ, ඔවුන් දිවා ආහාරයෙන් ඉක්බිතිව මරණය දක්වා පාළු ගතියකින් පෙළීම නිසාත්, ඔවුන්ගේ ආහාර දිරවීමට පහසුව පිණිසත්ය.

හඬ නඟා කියැවීම මට රිසි නොවූයේ කියවන දේ මතක තබා ගැනීමට එය බාධාවක් වූ බැවිනි. එහෙත්, මගේ හාම්පුතාලා එක්තරා සුහද ගිජුබවෙකින් යුතුව අසමින් කතාවල විරයන්ගේ දුෂ්ටත්වය නිසා විස්මය පළ කරති. ආඩම්බරයෙකින් එකිනෙකා අමතා කතා කර ගනිති.

"අපි සන්සුන් ලෙස හා සමාදානයෙන් ජීවත් වෙනවා. කිසි දෙයක් දන්නෙ නැහැ. දෙවියන්ට කීර්තිය අත්වේවා!"

ඔවුහු සිද්ධීන් පටලවා ගෙන සුප්‍රසිද්ධ පල්හොරකු වන චූර්කින්ගේ මංකොල්ලකෑම ආදිය පොමා කුචීනා කළැයි කියමින් වරද්දා ගනිති. අසා සිටින හාම්පුතාලාගේ මේ පටලැවිලි මම ලිහා දමා නිවැරැදි කරමි. එවිට ඔවුහු පුදුමයට පත්වෙති.

"මදෑ මේ කොල්ලගේ මතකයක හැටි!"

'මොස්කොව්ස්කි ලිස්තොක්' පුවත්පතේ නිතර පාහේ ලියනීද් ග්‍රාවේගේ කවි පළවෙයි. ඔහුගේ කවිවලට මා බොහෝ කැමතිය. ඔහුගේ සමහර කවි වෙනත් පොතක මම ලියා තබමි. හාම්පුත්තු කවියා ගැන මත පළ කරති.

"නාකි වුණාට කවි ප්‍රබන්ධ කරනවා."

"බේබද්දා, මෝඩයා, ඒ වුණාට"

ස්ත්‍රෑෂ්කින්ගේ සහ මෙමෙන්තො මොරි සිටුවරයාගේ කවිද මගේ සිත් ගෙන ඇත. මැහැල්ලත්, හාම්පුතුගේ බිරිඳත් දෙදෙනම කවි පල්හැලි ලෙස හඳුන්වති.

"විහිළුකාරයෝ, නළුවෝ තමා ඔය කවි කියන්නේ."

කුඩා, තදබදය සහිත කාමරයේ මට හිම සමයේ ඒ සැන්දෑවලදී ඔවුනට දිනපතා පුවත්පත කියැවීම අසීරු කාර්යයක් විය. ජනේලයට එහා නිහඬ, ගොළු රාත්‍රිය, දැඩි ශීතල නිසා හිම කැට පුපුරන සැටි ඇසෙයි. මේසය වටේ වාඩි වී සිටින ඔවුහු මාළුන් සේ නිහඬව සිටිති. හිටි

හැටියේ හිම කුණාටු හඬ නඟයි. ළමා කාමරයේ ළමයි අඬති. කළුවර මුල්ලකට ගොස් ගුළිවී වෘකයකු සේ උඩු බුරලෑමට මට සිතෙයි.

මේසයේ එක් කොනක ගැහැනු වාඩි වී මසති. නැතිනම් ගෙතුම් වැඩවල යෙදෙති. වික්තර් පිටිකොන්ද පහත් කරගෙන ප්ලෑන පිටපත් කරයි. ඔහු වැඩ කරන්නේ කැමැත්තකින් නොවේ. ඉඳහිට ඔහු කෑගසයි.

"ඔය මේසය හොලවන්නේ නැතුව ඉඳපල්ලා! නුඹලා මීයන්ගෙ පිට උඩ යන බල්ලො..."

රෙදිවලට ගෙත්තම් වැඩ දැමීම සඳහා ඇති ලොකු රාමුව අසලින් ගෙදර ස්වාමියා වාඩි වී සිටී. මේ රෙද්ද මත ඔහු රතුවන් කකුළුවන්, නිල්වන් මාළුවන්, කහවන් සමනළයින් සහ සරත් සමයේ රත්පැහැ ගන්නා කොළ ආදිය මසයි. මුලදී ඔහු ඒ රූප ඇඳ, තෙවැනි හිම සමයේදීත් ඒ වැඩය සම්පූර්ණ කරමින් සිටී. එය ඔහුට එපා වී ඇති වැඩකි. දිවා කාලයේදී මට විවේක ඇති වේලාවලදී ඔහු නිතර පාහේ මට කතා කරයි.

"ඉතින් පෙෂ්කොව්, මේ මේස රෙද්ද මහන්න පටන් ගනින්!"

මම වාඩිවී මහතැති ඉදි කටුවෙකින් මහන්නට පටන් ගතිමි.

ගෙදර ස්වාමියා නිසා මට කනගාටුවක් උපති. ඔහුට උදව් වීමට මසිතෙහි අති මහත් ආසාවෙකි. ඔහු හිටි හැටියේම ප්ලෑන ඇඳීම, මැහීම, කාඩ් සෙල්ලම් කිරීම වැනි දේ අත්හැර දමා සිත් ගන්නා වෙනත් යමක් පටන්ග නු ඇතැයි මට නිතරම හැඟෙයි. හිටි හැටියේම ඔහු කරන වැඩේ නවත්වා, එය අමුතු දෙයක් සේ සලකා බලමින් යමක් ගැන කල්පනා කරයි. එවිට ඔහුගේ දෙනෙත් අචලය, මවිතය පළකරයි. ඔහුගේ කෙස්වැටිය නළලත්, දෙකම්මුලත් වසා වැටී ඇත. එවිට ඔහු පූජකාරාමයක සිසුවකු මෙනි.

"ඔයා සිතන්නෙ මොනවා ගැනද?" ඔහුගේ බිරිඳ ප්‍රශ්න කරයි.

"නැහැ, නිකම්" යැයි කියන ඔහු යළිත් වැඩ කිරීමට පටන් ගනී.

මම නිහඬව මවිතයට පත්වෙමි. මිනිහකු කල්පනා කරන්නේ මොනවා ගැනදැයි ප්‍රශ්න කළ හැකිද? එම ප්‍රශ්නයට පිළිතුරු සැපයිය නොහැකිය. මිනිහෙක් එක වර බොහෝ දේ ගැන සිතයි. ඇසින් දුටු හැම දෙයක් ගැනම, ඊයේ දුටු දේත්, වසරකට පෙර දුටු දේත්, මේ හැම දෙයක්ම එකට මිශ්‍ර වෙයි. එය අල්ලා ගත නොහැකිය. හැම දෙයක්ම ජංගමශීලීය, වෙනස්වනසුලුය.

'මොස්කොව්ස්කි ලිස්තොක්' පුවත්පතේ උපහාසාත්මක ලිපි ප්‍රමාණවත් නොවීය. ගෙදර ඇඳ යට ඇති සඟරා කියවීමට මම යෝජනා කළෙමි. ගෙහිමියාගේ බිරිඳ සැක සිතින් ප්‍රශ්න කළාය.

"ඒවායෙහි කියවන්න තියෙන්නෙ මොනවාද? ඒවායේ පින්තූර විතරයි."

ඇඳ යට 'චිත්‍ර විමර්ශන' සඟරා පමණක් නොව, 'ඔගොන්යොක්' සඟරාවද තිබිණි. ඉතින් අපි සලියාස්ගේ 'තියාතින් බල්තීස්කි සිටුවරයා' කියවන්නට පටන් ගතිමු. තරමක මෝඩයකු වන ඒ වීර චරිතය නිසා ගෙහිමියා සතුටට පත්වී, ඇස්වල කඳුළු පිරෙන තුරු නොනවත්වා සිනා සෙයි. සිටුපුතාගේ කනගාටුදායක ක්‍රියා ගැන අසන ඔහු කෑ ගසයි.

"ආ, ඒක අපූරු වැඩක්!"

"ඒ ඔක්කොම බොරු" යැයි ගෙහිමියාගේ බිරිඳ පවසන්නේ ඇයටත් ස්වාධීන බුද්ධියක් තිබෙන බව කියා පෑමටය.

ඇඳ යට තිබුණු සඟරා නිසා මට විශාල වාසියක් ඇති විය. සඟරා කුස්සියට ගෙනයාමටත්, රාත්‍රී කාලයේදී ඒවා කියැවීමටත් මට වරම් ලැබිණි.

මගේ ඉමහත් සතුටට හේතු වූයේ මැහැල්ල කුස්සියේ සිට නිදාගැනීමට ළමා කාමරයට යාමය. ළමයින් බලා ගන්නා ආයම්මා කටගොන්නක් බී ගනී. වික්තර් මට බාධා නොකළේය. ගෙදර සියලු දෙනා නිදාගත් පසු, වික්තර් කබාය ඇඟලාගෙන නිහඬව ගෙයින් පිටව ගොස් උදෑසන දක්වා අතුරුදහන් වෙයි. රෑට පොත් කියවීම සඳහා මට ඉටිපන්දමක් නොදී, ඒවා සියල්ල කාමරයට ගෙන යයි. ඉටිපන්දම් මිල දී ගැනීමට මා අත මුදල් නොතිබිණි. උණුවී

වැක්කෙරෙන ඉටි සියල්ල එකතු කරගත් මම ඒවා හිස් සාඩින් ටින් බඳුනකට දමා, දෙවියන්ගේ පහනෙන් තෙල් ගෙන එයට මිශ්‍ර කොට නූල්වලින් සිළුවක් සාදාගෙන, කුස්සියේ ගිනි පෙනෙල්ලකින් එය අවුළුවා ගෙන පොත් කියවන්නට වීමි.

මම විශාල පොතේ පිටුවක් පෙරළන විට, මගේ පහනේ ගිනි සිළුව සුළඟට නැටුණි. එපමණක් නොව, එය නිවී යාමේ තර්ජනයක් පවා ඇති විය. පහන් සිළුව නිතර උණු ඉටි සහ තෙල් මිශ්‍ර ඉන්ධනවල ගිලුණු අතර, ඉන් පිටවූ දුමාරය මගේ නෙත්වලට පීඩා කළේය. එහෙත්, මේ සියලු දුක් ගැහැට මගේ සිත පීඩා නොකළේ මා අති මහත් ප්‍රීතියෙකින් යුතුව සඟරාවේ පින්තූර බලමින් ඊට යටින් ඇති විස්තර කියවන්නට වූ බැවිනි.

මේ චිත්‍ර නිසා ලෝකය පිළිබඳ මගේ දැනුම පුළුල් වීමට පටන් ගත්තේය. ලස්සන නගර, උස්කඳු වැටී. සුන්දර මුහුදු වෙරළ නිසා මගේ ලෝකය වඩාත් අලංකාර විය. ජීවිතය පුදුමාකාර ලෙස වැඩෙයි. පෘථිවිය වඩාත් සිත් ඇදගනී, මිනිසුන් වඩාත් පොහොසත් වෙයි. නගර සංඛ්‍යාවෙන් සහ විවිධත්වයෙන් වැඩිවෙයි. දැන් වොල්ගා අවට පෙදෙස දෙස බලන මට එහි හිස් බිම් නැති බව දැනෙයි. එහෙත්, ඉස්සර එහි එවැනි මුඩු බිම් තිබිණි. වොල්ගා නදියට එපිටින් පිහිටි භූමිය දෙස බලන විට විශේෂ පාළු ගතියක් දැනෙයි. පෙතැලි දියකඩිති, කළුවන් තණ පඳුරු, එම දියකඩිති සහිත භූමියට එහා ඉහළට නෙරා ගිය විශාල දැති වැනි ගස් සහිත වනයක්ය. දිය කඩිතිවලට ඉහළින් අපැහැදිලි, ශීතල අහසය. මහ පොළොවේ හිස් බවක් මෙන්ම, හුදෙකලා බවක්ද දැනෙයි. එවිට හදවත පාළු බවකින් පිරෙයි. නිහඬ දොම්නසක් ඇති වේ. සියලු අභිලාෂයන් අතුරුදහන් වේ. දෙනෙත් වසාගැනීමටද කිසිවක් ගැන නොසිතීමටද ආසාවක් ඇති වේ. කිසිම බලාපොරොත්තුවක් ඇති නොකරන මූසල නිහඬ පාළු බව හදවතේ ඇති හැම දෙයක්ම උරා ගනී.

චිත්‍රවල ඉදිරිපත් කර ඇති විස්තර බලමින්, පිටරටවල් ගැනත්, පිටරැටියන් ගැනත්, අතීතයේ සහ වර්තමානයෙහි විවිධ සිද්ධීන් ගැනත් කියවන මට බොහෝ දේ ගැන

වටහා ගැනීමට නොහැකිය. මෙය මගේ සිත් තැවුලට හේතු වෙයි. හිටි හැටියේම මා නොදන්නා වචන මගේ මොළයට කාවදී. "පාරභෞතිකවාදය', "හිලියාස්මය", "චාටිස්ට්වාදියා" ආදී අරුම පුදුම වචන නිතර මගේ සිත කුප්පාලයි. මේ වචනවල තේරුම දැන ගැනීමට මට නැහැකි වෙතිනම්, මට කිසිවක් වටහාගත නොහැකියි යන හැඟීම මා සිතෙහි තදින් කා වදින්නට පටන්ග නී. සියලු රහස්වල යතුරු මේ වචනවල ගැබ්වී ඇත. ඇඟිල්ලකට කා වැදුණු කටුවක් සේ නිතර වාක්‍ය ඛණ්ඩ එහෙම පිටින්ම මගේ මතකයෙහි නොමැකී පවතී. වෙනත් දේ ගැන කල්පනා කිරීමට එය මට බාධාවෙකි.

පුදුම සමගත කවි පෙළක් කියැවූ සැටි මට මතකය.

ජනයා රහිතව වානේ පණ කැවූ විටෙක මෙනි,
නිහඬය, ඇදිරිය අමු සොහොනක් මෙන්,
ගමන් ගනී. ගුන්වරුන්ගේ රජ, ඇටිලා.

ඔහු පසු පසින් කළු වලා සේ ගමන් ගන්නා යුද හමුදාවෝ ප්‍රශ්න නඟති.

කොහිද රෝමය. කොහිද රෝමය බලගතු?

රෝමය නගරයක් බව මම එවකට පවා දැන සිටියෙමි. ගුන්වරුන් යනු කවුරුන්ද? එය දැනගැනීම ඉත අවශ්‍ය වේ.

උචිත වේලාවක් බලා මම ස්වාමියාගෙන් ඇසුවෙමි.

"ගුන්වරුන්ද?" මවිතවී ඔහු මගෙන් ප්‍රති ප්‍රශ්නයක් නඟයි. "මොන යකාදැයි දන්නෙ කවුද? මොකක්දෝ පල් හෑල්ලක්....."

ඔහු හිස සලන්නේ අනුමත නොකරමිනි.

"පෙෂ්කෝව්, නුඹේ ඔළුගෙඩිය ඇතුළට වල්පල් රිංගලා. ඒක නරකයි!"

හොඳට හෝ නරකට හෝ වේවා මා ඒ ගැන දැන ගත යුතු යැයි මම තීරණය කළෙමි.

බළකායේ පූජකයා වන සලවියෝව් මේ ගැන දනිතියි මා සිතූ බැවින්, ගෙවත්තේදී මා ඔහු හමුවී ගුන්වරුන් යනු කවුදැයි මම ඔහුගෙන් ඇසීමි.

සුදුමැලි රෝගී සලවියොව් නිතර කෝපයෙනි. ඔහුගේ නෙත් රතු පැහැතිය. ඇහි බැම රහිතය. යටි රැවුළ කහ වන්ය. කළුවන් ඔහුගේ සැරයැටියෙන් බිම හාරමින් ඔහු කෝපයෙන් ප්‍රශ්න කළේය.

"ඉතින් නුඹට ඒ ගැන ඇති රැඳාව මොකක්ද? ආ?"

යුද්ධ නිලධාරි නේස්තෙරොව්ගෙන් ඒ ගැන විමැසූ විට ඔහු රෞද්‍ර ලෙස කෑ ගැසීය.

"මොනවද?"

ගුන්වරුන් ගැන විමැසිය යුත්තේ, ඔසුසලේ ඔසු වෙළෙන්දා වන පාවෙල් ගොල්ඩ්බෙර්ග්ගෙන් බව මම තීරණය කළෙමි. ඔහු මා දෙස හැමදාම කරුණාවෙන් බලයි. ඔහුගේ මුහුණෙන් බුද්ධිමත් බවක් පළ වෙයි. ඔහුගේ විශාල නැහැය මත රනින් කළ රාමුවක් සහිත ඇස් කණ්ණාඩියකි.

"ගුන්වරුන් යනු කිර්ගීස් ජාතිකයන් වගේ තැනින් තැන යන ජාතියක්. දැන් මේ ජාතියට අයත් මිනිසුන් නැහැ. උන් වඳවෙලා ගිහින්."

මසිතෙහි කනගාටුවක් සහ බලාපොරොත්තු සුන් වූ බවක් ඇති වූයේ, ගුන්වරුන් වඳ වී ගිය නිසා නොව, මගේ සිතට වධ දුන් ඒ වචනය සරල වූ අතර, එයින් කිසිදු පලක් මට නොලැබුණු බැවිනි.

එහෙත්, මා ගුන්වරුන්ට ණය ගැතිය. ඒ වචනය හැඳින ගැනීමෙන් පසු, වචන මගේ සිතට වධ දීම අවසන් වූ අතර, ඇටිල්ලාට පින් සිදු වන්නට මම ගොල්ඩ්බෙර්ග් හඳුනා ගතිමි.

බුද්ධිමත් වචනවල ඇති සරල තේරුම දැන සිටි ගොල්ඩ්බෙර්ග්, ගුප්තමය වචනවල අරුත් දැන සිටියේය. ඇඟිලි දෙකකින් ඇස් කණ්ණාඩි කුට්ටම හරි ගස්සා ගනිමින්, ඔහු මහතැති ඇස් කණ්ණාඩි කාච අතරින් මා දෙස අවධානයෙන් බලයි. ඔහුගේ කටින් පිටවන වචන මගේ මොළයට කා වදින්නේ තියුණු ඉදිකටු සේය.

"යාළුවා, වචන හරියට ගහක තියෙන කොළ වගෙයි. කොළ මේ විදිය මිසක්, වෙනත් විදියකට නැත්තෙ මොකද කියල දැන ගන්නට නම් ගහ ඉස්සෙල්ලා අඳුනාගන්න ඕන. ඒ කියන්නේ ඉගෙන ගන්න ඕන! පොත හරියට

හැම දෙයක්ම තියෙන හොඳ මල් වත්තක් වගෙයි. එහි සිත සතුටු වෙන දේත් තියෙනවා, ප්‍රයෝජනවත් දේත් තියෙනවා."

මම නිතර ඔසුහලට ගියෙමි. ගෙදර වැඩිහිටියන් නිතර බඩ දැවිල්ල ආදී රෝගවලින් පෙළුණු නිසා සෝඩා සහ මැග්නීසියා මිලදී ගැනීමටද ළමයින්ට අවශ්‍ය ඔයින්ට්මන් වර්ග සහ විරේක බෙහෙත් ගැනීමටද ඔසුහලට යාමට මට සිදුවිය. ඔසු වෙළෙන්දාගේ කෙටි දේශන නිසා පොත් කියැවීම පිළිබඳව වඩාත් බැරෑරුම් ආකල්පයක් දැරීමට මට සිදුවිය. බේබද්දකුට වොඩ්කා මෙන්ම, මටද පොත් කියැවීම අත්‍යවශ්‍ය දෙයක් බවට පත්වූයේ මටම නොදැනුවත්වමය.

මිනිසුන් වීර ක්‍රියාවලට සහ අපරාධවලට පොලඹවාලන හැඟීම් සහ අභිප්‍රායයන් ඇති කරන වෙනත් ජීවිතයක් ඔවුහු මට පෙන්වා ලූහ. එහෙත්, මා වටා සිටින මිනිස්සු එවන් වීර ක්‍රියා සහ අපරාධ කිරීමෙහි අසමත් බව මට පෙනිණි. ඔවුන් ජීවත් වන්නේ මේවාවලින් ඈත් වෙමිනි. ඔවුන්ගේ ජීවිතය පොත්වලට වඩා වෙනස් වූ අතර, ඔවුන්ගේ ජීවිතයේ සිත් ඇදගන්නා දේ මොනවාදැයි සිතා ගැනීම උගහටය. එවැනි ජීවිතයක් මට අනවශ්‍ය බව පැහැදිලිය.

ප්‍රාග්, ලන්ඩන් සහ පැරිස් නගරවල අගාධ, කුණු දමන වළවල් සහ ඒවා වටා තාප්පව බැඳ නැති බව මම චිත්‍රවලින් දැන ගතිමි. ඒ නගරවල මාර්ග පුළුල්ය. සෘජුය. නිවාස සහ දේවස්ථාන වෙනස්ය. එහි මිනිසුන් ගෙවල්වලට දමා සිරකොට තබන මාස හයක් තිස්සේ පවතින හිම කාලයක් නැත. අප රටේ මෙන් දීර්ඝ කාලීන උපවාස හෙවත් 'කොරොස්ම' කාලයක් ඒ රටවල නැත. ඒ කාලයට රුසියාවේ කිතුනු බැතිමතුන් ආහාරයට ගන්නේ ලුණු දැමූ ගෝවා, බිම්මල්, ධාන්‍ය සහ අර්තාපල්, දුගඳ හමන ල්යොන් තෙල් පමණකි. මෙම 'කොරොස්ම' කාලයට පොත් කියැවීමද තහනම් නිසා මා ළඟ 'චිත්‍ර විමර්ශන' සඟරාද උදුරා ගැනිණි. මේ නිස්සාර පුහු, කොරොස්ම කාලය යළිත් මා වෙත කඩා පැන ඇත. දැන් මා කොරොස්මයත්, පොත් කියැවීමත් සන්සන්දනය

කර බලන විට, කොරොස්මයේ දුගී බවත්, අවලස්සන බවත් මට වඩාත් හොඳින් වැටහිණි. පොත් කියවන විට මට සනීපයක් හා ශක්තියක් දැනිණි. මම කඩිසර ලෙසත්, දක්ෂ ලෙසත් වැඩ කළෙමි. මට අරමුණක් තිබිණි. වැඩක් ඉක්මනට අවසන් කළ විට, පොත් කියවීමට වඩාත් වැඩි වේලාවක් ලබා ගත හැකි බව මම දැන සිටියෙමි. පොත් කියැවීම නැවැත්වූ විට මට බෙලහීන ගතියක් මෙන්ම, අලස ගතියක්ද දැනිණි. එමෙන්ම, මීට පෙර මා නොදත් වේදනාව සහිත අමතක වීමේ රෝගයෙකින් මම පෙළෙන්නට පටන් ගතිමි.

තේරුම් විරහිත මේ පුහු දවස්වලදී එක්තරා ගුප්තමය සිද්ධියක් ඇති විය. දවසක් දා රාත්‍රියේ සියලුම මිනිසුන් නින්දට ගිය විට, දේවස්ථානයේ මහා සණ්ටාරය නද දෙන්නට විය. අඩ වශයෙන් ඇඳ සිටි මිනිස්සු ජනේල අසලට දිව ගියෝ එකිනෙකා අමතා කතා කරන්නට වූහ.

"ගිනි අරගෙනද? අවදානමක්ද?"

අනික් ගෙවල්වල මිනිසුන්ද කලබල වන සැටියක් පෙනෙන්නට තිබිණි. දොරවල් ඇරෙන වැසෙන හඬ ඇසිණි. අසකු කටකලියාවෙන් අල්ලා ගත් මිනිහෙක් ගෙවත්තට ආවේය. පල්ලියට සොරු පැන කොල්ල කා ඇතැයි මැහැල්ල කෑ ගසන්නට වූවාය. ගෙදර ස්වාමියා වන ඇගේ වැඩිමල් පුතා ඇය නැවැත්වීය.

"එය අවදානමක් නොවන බව පෙනෙන්න තියෙනවා නොවැ. අම්මා කෑ නොගහ ඉන්න."

"එහෙනම් ලොකු බිස්කුන්නාන්සේ මැරිලා...."

වික්තර් නිදාසිටි පොලතියෙන් බිමට බැස ඇඳ ගනිමින් මුමුනන්නට විය.

"සිද්ධ වුණේ මොනවාදැයි කියල මම දන්නවා."

ගිනිගන්නා තැනෙකින් ඇතිවන ආලෝකයක් පෙනෙතිදැයි සොයා බැලීමට හාම්පුතා මා අට්ටාලයට යැවීය. මම අට්ටාලයටත්, එතැනින් පියස්සටත් නැග වට පිට බැලීමි. ගිනි ගත් ස්ථානයෙකින් පැන නඟින එවැනි සලකුණක් නොවීය. හිම තුෂාර සහිත වාතය බිඳගෙන සණ්ටාර හඬ ඇසෙන්නේ කුසීත ලෙසිනි. නගරය නිදිබර ගතියෙකින් පෘථිවියට ඇලී ඇත. මගේ

ඇසට නොපෙනෙන මිනිස්සු හිම පාගමින් 'කර, කර' හඬක් පිට කරමින් ගමන් ගත්හ. හිම යානා ගමන් කරන හඬ ඇසිණි. ඒ අතර, වඩාත් නපුරු ලෙස ඝණ්ටාරය හඬවන්නට විය. මම යළිත් අපේ කාමර පන්තිවලට ගොස් හාම්පුතාට වාර්තා කළෙමි.

"ගින්නක් පෙනෙන්න නැහැ."

"මෑ කෙරුවාවෙක හැටි" යැයි පැවසූ හාම්පුතා පිටතට යාමට ඇඳගෙන හිම කබායේ කර පටිය ඔසවා ගෙල වසා ගෙන, සපත්තුවලට පිටතින් අඳින 'කලෝෂි' කවර පය ලා ගත්තේ අතීරණාත්මක ලෙසිනි. ඔහුගේ බිරිඳ බැගෑපත් ලෙස අයැද සිටින්නට වූවාය.

"එළියට යන්න එපා! අනේ යන්න එපා."

"මොන බොරුද!"

ඒ වන විට හිම කබාය ඇඟ ලා ගෙන සැරසී සිටි වික්තර් අන් අයට සමච්චල් කරන්නට විය.

"රහස මම දන්නවා."

හාම්පුතුන් දෙදෙනා පිටතට ගිය විට, සමවාරය සූදානම් කරන ලෙස මට අණ කළ ගැහැනු දෙදෙන ජනෙල් අසලට ගොස් සිට ගත්හ. පිටත සිට දොර සීනුව හැඬවූ හාම්පුතා නිහඬව පඩිපෙළ නැඟ ගෙයි කොරිඩෝරයට විත් බැරැඬි හඬින් මෙසේ පැවසීය:

"සාර් රජ්ජුරුවන්ව මරා දමලා!"

"කොහොම හරි මැරිලා!" මැහැල්ල හඬ නැඟුවාය.

"මරා දමලා මට කිව්වේ යුද්ධ නිලධාරියෙක්... දැන් ඉතින් මොනවා වෙයිද?"

ඊළඟට දොර සීනුව හඬවා ගෙට ඇතුළු වූයේ වික්තර්ය. අකැමැත්තකින් ඇඳුම් ගැලවූ ඔහු කතා කළේ කෝපයෙනි.

"අපොයි, මා සිතුවේ යුද්දෙ පටන් අරගෙන කියල!"

අනතුරුව තේ බීමට වාඩි වූ ඔවුහු සන්සුන්ව, පහත් හඬින් සහ පරෙස්සමින් කතා කරන්නට වූහ. මහපාරේ නිහඬතාවකි. ඝණ්ටාරය හැඬීම නැවතිලාය. ඔවුහු දවස් දෙකක් තිස්සේ රහසේ කතා කරමින් කුසුකුසු ගෑවෝය. හාම්පුතා හමුවීමට පැමිණි අමුත්තෝ යම් කිසි දෙයක් ගැන විස්තර කළහ. සිදුවුණේ කුමක්ද? යන්න ගැන දැන

ගැනීමට මම ඉමහත් පරිශ්‍රමයක් දැරීමි. එහෙත්, හාම්පුතුන් පුවත්පත මට නොදී සඟවා තැබූ අතර, සීදරව් හමුවූ මම සාර් රජු මරා දැම්මේ කුමන හේතුවක් නිසාදැයි ඔහුගෙන් විමැසීමි.

"ඒ ගැන කතා කිරීම තහනම් කරලා...."

ඒ සිද්ධිය දෛනික පුහු වැඩ නිසා මැකී ගියේය. ඉක්මනින්ම මට ඉතා අසතුටුදායක සිද්ධියකට මූණ පෑමට සිදුවිය.

එක් ඉරිදා දවසක උදෑසන දේව මෙහෙයට හාම්පුතාලා ගියෙන්, මම සමවාරය සූදානම් කොට, ඇතුළු කාමර සුද්ද කිරීමට ගියෙමි. වැඩිමහලු ළමයා කුස්සියට විත් සමවාරයේ කරාමය ගලවා එයත් සමඟ සෙල්ලම් කිරීමට මේසය යට වාඩි විය. සමවාරයේ බටය තුළ බිම අඟුරු බොහොමයක් තිබුණෙන් බටයෙන් කාමරයේ සිටි මට සමවාරය වෙනදා මෙන් නොව, අමුතු හඬක් පිට කරන සැටි ඇසිණි. කුස්සියට පැමිණි විට මා දුටුවේ නිල් පැහැගත් සහ උඩ පැනීමට දඟලන, වෙවුලන සමවාරයකි. එහි ඊයම් කොටස් වැගිරි බිම වැටිණි. දම් නිල් පැහැගත් ඒ සමවාරය බේබද්දකුට සමාන විය. මම වහාම සමවාරයට ඇල් වතුර වක්කළ විට එය ෂූ හඬක් පිටකර කෑලිවලට ගැලවිණි.

එවිටම වාගේ දොර සීනුව නාදවූයෙන් මම දොර හැරියෙමි. සමවාරය සූදානම්දැයි මැහැල්ල නැගූ ප්‍රශ්නයට මම හණික පිළිතුරු දුන්නෙමි.

"සූදානම්!"

මා එලෙස පිළිතුරු දුන්නේ ලජ්ජාව හා බිය නිසා විය යුතුය. ඔවුන් එය ගණන් ගත්තේ අවඥාවක් ලෙසිනි. එනිසා මට ලැබුණු දඬුවම වඩාත් බරපතළ විය. මට පහර කෑමට සිදුවිය. මැහැල්ල සෙස්නා කෝටු කීපයක් එක මිටියට ගෙන මට පහර දුන්නාය. එය එතරම් තියුණු වේදනාවක් නොදුන්නද, ඉදිකටු මෙන් සිහින් ලී පතුරු විශාල සංඛ්‍යාවක් හමට කා වැදිණි. හවස් වන විට මගේ පිට කොට්ටයක් මෙන් ඉදිමී, පිම්බිණි. පසු දින දහවල් වන විට මා රෝහලට ගෙන යාමට හාම්පුතුනට සිද්ධ විය.

සිනහ උපදවන තරම්ම කෙට්ටු සහ උසැති දොස්තර මා පිරික්සා බලා හඬින් සන්සුන් ලෙස කතා කළේය.

"ඉස්සෙල්ලාම මේ කොල්ලාට පහර දීම ගැන නිල වාර්තාවක් ලියන්න ඕන."

මා රෝහලට ගෙන ගිය හාම්පුතාගේ මූණ රතු විය. ඔහු පා ගටමින් හඬක් නැඟීය. ඔහු යමක් රහසින් දොස්තරට කිව්වේය. එවිට දොස්තර ඔහුගේ හිසටත් ඉහළින් බලමින් කෙටියෙන් පිළිතුරු දුන්නේය.

"වාර්තාවක් නොලියා ඉන්න බැහැ."

අනතුරුව මගෙන් ප්‍රශ්න කළේය.

"දුක් ගැනවිලි ඉදිරිපත් කරනවද?"

මට වේදනා දැනුණද, මම එය නොතකා පිළිතුරු දුන්නෙමි.

"ඕන නැහැ. ඉක්මනට බෙහෙත් දාන්න...."

මා වෙනත් කාමරයකට ගෙන ගොස් මේසයක් මත මුණින් අතට බාවා හමට සුවයක් දැනෙන ශීත ලෝහ අඬුවකින් ඉදිකටු වැනි සිහින් ලී පතුරු එකින් එක ගලවා දමමින් සතුටු සිතින් දොඩන්නට විය.

"යාළුවා, නුඹේ හම බොහොම හොඳට අලංකාර කරලා තියෙනවා. දැන් ඉතින් නුඹ වතුරට තෙමෙන්නේ නැති කොල්ලෙක් වේවි."

මගේ හම කිති කවමින් සිය කාර්යය අවසන් කළ දොස්තර තැන, මෙසේ පැවසීය:

"යාළුවා, පතුරු හතළිස් දෙකක් ගලවා දැම්මා. මතක තියාගනින්, නුඹට වහසි බස් දොඩවන්නට පුළුවන් වැඩක්. හෙට මේ වේලාවට වරෙන් නුඹට බේත් දමලා වෙළුම් පටිවලින් බඳින්න. නුඹට නිතර ගහනවද?"

මා පිළිතුරු දුන්නේ තරමක කල්පනා කිරීමෙන් ඉක්බිතිවය.

"ඉස්සර නම් නිතර ගැහුවා...."

දොස්තර බැරැඬි හඬකින් සිනාසී මෙසේ පැවසීය:

"යාළුවා, හැම දෙයක්ම හොඳටයි සිද්ධ වෙන්නෙ. හැම දෙයක්ම!"

ඔහු මා හාම්පුතා ළඟට ගෙනගොස්, ඔහු ඇමතීය. හෙට බේත් දැමීමට ගේන්න ඕන. මේ කොල්ලා විහිළුකාරයකු

වීම නුඹලාගේ වාසනාව."

අස්රියකින් ගෙදර යන ගමන් හාම්පුතා කතා කරන්නට විය.

"පෙෂ්කොව්, මටත් ඔය වගේ ගුටි ඇනලා තියෙනවා. මොනවා කරන්නද? ඔව්, මල්ලී, මමත් පහර කාලා තියෙනවා. නුඹට අනුකම්පා කිරීමට මා ඉන්නවා. නමුත්, මට අනුකම්පා කිරීමට කිසිවෙක් හිටියේ නැහැ. ඔව්, කිසිවෙක් හිටියේ නැහැ! හැම තැනම මිනිස්සු මහ තදබදයක්. අනුකම්පා කරන්න එක බැල්ලිගේ පුතෙක්වත් හිටියේ නැහැ. අනේ මහ මෘග කිකිළියෝ!"

හාම්පුතා ගෙදර එනතුරුම බැණ වදින්නට විය. ඔහු මා සමඟ මිනිහකු හැටියට කතා කිරීම නිසා මම ඔහුට බෙහෙවින්ම කෘතඥ වූයෙමි.

ගෙදරදී මා පිළිගත්තේ මගේ උපන් දින උත්සවය පවත්වන විටෙකදී මෙනි. දොස්තර මට බෙහෙත් කළ සැටි විස්තර සහිතව කියන ලෙස ගැහැනු මට බල කළහ. දොස්තර කී දේ මා ඔවුනට වාර්තා කළ විට, ඔවුහු එය අසා විස්මය පළ කරමින් රස කෑමක් කන විටෙක මෙන් තලු මරමින් මුහුණ රැලි ගන්වා ගත්හ. රෝගවලටත්, වේදනාවටත්, අසතුට දක්වන හැම දෙයටමත් ඔවුන් දක්වන උද්වේගී සැලකිල්ල මා මවිතයට පත් කළේය.

ඔවුනට විරුද්ධව දොස්තරට පැමිණිලි නොකිරීම ගැන ගැහැනුන් සතුටු වන බව දුටු මා, එයින් ප්‍රයෝජන ගෙන, ඇඳුම් කපන ශිල්පියාගේ බිරිඳගෙන් පොත් ලබා ගැනීමට මම අවසර ගතිමි. ඔවුන් අවසර දීම ප්‍රතික්ෂේප නොකළ අතර, මැහැල්ල පමණක් මවිත වී කෑ ගැසුවාය.

"මූ නම් හැබෑ යකෙක්!"

පසු දින මම ශිල්පියාගේ බිරිඳ ඉදිරියට ගිය විට ඈ සුරතල් ලෙස කතා කළාය.

"මට කිව්වේ මේ ළමයා අසනීප වෙලා ඉස්පිරිතාලෙට ගෙනිච්චයි කියල. ඔන්න පේනව නේද මිනිස්සු බොරු කතා කියන සැටි."

මම නිහඬව සිටියෙමි. ඇයට ඇත්ත කීම ලජ්ජාවට කරුණකි. ගොරහැඩි සහ කනගාටුදායක දේ ගැන ඇය දැනගත යුත්තේ මන්ද? ඇය අන් මිනිසුනට සමාන

නොවීම යහපත් දෙයකි.

යළිත් මම ඩුමා (ජ්‍යෙෂ්ඨ), පොන්සොන්-දෙ-ටෙරයි, මොන්තෙෂේන්, සකොනෙ, ගබොරියෝ, එමාර්, බුරාගොබේ ආදීන්ගේ නවකතා කියවන්නට පටන් ගතිමි. මා ඒවා ගිලදමන්නේ රසැති ආහාර මෙන්, ඉක්මනින්ය. මගේ සිත ප්‍රීතියෙනි. අසාමාන්‍ය ජීවිතයෙක කොටස්කරුවෙකු ලෙස මට හැඟෙයි. ජීවිතය ප්‍රමෝදයක් ඇති කරමින් කැලඹෙයි. යළිත් මගේ ආධුනික ඉටි සහ තෙල් පහන රෑට පත්තු වෙයි. රාත්‍රී නොනිදා මම එක හුස්මට පොත් කියවමි. මගේ දෙනෙත්වල වේදනාවක් දැනෙයි. මැහැල්ල ආචාරශීලී ලෙස මට අනතුරු අඟවයි.

"හිටපිය පොත් ගුල්ලා, නුඹේ ඇස් ගෙඩි පුපුරලා නුඹ පොට්ට වේවි!"

එහෙත්, ඉක්මනින් මා වටහාගත් දෙයක් නම්, සිත් ගන්නාසුලු මේ ව්‍යාකූල පොත්වල , ඒවායේ සිද්ධීන් අරබයා වූ විවිධත්වය නොතකා, නොයෙක් රටවල හා නගරවලත් කතා කරන්නේ එකක් ගැන බවය. හොඳ මිනිසුන් අවාසනාවන්ත වන අතර, ඔවුන් නරක මිනිසුන් විසින් ලුහුබදිනු ලැබීමය. නරක මිනිස්සු වාසනාවන්තයෝය. බුද්ධිමත්ය. ඒ කෙසේවතුදු, අවසානයේදී අල්වා ගැනීමට බැරි මේ මිනිසුන් පරදවා අනිවාර්යයෙන්ම හොඳ මිනිස්සු ජය ගනිති. ගැහැනුන්, පිරිමින් එකම වචනවලින් ආලය ගැන කතා කිරීම සිත් කලකිරවන දෙයක් විය. මේ ඒකතානමය ගතිය කාන්සියක් ගෙන දුන්නා පමණක් නොව, අපැහැදිලි සැකයක් ඇති කිරීමටද තුඩු දුන්නේය.

සමහර විට නවකතාවක් කියවන විට, ජයගන්නේ කවුද, පරාජය වන්නේ කවුද යන්න ගැන මුල් පිටුවෙන්ම දැනගත හැකි වෙයි. සිද්ධීන් පිළිබඳ ගැටලුව ගැන යම්තමින් පැහැදිලි වත්ම, එය ලිහා දැමීමට සිත් මවාපාන්නට පටන් ගනී. පොත කියැවීම නවත්වා අංක ගණිත ගැටලුවක් ගැන සිතන්නාක් මෙන්, සිතන්නට පටන් ගන්නා මට, සියලු සුභ සිද්ධීන්වලට හිමිකාරයා වන්නේ කිනම් වීරයාද, අපකීර්තියට භාජනය වන්නේ කිනම් වීරයාද යන්න අරබයා වැඩි වශයෙන් නිවැරැදි ලෙස සිතා ගැනීමට හැකිවේ.

එහෙත්, මේ සියලු නවකතාවල මට වැදගත් වන සත්‍යයේ වෙනත් ජීවිතයක හා වෙනත් සබඳකම් පිළිබඳ ඇද කුද මම දකිමි. පැරිසියේ අස්රියකරුවන්, කම්කරුවන්, සෙබළුන් සහ සියලු 'පහත් පන්තිවල මිනිසුන්' රුසියාවේ නීෂ්නි, කසාන් සහ පෙර්ම් නගරවල මිනිසුන්ට වඩා වෙනස් බව මම මින් දැන ගතිමි. ඔවුහු බිය නැතිව මහත්වරුන් හා ස්වාමි පන්තිය සමඟ කතා කරති. වඩාත් සරල ලෙසත් නිදහස් ලෙසත්, හැසිරෙති. පොතින්, මා කියවන සෙබළා සීදරව්ට හෝ නැවේ සේවය කරන ව්‍යාත්කාහි සෙබළාට හෝ ඊටත් වඩා යෙර්මෝහින්ට හෝ සමාන නොවේ. මොවුන්ට වඩා අර සෙබළා මිනිහකුට සමානය. ඔහුට ස්මූරි සතු සමහර අංග ලක්ෂණ තිබුණද, ස්මූරි තරම් තිරිසන් ගති සහ ගොරහැඩි ගති ඔහුට නැත. පොත්වලින් මා කියවන කඩකාරයන්, සැබෑ ජීවිතයේ මා හඳුනන කඩකාරයන්ට වඩා බෙහෙවින් වෙනස්ය. සැබෑ ජීවිතයේදී මා දැක ඇති පූජකයන්ට වඩා හාත්පසින්ම වෙනත් පූජකයන් මම පොතින් දැන ගත්තෙමි. ඔවුහු මා දන්නා පූජකයන්ට වඩා මෙත් සිත් ඇත්තෝ වෙති. මිනිසුනට වඩා අනුකම්පා කරති. පොදුවේ ගත් විට මා දන්නා ජීවිතයට වඩා පොතින් විස්තර කරන ජීවිතය, සිත් ගන්නාසුලුය. සැහැල්ලුය. යහපත්ය. අපේ රටේ මෙන් නිතර පාහේත්, වඩාත් තිරිසන් ලෙසත් පිටරැටියෝ පොර නොකති. නැවේදී ව්‍යාත්කාවලින් පැමිණි සෙබළා නින්දාවට ලක් කළ පරිදි, පිටරටවල මිනිස්සු පුද්ගලයන් නින්දා අපහාසවලට භාජනය නොකරන අතර, මා මෙහෙකාර කම් කරන ගෙදර මැහැල්ල දෙවියන්ට යාච්ඤා කරන පරිදි දුෂ්ට ලෙස පිටරැටියෝ යාච්ඤා නොකරති.

මා හොඳින් දන්නා, නිතර නිරීක්ෂණ කරන විස්තර කළ නොහැකි ක්‍රෑරත්වයත්, මිනිසා නින්දා අපහාසවලට ලක්කිරීමට ඇති ඉමහත් ආසාවත්, පොත්වලින් විස්තර කරන ක්‍රෑරත්වය සහ කෑදර නීචයන් විසින් කොහෙත්ම විස්තර නොකෙරේ. පොතින් විස්තර වන දුෂ්ටයා. දුෂ්ටකම් කරන්නේ හේතු සහගතවය. ඔහු එතරම් දුෂ්ටකම් කරන්නේ මන්ද යන්න නිතර පාහේ වටහා ගත

හැකිය. එහෙත්, මා සැබෑ ජීවිතයේදී දකින දුෂ්ටත්වය, ක්‍රෑරත්වය, අරමුණු රහිතය, පරමාර්ථ රහිතය, එයින් වාසි නොලබන දුෂ්ටයා හුදු විනෝදයක් පමණක් ලබයි.

මා කියවන හැම පොතක් නිසාම, පිටරට ජීවිතය රුසියන් ජීවිතයට කොහෙත්ම සමාන නොවන බව වඩාත් පැහැදිලි ලෙස කැපී පෙනුණෙන්, එය මසිතෙහි අපැහැදිලි කනගාටුවක් ඇති කළේය. මේ නිසා මා කියවන කිලිටි මුළු සහිත කහ පැහැති පිටුවලින් මවාපාන චරිතවල නිරවද්‍යතාව අරබයා මගේ සැකය වඩාත් වැඩි විය.

හිටිහැටියේම මට ගොන්කුර් ලියූ 'සෙම්ගාන්නෝ සොහොයුරෝ' නමැති පොත කියවීමට ඉඩ ලැබිණි. මෙතෙක් පොත් කියවා මා නොලැබූ අපූරු වින්දනයක් ලැබූ නිසා මවිතයට පත් මම, එක රැයකදී එය කියවා අවසන් කළෙමි. ඒ කනගාටුදායක ඉතිහාසය යළිත් කියැවීමට මා පෙලඹිණි. එහි බාහිර වශයෙන් සිත් ඇද ගන්නා ගැටලු කිසිවක් නොවීය. එහි මුල්පිටුවේ සිට මුනිවරයන්ගේ ජීවිතයට සමාන බැරෑරුම් සහ වියළි බවකින් යුක්ත කතා විය. එහි බස් වහරද බාහිර අලංකාරයෙන් තොරය. මුලදී එය මසිතෙහි අසතුට මුසු මවිතයක් ඇති කළේය. එහෙත්, නීරස වචන ශක්තිමත් ලෙස ගෙතූ වාක්‍ය බණ්ඩ, ඉතා අගනා ලෙස හදවතෙහි පැලපදියම් වී, පිනුම් ගසන සහෝදරවරුන් පිළිබඳ නාටකය. සිත් වශී වන ආකාරයෙකින් ලියා තිබුණු නිසා, ඒ පොත කියැවීමෙන් මා කොතරම් මිහිරි වින්දනයක් ලැබීදයත්, මගේ දෑත් වෙවුලන්නට විය. පිනුම් ගැසීම නිසා දෙපා බිඳුණු අවාසනාවන්ත සර්කස් ශිල්පියා, ඔහුගේ මල්ලී හොරෙන් පිනුම් ගැසීමට පුරුදු වන අට්ටාලයට බඩ ගාන සැටි කියැවූ මම කඳුළු වගුරුවන්නට වීමි.

ඇඳුම් කපන්නාගේ බිරිඳට ඒ පොත යළි දුන් මම එවැනිම පොතක් ඇගෙන් ඉල්ලා සිටියෙමි.

"ඒ වගේම පොතක්, ඒ කොහොමද?" ඈ සිනහා පාමින් මගෙන් ඇසුවාය.

ඇගේ එම සිනාව මා ලජ්ජාවට පත් කළෙන්, මගේ සිතෙහි තිබූ අදහස් ඇයට විස්තර කිරීමට මට නොහැකි

විය. "ඒ පොත මහා නීරස පොතක්, පසුව මම නුඹට හොඳ පොතක් ගෙනැවිත් දෙන්නම්..." යැයි ඕ පැවසුවාය.

ඊට දවස් කීපයකට පසුව ඈ මට 'අනාථ කොල්ලකුගේ සැබෑ ඉතිහාසය' නමැති ග්‍රීන්වුඩ්ගේ පොත දුන්නාය. ඒ පොතේ නම මගේ සිතට ඉදිකටු අනින්නාක් මෙන් විය. එහෙත් මුල් පිටුවේ සිටම මගේ අධ්‍යාත්මයෙහි ප්‍රබෝධවත් මඳ සිනාවක් ඇති කළේය. ඉදින් එම මඳ සිනාවත් සහිතව මම මුල් පිටුවේ සිට අග දක්වා, සමහර පිටු දෙතුන් වරක් කියැවීමි.

පිටරටවල පවා කොතරම් අමාරුකම් සහ වේදනා විඳිමින් කොල්ලන් ජීවත් වෙතිද! මගේ තත්ත්වය එතරම්ම අයහපත් නැත. එසේනම් බලාපොරොත්තු සුන් කර ගත යුතු නොවේ.

ග්‍රීන්වුඩ් මට ඉමහත් ප්‍රබෝධයක් ලබා දුන්නේය. සැබෑ "නිවැරැදි" පොතක් 'යෙව්ගේනි ග්‍රාන්දේ' ඉන් පසු මට කියැවීමට ලැබිණි.

මහලු ග්‍රාන්දේ මගේ සීයාට බෙහෙවින්ම සමාන විය. මවිත කරවන තරම් සත්‍යතාවෙන් යුත් මේ පොත කුඩා වීම මගේ සිතට කනගාටුවක් විය. මගේ ජීවිතය කලකිරවීමට පත් කළ මේ පොතින් ප්‍රකාශ වූ එම සත්‍යය මම ඉතා හොඳින් දැන සිටියෙමි. එම පොත ජීවන සත්‍යය පෙන්වාලූයේ පූර්ණ ලෙස අලුත් දුෂ්ටත්වය රහිත සන්සුන්තාවකිනි. ගොන්කුර්ගේ පොත හැර මවිසින් මීට පෙර කියවනු ලැබූ සියලු පොත්, මගේ ගෙදර ස්වාමිවරුන් මෙන් දුෂ්ට ලෙසත්, සෝෂාකාරී ලෙසත් මිනිසුන්ට විරුද්ධව නඩු තීන්දු දුන්නේය. ඒවා වැඩි වශයෙන් අපරාධකාරුවන්ට අනුකම්පාවක් දැක්වූ අතර, ගුණවත් මිනිසුන් කෙරෙහි බලාපොරොත්තු සුන්කරන ආකල්පයක් ඇති කළේය. අති විශාල වශයෙන් බුද්ධිමත් සහ අධිෂ්ඨාන ශක්තිය යෙදවූ විටෙක පවා තම අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමට මිනිසාට නොහැකි වන සැටි දකින විට මට ඉමහත් දොම්නසක් ඇති වේ. ගුණවත් මිනිස්සු මුල් පිටුවේ සිට අවසන් පිටුව දක්වා ගලින් නිමැවූ කණු සේ නොසැලී සිටිති. දුෂ්ටයන්ගේ සියලු දුර්ගුණයන් මේ ගල්මුවා කණුවල හැපී විනාශ වී

ගියද, ඒ ගල්මුවා සාධු චරිත අනුකම්පාව නූපදවයි. මෙම ශෛලමය තාප්පය කොතරම් ලස්සන සහ ශක්තිමත් වුවද, එයට එහා වැඩී ඇති ඇපල් ගහෙන් ඇපල් ගෙඩියක් කඩා ගන්නා විට, එය බලා සතුටු විය නොහේ. ඒ ගුණවත් මිනිසාට පිටුපසින් ඉතා වටිනා හා ජීවමාන දේ සඟවා ඇති බව මට හැඟෙයි.

ගොන්කුර්, ග්‍රීන්වුඩ් සහ බල්සාක් ආදීන්ගේ කතාවල දුෂ්ට චරිත මෙන්ම, සද්ගුණවත් චරිතද නොවීය. එහි සරල මිනිස්සු, පුදුමාකාර ලෙස ජෛවමය අය වූහ. ඔවුන් කරන කියන දේ එසේම කළ යුතු හැර වෙනත් ආකාරයකින් කළ හැකි යැයි සැක කිරීමට පවා ඉඩක් නොමැති විය.

යහපත්, නිවැරැදි පොත් කියවීම කොතරම් ලොකු ආස්වාදයක්ද යන්න ඒ අනුව මම වටහා ගතිමි. එහෙත්, ඒ පොත මා සොයා ගන්නේ කෙසේද? ඇඳුම් කපන ශිල්පියාගේ බිරිඳ එහිදී මට උදව් වීමට අපොහොසත් වූවාය.

"මෙන්න හොඳ පොතක්" යැයි ඈ මට කිව්වේ අර්සේන් හුසේගේ 'රෝසමල්, රත්රන් සහ ලේ පිරුණු අත්' නමැති නවකතාව දෙමිනි. එමෙන්ම, බෙලෝගේ, පෝල් දෙකොක් සහ පෝල් පෙවාල්ගේ පොත් හොඳ කෘති ලෙස ඇය හඳුන්වා දුන්නද, මා ඒවා කියැවූයේ නොසන්සුන්තාවකිනි.

මරියෙත්ගේ සහ වෙර්නෙර්ගේ පොත් ඇගේ සිත් ගත්තද, මට ඒවා කාන්සියක් ගෙන දිණි. ෂ්පිල්හේගන්ගේ පොත් මා සිත් නොගත් අතර, අවෙර්බාහ්ගේ කෙටි කතා මා සිත් ඉතා තදින් ඇද ගත්තේය. ස්යු සහ හියුගෝ ගේ නවකතාවලට මා සිත් ඇදී නො ගිය නමුදු, වෝල්ටර් ස්කොට්ගේ කතාවලට මම වඩාත් උසස් තැනක් දුන්නෙමි. අපූරු බල්සාක්ගේ පොත් මෙන් සිත කුප්පාලන එමෙන්ම සිත සතුටු කරවන පොත් කියැවීමට මම ආසා කළෙමි. ඇඳුම් කපන ශිල්පියාගේ බිරිඳ වඩාත් අඩුවෙන් මා සිත් ගන්නට පටන් ගත්තාය.

ඇය හමුවීමට යාමට පෙර මම අලුත් කමිසයක් ඇඳ ගෙන හිස පීරා ගතිමි. යහපත් පෙනුමක් ලබා ගැනීම

මගේ අදහස විය. මගේ යහපත් පෙනුම දකින ඈ, ඇගේ උත්සවාකාරී මුහුණේ ඇති මිනි සිනාව අතහැර දමා වඩාත් චාම් ලෙසත්, වඩාත් මිතුරු ලෙසත් කතා කරතියි මම බලා සිටියෙමි. එහෙත්, ඈ මඳ සිනා පාමින්, විඩාපත් සුමිහිරි හඬකින් ඇසුවාය.

"කියෙව්වද? හොඳද?"

"හොඳ නැහැ"

ඈ යම්තමින් බැම සඟළ ඔසවා මා දෙස බලා සුසුමක් හෙළා, නහයෙන් කතා කරන්නට වූවාය.

"ඒ මොකද?"

"මම ඒ ගැන කියවලා තියෙනවා."

"මොනවා ගැනද?"

ආලය ගැන."

එවිට ඈ දෙනෙත් හකුළුවා ගෙන, "සීනි මිශ්‍ර සිනාවකින්" මුව සරසා ගත්තාය.

"ඉතින් හැම පොතකම ආලය ගැන කියනවා නොවැ!"

විශාල පුටුවක වාඩිවී සිටින ඈ ලොමින් කළ පාවහන් පයලාගෙන දෙපා සොලවයි. නිල් පැහැති ලෝගුවක් පොරවා ගෙන රෝස පැහැති ඇඟිලිවලින් දණහිස මත තිබෙන පොතේ පිටකවරයට තට්ටු කරයි.

මට ඇගෙන් මෙසේ ප්‍රශ්න කිරීමට සිතෙයි.

"ඔබ මේ ගෙදරින් පිටවී නොයන්නේ මන්ද? යුද්ධ හමුදාවේ ඔපිසරලා ඔබට හොර ලියුම් ලියමින් හිනාවෙනවා."

මට ඇයට ඒ ගැන කීමට තරම් ධෛර්යයක් නැත. එනිසා ආලය ගැන ලියූ ලොකු නවකතාවක් රැගෙන මා පිටවී යන්නේ හදවතෙහි දුක්බරිත බලාපොරොත්තු සුන්වූ ගතියක් ඇතිවය.

ගෙවත්තෙහි රැස්වන්නෝ ඒ කාන්තාව ගැන වඩාත් නරක ලෙසත්, උපහාසාත්මක සහ දුෂ්ට ලෙසත් කතා කරති. ඒ කැත, සමහර විට බොරු කතා ඇසීම මගේ සිතට මහත්වූ දුකකි. මා ඇයට අනුකම්පා කරන අතර, ඇය නිසා මසිතෙහි බියක් හටගෙන ඇත. එහෙත්, ඇය හමුවීමට එන මා ඇගේ තියුණු දෙනෙත්, ඇගේ කුඩා සිරුරේ පූසකුගේ බඳු නම්‍යතාව, හැමදාම උත්සවාකාරී

ලෙස සැරසී ඇති ඇගේ මුහුණ දකින විට මගේ බිය හිරු දුටු කඳෝපැනියන් සේ අතුරුදහන් වේ.

වසන්තයේදී ඈ හිටිහැටියේම කොහේදෝ ගිය අතර, ඊට දවස් කීපයකට පසුව ඇගේ සැමියා වෙනත් ගෙයක් කුලියට ගෙන ඉවත්වී ගියේය.

ඇය වාසය කළ කාමර කීපය අලුත් පදිංචිකරුවන් බලාපොරොත්තුවෙන් සිටි විටදී, මම එහි පුංචි හතරැස් කොටු සහිත බිත්ති බැලීමට ගියෙමි. ඒ සලකුණු මීට පෙර ඒ ස්ථානවල පින්තූර එල්ලා තිබුණු බවට සාක්ෂිය. දෙකට නැමුණු ඇණ සහ ඇණ නිසා බිත්තිවල ඇති වූ සීරීම් ද දක්නට ලැබිණි. ලී මුවා ගෙබිමෙහි විවිධ පාටවලට අයත් රෙදි කෑලි සහ කඩදාසි කැබැලි, පොඩිකළ බෙහෙත් පෙට්ටි, සුවඳ විලවුන් සඳහා වූ හිස් බෝතල ආදිය විසිරී තිබුණු අතර, ඒවා මැද ලොකු පිත්තල හරනෙල් කටුවක් දිලිසිණි.

මගේ සිත දුකින් පිරිණි. යළිත් වරක් ඒ කාන්තාව දැකීමටත්, ඇයට කෘතඥතාව පුද කිරීමටත් මට සිත් විය.

X

ඇඳුම් කපන ශිල්පියාගේ බිරිඳ මේ නිවස අතහැරයාමට පෙර මගේ හාම්පුතාලා පදිංචි කාමර පන්තිවලට යට තට්ටුවේ ඇති කාමර පන්තිවලට කළුවන් ඇස් ඇති තරුණ කතක් සහ ඇගේ දුවද, ඇගේ මහලු මවුද පැමිණියහ. රිදීවන් හිසකේ ඇති ඒ මැහැල්ල නොකඩවා සිගරැට් බිව්වේ, තෘණමණි බටයක ආධාරයෙනි. කළුවන් ඇස් ඇති කාන්තාව ඉතා රූමත්ය. බලයක් ඇති කෙනෙකි. ප්‍රෞඪ ගැහැනියකි. ඇය කතා කළේ බැරැඬි, ප්‍රියමනාප කටහඬකිනි. හිස ඔසවා, දෙනෙත් යම්තම් හකුළුවාගෙන ඇය හැම දෙනාම දෙස බැලුවේ මිනිසුන් බොහෝ දුර සිටින විට නොපෙනෙන නිසා බලන ආකාරයෙකිනි. හැමදාම පාහේ ඇගේ දොරකඩ වෙත මෙහෙකාර සෙබළෙක් ත්‍යුප් යායේව් සිහින් පාද සහිත ජවන තුරඟයකු ගෙනාවේය. කාන්තාව වානේ පාටට හුරු දිගැති වෙල්වට් ගවුමක් හැඳගෙන, සුදුවන් අත්

මේස්වලින් සහ කහවන් පාවහන්වලින් සැරසී එළියට ආවාය. එක් අතකින් ඈ ගවුමේ දිගැති වලිගයද, දම් පැහැති මැණිකක් සහිත මිටක් ඇති සබුක්කුවද ගෙන සිටියාය. ඈ අනික් අතින් අශ්වයාගේ හොම්බ සුරතල් ලෙස අත ගෑවාය. දත්මිටි කමින් උෆ් ලේ පැහැති ඇසක් හරවා ඇය දෙස බලන්නේ, සෙමින්, වෙවුලමින් පයක් පොළොවේ ගැසීය.

"රොබෙර්, රෝ බෙර්" සෙමින් කියමින් කාන්තාව අශ්වයාගේ ලස්සන, දිගැති බෙල්ලට වැරෙන් තට්ටු කළාය.

අනතුරුව කාන්තාව මෙහෙකාර සෙබළාගේ දණහිස මත පයක් තබා, දක්ෂ ලෙස අසුගේ සැදෑලය මත වාඩි වූවාය. එවිට අශ්වයා ආඩම්බර ලෙස නටමින් වේල්ල දිගේ හැල්මේ යන්නට විය. ඇය අසු පිට සදෑලය මත වාඩිවී සිටියේ, එයත් සමඟ එකට අඛණ්ඩව පවතින සැටියෙක් පෙන්වාලමිනි.

හැමදාම අලුත් සහ මින් පෙර නොදුටු විරල අලංකාරයෙකින් සමන්විත වූ මේ කාන්තාව දෙස බැලීමෙන් හදවත ප්‍රීතියෙන් මත්වී පිරෙයි. ඇය දෙස බැලූ මට ඓතිහාසික නවකතාවල එන දියානා පුවතියේ මර්ගෝ රැජින, ලා.වලියේ තරුණ කත මෙවැනිම රූ සපුවෙකින් සිටියහයි සිතිණි.

නගරයේ යුද්ධ හමුදා ඩිවිෂනයට අයත් යුද්ධ නිලධාරීහු නිතර ඇය වට කර ගෙන උන්හ. හවස ඇගේ ගෙදර පියානෝ, වීණා, ගිටාර වාදනය ඇසිණි. ඒ ගෙදර රැස්වූවෝ ගැයූහ. නැටූහ, අන් අයට වඩා ඇය අසල වැඩියෙන් කරකැවුණේ මිටි කකුල් ඇති, තරබාරු මේජර ඔලේසොව්ය. ඔහුගේ නහය රතුය. හිසකේ පැසිලාය. ඔහු ඇඟ පුරා තෙල් තවරාගෙන සිටියේ නැවේ යාන්ත්‍ර ශිල්පියා මෙනි. ඔහු ඉතා හොඳින් ගිටාරය වැයූ අතර, කාන්තාවගේ සුවච, කීකරු මෙහෙකරුවකු ලෙස හැසුරුණේය.

ඒ කාන්තාවගේ පස් හැවිරිදි දියණිය මවු මෙන්ම වාසනාවන්ත රුවැත්තියක වූවාය. ඇගේ හිසකේ

කැරැලි ගැසිලාය, සිරුර ගෝලාකාරය. සුනිල්වන් ඇගේ විශාල නෙත්, බැරෑරුම් බවක් පෙන්වති. ඇගේ බැල්ම සන්සුන්ය, යමක් බලාපොරොත්තු වන විටෙක මෙනි. ඒ දැරියගේ මුහුණෙහි ළමා නොවන කල්පනාකාරී යමක් පෙනෙන්නට තිබිණි.

ඇගේ ආච්චි සේවක සෙබළා වන ත්‍යුප්‍යාවෙව් සමඟ එකතුව උදේ සිට රෑ වන තුරු ගෙදර වැඩවල යෙදුණේ, මූසල, ගොළු, තරබාරු, වපර මෙහෙකාරියත් සමඟය. කුඩා දැරිය බලා ගැනීමට ආයා කෙනෙක් නොවූවාය. ඇය ජීවත් වුණේ වැඩිහිටියන්ගේ සොයා බැලීමක් නැතිවය. උදේ සිටම, දවස පුරා ගෙදර ඉස්තෝප්පුවේ, නැතිනම් ගෙය ඉදිරිපිට ඇති ලී ගොඩේ ඈ සෙල්ලම් කළාය. හවස් කාලයේදී මම නිතර පාහේ ඇයත් සමඟ සෙල්ලම් කළෙමි. එහෙයින්ම මම ඇයට බෙහෙවින් ආදරය කළෙමි. ඈ මට ඉක්මනින්ම පුරුදු වූ අතර, මම ඇයට විවිධ කතා කියන විට ඈ මගේ දෑතට හිස තබා ගෙන නිදා ගත්තාය. මම ඇය ඔසවාගෙන ගොස් ඇගේ ඇඳෙහි තැබීමි. ඇය රාත්‍රී නින්දට යාමට පෙර මගෙන් සමු ගැනීම අනිවාර්ය දෙයක් බවට පත් විය. මා පැමිණි විට ඈ ඉතා වැදගත් ලෙස ඇගේ කුඩා අත මා වෙත දිගු කැරමින් මෙසේ කිව්වාය:

"හෙට වන තුරු ආයුබෝවන්! ආච්චියේ, කොහොමද කියන්න ඕන?"

"දෙවියෝ නුඹ ආරක්ෂා කරත්වා!" ආච්චි කිව්වේ කටින් සහ නාසයෙන් නිල්වන් දුම් ගුළි පිට කැරමිනි.

"හෙට වනතුරු දෙවියෝ නුඹ ආරක්ෂා කරත්වා! ඉතින් මම නිදා ගන්නවා." දැරිය එසේ පවසා මල් වැඩ දමා ඇති බිලැන්කේට්ටුව ඔතා ගත්තාය.

"හෙට විතරක් නොවේ. හැමදාම!"

"හැමදාමත් හෙටක් තියෙනවා නේද?"

'හෙට' යන වචනයට ඈ ඇලුම් කළ අතර, ඇය කැමති හැම දෙයක්ම ඈ අනාගතයට කල් දැමුවාය. කඩා දැමූ මලක් නැතිනම් ගසක අත්තක් සිටවන මේ දැරිය.

"හෙට මෙතන මල්වත්තක්...."

"ඔන්න කවදා හරි හෙට වුණාම මාත් අම්මා වගේ අස්පයකු අරගෙන පිට උඩ නැඟලා යනවා." යැයි කිව්වාය.

බුද්ධිමත් නමුදු, මේ කුඩා දැරිය එතරම් ප්‍රීතියෙන් නොසිටියාය. ප්‍රබෝධයෙන් සෙල්ලම් කරන විට පවා ඈ හිටිහැටියේ ප්‍රශ්න කරයි.

"පූජකයන්ට ගෑනුන්ට වගේ දිග කොණ්ඩ තියෙන්නෙ මොකද?"

කහඹිලියා ගැවුණු විට ඇගේ හම රත් පැහැ ගත්තෙන්, ඈ කහඹිලියා පැළයට තර්ජනාත්මක ලෙස ඇඟිල්ලක් ඔසවා මෙසේ තෙපලායඃ

"ඔන්න බලාගනින්, මම දෙවියන්ට කියනවා, එතකොට දෙවියෝ නුඹව කාලා දමාවි. නුඹට බොහොම පාඩු වේවි. දෙවියන්ට පුළුවනි අපේ අම්මාට වුණත් දඬුවම් කරන්න...."

සමහරදාට මේ කුඩා දැරිය බැරෑරුම්, නිහඬ දොම්නසකින් පසුවෙයි. ඈ මට තුරුලු වී, සුනිල්වන් නෙත් අහසට යොමු කොට, යමක් බලාපොරොත්තු වෙමින් කතා කරයි.

"ආච්චිට තරහ යනවා. අම්මා තරහ වෙන්නේම නෑ. හිනාවෙනවා විතරයි. ඔක්කෝමල්ලා ඈට ආදරෙයි. අම්මාට වෙලාවක් නැති හින්දා. අම්මාව බලන්න මිනිස්සු ගොඩක්, ගොඩාක් එනවා. අම්මා බෝම ලස්සනයි. අම්මා බෝම මිහිරියි. ඔලේසොව් කියනවා, 'මගේ මිහිරි අම්මා!' කියලා..."

මේ දැරියට සවන් දීම මගේ අති විශාල ප්‍රීතියට හේතුවිය. මා නොදත් ලෝකයක් ගැන ඕ විස්තර කළාය. ඈ ඇගේ අම්මා ගැන බොහෝ දේ ඉතා කැමැත්තෙන් විස්තර කළාය. මා ඉදිරියේ අමුතු ලෝකයක් නිහඬව විවෘත විය. යළිත් මතක පටයට මර්ගෝ බිසවගේ චරිතය ඇතුළු විය. මේ නිසා පොත් පිළිබඳ මගේ ඇති විශ්වාසයත් එමෙන්ම ජීවිතය පිළිබඳ වුවමනාවත් වැඩි විය.

දවසක් දා මම ගෙපිළෙහි වාඩි වී පිටතට ඇවිදීමට ගිය මගේ හාම්පුතුන් බලාපොරොත්තුවෙන් සිටින විට, කුඩා දැරිය මගේ දෑත් මත හිස තබාගෙන නිදන්නට

වූවාය. එවිටම වාගේ ඇගේ මවු අසු පිටින් පැමිණ, ඉතා ලෙහෙසියෙන් බිමට පැන හිස ඔසවා ප්‍රශ්න කළාය.

"නිදා ඉන්නේ මගේ දුවද?"

"ඔව්"

"ඒකත් එහෙමද?"

සෙබළ මෙහෙකරුවා ඉදිරියට පැන අසු භාරගත්තේය. ඈ සබුක්කුව බඳ වටා ඇති රෙදි පටියේ අමුණාගෙන දෑත් දිගු කළාය.

"ඔය ළමයාව මට දීපන්!"

"මම ඇඳට ගෙනයන්නම්" මම කිව්වෙමි.

"හේ!" ඈ මට කෑ ගැසුවේ අශ්වයාට කෑ ගැසූ පරිදිය. ඈ වේගයෙන් පයක් මිදුලේ ලී පඩියට ගැසුවාය.

දැරිය අවදි වී දෙනෙත් නටවා ඇගේ මවු දෙස බලා ඇය වෙත දෑත් දිගු කළාය. ඔවුහු ගෙට ගියහ.

මා කෑ ගැසීම්වලට පුරුදුය. එහෙත්, මේ කාන්තාවගේ කෑ ගැසීම නිසා මසිත අසතුටක් ඇතිවිය. ඈ සෙමින් අණ කළා වුවද, හැම දෙනෙක්ම ඇයට කීකරු වෙති.

ඊට විනාඩි කිපයකට පසුව ඒ ගෙදර වපර ඇසක් ඇති මෙහෙකාරිය විත්, මගෙන් සමු ගන්නේ නැතිව දැරිය නිදා ගන්නට කැමැති නැති බැව් පවසා සිටියාය.

මා දැරියගේ මවු ඉදිරියේ පෙනී සිටියේ ආඩම්බරයෙන් තොරව නොවේ. දැරිය මවුගේ දණහිස් මත වාඩි වී සිටි අතර, ඈ දැරියගේ ඇඳුම් කඩිසර ලෙස ගලවන්නට වූවාය.

"ඔන්න ඇවිත්. ඔන්න ඇවිල්ලා මේ රකුසා."

"එයා රකුසා නොවේ. ඒ තමා මගේ ළමයා." දැරිය කිව්වාය.

"ඒකත් එහෙමද? බොහෝම හොඳයි. අපි එහෙනම් දුවගේ ළමයාට මොනවා හරි තෑගි කරමු. දුව කැමතිද?"

"ඔවු. කැමතියි."

"අපූරුයි. මම තෑග්ගක් දෙන්නම්. දුව ගිහින් නිදා ගන්න!"

"හෙට වෙනකල් ආයුබෝවන්!" දැරිය අත දිගු කොට මෙසේද තෙපලායඃ "දෙවියෝ හෙට වන තුරු නුඹ රකිත්වා!"

මවිත වූ කාන්තාව ප්‍රශ්න කළාය.

"දුවට කවුද උගැන්වූවේ, ආච්චිද?"

"ඔවු..."

දැරිය නිදාගැනීමට ගිය පසු කාන්තාව මා වෙත ඇඟිල්ලක් දිගු කර ප්‍රශ්න කළාය.

"නුඹට තෑගි දෙන්නෙ මොනවද?"

මට තෑගි වුවමනා නැති බව කියා සිටි මම ඇගෙන් මෙසේ ඉල්ලා සිටියෙමි. "කියවීමට මොනවා හරි පොතක් දෙනවද?"

එවිට ඈ ඇගේ ඇඟිලිවලින් මගේ නිකට එසවූවාය. ඒවා උණුසුම්ය, එයින් සුවඳ වහනය විය. පසන් ලෙස මඳසිනා පාමින් ඕ ප්‍රශ්න කළාය.

"ඒකත් එහෙමද? නුඹ පොත් කියවනවද, නුඹ කියවා ඇති පොත් මොනවද?"

ඈ මඳ සිනා පාන විට, ඇගේ මුහුණ වඩාත් ලස්සන විය. කුළැටි ගතියෙන් යුතුව, කියවා ඇති සමහර නවකතාවල නම් කීපයක් මම කියුවෙමි.

"ඒ පොත්වලින් නුඹේ සිත් ගත්තේ මොනවාද?"

අතක් මේසය මත තබාගෙන සෙමින් ඇඟිලි නටවමින් ඈ ප්‍රශ්න කළාය.

ඇය වෙතින් යම් කිසි අපූරු මල්වල සුවඳක් වහනය වූයේ, අශ්වයාගේ ඩාදිය ගඳද මුසු කරමිනි. ඇගේ දිගැති ඇස් පිහාටු සහිත ඇස්වලින් ඇය මා දෙස බැලුවේ කල්පනාකාරී, බැරෑරුම් විලාසයකිනි. මීට පෙර කිසිවෙක් මා දෙස එලෙස බලා නැත්තාහ.

ඒ කාමරයේ ලස්සන ගෘහ භාණ්ඩ බොහොමයක් තිබුණෙන්, එහි කුරුලු කූඩුවෙක මෙන් තදබදයක් දැනිණි. මල් බඳුන් නිසා ජනේල වැසී තිබිණි. හවස ඇදිරිය මැඩ ගිනි තපින ළිප හිම කැට වැනි සුදුවන් පිඟන් කැටවලින් සරසා ඇත. එය අසලින් කළුවන් පියානෝවක් දිලිසිණි. බිත්තියේ එල්ලා තිබුණේ ඇදිරි රන්වන් පැහැයෙන් යුත් රාමු සහිත සහතිකපත්ය. ඒවා ඇලවුණු ස්ලාව් අකුරුවලින් යුක්තය. ඒ හැම සහතික පතකම කළුවන් මුද්‍රාවක් විය. මේවා හැම දෙයක්ම මේ කාන්තාව දෙස බැලුවේ මා මෙන් යටත් සහ බයාදු ගතියෙකිනි.

ජීවත් වීම ඉතා අමාරු සහ කාන්සිය ගෙන දෙන්නක් බැවින්, පොත් කියවන විට එය අමතක වන සැටි මට හැකි පමණින් මම ඇයට විස්තර කළෙමි.

"ඒකත් එහෙමද?" ඕ ප්‍රශ්න කරමින් නැඟිට සිටියාය. ඒ අදහස නරක නැහැ. ඒ විතරක් නොවෙයි. ඒක ඇත්ත. ඉතින්? මම නුඹට පොත් දෙන්නම්. නමුත්, දැනට මා ළඟ පොත් නැහැ. ඒ වුණත් මෙන්න මේ පොත ගනින්..."

ඈ දිවානය මත තිබූ කහවන් කවරයක් සහිත පරණ පොතක් මට දුන්නාය.

"නුඹ මේක කියවූවායින් පස්සෙ දෙවැනි කාණ්ඩය දෙන්නම්. කාණ්ඩ හතරක් තියෙනවා..."

මෙෂේර්ස්කි කුමාරයා විසින් ලියන ලද 'පිතර්බුර්ගයේ රහස්' නමැති ඒ පොත මා කියවන්නට පටන් ගත්තේ ඉමහත් අවධානයෙකිනි. පීතර්බුර්ගයේ රහස් මැඩ්රිඩ්, ලන්ඩන් සහ පැරිස් නගරවල රහස්වලට වඩා සිත පාළු කරවන බව මට පළමුවැනි පිටුවේ සිටම පැහැදිලි විය. 'නිදහස සහ පොල්ල' පිළිබඳ කතාව මට විනෝදයක් ලබාදීමට සමත් විය.

"මම නුඹට වැඩියෙ උසස්, මොකද දන්නවද, මට වැඩි නුවණක් තිබෙන නිසා" නිදහස පොල්ලට කිව්වා.

"නැහැ, මම නුඹට වැඩියෙ උසස්, මට නුඹට වැඩියෙ ශක්තිය තියෙනවා." පොල්ල පිළිතුරු දුන්නා.

දෙදෙනා තර්ක කරලා, තර්ක කරලා අන්තිමට ගුටි කෙළ ගත්තා. පොල්ල නිදහසට තඩි බෑවා. මට මතක හැටියට නිදහස පොල්ලෙන් හොඳටම ගුටි කා රෝහලේදි මිය ගියා.

නිහිලිස්ට් (නාස්තික) වාදීන් ගැනද ඒ පොතේ සටහන් වී තිබිණි. මෙෂේර්ස්කි කුමාරයා කියන විදිහට නිහිලිස්ට්වාදියා කොතරම් විෂ සහිත පුද්ගලයෙකුදයත්, ඔහුගේ බැල්මෙන් වුව, ඔහුට කිකිළියකු මරා දැමිය හැකිය. නිහිලිස්ට් නමැති වචනය අමනාපය පළ කරන, අශෝභන වචනයක් ලෙස මට පෙනුණු අතර, එයට වඩා යමක් වටහා ගැනීමට මට නොහැකි වූයෙන්, මම පසුතැවිල්ලට පත්වීමි. හොඳ පොත් කියවා තේරුම් ගැනීමට මට නොහැකි බැව් පැහැදිලි විය. පොත ඉතා

හොඳ බව මට ඒත්තු ගොස් තිබිණි. මේ තරම් ලස්සන කාන්තාවක් නරක පොත් නොකියවනු ස්ථිරය.

මෙෂේර්ස්කිගේ ඒ කහ පැහැති පොත කියවා මා ඇයට භාර දුන් විට, ඈ මගෙන් ප්‍රශ්න කළාය. "ඉතින් ඒ පොත හොඳද?"

නැතැයි කීමට මට නොහැකි වූයේ, ඇය තරහ වෙතියි මා කල්පනා කළ බැවිනි.

එහෙත්, ඈ සිනහා පාමින් තිරයට එහා ඇති ඇගේ ඇඳ තිබෙන ස්ථානයට ගොස් නිල් පැහැති කවරයක් සහිත කුඩා පොතක් ගෙනාවාය.

"මේ පොතට නම් නුඹ බොහොම කැමති වේවි. නමුත් පොත කිලිටි කරන්න එපා!"

ඒ පුෂ්කින්ගේ කවි පොතකි. මින් පෙර නොදුටු විරූ ලස්සන ස්ථානයකට පැමිණි විට එකවර ඒ ස්ථානය බැලීමට ඇතිවන ගිජු ආසාවට සමාන කෑදර හැඟීමෙකින් යුතුව, මම ඒ කවි සියල්ල එකවර කියැවීමි. කැලෑවේ මඩගොහොරු සහිත බිම්වල බොහෝ වෙලාවක් ඇවිද හිටි හැටියේම හිරු එළිය සහ ලස්සන මල් සහිත පවිත්‍ර තණ පිටියකට වැදුණු විට එවැනි සුහද සොම්නසක් ඇති වේ. එවන් තණ පිටියක සුන්දරත්වය දෙස විනාඩියක් බලා, අනතුරුව මුළු තණපිටිය වටේ දුවයි. එවන් තණ පිටියෙක පාද ස්පර්ශ වන විට නිහඬ ප්‍රීතියෙකින් හදවත පිනා යෙයි.

පුෂ්කින්ගේ සරල හා ගීතමය කවි නිසා මා කොතරම් මවිතයට පත්වීදයත්, ගද්‍ය සාහිත්‍යය ස්වාභාවික නොවන බවක් මට බොහෝ වේලාවක් තිස්සේ පෙනිණි. ඒවා කියැවීමද පහසු නොවීය. රුස්ලාන්ගේ කවි කතාවලට ලියා ඇති පූර්ව වාක්‍ය මගේ ආච්චිගේ ඉතාම හොඳ කතාවලට සමාන විය. එය පෙළ කීපයකට අපූර්ව ලෙස ගළපා ඇති අතර, එහි ඇති නොසැගෙන සත්‍යය මා විස්මයට පත් කළේය.

එහිදී, නොදුටු විරූ මාර්ගවල
පා සටහන්ය නොදුටු විරු සතුන්ගේ...

පුෂ්කින්ගේ අපූරු කවි මම සිතින් කියවන්නට වීමි. ඇසට යම්තමින් පෙනෙන, එනමුදු, මා ඉතා හොඳින් අඳුනන, තවමත් පිනි බිඳු වැටී නැති පයට නොපෑගුණු තණ සහිත, ගුප්තමය මාර්ගයන් මනැසින් මම දකිමි. ඒ පිනිබිඳු බරතිය. රසදිය මෙනි. පූර්ණ ශබ්ද සහිත ඒ කවි ඉතා හොඳින් මට කටපාඩම් විය. එයින් කළ කාව්‍යමය විස්තරය උත්සවාකාරී සුන්දරත්වයක් මවා පෑවේය. මේ කවි මා වාසනාවන්තයකු බවට පත් කළේය. මගේ ජීවිතය සැහැල්ලු විය. ප්‍රිය විය. නව ජීවිතයක හොරණෑවක් මෙන් එම කවි හඬ නැඟීය. අකුරු කියැවීමට හැකිවීම කොතරම් ලොකු වාසනාවක්ද!

පුෂ්කින්ගේ ඉතා අගනා කවි මට වඩාත් කිට්ටු,තේරුම් ගත හැකි දෙයක් බවට පත් විය. කීපවරක් ඒවා කියැවීමෙන් පසු මට එය කට පාඩම් විය. නිදා ගැනීමට යන විට, මම දෙනෙත් වසා ගෙන ඒ කවි සෙමින් කියමි. ඒ කවි කතා මම නිතර පාහේ සෙබළ මෙහෙකරුවනට කියුවෙමි. ඔවුහු එය අසා සිනාසෙමින් මිහිරි ලෙස බැණ වැදුණහ. සීදරව් මගේ හිස අතගාමින් සෙමින් මෙසේ කියයි.

"ඔන්න කොතරම් අපූරුද? අනේ දෙවියනි..."

මා අපූරු උද්දාමයකින් පෙළෙන සැටි මගේ හාම්පුත්තු දුටහ. මැහැල්ල මට බැණ වැදුණාය.

"පොත් කියවලා තෝ පිස්සු වැටිලා. සමවාරය දවස් හතරක් තිස්සේ සුද්ද කරලා නැහැ! කෝටුවක් අතට ගත්තාම..."

මොන කෝටුවක්ද? ඇයගෙන් ආරක්ෂා වනු වස් මම පුෂ්කින්ගේ කවි කියුවෙමි.

ඇත්තියකි දුෂ්ට හදවතක්
මැහැල්ලකි, යකින්නක්...

මට පොත් දුන් කාන්තාව මගේ නෙත් ඉදිරිපිට වඩා උසස්ව පෙනිණි. ඈ කොතරම් හොඳ පොත් කියවන්නීද...! මැය ඇඳුම් කපන ශිල්පියාගේ බිරිඳ වැනි පිඟන් බෝනික්කකු නොවේ.

මා පොත ගෙනැවිත්, දොම්නස් සිතින් ඇයට භාර දුන්

විට, ඈ විශ්වාසයකින් යුතුව කතා කළාය.

"ඒ කවිවලට නුඹ කැමැතිය! නුඹ පුෂ්කින් ගැන අහලා තියෙනවද?"

පුෂ්කින් ගැන මා කිසියම් සඟරාවෙක කියවා තිබුණද, ඇගේ විස්තරය ඇසීමට මා ඉතා කැමැති වූයෙන් නැතැයි කිව්වෙමි.

පුෂ්කින්ගේ ජීවිතය හා මරණය ගැන කෙටි විස්තරයක් කළ ඈ, වසන්තය මෙන් සුන්දර ලෙස මඳ සිනා පාමින් ප්‍රශ්න කළාය.

"ගැහැනුන්ට ආලය කිරීම කොච්චර භයානකදැයි පේනවා නේද?"

මා කියැවූ හැම පොතකින්ම ඒ ගැන කියා තිබුණු අතර, එය භයානක මෙන්ම, හොඳ දෙයක් බවත්, මම දැන සිටියෙමි. මගේ පිළිතුර මෙසේ විය.

"භයානක වුණාට හැම කෙනෙක්ම ආලය කරනවා!

ගැහැනු ආලය නිසා දුක් විඳිනවා..."

ඈ ඇසිපිය අතරින් මා බලන්නාක් මෙන් විනිවිද යන බැල්මෙකින් මා දෙස බැලුවාය.

"ඒකත් එහෙමද? නුඹ ඒකත් දන්නවාද? එහෙනම් මම නුඹට යහපත පතනවා. නුඹ ඒ ගැන අමතක කරන්න එපා!" යැයි ඇය පැවසුවේ ඉතා බැරෑරුම් ලෙසිනි.

මා කැමැති කවි මොනවා දැයි ඕ අනතුරුව විමසන්නට වූවාය.

මා මොනවාදෝ ඇයට කියමින්, දෑත් වනමින් සමහර කවි කිව්වේ කට පාඩමිනි. ඈ නිහඬව සහ බැරෑරුම් ලෙස මට සවන් දී සිට අනතුරුව නැඟිට කාමරයෙහි සක්මන් කරමින් කල්පනාකාරී ලෙස තෙපලන්නට වූවාය.

"ආදරණීය තිරිසන් පැටියෝ, නුඹ ඉගෙනගත යුතුයි!" මම ඒ ගැන කල්පනා කර බලන්නම්.... නුඹගේ හාම්පුතාලා නුඹේ නෑදෑයෝ නේද?"

මා එය අනුමත කරමින් හිස වැනූ විට, ඇය "ඕ!" යැයි කිව්වේ මට දොස් පවරන්නාක් මෙනි.

ඕ මට 'බෙරන්ෂේගේ ගීත' දුන්නාය. එය රන් මූණත සහ කැටයම් සහිත ඉතා අගනා මුද්‍රණයකි. කවරය රතු පාට සම් බැම්මකි. අති මහත් දුකක් සහිත උම්මත්තක

ප්‍රීතියක් මුසු ඒ ගීත මා පිස්සකු බවට නිට්ටාවටම පත් කළේය.

'මහලු හිඟන්නාගේ ගීතය' කියැවූ මසිත අතිමහත් දුකකින් පිරිණි.

පණුවකු වන මම තොපට අවහිර කරන්නෙම්ද?
නීචයකු වන මා පාගා දමනු!
කුමටද දුක්වන්නේ? පාගනු ඉක්මනට!
තොපි මට උගැන්වූයේ නැහැ නොවැ...
තිරිසන් ශක්තියට තොප ඉඩ නොදුන්නහුද?
පණුවාගේ සිට කුහුඹුවකු දක්වා වෙස් ගත හැකි නම්!
කුහුඹු සගයන් බදා ගෙන මියයනු ඇති මා.
මහලු වී මිය යන මම
මිනිසුන්ගෙන් පළි ගන්නා ලෙස කරමි අණ!

ඉන් ඉක්බිතිව 'අඬා වැලපෙන සැමියාගේ ගීත' කියවා, බක බක ගා සිනාසුණෙමි. බෙරන්ෂේගේ වචන මගේ මතක පටයෙහි නොමැකෙන ලෙස ඇඳිණි.

විද්‍යාවෙකි, ජීවිතය ප්‍රීතිමත්
නිකමුනට එය නොවෙති බරක්...!

නොසිඳෙන ප්‍රීතියක්, උපහාස කතා කීමට අභිලාෂයත්, හැම දෙනාටම තීව්‍ර, කැපෙනසුලු වචන බිණීමට ආසාවත්, බෙරන්ෂේ මසිතෙහි ඇති කළේය. කෙටි කලකින් එවැනි වචන ඇදබෑමට මම බෙහෙවින්ම සමත් වීමි. මම ඒ කවි කට පාඩම් කරගෙන සෙබළ මෙහෙකරුවන් වැඩ කරන කුස්සිවලට විනාඩි කීපයකට දිව ගොස් ඒවා ඔවුන් ඉදිරියේ කියා ඉමහත් තෘප්තියක් ලැබීමි.

එහෙත්, ඉක්මනින් මට ඒ කවි කීම අත්හැරීමට සිදු වූයේ මේ කවි දෙපදය නිසාය.

වයස දහහත වුණාම කෙල්ලකට
කිනම් ඇඳුමක් වුවද, ගැළපේ ඇයට!

මේ හේතුවෙන් යළිත් කෙල්ලන් ගැන ජඩ කතා ඇති විය. මෙයින් මා අතිමහත් ලෙස අවමානයට පත්වූයෙන්

යෙර්මෝහින් සෙබළාගේ හිසට ලෝහ හට්ටියකින් ගැසීමි. සීදරව් සහ අනික් මෙහෙකාර සෙබළු, යෙර්මෝහින් ගේ නුහුරු අත්වලින් මා බේරා ගත්හ. එදා සිට මම යුද්ධ නිලධාරීන්ගේ කුස්සිවලට යාම නැවැත්වීමි.

මහපාරේ ඇවිදීමට යාම මට තහනම් විය. ඇරත් මා කළ යුතු වැඩ කොටස වඩාත් වැඩි වූයෙන්, මට ඇවිදීමට වේලාවක් පවා නැතිවිය. ගෙදර මෙහෙකාරිය වෙනුවට වැඩ කිරීමත්, ගෙවත්ත අතු ගෑම, කඩේට යාම ආදියත් හැරුණු විට විශාල බෝඩ් ලෑලිවලට ඇණ ගසා, හාම්පුතාගේ සැලැස්ම ඇලවීමත්, ඔහුගේ ඉදිකිරීම් වැඩවල සටහන් පිටපත් කිරීමත්, කළමනාකරුවන්ගේ ගණන් හිලව් සොයා බැලීමත් කිරීමට මට සිදු විය. හාම්පුතා උදේ සිට රෑ වනතුරු යන්ත්‍රයක් මෙන් වැඩ කළේය.

ඒ කාලයේදී, රාජ්‍ය ගොඩනැගිලි, සල්පිල් පැවැත්වෙන දවස්වලදී පෞද්ගලික වෙළෙඳුනට අයත් විය. වෙළඳ ශාලා ඉතා ඉක්මනින් සාදන ලදී. මගේ හාම්පුතා අලුත් කඩ සෑදීමටත්, පරණ කඩ අලුත්වැඩියා කිරීමටත් භාර ගත්තේය. කඩ බක්කිවලට අවශ්‍ය ආරුක්කු සෑදීම, අට්ටාල කවුළුව සහිත පියස්ස සෑදීම ආදිය සඳහා ඇණෑවුම් ඔහු භාර ගත්තේය. ඒවා සෑදීමට ඇන්ද සැලැස්ම මගේ හාම්පුතා මා අත මහලු වාස්තු ශිල්පියා වෙත යැවූයේ රූබල් විසිපහක් බහා ලූ කවරයක් සමඟය. මහලු වාස්තු ශිල්පියා මුදල් අරගෙන, "මේ සටහන් සැබෑ තත්ත්වයක් අනුව නිවැරැදිය. ඒවා ගොඩ නැඟීම සොයා බැලීමට මම බාර ගතිමි. මීට අසුවලා." යනුවෙන් ලියුවේය. සත්තකින්ම ඔහු ඒ සටහන්වලට අදාළ කඩ බලා නැත. එමෙන්ම, ඒවා ඉදිකිරීමේදී සොයා බැලීමක් කළේත් නැත. මන්දයත්, මහලු වාස්තු ශිල්පියා රෝගියකු නිසා ඔහු ගෙදරින් එළියට පවා නොයන බැවිනි.

සල්පිලේ ප්‍රධාන පරීක්ෂකයා වෙතටත්, තවත් අවශ්‍ය මිනිසුන්ටත් මම අල්ලස් ගෙන ගියෙමි. නීති විරෝධී ඉදිකිරීම් සඳහා අවශ්‍ය ලියවිලි ඔවුන්ගෙන් ලබා ගතිමි. මේවා මගේ හාම්පුතා හැඳින්වූයේ 'ලියවිලි' යන නමිනි. මේ සියලු සේවය නිසා මගේ හාම්පුතුන් අමුත්තන්

හමුවීමට ගිය විට, ඔවුන් ආපසු එන තුරු පිළිකන්නට වී බලා සිටීමේ අයිතිය මට ලැබිණි. ඔවුන් අමුත්තන් හමුවීමට ගියේ කලාතුරකිනි. නැවත හැරී ආවේ රෑ දොළහට පසුවය. මම ඔවුන් එනතුරු පිළිකන්න ඉදිරිපිට ඇති චතුරශ්‍රයේ හෝ දර ගොඩ උඩ හෝ පැය කීපයක් තිස්සේ වාඩි වී සිටියෙමි. මම දර ගොඩ උඩ වාඩි වී, එය ඉදිරියට ඇති මගේ කාන්තාවගේ කාමර පන්තිවලින් පිටවන පසන් කතාබහට සහ සංගීතයට සවන් දුන්නෙමි.

එහි ජනේල විවෘතව තිබිණි. ජනේල රෙදි සහ මල් බඳුන් අතරින් යුද්ධ නිලධාරීන්ගේ කඩවසම් සිරුරු පෙනිණි. තරබාරු මේජර් තැන නටන අතර, කාන්තාව ඉතා චාම් ලෙසත්, සුන්දර ලෙසත් පීනන්නාක් මෙන් නටන්නට වූවාය.

මා විසින්, මටම ඇය හඳුන්වා ගනු ලැබුවේ මර්ගෝ රැජින නමිනි.

ප්‍රංශ නවකතාවල ලියන ප්‍රීතිමත් ජීවිතය මෙය විය යුතු යැයි මම ඒ ජනේල දෙස බලමින් කල්පනා කළෙමි. ඒ දවස්වල මගේ මනැස දොම්නසට හසුවිය. මගේ මර්ගෝ රැජින වටා යුද්ධ නිලධාරීන් පිරී සිටින සැටි දැකීම මගේ ළමා ඊර්ෂ්‍යාවට හේතු විය. මලක් වටා කැරකෙන මී මැස්සන්, දෙබරුන් මෙන් මේ නිලදරුවෝ හැසුරුණහ.

අන් අයට වඩා අඩුවෙන් ඇය බැලීමට උසැති, නිතර කනගාටුවෙන් පසුවන නිලදරුවෙක් පැමිණියේය. ඔහුගේ නළලේ කඩු පහරකින් කැපුණු බවක් පෙන්වන තුවාලයක සලකුණකි. ඔහුගේ දෙනෙත් ගැඹුරට පිහිටියේය. ඔහු වීණාවක් ගෙනා අතර, ඉතා දක්ෂ ලෙස එය නිතර වාදනය කළේය. ඔහු කොතරම් අපූරු ලෙස වාදනය කළේද යත්, මහ පාරේ යන එන්නෝ ජනේලය අසල නැවතී එයට සවන් දුන්හ. අපේ හාම්පුතාලා එදින ගෙදර සිටියෝ නම්, ඔවුහු ජනේල හැර, වීණා වාදනයට සවන් දී වාදකයාට පැසසූහ. පල්ලියේ ගී ගයන අන්නවිරාලට හැරුණු විට, මගේ හාම්පුතාලා වෙනත් අන් වාදකයකුට ප්‍රශංසා නොකළහ. ඒ කෙසේවතුදු, ඔවුන් සංගීතයට වඩා මාළු තෙලෙන් බදින ලද ආහාර වර්ග ප්‍රියකළ බව මම දනිමි.

සමහර දාට මේ නිලදරුවා බැරැඩි හඬකින් ගයයි. නැතිනම් කවි කියයි. එවිට ඔහු අමුතු විදිහකට හති ලමින්, අත්ලෙන් නළල වසා ගනී. දවසක් දා මා කුඩා දැරිය සමඟ මිදුලේ සෙල්ලම් කරමින් සිටින විට, මර්ගෝ රැජින ගීයක් ගයන ලෙස ඒ නිලදරුවාගෙන් ඉල්ලා සිටියාය. බොහෝ වේලාවක් එය ප්‍රතික්ෂේප කළ ඔහු අනතුරුව ඉතා පැහැදිලි ලෙස කතා කළේය.

නැතිවම බැරිය, සුන්දරත්වය ගීතයට,
කම් නැත සුන්දරත්වයට ගීතය නැතුවාට...

ඒ කවි දෙපදය මා සිත් ගත් අතර, නිලදරුවා නිසා මසිතෙහි දොම්නසක් ඇති විය.

මගේ කාන්තාව කාමරයේ හුදෙකලාව වාඩි වී පියානෝ වාදනය කරන සැටි බැලීමට මම ඉමහත් ලෙස ආසා කළෙමි. ගීත වාදනය නිසා වශී වූ මම ජනේලයත්, එයට පසුපසින් කහවන් පහන් කවරයත්, කාන්තාවගේ සිහින් සිරුරත්, ඇගේ ප්‍රෞඩ මුහුණේ පැතිකඩ පෙනුමත්, ඇගේ සුදුවන් අත් සහ ඉගිළෙන පක්ෂීන් බඳු ඇඟිලි පියානෝ සංගීත යතුරු මත නැටවෙන සැටිත් හැර අන් කිසිවක් නොදිටිමි.

ඇය දෙස බලමින්, ඇගේ දොම්නස් පිරි සංගීතයට සවන් දෙමින් මම පිස්සකු මෙන් දොඩවන්නට වීමි. කොහෙන් හරි ලොකු නිධානයක් හොයා ගෙන මම ඇයට තෑගි දෙනවා. එතකොට ඈ පොහොසත් වේවි! මම ස්කෝබ්ලෙව් සෙනෙවියා වුණා නම් ආයෙමත් තුර්කියට විරුද්ධ යුද්ධ කරලා, ඔවුන්ගෙන් ලොකු කප්පමක් අරගෙන මේ නගරයේ ඉතාම හොඳ ස්ථානයක් වන වොල්ගා නදී බෑවුම අසල ලස්සන ගෙයක් හදලා ඇයට එය තෑගි කරනවා. ඇය ගැන අහල පහල ඉන්න මිනිසුන් ජඩ කතා කියන නිසා ඈ මේ වීදියෙන් සහ ගෙදරින් ඉවත්වී වෙනත් තැනකට ගියාවේ!

අසල්වැසියෝද, අපේ ගෙවත්තේ මෙහෙකරුවෝද විශේෂයෙන්ම මගේ හාම්පුතාලාද, ඇඳුම් කපන ශිල්පියාගේ බිරිඳ අරබයා කී පරිදිම, නීච සහ දුෂ්ට කතා මර්ගෝ රැජින අරබයා කියන්නට වූහ. එහෙත්, ඔවුන් එසේ කිව්වේ වඩාත් පරෙස්සමින්, කටහඬ පහත් කරමින්

සහ වටපිට බලමිනි.

සමහර විට ඇයට බිය වුණේ ඇය සුප්‍රසිද්ධ පුද්ගලයකුගේ වැන්දඹු භාර්යාව වූ නිසා විය හැකිය. ඇගේ කාමරයෙහි රාමු කොට එල්ලා ඇති සහතික පත් ඇගේ ස්වාමියාගේ මුත්තන්ට සාර් රජවරුන් පිරිනැමූ සන්නස් පත්‍ර විය. ගදුනෝව්, අලෙක්සේයි මහා ප්‍රයෝතර් ආදී සාර් රජවරුන් ප්‍රදානය කළ සන්නස් පත්‍ර බව මට කියනු ලැබුවේ ඔවුන්ගේ මෙහෙකරු සෙබළා වන ත්‍යුප්යායෙව් විසිනි. අකුරු දත් ත්‍යුප්යායෙව් හැමදාම බයිබලය කියැවීය. සමහර විට ජඩකතා කියන්නන් බයවුණේ ඇය ඇතැති දම්පාට මැණික සහිත සබුක්කුවෙන් පහර වදිතියි යන බියෙන් විය හැකිය. ඈ එම සබුක්කුවෙන් කිසියම් වැදගත් නිලධාරියකුට පහර දුන් බවක්ද ආරංචි විය.

එහෙත්, පහත් හඬින් කියන වචන හයියෙන් කෑ ගසා කියන වචනවලට වඩා යහපත් නොවීය. මගේ කාන්තාව ජීවත්වුණේ ඇය වටා වූ සතුරු වලාකුළු මැදය. මට වටහාගත නොහැකි ඒ සතුරුකම් නිසා මම දුකට පත්වීමි. මගේ හාම්පුතාගේ මල්ලී වික්තර් මැදියම් රෑ ගෙදර එන ගමන්, ඔහු මර්ගෝ රැජින ගේ නිදන කාමරයට එබී බැලූ බවත්. ඈ රාත්‍රී ගවුම පමණක් ඇඳගෙන කුඩා පුටුවක වාඩිවී සිටි අතර, මේජර් තැන ඇය ඉදිරිපිට දණින් වැටී ඇගේ පයේ ඇඟිලිවල නියපොතු කපමින් ඇඟිලි පිස දමන සැටි දුටු බවත් පැවසීය.

මැහැල්ල බැණ වදිමින් කෙළ ගැසුවාය. තරුණ ස්වාමිදුව එනම් හාම්පුතාගේ බිරිඳ ලජ්ජාවෙන් රතු වී ඔහුට බැණ වැදුණාය.

"වික්තර්, චිකේයි! විළිලජ්ජා නැති වැඩක්! අපොයි. ඔය මහත්තුරු හරිම නීචයෝ!"

හාම්පුතා නිහඬව මඳසිනා පෑවේය. ඔහු නිහඬව සිටීම ගැන මම ඔහුට කෘතඥ වීමි. ඔහුත් ගැහැනුන් සමඟ එකතුව කෑකෝ ගසතියි, මම බියෙන් බලා සිටියෙමි. ගැහැනු 'හායි-හූයි' ගාමින් කාන්තාව වාඩි වී සිටි සැටිත්, මේජර් දණින් වැටීගෙන හුන් සැටිත් විස්තර සහිතව විමසන්නට වූහ. වික්තර් කතාව රස කරමින් එයට නවාංග ඇතුළු කළේය.

"මේජර්ගේ මුහුණ රතු පාටයි. දිව එළියට දාගෙන..."

මේජර් තැන කාන්තාවගේ නියපොතු කැපීම නින්දාවක් ලෙස නොසිතූ අතර, දිව එළියට දමාගෙන සිටි යැයි කීම බොරුවක් බව සිතා ගෙන මම වික්තර්ට මෙසේ පැවසීමි:

"ඒක හොඳ නැතිනම් ඔබ මොකටද ජනේලෙන් එබිකම් කරලා බැලුවෙ? ඔබ පොඩි එකෙක් නොවේ..."

එවිට ඔවුහු මට බැණ වැදුණහ. එහෙත්, එයින් මම අමනාපයට පත් නොවීමි. වහාම ඇය සොයා ගොස් ඇය ඉදිරියේ මේජර් මෙන් දණින් වැටී ඇගෙන් මෙසේ ඉල්ලා සිටීමට පමණක් මට සිත්විය.

"කරුණාකර මේ ගෙදරින් වහාම පිටවී යන්න!"

වෙනත් ජීවිතයක්, වෙනත් මිනිසුන්, හැඟීම් හා චින්තන ඇති බව මා දැනගත් ඉක්බිතිව, මෙම නිවාසයත්, එහි වාසය කරන සියලු දෙනාත් කෙරෙහි මා තුළ ඇති වූයේ, වඩාත් වැඩි පිළිකුලකි. නින්දා සහගත වාචාල කතා සහිත දැලක් බඳු කැත ජාලාවකින් එම නිවෙස වැසිලාය. මෙහි දුෂ්ට සිතින් කතා නොකළ එකද මිනිහකුවත් නැත. යුද්ධ බළකායේ පූජකයා රෝගී, දුක්මුසු මිනිහෙකි. ඔහු බේබද්දකු බවත්, නරුමයෙකු බවත් හැමදෙනාම කීහ. මගේ හාම්පුතාලා කියන පරිදි යුද්ධ නිලධාරීන් සහ ඔවුන්ගේ බිරියන් වාසය කළේ පව් ගොඩක ගිලෙමිනි. මෙහෙකාර සෙබළුන් ගැහැනුන් ගැන කියන ඒකතානමය කතා මට නොරිසි විය. මා අන් හැමටම වඩා කලකිරුණේ මගේ හාම්පුතුන් නිසාය. අනුකම්පා විරහිත ලෙස මිනිසුන් විවේචනයට හසුකිරීමේ ඔවුන්ගේ ක්‍රියාවේ නිසි වටිනාකම මම හොඳ හැටි දැන සිටියෙමි. මිනිසුන්ගේ දුර්ගුණයන් නිරීක්ෂණය කිරීම නොමිලේ ලබාගත හැකි එකම විනෝදයකි. මගේ හාම්පුතුන් එතරම් ධර්මිෂ්ඨ, අමාරු සහ පාළු ජීවිතයක් ගත කරතියි සිතමින්, ඔවුහු අසල්වැසියන්ට වචනවලින් පහර දෙමින් ඔවුන්ගෙන් පළිගත්හ.

මර්ගෝ රැජින ගැන ජඩ කතා කියන විට මම ළමා නොවන උමතුවකින් පෙළෙන්නට වීමි. ඒ කතා පතුරුවන්නන්ට මම මුළු සිතින්ම වෛර කළෙමි. තියුණු උපහාස කතා කීමට ඇති ආසාව මා මැඩ ජය ගත්තේය.

සමහර විට මා කෙරෙහිත්, මා වටා ඇති මිනිසුන් කෙරෙහිත් වේදනාකාරී අනුකම්පාවක්ම සිතෙහි උපනි. මෙම ගොළු අනුකම්පාව වෛරයට වඩා බරපතළ විය.

මර්ගෝ රැජින ගැන මම අන් අයට වඩා දැන සිටියෙමි. මම ඇය ගැන දන්නා බව, ඔවුන් දැන ගනිතියි මම බියවීමි.

උත්සව දවස්වලදී මගේ හාම්පුතුන් දවල් පූජාව සඳහා දේවස්ථානයට ගිය විට, මර්ගෝ රැජින ඇගේ යහන් ගැබට මා කැඳවයි. රන්වන් සේද රෙද්දෙන් නිමැවූ මෙට්ටයක් සහිත කුඩා පුටුවේ මා වාඩි වූ විට, ඇගේ පුංචි දුව මගේ දණහිස් මත නැඟ මට තුරුලු වෙයි. මම ඇගේ මවට මා කියැවූ පොත් ගැන විස්තරයක් කරමි. රැජින ඇඳෙහි වැතිර ගෙන ඇගේ කුඩා අත් කම්මුල යට තබාගෙන සිටී. ඇගේ සිරුර පොරෝනයට සැඟවී ඇත. එම පොරෝනයද යහන් ගැබෙහි ඇති අන් සියලු දේ මෙන්ම, රන් පැහැතිය. ගෙතූ ඇගේ දිගැති කළු කොණ්ඩය ඇගේ දුඹුරුවන් උරහිස මත වැටිලාය. සමහරදාට ඇගේ කොණ්ඩය ඇඳේ සිට බිම දක්වා විහිදී තිබිණි.

මගේ කතාවට සවන් දෙන ඇය මා දෙස බලන්නේ මෘදු නෙත්වලින් යම්තමින් මඳ සිනා පාමින් ඈ කතා කරයි.

"ඒකත් එහෙමද?"

ඇගේ ආශීර්වාදාත්මක මඳහස පවා මට පෙනුණේ රැජිනකගේ සානුකම්පිත මඳ සිනාවක් ලෙසිනි. සුරතල් පාන කටහඬකින් ඈ කතා කළාය. මට හැඟුණේ ඇය හැමදාම එකම දෙයක් ගැන කියන සැටියකි.

"සියලු මිනිසුන්ට වඩා මා නොමිණිය හැකි තරම් හොඳයි, පිරිසුදුයි, ඔවුන්ගෙන් එකකුවත් මට ඕනෑ නැහැ."

සමහර දාට ඇය හිස පීරන සැටි මම දැක ඇත්තෙමි. පහත් පුටුවෙක වාඩි වී ඈ හිස පීරන්නට වූවාය. ඇගේ කොණ්ඩය පුටු ඇන්දට වැටී බිම ගෑවෙන තරම් පහත් වී තිබුණු අතර, එහි අග ඇගේ දණහිස් මත අවටද විසිරි තිබිණි. මගේ ආච්චිගේ කොණ්ඩය මෙන්ම, එය දිගැතිය, ඝනව වැඩිලාය. දුඹුරුවන් ඇගේ ශක්තිමත් දෙතන මම දැක ඇත්තෙමි. ඈ මා ඉදිරියේ තනපට ඇන්දාය. ඈ

පාද ජාල ඇන්දේත් මා ඉදිරියේදීය. එසේවතුදු ඇගේ පවිත්‍ර පාද දකින මට ලජ්ජාවක් ඇති නොවූවා පමණක් නොව, ඇය නිසා ප්‍රීතිමත් ආඩම්බර හැඟීමක් ඇති විය. ඇය අරබයා නරක හැඟීම් ඇති කිරීම වළක්වාලන කුසුම් සුවඳක් ඇගෙන් වහනය විය.

යහපත් සෞඛ්‍යයකින් හා ශක්තියෙන් සිටි මම පිරිමින් සහ ගැහැනුන් අතර ඇති වන ලිංගික සබඳකම් ගැන දැන සිටියෙමි. එහෙත්, මිනිසුන් මා ඉදිරිපිට එම රහස් ගැන කතා කළේ කොතරම් ලොකු දුෂ්ට තෘප්තියකින් හා ක්‍රූරත්වයකින්ද යත්, කොතරම් නීච ලෙසකින්ද යත්, මෙම ගැහැනිය පිරිමින්ගේ වැලඳ ගැනීමට ලක්වීම මට සිතින් සිතා ගැනීමට පවා නොහැකි විය. කිසිවකුට අධම ලෙසත්, ලජ්ජා රහිත ලෙසත් මේ ගැහැනියගේ සිරුරට අත තැබීමට අයිතියක් තිබේ යැයි සිතා ගැනීමට පවා දුෂ්කරය. මර්ගෝ රැජින කුස්සියේත්, කළුවර කාමරයේත් කරන ආලය නොදැන සිටියහයි මම විශ්වාස කළෙමි. ඇය උසස් ප්‍රීතියක් සහ වෙනත් වර්ගයක ආලයක් දන්නවා විය යුතුය.

එක් දවසක් හවස්වීමට ඔන්න මෙන්න කියා තිබියදී, මම මර්ගෝ රැජිනගේ විසිත්ත කාමරයට පැමිණියෙමි. ඇගේ යහන් ගබඩාවේ, මගේ සිත් ගත් ඇගේ සිනාව සහ තවත් මිනිහකුගේ කටහඬද ඇසිණි.

"නවතින්න... දෙවියනේ! විශ්වාස කරන්න බැහැ" යැයි පිරිමි කටහඬ කියන සැටි ඇසුණු විට මා පිට වී යා යුතු බව වැටහුණද මට එසේ යාමට නොහැකි විය.

"ඔතන කවුද?" ඈ ප්‍රශ්න කළා ය. "ආ, ඒ නුඹද? වරෙන්..."

මල් සුවඳ නිසා ඇගේ නිදන කාමරයෙහි තද අපහසුවක් දැනිණි. ජනේල තිරවලින් වසා තිබුණෙන්, ඇඳිරි බවක් එහි විය. මර්ගෝ රැජින ඇඳෙහි වැතිර ගෙන නිකට දක්වා පොරෝනයෙන් වසාගෙන සිටියාය. වීණා වාදක යුද්ධ නිලධාරියා යට කමිසයක් ඇඳ නග්න පපුව ඇතිව ඇය අසලින් වාඩි වී සිටියේය. ඔහුගේ පපුවේ දිගැති තුවාල කැළලකි. එය දකුණු උරහිසේ සිට පපුවේ වක්ෂසීය මාංස පේෂියේ පුඩුව දක්වා විහිදී ඇති සැටි

කාමරය තුළ ඇති අන්ධකාරය පවා නොතකා පැහැදිලි ලෙස පෙනිණි. ඔහුගේ හිසකේ අවුල් වෙලා ය. ඔහුගේ කනගාටුදායක, තුවාල කැළැල් සහිත මුහුණේ මම ප්‍රථම වරට මඳ සිනාවක් දුටිමි. ඔහු සිනාසුණේ අපූරු ආකාරයකටය. ඔහුගේ විශාල (ස්ත්‍රියකගේ බඳු) දෙනෙත් රැජින දෙස එල්ල වුණේ හරියට ඒවා ප්‍රථම වරට ඇගේ සුන්දරත්වය දුටු විටෙක මෙනි.

"මේ මගේ යාළුවා" යැයි ඈ කියුවේ මට ද නැතිනම් ඔහුටද යන්න මම නොදනිමි.

"නුඹ බය වුණේ මොකටද?" ඈ මට ඇතින් සිට ගෙන කතා කරන සැටියක් දැනිණි. "මෙහෙ වරෙන්..."

මා ඇය අසලට ගිය විට ඈ නග්න උණුසුමැති අතකින් මගේ ගෙල බදාගෙන මෙසේ තෙපලායඃ

"නුඹ ලොකු වුණාම, වාසනාවන්ත කෙනෙක් වේවි... පලයන්!"

මම ගෙනා පොත රාක්කයෙහි තබා, අලුත් පොතක් රැගෙන ඉවත ගියෙමි.

මගේ හදවත බිඳෙන සැටියක් මට දැනිණි. මගේ මර්ගෝ රැජින අන් අය මෙන්ම, ආලය කරන බවක් මා විනාඩියකට හෝ කල්පනා නොකළද, නිලධාරියා එවැන්නක් ගැන සිතීමට මට ඉඩ නොතැබීය. ඔහුගේ මඳ සිනාව මගේ මනැස ඉදිරියෙහි පෙනිණි. බලාපොරොත්තු විරහිත ලෙස මවිතයට පත් ළමයකුගේ සිනාවකි. එය, ඔහුගේ දුක්බර මුහුණ එයින් අමුතු පණක් ලැබීය. ඔහු ඇයට ආලය කළ යුතුය. ඇයට ආලය නොකර සිටිය හැකිද? ඔහු ඉතා අපූරු ලෙස වීණා වාදනය කළ නිසා දයාන්විත ලෙස කවි කියන නිසා ඔහුට ත්‍යාගශීලී ලෙස ආලය කිරීමට ඇයට පිළිවන.

එලෙස සිත වාවාගැනීම මා කළ යුතුව තිබුණද, හැම දෙයක්ම එතරම් හොඳ නැති බවත්, මා දුටු හැම දෙයක් කෙරෙහිත්, මර්ගෝ රැජින කෙරෙහිත් මා දක්වන ආකල්පය නිවැරැදි නොවන බවත් මට පැහැදිලිව පෙනිණි. යමක් නැතිවූ විටෙක මෙන් හැඟීමෙකින් මා පීඩා විඳි අතර, දවස් කීපයක්ම මම ඉමහත් දුකකින් තැවුණෙමි.

දවසක් දා මම රෞද්‍ර ලෙසත්, ගොරහැඩි ලෙසත් මුරණ්ඩුකම් කොට, පොතක් ලබා ගැනීමට මගේ රැජින වෙත පැමිණියෙමි. එවිට ඈ මට දැඩි ලෙස කතා කළාය.

"මට ලැබුණු ආරංචි අනුව නුඹ මහ ගෝරිකාරයෙක් වගෙයි. මම නම් නුඹ ගැන එහෙම සිතුවේ නැහැ...."

ඉවසා සිටීමට මා අසමත් වූයෙන්, මට ජීවිතය ඉතා කටුක වී තිබෙන බවත්, ඇය ගැන ජඩ කතා කියන විට එය අසා සිටීම නොකළ හැකි දෙයක් බවත්, මම ඇයට විස්තර කළෙමි.

ඈ මා ඉදිරිපිට සිටගෙන, මගේ උරහිසට අතක් තබා ගෙන මුලදී සාවධානව සහ බැරෑරුම් ලෙස මගේ කතාවට සවන් දුන්නද, ඉක්මනින්ම සිනාසෙමින් මා සෙමින් තල්ලු කළාය.

"ඔය ඇති. මා ඒවා සියල්ලම දන්නවා. නුඹට තේරුණාද? මම දන්නවා!"

අනතුරුව ඈ සුරතල් ලෙස මගේ දෑත් ගෙන මෙසේ තෙපලාය:

"ඔය කැත කතා ගැන නුඹ අඩුවෙන් සලකන තරමට නුඹට හොඳයි... ඒ වුණාට නුඹ හොඳට දෑත් හෝදලා නැහැ...."

එවැන්නක් ඇය නොකියා සිටියා නම් මැනවි, ඇයත් මා මෙන්ම, පිත්තල භාණ්ඩ මැද, ගෙබිම සෝදා, ළමයින්ගේ හාන් රෙදිත් සොදන්නේ නම්, ඇගේ අත් මගේ අත්වලට වඩා නොදෙවැනි වනු ඇත.

"මිනිහෙක් හොඳට ජීවත් වන විට ඔහු කෙරෙහි කෝප වෙනවා, ඔහුට ඉරිසියා කරනවා. මිනිහෙක් නරකට ජීවත් වන විට ඔහුව හෙළා දකිනවා." යැයි ඕ කල්පනාකාරී ලෙස තෙපලාය. ඈ මා ඇය වෙතට ඇදගෙන මා දෙස සුරතල් ලෙස බලා ප්‍රශ්න කළාය.

"නුඹ මට ආදරේද?"

"ඔව්"

"හුඟක් ආදරේද?"

"ඔව්"

"කොහොමද?"

"කියන්න දන්නෙ නැහැ."

"නුඹට ස්තුතියි. නුඹ හරි හොඳ පැටියෙක්! මට ආදරය කරන අයට මාත් ආදරේ කරනවා."

ඈ සිනාසී යමක් කීමට සූදානම් වුණද, හුස්ම ඉහළට ඇද සුසුමක් හෙළා මගේ දෑත් අත නොහැරම බොහෝ වේලාවක් නිහඬව සිටියාය.

"නුඹට ඉඩ තියෙන වේලාවට නුඹ මා බලන්න වරෙන්, හොඳද?

එයින් මා ප්‍රයෝජනය ගෙන මම ඇගේ දයාන්විත කරුණාව ලබා ගතිමි. දිවා ආහාරයෙන් පසු මගේ හාම්පුතුන් නිදාගන්නා විට මම ඇය වෙත දිව ගොස්, ඇය ගෙදර සිටියේ නම් ඇය අසල පැයක් හෝ ඊට වඩා වැඩි වේලාවක් හෝ රැඳී සිටියෙමි.

"රුසියන් පොත් කියවන්න ඕන. තම රුසියන් ජීවිතය දැන ගන්න ඕන." ඈ ඇගේ රෝස පැහැති ඇඟිලිවලින්, ඇගේ සුවඳැති කෙස්වැටියට කොණ්ඩා කටු ගසමින් කිව්වාය.

රුසියානු ගත්කරුවන්ගේ නම් කියමින් මගෙන් ප්‍රශ්න කළාය.

"නුඹට මතකද?"

ඈ කල්පනාකාරී ලෙස තරමක බලාපොරොත්තු සුන් වූ ගතියකින් නිතර මෙසේ තෙපලාය:

"නුඹට ඉගෙන ගන්න ඕන, නුඹ ඉගෙන ගත යුතුයි. මට නිතර ඒ ගැන අමතක වෙනවා! අනේ දෙවියනි..."

ඇය අසල පැයක් පමණ සිට මා පොතකුත් අරගෙන මගේ හාම්පුතුන්ගේ කාමර පන්තිවලට දිව ගියේ අභ්‍යන්තරයෙන් පවිත්‍රතාවක් ලැබූ විටෙක මෙනි.

අක්සාකොව්ගේ 'පවුලක තොරතුරු' කීර්තිමත් රුසියානු පොතක් වන 'වනය', විස්මය දනවන 'දඩයක්කාරයාගේ දිනපොත' ග්‍රෙබෙන්කො සහ සලගුබ්ගේ කාණ්ඩ කීපයක්ද, වෙනෙවීතිනොව්. ඔදොයෙව්ස්කි, ත්‍යුත්වෙච්චිගේ කවි පොත්ද මේ වන විට මම කියවා අවසන් කළෙමි. මේ පොත් මගේ අධ්‍යාත්මය ශුද්ධ පවිත්‍ර කළ අතර, හිඟන සහ කටුක යථාර්ථයේ හැඟීම්වල ඇති රොඩුද පවිත්‍ර කර දැමීය. මේ පොත් නිසා මගේ අධ්‍යාත්මය සන්සුන් වී එහි දැඩි ස්ථිරත්වයක් ඇති විය. මෙලොව මා තනිවී නැත.

මම අනාථ නොවෙමි!

මගේ ආච්චි මා බැලීමට පැමිණි අතර, මම ඇයට මර්ගෝ රැජින ගැන උද්දාමයකින් විස්තර කළෙමි. ඈ තලු මරමින් දුම්කුඩු උරා, ස්ථිර විශ්වාසයකින් කතා කළාය.

"ඉතින් ඔන්න, ඒක බොහොම හොඳයි. හොඳ මිනිස්සු බොහොම ඉන්නවා. හොයන එක විතරයි තියෙන්නෙ."

වරක් ආච්චි මට මෙසේ යෝජනා කළාය.

"ඒ නෝනාව හම්බවෙලා නුඹ වෙනුවෙන් ඇයට ස්තුති කරන්නද?"

"එපා, ඕන නැහැ."

"එපා නම්, එපා. දෙවියනි, කොතරම් හොඳද! සදාකාලයෙන් සදාකාලයට මම ජීවත්වීමට සූදානම්."

මගේ අධ්‍යාපනය ගැන වෙහෙස වීමට මර්ගෝ රැජිනට සිදු නොවීය. ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්‍ය කාලය වන විට මා මහත් නින්දාවකට අසු නොවී බේරුණේ යම්තම්නි.

මේ මංගල්‍යයට දවස් කීපයකට පෙර මගේ ඇසිපිය ඉදිමී දෙනෙත් සම්පූර්ණයෙන්ම වැසිණි. මා අන්ධ වෙතියි මගේ හාම්පුත්තු බිය වූහ. මමද එමෙන්ම, බිය වීමි. දොස්තර කෙනෙකු හා ප්‍රසව විද්‍යාඥයකු වන ගෙන්රිහ් රද්සේවිච් වෙත මා ගෙන ගියහ. ඔහු මගේ ඇසිපිය ඇතුළු පැත්තෙන් කපා දෙනෙත් වටා වෙළුම් පටිවලින් වෙළීය. දවස් කීපයක් තිස්සේ මම වේදනාකාරී ලෙස අන්ධකාරයෙහි ගිලී සිටියෙමි. ත්‍රිත්ව මංගල්‍යයට පෙර දින මගේ වෙළුම් පටි ලිහුවේය. පණ පිටින් මිනී වළක බහා තබා පසුව, යළිත් ජීවතුන් අතරට පැමිණි සැටියක් මට දැනිණි. දෙනෙත් අන්ධ වනවාට වඩා බියජනක දෙයක් තවත් නැතිය. ඇස් පෙනීම නැතිව ගියහොත් මිනිහකුගේ ලෝකයෙන් දහයෙන් කොටස් නවයක්ම ඔහුට නැතිවෙයි.

ශුද්ධ වූ ත්‍රිත්වයේ මංගල්‍ය දවසේ රෝගියකු හැටියට මා මගේ වැඩවලින් නිදහස් කොට ඇවිදීමට අවසර දුන්නේය. මම යුද්ධ නිලධාරින්ගේ මුළුතැන් ගෙවල් ගානේ යමින්, සෙබළ සේවකයන් හමුවීමි. ත්‍යුප්යායෙව් හැර අන් සියලු දෙන්ෂික්වරු බී වෙරිමත්ව සිටියහ. හවස් වීමට පෙර යෙර්මෝහින් සීදරව්ගේ හිසට දණ්ඩකින් පහර

දුන්නෙන්, සීදරව් සිහිසන් නැතිව ගබඩා කාමරයේ වැටී සිටියේය. බියගත් යෙර්මෝහින් දිවැගොස් අගාධයෙහි සැඟවුණේය.

සීදරව් මැරුම් කෑහයි යන ප්‍රචාරය ඉක්මනින්ම ගෙවත්ත පුරා පැතිරිණි. සෙබළාගේ සිරුර වැටී ඇති තැන රැස්වූ මිනිස්සු මුමුනමින් පොලීසිය කැඳවිය යුතු බව කියා සිටියහ. සීදරව්ගේ හිස ගබඩා කාමරය තුළට වැටෙන සේ ඔහුගේ සිරුර කුස්සියේ දොරකඩ හරහා වැටී තිබිණි. එහෙත්, කිසිවකු පොලීසියට දැන්වූයේවත්, සීදරව්ගේ සිරුරට අත තැබුවේවත් නැත.

අලුත් නිල්වන් ගවුමක් හැඳ, සුදු ලේන්සුවක් කරේ දමාගෙන නතාලියා කස්ලොව්ස්කයා - රෙදි නැන්දා පැමිණියාය. ඈ කෝපයෙන් මිනිසුන් තල්ලු කරමින් සීදරව්ගේ සිරුර වෙත ළංවී, උක්කුටියෙන් වාඩි වී ඔහු පිරික්සා බලා කෑ ගැසුවාය.

"මෝඩයනි, ඔහුට පණ තියෙනවා. වතුර දීපල්ලා!"

"නුඹ ඔය වැඩට අත දාන්න එපා!" මිනිස්සු ඇයට උවදෙස් දුන්හ.

"වතුර ගෙනෙව්!" යැයි ඇය කෑගැසුවේ ගිනිගත් විටෙක ජලය ඉල්ලන්නාක් මෙනි. ඈ ඇගේ අලුත් ගවුම දණහිසට ඉහළින් ඔසවා යටි සාය හරි ගස්සවාගෙන ලෙයින් නෑවුණු සීදරව්ගේ හිස දණහිස මත තබා ගත්තාය.

රැස්ව සිටියහු බියෙන් යුතුව ඈත්, මෑත් වූහ. ගබඩා කාමරයේ අඳුර අතරින් රෙදි නැන්දාගේ සුදුවන් මුහුණේ දෙනෙත් කඳුළින් දිලිසෙන සැටි මට පෙනිණි. මම වතුර බාල්දියක් ගෙනා විට, එය සෙබළාගේ හිසට සහ පපුවට වක් කරන ලෙස ඈ කියා සිටියේ මට කල් ඇතිව දැනුම් දෙමිනි. "මගේ ඇඟට වක් කරන්න එපා. මට ගමනක් යන්න තියෙනවා."

සෙබළාට සිහිය ලැබී, ඔහු දෙනෙත් හැර කෙඳිරි ගෑවේය.

"මේකාව ඔසවාපන්!" යැයි නතාලියා කියුවේ දෑතේ දුරට කිහිලිවලින් අල්ලා ඔහු නැඟිට්ටුවාලමිනි. ඇය එසේ කළේ ඇගේ අලුත් ඇඳුමේ ලේ නොතැවරෙනු පිණිසය. අපි දෙදෙනා සෙබළාව මුළුතැන් ගෙට ගෙනැවිත්,

ඔහුගේ ඇඳ මත තැබීමු. ඈ ඔහුගේ මුහුණ තෙතැති රෙදි කඩකින් පිසදමා පිටවී යන්නී මට මෙසේ කිව්වාය:

"රෙදි කෑල්ල තෙමලා ඔළුවේ තුවාලයට තියපත්. මම ගිහිල්ලා අනික් මෝඩයාව හොයන්නම්. මේ යක්කු හිරගෙට වැටෙන තුරු බීලා නාස්ති වෙව්!"

ඇගේ යට සායේ ලේ තැවරී තිබුණෙන්, ඈ එය පරෙස්සමින් ගලවා මුල්ලකට විසි කොට, හැකිළී ඇති අලුත් ගවුම වුවමනාවෙන් හරි ගස්සා ගෙන පිටවී ගියාය.

සීදරව් වේදනාවෙන් ඉක්කා ගසමින්, කෙදිරි ගාන්නට විය. ඔහුගේ හිසේ තුවාලයෙන් බොර පැහැති උකු ලේ බින්දු මගේ කකුලට වැටිණි. එය මගේ අමනාපයට හේතු වුවද, මා සිත බියෙන් පිරී තිබුණු නිසා මම කකුල ඉවත නොගතිමි.

සිතට දොම්නසකි, ගෙවත්තේ උත්සව සිරියකි. ගෙමිදුලත්, වැටත්, ළපටි බිරියෝසා අතුවලින් සරසලාය. මහ පාර දෙපස ඇති කණුවල ක්ලෙන් සහ රිබීන අතු එල්ලා ඇත. මුළු පාරම කොළ පැහැයෙන් අලංකාර වී ඇත. හැම දෙයක්ම යෞවනය, අලුත්ය. උදේ වරුවේ මට සිතුණේ මෙම වසන්ත උත්සවය දීර්ඝ කාලයකට ඇවිත් තිබෙන සැටියෙකි. අද සිට ජීවිතය වඩාත් පවිත්‍ර, ප්‍රභාවත් සහ ප්‍රීතිමත් ලෙස ගෙවෙනු ඇතැයි මට සිතිණි.

සෙබළාට ඔක්කාරය සෑදිණි. වොඩ්කා සහ ලූනු කොළ සුවඳ නිසා කුස්සියෙහි හුස්ම ගැනීමට පවා අමාරු විය. ජනේල වීදුරුව අසලට එන මිනිස්සු එයට ඔවුන්ගේ මුහුණත ගෙන සෙබළා දෙස බලති. එවිට ඒ මුහුණ පෙතලි නාසා, කම්මුල් සහිත විකෘති රූප බවට පත්වේ.

සෙබළා සිද්ධිය ගැන සිහිකරමින් දොඩවන්නට විය.

"ඒ, එහෙම කොහොමද? මම වැටුණද? යෙර්මෝහින් කෝ? අපූරු ස-ග-යා..."

අනතුරුව ඔහු කහින්න පටන්ගත් අතර, බේබදු ලෙස කඳුළු සලමින් නහයෙන් අඬන්නට විය.

"මගේ නංගී, පුංචි නංගී..."

වැනි, වැනි ඔහු නැඟිට සිටියේය. තෙතබරි වී සිටි ඔහුගෙන් දුගඳක් වහනය විය. දෙපා පණ නැතිව ගිය විටෙක මෙන්, ඔහු යළිත් ඇඳ මත පතිත විය. දෙනෙත්

බියජනක ලෙස නටවමින් ඔහු කෑගැසීය.

"එහෙම පිටින්ම මරා දැම්මා..."

මට සිනාව මැඩගත නොහැකි විය.

"හිනා වෙන්නෙ මොන යකාද?" සෙබළා මා දෙස මෝඩ බැල්මක් හෙළීය. "නුඹ හිනාවෙන්නෙ කොහොමද? මාව සදහටම මරා දමලා..."

ඔහු දෑතින්ම මා තල්ලු කරමින් විකාරයෙන් දොඩවන්නට විය.

"පළමුවැනි කාලය දිවැස් කියන ඊල්යාටයි. දෙවැන්න යෙගෝර් අශ්වයා පිට නැඟලා, තුන්වැන්න තෝ මා ළඟට එන්න එපා! වෘකයා මා ළඟට එන්ට එපා..."

"මෝඩයා නොවී ඉඳපන්!" යැයි මම ඔහුට කිව්වෙමි.

ඔහු අමනයකු සේ කෝපයට පත්වී, කෑ ගසා දෙපා වනන්නට විය.

"මාව මරා දමලා, නමුත් නුඹ..."

බරැති, කේදෑරි, කුණු සහිත අතින් ඔහු මගේ දෙනෙතට පහරක් ගැසීය. මම වේදනාවෙන් කෑගැසීමි. දෙනෙත් අන්ධ වූවාක් මෙනි. මම යම්තමින් කුස්සියෙන් පිටතට පැන ගැනීමට සමත් වීමි. මා ඉදිරියට නතාලියා එමින් සිටියාය. ඇය ගමන් කළේ යෙර්මෝහින්ගේ අතක් අල්ලා ගෙන ඔහුට බැණ වදිමිනි.

"පල අශ්වයා, පල!" ඕ මා දකින්නී ප්‍රශ්න කළාය. "නුඹට මක් වුණාද?"

"මට ගැහැව්වා..."

"ගහනවද?" ඈ ප්‍රශ්න කළේ පුදුම වෙමිනි. නතාලියා යෙර්මෝහින් ඉදිරියට තල්ලු කොට යළි බැණ වැදුණාය.

"ඉතින් යකෝ තෝ දෙවියන්ට පින් දීපිය!"

මම දෙනෙත් ඇල් වතුරෙන් සෝදා ගතිමි. ගබඩා කාමරයේ සිට බලන විට, සෙබළුන් දෙදෙනා සමාදාන වූ සැටිත්, අඬමින් එකිනෙකා වැලඳගත් සැටිත් පෙනිණි. අනතුරුව ඔවුන් නතාලියා වැලඳ ගැනීමට ඉදිරිපත් වූ විට, ඈ ඔවුන්ගේ අත්වලට මිට මෙළවූ අතින් පහර දෙමින් කෑ ගැසුවාය.

"බලුපැටවුනි, ඈත් වෙයව්! නුඹලා හිතනවද මම නුඹලාගේ හදිසිය පිරිමහන ගෑනියක් කියලා? තොපේ

හාම්පුතාලා දැන් ගෙදර නැති නිසා වහාම නිදාගනිල්ලා! නැතිනම් තොපිට විනාශය තමයි!"

ඇය ඔවුන් නිදි කෙරෙව්වේ කුඩා එවුන් මෙනි. එකකුව ඇඳ උඩත්, අනිකාව බිමත් නිදි කරවා ඔවුන් ගොරවන්නට පටන් ගත් ඉක්බිතිව ඕ කුස්සියේ ගබඩා කාමරයට ගියාය.

"මම ගමනක් යන්නයි ඇඳගෙන ආවෙ. මගෙ ඇඳුම් පොඩිවෙලා, අරූ නුඹට ගැහුවා නේද? බලාපන් උඹ වගේ මෝඩයෙක් ඉන්නවද! ඔන්න පේනවද වොඩ්කාවල හැටි. පැටියෝ, නුඹ කවදාවත් බොන්න එපා. කිසිමදාක බොන්න එපා..."

ඉන් ඉක්බිතිව ඇයත් සමඟ දොරටුව අසල බංකුවේ වාඩිවී, ඈ බේබද්දන්ට බය නැත්තේ මන්දැයි මම ඇගෙන් විමැසීමි.

"මම නොබීපු එවුන්ටවත් බය නැහැ. උන්ට මෙන්න දෙන බැටේ." කියමින් නතාලියා ඇගේ රතු පැහැති මිට මෙළවූ අත පෙන්වූවාය. "මගේ මැරිච්ච මිනිහාත් කනමදයා වගේ බිව්වා. මම එයාගේ අත පය බැන්දා. නින්ද ගියාම එයාගෙ කලිසම ගලවලා වේවැල් කෝටුවලින් පහර දෙනවා. බොන්න එපා. කසාද බැන්දානම් බොන්න එපා. නුඹේ විනෝදෙට ගෑනි ඉන්නවා. වොඩ්කා ඕන නැහැ. හොඳට හෙම්බත් වන තුරු පහර දුන්නම මිනිහා ඉටි වගේ මොළොක් වෙනවා...."

"ඔබ ශක්තිමත් කෙනෙක්" යැයි මා ඇයට කියුවේ දෙවියන් වහන්සේ පවා රැවටූ ඒවා ගැන සිතමිනි.

නතාලියා සුසුමක් හෙළමින් මෙසේ පැවසුවාය:

"ගෑනියකුට මිනිහකුට වැඩිය දෙගුණයක් හයිය තියෙන්න ඕන. දෙවියන් වහන්සේ ගැහැනිය දුර්වල කළා. පිරිමියා කෙරෙහි විශ්වාසය තැබිය නොහැකියි."

ඈ කතා කළේ සන්සුන් ලීලාවෙනි. කෝපයෙන් තොරවය. බිත්තියට හේත්තු වී දෑත් ඇගේ විශාල පපුව මත තබාගෙනය. ඇගේ දෙනෙත් දුක්මුසු ලෙස කුණු රොඩු පිරුණු ටැන්කියේ තාප්පය වෙත යොමුවී තිබිණි. මා ඇගේ නුවණ සහ උපදෙස්වලට සවන් දෙමින් සිටි නිසා වේලාව ගැන මට අමතක විය. මගේ හාම්පුතා ඔහුගේ බිරිඳත් සමග වේල්ල දිගේ සෙමින් වැදගත් ලෙස

ඇවිදින සැටි මට හිටි හැටියේම පෙනිණි. කළුකුමෙක් කිකිළියක් සමඟ ඇවිදින සැටියක් පෑ ඔවුහු අප දෙස අවධානයෙන් බලා කසුකුසු ගෑහ.

මම අපේ ගෙදර මහ දොර විවෘත කිරීමට දිව ගියෙමි. හාම්පුතුගේ බිරිඳ පඩිපෙළ නඟිමින් තියුණු උපහාසයෙන් කතා කළාය.

"රෙදි නැන්දලත් එක්ක මුකුළු කරනවද? පහළ තට්ටුවේ නෝනා මහත්තයට හොරෙන් නේද ඔය වැඩ කරන්නෙ?"

ඒ කතාව කොතරම් මුග්ධ වීදයත්, එය මගේ සිත පැරීමට සම්පූර්ණයෙන්ම අසමත් විය. හාම්පුතා නිහඬව සිට කළ ඉඟිය නිසා මසිත වඩාත් පැරිණි.

"ඉතින් කාලය ළං වෙලා!"

පසු දින උදෑසන මම දර පැළීම සඳහා මඩුවට ගිය විට බළලුන් සඳහා වූ කොටුව අසල හිස් පසුම්බියක් තිබෙන සැටි දුටුවෙමි. ඒ පසුම්බිය සීදරව් අත තිබෙන සැටි මා කීප වරක්ම දැක තිබෙන නිසා මම එය ගෙන ගොස් ඔහුට භාර දුනිමි.

"මේකෙ තිබුණ මුදල් කෝ?" ඔහු පසුම්බිය ඇතුළට අත යවා පිරික්සමින් මගෙන් ප්‍රශ්න කළේය. "රූබල් තිහක් තියෙන්න ඕන. මෙහෙ දීපන් සල්ලි!"

ඔහුගේ හිස තුවායකින් ඔතා තිබුණු අතර, ඔහු කහ පැහැගෙන, කෙට්ටු වී සිටියේය. ඔහු කෝපයෙන් යුතුව ඔහුගේ ඉදිමුණු ඇසිපිය හෙළන්නට වූයේ මා හිස් පසුම්බිය පමණක් අහුලා ගත් බව විශ්වාස නොකරමිනි.

ඒ අතර, යෙර්මෝහින් සීදරව් හමුවීමට විත්, මුදල් සොරකම් කළේ මා බව පවසමින් ඔහුට ඒත්තු ගැන්වීමට වෑයම් කළේය.

"මූ තමයි නුඹේ සල්ලි හොරකම් කළේ. මූව මගේ හාම්පුතා ළඟට ගෙනියපන්. සෙබළා, සෙබළකුගෙන් හොරකම් කරන්නෙ නැහැ!"

යෙර්මෝහින්ගේ ඒ කතාව නිසා මුදල් සොරකම් කළේත්, හිස් පසුම්බිය දර මඩුවට වීසි කළේත්, ඔහු බව මට ස්ථිර ලෙසින්ම ඒත්තු ගියෙන්, මම වහාම ඔහුගේ දෙනෙත් දෙස බලා කෑගැසීමි.

"බොරු කියනවා! නුඹ තමයි හොරා!"

මගේ නිගමනය නිවැරැදි බව සැක රහිතව මට ඔප්පු වූයේ, ඔහුගේ මුහුණ බියෙන් සහ කෝපයෙන් විකෘති වූ බැවිනි. ඔහු සීන් හඬින් කෑ ගැසීය.

"ඔප්-පු කොරපන්!"

මා එය ඔප්පු කරන්නේ කෙසේද? යෙර්මෝහින් කෑ ගසමින් මා ගෙවත්තට ඇද ගෙන ගියේය. සීදරව් මා පසු පසින් ගමන් කරමින් මොනවාදෝ කියමින් කෑගසන්නට විය. ජනේලවලින් මිනිස්සු මුහුණු පිටතට දමාගෙන බලන්නට වූහ. මර්ගෝ රැජිනගේ අම්මාද මෙලෙස බලන්නන් අතර වූවාය. රැජිනගේ දෙනෙත් ඉදිරිපිට මා නින්දාවට පත් වුණු බව මට වැටහිණි. මම අන්දමන්ද වීමි.

සෙබළුන් දෙදෙනා මගේ දෑත් අල්ලා ගෙන සිටි අතර, මගේ හාම්පුතුන් ඔවුන් ඉදිරියේ සිටගෙන, ඔවුන් කියන දේට සවන් දෙමින් සෙබළුන්ට හිතවත්කමක් දක්වමින් හිස සලමින්, දුක් ගැනවිලි අසා සිටින සැටිත් මට මතකය. හාම්පුතාගේ බිරිඳ විශ්වාසයකින් කතා කළාය.

"සත්තකින්ම මේ කොල්ල හොරකම් කරලා ඇති. ඒ නිසා තමයි මූ ඊයේ හැන්දෑවේ රෙදි අපුල්ලන ගෑනිත් එක්ක මුකුළු කර කර හිටියෙ. එහෙනම් මූ ළඟ සල්ලි තිබිලා තියෙනවා. ඒ වගේ ගෑනුන්ගෙන් සල්ලි නැතුව මොනවත් ලබා ගන්න බැහැ...."

"හරියට හරි" යැයි යෙර්මෝහින් එය අනුමත කරමින් කෑ ගැසීය.

මගේ දෙපයට මහ පොළොව ගිලෙන්නාක් මෙන් විය. මා යක්ෂාවේශ වී හාම්පුතාගේ බිරිඳට බැණ වැදුණෙන්, මට ඉතා නපුරු ලෙස පහර දුන්නේය.

ගුටි බැට කෑමෙන් මා ලත් ශාරීරික වේදනාවලට වඩා මගේ සිතේ තැවුණේ මර්ගෝ රැජින මා ගැන කුමක් සිතතීද යන්න ගැනය. ඇය ඉදිරියේ මගේ නිර්දෝෂත්වය ඔප්පු කරන්නේ කෙසේද? ඒ අයහපත් වේලාවේදී මගේ දුක කටුක විය.

මගේ වාසනාවට සෙබළුන් මේ කතාව මුළු නිවෙසටත්, වීදියටත් ගෙන ගොස් පතුරුවා හැරිය නිසා, ගුටි කා

අට්ටාලයට වී සිටි මට, පහළ නතාලියා කස්ලොව්ස්කයා කෑ ගසන සැටි ඇසිණි.

"ඇයි මොකටද මම නිහඬ වෙන්නෙ! මෙහාට වරෙන්, මෙහාට වරෙන්! නැතිනම් මම නුඹේ හාම්පුතා ළඟට යනවා. එයා නුඹට දඬුවම් කරාවි..."

ඒ කෑගැසීම මා ගැන බව මට වැටහිණි. නතාලියා කෑගැසුවේ අපේ ගෙදර මිදුල අසල සිටගෙනය. ඇගේ කටහඬ වඩාත් උස්වූ අතර, වඩාත් උත්සවාකාරී විය.

"නුඹ ඊයේ මට සල්ලි කොච්චර පෙන්නුවද? ඒ සල්ලි කොහින්ද කියාපිය."

මගේ ප්‍රීතිය නිම්හිම් නැතිවිය. සීදරව් කෙදිරි ගාමින් කතා කරන සැටි ඇසිණි.

"අනේ අනේ යෙර්මෝහින්..."

"කොල්ලට අපහාස කරලා. පහර දුන්නා..."

වහාම පහළට දිව ගොස් නැටුමක් නටා රෙදි අපුල්ලන්නියගේ මුහුණ සිප ගැනීමට තරම් ආසාවක් මට උපණි. එහෙත්, ඒ වේලාවේදීම අපේ ජනේලයේ සිට හාම්පුතාගේ බිරිඳ කට දමන සැටි ඇසිණි.

"කොල්ලට පහර දුන්නේ ඌට බැණපු හන්දා. ඌ හොරකම් කළැයි මෝඩ ගෑනියේ නුඹ හැර අන් අය සිතුවේ නැහැ...!"

"නෝනා, මෝඩ ගෑනි නුඹ තමයි. නුඹ එළදෙනක් බව කියන්නට අවසර දීපන්."

නතාලියාගේ එම බැණ වැදීම මට ඇසුණේ ගීතයක් මෙනි. අමනාපය නිසාත්, නතාලියා කෙරෙහි මසිතෙහි ඇති වූ කෘතඥතාව නිසාත් සතුටු කඳුළු වැගිරිණි. එම හේතුව නිසාම මගේ පපුව හිරවෙන බවක්ද දැනිණි. එම හැඟීම මැඩ ගනු වස් මම හති ලන්නට වීමි.

ඉක්බිතිව මගේ හාම්පුතා පඩිපෙළ දිගේ සෙමින්, සෙමින් අට්ටාලයට නැංගේය. ඔහු මා අසලින් වාඩි වී හිසකේ අත ගාමින් කතා කළේය.

"ආ මල්ලි, පෙෂ්කොව්, නුඹේ කලදසාව නරකයි නේද?"

මම නිහඬව වෙනත් පැත්තකට හැරුණෙමි.

"නුඹ මහ කැත විදිහටයි නෙව කුණුහරුප කියන්නෙ."

ඔහු තවදුරටත් කීය. එවිට මම ඔහුට සෙමින් මෙසේ පැවසීමි:

"තුවාල සනීප වුණාම. මම ඔබෙන් ඉවත්වී යනවා...."

ඔහු නිහඬව සිගරැට්ටුවක් බී, එහි අග තුඩුව දෙස බොහෝ වේලාවක් බලා සිට පහත් හඬින් මෙසේ පැවසීය.

"ඔව්, ඒක නුඹේ වැඩක්. නුඹ දැන් පොඩි එකෙක් නොවෙයි. නුඹට හොඳ විදිහකට නුඹ ක්‍රියා කරපන්..."

ඔහු නැඟිට ඉවත්ව ගියේය. හැමදාම මෙන්ම එදත් ඔහු නිසා මට දුකක් ඇති විය.

ඊට දවස් හතරකට ඉක්බිතිව, මම ඒ ගෙදරින් පිට වූයෙමි. මර්ගෝ රැජිනගෙන් සමු ගැනීමට මසිතෙහි අතිමහත් ආසාවක් ඇති වුවද, ඇය ඉදිරිපිට පෙනී සිටීමට තරම් ධෛර්යයක් මට නොවීය. ඇය මට අඬ ගසතියි මම නොඉවසිල්ලෙන් සිටියෙමි.

ඇගේ පුංචි දැරියගෙන් සමුගත් මම ඇයට මෙසේ පවසන ලෙස කිව්වෙමි.

"අම්මාට කියන්න, මම ඇයට බොහොම ස්තුතිවන්ත වන බව. බොහොම! කියනවා නේද?"

"කියන්නම්" යැයි ඒ දැරිය කිව්වේ සුරතල්, මුදු මඳසිනා පාමිනි. හෙට වනතුරු ආයුබෝවන්, එහෙම නේද?" ඕ තෙපලාය.

ඊට වසර විස්සකට පමණ ඉක්බිතිව මම ඇය මුණ ගැසුණෙමි. ඈ ඒ වන විට පොලිස් හමුදාවේ නිලධාරියකු සමඟ විවාහ වී සිටියාය.

XI

'පෙර්ම්' ගංගා තරණ නෞකාවේ පිඟන් සෝදන්නකු ලෙස මම යළිත් වැඩ කරමි. ඒ නැව හංසයකු සේ සුදු පැහැතිය, විශාලය, වේගවත්ය. දැන් මම ලොකු පිඟන් ආදිය හෝදන්නකු හෙවත් කුස්සියේ ආවතේවකරුවා ලෙස වැඩ කරමි. මගේ වැටුප මසකට රූබල් හතකි. කෑම පිසින කෝකිවරුනට උදව්වීම මගේ ප්‍රධාන කාර්යයයි.

බූපේ අවන්හලේ වෙළෙන්දා වටකුරුය, මානාධික බවකින් ඉදිමිලාය. ඔහුගේ හිස මුඩුය, බෝලයක් මෙනි.

දැත් පිටිතල හා කොට බැඳගෙන අමාරුවෙන් ඩෙක් තට්ටුවේ එහා මෙහා ගමන් කරන්නේ උෂ්ණාධික දවසක සෙවණ ඇති තැනක් සොයන වැලි මීයකු ලෙසිනි. බුපේ වෙළඳ කවුන්ටරයේ ඔහුගේ බිරිඳ සිටී. ඈ අවුරුදු හතළිහක් පමණ වයසැති ගැහැනියකි. රූමත් වුවද, වෙහෙසට පත් වී සිටී. ඈ මුහුණේ කොතරම් පුයර තවරාගෙන සිටින්නීදයත්, ඇගේ ගවුමට පුයර කුඩු දූලි මෙන් හැලෙයි.

කුස්සියේ වැඩ කටයුතු මෙහෙයවන්නේ ඉවාන් ඉවානවිච් කෝකි තැනය. ඔහුගේ විකට නාමය මිද්විඡෝනක් (වලස්පැටියා) ය. හේ මිටිය, තරබාරුය. ඔහුගේ නහය ගිරා හොටක් මෙනි. දෙනෙත්වල හාස්‍යය මුසු පෙනුමකි. ඔහු ජේත්තුකාරයෙකි. කැඳ දමා මැද ඇති කරපටි අඳියි. දිනපතාම රෑවුළු බූ ගායි, ඔහුගේ කොපුල් නිල් පැහැතිය. කළුවන් උඩු රෑවුළ උඩු අතට නවලාය. ඔහුට විවේක ඇති සෑම මොහොතකදීම, ඔහු නොකඩවා උඩු රෑවුළුවල කුඩු අග උඩු අතට ඔහුගේ රත් පැහැති ඇඟිලිවලින් කරකවයි. කුඩා වටකුරු කණ්ණාඩියකින් රෑවුළ දෙස බලයි.

නැවේ ඉතාම සිත් ගන්නාසුලු පුද්ගලයා ගිනි උදුනට අඟුරු දමන යාකොව් ෂුමොව්ය. විශාල පපුවක් ඇති ඔහු උසත්, මහතත් එක හා සමාන හතරැස් මිනිහෙකි. කුරු නාසයක් ඇති ඔහුගේ මුහුණ උදැල්ලක් සේ පෙතැලිය. වලසකුගේ බඳු දෙනෙත්, ඝනව වැඩුණු ඇහිබැමිවලට සැඟවී ඇත. ඔහුගේ මුහුණේ ඇති රෑවුළු ගස් පෙඳ පාසිවලට සමානය. ඔහුගේ හිසකේ හිස බදා සිටින තොප්පියක් මෙනි. ඔහු වක ගැසුණු තම ඇඟිලි හිසකේ අතරින් යවන්නේ අපහසුවෙකිනි.

ඔහු සල්ලි ඔට්ටුවට කාඩ් ක්‍රීඩා කිරීමෙහි හපනෙකි. මහ ගොඩක් ආහාර ගිල දැමීමෙන් ඔහු මිනිසුන් විස්මයට පත් කරයි. බඩගිනි බල්ලකු සේ නිතර කුස්සිය අසල ඇවිදින ඔහු මස් කෑලි, කටු කෑලි ඉල්ලයි. හවසට මිද්විඡෝනක් සමඟ එකතුව තේ බොමින් ඔහු, ඔහු ගැනම අපූරු කතා කියයි.

ඔහු කොලු වයසේදී රියාසාන් නගරයේ එඬේරයකු යටතේ එඬේර රැකියාව කළේය. පසුව පූජකයෙක් ඔහු පූජකාරාමයකට යාමට කැමැති කරවා ගත්තේය. ඔහු පූජකාරාමයෙහි අවුරුදු හතරක් සේවය කළේය.

"මට පූජකයකු වීමට ඉවක් තිබුණා. යකාගේ තාරකාවක් වීමට." ඔහු ඉක්මනින් කතා කරමින් කියන්නට විය. " ඔහොම ඉන්නකොට පෙන්සා නගරයේ ඉඳලා ආවා, භක්තිමත් අම්මණ්ඩි කෙනෙක්. මෙන්න බොලේ මේ ගෑනි මාව මායමට යටකරගත්තා. එයා මට මෙහෙම කියාපි. නුඹ කඩිසර, හයිය ඇති තරුණයෙක්. මම අවංක කනවැන්දුම් ගෑනියක්. මම ජීවත් වන්නේ තට්ට තනියම, නුඹ අපේ ගෙවත්ත අතුගාන්නා හැටියට වරෙන්. මට, මගේ ගෙයක් තියෙනවා, මම කුරුලු පිහාටු වෙළඳාම් කරන්නියක්."

"හොඳයි මම එයාගේ වත්ත අතුගානවා. එයා මගේ ඇඟ පත අත ගානවා. ඉතින් ඔහොම ඇගේ උණුසුම් ඇඳට වෙලා මම අවුරුදු තුනක් විතර හිටියා."

"අපොයි නුඹ ගල් පැළෙන බොරු ඇදබානවා. මෙද්විෂෝනක් ඔහුගේ විස්තරයට බාධා කරමින් පවසන්නේ තම නාසයේ කුරුලෑ දෙස මහත් ඕනෑ කමින් බැලීය. "බොරු කියනවට සල්ලි ගෙවනවා නම් නුඹට මෙලහකට රූබල් දහස් ගණනක් ගෙවලා ඇති."

යාකොව් ආහාර සපයි. ඔහුගේ මුහුණේ නිල්වන් රැවුළු ගස් නැටවෙයි. මවිල් සහිත දෙකන් සෙලවෙයි. කෝකියාගේ වාග් ප්‍රහාරයෙන් පසුවත් ඔහු පැහැදිලි ලෙසත්, ඉක්මන් ලෙසත් කතා කරයි.

"ඒ ගෑනි මට වැඩිය වයසයි. ඉතින් ඒකිත් එක්ක වාසය කිරීම මට එපා වුණා. මම ඒකිගේ ලේළියක් එක්ක පොඩි සම්බන්ධකමක් ඇති කර ගත්තා. මේ බව දැනගත්තු හැටියේ ගේ අයිතිකාර ගෑනි මාව බෙල්ලෙන් අල්ලලා දොට්ට දාපි..."

"ඒක නුඹට යස තෑග්ග. එයිට වැඩිය හොඳ දෙයක් නුඹට ඕන නැහැ." කෝකියා කතා කළේත් යාකොව් මෙන්ම, පහසුවෙන් හා දක්ෂ ලෙසිනි.

යාකොව් සීනි කැටයක් කටේ දමා ගෙන දිගටම විස්තර කරන්න විය.

"ඔන්න ඉතින් මම ටික කාලයක් රස්තියාදු වෙලා වොලොදිමේර්වල බඩු විකුණන මහලු මිනිහකු ළඟ නැවතුණා. මම මේ නාකියත් සමඟ හැම තැනම ඇවිද්දා. බල්කාන් කඳුවලටත්, තුර්කියන්, රුමේනියානුවන්, ග්‍රීකයින්, ඔස්ත්‍රියානුන් ඉන්න රටවලටත් ගියා. එක රටකින් බඩු මිලදී අරගෙන තවත් රටකට විකුණනවා..."

"හොරකම් කළාද?" කෝකියා ප්‍රශ්න කළේ බරපතළ ලෙසිනි.

"නාකියාද අපොයි නැහැ. අනුන්ගේ රටේ අවංක ලෙස හැසිරෙන්න ඕන කියල එයා මට කිව්වා. මේ රටවල්වල නීතිය අනුව හොරකම් කළොත් බෙල්ල කඩා දමනවා. කොහොම වුණත් මම හොරකම් කිරීමට උත්සාහ කළා. කිසි පලක් නැහැ. මම එක වෙළෙන්දෙකුගෙන් අශ්වයකු හොරකම් කිරීමට හැදුවා. උන් මාව අල්ලාගෙන හොඳටම මට තඩි බෑවා. ඊට පස්සේ මාව පොලීසියට බාර දුන්නා. ඔය හොරකමට අපි දෙන්නෙක් අහුවුණා. එකෙක් හැබෑ හොරා. මම නිකම් කුතුහලයටයි. ඒකට අත දැම්මේ. මම ඒ වෙළෙන්දගේ නාන ගෙදරට ලොකු ගිනි උදුනක් බඳිමින් හිටියා. වෙළෙන්දා අසනීප වෙලා. හීනෙන් මාව දැකලා තියෙනවා. වෙළෙන්දා ඇවිත් පොලීසියෙන් ඉල්ලා හිටියා මාව නිදහස් කරන්නයි කියලා. ඒකාට මාව හීනෙන් පෙනෙන්නේ, මා විජ්ජාකාරයෙක් නිසාලු. මාව පොලීසියෙන් නිදහස් කළොත්, ඔහුට සනීපවෙයි කියල වෙළෙන්දා කිව්වා. ඔන්න ඉතින් මම විජ්ජාකාරයෙක්! වෙළෙන්දා බොහොම පොහොසත්, ප්‍රසිද්ධ මිනිහෙක්. ඒ නිසා පොලීසිය මාව නිදහස් කළා."

"නුඹව නිදහස් කරනවා වෙනුවට, වතුරෙ ඔබන්නයි තිබුණේ. නුඹේ මෝඩකම් දියවෙලා යන්න" කෝකියා පැවසීය.

යාකොව් ඔහුගේ අදහස අනුමත කරමින් කතා කරන්නට විය.

"ඒක ඇත්ත. මගේ මෝඩකම් ඉහවහා ගිහින්. මුළු ගමකට වුණත් සෑහෙන්න මෝඩකම් මා ළඟ තිබුණා.

හිරැති කර පටියට ඇඟිල්ලක් එබූ කෝකියා යාකොව් දෙස අමනාපයෙන් බලා හිස වනමින් බලාපොරොත්තු රහිතව මෙසේ පැවසීය:

"මොන විකාරද! මේ වගේ හිරකාරයෙක් මහ පොළොවේ ජීවත් වෙනවා. කනවා, බොනවා, රස්තියාදු වෙනවා. මොකටද? කියාපන් නුඹ ජීවත් වෙන්නෙ මොකටද?"

තලු මරමින් යාකොව් පිළිතුරු දෙයි.

"ඒ ගැන කීමට මා දන්නෙ නැහැ. ජීවත්වන නිසා ජීවත් වෙනවා. එකෙක් වැතිරිලා, අනිකා ඇවිදිනවා. නිලධාරියා ආසනයේ වාඩිවෙලා ඉන්නවා." ඒ වුණාට හැම එකකුටම කෑම ඕන."

කෝකියා තවත් කෝපවී කෑගසයි.

"මදැයි නුඹ වගේ උෆරෙක්! වචනයෙන් විස්තර කරන්න බැහැ. උෆරා වගේ කනවා."

"නුඹ මොකටද බං බණින්නේ..." යාකොව් මවිත වී ඔහුගෙන් ප්‍රශ්න කරයි. "මූෂිකයො ඕක් ගහේ ගෙඩි වගේ. ඔක්කොමල්ලා එක හා සමානයි. නුඹ නොබැණ ඉඳපන්. නුඹ බැන්නයි කියල මම හොඳ මිනිහෙක් වෙන්නෙ නැහැ නෙව."

ඒ මිනිහා ඔහු වෙතට මා ඇද ගත්තේ ඉතා දැඩි ශක්තියකිනි. ඔහුගේ කතාවලට මා සවන් දුන්නේ කට ඇරගත් ගමන්ය. ඔහු ළඟ ඔහුටම ආවේණික වූ ස්වයං ජීවිතයක් තිබෙන බව මට සිතිණි. ඔහු හැම කෙනෙකුම ඇමතුවේ 'නුඹ' යනුවෙනි. නැවේ කපිතාන්, බුපේ වෙළෙඳහල්කරු, වැදගත්, ප්‍රධාන පන්තියේ මඟීන් හැම දෙනකු දෙසම ඔහු බැලුවේ ඝනව වැඩුණු ඇහි බැමි ඇති ඇස්වලින් සෘජුවය, නිදහස්වය. ඔහු මේ හැම කෙනෙකුවම ඔහුටත් නාවිකයන්ටත්, අවන්හලේ මෙහෙකරුවන්ටත්, ඩෙක් තට්ටුවේ ගමන් කරන දුප්පත් මඟීන්ටත් සමාන කළාක් මෙනි.

සමහර දවස්වලට ඔහු කපිතාන් ඉදිරියේ නැතිනම් යාන්ත්‍ර ශිල්පියා ඉදිරියේ සිටගෙන, ඔහුගේ දිගැති වානර අත් පිටිතලහා කොට ගෙන ඔහුගේ කම්මැළිකම නිසා නැතිනම් ඔහු යමකු කාඩ් ක්‍රීඩාවෙන් අවසන් වශයෙන්

පරාජය කළ නිසා ඔහුට බැණ වදින සැටි අසාගෙන නිහඬව සිටී. ඒ බැණුම් ඔහුට කොහෙත්ම ගණන් නැත. පළමුවැනි තොටුපළේදීම නැවෙන් පන්නා දමන බවට තර්ජනය කළද, එය ඔහු තඹයකටවත් ගණන් නොගනී.

ඔහුගේ ගතිගුණ සම්පූර්ණයෙන්ම වෙනස්ය. එය 'හරෝෂයෙ දේලො' ('හොඳ වැඩේ') මතක් කරවයි. ඔහු ඔහුගේ විශේෂත්ව ගැන එනම්, මිනිසුනට ඔහු අවබෝධ කර ගත නොහැකිය යන්න වටහාගෙන සිටින විටෙක මෙනි.

ඔහු අමනාප වී සිටින සැටියක්, කල්පනාකාරීව සිටින සැටියක් මම දැක ඇත්තෙමි. එමෙන්ම, ඔහු බොහෝ වේලාවක් නිහඬවද නොසිටියේය. රැවුලෙන් වටවී ඇති ඔහුගේ කටින් නිරතුරුවම වචන ඇද හැලිණි. ඔහුට බණින විට, නැතිනම් කිසිවෙකු කිසියම් කතාවක් කියන විට වුවද, ඔහුගේ දෙතොල් නැටවෙන්නේ ඔහු අනිකාගේ කටින් පිටවන දේ තමාටම යළි කියාගන්නාක් මෙනි. හැමදාම ගිනි උදුනට ඉන්ධන දැම්මේ ඔහුගේ වැඩ මුරය අවසන් වූ පසු, ඔහු තම වළෙන් පිටතට ආවේ පාවහන් රහිතවය. ඇඟපත පුරා දහදිය සහ තෙල් සහිතවය. ඔහුගේ කමිසය දහදියෙන් තෙම්ලාය. ඉණෙහි බඳ පටියක් නැත. පපුව නග්නය. එය මවිල්වලින් ගහනය. ඔහු එළියට වන් විගස ඔහු ගේ තරමක් බැරැඩි කට හඬ ඒකතානමය ලෙස ඇසෙයි. එය වැහි බින්දුවලට සමානය.

"අම්මේ, ආයුබෝවන් මේ කොහේ යනවද? විස්තපෝල්වලටද? මම දන්නවා. මා එහි ගිහින් තියෙනවා. පොහොසත් තනිකාරයකු ළඟ කුලී ගොවියකු හැටියට වැඩ කළා. ඒ තනිකාරයාගේ නම උසාන් ගුබයිදුලින්. ඒ නාකියාට ගෑනු තුන්දෙනෙක් හිටියා. ඌ මහ යකෙක්. මූණ රතු පාටයි. එක ගෑනියෙක් තරුණයි. හොඳ බඩුව. මම ඒකිත් එක්ක පව් කළා..."

ඔහු හැම තැනම ගිය කෙනෙකි. හමුවුණු හැම ගැහැනියකු සමඟම පව් කර ඇත්තෙකි. ඔහු හැම දෙයක් ගැනම කතා කළේ කෝපයෙන් තොරවය. සන්සුන් ලෙසිනි. තම ජීවිතයේ කිසිම දවසෙක අමනාපයට පත් වී නැති. බැණුම් අසා නැති මිනිහකු මෙනි. ඔහු කතා

කරන්නේ, විනාඩියක් ගත වත්ම ඔහු ඇණියට වී කතා කරන සැටි ඇසේ.

"කාඩ් සෙල්ලම් කරන අය අවංක මිනිස්සු කාඩ් තුනක් අතට ගන්නවා. හිත හදාගන්න පුළුවන් වැඩක් තමයි මේ කාඩ් සෙල්ලම. නිකම් ඉඳගෙන සල්ලි ගරන්න පුළුවනි. වෙළඳ සිටුකාරියක්..."

ඔහු හොඳට, නරකට, නැතිනම් ඕනෑ එපාවට කතා කරනවා මම අසා ඇත්තේ ඉතා කලාතුරකිනි. එහෙත් ඔහුගේ කතාව හැමදාම හාස්‍ය මුසුය. සිත් සමනය කරවයි. කුතුහලයෙන් යුක්තය. ලස්සන ගැහැනියක් ඔහුට සිත් ගන්නා සමනලයෙකු මෙනි. ඉර අව්ව ඇති යහපත් දවසක්, 'හිත හදාගත' හැකි දවසකි. ඔහු නිතර මෙසේ කීමට පුරුදුව සිටියේය:

"පොට්ට කාසියක් තරම් වටින්නෙ නැහැ!"

හැම කෙනෙක්ම ඔහු කම්මැළියකු ලෙස සිතූහ. එහෙත්, නිරයක් වැනි ගිනි වළ අසල හුස්ම ගැනීමට පවා නොහැකි තත්ත්වයක් යටතේ ඔහු අනික් අය මෙන්ම අවංක ලෙස වැඩ කරයි. එහෙත්, අනික් ගිනි උදුන් කරුවන් මෙන් විඩාපත් වූහයි යන දුක් ගැනවිල්ල ඔහු ඉදිරිපත් කළ බවක් මට මතක නැත.

දවසක් දා ඩෙක් තට්ටුවේ සිටි මැහැල්ලකගේ මුදල් පසුම්බිය කිසිවකු විසින් සොරාගන්නා ලදි. එදින සාමය රජකළ නිහඬ සැන්දෑවක් විය. මඟීහු ඉතා සුහද සාමයකින් පසු වූහ. නැවේ කපිතාන් තැන මැහැල්ලට රූබල් පහක් තෑගි කළේය. මඟියෝද මුදල් එකතු කොට මැහැල්ලට දුන්හ. ඈ හිසත්, උඩුකයත් නමා මිනිසුන්ට ආචාර කරමින් හා කුරුසියේ ලකුණ ඇඳගනිමින් මෙසේ කිව්වාය:

"මගේ ළමයිනි! රූබල් තුනකුත් කොපෙක් පනහක් මට වැඩියෙන් ලැබිලා තියෙනවා!"

කිසිවෙක් එය අසා සතුටු සිතින් කෑ ගැසූහ.

"ආච්චියේ ලැබුණු සල්ලි ඔක්කොම තියාගනින්. කෑගහන්නේ මොකද? රූබල් තුන අමතර කාසියක් නොවෙයි."

යාකොව් මැහැල්ල ඉදිරියට විත් බැරෑරුම් ලෙස

යෝජනා කළේය.

"වැඩිපුර සල්ලි මට දීපන්. මම කාඩ් සෙල්ලම් කරන්නම්."

අවට සිටියවුන් සිනාසුණේ, ගිනි උදුන්කරුවා විහිළු කරතියි සිතමිනි. ලජ්ජාවෙන් සිටි මැහැල්ලට ඒත්තු ගැන්වීම සඳහා ඔහු දිගටම කතා කරන්නට විය.

"ආච්චියේ සල්ලි මට දීපන්. නුඹට සල්ලි මොන ඉලව්වකටද? හෙට වෙන විට නුඹ වළපල්ලට යනවා නෙව."

මිනිස්සු බැණවැදී ඔහු පන්නා ගත්හ. ඔහු හිස වනා මවිතයට පත්ව මට මෙසේ කිව්වේය:

"මිනිස්සු මහ පුදුම බඩු! උන්ට අයිති නැති වැඩට උන් අත දමන්නේ මොකටද? වැඩිපුර සල්ලි තියෙනවයි කියල කිව්වේ ආච්චිම නෙවද. ඒ රූබල් තුන මගේ හිතට සැපක් ලබා දෙන්නට තිබුණා."

දවසක් දා ඔහුත් සමඟ කාඩ් සෙල්ලම් කරන ලෙස ඔහු මට යෝජනා කළේය. මම ඒ ක්‍රීඩාව නොදැන සිටියෙමි.

"මිනිස්සු මහ පුදුම බඩු! උන්ට අයිති නැති වැඩට අකුරු දන්නවා. නුඹට මම උගන්වන්නම්. අපි සීනි කැට ඔට්ටුවට සෙල්ලම් කරමු."

ඔහු මගෙන් සීනි රාත්තල් බාගයක් දිනාගත්තේය. මා දැන් ක්‍රීඩා රීති ගැන දැනගෙන ඇතැයි සිතූ ඔහු මෙසේ කිව්වේය:

"දැන් ඉතින් අපි හැබෑට සල්ලි ඔට්ටුවට සෙල්ලම් කරමු! නුඹ ළඟ සල්ලි තියෙනවද?"

"රූබල් පහක් තියෙනවා."

"මා ළඟ රූබල් දෙක හමාරක් තියෙනවා."

ඔහු ඉතා ඉක්මනින් මා පැරදවූ බව නොකිවමනාය. ලොකු මුදලක් දිනා ගැනීමේ අදහසින් මම එකවර රූබල් පහක ඔට්ටුවක් ඇල්ලීමි. මම පරාද විමි. මගේ අලුත් සපත්තු කුට්ටම රූබල් තුනකට ඔට්ටු තැබීමි. ඒ වරද පරාජය වීමි. එවිට යාකොව් අසතුටකින් හා තරහ වුණු ගතියකින් මට සැර විය.

"නැහැ, නුඹට සෙල්ලම් කරන්න දන්නෙ නැහැ. නුඹ ඕනවට වැඩිය කෝප වුණා. ඒකෙන් ඇති වැඩක් නැහැ.

ඉඳා නුඹේ සල්ලියි, සපත්තුයි ආපසු ගනින්. රූබල් හතරක් මම නුඹට ආපහු දෙනවා. රූබලයක් ගන්නවා. නුඹට සෙල්ලම් කරන හැටි උගැන්නුවට. නුඹ කැමතිද?"

මම ඔහුට ඉමහත් ලෙස කෘතඥ වීමි.

"පොට්ට කාසියක් තරම්වත් නුඹගෙ කෘතඥතාව මට වටින්නෙ නැහැ. ක්‍රීඩාව කියන්නෙ ක්‍රීඩාවටයි. නුඹට ජුවල් නගින්නේ හරියට නුඹ ගුටිකෙළියකට ඉදිරිපත් වනවා වගෙයි. ගුටිකෙළියට ගියාම ඔළුව ගිනි ගත්තා වගේ හැසිරෙන්න ඕන නැහැ. මිම්මට මැනලා පහර දෙන්න ඕන. කේන්ති ගන්නෙ මොකටද? නුඹ තරුණයි. ඒ නිසා හොඳ හික්මීමෙන් වැඩ කරන්න ඕන. එක වරක් හරි ගියේ නැහැ. පස් වරක් උත්සාහ කරපන්. හරි ගියේ නැත්නම් හත් වරක් උත්සාහ කරපන්. ඒ වරත් හරි නොගියොත්, කෙළ පිඩක් ගහලා අයින් වෙයන්. කෝපය නිවිලා ගියාම ආයෙමත් පටන් ගනින්! ක්‍රීඩා කළ යුත්තේ එහෙමයි."

ඔහු වරෙක මගේ සිත් වඩාත් ගත් අතර, තවත් වරෙක සිත් නොගත්තේය. සමහර විට ඔහුගේ කතා මගේ ආච්චි සිහියට නැංවීය. ඔහුගේ සමහර ගුණයක් නිසා මම ඔහු වෙත ඇදී ගියෙමි එහෙත්, ඒ අතරම මා ඔහුගෙන් ඉතා තදින්, ඈත් වූයේ ඔහු මිනිසුන් කෙරෙහි දැක්වූ මන්දෝත්සාහීත්වය නිසාය.

වරෙක හිරු බැස යන වේලාවකදී දෙවැනි පන්තියේ ගමන් කළ බේබදු, නැබුලු, පෙර්ම් නගර වැසි වෙළෙන්දෙක් ගඟට වැටී, නැව ගමන් කරන මාර්ගයේ රතු රන්වන් ජල පහර දිගේ පීනන්නට විය. නැවේ යන්ත්‍ර ක්‍රියා විරහිත කොට, නැව නැවැත්වීය. නැවේ විශාල රෝදයෙන් විශාල පෙණ ගුළි විසි කළෙන් බැස යන හිරුගේ රශ්මිවලින් එය ලේ පැහැ ගැන්විණි. මෙලෙස ලේ පැහැ ගැන්වුණු පෙණ අතර අවරයට බොහෝ ඈතින් ගංගා ජලයෙහි දඟලන වෙළෙන්දාගේ කළුවන් සිරුර පෙනිණි. සිත දෙදරුම් කවන කෑ ගැසීමක් ගඟේ පැතිර ගියේය. මඟීහුද කෑගසමින්, එකිනෙකා තල්ලු කරලමින්, අවරයේ ඩෙක් තට්ටුවට රැස්වූහ. ගඟේ ගිලෙන මිනිහාගේ සගයා රතුවන් රැවුළක් ඇති තට්ටයකු වූ ඔහුද කට ගොන්නක්

බීගෙනය මිට මෙළවූ දෑත්වලින් පපුවට ගසා ගනිමින් නැවේ වැට අයිනට යමින් බෙරිහන් දුන්නේය.

"අහකට පලයව්. මම දැන් ඔහු බේරා ගන්නම්."

ඒ වනවිටත් නැවියෝ දෙදෙනෙක් ගඟට පැන ඔහු දෙසට පීනන්නට වූහ. නැවේ සිට ගඟට ඔරුවක් බෑවේය. නිලධාරියාගේ අණ දීම්, කෑ ගැසීම්, ගැහැනුන්ගේ වැලපීම් අතරින් යාකොව්ගේ අර්ධ බැරැඬි හඬ ඇසිණි.

"ගිලේවි, ගිලෙනවා සිකුරුයි. මොකද දන්නවද, එයාගෙ ලෝගුව දිගයි. දිග ඇඳුම් ඇඳලා ඉන්න විට ගිලෙනවා සිකුරුයි. සහතිකයි. ඔන්න ගෑනු මොකද පිරිමින්ට ඉස්සෙල්ලා ගිලෙන්නෙ? උන්ගෙ සාය හන්දා. ගෑනියෙක් ගඟට වැටුණොත් යකඩ පඩියක් වගේ එක පාරටම ගිලා බහිනවා. ඔන්න බලාපල්ලා වෙළෙන්දා ගිලුණා. මම නිකම් කට රිදෙනවට නොවෙයි කියන්නේ..."

ඒ වෙළෙන්දා සැබැවින්ම ගඟේ ගිලුණේය. නාවිකයන් ඔහු දෙපැයක් පමණ වෙලා සෙවූ නමුදු, සොයාගත නොහැකි විය. ඒ වන විට ඔහුගේ සගයාගේ වෙරි සිඳී තිබුණෙන් ඔහු අවරයෙහි වාඩි වී, දුකින් මුමුනන්න විය.

"ඔන්න, අපි නැවෙන් ගිය හැටි. දැන් ඉතින් මොනවා කරන්නද? එයාගෙ නෑයන්ට මොනවා කියන්නද? එයාගෙ නෑයෝ...."

යාකොව් ඔහු ඉදිරියේ සිටගෙන, දෑත් පිටිතලහා කොටැ බැඳගෙන, ඔහු අස්වසාලීමට පටන් ගත්තේය.

"මුදලාලි. කමක් නැහැ. ඔහු දැනගෙන හිටියද ඔහුට මරණයට නියමවෙලා තියෙන්නේ කොතැනද කියලා? සමහර විට මිනිහෙක් බිම්මලක් කාපුවමත් මැරිලා යනවා නෙව. දහස් ගණන් මිනිස්සු බිම්මල් කනවා. උන්ට කිසි ලෙඩක් නැහැ. ඔන්න එක මිනිහෙක් කනවා. කාපු ගමන් මැරිලා යනවා. බිම්මල් ගැන මොන කතාද?"

පුළුල් උරතල සහිත ශක්තිමත් යාකොව් වෙළෙන්දා ඉදිරිපිට සිට ගත්තේ වංගෙඩියක් මෙනි. තුවක්කු කටකින් පිටවන වෙඩි උණ්ඩ මෙන් ඔහු වචන විද්දේය. මුලදී වෙළෙන්දා ඔහුගේ දෙනෙතින් යටි රැවුළට වැටෙන කඳුළු අත්ලෙන් පිසදමන්නට විය. එහෙත්, යාකොව්ගේ කතාවට සවන් දී සිටි ඔහු යටි උගුරෙන් මෙන් කෑගැසීය.

"යක්ෂයා තෝ මාව පිස්සකු කරන්න හදනවද? ක්‍රිස්තියානිකාරයනි. මේකාව ඉවතට ගනිල්ලා. නැති නම් මහ පාප කර්මයක් සිද්ධ වේවි."

යාකොව් සන්සුන්ව ඉවත යමින් මෙසේ පැවසීය:

"මිනිස්සු මහ අපූරු ජාතියක්! මම හොඳ හිතින් උන් ළඟට ගියාම උන් මට අනිනවා."

සමහර විට මට මේ ගිනි උදුන්කරුවා පෙනුණේ මොට්ටයකු ලෙසිනි. එහෙත්, ඔහු බොරුවට මෝඩයකු ලෙස හැසිරෙතියි මම සිතිමි. ඔහු විවිධ රවටලට ගියේ කෙසේද, එහිදී දුටුවේ මොනවාද ආදිය අසා දැන ගැනීමට මා තුළ උපන්නේ නොහික්මුණු ආසාවකි. එහෙත්, එසේ ඇසීම එතරම් සාර්ථක නොවීය. ඔහු යම්තමින් හිස උඩු අතට හරවා ගෙන, වලසකුගේ බඳු කළුවන් දෙනෙත් මඳ වශයෙන් විවෘත කරගෙන, මසින් පිරුණු මුහුණ අත ගාමින් යටගියාව සිහි කරන්නට විය.

"මල්ලී, මිනිස්සු හැම තැනම පිරිලා ඉන්නෙ හරියට කුහුඹි වගෙයි. මිනිස්සු ඉන්න හැම තැනම මහ හිරිහැරයක්. වැඩියෙන්ම ඉන්නෙ ගොවියො. මුළු ලෝකයම ගොවි මුෂිකයන්ගෙන් පිරිලා. හරියට සරත් කාලෙට ගස්වලින් බිමට වැටෙන කොළ වගේ. ඔන්න බල්ගේරියානුවන්ව දැක්කද? ග්‍රීකයන්, ඒ වගේම සර්බියානුන්, රුමේනියානුන් ඒ විතරක්ද ටිසිගාන්වරුන් (අභිගුණ්ඨිකයෝ), මේ වගේ ජාතීන් මහ ගොඩක් ඉන්නවා. මොන විදිහේ මිනිසුන්ද? මොන විදිහේ අයද? නගරවල නාගරිකයො, ගම්වල ගම්මු. අපේ රුසියාවෙ වගේම තමයි. උන් අපිට බොහොම සමානයි. සමහරුන් අපි වගේම රුසියන් බස කතා කරනවා. ඔය තතාර්, මොර්ද්වින් වගේ එහෙත්, මෙහෙන් යම්තම් රුසියන් බසින් කතා කරනවා. ග්‍රීකයන්ට අපේ භාෂාව කොහොමත් බැහැ. උන් මොනවදෝ වචන කියනවා. නමුත්, ඒවා තේරුම් ගන්න බැහැ. උන් එක්ක කතා කරන්න ඕන හස්ත මුද්‍රා භාෂාවෙන්. මාත් සමඟ ඔය රට රටවල්වලට ගිය නාකියා ඉන්නවා නේද, මිනිහා ලෝක කපටියා, එයා ග්‍රීක භාෂාව දන්නවා වගේ 'කාරාමාරා කලිමේරා' ගානවා. මගේ මහල්ලා රට කපටියා. බොරු වචන හදන්න රජා.... නුඹ ආයෙමත්

අහනවා මොන විදිහේ මිනිසුන්ද කියලා. නුඹ පුදුම කොල්ලෙක්. ඉන්නේ මොන විදිහේ මිනිසුන්ද? කළුපාට එවුන් ඉන්නවා. රුමේනියන්කාරයෝ, උනුත් කළුපාටයි. උන්ගේ ආගම වෙනස්. බල්ගේරියානුන් කළුපාටයි. ඒ වුණාට උන්ගේ ආගම අපේ ආගමම තමයි. ග්‍රීකයෝ උන් හරියට තුර්කියන් වගෙයි...."

ඔහු දන්නා සම්පූර්ණ සත්‍ය ඔහු නොකියන බවත්, ඔහු කියන්නට අකැමැති තවත් යමක් ඉතිරි වී තිබෙන බවත් මට සිතිණි.

සඟරා පින්තූරවලින් මම ග්‍රීසියේ අගනුවර අථීනි (ඇතැන්ස්) දැක ඇත්තෙමි. එය ඉපැරැණි, ඉතා ලස්සන නගරයෙකි. එහෙත්, යාකොව් සැක සිතින් හිස වනා අථීනා හෙවත් ඇතැන්ස් නමින් නගරයක් නැතැයි පැවසීය.

"උන් නුඹට බොරු ගොතලා තියෙනවා. මල්ලී අථීනා නොවෙයි අපොන්. ඒක නගරයක් නොවෙයි. කන්දක්. ඒ කන්ද උඩ පූජකාරාමයක්. එයිට වැඩියෙ මොනවත් නැහැ. ඒකට කියන්නෙ ශුද්ධ වූ අපොන් කන්ද කියලයි. මා අඳුනන එක මහල්ලෙක් ඒ පින්තූර වෙළඳාම් කළා. දුනායි ගඟබඩ බේල්ගොරොද් නගරය තියෙනවා. එය හරියට යරොස්ලාවල් නැතිනම් නිෂ්නි නගරය වගෙයි. උන්ගේ නගර එතරම් ලස්සන නැහැ. උන්ගේ ගම්, අපේ ගම් වගේමයි. ගෑනුන්, අපේ ගෑනුන් වගේමයි. ඒ විතරක් නොවෙයි. බොහොම ලස්සනයි. දැකපුවම හිත පිරෙනවා."

ඔහු දෑතේ අතුල්වලින් මුහුණ දැඩි ලෙස අතුල්ලන විට ඔහුගේ රැවුළු ගස්වලින් හඬක් නිකුත් විය. ඔහුගේ උගුරේ ගැඹුරින් නැඟෙන සිනා හඬ බිඳුණු ගෙජ්ජි රබානකින් නැඟෙන හඬට සමාන විය.

"මට අමතක වුණා! මම ඒකිත් එක්ක කොහොමට හිටියද! එයා සමුගත්තේ අඬ අඬා. මාත් ඇඬුවා. දෙවියම්පා!"

ගැහැනුන් සමඟ හැසිරිය යුත්තේ කෙසේද යන්න අරබයා ඔහු මට ලජ්ජා රහිත, සන්සුන්තාවකින් උගැන්වීය.

අපි නැවේ ඇණියෙහි වාඩිවී සිටියෙමු. උණුසුම සහිත

සඳරැසින් යුත් රාත්‍රිය අප පිළිගැනීමට ඉදිරියට එයි. තණ පිටි සහිත ගං ඉවුරු යම්තමින් රිදී පැහැයට පෙනෙයි. කඳු පෙදෙසේ සිට කහවන් ආලෝකය විහිදෙයි. අහසේ තරු බැබැළෙයි. අවට හැම දෙයක්ම චලනය වෙයි. නිදි රහිතව මුමුනයි. නිසල සැබෑ ජීවිතයකින් පණ ගැන්වී ඇත. ඔහු එවැනි සුමිහිරි දොම්නසින් බර රාත්‍රියෙක අර්ධ බැරැඬි හඬින් කතාව පටන් ගනී.

"ඔන්න ඉතින් අත දිගහැරපු හැටියේම...."

යාකොව්ගේ කතා ලජ්ජා රහිත වුවද, ඒවා අප්‍රියජනක නොවේ. එහි ආත්මාඩම්බරයක් සහ ක්‍රෑරත්වයක් නැත. එහි යම් කිසි සරල බවක් ඇති අතර, එක්තරා කනගාටුවක්ද ඇත්තේය. අහස ගෙන සිටින චන්ද්‍රයාද ලජ්ජා රහිත ලෙස නිරුවත්ය. එය අපේ සිත් නොසන්සුන් කොට, අපට කනගාටු වීමට සලස්වාලයි. හොඳ, ඉතාම හොඳ දේ ගැන පමණක් සිහිවේ. මර්ගෝ රැජින සහ අමතක නොවන සත්‍යය ගැප්වූ කවි.

නැතිවම බැරිය, සුන්දරත්වය ගීතයට,
කම් නැත සුන්දරත්වයට ගීතය නැතුවාට....

මඳ සිහිනයක් සේ එම චින්තන ලෝකයෙන් ඉවත්වූ මම, යළිත් යාකොව් දුටු ජීවිතය විමසන්නට වූයෙමි.

"නුඹ මහ පුදුම කොල්ලෙක්. නුඹට මොනවා කියන්නද? මම හැම දෙයක්ම දුටුවා. නුඹ මගෙන් මෙහෙම අහපන්, පූජකාරාම දුටුවාද? දුටුවා. තැබෑරුම්, අවන්හල් දුටුවාද? ඔව්. දැක්කා. රදල හාම්පුතාලාගේ ජීවිතයක් ගොවි දාසයන්ගේ ජීවිතයත් දැක්කාද? දැක්කා. බඩපුරා කා, බී හිටියා, බඩගින්නෙත් හිටියා.

ගැඹුරු ගඟක් තරණය කොට, හීතල භයානක පාලමකට පැමිණි විටෙක මෙන්, ඔහු සෙමින් යටගියාව මතක් කරයි.

"ඔන්න මම අශ්වයකු සොරකම් කරපු නිසා පොලීසියට අහුවෙලා ඉන්නවා. මට සයිබීරියාවට යන්න වේවි කියලා මම කල්පනා කළා. පළාත් භාර පොලිස් මුලාදෑනියා බණිනවා. එයාගෙ කාර්යාලේ ගිනි තපින උදුන නරක් වෙලා දුම් නගිනවා. ඉතින් මම මෙහෙම

කිව්වා. උතුමාණෙනි, මට ඔය උදුන හදන්න පුළුවනි. එයා මට කෑ ගහනවා. කට වහපිය! මම ආයෙමත් එයාට කතා කරලා මෙහෙම කිව්වා. එඬේරා සෙනෙවියකුට වඩා නුවණක්කාරයකු වෙන වෙලාවල් තියෙනවා. එදා මා හැමදේටම ඉදිරිපත් වුණා. කොහොම වුණත් සයිබීරියාවට යන්න සිද්ධ වෙනවාමයි. 'හොඳයි, නුඹ ලිප හරිගස්සාපන්! හැබැයි වැඩේ වැරදුණොත් නුඹේ මස් තියා කටුවත් ඉතිරි කරන්නෙ නැහැ!' දවස් දෙකක් ඇතුළතදී මම එම උදුන හරි ගස්සලා දුන්නා. පොලිස් මුලාදෑනියා මෙහෙම කියනවා. 'අනේ බං නුඹ මෝඩ හරකෙක්. නුඹ ශිල්පියෙක් යකෝ, නුඹ මොකටද අස්පයකු හොරකම් කළේ?' මම එයාට අනුකම්පා හිතෙන්න කතා කරනවා. 'අනේ පින් කරන හාමුදුරුවනේ, මගේ මෝඩකම හින්දා' ඇත්ත නුඹ මෝඩයෙක් තමයි. මට නුඹ ගැන අනුකම්පයි. දුකයි. ඔන්න පේනවද? මිනිහට මා ගැන දුක හිතිලා. පොලිස් මුලාදෑනියා, නිලය අනුව අනුකම්පා විරහිත විය යුතුයි. ඒ වුණාට අනුකම්පා කළා."

"ඉතින් ඊට පස්සෙ?" මම ප්‍රශ්න කළෙමි.

"මොනවත් නැහැ. අනුකම්පා කළා. තවත් මොනවද?"

"නුඹට අනුකම්පා කරන්නෙ මොකටද? නුඹ පරුවතයක් නොවැ."

ඔහු සුහද සිතින් සිනහසෙයි.

"පුදුම කොල්ලා! පරුවතයක් කියලද කියන්නෙ? නුඹ ඒ පරුවතයට අනුකම්පා කරපන්. පරුවතය වුණත් සේවය කරාවි. පරුවතයෙන් කඩාපු ගල්වලින් නේද මහ පාර හදල තියෙන්නෙ. හැම දේටම අනුකම්පාකරන්න ඕන. ඒවා නිකම් වැටිලා නැහැ. පස් ගැන කල්පනා කළාද? තණ පඳුරු වැවෙන්නේ පසේ...."

ගිනි උදුන්කරුවා මෙසේ කතා කරන විට මට දැනගත නොහැකි යම් දෙයක් ඔහු දන්නා බව මට පැහැදිලි වෙයි.

ඔබ අපේ කෝකියා ගැන සිතන්නෙ මොනවාද?" මම ඔහුගෙන් ඇසුවෙමි.

"මිද්විෂෝනක් ගැනද? ඔහු අසන්නෙ මන්දෝත්සාහී ලෙසිනි. "එයා ගැන මොනවා සිතන්නද? කිසිම දෙයක් කල්පනා කිරීමට ඕනෑ නැහැ."

එය සත්‍යයකි. ඉවාන් ඉවානොවිච් කෝකියා දැඩි නීති ගරුකය. සිනිදුය. ඔහු අරබයා යම් කිසි අදහසක් ඇතිකර ගත නොහැකිය. ඔහුගේ එක් ගතියක් පමණක් සිත් ගනී. එනම්, ඔහු යාකොව් නිතර බැණ වැදීම ඔහුට කැමති නොවීමය. එහෙත්, ඒ අතර හැමදාම තේ පානය සඳහා කෝකියා ගිනි උදුන්කරුවාට අඬ ගැසීමය.

වරක් ඉවාන් ඉවානොවිච්, යාකොව් අමතා මෙසේ පැවසීය.

"තවමත් මේ රටේ ප්‍රවේණිදාස ක්‍රමය පැවතුණා නම් මම නුඹේ ප්‍රවේණි රදල ස්වාමියාව හිටියා නම්, නුඹ වගේ පින් බතෙකුට හැම සුමානයක් පාසාම කස පහරවල් හතක් බැගින් ගහනවා."

යාකොව් බැරෑරුම් ලෙස තම අදහස කියා පෑවේය.

"හත්වරක් බොහොම වැඩියි නෙව!"

කෝකියා, ගිනි උදුන්කරුවාට බණින අතරම යම් කිසි හේතුවක් මත ඔහුට විවිධ කෑම වර්ග දුන්නේය. ගොරහැඩි ලෙස ඔහු ගිනි උදුන්කරුවාට ආහාරයට යමක් දෙයි.

"බඩජහරියා ඉඳා කාපිය!"

යාකොව් සෙමින්, සෙමින් ආහාර සපමින් කතා කරයි.

"ඉවාන් ඉවානොවිච්, නුඹට පින් සිද්ධ වෙන්න මම බොහොම ශක්තිය රැස්කර ගන්නවා."

"නුඹ වගේ කම්මැළියකුට ශක්තිය මොකටද?"

"අහන්නෙ මන්ද? බොහෝ කල් ජීවත් වීමට."

"නුඹ ජීවත්වන්නෙ මොකටද? යක්ෂයා...."

"යක්ෂයාත් ජීවත් වෙනවා. ජීවත්වීම විනෝදයක් නොවේද? ජීවත් වීම ඉවාන් ඉවානොවිච්ගේ හිතට ලොකු සැපක්."

"හරිම භක්ෂකයෙක්!"

"ඒ මොකක්ද?"

"භක්ෂකයා"

"ඔන්න වචනයක හැටි" යාකොව් මවිත වී පවසයි. ඒ අතර මිද්විෂෝනක් මට මෙසේ කියයි:

"ඔන්න කල්පනා කරපන්. අපි ලේ උණු කරගෙන කටු වේළාගෙන ගිනි උදුන් ළඟට වෙලා වැඩ කරනවා. ඉතින්

බලාපන් මේකා වැලිමීයකු වගේ හප හපා ඉන්නවා!"

"එක් එක්කෙනාට වෙන වෙනම ඉරණමකි!" යාකොව් ආහාර සපමින් පිළිතුරු දෙයි.

කුස්සියේ ළිප් ඉදිරිපිට වැඩ කරනවාට වඩා නැවේ බොයිලේරුවට අඟුරු දමන උදුන ඉදිරිපිට වැඩ කිරීම බෙහෙවින්ම අමාරුය. මා යාකොව් සමඟ එකතු වී එලෙස බිම් අඟුරු දැමීමට කීප වරක්ම තැත් කළ නිසා ඒ බව මම දනිමි. එහෙත්, යාකොව් ඔහුගේ වැඩ කෝකියාගේ වැඩට වඩා බොහෝ අමාරු බව දැන දැනත් කිසියම් හේතුවක් නිසා ඒ ගැන කීමට ඉදිරිපත් නොවීම මට පුදුමයකි. නැත, මේ මිනිසා කිසියම් දෙයක් ගැන විශේෂ දැනුමක් ඇත්තෙකි.

නැවේ කපිතාන්, යන්ත්‍රාගාර ශිල්පියා, බොට්ස්මන් යන මේ හැම දෙනාම යාකොව්ට බැණ වදිති. වැඩක් ඇතිව හෝ නැතිව හෝ ඔහු දෝෂාරෝපණයට ලක් වෙයි. එසේනම් ඔහු අස්කර නොදමන්නේ මන්ද? අනිකුත් ගිනි උදුන්කරුවන් ඔවුන්ගේ සගයා වන යාකොව් කෙරෙහි යහපත් ආකල්පයක් දැක්වූහ. එසේ වුවද, ඔවුහු, ඔහුගේ කතා නිසාත්, ඔහුගේ කාඩ් සෙල්ලම් නිසාත් ඔහුට සිනාසුණහ. මම ඔවුන්ගෙන් මෙලෙස ඇසුවෙමි.

"යාකොව් හොඳ මිනිහෙක්ද?"

"යාකොව්ද? නරක නැහැ. ඔහු අමනාප වෙන මිනිහෙක් නොවෙයි. ඔහුත් සමඟ ඕනෑම දෙයක් කළ හැකියි. ගිනිගෙන දැවෙන බිම් අඟුරු කැට ඔහුගේ ඇඟට දැම්මත් ඔහු තරහ වෙන්නෙ නැහැ."

ගිනි උදුන් ඉදිරිපිට ඔහු වැඩ කළද, විශාල ආහාර රුචියෙකින් පෙළුණද, ඔහු නිදාගත්තේ අල්ප වේලාවකි. ඔහුගේ වැඩ මුරය අවසන් කළ විගස, කුණු හා දහදිය තවරා ගෙන ඔහු ඩෙක් තට්ටුවේ රස්තියාදු වීමට පටන් ගනී. ඔහු එක්කෝ මඟීන් සමඟ කතා බහ කරයි. නැතිනම් කාඩ් සෙල්ලම් කරයි.

ඔහු මා ඉදිරිපිට සිටියේ, මට අවශ්‍ය යමක් සඟවා ඇති පෙට්ටගමක් ලෙසිනි. එම පෙට්ටගම විවෘත කිරීමට අවශ්‍ය යතුර මම මුරණ්ඩු ලෙස සොයන්නට වීමි.

"මල්ලී, නුඹට ඕන මොනවද කියල මට තේරුම් ගන්න බැහැ." ඝන වූ ඇහිබැම්වලට යටින් ඇති දෙනෙත්වලින් ඔහු බලමින් මගෙන් ඇසුවේය. "ඉතින් මේ මහ පොළොවේ රට රාජ්‍යවල මම ඇවිදලා තියෙනවා. ඉතින් මොකද? නුඹ පුදුම කොල්ලෙක්! ඔන්න අහපන් මම මූණ පෑ සිද්ධියක් ගැන."

ඔහු තම කතාව කියන්නට විය. ප්‍රාදේශීය නගරයක තරුණ නඩුකාරයෙක් හිටියා. එයා ක්ෂයරෝගකාරයෙක්. එයාගේ පවුල හොඳ ශරීර සනීපයක් ඇති ගෑනියක්. ඒගොල්ලන්ට ළමයි නැහැ. එයා ජර්මන්කාරියක්. ඉතින් මේ ජර්මන්කාරි, කාන්තා ආභරණ වෙළෙන්දෙකුට ආලය කළා. ඒ වෙළෙන්දා බැඳපු මිනිහෙක්. එයාට ළමයින් තුන් දෙනෙක් හිටියා. වෙළෙන්දා දැන ගත්තා ජර්මන්කාරි එයාට ආලය කරන බව. ඉතින් ඔහු මේ ගෑනිව අවඥාවට ලක් කිරීමට තීරණය කරලා ජර්මන්කාරිට රෑට මල්වත්තට එන්නයි කියලා දන්වා, එයාගෙ මිතුරන් දෙදෙනෙකුටත් මල් වත්තට ඇවිල්ලා හැංගිලා ඉන්නයි කියලා කිව්වා.

"ඔන්න පුදුමයක හැටි. ජර්මන්කාරි කියාපු වේලාවට මල් වත්තට ආවා. එතකොට වෙළෙන්දා ජර්මන්කාරියට මෙහෙම කියනවා. නුඹ මට ආලය කළාට පෙරළා ආලය කරන්න මට බැහැ. මම කසාද බැඳපු මිනිහෙක්. මම මිතුරන් දෙදෙනකුව අඬගහගෙන ආවා. එකෙකුගේ ගෑනි මැරිලා. අනිකා තනිකඩයෙක්. ජර්මන්කාරි කෝපයට පත් වෙලා වෙළෙන්දාගේ කම්මුලට ගහපි. එයාව බංකුවෙන් බිමට වට්ටලා සපත්තු ගලවලා එයාගෙ හිසට ගහන්න පටන් ගත්තා. ජර්මන්කාරිත් එක්ක මල්වත්තට මාත් ගියා. මම ඒ දවස්වලදී නඩුකාරයගෙ වත්තේ වැඩ කළා. මම මල්වත්තේ වැට අස්සෙන් බලාපුවම මට පේනවා මහ ගිනි කෙළියක්. වෙළෙන්දාගේ යාළුවෝ දෙදෙනා ඉදිරියට පැනලා ඇගේ කොණ්ඩය අදින්න පටන් අරගෙන. මම වැටෙන් පැනලා අර දෙන්නා ළඟට ඇවිත් ඒ ගොල්ලන්ව තල්ලු කරලා මෙහෙම කිව්වා. 'මුදලාලි මහත්වරුනි, එහෙම කරන්න එපා! අපේ නෝනා වෙළෙන්දා ළඟට ආවේ ආදරය නිසාය. නමුත්, එයා අපේ නෝනාට

අපහාස කළා.' එහෙම කියලා ජර්මන්කාරිව ගෙදරට කැඳවාගෙන යන කොට උන් දෙන්නාගෙන් එකෙක් මට ගඩොල් කැටයකින් ඔළුවට ගැහැව්වා. අර වෙළෙන්දාට තියෙන ආදරය නිසා ජර්මන්කාරි බොහොම දුකෙන් පසුවුණා. ඉතින් එක දවසක් එයා මට මෙහෙම කියාපි. 'යාකොව් මගේ මහත්තයා මැරුණ හැටියේම මම ජර්මනියට යනවා.' 'ඔව්, නෝනා එහෙම යන එක හොඳයි.' කියල මම උත්තර දුන්නා. නඩුකාරයා මළායින් පස්සේ ජර්මන්කාරි ජර්මනියට ගියා. එයා බොහොම හොඳ නුවණක්කාර නෝනා කෙනෙක්. මැරිච්ච නඩුකාර හාමුදුරුවෝත් බොහොම හොඳ මනුස්සයා..."

එම කතාවේ තේරුම වටහාගත නොහැකි වූ මම අන්දමන්ද වූයෙමි. නිහඬවීමි. එම කතාවෙහි මා දන්නා. අනුකම්පා විරහිත, අමන යමක් තිබුණද එය කියන්නේ කොහොමද?

"ඒ සිද්ධිය හොඳද?" යාකොව් මගෙන් ප්‍රශ්න කරයි.

මම යමක් කියමින් කෝපයෙන් බැණ වදිමි. එවිට ඔහු සන්සුන් ලෙස විස්තර කරයි.

"උන්ගේ බඩකට පිරිලා. උන් බොහොම සතුටින් ඉන්න නිසා ඉඳ හිටලා විහිළු කරන්න උන්ට සිතෙනවා. ඒ වුණාට විහිළු හරියන්නෙ නැහැ. උන්ට විහිළු කරන්න දන්නෙ නැහැ. උන් වෙළෙන්දෝ, බොහොම බැරෑරුම් අය. වෙළඳාම් කරන්ට කපටි නුවණ තියෙන්ට ඕන. දිගින් දිගටම ඔහොම හිටියම උන්ට පාළු ගතියක් දැනෙනවා. ඉතින් ඒ හන්දා උන් පොඩ්ඩක් නැළවෙන්න හදනවා."

නැවේ අවරයට වී බලන විට, ගඟ වේගයෙන් ගලා බසිමින් පෙණ මතු කරන සැටි පෙනෙයි. කළුවන් ගං ඉවුර ජලයෙන් සමු ගන්නාක් මෙනි. ඩෙක් තට්ටුවේ මඟීහු ගොරවමින් නිදති. බංකු අතරින් සහ නිදා සිටින මඟීන් අතරින් පනිමින් සෙමින්, සෙමින් අප ළඟට කළු හැඳගත් කාන්තාවක් එයි. ඇගේ හිස පුරා පැසුණු හිස කෙස්ය. යාකොව් මගේ උරහිසට තට්ටු කොට සෙමින් මෙසේ පවසයි:

"ආං බලාපන් කාන්සියෙන් පෙළෙනවා."

අනුන්ගේ කාන්සිය නිසා ඔහු සතුටුවන බවක් මට හැඟිණි.

ඔහු බොහෝ කතා කී අතර, මම ඒවාට ගිජු සිතින් සවන් දුන්නෙමි. ඔහුගේ කතා හැම එකක්ම මට ඉතා හොඳින් මතක ඇත. ඒවා අතර එකද ප්‍රීතිමත් කතාවක් හෝ නොවීය. ඔහු කතා කිව්වේ පොතකටත් වඩා වැඩි සන්සුන්තාවකිනි. පොතක් කියවන විට මට ගත්කරුවාගේ කෝපය. ප්‍රීතිය, දොම්නස, උපහාසය හැඟිණි. එහෙත්, ගිනි උදුන්කරුවා සිනා නොවීය. විවේචනය නොකළේය. ඔහු කිසිවක් නිසා අමනාප නොවීය. එතරම් ප්‍රීති නොවීය. ඔහු කතා කළේ අධිකරණය ඉදිරිපිට සාක්ෂි දෙන සාක්ෂිකරුවකු මෙනි. චෝදකයාත්, චූදිතයාත්, නඩුකාරයාත් යන මේ තිදෙනා වෙත එක හා සමාන ආකල්පයක් දක්වන මිනිහකු මෙනි. ඔහුගේ මෙම මන්දෝත්සාහි ගතිය වඩාත් දුෂ්ට කාන්සියක් ඇති කළේය. යාකොව් වෙත කටුක අහිතකර ගතිත් මෙයින් මසිතෙහි ඇති විය.

ගිනි උදුන්වල ඇවිළෙන ගිනි ජාලා මෙන් ඔහු ඉදිරියේ ජීවිතය ඇවිළ පැවැතිණි. එහෙත්, ඔහු ගිනි උදුන් ඉදිරියේ සිටගෙන අඟුරු වැඩි කරමින් සහ අඩු කරමින්, ඔහුගේ වලස් අත්වලින්, ලී මිටියකින් කරාමයට පහර දෙමින් සිටියේය.

"යාකොව් තමුසෙව කවුරුන් හරි අමනාපයට පත් කළාද?" මම ඇසුවෙමි.

"මට එහෙම කරන්නෙ කවුද? මම හයිය ඇති මිනිහෙකි. එක පාරයි අනින්නේ...."

"මම පොර ඇල්ලීම ගැන නොවෙයි ඇහුවේ. තමුසෙගෙ ආත්මය අමනාපයට පත් කළේ නැත්ද?"

"ආත්මය අමනාපයට පත් කළ නොහැකියි. ආත්මය අමනාපයක් භාර ගන්නෙ නැහැ. මිනිස් ආත්මය කිසි දෙයක් අල්ලන්නෙ නැහැ."

ඩෙක් තට්ටුවේ ගමන් කරන මඟීන්, නැවේ නාවිකයන් සහ අනිකුත් මිනිසුන් ආත්මය ගැන කතා කළේ ඉඩම්, රැකියාව, ආහාර සහ ගැහැනුන් ගැන කතා කරන්නාක්

මෙනි. නිතර අතින් අත මාරුවන, පහේ තඹ කාසියක් මෙන් සාමාන්‍ය මිනිසුන්ගේ කතාවලට අයත් වචන මාලාවේ සෑම දසවැනි වචනය 'ආත්මය' යි මිනිසුන්ගේ ලිස්සනසුලු ජංගමශීලී දිවෙන් නිතර එම වචනය ජනිත වීම මට නොරිසිය. ආත්මය පන්නා හරිමින් මිනිස්සු නපුරු ලෙසත්, එමෙන්ම, සුරතල් ලෙසත් 'අම්මා ඇද බැණීම' මගේ හදවතට ගසන පහරක් මෙනි.

මගේ ආච්චි ආත්මය ගැන ඉතා පරෙස්සමින් කතා කළ සැටි මට මතකය. එය ආලයේ, සුන්දරත්වයේ සහ ප්‍රීතියේ, ගුප්තමය ගබඩාව හෙවත් භාණ්ඩාගාරය බව ආච්චි කිව්වාය. යහපත් මිනිහකුගේ මරණින් මතු ඔහුගේ ආත්මය ධවලමය දේවදූතයන් නිල්වන් ගුවන් ගැබ ඔස්සේ මගේ ආච්චි විශ්වාස කරන සද්ගුණවත් දෙවියන් වෙත ගෙනයන බව මම විශ්වාස කළෙමි. දෙවියෝ ආත්මය පිළිගනිමින් මෙසේ කියති:

"මිහිරි, පවිත්‍ර ආත්මය, නුඹ පෘථිවියේ දුකට, දොම්නසට පත් වුණාද?"

ඉනික්බිතිව දෙවියෝ ඒ ආත්මයට පවිත්‍ර පියාපත් පිරිනමති. ධවල පියාපත් හයක් බැගින් දෙති.

ආත්මය ගැන මගේ ආච්චි කතා කළ පරිද්දෙන්ම, පරිස්සමෙන් හා අල්පවශයෙන්ද, අකැමැත්තෙන්ද යාකොව් ෂුමොව් කතා කළේය. ඔහු බණින විට පවා කෙනෙකුගේ ආත්මය, අපහාස නොවන පරිදි එසේ කළේය. ආත්මය ගැන වෙනත් මිනිසුන් කතා කරන විට යාකොව් ඔහුගේ රතුවන් මී හරක් ගෙල නවාගෙන නිහඬව එයට සවන් දුන්නේය. "ආත්මය යනු කුමක්දැ?" යි මා ප්‍රශ්න කළ විට ඔහු දුන් පිළිතුර මෙසේ විය.

"ආත්මය කියන්නෙ දෙවියන්ගේ ජීවන හුස්මටයි...."

ඔහුගේ පිළිතුරෙන් නොසෑහීමට පත් වූ මා තව දුරටත් ඔහුගෙන් විමැසූ විට ඔහු මෙසේ විස්තර කරයි.

"ආත්මය ගැන පූජකයන් පවා දන්නෙ බොහොම ටිකයි. ආත්මය අබිරහසක්...."

ඔහු ගැන නිතර කල්පනා කිරීමට ඔහු මා සලස්වයි. මම නොසන්සුන් ලෙස ඔහු වටහා ගැනීමට තැත් කරමි.

එහෙත්, එය සාර්ථක නොවීය. ඒ අතර, මට කිසිවක් නොපෙනෙන පරිදි, මට බාධා කරන්නෙ ඔහුගේ නැබුළු සිරුරය.

'බුපේ' වෙළෙන්දිය මා කෙරෙහි සැක උපදවන සුරතල් බවක් පළ කරයි. ඇයට මුහුණ සේදීමට වතුර සැපයීම දෙවැනි පන්තියේ සේවිකාවක් වන පවිත්‍ර සහ ප්‍රීතිමත් තරුණ ලූෂාගේ කාර්යයක් වුවද, එය මා කළ යුතු විය. වෙළෙන්දියගේ කුඩා කාමරයෙහි සිට ගෙන ඇගේ මුහුණ සේදීමට වතුර වක් කරන විට, ඉඟටිය දක්වා නග්න ඇගේ උඩුකය මට පෙනේ. එය ඇතූ පිළුණු පිටි ගොඩක් මෙන් වැහැරිලාය. එවිට මට මර්ගෝ රැජිනගේ දුඹුරුවන් උඩුකය මතක් වෙයි. මගේ නෙත් ඉදිරිපිට ඇති වැහැරුණු උඩු කය නිසා ජගුප්සාජනක හැඟීමක් මට ඇති වේ. එහෙත්, 'බුපේ' වෙළෙන්දිය වරෙක දොම්නසින් හා දොඩමලු ලෙසත්, තවත් වරෙක කෝපයකින් හා උපහාසයකිනුත් යමක් ගැන කතා කරයි.

ඇගේ එම දෙඩවිලිවල තේරුම මට හරිහැටි නොවැටහෙයි. එසේවතුදු, එහි අදහස යම්තමින් මට දැනෙන්නාක් මෙනි. එය නීච, හිඟන ලජ්ජා රහිත අදහසකි. මා ලජ්ජාවට පත් නොවන්නේ 'බුපේ' වෙළෙන්දිය ගෙන් සහ නැවේ සිදුවන හැම දේකින්ම ඈත් වූ වෙනත් ලෝකයෙක මා ජීවත්වන බැවිනි. මා පෙඳ පාසි සහිත විශාල පර්වතයකට මුවා වී සිටින්නාක් මෙනි. ඒ මිනිස් පර්වතය අසලින් අනික් සියලු දේ දිවා රෑ නොතකා කොහේදෝ පාවෙයි.

"ගව්රීලච්නා නුඹට මුළු හිතින්ම ආලය කරනවා. කට ඇරගෙන ඈනුම් හරින්න එපා. වාසනාව අල්ලා ගනින්..." යැයි ලූෂා උපහාසාත්මක ලෙස කී වචන මට සිහිනෙන් මෙන් ඇසෙයි.

මා සිනහවට ලක්කරන්නේ මේ තරුණිය පමණක් නොවේ. බුපේ අවන්හලේ අනිකුත් සියලු සේවකයෝ වෙළෙන්දියගේ දුර්වලකම් ගැන ඉතා හොඳින් දනිති. කෝකියා මුහුණ ඇඹුල් කර ගනිමින් මෙසේ කියයි.

"ගෑනි බඩ පුරා කාලා, දැන් කේක් කන්න ඒකිට දොළදුකක් හැදිලා. යකින්නක්! පෙෂ්කෝව්, දෙනෙත්

ඇරගෙන බලා හිටපන්..."

යාකොව් මට පියකු සේ උවදෙස් දීමට ඉදිරිපත් වෙයි.

"නුඹ මීට වඩා අවුරුදු දෙකකින් විතර වැඩිමල්ව හිටියානම්, මට මීට වඩා වෙනත් උපදෙසක් දෙන්න තිබුණා. නුඹේ වයස අනුව බලන විට, ඒකිට යටවීම හොඳ නැහැ! කොහොම වුණත් නුඹේ කැමැත්තක්..."

"මොන පිස්සුද, ඒක මහා නීච වැඩක්" යැයි මම කිව්වෙමි.

"සත්තකින්ම." ඔහු එකඟ විය.

එහෙත්, එවිටම වාගේ නළලට වැටෙන කොණ්ඩය අතකින් හරිගස්වා ගනිමින් යාකොව් යළිත් කතා කරයි.

"අනිත් අතින් ඒ ගෑනිගෙ ආසාවන් ගැනත් කල්පනා කරලා බලන්න ඕන. ඒක බොහොම අල්ප, ලෞකික දෙයක්. බල්ලකුව අත ගාන විට ඌටත් ඒක සැපතක්. ඉතින් මිනිස් ප්‍රාණයකට! බිම්මල්වලට තෙතමනය ඕනෑ වගේම ගෑනියටත් කරුණා, ආදරය ඕන. ඒකිටත් ඒක ලජ්ජාවක්. නමුත්, මොනවා කරන්නද? ශරීරයට කාම සැපත ඕන. එයට වැඩි දෙයක් නොවේ."

මම නොසන්සුන් ලෙස ඔහු දෙස එක එල්ලේ බලා ඇසුවෙමි.

"නුඹට ඇය ගැන දුකක් ඇති වුණාද?"

"මටද? ඒකි මගේ අම්මද? මවුවරුන් ගැන පවා කනගාටු වෙන්නෙ නැහැ. නුඹ පුදුම කොල්ලෙක්!"

බිඳුණු ගෙජ්ජි රබානකින් පිටවන හඬක් මෙන් ඔහුගේ සිනා හඬ ඇසෙයි.

සමහරදාට ඔහු දෙස බලන මට හැඟෙන්නේ ගොළු ශූන්‍යතාවකට, පතුලක් නැති අගාධයකට මා ඇද වැටෙන සැටියෙකි.

"ඔක්කොමල්ලා කසාද බඳිනවා. යාකොව් මොකද කසාද නොබඳින්නෙ?"

"ඒ මොකටද? ගෑනියෙක් ඕන වුණාම මම හොයා ගන්නවා, දෙවියන්ට පින් සිද්ධ වෙන්න ඒක බොහොම ලෙහෙසි වැඩක්. කසාද බැන්දම එක තැනක ජීවත් වෙන්න ඕන. ගොවිතැන් කරන්න ඕන. මගේ ඉඩම සරු නැහැ. ඒක පුංචි ඉඩම් කෑල්ලක්. ඒ මදිවට මගේ

මාමා ඒක උදුරා ගත්තා. මගේ මල්ලී අනිවර්ය යුද්ධ සේවාවේ ඉඳලා ඇවිත් මාමාත් එක්ක තර්ක කරලා, අන්තිමේදී ඔළුව පළාපි. ලේ වැගුරුණා. ඔන්න ඒ නිසා මල්ලිට අවුරුදු එක හමාරක සිර දඬුවමක් ලැබුණා. හිර ගෙදරින් එළියට ආවාම වෙන්නෙ මොකක්ද? ආපහු හිර ගෙදරට යන එක තමයි. එයාගෙ ගෑනි තරුණයි. ඉතින් ඔය ගැන මොනවා කියන්නද! කසාද බැන්දනම් තමුන්ගේ බලුකුඩුවේ අයිතිකාරයා වෙලා එතන ඉන්න ඕන. සෙබළා ඔහුගේ ජීවිතයේ හාම්පුතා නොවෙයි."

"යාකොව් දෙවියන්ට වඳිනවද?"

"නුඹ පුදුම කොල්ලෙක්. සත්තකින්ම වඳිනවා."

"කොහොමද?"

"හැම ආකාරයටම."

"තමුසෙ දන්න යාච්ඤා මොනවද?"

"යාච්ඤා මම දන්නෙ නැහැ. මල්ලී, මම බොහොම සරල විදිහට යාච්ඤා කරනවා. ජේසුතුමාණනි, පණ පිටින් ඉන්නා අයට සමාව දෙන්න. මියගිය අයට සමාදානය දෙන්න. මිනිසුන් ලෙඩ රෝගවලින් නිවාරණය කරන්න. තවත් ඔය වගේ දේවල් තමයි මම කියන්නෙ."

"මොන වගේ දේවල්ද?"

"කොහොම කිව්වත් දෙවියන්ට එය හොඳට තෝරා ගන්න පුළුවනි!"

ඔහු මා කෙරෙහි දැක්වූයේ සුරතලය සහ කුතුහලය සහිත ආකල්පයෙකි. හාස්‍යය උපදවන දේ කිරීමෙහි සමත් බලුපැටවකුට මෙනි. සමහර දාට රාත්‍රී කාලයේ ඔහු අසල මම වාඩි වී සිටිමි. ඔහුගෙන් තෙල් ගඳත්, දහදිය ගඳත්, ලූනු සුවඳත් වහනය වෙයි. ඔහු ඇපල් කන්නාක් මෙන් අමු ලූනු ගෙඩි සැපීමට කැමතිය. හිටි හැටියේම මගෙන් ඔහු මෙසේ ඉල්ලා සිටී. "ඉතින් අල්‍යෝහා යෙරෝහා. වෝහා හොඳ කවියක් කියපන්!"

මා බොහෝ කවි කට පාඩමින් දැන සිටි අතර, මම ඉතාම ආදරය කරන කවි මහත කොපි පොතක පිටපත් කර තැබීමි. මා ඔහුට 'රුස්ලාන්'[1] කවිකතාව කියවන

1 රුසියාන් මහා කවි පුෂ්කින් ලියූ "රුස්ලාන් හා ලුද්මීලා" කවිකතාව ගැනය. : අනුවාදක

අතර, ඔහු නොසෙල්වී, අන්ධයකු සහ ගොළුවකු සේ එයට සවන් දෙන්නේ හුස්ම පවා නොගනිමිනි. අනතුරුව ඔහු පහත් හඬින් මෙසේ පවසයි:

"සිත් ගන්නා අපූරු කතාවක්. නුඹ හිතලා කිව්වද? පුෂ්කින්ද? එක රදලයෙක් ඉන්නවා. මුහින්-පුෂ්කින් එයාගෙ නම. මම එයාව දන්නවා."

"මේ කවි ලියාපු පුෂ්කින් මැරුම් කාලා බොහොම කල්" යැයි මම පැවසීමි.

"මොනවා නිසාද?"

මර්ගෝ රැජින මට කී කතාව මම ඔහුට කිව්වෙමි. යාකොව් ඒ කතාව අසා අනතුරුව සන්සුන්ව මෙසේ පැවසීය: "මේ ගෑනුන් හන්දා බොහොම මිනිස්සු මැරුම් කනවා."

මම ඔහුට නිතරම පාහේ මා කියවා ඇති පොත්වලින් කතා කියන්නට වීමි. ඒ කතා සියල්ල මා මිශ්‍ර කරගත් අතර, ඒවා සියල්ල නොසන්සුන්, ලස්සන ජීවිතයෙකි, ගිනි මෙන් රාගයෙන් යුත්, අවිචාරවත් වික්‍රමවලින් පිරි, ශෝභන උදාරත්වයෙන් යුත්, අපූරු වාසනාවක් සහිතව, ද්වන්ද සටන් හා මරණ සහිත උදාර කතා සහ නීච ක්‍රියාවලින් යුත් ඉමක් නැති කතා වැලක් විය. රොකම්බොල් චරිතය මම ලා මෝල ගේ ධීර වීර ක්‍රියා සහ හැනිබාල්, කොකෝනා චරිත දක්වා වෙනස් කළෙමි. එකොළොස් වැනි ලුයි ග්‍රාන්දේ පියාගේ චරිතය වෙනස් කළෙමි. ඔත්ලෙතායෙව් හතරවැනි හෙන්රි සමඟ මිශ්‍ර කළෙමි. මගේ උද්දාමය හා ආස්වාදය අනුව මෙලෙස මිශ්‍ර කළ චරිත සහ වෙනස් කළ සිද්ධි සහිත ලෝකයෙහි මම සීයාගේ දෙවියන් මෙන් නිදහස් කෙනෙකු බවට පත්වීමි. ඒ දෙවියෝද තමන් රිසි පරිදි ක්‍රීඩාවෙහි යෙදෙති. සැබැවින්ම පවතින යථාර්ථය දැකීමට බාධා නොකර, ජීවමාන මිනිසුන් වටහා ගැනීමට මගේ ඇති අභිලාෂය අඩු නොකර, ඒ කතා වැල බෝවනසුලු කිලිටි විෂබීජවලින්ද, ජීවිතයේ වස විෂවලින්ද මා ආරක්ෂා කළේ, විනිවිද පෙනෙනසුලු, සිදුරු නොකළැකි වලාකුළක් වැනි ආවරණයෙකිනි.

බොහෝ දේ නිසා සිත අමනාප නොවන කෙනෙකු

බවට මා පත් කරනු ලැබුවේ පොත් විසිනි. ආලය කරන සැටිත්, දුක් විඳින සැටිත් දැනගෙන, ගණිකා නිවසට යා නොහැකිය. නීච පාප ක්‍රියාවලට මසිතෙහි තද පිළිකුලක් ඇති වූ අතර, එවැනි ක්‍රියා සැපතක් ලෙස සිතා ක්‍රියා කරන මිනිසුන් කෙරෙහි මම අනුකම්පාවක් දැක්වීමි. වටපිටාවට යටත් නොවී, අධිෂ්ඨාන ශක්තිය පෙන්වන ලෙස මට රොකම්බොල් උගැන්වීය. කිසියම් වැදගත් ශ්‍රේෂ්ඨ දෙයක් සඳහා ජීවිතය කැප කිරීමට ඩුමාගේ වීරයෝ මට උගැන්වූහ. මගේ ප්‍රධානතම වීරයා වූයේ හතරවැනි හෙන්රි රජුය. බෙරන්ෂේගේ ගීත විස්තර කළේ මෙන්න මේ වීරයා ගැන යැයි මට සිතිණි.

දුන්නා ඔහු ගොවීන්ට බොහෝ වරම්,
බීමට මත්පැන් කැමති ඔහු හැකි තරම්,
ඔව්, ජනතාව සතුටින් සිටිති නම්,
රජුට බීමට නොහැකි කරුණ කිම්?

නවකතා හතරවැනි හෙන්රි රජු විස්තර කළේ සාධු ගුණ ඇති පුද්ගලයකු ලෙසිනි. ඔහු සිය වැසියනට ළංවී සිටියේය. ඔහු හිරු මෙන් පැහැදිලිය. ප්‍රංශය ලෝකයේ ඉතාම ලස්සන රට බවට ඔහු මට ඒත්තු ගැන්වීය. ධීර වීර සෙනෙවියන් රජුගේ ඇඳුම් ඇඳ සිටියද, ගොවි ඇඳුමෙන් සැරසී සිටියද එක සේ, උදාරය. ඇන්ජ් පිතු ද'අර්තන්යාන් මෙන්ම වීරයෙකි. හෙන්රි රජු මැරුම් කෑ විට දුකෙන් පිරි හදවතකින් යුතුව මම ඇඬුවෙමි. රවල්යාක් කෙරෙහි ඇති වූ කෝපය නිසා දත්මිටි කන්නට වීමි. ගිනි උදුන්කරුවාට මා කී කතාවල වීරයා වූයේ හෙන්රි රජුය. යාකොව්ද 'හෙන්රික්' රජුට සහ ප්‍රංශයට ඇලුම් කළැයි මට සිතිණි.

"ඔය හෙන්රික් රජ්ජුරුවෝ බොහොම හොඳ කෙනෙක්. එයත් සමඟ මාර යුද්ධයට වුණත් යන්න පුළුවන්." යාකොව් කිව්වේය.

ඔහු උද්දාමයට පත් නොවීය. මගේ කතාවට බාධා කරමින් ප්‍රශ්න ඉදිරිපත් කළේ නැත. ඔහු බැම සඟළ පහත දමා ගෙන, අවල මුහුණක් ඇතිව පෙඳ පාසිවලින් වැසුණු පැරණි පර්වතයක් සේ කතාවට සවන් දුන්නේය. යම් හේතුවක් නිසා මා කතාව නැවැත්වූවෙන් ඔහු සැණෙකින් ප්‍රශ්න කරයි.

"ඉවරද?"

"තවම නැහැ."

"නුඹ අතරමඟදී නවත්වන්න එපා."

ප්‍රංශුවන් ගැන ඔහු කතා කළේ සුසුම්ලමිනි.

"හෙවණේ ජීවත් වෙනවා."

"ඒ කොහොමද?"

"අපි නුඹලා මෙහෙ වැඩ කරමින් ගින්නෙන් දැවී, දැවී ජීවත්වෙනවා. ඒ ගොල්ල හෙවණට වෙලා ජීවත් වෙනවා. උන්ට කිසි වැඩක් නැහැ. කනවා, බොනවා, ඇවිදිනවා. හිත සනසා ගන්න පුළුවන් ජීවිතයක් උන් ගත කරනවා."

"ප්‍රංශකාරයොත් රක්ෂාවල් කරනවා."

"නමුත්, නුඹේ කතා අනුව උන් රක්ෂාව කරන බවක් පෙනෙන්න නැහැ." යි ගිනි උදුන්කරුවා සාධාරණ ලෙස විමර්ශනය කළේය. මවිසින් කියවන ලද පොත්වලින් අති බහුතරය මිනිසුන් වැඩ කරන සැටිත්, උදාර වීරයන් ජීවත් වන්නේ කිනම් අමාරුකම් ඇතිවද යන්න ගැනත් නොකියන බව ඔහුගේ කතාව නිසා මට හිටිහැටියේම පැහැදිලි විය.

"හොඳයි, මම පොඩ්ඩක් නිදාගන්නම්" යාකොව් එසේ කියා ඔහු වාඩි වී සිටි තැනම උඩු බැලි අතට පෙරළුණේය. විනාඩියක් ගතවත්ම ඔහු නහයෙන් හඬක් නංවමින් සැපසේ නිදාගන්නට විය.

සරත් සමය ළංවත්ම, කාමා ගං ඉවුරුවල ගස් කහ පැහැගත්තේය. හිරු රැස් මලානික විය. යාකොව් නැවෙන් පිටතට ගියේ බලාපොරොත්තු රහිතවය. එසේ යාමට පෙර ඔහු සිය අදහස් දැක්වීය.

"හෙට අපි පෙර්ම්වලට යනවා. අපි නාන ගෙදරට ගිහිල්ලා උතුරන වතුරවලින් පිටවන වාෂ්පවලින් නාමු. ඊට පසු හොඳ තැබෑරමකට ගිහිල්ලා හොඳ සංගීතය අහලා ඇඟ රත් කර ගනිමු. හිත සැනසෙන වැඩක්! සංගීත පෙට්ටියේ සංගීතය අහන්න මම බොහෝ කැමතියි."

එහෙත්, සරපුල් නගරයේදී නැවට තරබාරු මිනිහෙක් ආවේය. ඔහුගේ සිරුරේ තෙල් සහිත හම අප්‍රාණික බවක් පළ කළේය. මුහුණ ගැහැනියකගේ මෙනි. එහි උඩු හෝ යටි හෝ රැවුළු නැතිය. ඔහු ඇඳ සිටි දිගැති චුයිකා කබායද,

දෙකන් වැසෙන පරිදි හිවල් ලොමින් සෑදූ කන්පෙති සහිත කර්තුස් තොප්පිය ද ඔහු වඩාත් ගැහැනියකට සමාන කළේය. ඔහු කුස්සිය අසල වූ මේසයක වාඩි වී, තේ පානය සඳහා අවශ්‍ය ආම්පන්න ඇණවුම් කළේය. ඔහු කබාය සහ කන්පෙති සහිත තොප්පිය නොගලවාම උණු තේ බොන්නට වූයෙන්, දහදියෙන් තෙමිණි.

සරත් සමයේ වැහි වලා තොරක් නැති පොද වැස්ස මවා ලීය. මේ මිනිහා කොටු වැටිච්ච ලේන්සුවෙන් ඔහුගේ මුහුණ පිසදමන විට වැසි තුරල් වන සැටියකුත්, දහදිය පෙරාගෙන තේ බොන විට වැසි වැඩි වන සැටියකුත් මට දැනිණි.

ඉක්මනින්ම යාකොව් ඔහුගේ මේසය අසලට විත් ඔහුත් සමග එකතු වී දින දර්ශනයේ ඇති සිතියමක් බලන්නට වූ අතර, මේ පණ්ඩක මඟියා ඇඟිල්ලෙන් සිතියම් පෙන්වීය. යාකොව් සන්සුන් ලෙස කතා කළේය.

"හොඳයි. මම ලෑස්තියි. ඒක මම පොට්ට කාසියක් තරම්වත් ගණන් ගන්නෙ නැහැ..."

"හොඳයි!" සිහින් හඬින් එසේ කී මඟියා සිතියම ඔහුගේ දෙපා අසල තිබුණු සම්මුවා මල්ලේ බහා ලීය. දෙදෙනා පහත් හඬින් කතා කරමින් තේ බොන්නට වූහ.

යාකොව්ගේ වැඩ මුරය පටන් ගැනීමට පෙර ඒ මිනිසා ගැන තොරතුරු මම ඔහුගෙන් විමසීමි. ඔහු සිනහා සෙමින් මෙසේ පැවසීය:

"මිනිහා රජගෙදර පරවියෙක්. පණ්ඩකයෙක් වගෙයි පෙනෙන්නේ. ඈත සයිබීරියාවේ ඉඳලා ඇවිත් සැලැස්ම අනුව ජීවත් වෙනවා."

ඔහු මගෙන් ඈත්වී ඩෙක් තට්ටුවේ ගාටමින් ගමන් කරමින්, ළපැත්ත කසමින් මට මෙසේ කිව්වේය:

"මම ඒ මිනිහා ළඟ වැඩට යන්න කතා කර ගත්තා. මම පෙර්ම්වලට ආපු හැටියේම නැවෙන් අස්වෙලා යනවා. ඉතින් ආයුබෝවන් යෙරෝහා, වොහා. ඉස්සෙල්ලාම අපි කෝච්චියෙන් යනවා. ඊළඟට ගංගාවක් දිගේ යනවා. ඊටත් පසුව අස්පයන් පිට උඩ නැඟලා යනවා. මේ ගමනට සුමාන පහක් යනවලු. ඔන්න ඒ මිනිහා ඇවිත් තියෙන දුරක තරම..."

"නුඹ ඒ මිනිහව අඳුනනවද?" යාකොව්ගේ බලාපොරොත්තු රහිත තීරණය නිසා මම මවිත වී ඔහුගෙන් ඇසුවෙමි.

"ඒ මිනිහවද? මගේ අම්මා මුත්ත කාලෙදීවත් දැකලා නැහැ. මම ඒ පළාතේ වාසය කරලා නැහැ නොවැ...."

පසු දින උදෑසන යාකොව් කෙටි, කිලිටි අර්ධ හිම කබායක් ඇඳගෙන මේස් රහිතව සපත්තු කුට්ටමක් පය ලා ගෙන, මිද්විෂෝනක්ගේ පිදුරු තොප්පියක් හිස දමාගෙන, ඔහුගේ අයෝමය ඇඟිලිවලින් මගේ අතක් මිරිකා සමුගනිමින් මෙසේ පැවසීය:

"මාත් සමඟ වරෙන් හොඳද? මම ඔහුට කිව්වොත් ඔහු නුඹවත් ගෙනයාවි. නුඹ කැමතිද? නුඹේ අමතර දේ කපලා දාවි වැඩිපුර කෑම දේවි, සල්ලිත් දේවි. මිනිහකුව විකෘති කිරීම උන්ට ඒක ලොකු උත්සවයක්. ඒ නිසා උන් තෑගි බෝග දෙනවා."

පණ්ඩකයා බඩු පොදියක් කිහිලි ගන්නාගෙන යාකොව් දෙස බලාගත්වනම සිටියේ මළ මිනිහකුගේ නෙත්වලිනි. ඉදිමුණු ඔහුගේ සිරුර දියේ ගිලී මළ එකකු සිහි ගන්වයි. මම ඒ මිනිහාට තරමක් දොස් පවරමින් කතා කළ විට, යාකොව් මගේ අත තවත් තදින් මිරිකා සමු ගත්තේය. "තඹයකටවත් මම ගණන් ගන්නෙ නැහැ! එක එකා. උන් උන්ගේ දෙවිවරුන්ට වඳිනවා. අපට මොකද? ඉතින් නුඹට ආයුබෝවන්. වාසනාවන්තව ජීවත් වෙයන්!"

වලසකු සේ තරමක් පැද්දෙමින් යාකොව් ෂුමොව් ඉවත් වී යන්න ගියේය. ඔහු නිසා මසිතෙහි අසීරු, සංකීර්ණ හැඟීම් හට ගත්තේය. මට ඔහු නිසා කනගාටුවක් සහ අනුකම්පාවක් ඇති විය. එමෙන්ම, ඔහු නිසා ඇතිවූයේ එක්තරා සුහද ඉරිසියාවකි. මේ මිනිසා නන්නාඳුනන මිනිහෙකු සමඟ නන්නාඳුනන පළාතකට යන්නේ කුමක් නිසාද?

යාකොව් ෂුමොව් කිනම් පුද්ගලයෙක්ද?

XII

සරත් සමය අවසානවත්ම, නැව් ප්‍රවාහනය නැවතුණෙන්, මම දේව රූප (ඉකෝන) අඳින වැඩ ශාලාවෙක සිප්කැමියකු ලෙස සේවයට බැඳුණෙමි. එහෙත්, දවසකට පසු වැඩ ශාලාවේ අයිතිකාරිය මෘදු එමෙන්ම, බේබදු මැහැල්ල විලදීමීර් ප්‍රදේශයේ බස් වහරින් මා අමතා මෙසේ තෙපලායඃ "මේ දවස්වල දිවාකාලය කෙටියි. රාත්‍රී කාලය වැඩියි. ඉතින් නුඹ උදේට පින්තූර විකුණන කඩේට ගිහිල්ලා වෙළඳාමට උදව් වෙයන්. හවසට ඉගෙන ගනින්."

වෙළඳ හලේ කළමනාකරු වන මිටි, කඩිසර, ලස්සන මුහුණක් ඇති තරුණයා යටතට මා පත් කළේය. හැමදාම උදෑසන ශීතල සහිත අඬ ඇඳිරිය පවතිද්දී, ඉල්යින්කා නමැති නිදිබර වෙළෙන්දන් පදිංචි වීදිය ඔස්සේ නිෂ්නී බසාර් (පහළ කඩපොළට) වලට මම පයින් යමි. එහි ගොඩනැඟිල්ලක දෙවැනි මහලෙහි පින්තූර හෙවත් ඉකෝන වෙළඳ හල පිහිටා ඇත. ඇඳිරි ගබඩා කාමරයක් සහ යකඩ දොරක්ද, කුඩා ජනේලයක් සහ යකඩ පියස්සක් සහිත මලුවකින්ද යුත් වෙළඳ හලේ විවිධ ප්‍රමාණයේ දේව පින්තූර මහ ගොඩකි. එම දේව පින්තූරවලට "මිදි ගෙඩි" සහිත සිනිඳු ලෝමුවා කැටයම් වැඩ දමා ඇත. කහ පැහැති සම් බැම්මෙන් සැදූ ස්ලාව් යාච්ඤා පොත් මෙහි ගොඩගසලාය. මෙම වෙළඳ හලට යාබදව තවත් කඩයකි. එහිද විකුණන්නේ එවැනිම පින්තූර සහ යාච්ඤා පොත්ය. එම වෙළඳ හලේ අයිතිකරුවා වොල්ගා සහ කෙර්ෂෙනේට්ස් පළාත්වල ඉතා ප්‍රසිද්ධ පැරැණි ආගම විශ්වාස කරන්නෙකු සහ ඇසූ පිරූ තැන් ඇත්තකුගේ නෑයකු වන කළුවන් යටි රැවුළක් ඇත්තෙකි. මෙම වෙළඳ අයිතිකරුවාත් සමඟ ඔහුගේ පුතාද විය. වියළි, කඩිසර ඔහු මගේ සමවයස්කරුවෙකි. අළුවන් ඔහුගේ මුහුණ මහල්ලකුගේ මෙනි. නොසන්සුන්තාව සහිත ඔහුගේ දෙනෙත් මීයකු සිහියට නංවයි.

දිනපතා උදෑසන වෙළඳ හලේ දොර හැර මා උණු වතුර ලබාගැනීම සඳහා ළඟැති කඩයට යා යුතුය. තේ

සාදා පානය කළ පසු කඩේ වෙළඳ භාණ්ඩ පිසදා පවිත්‍ර කළ යුතුය. ඉන් ඉක්බිතිව මළුවට විත් සිටගෙන අල්ලපු කඩේට මිනිසුන් නොයැවීම සඳහා ඉතා තියුණු ලෙස රාජාලි බැල්මකින් සිටිය යුතුය.

"ගැනුම්කාරයා මෝඩයෙකි." යි මට නිතර නිතර කළමනාකරුවා කියා සිටියේය. "ගැනුම්කාරයාට කොහෙන් බඩු ගත්තත් එකයි. ඔහුට ඕන ලාබෙට බඩු ගන්නයි. බඩුවල හොඳ නරක ඔහුට තේරුම් ගන්න බැහැ."

"කළමනාකරුවා දේව පින්තූර එකින් එක අතට ගෙන, ඒවාට තට්ටු කරමින් විෂය පිළිබඳව සියුම් දැනීමකින් යුතුව මට උගන්වන්නට විය.

"චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ බොහොම ලාබයි. අඩි තුනයි හතරේ පින්තූරයක මිල මෙච්චරයි. ශුද්ධවන්තයන් ගැන දන්නවාද? බොනිපේස් මුනිතුමා, බේබදුකමින් මුදාගැනීමට බාර්බරා මුනිතුමිය. දත් කැක්කුමෙන් සහ අකල් මරණයෙන් ගලවා ගැනීමට බැසිල් මුනිතුමා උණ සන්නිපාතයෙන් හා වෙවුලන රෝගවලින් මුදා ගැනීමට. දේව මෑණියන් ගැන විස්තර දන්නවාද? ඔන්න මතක තියා ගනින්. වික්ෂෝප මෑණියෝ, ත්‍රිත්වයේ මෑණියෝ, ශුද්ධ වූ ලකුණේ මෑණියෝ, සනසාලීමේ මෑණියෝ, කසාන්. පක්රෝව්, ඊතල හතේ..."

ඒ ඒ පින්තූරවල ප්‍රමාණය ඒවායේ මිල ගණන්, විවිධ වර්ගවලට අයත් දේව මෑණියන්ගේ පින්තූර එකවරම මා මතක තබා ගත්තද එක්, එක් සාන්තුවරයා සුව කරන ලෙඩ රෝග ආදිය ගැන මතක තබා ගැනීම ලෙහෙසි නොවීය.

වෙළඳ කවුන්ටරය අසල සිටගෙන මම සිහින දකිමින් ඉන්නා විට, හිටි හැටියේම කළමනාකරුවා මගේ දැනීම පිරික්සුමට හසු කරයි.

"අමාරු දරු උපත්වලට පිහිට වෙන්නෙ කවුද?"

මා නිවැරැදි පිළිතුර නොදුනහොත් ඔහු අවඥා සහගත ලෙස මගෙන් ප්‍රශ්න කරයි.

"ඇයි බං නුඹේ ඔය ඔළුගෙඩිය මොකටද?"

ගැනුම්කරුවන් ඇද ගැනීම ලෙහෙසි නොවීය. විකෘති

නිර්මාණ මගේ සිත් නොගත් අතර, ඒවා වෙළඳාම් කිරීමද අපහසු කාර්යයකි. ආච්චිගේ කතා අනුව දේව මෑණියන් මගේ සිතෙහි ඇඳුණේ යෞවන, රූමත්, දයාබර කෙනෙකු ලෙසිනි. සඟරාවලින්, මුද්‍රිත චිත්‍රවලින් මා දුටුවේත් එවැනි කෙනෙකි එහෙත්, මෙහි ඇඳ තිබෙන ඉකෝන චිත්‍රවල දේවමෑණියෝ මහලුය. දැඩිය, ඇගේ නාසය දිගුය, වක්‍රය, දෑත් දර කෝටු මෙනි.

කඩපොළ පවත්වන දවස්වලට, එනම් බදාදා සහ සිකුරාදා දවස්වලට වෙළඳාම ජයට කෙරිණි. කඩයට අයත් මලුවේ ගොවියන්, මැහැල්ලන්. සමහර විට පවුල් පිටින් දක්නට ලැබිණි. වොල්ගා නදියට එහා පෙදෙසින් පැමිණි මොවුහු පැරණි ආගමික සිරිත්වලට අයත් වූවෝය. කැලෑ පෙදෙස්වලින් පැමිණි මොවුහු අවිශ්වාස ලෙසත්, මූසල ලෙසත් බලති. පය තැබුවොත් ගිලෙතියි යන බියෙන් මිනිහෙක් පඩිපෙළ ඔස්සේ ගමන් කරයි. ඔහුගේ දෙපාවල ගෙදර මැසූ, එළු සමින් කළ හිම පාවහන් දෙකකි. එය දණහිස් දක්වා උසය. ඔහු ඉදිරියේ සිටින විට අපහසුවක් සහ ලජ්ජාවක් මට දැනෙයි. ඔහු යන මඟ අහුරා, ඔහුගේ විශාල පාවහන් ඉදිරියේ මා ඔහු අමතා කතා කරන්නේ පරිශ්‍රමයෙනි. මදුරුවකුගේ නාදයක් මෙන් මම ඔහු අමතමි.

"ගරු කටයුතු මිනිසාණෙනි, ස්තෝත්‍ර යාච්ඤා පොතක් ඕනද? යෙප්රේම් සීරින්ගේ, කිරිල්ගේ යාච්ඤා. දේව වාක්‍ය, සුවිශේෂය, කරුණාකරලා බලන්න! දේව පින්තූර අප ළඟ තියෙනවා. නොයෙක් මිල ගණන්වලට. ඉතාම හොඳ නිර්මාණ! හොඳ පාටවලින් ඇඳපු ඒවා. ඔබේ ඇණැවුම් පරිදි අපට සුද්දවන්තයන්ගේ, දේව මෑණියන්ගේ පින්තූර ඉතා හොඳට ඇඳලා දෙන්න පුළුවනි. මුළු පවුලම සඳහා ඇණැවුම් කිරීමට ඔබ කැමතිද? අපේ චිත්‍රකාරයෝ රුසියාවේ ඉතාම හොඳ අය! මේක තමා මේ නගරයේ ඉතාම හොඳ වෙළඳ හල!"

විනිවිද නොයන, තේරුම්ගත නොහැකි ගැනුම්කරුවා බොහෝ වේලාවක් නිහඬව සිටින්නේ බලුපැටවකු දෙස බලන පරිදි මා දෙස බලමිනි. හිටිහැටියේම ඔහුගේ දරකෝටු අතින් මා පසෙකට තල්ලු කොට, ඔහු යාබද

වෙළඳ හලට යයි. අපේ කඩේ කළමනාකරුවා ඔහුගේ විශාල දෙකන් අතුල්ලමින් මට බැණ වදී

"ගැනුම්කරුවාට යන්න ඉඩ දුන්නා..."

අල්ලපු කඩේ වෙළෙන්දා මුදු ලෙසත්, රසබර ලෙසත් කතාව පටන් ගනී. මිනිසුන් මුළා කරන ඉබා දෙසුමක් අපට ඇසේ.

"කරුණාවන්ත මහත්තයෝ, අපි එළු හම් වෙළඳාම් කරන්නෙ නැහැ නොව. මේක සපත්තු වෙළඳාමකුත් නොවෙයි. දෙවියන්වහන්සේගේ ආශීර්වාදය ලත් වෙළඳාමක්. මේක රිදී රත්තරන්වලටත් වැඩිය වටිනවා. මේවායේ වටිනාකම මේ තරම් කියල කියන්න බැහැ...."

"යක්ෂයා!" යැයි අපේ කඩේ කළමනාකාරයා මුමුනන්නේ එක්තරා උද්දාමයක් ඇතිවය. "අර වෙළෙන්දා බොහොම අපූරු විදිහට ගමයාව රවටනවා. හොඳට ඉගෙනගනින්! ඉගෙනගනින්!"

මම සිත කය යොදා එම කලාව ඉගෙන ගතිමි. යම් කිසි දෙයක් බාරගත්තේ නම් එය හරි හැටි කළ යුතුය. එහෙත්, ගැනුම්කරුවන් ඇද ගැනීම සඳහා කතා කිරීම මට සාර්ථක ලෙස කළ නොහැකි විය. මූසල පෙනුමක් ඇති ගමයෝද නිතර බියවී සිටින ඌරුමීයන් සිහි ගන්වන මැහැල්ලෝද මසිතෙහි අනුකම්පාවක් ඇති කළහ. වැඩිපුර කොපෙක් විස්සක් ඉල්ලන්නේ නැතිව පින්තූරයේ නියම මිල හොරෙන් ඔවුනට කීමට මට සිත්විණි. බැලූ බැල්මට දුගී දුප්පත් හාමතෙන් පෙළෙන්නන් ලෙස පෙනෙන මේ මිනිසුන් අන් දේවලට වඩා වැඩියෙන් මිලදී ගත්, දේව ස්තෝත්‍ර යාච්ඤා පොතට රූබල් තුන හමාරක් ගෙවන සැටි මා පුදුමයට පත් කළේය.

යාච්ඤා පොත් පිළිබඳ ඔවුන්ගේ දැනීමත්, දේවරූප ඇඳීමේ කලාව පිළිබඳ දැනීමත් නිසා මම මවිත වීමි. තරමක මහලු මිනිහකු අපේ කඩයට ඇද ගැනීම සඳහා මා කී විස්තර වර්ණනයට සවන් දී සිටි ඔහු ශාන්ත ලෙස මෙසේ පැවසීය:

"රූප අඳින උඹලෑ වැඩපොළ රුසියාවේ ඉතාම හොඳ එක යැයි කීම ඇත්ත නොවෙයි. පොඩ්ඩෝ ඉතාම හොඳ වැඩපොළ මොස්කව් නගරයේ රගෝෂින්ගෙ වැඩපොළ!"

ලජ්ජාවට පත් වූ මම ඔහුගෙන් ඈත් වීමි. ඔහු අල්ලපු වෙළඳහලට පවා නොගොස් සෙමින්, සෙමින් යන්නට ගියේය.

'පල් වුණාද?" ස්වයං තෘප්තියකින් කළමනාකරුවා ඇසීය.

"ඔබ මට රගෝෂින්ගේ චිත්‍ර වැඩපොළ ගැන කිව්වේ නැහැ." මම පිළිතුරු දුනිමි.

ඔහු බැණ වදින්නට පටන් ගත්තේය.

"ඔහොම රස්තියාදු වන හෙමිජ්ජෝ හැම දෙයක්ම දන්නවා. අන්ත ක්‍රිස්තුලා. හැම දෙයක්ම උන්ට තේරෙනවා. නාකි බල්ලෝ..."

ලස්සන, බඩපුරා කා බී සතුටින් සිටින කළමනාකරුවා ගමයන්ට වෛර කළේය. සමහර වෙලාවලදී ඔහු දුක්ගැනවිලි ඉදිරිපත් කළේය.

"මම, බුද්ධිමත්, පිරිසිදුකමට මම කැමතියි. දෙවියන්ට පත්තු කරන තෙල්වල සුවඳ, ඔඩිකොලෝන් වගේ සුවඳට මම ආසයි. මේ වගේ නම්බුකාර මට සිද්ධ වෙලා තියෙනවා ගඳගහන ගමයාට හිසයි, උඩුකයයි පහත් කරන්න. මොකටද කඩේ අයිතිකාරියට වැඩියෙන් කොපෙක් පහක් හම්බ කරලා දෙන්න. ඒක මට සුදුසු වැඩක්ද? ගමයා කියන්නේ මොකාටද? ගඳ ගහන මව්ල් වලට. උකුණට. ඒ වුණාට..."

ඔහු දොම්නසින් නිහඬ වෙයි.

එහෙත්, ගම්මුනට මා කැමැතිය. ඔවුහු හැම දෙනෙක්ම යාකොව් මෙන් ගුප්ත පුද්ගලයෝය.

චපානයක් සහ ඊට උඩින් අර්ධ හිම කබායක් ඇඳගත් තරබාරු ගැමියෙක් අපේ වෙළඳ හලට ඇතුළු වෙයි. ඔහු සිය ලොම්මුවා හිම තොප්පිය ගලවා දේවරූප තබා ඇති මුල්ලත්, ඒවා ඉදිරියේ දැල්වෙන පහනත් දෙස බලා ඇඟිලි තුඩු දෙකකින් කුරුසියේ ලකුණ ඇඳ ගන්නේ අනික් පින්තූර දෙස පවා නොබලමිනි. අනතුරුව ඔහු නිහඬව වටපිට බලා මෙසේ ඉල්ලයි.

"දෙන්නකෝ මට දේව ස්තෝත්‍ර යාච්ඤා පොතක්. හොඳ එකක් !"

ඔහු චපාන් ලෝගුවේ අත නවාගෙන එහි පිටක්

කියවන්නේ ලේ ගැලීමට තරම්ම පැළී තිබෙන අළු පැහැති දෙතොල් නටවමිනි.

"පුරාණ පොත් නැත්ද?"

"පුරාණ පොතක වටිනාකම රූබල් දාහක් විතර වෙනවා. ඔබ ඒ ගැන දන්නවා නොවැ..."

"ඔව්, දන්නවා."

ඇඟිල්ලකට කෙළ ගසා ගැමියා පිටුවක් පෙරළයි. ඔහු ඇල්ලූ තැන ඔහුගේ ඇඟිලි සලකුණ ඇති වේ. ගැමියාගේ පිටු පසින් සිට ඔහු දෙස නපුරු බැල්මක් හෙළා කළමනාකරුවා කතා කරයි.

"ශුද්ධ වූ ලියවිලි සියල්ල පුරාණ දේවල්, දෙවියන් වහන්සේගේ වචනය වෙනස් වෙලා නැහැ..."

"අපි දන්නවා, අහලා තියෙනවා. දෙවියෝ වෙනස් කළේ නැහැ. ඒ වුණාට මහ පූජකයා නිකන් වචන වෙනස් කළා."

පොත වසා තිබුණු තැන තබා ගැනුම්කරුවා නිහඬව පිට වී යයි.

සමහර දාට කැලෑවලින් එන මේ කැලෑ ගැමියෝ කළමනාකරුත් සමඟ තර්ක කළහ. ඔවුන් ඔහුට වඩා හොඳින් දන්නා බව මට පැහැදිලි වූයේ ඔවුන්ගේ තර්ක වලට සවන් දීමෙනි.

"පල්මෝඩයෝ" යැයි කළමනාකරුවා ඔවුනට බැණ වැදුණේය.

සමහර විට අලුත් යාච්ඤා පොත ගැමියන්ගේ සිත් නොගත් බව මම දුටිමි. එහෙත්, ගැමියා එය ගෞරවයෙන් බලයි. ඒ පොත අතින් ගිලිහී යා හැකි කුරුල්ලකු මෙන් සලකා පරෙස්සමින් එහි පිටු පෙරළයි. එවන් දර්ශනයක් නැරඹීම මට ප්‍රීතියෙකි. මන්දයත්, මට නම් පොතක් වූ කලි එය ලියා ඇති මිනිසාගේ අධ්‍යාත්මය බහා තිබෙන පුදුමයක් බැවිනි. මා එම අධ්‍යාත්මය මුදා ලූ විට, එය මාත් සමඟ ගුප්තමය ලෙස කතා කරයි.

බොහෝ විට මහල්ලෝ සහ මැහැල්ලියෝ නීකන් මහ පූජකයාගේ කාලයට පෙර මුද්‍රණය කළ පැරණි යාච්ඤා පොත් නැතිනම් ඉර්ගීස්හි සහ කෙර්ෂෙනෙට්ස්වල වන ගත තාපසයන් විසින් පිටපත් කොට අලංකාර කරනු ලැබූ

අත් පිටපත්ද විකිණීමට ගෙනාවෝය. ද්මිත්‍රී රස්තොව්ස්කි විසින් සංශෝධනය නොකරනු ලැබූ මිනේයි පොත්වල පිටපත්ද මේවා අතර විය. පුරාණ පින්තූර සහ කුරුසද, තඹවන් ආගමික පූජා භාණ්ඩද, මොස්කව් කුමාරවරුන් විසින් බැතිමතුනට පූජා කරන ලද පිටරට සෑදූ රිදීමය බඳුන්ද ඔවුහු ගෙනාහ. මේවා සියල්ල වෙළඳාමට යෝජනා කළේ රහසිනි. බයාදු ලෙස වටපිට බලමිනි.

අපේ කඩේ කළමනාකරුවා සහ අල්ලපු කඩේ වෙළෙන්දා මෙවැනි පුද්ගලයන් ගැන ඉමහත් සෝදිසියකින් සිටියේ එකෙකුට පෙර අනිකා ඔවුන් අල්ලා ගැනීමට සූදානමිනි. මෙවැනි දේ රූබලයකට නැතිනම් රූබල් දහයකට මිලදී ගෙන සල්පිල පැවැත්වෙන කාලවලදී පැරැණි ආගම් චාරිත්‍ර අනුගමනය කරන පොහොසත් මිනිසුනට රූබල් සිය ගණන්වලට විකුණුවේය.

කළමනාකරු මට උගන්වන්න විය.

"ඔය යකුන්, විජ්ජාකාරයන් ගැන, නුඹ ඇස් දෙකම ඇරගෙන බලාගෙන ඉඳපන්. ඔවුන් අපට වාසනාව ගෙනෙනවා."

එවැනි වෙළෙන්දෙකු පැමිණි විට, කළමනාකරුවා මිල තක්සේරු කර පැරැණි ශිල්පියකු වන ප්‍රොතර් වසීලෙවිච් කැඳවා ගෙන එන ලෙස මා පිටත් කර යවයි. ඔහු පැරැණි යාච්ඤා පොත්, ඉකෝන ආදී දේ ගැන දැනුමක් ඇත්තෙකි.

ප්‍රොතර් වසීලෙවිච් උසය, මහලුය, වසීලි බ්ලෂේන්නී මුනිවරයා මෙන් යටි රැවුළ ඇත්තෙකි. ඔහුගේ නෙත් බුද්ධිමත්ය. මුහුණ පියකරුය. ඔහුගේ එක් පයක ඇඟිලි සන්ධිවලින් කපා තිබුණෙන්, ඔහු ගමන් කළේ නොණ්ඩි ගසමිනි. හිම කාලයේදී මෙන්ම, ගිම්හානයේදීත් ඉතා තුනී කබායක් ඇඟලා ගෙන සැරයටියක් අතැතිව හේ ගමන් කළේය. හට්ටියකට සමාන පැරැණි පන්නයේ වැල්වට් තොප්පියක් ඔහු හිස දැමුවේය. ප්‍රබෝධවත්, රිජු ලෙස වෙළඳ හලට ඇතුළු වන ඔහු, දෙවුර පහත් කොට, පිටිකොන්ද නමා, සුසුම් ලමින් දෙවියන්ගේ පහන ඉදිරියේ ඇඟිලි තුඩු දෙකකින් කුරුසියේ ලකුණ ඇඳ ගනිමින්, දේව ස්තෝත්‍ර කියමින් මුමුනන්නට විය. ඒ

යාච්ඤා සහ මහලු දුබලකම නිසා කළමනාකරුවා ඔහු කෙරෙහි විශ්වාසය තැබීය.

"ඇති ගනුදෙනුව මොකක්ද?" මහල්ලා ප්‍රශ්න කරයි.

"පරණ ඉකෝනයක් මිනිහෙක් ගෙනාවා. ස්ත්‍රෝගනව් නිර්මාණයක්ලු."

"මොනවද?"

"ස්ත්‍රෝගනව්..."

"ආ..., මට ඇහෙනවා මදි. මේ නීකන්ගේ කැත වචනවලින් දෙවියෝ මගේ කන් ආරක්ෂා කළා..."

ඔහු තොප්පිය ගලවා ඉකෝන චිත්‍රය තිරස් අතට අල්ලා රූපය ඇඳ තිබෙන සැටි පිරික්සයි. ලීයේ ඇති වට රවුම් ලපය දෙස බලන්නේ දෙනෙත් හකුළුවාගෙන 'මුරු මුරු' ගාමිනි.

"මේ ඉකෝනකාරයෝ මහ මිථ්‍යා දෘෂ්ටිකයෝ. පැරැණි ඉකෝනවලට අපි ආස කරන බව දැනගෙන මුන් ව්‍යාජ ඉකෝන අඳින්නෙ, යකාගෙන් වරම් අරගෙනයි. ශුද්ධ වූ ඉකෝන කොයිතරම් ව්‍යාජ ලෙස අඳිනවද! හැබෑ හොරු. බැලූ බැල්මට ස්ත්‍රෝගනව් නැතිනම්, උස්ත්‍යුග් චිත්‍ර කලාව, එහෙමත් නැතිනම් සූස්දල් චිත්‍ර කලාව. හොඳට බලාපුවාම බොරුවක්, කොපියක් බව පේනවා."

ප්‍යොතර් වසීලෙවිච් 'ව්‍යාජ' නමැති වචනය පාවිච්චි කළොත්, එහි තේරුම ඉකෝන චිත්‍රය වටිනා, විරල එකක් බවය. එය මිලදී ගත හැකි මුදල් ප්‍රමාණය මේ යැයි දැන්වීමට ඔහු සහ කළමනාකරු අතර සම්මත බස් වහරක් විය. ඉන් වචන කීපයක් මම දැන සිටියෙමි. "කනස්සල්ල හා වික්ෂෝපය" යනු ඉකෝනය රූබල් දහයක් වටිනා බවය. "නීකන් පූජකයා කොටියා" යනු චිත්‍රය රූබල් විසිපහක් වටිනා බවය. අසරණ මිනිහා රවටන සැටි දකින මට ලජ්ජා සිතෙයි. එහෙත්, මිල තක්සේරුකරු, ප්‍යොතර් වසීලෙවිච්ගෙ ක්‍රීඩාව මා සිත් ගත්තේය.

"මේ ඉකෝන මහ පච්කාර දේවල්. නීකන් පූජක කොටියාගේ පුතුන්ට ඕනෑම දෙයක් කරන්න පුළුවනි. උන්ව මෙහෙයවන්නේ යක්ෂයා. රූපය හැබෑ එකක් වගේමයි. එක කොටසක් එක් අතකින් ඇඳලා බදාම හරියට හැබෑ වගේමයි. අනික් කොටස එනම් මුහුණ

වෙනින් අතකින් ඇඳලා තියෙනවා. ඔන්න බලාපන් වැඩක හැටි! වෙනින් අතකින් මුහුණ ඇඳලා. පරණ චිත්‍රකාරයෝ, පාෂාණ්ඩයකු වුණත්, පිමෙන් උෂකොච් මුළු රූපයම තනිවම ඇන්දා, රූපයත්, ඉතුරු කොටසුත් ඇඳලා මුළු ඉකෝනයම තනිවම පිළියෙල කළා. දැන් ඉතින් අපේ කාලෙ ඉන් චිත්‍රකාරයන්ට එහෙම දෙයක් කරන්න බැහැ. හරිම පල්හොරු! උන් දේව විරෝධියෝ. ඉස්සර ඉකෝන ඇඳීම ශුද්ධ වූ කාරියක්. දැන් ඒක නිකම්ම නිකම් චිත්‍ර කලාවට විතරක් සීමා කරලා!"

ඔහු මෙලෙස තම අදහස් කියා පරෙස්සමින් ඉකෝනය වෙළඳ කවුන්ටරය මත තබා තොප්පිය හිස ලාගෙන කතා කරයි.

"පව්කාර වැඩ."

එහි තේරුම මිලදී ගනින්! යන්නය.

ප්‍රීති සයුරක ගිල්වන මිහිරි වචන දොඩවන මහල්ලාගේ දැනීම නිසා ඔහුට ගරු කරමින් ඉකෝනය ගෙනා මිනිහා මෙසේ අසයි:

"ගරු කටයුතු ලොකු උන්නැහේ, ඉකෝන චිත්‍රය ගැන කොහොමද?"

"ඉකෝන චිත්‍රකාරයාගේ වැඩක්."

"ඒක වෙන්න බැහැ. මගේ මුත්තාත්, මීමුත්තාත් මේ ඉකෝනයට තමයි වැන්දේ."

"නිකන් මහ පූජකයා නුඹේ මීමුත්තට ඉස්සෙල්ලා නෙව ජීවත් වුණේ."

එවිට මහල්ලා කළමනාකරුගේ මුහුණට එය ළං කරමින් ඔහුට ඒත්තු ගැන්වීමට තැත් කරයි. "බලාපන් කොච්චර ලස්සනද කියල. මේක ඉකෝනයක්ද? මේක චිත්‍රයක් නිකම් චිත්‍ර ශිල්ප කලාවට අයිති දෙයක්. මේ වගේ චිත්‍රයකට අධ්‍යාත්මය නැහැ. මම ඇත්ත කියනවා නොවේද? මම යුක්ති ගරුක මහල්ලෙක්. මට ඉක්මනින්ම දෙවියන් ළඟට යන්න වෙලයි තියෙන්නේ. හිතට හොරා බොරු කීමට මට වුවමනාවක් නැහැ."

ඔහු මලුවට යන්නේ මහලු දුබලකමින් පෙළෙමිනි. ඔහුගේ තක්සේරුව ගණන් නොගත් නිසා ඔහු අමනාපයක් දක්වයි. කළමනාකරුවා ඉකෝනය ගෙනා මිනිහාට රූබල්

කීපයක් දෙයි. ඒ මිනිහා ප්‍රයොතර් වසිලවිච්ට හිස නමා ආචාර කොට පිටවී යයි. තේ පිළියෙල කිරීමට උතුරන වතුර ගෙනෙනු පිණිස ඔවුහු මා අවන්හලට යවති. වතුර කේතලය ගෙනෙන මම ප්‍රීතියෙන් සිටින ප්‍රයොතර් වසිල්යෙවිච් දකිමි. ඔහු මිල දී ගත් ඉකෝනය බලමින් කළමනාකරුට උගන්වයි.

"බලාපන් මේ ඉකෝනය බොහොම උසස් නිර්මාණයක්. දෙවියන්ට බයෙන් ඇඳලා තියෙන්නේ. මිනිස් අධ්‍යාත්මය එහි ගැබ්වෙලා තියෙනවා."

"නිර්මාණය කාගෙද?" කළමනාකරුවා අසන්නේ ප්‍රීතියෙන් උඩ පනිමිනි.

"ඒක දැන ගැනීමට නුඹ ළපටි වැඩියි."

"දන්න මිනිස්සු කීයක් දේවිද?"

ඒක මට කියන්න බැහැ. අපි තවත් කාට හරි පෙන්වමු."

"අනේ. ප්‍රයොතර් වසිල්යෙවිච්..."

"මම මේක විකුණුවොත් නුඹට රූබල් පනහක් දෙනවා. ඉතිරි හරිය මටයි." ඔහු කළමනාකරුට පවසයි.

"අනේ..."

"නුඹ අනේ කියන්න එපා..."

ඔවුන් දෙදෙනා එකිනෙකා දෙස පල්හොරුන් ලෙසත් බලමින් හෙට්ටු කරන්නේ තේ පානය කරමිනි. කළමනාකරු ප්‍රයොතර් වසිල්යෙවිච්ගේ ග්‍රහණයට හසුවී ඇති බැව් පැහැදිලිය. මහල්ලා ගිය විගස කළමනාකරු මට මෙසේ කියයි:

"නුඹ බලාගෙන මේ ගැන අයිතිකාරියට විතරක් කියන්න එපා."

ඉකෝනය අලෙවි කිරීමේ කොන්දේසිවලට දෙදෙනා එකඟ වූ පසුව, කළමනාකරුවා තොරතුරු විමසයි.

"ප්‍රයොතර් වසිලවිච්, නගරයේ තොරතුරු මොනවාද?"

කහ පැහැති අතින් යටි රැවුළ අතගා, තෙල් සහිත දෙතොල් විවෘත කොට, මහලු ප්‍රයොතර් වසීලෙවිච් පොහොසත් වෙළෙන්දන්ගේ ජීවිතය ගැන විස්තර කරයි. ඔවුන්ගේ වෙළඳ ජය ගැනත්, බේබදු විනෝදකාමී ජීවිත ගැනත්, ලෙඩ රෝග සහ විවාහ මඟුල් ගැනත්, ස්ත්‍රීන් හා පුරුෂයන් එකිනෙකාට හොරෙන් ගෙන යන ලිංගික

සබඳතාවන් ගැනත්, ඔහු නොයෙක් දේ කියයි. ඒ කතා ඔහු මවා පාන්නේ දක්ෂ කුස්සි අම්මා කෙනෙක් ඉක්මනට වෙල්ලවැහුම් පිසින ආකාරයටය. කතාව අතරින් පතර ඔහු එය සිනාවෙන් සරසාලයි. කළමනාකරුගේ වටකුරු මුහුණ ඊර්ෂ්‍යාවෙන් සහ ප්‍රබෝධයකින් රත් පැහැගනී. ඔහුගේ දෙනෙත්වල බලාපොරොත්තු බවේ සිහිනයෙකි. සුසුම්ලමින් ඔහු මෙසේ පවසයි:

"ඔන්න මිනිස්සු ජීවත්වන හැටි! ඒ වුණාට මම..."

"එක එකාට, වෙන වෙනම ඉරණමක්. සමහරුන්ගේ ඉරණම දේවදූතයන් නිර්මාණ කරන පුංචි රිදී මිටිවලින්. සමහරුන්ගේ ඉරණම යකා හදන මොට්ට පොරොවකින්." මහල්ලා බැරැඩි හඬින් විස්තර කරයි.

ශක්තිමත් කෙට්ටු මහල්ලා මුළු මහත් නගර ජීවිතයත්, වෙළෙන්දන්ගේ, නිලධාරීන්ගේ, පූජකයන්ගේ, පහත් මධ්‍යම පන්තිකයන්ගේ සියලු රහස් ආදිය හැම දෙයක්මත් දනී. ගොදුරු ගසා කන පක්ෂියකු මෙන් ඔහුගේ නෙත් තියුණුය. ඔහු වෘකයකුගේ සහ හිවලකුගේ මිශ්‍රණයකි. ඔහු කෝප කරවීමට මට වුවමනා වුවද, ඔහු මා දෙස බලන්නේ ඈත සිට මීදුමක් අතරින් බලන්නාක් මෙනි. ඔහු පතුලක් නැති පුහුබවෙකින් වටවී සිටින සැටියෙකි. මට දැනෙන්නේ ඔහු ළඟට ගියොත් මා පතුලක් නැති එම අගාධයට ඇද වැටීමට ඉඩ ඇති බවයි. නැවේ ගිනි උදුන්කරු යාකොව් ෂුමව්ට මොහුගේ කිසිම නෑකමක් තිබෙන සැටියක් මට දැනෙයි.

කළමනාකරු මහල්ලාගේ ඇස් ඉදිරිපිට ඔහුගේ බුද්ධිය නිසා ප්‍රබෝධයකින් පසුවුණද, ඔහුටද මට මෙන් මහල්ලාව කෝප කරවීමට වුවමනාවක් ඇති බැව් මට සිතෙයි.

"නුඹ මිනිසුන්ව මුළා කරනවා නොවැ." ඔහු හිටි හැටියේම මහල්ලාගේ මුහුණටම කියයි.

මහල්ලා උදාසීන ලෙස සිනා පාමින් පිළිතුරු දෙයි.

"රැවටිලි නැත්තේ දෙවියන් වහන්සේ ළඟ විතරයි. අපි ජීවත්වන්නේ මෝඩයන් අතරයි. මෝඩයකුව රවටන්නේ නැති නම් ඔහුගෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද?"

කළමනාකරුවා උණුසුම් ලෙස වාද කළේය.

"ගමයන් හැම එකෙකුම මෝඩයන් නොවෙයි! ලොකු පෝසත් වෙළෙන්දන් පවා ඇතිවන්නේ ගමයන්ගෙන් නේද!"

"අපි දැන් කතා කරන්නේ වෙළෙන්දන් ගැන නොවෙයි. මෝඩයා, කපටියා වගේ ජීවත් වන්නේ නැහැ. මෝඩයා සුද්දවන්තයා, එයාගෙ මොළය නිදි."

මහල්ලා වඩාත් මන්දෝත්සාහී ලෙස කතා කරන නිසා එය කුප්පාලීමට හේතු වෙයි. මට හිතෙන්නේ මේ මහල්ලා මඩ ගොහොරු බිමකින් වට වූ තණ පිටියක සිටින බවකි. ඔහුව කුප්පාලීම නොකළ හැක්කකි. ඔහුව කුපිත කළ නොහැකි අතර, ඔහු ගැඹුරු ලෙස සැඟවීමෙහි සමත්ය.

එහෙත්, සමහරදාට මහල්ලා මා සමඟ කුලුපග වීමට තැත් කරයි. ඔහු යටි රැවුළ දෙස බලමින් යම්තමින් සිනාවෙමින්, මගෙන් විමසයි.

"නුඹ කියවන ප්‍රංශ කතාකාරයාගේ නම මොකක්ද, පොනොස්ද[1]?"

නම් මෙලෙස විකෘති අරුත්වලට හරවා ගැනීම මගේ අති මහත් කෝපයට හේතුවකි. එහෙත්, මගේ කෝපය මැඩ ගනිමින් මම පිළිතුරු දෙමි.

"පොන්සොන් දෙ.තෙරයිල්"

"තෙර්යායෙත් (නැති වුණේ) කොහිද?"

"සීයා මෝඩයකු වෙන්න එපා. පුංචි ළමයකු නොවෙයි."

"ඇත්ත, මම පුංචි එකෙක් නොවෙයි. නුඹ දැන් කියවන්නෙ මොනවාද?"

"යෙප්රේම් සීරින්ගේ පොතක්."

"වැඩියෙන් හොඳට ලියන්නෙ කවුද? ලෞකික අයද, ආගමික අයද?"

මම නිහඬ වෙමි.

"ලෞකික අය වැඩියෙන් ලියන්නෙ මොනවා ගැනද?" ඔහු මා අත නොහරියි.

"ජීවිතයේ සිදු වන හැම දෙයක්ම ගැන."

"එහෙනම් බල්ලන් ගැන. අස්වයන් ගැන. උන්ට තමා සිද්ධ වෙන්නෙ."

---

1 පොනොස් යනු බඩයාමය - අනුවාදක.

කළමනාකරුවා බක බක ගාමින් හිනාවෙන අතර, මම කෝප වීමි. මට එය උහුලාගත නොහැකිය. එහෙත්, මා පිටවීමට තැත් කළ විට, කළමනාකරුවා මා නවත්වයි.

"යන්නෙ කොහෙද?"

මහල්ලා මා පිරික්සුමට භාජනය කරයි.

"අකුරු දන්න කොල්ලා, මම නුඹට තේරවිල්ලක් කියන්නම්. නුඹ තෝරාපන්. ගෑනු පන්සීයකුයි, පිරිමි පන්සීයකුයි හෙලුවැල්ලෙන් ඉන්නවා. ඒ ගොල්ල අතර ආදම් සහ ඒව ඉන්නවා. නුඹ ආදම් සහ ඒවා සොයා ගන්නේ කොහොමද?"

ඔහු බොහෝ වේලාවක් මගෙන් අතුරු ප්‍රශ්න අසා අනතුරුව ඉමහත් ජයග්‍රාහී ලීලාවෙන් මෙසේ පවසයි:

"මෝඩපැටියෝ, ආදම් සහ ඒව මවු කුසෙන් උපන්නේ නැහැ නෙව. ඉතින් ඒ නිසා උන් දෙන්නාට බුරිය නැහැ!"

මහල්ලා මෙවැනි තේරවිලි ඉතා විශාල සංඛ්‍යාවක් දනී. එවැනි තේරවිලිවලින් ඔහු මට වධ දෙයි.

වෙළඳ හලේ මුල් දවස්වලදී මම කියැවූ පොත්වලින් කතා කීපයක් කළමනාකරුවාට කිව්වෙමි. දැන් ඒ කතා මට විරුද්ධව ඔවුහු යොදවා ගත්හ. ඔහු ඒවා ප්‍රයෝතර් වසීලෙවිච්ට කිව්වේ වුවමනාවෙන්ම විකෘති කොට කුණු තවරමිනි. එවැනි ලජ්ජා විරහිත ප්‍රශ්නවලින් මහල්ලා ඔහුට දක්ෂ ලෙස ආධාර කළේය. යෙව්ගේනියා ග්‍රාන්ඩේ, ලුද්මීලා, හතරවැනි හෙන්රි යන චරිත ඔවුහු කැත වචනවලින් අසභ්‍ය ලෙස විකෘති කළහ.

ඔවුන් මෙලෙස කැත කතා කියන්නේ ඔවුන් දුෂ්ට නිසා නොව, තද පාළු ගතියකින් පෙළෙන නිසාය. එහෙත්, එයින් මට පහසුවක් නොවීය. මෙලෙස කුණු කතා මවා පා ඔවුන් එහි එරුණේ කුණු ගොඩක ලගින උෆරන් මෙනි. සුන්දර, ඔවුනට අයත් නොවන, ඔවුනට තේරුම් ගත නොහැකි හාස්‍යජනක යැයි ඔවුනට සිතෙන දේ ඔවුන් කැත කළේ නහයෙන් හඬ නගමින් දගලන උෆරන් මෙනි.

වෙළෙඳ නිවාස පිහිටි පෙදෙසේ මිනිසුන්ද, වෙළෙඳුන් සහ කළමනාකරුවන්ද ජීවත්වුණේ පුදුමාකාර ලෙසිනි. එය ළාමක මෝඩ වැඩවලින් පිරී පැවැතිණි. එහෙත්,

හැමදාම එය දුෂ්ට විනෝදකාමී වැඩවලින් යුක්ත විය. මිනිහෙක් විත් යම් කිසි තැනකට යන්නේ කෙසේදැයි ඇසුවොත්, වුවමනාවෙන්ම වැරැදි මඟක් පෙන්වීම මෙහි සිටිනවුන්ගේ සිරිතක් විය. එය කොතරම් දුරට වැඩුණේද යත්, එසේ වැරැදි මාර්ග කියා මිනිසුන් අමාරුවේ දැමීම තව දුරටත් විනෝදයක් නොවීය. ලොකු ඌරුමීයන් දෙදෙනකු අල්ලා උන්ගේ වලිග දෙක එකට බැඳ ගැට ගසා උන් එළවයි. එවිට උන් දෙන්නා එක්, එක් පැත්තකට අදිමින් පොරකමින්, එකිනෙකා සපා කයි. සමහර දාට එවැනි මීයකුට භූමිතෙල් වත්කොට ඌට ගිනි තබයි. බල්ලකු ගේ වලිගයට බිඳුණු යකඩ භාජනයක් බඳියි. බල්ලා පණ බියෙන් උඩු බුරලමින් හිස ලූ ලූ අත දුවයි. මිනිස්සු එය බලා සිනාසෙති.

මෙවැනි සහ තවත් විනෝද ක්‍රීඩා බොහෝ විය. මේ වෙළෙඳ පෙදෙසේ මිනිසුන් විශේෂයෙන්ම ගම්මුන් ජීවත්වන්නේ විනෝද ක්‍රීඩා පමණක් සඳහා යැයි කෙනෙකුට සිතෙයි. මිනිහකු සිනාවට ලක් කිරීම, ඔහු වේදනාවට පත් කිරීම, ඔහු අමාරුවේ දැමීම ඔවුන්ට ආවේණික ලක්ෂණයන් විය. මිනිසුන් එකිනෙකා අවඥාවට ලක්කිරීම සඳහා ඔවුන් ගන්නා දැඩි පරිශ්‍රමය ගැන මා කියැවූ පොත්වල ස්ථිර ලෙසින්ම නිහඬවීම මට පුදුමයක් විය.

මෙහි මිනිසුන්ගේ එක් විනෝදයක් මගේ අමනාපය සහ පිළිකුල විශේෂයෙන්ම වැඩි කළේය.

අපේ වෙළඳ හලට පහළ තට්ටුවේ ලොම් සහ වාලෙන්කි නමැති හිම සපත්තු විකුණන කඩයක් විය. එහි වෙළඳ සේවකයා ඔහුගේ බඩජහරිකම නිසා මුළුමහත් නිෂ්නී බසාර් කඩපොළම මවිතයට පත් කළේය. කඩහිමියා තම සේවකයාගේ මෙම මජර ගතිය නිසා පුරසාරම් දොඩවන්නට වූයේ, බල්ලකුගේ නපුරු ගතිය නිසා හෝ අශ්වයකුගේ ශක්තිය නිසා හෝ උදම් අනන්නාක් මෙනි. නිතරම පාහේ ඔහු තම අසල්වැසියන් සමඟ ඔට්ටු ඇල්ලීමට ඉදිරිපත් වෙමින් අභියෝග කරයි.

"රූබල් දහයක් ඔට්ටු ඇල්ලීමට කැමැති කවුද? පැය දෙකක් ඇතුළතදී මීෂ්කා බේකන් රාත්තල් දහයක් කාලා

දමාවි!"

මීෂ්කා එවැනි දෙයක් කිරීමෙහි සමත් එකෙකු බව දත් ඔවුහු මෙසේ පැවසූහ.

"ඔට්ටු අල්ලන්න ඕන නැහැ. බේකන් අපි සල්ලිවලට ගනිමු. මීෂ්කා ඔහේ කාපුදෙන්. අපි බලමු."

"කටු නැතුව මස් විතරක් දෙනවා!"

කඩහිමියෝ අල්ප වශයෙන් හා උදාසීන ලෙස තර්ක කළහ. අඳුරු ගබඩාවෙහි සිට කෙට්ටු, යටි රැවුළක් රහිත, හකු ඇට ඉදිරියට නෙරා ගිය ගැටවරයෙක් ආවේය. ඔහු දිගැති කබායක් ඇඳ සිටි අතර, ලොම් සහිත රතු පැහැති බඳපටියක් ඉණ වටා බැඳ සිටියේය. ඔහු සිය කුඩා හිසෙන් කර්තුස් තොප්පිය කුළුටි ලෙස ගලවා කඩහිමියාගේ දම් පැහැති මුහුණ දෙස ඔහුගේ ගැඹුරු නෙත්වලින් අපහැදිලි බැල්මක් නිහඬ ලෙස හෙළයි. කඩ හිමියාගේ දෙකොපුල් සහ නිකට පුරා වැඩී ඇති රැවුළු ගස් ඝනය, ගොරහැඩිය.

"බට්මාන් බේකන් කනවද?"

"කොපමණ වේලාවකින්ද?" මීෂ්කා සිහින් හඬින් ප්‍රශ්න කරයි.

"පැය දෙකකින්!"

"අමාරුයි. ස"

"මොන අමාරුවක්ද බාං!"

"බීර බෝතල දෙකකුත් දෙනවා නම්!"

"හොඳයි පටන් ගනින්" යැයි පවසන කඩහිමියා පුරසාරම් දොඩවයි. "නුඹලා හිතන්න එපා මූ හිස්බඩ කියලා. මූ පාන් රාත්තල් දෙකක් උදේට කෑවා. දවාලට සාමාන්‍යයෙන් කන විදිහට කාලා ඉන්නේ."

බේකන් ගෙනාවෙන් ප්‍රේක්ෂකයෝ රැස්වූහ. ඔවුන් හැම දෙනාම ලොකු වෙළෙන්දන්ය. ඔවුහු බරැති හිම කබා පොරවාගෙන සිටින නිසා බරැති යකඩයකට සමාන වූහ. උන්ගේ බඩගෙඩි විශාලය. නෙත් කුඩාය. තෙල් හා මේදස් පරුවතවලට සමාන ඔවුන්ගේ අනිවාර්ය පාළු ගතිය නිදිබර දුමාරයක් මෙනි.

ප්‍රේක්ෂකයෝ දෑත් බැඳගෙන, ආහාර ගිල දමන මජරයා වටා වළල්ලක් සේ සිට ගනිති. ඔහු එක අතකින් පිහියක්ද

අනික් අතින් පරළු පාන් ගෙඩියකින් විශාල කොටසක්ද ගෙන සිටී. ඔහු ඉමහත් භක්තියෙන් කුරුසියේ ලකුණ ඇඳගෙන ලොම් ගොඩක් මත වාඩි වෙයි. බේකන් ගොඩ ඔහු අසලින් තබාගෙන ඒ දෙස බලයි.

ලොකු මස් කෑල්ලක් සහ සිහින් පාන් කෑල්ලක් කපා ගෙන, ඔහු ඒ දෙකම කටේ ඔබා ගනී. එවිට ඔහුගේ දෙතොල් සැලෙයි. බල්ලකු සේ දිව දිගු කොට තොල් ලෙවකත්ම ඔහුගේ තියුණු දසන් පෙනෙයි. ඔහු මස් කෑල්ල සපන්නේද බල්ලකු මෙන් හොම්බ නටවමිනි.

"පටන් ගත්තා!"

"ඔර්ලෝසුව බලාපල්ලා!"

මජරයා දෙස සියලු දෙනාගේම නෙත් යොමුවී තිබිණි. ඔහුගේ කටේ පහළ හනුව දෙසත්, දෙකන් අසල ඇති හකු ඇට දෙසත්, ඔවුහු බැලූහ. ඔහු ආහාර සපන විට ඔහුගේ තියුණු නිකට උස් පහත් විය. ඔහුගේ චින්තනයත් සමඟ එය උදාසීන ලෙස සම්බන්ධ වී තිබෙන සැටියක් පෙනිණි.

"වලසා වගේ වලස් විදියට වැඩේ කරනවා."

"වලසා කෑම කන හැටි නුඹ දැකලා තියෙනවද?"

"නුඹ හිතුවේ මම කැලෑවේ වාසය කරනවා කියලද? වලසා වගේ කනවා කියලා කට කතාවක් තියෙනවා."

"උරා වගේ කනවා කියලා තමයි සමහරුන් කියන්නේ"

"ඌරා, ඌරුමස් කන්නෙ නැහැ."

සමහරු අකැමැත්තෙන් සිනහ සෙති. කරුණු දන්නා මිනිහෙක් සංශෝධනයක් ඉදිරිපත් කරයි.

"ඌරා හැම දෙයක්ම කනවා. උගේ පැටවුන්වයි, නංගිලාවයි."

ආහාර ගිලින මජරයාගේ මුහුණ ක්‍රමයෙන් දම් පාටට හැරෙයි. දෙකන් නිල් රතු පැහැයට හුරුය. ගැඹුරට පිහිටි දෙනෙත් දොට්ට පැනීමට මෙනි. ඔහු හුස්ම ගන්නේ ආයාසයකිනි. එසේවතුදු, ඔහුගේ නිකට පෙර මෙන්ම, ක්‍රමානුකූලව චලනය වෙයි.

"මිහයිලො කාපන්, වෙලාවත් යනවා!" කෙනෙක් ඔහු දිරි ගන්වයි. ඔහු ඉතිරි වූ මස්ගොඩ දෙස බලන්නේ නොසන්සුන් ලෙසිනි. බීර උගුරක් බොන ඔහු, යළිත්

ආහාර සපයි. ප්‍රේක්ෂකයෝ ප්‍රබෝධයට පත්වෙති. මීෂාගේ හාම්පුතාගේ අත ඇති ඔර්ලෝසුව දෙස බලති. සමහරු එකිනෙකා දෙස බලමින් කල් ඇතිව දැනුම් දෙති.

"ඔය මිහිහා ඔර්ලෝසුව ආපස්සට කරකවන්නට පුළුවනි. එයාගේ ඔර්ලෝසුව ගනිල්ලා!"

"මීෂ්කා දිහා බලාගෙන හිටපල්ලා. ඌ කබා අත් අස්සේ මස් කුට්ටි හංගන්නට පුළුවනි!"

"ඌට වෙලාවට ඉස්සෙල්ලා කාලා ඉවර කරන්න බැහැ!"

එවිට මීෂ්කාගේ හාම්පුතා උද්දාමයෙන් කෑ ගසයි.

"රූබල් විසිපහක් ඔට්ටුයි! මීෂ්කා මාව පාවා දෙන්ට එපා!"

ප්‍රේක්ෂකයෝ හාම්පුතාගේ කතාව අනුමත කළද, එකෙක්වත් ඔට්ටු ඇල්ලීමට ඉදිරිපත් නොවෙති.

ඒ අතර, මීෂ්කා නොනවත්වා කෑම සපයි. දැන් ඔහුගේ මුහුණත් තැම්බූ ඌරු ගාතයකට සමානය. තියුණු නහයෙන් දුක් ගැනවිල්ලක් බඳු හඬක් නිකුත් වෙයි. ඔහු දෙස බැලීම පවා බිය ජනකය. දැන්, දැන් ඔහු කෑගසා අඬනු ඇතැයි සිතෙයි.

"මට සමාවෙයල්ලා!"

එසේත් නැතිනම් උගුර තෙක් මස් කුට්ටි පිරුණු පසු ඔහු ප්‍රේක්ෂකයන්ගේ දෙපා මුල වැටී මිය යනු ඇතැයි මට සිතේ.

අවසානයේදී මීෂ්කා බේකන් රාත්තල් දහයම කා වෙරිමත් වූ දෙනෙත් ඔරවා ගෙන විඩාපත් හඬින් ඉල්ලා සිටී.

"බීමට යමක් දීපල්ලා."

ඔහුගේ හාම්පුතා ඔර්ලෝසුව දෙස බලා බැණ වදියි.

"නීචයා, විනාඩි හතරකින් පමා වුණා..."

ප්‍රේක්ෂකයෝ කඩහිමියා කුපිත කරවති.

"චාඃ හරි කනගාටුයි, ඔට්ටු ඇල්ලුවා නම් දිනාගන්ට තිබුණා!"

"කොහොම වුණත් මූ නම් යකෙක්!"

"මූව සර්කස් එකට ගෙනියන්න ඕන."

"දෙවියන් වහන්සේ මිනිහකු විකෘති කරල තියන හැටි

පේනවද?"

"ඉතින් අපි තේ බොන්න යමුද?"

ඔවුහු පාරු මෙන් පැද්දෙමින් අවන්හල දෙසට යති.

මේ තරබාරු, මොට්ට මිනිසුන් අවාසනාවන්ත ගැටවරයා වටේ රැස්වූයේ මන්ද, ඔහුගේ ව්‍යාධිමය ආහාර රුචිය ඔවුන්ගේ විනෝදයට හේතු වූයේ මන්ද? යන්න දැන ගැනීමට මා කැමැතිය.

සත්ත්ව ලොම් සහ එළුවන්ගේ මවිල්වලින් සෑදූ කඹ දරුණු කොට ගොඩගසා ඇති, වාලෙන්කි හිම සපත්තු සහ එවැනි සම් භාණ්ඩ ගොඩගසා ඇති පටු ගබඩාව ඇදිරිය, මූසලය, ගඩොල් කණුවලින් එය වෙන්කර ඇත්තේ ජනේලවලිනි. ගොරහැඩි ලෙස මහත ඒ කණු කාලය විසින් ජරපත් කරනු ලැබ ඇත. මහ පාරේ දූලි සහ කුණු එය කා දමයි. සිතින් දහස් වාරයෙකින් කොට ඇති සිදුරු සහ ගඩොල් මගේ මනැසෙහි විකෘති රූප මවා පෑවේය.

පනේල ඔස්සේ මඟියෝ සෙමින්, සෙමින් ගාටති. මහ මඟ දිගේ බඩු පිරුණු හිම යානා ඇදගෙන අස්රියකරුවෝ සෙමින් ගමන් කළෝය. මහපාරට එහා රතුවන් චතුරශ්‍රය මැද දෙමහල් වෙළෙඳහලෙකි. එම චතුරශ්‍රයේ වට්ටි, පෙට්ටි පිදුරු පොඩි කොට ගුළිකළ කඩදාසි ඒවා වසා ඇති කුණු සහිත හිම තට්ටු පිරිලාය.

මේ හැම දෙයක්ම සමඟ මිනිසුන් හා අශ්වයන් ගමන් ගත්තද, බැලූ බැල්මට එම දර්ශනය අජංගමශීලී, කුසීත ලෙස එකම තැනෙක කරකැවෙන දේ ලෙසත්, ඒවා අදිසි යදම්වලින් බැඳ තිබෙන සැටිත් පෙනේ. හිටිහැටියේම ඒ ජීවිතය කුමක්දැයි හඟින්නට පිළිවන. එහි හඬෙක් නැති තරම්ය. ගොළුවත දක්වා වූ නිහඬතාවකි. එය වීදිය ඔස්සේ ඇද්දෙන හිම යානයේ හඬක් පිට කරයි. කඩවල දොර ඇරෙන වැසෙන හඬ ඇසේ. වෙළෙන්දෝ කෑගසති. එසේ වුවද, ඔවුන්ගේ කෑගැසීමෙහි සතුටක් නැත. ඒකතානමය ලෙස ඔවුහු අකැමැත්තෙන් කෑගසති. එයට ඉක්මනින් පුරුදු වන්නෙක් එය නිසා කලබල නොවෙයි.

දේවස්ථානයේ සීනුව අවමංගල හඬක් නංවයි. ඒ මූසල

සණ්ටාර නාදය හැමදාම කන්වල තැන්පත් වී ඇත. උදේ සිට රෑ වනතුරු කඩපොළට උඩින් පැතිර යන එම රාවය හැඟීම් හා චින්තනවලට පණ පොවයි. සියලු හැඟීම්වල තඹවන් මණ්ඩි මෙන් එය බැඳී ඇත.

හැම තැනින්ම ශීතල, මූසල පාළු බවක් නැඟ එයි. කිලිටි හිමෙන් වැසී ඇති මහ පොළොවෙන්ද, පියසී මත ගොඩ ගැසී ඇති අළුවන් හිම ගොඩවලින්ද, රතුවන් ගඩොල් ගොඩනැගිලිවලින්ද එය නැඟ එයි. දුම් බට ඔස්සේ අළුවන් දුම්වලා මෙන්ද, නො උස්, හිස් අහසට නඟින්නේත් පාළු කාන්සියය. අශ්වයන් විසින් දුම් දමනු ලබන්නේත්, මිනිසුන් හුස්ම ගන්නේත් පාළු බව විසිනි. මේ පාළු ගතියට විශේෂ වූ ගඳක්ද ඇත. එය බරැති දහදිය ගඳය. මේදස් සහ හණ ඇටවලින් පෙරන 'කනපොල්' තෙල් ගඳය. පුස්කාපු පාන් සහ දුම් ගඳය. මෙම ගඳට හිසක් පවා ඇත. එය ලොමින් කළ හිසට හිරවන තොප්පියක් මෙනි. පපුව කිතිකවන පාළු බව නමැති ගඳ කෙනෙකු මත් කරවයි. දෙනෙත් වසා ගැනීමට තරම් සිතක් ඇති වේ. බලාපොරොත්තු විරහිත ලෙස කෑගැසීමටත් කොහේ නමුදු දිව ගොස් ඉදිරියට හමුවන ප්‍රථම තාප්පයේම හිස ගසා ගැනීමටත් සිත් දෙනු ලබන්නේ මේ මූසල පාළු ගතිය විසිනි.

ඉතා හොඳින් පෝෂණය වූ මේ වෙළෙඳ මුදලාලිවරුන්ගේ මුහුණ දෙස මම බැලීමි. ඒවා තෙල් සහිත කැටි ලේවලින් පිම්බිලාය. ඉතා දැඩි හිම තුෂාරයට අසුවී ඇති ඔවුන්ගේ මූණු නින්ද මෙන් අවලය. වියළි පස්ගොඩට ඇද දැමූ මාළුවන් මෙන් මිනිස්සු කට පළල් කොට හැර නිතර ඇනුම් හරිති.

හිම කාලයට වෙළඳාම සරු නැත. ගිම්හානයේදී මෙන් ඔවුන්ගේ ඇස්වලට එක්තරා දීප්තියක් ලබා දෙන, සුපරීක්ෂාකාරී, ගොදුරු ගසා කන, විලෝපකාරී පැහැය හිම කාලයේදී දක්නට නැත. බරැති ලොකු හිම කබා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය සීමා කොට ඔවුන් පොළොවට බැඳ තබයි. මුදලාලිලා කුසීත ලෙස කතාබහ කළද, කෝපවූ විට තර්ක කරති. ඔවුන් එය වුවමනාවෙන්ම එසේ කරන්නේ තමන් ජීවත්වන බව එකිනෙකාට පෙන්වීමට

බව මගේ අදහසය.

පාළු ගතිය සහ කාන්සිය ඔවුන් තළා පෙළා මරා දමන සැටි මට නම් ඉතා පැහැදිලිය. මෙම පාළු ගතිය ඇතිකරන හැම දෙයක්ම ගිලගැනීමේ ගුණයට විරුද්ධව අසාර්ථක ලෙස සටන් කිරීම නිසා මිනිසුන් ක්‍රූර සහ අමන විනෝදවලට පෙලඹෙන බව එයට හේතු වශයෙන් දැක්විය හැකිය.

සමහරදාට මම ප්‍රොතර් වසිල්යෙවිච් සමඟ ඒ ගැන සාකච්ඡා කරමි. ඔහු පොදුවේ මා කෙරෙහි උපහාසාත්මක හා සාවඥ ආකල්පයක් දැරුවද, මා ඉතා ආසාවෙන් පොත් කියවීම ඔහුගේ ප්‍රසාදයට භාජනය වී ඇත. සමහරදාට ඔහු මට උපදේශාත්මක ලෙසත්, බැරෑරුම් ලෙසත් කතා කරයි.

"ලොකු වෙළෙන්දන් ජීවත්වන හැටි මගේ හිතට අල්ලන්නෙ නැහැ." මම ඔහුට කියමි.

ඔහු සිය දිගැති යටි රැවුළ ඇඟිල්ලක ඔතා ගනිමින් මගෙන් අසයි.

"උන් ජීවත්වන සැටි නුඹ දන්නෙ කොහොමද? නුඹ උන් ළඟට නිතර අමුත්තකු හැටියට යනවද? මේක මහ පාර, තේරුණාද කොල්ලෝ! මහ පාරේ මිනිසුන් ජීවත් වෙන්නෙ නැහැ. මහ පාරේ එක්කෝ වෙළඳාම් කරනවා නැතිනම් ඉක්මනට ගමන් කරනවා විතරයි. ආයෙමත් ගෙදරට යනවා. මහපාරට මිනිස්සු එන්නේ ඇඳ පැලඳගෙන. ඒ හන්දා ඔවුන්ව නිසි පරිදි හඳුනා ගන්න බැහැ. මිනිහෙක් එළිපිට ජීවත්වෙන්නෙ තමාගේ ගෙදර, බිත්ති හතර ඇතුළේ, අන්න ඒ ජීවිතය ගැන නුඹ කිසි දෙයක් දන්නෙ නැහැ!"

"ඒ වුණාට ඒ ගොල්ලන්ගේ අදහස් මෙතනදී හරි, ගෙදරදී හරි එකමයි නේද?"

"අල්ලපු ගෙදර මිනිහගේ අදහස් මොනවද කියල දැනගන්ට පුළුවන් කාටද?" මහල්ලා ගැඹුරු බැරැඩි හඬකින් මගෙන් අසන්නේ දෙනෙත් ගෝලාකාර කර ගනිමිනි. "අදහස් හරියට උකුණෝ වගෙයි. ඒවා කොච්චරද කියල ගණන් කරන්න බැහැයි කියල නාකි මිනිස්සු කියනවා. සමහර විට මිනිහෙක් ගෙදර ඇවිත්

දණින් වැටිලා දෙවියන් ඉදිරියේ අඬා වැලපෙනවා වෙන්ට පුළුවනි. අද ශුද්ධ වූ දවසේදී මා පව් කළාට මට සමා වෙන්න. සමහර විට ඔහුගේ ගෙදර ඔහුට පූජකාරාමයක් විය හැකියි නේද? ඔන්න ඔහොමයි! මකුළුවා උගේ තැන දැනගන්න ඕන. උගේ බර දැනගෙන ඒ අනුව මකුළු දැල වියන්න ඕන."

ඔහු බැරෑරුම් ලෙස කතා කරන විට ඔහුගේ කට හඬ වඩාත් බැරෑඩි වෙයි. එවිට ඔහු වැදගත් රහස් හෙළි කරන්නාක් මෙනි.

"කොල්ලෝ, නුඹ තර්ක කරනවා. නමුත්, නුඹට තර්ක කිරීමට කල් වැඩියි. නුඹේ වයසට නුඹ ජීවත් වෙන්න ඕන මොළෙන් නොවෙයි කන්වලින්, ඇස්වලින්, එහි තේරුම් බලාපන්, අහපන්, ඒ වුණාට නිහඬ වෙයන්. බුද්ධිය ඕන වැඩවලට, අධ්‍යාත්මය ඕන විශ්වාසයට, නුඹ පොත් කියවනවා. ඒක හොඳ දෙයක්. හැම දෙයක්ම පමණට දැන ගත යුතුයි. සමහරු පොත් කියවනවා පිස්සු වැටෙන කල්. තවත් සමහරු අදේවවාදීන් වෙනවා."

ඔහු අමරණීය කෙනෙක් යැයි මට හැඟිණි. ඔහු තවත් මහලු වෙතියි, වෙනස් වෙතියි සිතීම අමාරු විය. ප්‍රසිද්ධ පුද්ගලයන් බවට පත්වුණු වෙළෙන්දන්, පල්හොරුන්, හොර සල්ලි අච්චු ගසන්නන් ගැන කීමට ඔහු බෙහෙවින් ප්‍රිය කළේය. මම මෙවැනි කතා සීයාගෙන්ද අසා ඇත්තෙමි. ප්‍රයොතර් වසිල්යෙවිච්ට වඩා හොඳට සීයා මේ කතා කිව්වේය. එහෙත්, ඒ කතාවල හරය හැමදාම එකක් විය. දෙවියන්ට සහ මිනිසුන්ට විරුද්ධව පාප කර්මයන් මගින් පොහොසත් වීමය. ප්‍රයොතර් වසිල්යෙවිච් මිනිසුන්ට අනුකම්පා නොකළ අතර, දෙවියන් ගැන කතා කළේ සුසුම්ලමින් සහ උණුසුම් හැඟීමෙකිනි. දෙනෙත් සඟවා ගනිමිනි.

"ඉතින් උන් දෙවියන් වහන්සේව රවට්ටනවා. අපේ දෙවියෝ පේ්‍රසු තුමාණෝ ඒවා දැකලා අඬලා මෙහෙම කියනවා. අනේ ජනයනි, දුක් විඳින ජනයනි, නුඹලාගේ පව්වලට මම නුඹලාට නිරය සූදානම් කළා!"

දවසක්දා මම ඔහුට නොබියව මෙසේ පැවසීමි:

"සීයාත් ගම්මුන්ව රවට්ටනවා නේද?"

එහෙත්, ඔහු අමනාප නොවීය.

"මගේ වැඩත් එතරම් ලොකු දෙයක්ද? රූබල් තුනකට නැතිනම් පහකට රවටනවා. ඊට වැඩිය නොවේ."

මා පොතක් කියවන සැටි දුටුවහොත් ඔහු මගෙන් පොත රැගෙන, මා කියැවූ දේ ගැන ඉතා දැඩි ලෙස ප්‍රශ්න කරයි. අනතුරුව අවිශ්වාසයෙන් යුතුව මවිත වෙමින් ඔහු කළමනාකරුට මෙසේ පවසයි:

"ඔන්න බලාපන්, මේ හොරගෙඩියට පොත් තේරුම් ගන්න පුළුවනි!"

ඔහු වුවමනාවෙන් අමතක නොවන සේ මට උගැන්වීය.

"මේ අහපන්, මගේ මේ කතාව නුඹට ප්‍රයෝජනවත් වේවි. කිරිල්ලා දෙදෙනෙක් හිටියා. දෙදෙනාම අගරාජ ගුරුවරු. එක්කෙනෙක් අලෙක්සාන්ද්‍රීහි අගරාජ ගුරු, අනික් එක්කෙනා යෙරුසෙලෙම්හි, අගරාජ ගුරු, පළමුවැන්නා නෙස්තෝරි නමැති දේව විරෝධියාට විරුද්ධව සටන් කළා. දේව මෑණියෝ මිනිස් ප්‍රාණියෙක්. ඉතින් එයාට බැහැ දෙවියන්ව වදන්න. ඉතින් එයා වැදුවේ මිනිහෙකුව. එයාගේ නම තමයි ක්‍රිස්තු ලෝකයා ගලවා ගත් ක්‍රිස්තු. ඒ නිසා දේව මෑණියෝ යැයි කීම වැරැදියි. ක්‍රිස්තු මෑණියෝ කියලා කියන්න ඕන. නුඹට තේරුණද? ඒ තමයි දේව විරෝධී පාෂාණ්ඩ ක්‍රියාව. යෙරුසෙලෙම්හි කිරිල් අගරාජගුරු, ආරි කියන පාෂාණ්ඩයාට විරුද්ධව සටන් කළා."

රුසියානු සාධර්මික නිකායේ ඉතිහාසය ගැන ඔහු කියන කතා මගේ සිත් බෙහෙවින් ඇද ගත්තේය. ඔහු පූජකයකු සේ යටි රැවුළ අතගාමින් පුරසාරම් දෙඩීය.

"ආගම ගැන මගේ දැනීම බොහොම ඉහළයි. මම මොස්කව් නගරයේ ශුද්ධ වූ ත්‍රිත්වයේ පල්ලියට ගියා නීකන්වාදී විෂ සෝර උගතුන්ට, පූජකයන්ට සහ උපාසකයන්ට විරුද්ධව තර්ක කරන්න, කොල්ලෝ, මම මහාචාර්යවරුන් සමඟත් තර්ක කරලා තියෙනවා. එය පූජකයකුට මම කොතරම් කට වචනයෙන් බැටේ දුන්නද, එයාගේ නහයෙන් ලේ ගලන්නට පටන් ගත්තා. ඔන්න ඔහොමයි කෙරුවාව!"

ප්‍රයොතර් වසිලියෙවිච්ගේ කම්මුල රතු වී දෙනෙත් දීප්තියෙන් බැබළිණි.

ප්‍රතිමල්ලවයාගේ නහයෙන් ලේ ගැලීම ඔහු සිතන්නට ඇත්තේ ඔහුගේ ජයග්‍රහණයේ උසස්ම වික්‍රමය ලෙසිනි. ඔහුගේ වික්‍රමය නමැති ඔටුන්නේ ඉතාම අගනා මැණික හැටියටය. ඔහු ඒ ගැන ඉමහත් ප්‍රීතියෙකින් උදම් ඇණිය.

"ඒ පූජකරාල යෝධයෙක් තරම් විශාලයි. ලස්සනයි. මගේ ඉස්සරහ හිටගෙන ඉන්නවා. එයාගෙ නහයෙන් ලේ බින්දු ටක් ටක් ගාලා වැටෙනවා. එයාට එය පේන්නෙ නැහැ. පූජකයාට කේන්ති ඇවිත්, කාන්තාරෙ සිංහයකු වගේ මිනිහා නාදකරනවා. හරියට ඝණ්ටාරයක් වගේ. මම එයාට හෙමින්, එයාගෙ ආත්මෙට, ඉළ ඇට අතරින් ඊතල වගේ වචන විද්දා. පූජකයා හරියට ගිනි උදුනක් වගෙයි. පාෂාණ්ඩයෙකු වගේ කෝපවෙලා පුපුරනවා. ඔන්න ඔහොමයි කෙරුවාවෙ හැටි!"

තවත් තක්සේරු කරන්නෝ නිතර පැමිණියහ. දිගැති කබායට යටින් විශාල බඩක් සහිත, එකැස් කණෙකු වන නිතර කහින පහෝම්, මීයකු මෙන් සිනිඳු, සුරතල් බසින් කතාකරන කඩිසර ලුකියාන් සහ ඔහුත් සමඟ අස්ගොව්චකුට සමාන, විශාල, මූසල, මළගිය එකෙකු සිහිගන්වන මුහුණක් සහ කළුවන් යටි රැවුළක්ද, ප්‍රිය නොවන නමුදු, ලස්සන, එමෙන්ම, අවල නෙත්ද සහිත මිනිහෙක් පැමිණියේය.

ඔවුන් නිතර ආවේ පැරණි පොත්, ඉකෝන චිත්‍ර ඉටිපන්දම් අලවන කණු සහ දීසි වැනි භාණ්ඩ විකිණීමටය. සමහර විට ඔවුහු වොල්ගා නදියෙන් ඔබ්බට වාසය කරන මැහැල්ලක නැතිනම් මහල්ලෙක් සමඟ ආවෝය. වෙළඳ ගනුදෙනු අවසන් කොට ගස් අතුවල ලගින කාක්කන් මෙන් ඔවුහු වෙළඳ බංකුව මත වාඩිවී, පාන් කමින් තේ බොමින් නීකන් පූජකයාගේ නිකායට අයත් මිනිසුන් අනික් එවුන් පන්නා දැමූ සැටි එකිනෙකාට විස්තර කිරීමට ආසා කළහ. එක් තැනෙක පොලීසිය කඩා වැදී යාච්ඤා පොත් උදුරාගත් සැටිත්, තවත් තැනෙක දණ්ඩ නීතියේ 103 වැනි වගන්තිය අනුව යාච්ඤා ගෘහයක් වසාදමා එහි අයිතිකරුට නඩු පැවරූ සැටිත් කියන සැටි මම අසා

ඇත්තෙමි. ඔවුන්ගේ කතාවට නිතරම පාහේ තේමාව වූයේ 103 වැනි වගන්තියය. එසේ වුවද, ඔවුන් ඒ ගැන කතා කළේ ශීත සමයේදී ඉතා දැඩි හිම තුෂාරය මෙන්, වැළැක්විය නොහැකි දෙයක් මෙන් සන්සුන් ලෙසිනි.

පොලීසිය, හෝදිසි කිරීම, හිරගෙදර, නඩු ඇසීම, සයිබීරියාව වැනි වචන ඔවුන්ගේ කතාවලදී නිතර ඇසිණි. ආගමික විශ්වාසය නිසා දුන් වධ හිංසා පිළිබඳ මෙවැනි කතා මගේ හදවත ඇවිළවූයේ ගිනිරත්වූ බිම් අඟුරු කැට මෙනි. ඒ නිසා මේ මහල්ලන් වෙත මා හදවතෙහි අනුකම්පාවක් ඇති විය. තම පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා දැඩි ලෙස ක්‍රියා කරන මිනිසුන්ට ගෞරව කරන ලෙසත්, ආධ්‍යාත්මික ස්ථිරත්වය අගය කරන ලෙසත්, මා කියැවූ පොත් විසින් මට උගන්වන ලදී

මේ ගුරුවරුන්ගේ ජීවිතයේදී මා දුටු නරක දේ මට අමතක විය. මා දුටුවේ ඔවුන්ගේ සන්සුන් දැඩි බව පමණකි. ගුරුවරුන් ඔවුන්ගේ සත්‍යය කෙරෙහි අචල විශ්වාසයක් තබා ඇත. ඔවුන්ගේ එම සත්‍යය සඳහා ඔවුන් ඕනෑම පරිත්‍යාගයක් කිරීමට සූදානම් බවත්, එය මෙම දැඩි බව විසින් වසනු ලැබ ඇති බවත් මට හැඟිණි.

ඊට පසු කලෙක, පොදු ජනතාව සහ බුද්ධිමතුන් අතර පැරණි ලබ්ධියට අයත් වුවත් මා දුටු විට, මා තේරුම් ගත් එක් කරුණක් නම්, ඒ දැඩි බව මිනිසුන්ගේ අවිහිංසාවාදීත්වය ලෙසිනි. ඔවුන් සිටින තැනින් අන් තැනකට යාමට ඔවුනට නොහැකිය. එමෙන්ම, ඔවුන් වෙනත් තැනකට යාමට පවා අකැමැතිය. මන්දයත්, පැරැණි වචන සහ යල්පැන ගිය අරුත්වලට ඔවුන් ඉතා දැඩි ලෙස බැඳී සිටින බැවිනි. ඒ වචන සහ අරුත්වලින් ඔවුහු අන්දමන්ද වී සිටිති. ඔවුන්ගේ අභිප්‍රාය ජංගමශීලී බවෙන් තොරය. අනාගතය දක්වා එය වර්ධනය කළ නොහැකිය. පිටතින් ඇතිවන යම් කිසි පහරක් විසින් ඔවුන් සුපුරුදු තැනින් ඇද දමනු ලැබුවහොත්, ඔවුන් යාන්ත්‍රික ලෙස පහළට ඇද වැටෙන්නේ කඳු මුදුනක සිට පහළට වැටෙන ගල් කැටයක් මෙනි. අතීතය පිළිබඳ මතකය නමැති යල්පැන ගිය සත්‍යයට ඔවුන් බැඳී සිටින්නේ මරණීය බලවේගයකිනි. එය ගම්බද පැරැණි

සුසාන භූමියක් සිහි ගන්වයි. එමෙන්ම, ඔවුහු වධ විඳීමට සහ පැගී සිටීමට ව්‍යාධිමය ආදරයක් දක්වති. එහෙත්, වධ විඳීමේ හැකියාව ඔවුන්ගෙන් උදුරා ගතහොත්, සුවදායක සුළං හමන දවසෙක ගසාගෙන යන වලාකුළු මෙන් ඔවුහු අතුරුදහන් වෙති.

අති මහත් තෘප්තියෙකින් සහ ශ්‍රේෂ්ඨ ස්වයං ආදරයකින් යුතුව වධ විඳීමට සූදානම් ඔවුන්ගේ විශ්වාසය විවාද රහිත ස්ථිර ගුණයකි. එහෙත්, එය බොහෝ කල් ඇඳ පරණ වූ තෙල් සහ කුණු තැවරුණු ඇඳුමක් මෙනි. එනිසා කාලයාගේ ඇවෑමෙන් වන විනාශයට ඔරොත්තු දිය නොහැකිය. අගතිය සහ ආධානග්‍රාහීත්වය නමැති තදබදය සහිත බරැති පිට පොත්තට චින්තනය සහ හැඟීම හුරු පුරුදු වී ඇත. එහි පියාපත් කපා දමා එය විකෘති කොට තිබුණද, එය යහපත් ලෙසත්, සැප පහසු ලෙසත් පවතී.

මෙම විශ්වාසය පරිචිතය අනුව පැවත එන්නකි. අපේ ජීවිතයේ ඉතා කනගාටුදායක සහ නපුරු ප්‍රපංචයකි මෙය. විශ්වාසය නමැති මෙම ක්ෂේත්‍රය ගල්මුවා තාප්පයකට වැටුණු හෙවණැල්ලක් මෙනි. මෙහි හැම දෙයක්ම සෙමින් හා විකෘති ලෙසත්, ඇලිමැළි දුබල ලෙසත් වැඩෙයි. මෙම අන්ධකාර විශ්වාසයෙහි ආදරයේ රැස් ධාරා අල්පය, අමනාපය, කෝපය හා ද්වේෂය වුවමනාවටත් වඩා වැඩිය, මේවා සියල්ල වෛරයත් සමඟ හැමදාම මිතුරුව පවතී. මේ විශ්වාසයේ ආලෝකය දිරාපත්වීමේ දීප්තියට සමානය.

මේවා සියල්ල නිසි පරිදි දැනගැනීම සඳහා බරපතළ වසර බොහොමයක දුක් ගැහැට විඳීමටත්, බොහෝ දේ විඳ දරාගෙන සිතින් බැහැර කිරීමටත් මට සිදුවිය. එසේවතුදු, ජීවිතයේ ගුරුවරුන් මා ප්‍රථම වරට හමුවූ විට, පාළු ගතියෙන් යුත් හෘද සාක්ෂිය රහිත යථාර්ථයෙහි, ඉමහත් ආධ්‍යාත්මික ශක්තියකින් යුත්, ඉතාම හොඳ මිනිසුන් ලෙස ඔවුන් මට පෙනිණි. මේ හැම කෙනෙකුම සිර දඬුවමට භාජනය වී, විවිධ නගරවලට පිටුවහල් කොට, සිරකරුවන් සමඟ විවිධ අවදිවලදී එකට ගමන් කළ අය වූහ. ඔවුහු පරෙස්සමින් ජීවත්වූවෝ, සැඟවී

සිටියෝය.

නීකන් පූජකයාගේ අනුගාමිකයන් ඔවුන්ගේ අධ්‍යාත්මය හිර කරතියි දුක් ගැනවිලි ඉදිරිපත් කරන මේ මහල්ලන් තෘප්තියෙකින් පවා එකිනෙකාට එරෙහිව ක්‍රියා කරන සැටිද මම දැක ඇත්තෙමි.

සුරා පානයෙන් පසු වෙරි වන එකැස් අන්ධයකු වන පහෝමි, කෙනෙකුට සැබැවින්ම පුදුමයට පත්විය හැකි ධාරණ ශක්තිය ගැන උදම් අනයි. භක්තිමත් යුදෙව්වකු ශුද්ධ වූ තාල්මුද් පුස්තකය කට පාඩමින් දන්නාක් මෙන්ම, පහෝමිද සමහර පොත්වල ඕනෑම තැනෙක සිට කට පාඩමින් කීමට සමත්ය. ඔහු පොතක් දිගහැර පිටුවක් පෙරළා එතැන් සිට ඔහු කට පාඩමින් කියන්නේ නාසයෙන් පිටවන මෘදු හඬෙකිනි. ඔහු එවිට බිම බලාගනී. ඔහුගේ ප්‍රකෘති ඇස බියෙන් මෙන් බිම දෙස බලාගත්වනම නැටවෙන්නේ, නැති වූ වටිනා දෙයක් සොයන විටෙක මෙනි. මිෂෙට්ස්කි කුමාරයා විසින් ලියන ලද 'විනෝග්‍රාද් රසීස්කි' නමැති පොතින් ඔහු අනික් පොත්වලට වඩා නිතර පාහේ කොටස් උපුටා කීමෙන් මෙම විජ්ජාව පෙන්වීය. විස්මයජනක නිර්භය මිනිසුන්ගේ ඉමහත් ඉවසීම සහ වධ වේදනා විඳීමේ අභීත ශක්තිය පහොමි ඉතා හොඳින් කට පාඩමින් දැන සිටියේය. එසේවතුදු ඔහුගේ වැරැදි ඇල්ලීමට ප්‍රයොතර් වසිල්යෙව් දරුවේ ඉතා දැඩි ආයාසයෙකි.

"අන්න බොරුවක් කිව්වා! ඒ සිද්ධියට හවුල් වුණේ කිප්රියාන් උම්මත්තක මුනිවරයා නොවෙයි. දෙනීස් බ්‍රහ්මචාරිතුමා." ප්‍රයොතර් වසිල්යෙව් විරුද්ධ වෙයි.

"මොන දෙනීස්ද? දියොනීසි කියලා කියන්න ඕන."

"නුඹ වචන බදාගෙන හරඹ කරන්න එපා!"

"නුඹ මට උගන්වන්න එන්න එපා!"

විනාඩියක් ගතවත්ම. දෙදෙනා කෝපයෙන් පිම්බී එකිනෙකා දෙස රවති.

"බඩජහරියා, ලජ්ජා නැති මිනිහා. ඔන්න නුඹේ බඩේ හැටි."

ඇබකසයෙන් ගණන් කරන විටෙක මෙන් පහෝමි පට පට ගා පිළිතුරු දෙයි.

"නුඹ නාකි මනමාලයා, එළුවා, ගෑනිට ඇලිච්ච වලිගයක් වගේ ඇඹිලයා."

කළමනාකරුවා දෑත් බැඳ ගනිමින් දුෂ්ට තෘප්තියෙකින් යුතුව පැරණි ගරුත්වය රකින මහල්ලන් දෙදෙනා කොල්ලන් සේ උනුන් කොටවයි.

"අන්න එහෙම තවත් හොඳවායින් කියන්න!"

දවසක්දා මහල්ලෝ දෙදෙනා ගුටි කෙළ ගත්හ. ප්යොතර් වසිල්යෙව් බලාපොරොත්තු විරහිත කඩිසර කමකින් යුතුව තම සගයාට කම්මුල් පහර කීපයක් දුන්නෙන්, ඔහු දුවන්නට විය. විඩාපත්ව මුහුණෙන් දහදිය පිසදමා ගත් ඔහු දිව යන සගයාට ඇසෙන සේ බැණ වදින්නට විය.

"බලාපිය මේකේ පව් නුඹට තමයි. ශාපලත් යක්ෂයා, මාව පව් කිරීමට පෙලඹෙව්වා. තෑ විතරක් නොදෝකින්!"

තමාගේ සගයන් දැඩි ලෙස පැරණි ආගම විශ්වාස නොකරන බවත්, 'නිගණ්ඨවාදයට' ඇද වැටෙන බවත්, කියමින් ඔවුනට චෝදනා කිරීමට ප්යොතර් වසිල්යෙව් ආසා කළේය.

"නුඹලා අමාරුවේ දාන්නෙ අලෙක්සාෂ්කා. ඒ මී නාම්බා පාරම්බානවා."

නෙතව්ෂිනා (නිගණ්ඨවාදය) ඔහු කුප්පාලීය, බිය ගැන්වූවාක් මෙනි. එහෙත්, එම උගැන්වීමේ හරය කුමක්ද යන ප්‍රශ්නයට ඔහු පිළිතුරු දුන්නේ එතරම් පැහැදිලි ලෙස නොවේ.

"නෙතව්ෂිනා හෙවත් නිගණ්ඨ වාදය ඉතාම නරක පාෂාණ්ඩ උගැන්වීමයි. එහි ඇත්තේ එකම උගැන්වීමයි. දෙවියන් නැති බව පමණයි. බයිබලය ඇරුණු විට වෙන කිසි දේකට ගරු කරන්නේ නැහැ. බයිබලය ලැබුණේ සරාතව්වල ඉන්න ජර්මන්කාරයන්ගෙන්, ලූතර් ගෙන්, ඔහුගේ නම ගැන මෙහෙම කියන්න පුළුවනි ලූතර්[1], ලූත කියන්නේ රුදුරු කෝපයට, දෙවියන්ටයි හැම දේටමයි කෝපවීම. මුන් ඔක්කොම පට්ටපල් මගෝඩිකාරයෝ. බටහිර හැම දෙයක්ම පාෂාණ්ඩයන්ගේ දේවල්."

---

1 ලූතර් - ජර්මන් නමකි. එහෙත්, ලූත යනු කෝපය හැඟවීමට යොදන රුසියන් වචනයකි. - අනුවාදක

නොණ්ඩි කකුල බිම අනිමින් ඔහු දැඩි ලෙසත්, බැරෑරුම් ලෙසත් කතා කළේය.

"අලුත් පන්නයට ආගම අදහන එවුන්ව තමයි එළවන්ට ඕන. උන්ව ගිනි තියල පුච්චන්න ඕන. අපව නොවෙයි. අපි සදාතනික රුසියානුන්. අපේ ආගම සැබෑ ආගම. නැඟෙනහිර ලබ්ධිය. මුල් බැසපු රුසියානු ආගම අනික් ඒවා සියල්ල බටහිරින් ආපු විකෘති කරපු හිතුවක්කාර වාදය! ජර්මනුන්ගෙන්, ප්‍රංශුවන්ගෙන් මොන යහපතක්ද? එක්දාස් අටසිය දොළහේදී[1] වෙච්ච දේ මතකයි නේද..."

ස්වකීය චින්තනයෙහි ගිලෙන ප්‍යොතර් වසීල්යෙව් ඔහු ඉදිරියෙහි කොල්ලකු වන මා සිටින බව අමතක කරයි. ඔහු මගේ කමිස කර දැඩිකොට ගෙන මා ඔහු වෙතට වරෙක ඇද ගනී, තවත් වරෙක මා ඔහු වෙතින් ඉවතට තල්ලු කරයි. ඔහුගේ කතාව ලස්සනය, නොසන්සුන්ය, උණුසුම්ය. යෞවනය.

"මිනිහාගේ බුද්ධිය වල්මත් වෙන්න පටන් අරගෙන, හරියට කෝපවුණු නපුරු වෘකයා වගේ. යකාට යටවෙලා. දෙවියන් වහන්සේගේ තිළිණය වන මිනිස් ආත්මය දසවධ විඳිනවා. යක්ෂයාගේ ගෝලයනි, තොපි සිතන්නේ මොනවාද? නිගණ්ඨවාදීන්ට උගන්වලා තියෙන ආගමක හැටි. සාතන් දෙවියන් වහන්සේගේ පුතෙක්ලු. ජේසුස් ක්‍රිස්තුගේ අයියාලු. ඔන්න උන්ගේ ආගම! ලොක්කන්ගේ කීම අහන්න එපා, වැඩ කරන්න එපා, ගෑනිවයි, ළමයින්වයි පන්නා දමාපල්ලා කියන දේ උන් උගැන්වූවා. මිනිහාට කිසිම දෙයක් ඕන නැහැ. කිසිම පිළිවෙළක් ඕන නැහැ. මිනිහාට ඕන විදිහට, යක්ෂයා උගන්වන විදිහට ජීවත්වන්න ඕනලු. ඔන්න අලෙක්සාෂ්කා ආපහු ආවා. අනේ, පණුවෝ..."

මෙය සිදුවුණේ කළමනාකරු මා කොහේදෝ යැවූ වේලාවකදීය. නැතිනම් මට වැඩක් බාරදුන් විටෙකදීය. එවිට මම ඒ මහල්ලාගෙන් ඈත් වූයෙමි. එවන් අවස්ථාවලදී ඔහු උඩුමහලේ පටු ආලින්දයේ තනිවී, කතා කරන්නට විය.

---

1 1812 දී නැපෝලියන් රුසියාව ආක්‍රමණය කළේය. - අනුවාදක

"අහෝ පිහාටු රහිත ආත්මයෙනි, පොට්ට බළල් පැටියනි. නුඹලා දිව යන්නේ කා වෙතටද?" ඉනික්බිතිව ඔහු හිස උඩු අතට හරවාගෙන දෑතින් දණහිස් අල්ලා ගෙන, හිම කාලයේ අළුවන් ඇදිරි අහස දෙස බොහෝ වේලාවක් බලාගෙන සිටියේය.

ඔහු වඩාත් වැඩි අවධානයකින් සහ සුරතල් ලෙසකින් මට සලකන්නට වූ අතර, මා පොතක් කියවන සැටි දුටහොත් මගේ උරහිස අතගාමින් උවදෙස් දෙන්නට විය.

"කියවාපන්, පොඩ්ඩෝ, කියවාපන්, පලක් ලැබේවි! නුඹට මොළේ තියෙන පාටයි. වැඩිමල් අයට නො සැලකීම විතරයි නරක. නුඹ වැඩිමල් අයත් සමඟ එකට එක කතා කරනවා. ඔය නරක පුරුද්ද නිසා නුඹට යන්න වෙන්නෙ කොහාටද දන්නවද? පොඩ්ඩෝ නුඹේ ඔය මුරණ්ඩු ගතිය නිසා නුඹට හිරගෙයි ලගින්න සිද්ධ වේවි. නමුත්, එකක් මතක තියාගනින්. පොත් කොච්චර කියුවත්, මොළෙන් කල්පනා කරන්න ඕන! කායික වධ දෙන නිකායකයන්ගේ ලොක්කෙක් හිටියා දනීන කියලා. ඔහු තීරණය කළා පරණ පොත් විතරක් නොවෙයි. අලුත් පොතුත් ඕන නැතෙයි කියල. ඉතින් ඔහු පොත් සියල්ල ගඟට වීසි කළා. ඒකත් මහා මෝඩ වැඩක්, සත්තකින්ම. ඔන්න අලෙක්සාෂා බලු ඔළුවා විකාර කරනවා...."

ඔහු නිතරම ඒ අලෙක්සාෂව සිහි කරන්නට විය. දවසක්දා ඔහු අපේ කඩයට විත්, කනගාටුවෙකින් තැවෙමින් කළමනාකරුවා අමතා මෙසේ පැවැසීය:

"අලෙක්සාන්දර් වසිල්යෙව් නගරයට ඇවිත් තියෙන්නෙ ඊයේ, මම ඔහුව හැම තැනම සෙව්වා, නමුත් හොයා ගන්න බැරිවුණා. මිනිහා හැංගිලා ඉන්නවා. මම මෙහාට වෙලා බලාගෙන ඉන්නම්, නුඹ ගිහිල්ලා බලාපන්..."

කළමනාකරුවා මිතුරු නොවන ලීලාවෙකින් කතා කළේය.

"මම කිසිම කෙනෙකුව දන්නෙ නැහැ."

හිස හරවා මහල්ලා කතා කළේය.

"ඒ එහෙම තමා. නුඹට සියලු මිනිස්සු එක්කෝ ගැනුම්කාරයෝ නැතිනම් විකුණන්නෝ වෙන අය නැහැ. තේ ටිකක් වත් දෙනවකෝ..."

මම විශාල තඹ කේතලයට උතුරන වතුර රැගෙන එන විට, අපේ කඩයට තවත් අමුත්තෝ පැමිණ සිටියහ. ලුකියාන් මහල්ලා ප්‍රීතිමත් ලෙස මඳ සිනා පෑ අතර, දොරට එහා ඇඳිරි මුල්ලේ උණුසුමැති හිම කබායක් සහ උසැති වාලෙන්කි හිම සපත්තු දමාගත් අලුත් මිනිසකු වාඩිවී සිටින සැටි දුටුවෙමි. ඔහුගේ බඳ වටා කොළ පැහැති පටියකි. බැම සඟළ පවා වැසෙන තරමට ඔහු තොප්පියක් දමාගෙන සිටියේය. ඔහුගේ මුහුණ ප්‍රියජනක නොවීය. ඔහු බැලූ බැල්මට නිහඬය. චාම්ය, මේ දැන් රැකියාව අහිමි වී, ඒ නිසා ඉමහත් කනස්සල්ලට පත්වී සිටින කළමනාකරුවකු ඔහු සිහියට නැංවීය.

ප්‍යොතර් වසීල්යෙව් ඒ මිනිහා දෙස නොබලා යමක් දැඩි ලෙසත්, බැරෑරුම් ලෙසත් පැවසීය. එවිට ඒ මිනිහා වෙවුලන දකුණු අතින් තොප්පිය සොලවන්නට විය. ඔහු අත එසවූවේ කුරුසියේ ලකුණු ඇඳ ගන්නට මෙනි, එහෙත්, ඔහු අතින් තොප්පියට සෙමින් තට්ටු කළේය. මෙලෙස ඔහු කීප වරක්ම අත එසවීය. තොප්පිය හිසේ පසු කොටස වැසෙන තෙක් දමන ඔහු යළිත් එය ඉදිරියට ඇද, එයින් බැම සඟළ වැසෙන පරිදි හිස වසා ගත්තේය. ඔහුගේ මේ ගැස්ම සහිත ක්‍රියාව නිසා 'සාක්කුවේ මරණය' නමැති ඉගෝෂ්කා මට සිහිවිය.

"ගඟේ දිය බොර වුණාම නොයෙක් ජාතියේ මඩ කරි දඟලන්නට පටන් ගන්නවා." ප්‍යොතර් වසීල්යෙව් ඇනුම් පදයක් එල්ල කළේය.

කළමනාකරුවකුට සමාන මිනිසා සන්සුන් ලෙස මෙසේ ඇසීය:

"නුඹ ඇනුම් පද එල්ල කළේ මටද?"

"ඉතින් නුඹට තමයි කියල සිතමු...."

එවිට ඒ මිනිහා සන්සුන්ව නමුදු ඉතා ළෙන්ගතු ලෙස ප්‍රශ්නයක් ඇසුවේය.

"එහෙනම් උන්හැහෙ නුඹ ගැන නුඹ හිතන්නෙ කොහොමද?"

"මා ගැන මම දෙවියන්ට වාර්තා කරන්නම්. ඒක මගේ වැඩක්."

"නැහැ. උන්නැහෙ ඒක මගේත් වැඩක්" යැයි අනික්

මිනිසා කිව්වේ උත්සවාකාරී ලෙසත්, ශක්තියකිනුත් යුක්තවය. "සත්‍යයෙන් ඉවතට නුඹ මුහුණ හරවා ගන්න එපා. මානාධික ගතියෙන් නුඹ දෙනෙත් අන්ධ කරගන්න එපා. දෙවියන් සහ මිනිසුන් ඉදිරියේ ඒක මහා පාපයක්."

මේ අලුත් මිනිසා ප්‍රොතර් වසිල්යෙව්ට 'උන්නැහේ' නමින් ආමන්ත්‍රණය කිරීමත්, ඔහුගේ සන්සුන් සහ උත්සවාකාරී කටහඬත් මගේ සිත් ගත්තේය. ඔහු කතා කළේ යහපත් පූජකයන් කතා කරන පරිදිය. " පරමණ්ඩලයේ වැඩ සිටින අපගේ පිතාවෙනි, ඔබගේ නාමය ආරාධිත වේවා!" ඔහු කතා කළේ හිසත්, කඳත් පෙරට නමාගෙන, මුහුණ ඉදිරිපිට දෑත් වනමිනි.

"නුඹ මාව හෙළාදකින්න එපා. පව් කිරීමේදී මම නුඹට වඩා වැඩියෙන් පව් කර නැහැ."

"කේතලයේ වතුර උතුරලා නටනවා. හඬ පිට කරනවා." යැයි ප්‍රොතර් වසිල්යෙව් අවලාද මුඛයෙන් පැවසීය. එහෙත්, අනික් මිනිහා ඔහුගේ කතාව ගණන් නොගෙන තම අදහස් කියා පෑවේ ය.

"ස්ප්‍රිතු සාන්තු වහන්සේගේ උල්පත වඩාත් බොර කරන්නේ කවුද කියන එක දන්නේ දෙවියන් වහන්සේ පමණයි. සමහර විට එය නුඹලාගේ පව් වෙන්නට පුළුවනි. පොත් සහ කඩදාසි වැනි ජනයිනි. මම පොතක්වත්, කඩදාසියක්වත් නොවෙයි. මම වාම් ජීවමාන මිනිහෙක්."

"මම නුඹේ වාම් ගතිය ගැන හොඳට අහලා තියෙනවා."

"නුඹලා තමයි මිනිසුන්ව පටලවා ගන්නේ. නියම චින්තනය බිඳ දමනවා. නුඹලා පොත් ගුරාලා. වංචාකාරයෝ. මගේ මතය ගැන නුඹ කියාපන්!"

"පාෂාණ්ඩයා!" යැයි ප්‍රොතර් වසිල්යෙව් කියත්ම, අනික් මිනිහා අත්ල මුහුණ දෙසට හරවා ගෙන එහි ලියා ඇති යමක් කියවන පරිදි කැලඹීමෙකින් කතා කළේය.

"මිනිසුන්ව එක කඳවුරක ඉඳලා තවත් කඳවුරකට පන්නා දැමීමෙන් ඔවුනට හොඳක් වෙනවයි කියල නුඹලා සිතනවද? එහෙම නොවන බවයි මා කියන්නේ. මිනිසා තමාව ගලවා ගත යුතුයි. දෙවියන් ඉදිරියේ නුඹේ නිවෙස. ගෑනි මොනවටද? මිනිසුන් එකිනෙකාට විරුද්ධව ඇනකොටා ගන්නේ මොනවා නිසාද? ඒවා

සියල්ලෙන් විමුක්තිය ලබා ගන්න ඕන. රත්තරන්, රිදී ආදී සියලු වස්තුවලින් ගැලවෙන්නට ඕන. ඒවා තමයි සියලු පාප කර්මයන්ට මුල. ආත්මය ගලවා ගත හැක්කේ වතු පිටි, කුඹුරුවලින් නොවෙයි. ස්වර්ගයේ තැනිතලාවේ! හැම දෙයක්ම ප්‍රතික්ෂේප කරනු. සියලු යදම්, ලණු පොටවල් බිඳ දමනු. ලෝකයේ සියලු ලෞකික දෙයින් නිදහස් වෙනු. ලෞකික වස්තු සියල්ල අන්ත ක්‍රිස්තුගේ දේවල්. මම යන්නේ කෙළින් පාරේ. මගේ ආත්මය මම දූර්වල කරන්නේ නැහැ. අන්ධකාර ලෝකය මම පිළිගන්නේ නැහැ..."

"එහෙනම් ආහාර, වතුර, ඇඳුම් ඒවා පිළිගන්නවාද? ඒවා ලෞකික දේවල් නොවැ." ප්‍රයොතර් වසීල්යෙව් දුෂ්ට සිතින් ඇසීය.

එහෙත්, ඒ වචන අලෙක්සාන්දර් ගණන් ගත්තේවත් නැත. ඔහුගේ කතාව වඩාත් සිත් ඇදගන්නාසුලු විය. ඔහු සෙමින් කතා කළද තඹවන් නළාවෙකින් පිඹින විටෙක මෙන් ශබ්දයක් පැතිරිණි.

"උන්නැහේ, නුඹට වැඩියෙන් වටින්නේ මොනවාද? දෙවියන් වෙත යාමට ඇත්තේ එක මාර්ගයක් පමණයි. දෙවියන් ඉදිරියේ සෑම දෙයින්ම පවිත්‍රවී නැඟී සිටිනු. ලෞකික බැම්වලින් ආත්මය මුදාහැරපන්. අන්න එවිට නුඹට දෙවියන් ලබාගත හැකියි. දෙවියෝ තනියම, නුඹත් තනියම! අන්න ඒ විදිහට දෙවියන්ට ළං වෙනු! දෙවියන් වෙත ළං වීමට ඇති එකම මාර්ගය එය පමණයි. දෙමාපියන් අතහැර දා ආත්මය ගලවා ගනින් යැයි කියා තිබෙනවා. නුඹව පරීක්ෂාවට හසු කිරීමට නුඹේ ඇස වරදකරුවෙක් නම්, ඒ ඇස පවා උගුල්ලා දමනු! දෙවියන්ගේ නාමයෙන් සියලු ලෞකික දේවලින් ඈත් වෙලා ආත්මය පමණක් ආරක්ෂා කර ගනින්! එවිට නුඹේ ආත්මය සදහටම ජීවත් වනු ඇත."

"නුඹ හොඳයි ගඳ බල්ලන්ට" යැයි කී ප්‍රයොතර් වසීල්යෙව් නැඟිට සිටියේය. "පහුගිය අවුරුද්දේදී නුඹට නුවණ ලැබිලයි කියලා මා සිතුවේ. නමුත්, නුඹ වඩාත් ලොකු මෝඩයකු වෙලා." ඔහු එසේ කියා තරමක් වැනෙමින් මලුව දෙසට පා තැබීය. එයින් කැලඹීමට පත්

වූ අලෙක්සාන්දර් මවිතයෙන් සහ හණිකට ප්‍රශ්න කළේය.

"යනවද...ඇයි... එහෙම කොහොමද?"

එසේ වුවද, දයාන්විත ලුකියාන් ඇසක් අඩවන් කොට සන්සුන් ලෙස මෙසේ පැවසීය:

"කමක් නැහැ... කමක් නැහැ..."

එවිට අලෙක්සාන්දර් ඔහු වෙත කඩා පැන්නේය.

"ඔන්න නුඹ ලෞකික වැඩවල වහලා. නුඹත් කමකට නැති වචන දොඩවනවා. පලය කුමක්ද? අලෙලූයා කියා දෙවියන්ට පින් දෙන අතරම, ලෞකික වැඩ කරනවා."

ඔහු දෙස බලා මඳ සිනා පෑ ලුකියාන්ද මලුවට ගියේය. එවිට අලෙක්සාන්දර් කළමනාකරු දෙස බලා කතා කළේ දැඩි විශ්වාසයකිනි.

"ඒ ගොල්ලන්ට බැහැ මගේ ආත්මය ඉදිරියේ නැඟිටලා ඉන්න. උන්ට ඉවසන්න බැහැ. ගින්දරෙන් වෙන්වන දුම වගේ අතුරුදහන් වෙලා යනවා."

කළමනාකරුවා යටැසින් ඔහු දෙස බලා වියළි හඬෙකින් පිළිතුරු දුන්නේය.

"මම ඔය වැඩවලට අත දාන්නෙ නැහැ."

අලෙක්සාන්දර් ව්‍යාකූල වූ විටෙක මෙන් තොප්පිය හිස දමාගෙන මුමුනන්න විය.

"අත නොදමා ඉන්නෙ කොහොමද? මේවා ඒ තරම් උසස් වැඩ, ඒවාට අත දැමිය යුතුයි කියලා ඒවා ඉල්ලා සිටිනවා.

ඔහු හිස පහත් කරගෙන මොහොතක් නිහඬව සිටියේය. එවිට මහල්ලන් දෙදෙනා ඔහුට අඬ ගැසූහ. තිදෙනා සමු නොගෙන පිටත්වී ගියෝය.

ඒ මිනිහා මා ඉදිරියේ පෙනී සිටියේ මහ රෑ දැල්වූ ගිනි ගොඩක් මෙනි. දීප්තිමත් ලෙස ඇවිළී නිවී ගිය ගිනිමැලයක් සේ ඔහු අතුරුදහන් වූයේ, ඔහුගේ ජීවිත නිෂේධන ප්‍රතිපත්තියෙන් කිසියම් සත්‍යයක් මට හඟින්නට සලස්වාලමිනි.

හවස නිසි වේලාවක් සොයාගෙන මම ඔහු ගැන ඉකෝන චිත්‍ර ශිල්පී නිහඬ, දයාවන් ඉවාන් ලරිඕනොවිච්ට ඉමහත් උද්යෝගයකින් විස්තර කළෙමි. ඔහු මගේ කතාවට සවන් දී මෙලෙස නිගමනය කළේය.

"පලා යන්නෙක් වෙන්න ඕන. ඔය වගේ නිකායවාදීන් ඉන්නවා. ඔවුන් කිසිම දෙයක් පිළිගන්නෙ නැහැ."

"ඒ ගොල්ල ජීවත් වන්නෙ කොහොමද?"

"පලායමින් ජීවත් වෙනවා. පෘථිවියේ හැම තැනම ඇවිදිනවා. ඒ නිසා තමා ඒ ගොල්ලන්ට පලායන්නෝ කියලා කියන්නෙ. පෘථිවියත්, එහි ඇති සියලු දෙයත් අපට අයිති නැති දේ කියලා ඒ ගොල්ල කියනවා. පොලිසිය ඔවුන් සතුරන් හැටියට සලකා ඔවුන්ව අල්ලනවා." චිත්‍ර ශිල්පියා වැඩි දුරටත් විස්තර කළේය.

මගේ ජීවිතය කටුක වුවද, ඔවුන් අවබෝධ කර ගැනීමට මම අසමත් වීමි. හැම දෙයකින්ම පලායන්නේ කෙසේද? එවකට මා වටා පැවැති ජීවිතයෙහි මා අගය කරන බොහෝ වැදගත් දේ තිබිණි. එබැවින් ඉක්මනින්ම අලෙක්සාන්දර් වසිල්යෙව් මගේ මතක පටයෙන් ඈත් විය.

එහෙත්, කලින් කල ජීවිතයේ අමාරු අවස්ථාවලදී ඔහුගේ සේයා රුව මා ඉදිරියෙහි මැවී පෙනිණි. ඔහු කෙත්වතු ඔස්සේ අළුවන් මඟෙක ගමන් කරන සැටිත්, වනයට පා නඟන සැටිත්, සුදුවන් වැඩ නොකරන වෙවුලන අතින් ඔහු තොප්පිය තල්ලු කරන සැටිත් මගේ මනැසට පෙනෙයි.

"මා යන්නෙ නිසි මඟ ඔස්සේ. මා කිසිවක් පිළිගන්නෙ නැහැ! සියලු සබඳකම් කඩා දමව්..."

නැසීගිය මගේ පියාගේ සේයා රුවද ඔහු අසලින් මැවී පෙනිණි. ආච්චි දුටු සිහිනය වගේමය. කොට්ටන් ගසකින් කඩාගත් අත්තක් ඔහු අත විය. ඔහු පිටුපසින් ලප සහිත බල්ලෙක් දුවයි. එළියට දා ගත් උගේ දිව වැනෙයි.

XIII

ගල්කැටවලින් සාදා, අඩක් නිම කළ විශාල නිවෙසක කාමර දෙකක ඉකෝන චිත්‍ර ඇඳීම සිදු කෙරිණි. මෙහි එක් කාමරයක ජනේල තුනක් මිදුලට මුහුණ ලා පිහිටි අතර, අනික් ජනේල දෙක වත්තට මුහුණ ලා පිහිටියේය. මේ ජනේල කුඩාය. එමෙන්ම, වීදුරු පරණය. මේ හේතුව

නිසා හිම කාලයේ ඇදිරි දවස්වලදී චිත්‍ර අඳින කාමරවලට හිරු එළිය ඉතා අල්ප වශයෙන් ලැබේ.

කාමර දෙකේම මේස තබා ඇත. හැම මේසයක් අසලම පිට කොන්ද ඉදිරියට නවා ගත් චිත්‍ර ශිල්පියෙක් වාඩිවී සිටී. සමහර විට එවැනි ශිල්පියෝ දෙදෙනෙක් එකට වැඩ කරති. වහලේ සීලිමේ සිට පහළට වීදුරු බෝල පෙළක් එල්ලා ඇත. ජලය සහිත මේ වීදුරු බෝලවලට වැටෙන පහන් ආලෝකය හතරැස් චිත්‍රය මත ආලෝක ධාරාවක් සේ විහිද යෙයි.

චිත්‍ර අඳින කාමරවල උෂ්ණය, වාතය අපිරිසිදුය. දේවරූප අඳින්නෝ විසිදෙනෙක් මෙහි වැඩ කරති. ඔවුහු පාලෙහ්, හොලූයි, ම්ස්තෙර ආදී පෙදෙස්වලින් පැමිණියෝය. කර ඇරපු කපු කමිස හා ටිකෝ රෙදි වර්ගයෙන් මැසූ කලිසම් හැඳ පාවහන් රහිතව හෝ ලණුවලින් සෑදූ පාවහන් සහිතව හෝ ඔවුහු චිත්‍ර අඳිති. ඔවුන්ගේ හිසට ඉහළින් සිගරැට් දුම් වලා පාවෙයි. තෙල් වර්ගවලත්, සායම් හා කුණු බිත්තරවලත් ගඳ එහි වහනය වෙයි. දුම්මල ලාටු වැක්කෙරෙන්නාක් මෙන් සෙමින්, සෙමින් විලදීමිර් ප්‍රදේශයේ ගීතයක් පැතිර යෙයි.

හෘදය සාක්ෂිය නොමැත දැන් ඉන්න මිනිසුනට
කොල්ලෙක් කෙල්ලක රවටයි උන් ඉදිරිපිට

ප්‍රීතිය රහිත වෙනත් ගීතද ගායනය කරන නමුදු, නිතර ගයන්නේ යටකී ගීතයමය. ඇද පැද ගැයෙන මේ ගීතය කල්පනාවට බාධා නොකැරේ. ගොර්නස්තායි සතාගේ මවිල්වලින් සාදා ඇති පින්සලයෙන් පසුතලයේ මිටියාවත ඇඳීමටත්, ශුද්ධවන්තයන්ගේ කෙටිටු මුහුණුවල වධ විඳීමේ වක රැලි ඇඳීමටත් ගීතය බාධාවක් නොවේ. ලෝහ කැටයම්කරුවකු වන, බේබදු මහලු ගොගොලෙව් ජනේලය අසලට වී වැඩ කරන සැටි ඇසෙයි. ඔහුගේ නහය විශාලය, නිල් පැහැතිය. කුසීත ගීතයේ රාවය බිඳගෙන මිටියෙන් පැන නඟින වියළි හඬ ඇසෙන්නේ පණුවෙක් ගස් කඳක් විදින විටෙක මෙනි.

චිත්‍ර ඇඳීම කෙරෙහි කිසිවකුගේ සිත ඇදී නැත. යම් කිසි දුෂ්ට බුද්ධිමතකු විසින් චිත්‍ර ඇඳීමේ ක්‍රියාදාමය අවදි කීපයකට බෙදා වෙන් කළේය. මේ නිසා එය

සුන්දරත්වයෙන් වෙන්වී එයට ආදරය කිරීමට ඇති හැකියාව නැති කොට එය නීරස දෙයක් බවට පරිවර්තනය කර ඇත. වපරැස් පන්පීලව් වඩුරාල නපුරුය, කපටිය. ඔහු විවිධ ප්‍රමාණයේ කිපරිස් සහ ලීපා ලෑලි කපා යතුගා පිළියෙල කරයි. ක්ෂයරෝගයෙන් පෙළෙන දවීදව් ගැටවරයා එම ලෑලිවලට බදාම ගායි. ඔහුගේ සගයා සරෝකින් ලෙව්කාස් බදාම ගා පසු පස පිළියෙල කරයි. මිල්යාෂින් මුල් ඉලෝනයේ කටු සටහන පැන්සලයකින් සටහන් කරයි. ඉකෝනයට අවශ්‍ය ලෝහ වැඩ කැටයම් කරන්නේ මහලු වඩුරාල, ගෝගොලෙව්ය. පසුබිමේ දර්ශනය අඳින්නෝ මිටියාවත සහ ශුද්ධවන්තයාගේ ඇඳුම ඇඳ පාට කරති. ඉන් අනතුරුව මේ ඉකෝන චිත්‍ර මුහුණ සහ අත් පා රහිතව බිත්තිය දිගේ එල්ලා තබන්නේ මුහුණු අඳින චිත්‍රකාරයන්ගේ කොටස බලාපොරොත්තු වෙමිනි.

ඉකෝන තට්ටුවලට සහ අල්තාර ද්වාරවලට අවශ්‍ය විශාල ඉකෝන චිත්‍ර මුහුණ සහ අත් පා නැතිව එල්ලා තැබීම ප්‍රියජනක දර්ශනයක් නොවේ. ප්‍රධාන දේව දූතයන්ගේ ලෝහකවරය සහ වලාකුළුවලින් මැවුණු ස්වර්ගමය ඇඳුම් පමණක් ඇඳ ඇත. මෙවැනි චිත්‍ර ජීවය රහිත මරණීය දර්ශනයක් මවා පායි. මෙහි තිබිය යුතු දර්ශනය දකින්නට නෙමැත. එය පුදුමාකාර ලෙස අතුරුදහන් වූ අතර, ඉතිරි වී ඇත්තේ වලාකුළු සහිත ස්වර්ගමය ඇඳුම පමණකි.

මුහුණ අඳින චිත්‍රකාරයෝ මුහුණු අත් පා ආදිය ඇඳ ඉවරවුණු විට, එය ඉතා සියුම් වැඩ දමන ශිල්පියාට භාර දෙති. ඒ ඒ චිත්‍රයට අවශ්‍ය වැකිය ලියනු ලබන්නේද වෙනත් ශිල්පියකු විසිනි. අවසානයේ දී ඉකෝන චිත්‍රයට අවශ්‍ය ලැකර් බදාම ගාන්නේ සියලු කටයුතු මෙහෙයවන ප්‍රධාන චිත්‍ර ශිල්පී නිහඬ ඉවාන් ලරිඕනිච්ය.

ඔහුගේ මුහුණත්, යටි රැවුළත් දෙකම අළු පැහැතිය. යටි රැවුළු ගස් සිනිඳු සේද මෙනි. ඔහුගේ අළුවන් දෙනෙත් විශේෂයෙන් ගැඹුරට පිහිටා ඇති අතර, ඒවා දොම්නසින් පිරිලාය. ඔහු යහපත් ලෙස මඳ සිනා පායි. එහෙත්, ඔහුට කිසිවෙක් පෙරළා මඳ සිනා නොපාති.

එසේ කිරීමට කිසියම් අපහසුවක් දැනෙයි. ඔහුගේ මුහුණ සිමොන් සිරනේවුස්[1] මතක් කරවයි. ඔහු එමෙන්ම, සිහින්ය, වියළිය. ඔහුගේ අවල දෙනෙත්, මිනිසුන් හා තාප්ප බිත්ති විදගෙන ඈත යමක් බලන විටෙක මෙනි.

මා චිත්‍රාගාරයේ වැඩ ඉගෙනගැනීමට පටන් ගෙන දවස් කීපයකට ඉනික්බිතිව, ඉකෝන චිත්‍රවල දේවධජය අඳින චිත්‍ර ශිල්පි කපෙන්දූහින් කට ගොන්නක් බීගෙන ආවේය. දොන් නදීබඩ කසාකයෙක් වූ ඔහු කඩවසම්ය; ශක්තිමත්ය. ඔහු දත්මිටි කමින්, මුවැත්තියකගේ බඳු කදිම දෙනෙත් හකුළුවාගෙන, අයෝමය අත්වලින් සගයන්ට පහර දුන්නේ නිහඬවය. මිටි, ශක්තිමත් සිහින් සිරුරක් ඇති ඔහු මීයන් මැදට පැනගත් බළලකු සිහි ගැන්වීය. අන්දමන්ද වූ ඔහුගේ සගයෝ අහුමුලුවල සැඟවී කෑ ගැසූහ.

"ඉඳා ගහපිය!"

සාන්තුවරයන්ගේ මුහුණු අඳින යෙව්ගේනි සිතානොව් බේබදු මැරවරයාගේ හිසට බංකු පුටුවෙකින් පහර දුන්නේය. එවිට බේබද්දා බිම පතිත වත්ම, ඔහු ගෙන් පහර ලැබූවෝ වහාම ඉදිරියට පැන ඔහු පෙරළා ගෙන ඔහුගේ අත් පා තුවාවලින් බැඳ දැමූහ. ඔහු සතෙකු මෙන් තුවා බැමි දතින් සපන්නට විය. යෙව්ගේනි වහාම මේසය උඩට නැඟ දැත් දෙපැත්තට තබාගෙන කොසාක බේබද්දාගේ ඇඟට පැනීමට සූදානම් විය. උසැති ශක්තිමත් යෙව්ගේනි බේබද්දාගේ පපුව පාගා විනාශ කරනු නො අනුමානය. එහෙත්, හරියටම ඒ මොහොත්දීම ලරිඕනිච් හිමකබායකින් හා හිම තොප්පියකින් සැරසී එතැනට පැමිණ යෙව්ගේනිට දබරැගිල්ලෙන් තර්ජනය කොටැ, හණිකට මෙසේ පැවසීය.

"මේකාව ගබඩා කාමරයට ගෙනියලා වෙරි හිඳෙනතුරු එහි තබාපල්ලා."

බේබදු කොසාකයාව චිත්‍රාගාරයේ යට ගබඩා කාමරයට ගෙන ගොස් යළිත් නිසි පරිදි මේසය තබා චිත්‍ර ඇඳීමට පටන් ගත්හ. ඔවුහු වැඩෙහි යෙදෙන ගමන්ම, තම බේබදු සගයාගේ ශක්තිය ගැන කතා කරමින්, ඔහු කවදා හෝ

1 ක්‍රිස්තු වහන්සේ කුරුසිය කරින් ගෙන යද්දී ඔහුට පිහිට වූවෙකි. - අනුවාදක

ගුටි කෙළියකදී මිය යන බවට අනාවැකි පළ කළහ.

"ඌව මරන එක ලෙහෙසි නැහැ." යි යෙව්ගේනි සිතානොව් කිව්වේ ඒ ගැන ඉතා හොඳින් දන්නා එකෙකු මෙනි.

මම ලරිඕනිච් දෙස බලමින් අපැහැදිලි ලෙස කල්පනා කරන්නට වීමි. මෙතරම් ශක්තිමත් මුරණ්ඩු තරුණයන් මේ මිනිහාට ලෙහෙසියෙන් යටත් වන්නේ මන්ද?

ලරිඕනිච් හැම දෙනකුටම වැඩ කළ යුතු සැටි පෙන්වන්නට විය. ඉතාම හොඳ චිත්‍ර ශිල්පීන් පවා ඔහුගේ උවදෙස්වලට සවන් දුන්නේ සැලකිල්ලෙනි. අන් අයට වඩා වැඩි වශයෙන් ඔහු උවදෙස් හා ගුරු හරුකම් දුන්නේ කපෙන්දුහින්ටය.

"කපෙන්දුහින්, නුඹ ෂිවොපීසෙට්ස් (ජීවය චිත්‍රයට අදින්නා) එහි තේරුම නුඹේ ඇඳීම ජීවමාන විය යුතු බවයි. ඉතාලියානු චිත්‍ර ශිල්පය අනුව අඳින්න ඕන. තෙල් සායමින් අඳින විට පාටවල උණුසුම් ඒකීයතාවක් තියෙන්න ඕන. නුඹ ඕනවට වැඩිය සුදු පාට ගානවා. බලාපන් ඒ නිසා දේව මෑණියන්ගේ නේත්‍රා පණ රහිත මලානික වෙලා. දෙකොපුල් ළා රතු පාටින් ඇන්දට නේත්‍රා එයට හරියට ගැළපෙන්නෙ නැහැ. පිටත්තරයි. නේත්‍රාවල දුර ප්‍රමාණයත් හරි නැහැ. එකක් නහයට ළඟයි. අනික කනට ළඟයි. ඒ නිසා දේවමෑණියන් ගේ මුහුණ ස්වර්ගමය පවිත්‍ර මුහුණක් නොවෙයි. ලෞකික කපටි මුහුණක් වෙලා. කපෙන්දුහින්, නුඹ නුඹේ ඇඳීම ගැන කල්පනා කරන්නෙ නැහැ."

කපෙන්දුහින් ඔහුගේ කතාවට සවන් දෙමින් මුහුණ ඇඹුල් කරගනී, අනතුරුව ඔහු, ඔහුගේ වනිතා නුවන්වලින් ලජ්ජා රහිත ලෙස මද සිනා පායි. මත්පැන් පානය නිසා තරමක් බැරැඩි හඬෙකින් ඔහු කතා කරන්නේ ප්‍රිය මනාප ලෙසිනි.

"අනේ ඉවාන් ලරිඕනිච්, තාත්තේ, ඒක මගේ වැඩක් නොවෙයි. මම උපන්ගෙයි සංගීතකාරයෙක්. මාව චූජකයකු කරලා."

"උත්සාහ කළොත් නුඹට ඔබ බාධා මැඩ ජයගන්නට පුළුවනි."

"නැහැ, මම කවුද? මම කැමතියි අස්ව කරත්තයක් එළවන්න. අස්වයො තුන්දෙනෙකු දාපු ත්‍රොයිකාවක්, ආ..."

උගුරුදණ්ඩ පාදාගෙන ඔහු ඇද පැද ගායනය පටන් ගනී.

ත්‍රොයිකාවේ අස්පයෝ මනහර,
දුවති වේගයෙන් ගී සැර
හිම සමයේ මහ රෑ වේගයෙන්
මා යන්නේ පෙම්වතිය වෙත රාගයෙන්!

ඉවාන් ලරිඕනිච් යටත් ලෙස මඳසිනා පාන්නේ ඔහුගේ දුක්බර අළුවන් නහය මත තිබෙන කණ්ණාඩි කුට්ටම හරිගස්වා ගනිමිනි. අනතුරුව ඔහු ඉවත යයි. එවිට චිත්‍ර ශිල්පියෝ සංගතික ලෙස ගායනය ආරම්භ කරති. බලගතු රළවේගයක් විසින් මුළු මහත් චිත්‍රාගාරයම අහසට ඔසවනු ලැබ එය පද්දන්නාක් මෙන් හැඟෙයි.

ඉවෙන් මෙන් දනිති, අශ්වයෝ
සුන්දරියගේ නිවෙන තිබෙන තැන...

සිප්කැමි පාෂා ඔදින්ත්සොව් බිත්තර කහ මද මිශ්‍ර කිරීම නවත්වා දෑතේ බිත්තර කටු දෙකක් තබා ගෙන අලංකාර ලෙස පදය අල්ලයි.

ගීත රාවයෙන් මත්වන චිත්‍ර ශිල්පීහු හැම දෙයක්ම අමතක කොට ළය පුරා හුස්ම ගෙන ඉමහත් ප්‍රීතියෙන් ගයමින්, ඇස් කොනින් කොසාක කපෙන්දුහින් දෙස බලති. ඔහු ගයන විට, චිත්‍රාගාරයේ සියලු දෙනා ඔහු මහා ගායකයා ලෙස පිළිගත්හ. දෙපසට විහිදෙන ඔහුගේ දෑත් දෙස බලමින් සගයෝ ඔහු වෙතට ඇදී යති. "හැම දෙයක්ම කඩා බිඳ දමනු, හැම දෙයක්ම" යැයි ඔහු කිව්වොත්, ඔවුන් ඉතාම දක්ෂ චිත්‍ර ශිල්පීන් පවා කිසිදු චකිතයෙකින් තොරව, මුළු මහත් චිත්‍රාගාරයම කුඩේ කුඩු කොට දමනු ඇතැයි මට සිතිණි.

කපෙන්දූහින් ගායනය කළේ ඉඳහිටලාය. එහෙත් ඔහුගේ කැරැලිකාර ගීත හැමදාම එක හා සමාන ලෙස

අපරාජිත හඬක් නැඟීය. මිනිසුන්ගේ මනෝභාවය කොතරම් දුක්බර වුවද, ඔවුන්ගේ හදවත තුළ ආලෝකයක් අවුළුවාලීමට ඔහු හැමදා සමත් විය. එවිට ඔවුන්ගේ කටහඬ සියල්ල එකට එක්වී එය ඒකීය සුමධුර බලවේගයක් බවට පත් විය.

ඒ ගීත නිසා මසිතෙහි සුහද හැඟීමෙක්ද, ගායකයා කෙරෙහිත්, ඔහු අනික් පුද්ගලයන් මත දරන සුන්දර පාලනය කෙරෙහිත්, සුහද ඉරිසියාවක්ද ඇති විය. හදවත නොසන්සුන් වී, උණුසුම් වී, වේදනාව දක්වා එය පිම්බෙන සැටියෙක් දැනිණි. ඇඬීමට සහ ගී ගයන මිනිසුන් අමතා කතා කිරීමට සිත් විය.

"මම නුඹලාට ආදරය කරමි!"

කෙස්වැටිය අවුල් කරගත්, කාසරෝගී කහපැහැති දවීදව් කටහැරගෙන, ගාල්කා කුරුලු පැටවකු මෙන් බලන්නේ මේ දැන් බිත්තර බිඳ ගෙන මෙලොවට ජනිත වූ විටෙක මෙනි.

ප්‍රීතිමත් කැරැලිකාර ගීත ගායනය කළේ ඒවා කසාකයා පටන්ගත් විටය. එසේ වුවද, වැඩි වශයෙන් ගායනය කළේ " හෘදසාක්ෂිය නැති ජනතාව" ගැනය. නැතිනම් 'මහවනයේ රූස්ස ගස් යට', පළමුවැනි ඇලෙක්සාන්දර්ගේ මරණය ගැන හෙවත් 'ඇලෙක්සාන්දර් තම යුද්ධ හමුදාව බැලීමට ගිය ගමන' ගැනය. සමහර දාට අපේ චිත්‍රාගාරයේ මුහුණ ඇඳීම පිළිබඳ දක්ෂතම චිත්‍රශිල්පී ෂිහර්යොව්ගේ ඉල්ලීම පරිදි පල්ලියේ ගීත ගැයීමට තැත් කළද, එය සාර්ථක වූයේ කලාතුරකිනි. ෂිහර්යොව් තමාට පමණක් අවේණික වූ විශේෂ පරිශ්‍රමයකින් ගායනය කළ අතර, එය අනික් හැම දෙනාටම බාධාවක් විය.

ෂිහර්යොව් අවුරුදු හතළිස්පහක් පමණ වයසැති වියළි අර්ධ තට්ටයක් සහිත, ට්සිගානයකුගේ මෙන් කැරැලි ගැසුණු කළු වන් කෙස්වලින් හිසෙහි ඉතිරි කොටස වැසුණු තියුණු අග සහිත විශාල උඩු රැවුළක් ඇති. කළුවන් බැමසඟළකින් යුත් මිනිසෙකි. ඔහුගේ රුසියානු නොවන සිහින් කඩවසම් මුහුණ අලංකාර කරනු ලැබුවේ කළුවන් සනැති යටි රැවුළ විසිනි. එහෙත්, ගිරා හොටක් වැනි ඔහුගේ නාසයට යටින් ඇති උඩු රැවුළ ගොරෝසුය.

එය අමතර මෙවලමක් සේ ඉවතට පැන තිබිණි. ඔහුගේ නිල්වන් දෙනෙත්ද එකිනෙකට වෙනස්ය. වම් ඇස දකුණු ඇසට වඩා විශාලය.

"පාෂ්කා" යැයි ඔහු බැරැඩි හඬින් ඇමතුවේ මගේ සගයා වන සිප්කැමියාටය. 'ආරාධිත වේවා!' දේව ස්තෝත්‍ර ගීතය ගයාපන්! අහපල්ලා!"

ලෝගුවෙන් දෑත පිහදා ගනිමින් ඔහු ගායනය ආරම්භ කළේය.

'ආරාධිත වේවා...'

"දෙවියන්ගේ ශ්‍රී නාමය" කීපදෙනෙක් ඊළඟ පදය අල්ලත්ම, ෂිහර්යොව් කැලඹීමෙන් කෑ ගැසීය.

"යෙව්ගේනි, පහළින්! ආත්මයේ පතුල දක්වා පහළට බැහැපන්.!

යෙව්ගේනි සිතානව් පීප්පයක් තුළින් මතුවන හඬක් මෙන් බැරැඩි ලෙස ගායනය පටන් ගනී.

"වහලුන් වමු දෙවියන්ගේ...."

"එහෙම නොවෙයි! මෙතැනදී ගයන්න ඕන මහ පොළොව දෙදරුම් කන තාලෙට. ඉඹේටම දොර, ජනේල ඇරෙන තාලෙට."

ෂිහර්යොව් වටහාගත නොහැකි උද්දාමයකින් පෙළිණි. ඔහුගේ අපූරු බැම සඟළ නළලේ ඉහළ පහළ යමින් තිබිණි. ඔහුගේ කට හඬ දෙදරුම් කයි, ඔහුගේ දෑතේ ඇඟිලි අදිසි තූර්ය භාණ්ඩයක් වයයි.

"දෙවියන්ගේ වහලුනි, නැඟිටියව්!" යැයි ඔහු කියන්නේ බහු අරුත් ඇතිවය. "එය මුළු මහත් ශරීරයෙනුත්, ආත්මයෙනුත් හඟින්නට ඕන. වහලුනි, දෙවියන්ට ප්‍රසංශා කරව්! පණ ඇති මිනිසුන් වන නුඹලාට එය නොතේරෙන්නේ මන්ද?"

"ඔබට ඕන හැටියට ගායනය කරන්න අපට කිසිමදාක බැහැ. " සිතානව් ආචාරශීලී ලෙස කියයි.

හොඳයි, අත හරිමු!" යි පවසන ෂිහර්යොව් අමනාපයෙන් තම වැඩ පටන් ගනී. ඔහු අප අතර සිටින ඉතාම හොඳ චිත්‍ර ශිල්පියාය. ඔහු දේව රූප බයිසෙන්ටයින්, ජර්යාෂ් සහ 'ජීවමය' ඉතාලි ලතා අනුව ඇඳීමෙහි සමත්ය. ඉකෝන චිත්‍ර ඇඳීමට ඇණවුම් භාර ගන්නා විට ලරිඕනිව්

ඔහුගෙන් උවදෙස් ගනී. සැබෑ ඉකෝන චිත්‍ර ගැන ඉතා ගැඹුරු දැනීමක් ඇති ෂිහර්යොව් හාස්කම් පෙන්වන ප්‍රයොදරව්ස්කයා, ස්මොලෙන්ස්කයා, කසාන්ස්කයා සහ වෙනත් දේවමෑණිවරුන්ගේ ඉකෝන පින්තූරවල සැබෑ පිටපත් ගැනද දන්නා කෙනෙකි. එහෙත්, සැබෑ ඉකෝන චිත්‍ර අත ගාමින් පිරික්සන ඔහු මැසිවිලි කියයි.

"මේ සැබෑ ඒවා නිසා අපේ අත් බැඳලා. කෙළින්ම කියන්න ඕන අපේ අත් බැඳලා."

චිත්‍රාගාරයෙහි ඔහුට හිමි වැදගත් තත්ත්වය නොතකා ඔහු අන් අයට වඩා ආඩම්බරකමින් අඩුය. සිප්කැමියන් වන මටත්, පාවෙල්ටත් ඔහු කරුණාවන්ත ලෙස සලකයි. චිත්‍ර ඇඳීමේ කලාව අපට කියා දීමට ඔහු මහන්සි වෙයි. වෙනත් අය එවැන්නකට ඉදිරිපත් නොවෙති.

ඔහු වටහා ගැනීම ලෙහෙසි නැත. පොදුවේ ගත් විට ඔහු ප්‍රීතිමත් පුද්ගලයකු නොවේ. සමහර විට පුරා සතියක්ම ඔහු වැඩ කරන්නේ ගොළුවකු මෙනි. ඔහු හැම කෙනෙකු දෙසම මවිතයෙන් හා අමුතු ලෙස බලයි. නාඳුනන මිනිසුන් ලෙස ප්‍රථම වරට බලන විටෙක මෙනි. ඔහු ගායනය කිරීමට ඉමහත් ලෙස ආසා කළ ද, නිහඬ තාලයට ඔහු ගීත නොගයනවා පමණක් නොව, ඒවා නෑසෙන විටෙක මෙන් හැසිරෙයි. අනික් චිත්‍ර ශිල්පියෝ ඔහු දෙස බලමින් එකිනෙකා දෙස නෙත් යොමා, ඉඟි මරති. දණහිස මත තබාගත් ඉකෝන චිත්‍රය දෙසට නැමී ගෙන ඔහු ඉතා සියුම් ලෙස ඇඳිරි වර්ණවලින් ලෝකෝත්තර මුහුණක් අඳියි. එවිට ඔහුගේ මුහුණත් ඇඳිරි වී ලෝකෝත්තර පැහැයක් ගනී.

හිටිහැටියේම ඔහු පැහැදිලි ලෙසින් හා අමනාපයෙන් කතා කරයි.

"ප්‍රෙද්තේචා මොකක්ද මේ? තේච් යනු පැරණි (රුසියන්) බසින් ගාමකය යනුයි. ප්‍රෙද්තේචා යනු පුරෝගාමියා මිස අන් කිසිවෙක් නොවේ." ඔහුම අර්ථකථනයක් සපයයි.

චිත්‍රාගාරයෙහි නිහඬතාව රජකරයි. හැම දෙනෙක්ම හොරහින් ෂිහර්යොව් දෙස බලා සිනා සෙති. නිහඬතාව බිඳගෙන මවිතය දනවන වචන ඇසේ.

"ඒක බියජනක ලෙස නොව, ප්‍රීතිමත් ලෙස අඳින්නට ඕන."

"නුඹ කතා කරන්නේ කා සමඟද?" ඔහුගෙන් අනික් අය අසති.

ඔහු නිහඬය. එක්කෝ ඔහුට ප්‍රශ්නය ඇසුණේ නැත. නැතිනම් පිළිතුරු දීමට ඔහු කැමැති නැත. ඉක්බිතිව හැම කෙනෙක්ම ඔහුගේ මුවෙන් වචනයක් පිටවන තුරු බලා සිටිති.

"සුද්දවන්තයන්ගේ ජීවිතය ගැන දැනගත යුතුයි. ඔවුන්ගේ ජීවිතය දන්නෙ කවුද? ආත්මය කොහිද? කොහේද ආත්මය? සැබෑ ඉකෝන තියෙනවා. නමුත් හදවත නැහැ...?"

මෙලෙස නිහඬව ඔහු සිතන සැටි දකින්නෝ. සිතානව් හැරුණු විට, උපහාසාත්මක ලෙස මඳසිනා පාති. කිසිවෙක් දුෂ්ට ප්‍රීතියෙකින් මෙසේ පවසති:

"සෙනසුරාදාට හොඳට අඩි ගහවි."

අවුරුදු විසිදෙකක් වයසැති කෙට්ටු ශක්තිමත් මස් පිඬු සහ වටකුරු මුහුණක් සහිත, උඩු රැවුළක් සහ ඇහි බැමි රහිත සිතානව් දොම්නසින් යුතුව මුල්ලක් දෙස බලයි.

ජයොදරව්ස්කයා දේව මෑණියන්ගේ ඉකෝන ප්‍රතිමාව ඇඳ අවසන් කරන ෂිහර්යොව් කැලඹීමෙකින් යුතුව හඬ නඟන සැටි ඇසුණු බව මට මතකය.

"දේවමෑණියනේ ඇඳලා ඉවරයි. ඔබ වහන්සේ පතුල නැති කුසලානයක් වගෙයි. ලෝකයේ ඉන්න මිනිස්සුන් දුක් කඳුළු වගුරවන්නේ මේ කුසලානයට තමයි..."

ඔහු එසේ පවසා කාගේදෝ හිම කබායක් ඇඟේ ලාගෙන තැබෑරුමට ගියේය. තරුණයෝ සිනාසී උරුවම්බෑහ. වැඩිහිටියෝ ඔහුට ඉරිසියා කරන්නාක් මෙන් සුසුම් ලෑවෝය. සිතනව් ඔහු ඇඳ අවසන් කළ ඉකෝනය වෙත ගොස් එය අවධානයෙකින් බලා විස්තර කළේය.

"සත්තකින්ම ඔහු බොන්න පටන් ගනීවි. ඔහුට මේ තරම් හොඳ චිත්‍රයක් වෙන කෙනෙකුට දීම අමාරු වැඩක්. ඔවැනි හිතේ අමාරුවක් හැදෙන්නේ හැම කෙනාටම නොවෙයි."

ෂිහර්යොව් මත්පැන් බීම අරඹන්නේ සෙනසුරාදාය. එය චිත්‍ර ශිල්පීන්ට සාමාන්‍යයෙන් හැදෙන 'බේබදු රෝගය' නොවේ. උදේට ඔහු කිසියම් ලියුම් කෑල්ලක් ලියා පාවෙල්ට කොහේදෝ යවයි. දිවා ආහාරයට පෙර ඔහු ලරිඔනිච්ට මෙසේ පවසයි:

"අද මම නාන්න යනවා!"

"දවස් කීයකටද?"

"අනේ දෙවියනේ..."

"කරුණාකරලා අඟහරුවාදා වෙනකොට එන්නැ" යි ලරිඕනිච් කියයි.

ෂිහර්යොව් තට්ට හිස වනත්ම, ඔහුගේ බැම සඟළ නැටවෙයි.

වාෂ්ප දමන උණු වතුර නාගෙන ඔහු ඇඳ පැළඳගන්නේ වැදගත් තාලයකටය. දිලිසෙන සුදු කරපටියත්, කමිසය වෙනුවට පපුව පමණක් වැසෙන සුදු රෙදි කඩත්, අත්වලට ව්‍යාජ කමිස පටි දෙකත් ඇඳ, දිලිසෙන කළු වැල්වට් රෙදිවලින් මැසූ කබායත්, අත් කොට කබායත් කලිසමත් රිදී දම්වැල් පොටකුත් බැඳ ගනී. පිටවී යන ඔහු මටත්, පාවෙල්ටත් වැඩ භාර කරයි.

"හවස් වෙනකොට චිත්‍රාගාරය හොඳට පවිත්‍ර කරපල්ලා. ලොකු මේසය හොඳට සෝදලා සුද්ද කරපල්ලා!"

හැම කෙනෙකුම එක්තරා උත්සවාකාරී ගතියකින් පෙළෙන්නට වූයෙන්, ඉක්මනට උණුවතුර නාගෙන විත් ලහි ලහියේ රාත්‍රී ආහාරය ගත්හ. රාත්‍රී ආහාරයෙන් ඉනික්බිතිව ෂිහර්යොව් ආවේ බීර,වයින් සහ කට ගැස්මට අවශ්‍ය ආහාර වර්ගත් පොදි ගසාගෙනය. ඔහුත් සමඟ පැමිණි කාන්තාව උසින්, මහතින් සහ හැම අතින්ම ඔහුට වඩා විශාලය. ඇගේ එම විශාලත්වය විරූපීය. ඇගේ උස අඩි හතක් පමණ වේ. ඇය ඉදිරියේ මේස පුටු කුඩා ක්‍රීඩා භාණ්ඩ මෙනි. උසැති ගැටවරයකු වූ සිතානව් ඇගේ කිහිල්ලට තරම්වත් උස නැතිය. එසේ වුවද, ඇගේ ශරීරය හැඩයකින් යුක්තය. එකම වරද ඇගේ දෙතන නිකට දක්වා ඉහළට නෙරා තිබීමය. ඈ සෙමින් හා නුහුරු ලෙස චලනය වෙයි. ඇගේ වයස අවුරුදු හතළිහකට වැඩිවුවද, අශ්වයකුගේ මෙන් විශාල නෙත්

යුගලක් සහිත ඇගේ වටකුරු, අවල මුහුණ සුන්දරය, සිනිඳුය. ඇගේ පුංචි මුව චිත්‍ර ශිල්පියකුගේ නිර්මාණයක් සහ ලාබ බෝනික්කෙකුගේ කටක් මෙනි. ඇගේ පුළුල් අත හැම කෙනෙකුටම දිගු කරමින්, ඈ අවශ්‍ය නොවන වචන ගොඩක් ඇදබායි.

"ආයුබෝවන්. අද බොහොම හීතලයි. ඔහෙලගෙ චිත්‍රාගාරයේ සැර පුසුඹක්. තීන්ත සහ සායම්වල පුසුඹ වෙන්ට ඕන. ආයුබෝවන්."

සන්සුන්, ශක්තිමත්, පවිත්‍ර ජලයෙන් පිරි ගංගාවක් වැනි ඇය දෙස බැලීම සිතට සතුටකි. එහෙත්, ඇගේ එම කතාවල කිසියම් අනවශ්‍ය, වඩාත් පීඩා කරන නිදිමත ගතියක් ඇති කරයි. ඇය ඉදිරිපිට වචනයක් කී විගස දම්පැහැති ඇගේ දෙකොපුල් වඩාත් වටකුරුවේ.

තරුණයෝ මත්පැන් බී කසු කුසු ගාති.

"හරියට යන්තරයක් වගෙයි!"

"සණ්ටාර කුලුනක්!"

දෙතොල් පීත්ත පටියක් සේ උල් කරගෙන දෑත් පපුවට පහළින් බැඳගෙන ඈ සමවාරය අසලින් මේසයට වාඩි වූවාය. ඇගේ තුරඟ නුවන්වලින් ඈ හැම දෙනකු දෙසම දයාන්විත ලෙස බලයි.

හැම දෙනෙක්ම ඇයට ගරු කරති. තරුණයන් ඇයට තරමක් බිය බවකි. තරුණයෙක් ඇගේ සිරුර දෙස ගිජු නෙතින් බලයි. එහෙත්, ඔහුගේ එම බැල්ම ඇගේ සුරතල් බැල්ම සමඟ ගැටෙත්ම, ඔහු ලජ්ජාවෙන් බිම බලා ගනී. ෂිහර්යොව්ද ඇය අමතන්නේ 'ඔබ' යනුවෙනි. ඇය ඔහුගේ මඤ්ඤා යැයි හඳුන්වමින් ඇයට ආහාරවලින් සංග්‍රහ කරන හැම වාරයකදීම ඇයට හිස නමා ආචාර කරයි.

"අනේ ඔයා කරදර වෙන්න එපා. ඇත්තටම ඔයා හරිම කලබලකාරයෙක් නොවැ." ඕ ඇද පැද පවසයි.

ඇය හැසිරෙන්නේ සන්සුන් ලෙසිනි. ඇගේ දෑත් චලනය වන්නේ වැළමිටේ සිට මැණික් කටුව දක්වා පමණකි. වැළමිට සිට පහළට බාහු දෙපැත්තට තද වී ඇත. ඇය වෙතින් උණු පාන්වල සුවඳක් වහනය විය.

ගොගලෙව් මහල්ලා ඇගේ රූ සපුව නිසා උද්දාමයට

පත්වී ඉක්කා ගසමින් කතාකරන්නේ පල්ලියේ අන්නවි රාල යාච්ඤා පොත කියවන්නාක් මෙනි. ඔහු දෙස සුහද ලෙස ඈ බලන්නට පටන් ගනී. ඔහු වචන පටලවා ගන්නට පටන් ගත් විට ඈ ඇය ගැන විස්තර කරයි.

"මම තරුණ කාලේ කොහෙත්ම ලස්සනට හිටියේ නැහැ. ගෑනු ජීවිතය නිසා තමයි, මෙහෙම ඇඟ හැදුණේ. අවුරුදු තිහක් වන විට මා ගැන රදල හාමු මහත්තයලත් සැලකිලි දක්වන්ට පටන් ගත්තා. කෝරලේ ප්‍රධානියා අස්වයෝ දෙදෙනෙකු සමඟ කරත්තයක් දීමට පොරොන්දු වුණා."

මත්පැන් බී තරමක් පදම් වී සිටි කපෙන්දුහින් වෛරයෙන් මෙන් ගැහැනිය දෙස බලා ප්‍රශ්න කළේය.

"පොරොන්දු වුණේ මොනවාටද?"

"සත්තකින්ම මගේ ආදරය ලබා ගැනීමට" යැයි කාන්තාව විස්තර කළාය.

"ආලය තමා, මොන ආලයක්ද?" කපෙන්දුහින් ලජ්ජාවෙන් මෙන් මුමුනයි.

"ඔබ කොතරම් අපූරු තරුණයෙක්ද, ආදරය ගැන ඉතා හොඳට දන්නවා නොවැ." යැයි කාන්තාව කිව්වේ ඉතා චාම් ලෙසිනි.

චිත්‍රාගාරයේ රැස්වූවෝ මහ හඬින් සිනාසෙති. කපෙන්දුහින් අමතා සිතානව් මුමුනයි.

"එයා මෝඩියක් විතරක් නොවේ, ඊටත් වඩා නරකයි. ඔය වගේ ගෑනියකුට ආලය කරන්න පුළුවන් පාළු මුඩුම ගතියක් ඇතිවුණාම, ඒක හැම දෙනාම දන්නවා."

සිතානව් වයින් පානය කරත්ම, ඔහුගේ මුහුණ මලානික වෙයි. ඔහුගේ නළල දෙපැත්තේ ඩා බිඳු දිලිසෙයි. මහලු ගොගලෙව් ඔහුගේ විරූපී නාසය වනා ඇසෙක ඇති කඳුළු බින්දුවක් ඇඟිලි තුඩින් පිසදමා ප්‍රශ්න කරයි. නුඹට ළමයින් කී දෙනෙක්ද?"

"මට ලැබුණේ එක ළමයකු විතරයි."

මේසයට ඉහළින් එක පහනක් දල්වා තිබුණු අතර, අනික් පහන කාමරය මුල්ලේ ගිනි උදුනට ඉහළින් තිබිණි. මෙම පහන්වලින් ලැබෙන ආලෝකය අල්පය. චිත්‍රාගාරයේ අනික් මුලුවල සෑහෙන තරම් කළුවරය. එතැන් සිට ඇඳ

අවසන් නොකළ හිස් රහිත රූප පෙනෙයි. හිස සහ අත් වෙනුවට ඇත්තේ අළු පැහැති ලප පමණකි. ඒවා පමණට වඩා විශාල බවක් පෙනෙන නිසා බියජනක බවක් කියාපායි. ඇඳුම්වලට යටින් ඇති ශ්‍රද්ධවන්තයන්ගේ සිරුරු අතුරුදහන් වූ සැටියක් දැනෙයි. වහල සීලිමෙහි එල්ලා ඇති වීදුරුබෝල දුම්වලා අතරින් දිලිසේ.

ෂිහර්යොව් මේසය වටේ යමින් සියලු දෙනාටම සංග්‍රහ කරන්නට විය. ඔහුගේ තට්ට හිස ඇකෝඩියනය වාදනය කරන්නාගේ ඇඟිලි දෙසට හැරෙයි. ඔහු වඩාත් කෙට්ටු වී ඇති අතර, ඔහුගේ වකුටු නහය වඩාත් තියුණුවට පෙනෙයි. ඔහු ගිනි උදුනට විරුද්ධව සිට ගන්නා විට, ඔහුගේ නාසයේ කළුවන් සෙවණැල්ල දැකිය හැකිය.

"මිතුරනි, කාපල්ලා. බීපල්ලා!" යැයි ඔහු බැරැඬි හඬින් පිරිස අමතයි.

ගැහැනිය කුලුපග ලෙස කතාකරයි.

"ඔබ, පඤ්ඤෝ කලබල වෙන්න එපා. සෑම කෙනෙකුටම තමාගේම ආහාර රුචියක් බඩගින්නක් තියෙනවා. හැම කෙනෙකුටම සිත පුරා කන්නට බැහැ නෙව!"

"මිත්‍රවරුනි, විනෝද වෙයල්ලා!" යැයි ෂිහර්යොව් කියන්නේ ඉමහත් කැලඹීමෙනි. "මිතුරනි අපි සියලු දෙනාම දෙවියන් වහන්සේගේ වහල්ලු. දෙවියන්ට 'ආරාධිත වේවා!' ගීතය ගයමු."

ගීතය නිසි පරිදි ගැයෙන්නේ නැත. වොඩ්කා සහ ආහාරවලින් මත්වූවෝ කුසීතව සිටිති. කපෙන්දූහින් ස්වරමාලා දෙපෙළක් සහිත 'ගර්මොනි' සංගීත භාණ්ඩය වාදනය කරයි. කාක්කකු මෙන් කළුවන්, බැරැරුම්, තරුණ වික්තර් සලඋතින් ගෙජ්ජි රබානයේ හම ඇඟිල්ලකින් අතුල්ලත්ම, එක්තරා හඬක් පිටවෙමින් එයින් රබාන වළල්ලේ ඇති ගෙජ්ජි සෙලවේ.

"රුසියානු ගීතයක්!" යැයි විධානය කරන ෂිහර්යොව් "කුමුෂ්කා[1] මෙහාට එන්නැ" යි ගැහැනිය අමතයි.

"අනේ, ඔයා කලබල වෙන්න එපා." යැයි ඇය පවසන්නේ පුටුවෙන් නැඟිට සුසුම්ලමිනි.

1 සුරතල් ඇමතීමකි. -අනුවාදක

ඇය කාමරයේ ඉඩ ඇති තැනක සිට ගන්නේ ඕර්ලෝසු කණුවක් සේය. ඇගේ සාය පුළුල්ය. දුඹුරු පැහැතිය, හැට්ටය කහ පැහැතිය. ඈ රතුවන් ලේන්සුවක් හිස බැඳලාය.

ගර්මොනිය (ඇකෝඩියනය) හඬ නඟයි. රබානයේ ගෙජ්ජි හඬ ඔස්සේ සෙමින් නිකුත්වන ශබ්දයද ඇසෙයි. රබානයේ සමින් පැතිරයෙන එම ශබ්දය බරතිය, කනට අමිහිරිය. පිස්සු වැටුණ මිනිහෙක් කෑ ගසමින්, සුසුම් ලමින් බිත්තියට නළල හප්පා ගන්නාක් මෙනි.

ෂිහර්යොව් නැටුම් නොදනී. ඔහු සපත්තු අඩි හප්පමින් එක තැන උඩ පැන්නද එයත් තාලයට ගැළපෙන පරිදි නොවේ. ඔහු ගේ පාද ඔහුට අයත් ඒවා මෙන් නොවේ, ඔහුගේ සිරුර අවලස්සන ලෙස නැවෙයි. මකුළු දැලකට හසු වූ දෙබරකු මෙන්, නැතිනම් දැලකට පැටලුණු මාළුවකු මෙන් ඔහු දඟලයි. බීමත් වූවන් ඇතුළු හැම දෙනෙක්ම එක්තරා ගැස්මෙකින් යුතුවත්, අවධානයෙන් සහ නිහඬවත් ඔහුගේ අත්පා චලනය දෙස බලති. ෂිහර්යොව්ගේ මුහුණ අපූරු ලෙස නැටවේ. වරෙක ඔහුගේ මුහුණට සුරතල් බවක්ද, තවත් වරෙක ව්‍යාකුල ගතියක්ද ආරූඪ වෙයි. වරෙක උඩඟුවක්ද, තවත් වරෙක දැඩි ගතියක්ද ඉන් පළවෙයි. දෑතේ ඇඟිලි මිට මොළවාගෙන, ඒ අතරම බාහු දිග හැරගෙන අඩි පොළොවේ හප්පා හෘදයංගම සිනාවක් පා ඔහු ගැහැනිය ඉදිරිපිට දණින් වැටෙයි. ඈ ඉහළ සිට පහළට ඔහු දෙස සුහද සිතින් බලා සන්සුන් ලෙස කතා කරයි.

"අනේ ඔයාට මහන්සියි නෙව!"

ඇය සුන්දර ලෙස දෙනෙත් පියා ගැනීමට තැත් කළද, කොපෙක් තුනක කාසියක් තරම් විශාල වූ ඒවා සම්පූර්ණයෙන්ම වැසෙන්නේ නැත. එවිට ඇගේ මුහුණ හැකිළී අශෝභන පෙනුමක් මවා පායි.

ඈද නැටීම නොදත්තාය. ඈ ඇගේ යෝධමය සිරුර සෙමින් සහ හඬ රහිතව සොලවයි. තැනින් තැන සෙමින් පා තබයි. ඇගේ වමතෙහි ඇති ලේන්සුව ඈ කුසීත ලෙස වනයි. දකුණත ඉණට තබාගෙන සිටින නිසා ඇය අණ්ඩක් සහිත යෝධමය ගුරුලේත්තුවක් සිහි නංවයි.

එහෙත්, ෂිහර්යොව් මේ ශෛලමය කාන්තාව වටා නටන්නේ පරස්පර ලෙස එකිනෙකට වෙනස් මුහුණු මවා ගනිමිනි. ඔහු වෙස් දහයක් ගෙන නටන විටෙක මෙනි. ඒ හැම වෙසක්ම එකිනෙකට වෙනස්ය. එකක් සන්සුන්ය, යටත්ය, අනික කෝපාන්විතය, බිය ගන්වනසුලුය. තෙවැන්න නොදැනෙන පරිදි ඒ අප්‍රියජනක ගැහැනියගෙන් ඉවත්වීමට තැත් කරන වෙසක් ඔහු මවා පායි. ඉන් ඉනික්බිතිව ඔහු තවත් වෙසක් මවා පෑවේය. තුවාල ලත් බල්ලකු සේ ඔහු දත් සපමින් වෙවුලමින් දඟලන්නට විය. මෙම මුඩුම අවලස්සන නැටීම බැරෑරුම් දොම්නසක් මසිතෙහි මවා පායි. සෙබළුන්, රෙදි අපුල්ලන්නියන්, ගෘහ මෙහෙකාරියන් සහ බල්ලන්ගේ මඟුල් එය සිහියට නංවයි.

සීදරව් වරක් පැවසූ වචන මට මතක් විය.

"ලිංගික සම්බන්ධකම්වලදී හැම දෙනෙක්ම බොරු කියනවා. ඔක්කොමල්ලා ලජ්ජා වෙලා. කිසිවෙක් කිසිවකුට ආලය කරන්නෙ නැහැ. නිකම් ආසාව පිරිමහ ගන්නවා විතරයි."

"හැම දෙනෙක්ම බොරු කියනවා." යන කීම විශ්වාස කිරීමට මා සූදානම් නැත. එසේ නම් මර්ගෝ රැජින ගැන කොහොමද? ෂිහර්යොව් සත්තකින්ම බොරු කරනවා නොවෙයි. "වේසාකම් කරන" තරුණියකට සිතානව් ආලය කළ බව මම දනිමි. ඈ ඔහුට (සමාජ රෝගයක්) බෝ කළද, ඔහුගේ සගයන් ඔහුට උවදෙස් දුන් පරිදි ඔහු ඇයට පහර දීමට ඉදිරිපත් නොවෙයි. ඇය සඳහා කාමරයක් කුලියට ගෙන, ඔහු ඇයට වෙදකම් කරවයි. විශේෂ සුරතල් ලෙසින් හා ලජ්ජාශීලී ලෙසින් ඔහු හැමදාම ඇය ගැන කතා කරයි.

යෝධ කාන්තාව සෙමින් චලනය වෙමින් මළ එකියක සිහි ගන්වන මඳ සිනාවක් පායි. අත ඇති ලේන්සුව වනයි. ෂිහර්යොව් වෙවුලමින් උඩ පනිමින් ඇය වටේ දුවයි. දෙවියන් වහන්සේව රවටා ලූ ඒවා, මේ ගැහැනිය මෙන් වෙළඹක් වූවාද? මසිතෙහි ඇයට වෛරයක් ජනිත වෙමින් පවතී.

මුහුණ රහිත ඉකෝන කවන්ධ සේ බිත්තියේ සිට අප

දෙස බලන්නාක් මෙනි. ඇදිරි රැය ජනේල වීදුරුවලට ඇලී සිටී. චිත්‍රාගාරයේ අපිරිසුදු වාතය අතරින් පහන්වල මලානික ආලෝකය පෙනේ. ශබ්දවලට කන් යොමා සිටින විට, නැට්ටුවන්ගේ පා ගැටෙන ශබ්දයත්, මිනිසුන් කතාබහ කරන හඬත්, අතරින් තඹවන් පයිප්පයේ සිට පහළට කසළ ගොඩට වතුර කාන්දු වන ශබ්දයද ඇසෙයි.

මා පොත්වලින් කියවූ ජීවිතයට වඩා මෙය කොතරම් වෙනස්ද! භයානක ලෙසින්ම සමාන නොවේ. ඔන්න අවසානයේදී හැම දෙනම පාළු මූසල ගතියෙන් පෙළෙන්නට වූහ. කපෙන්දූහින් හර්මොනියාව සලඋතින් අත තබා කෑගසයි.

"ගිනි පිටවෙන්න තාලයක් වයාපන්!"

වාන්කා ටිසිගන් මෙන් ඔහු නටන්නේ මහ පොළොවට ඉහළින් පා වෙමිනි. ඊළඟට ඉතා දක්ෂ ලෙස පාවෙල් ඔදින්ත්සෙව් සහ සරෝකින්ද නැටූහ. කාස රෝගී දවීදව් සෙමින් පාද තබා නටන්නේ, දූවිල්ලත්, දුමත්, වොඩ්කා සහ සම් ගඳට සමාන කොල්බසාවල සැර සුවඳත්, නිසා කහින්නට පටන් ගත්තේය.

නටමින්, ගී ගයමින් කෑ ගැසුවද, හැම දෙනකුටම එකක් මතකය. එනම් ඔවුන් ප්‍රීතිවන බවය. ඔවුන් එකිනෙකා දක්ෂතාවයේ සහ විඩාපත්නොවීමේ විභාගයකට ඉදිරිපත් වී සිටින බව ඔවුහු අමතක නොකරති.

සෑහෙන්නට මත්පැන් බී සිටි සිතානව් එකිනෙකා වෙත ගොස් ප්‍රශ්න කරයි.

"ඔය වගේ ගෑනියකුට ආලය කරන්න පුළුවන්ද?"

ඔහු දැන්, දැන් අඬතියි මට සිතේ.

ලරිඕනිච් කටු ගොඩක් බඳු ඔහුගේ දෙඋර ඔසවා විස්තර කරයි.

"ඉතින් එයා අනික් ගෑනුන් වගේම ගෑනියක් නොවැ. නුඹට තවත් ඕන මොනවද?"

කතාවට භාජනය වූ ගැහැනිය සහ අනික් පුද්ගලයාත් අතුරුදහන් වූහ. ෂිහර්යොව් තවත් දවස් දෙක තුනකින් යළිත් නාන්නට ගොස් වැඩට විත් පුරා දෙසතියක් යනතුරු මුල්ලකට වී බුම්මාගෙන ඉකෝන අඳිනු ඇත. ඔහු නිහඬව වැදගත් බවක් ආරූඪ කර ගත්තද, අනික්

හැම දෙනාටම ඔහු පිට කෙනෙකු මෙනි.

"ගිහිල්ලද?" සිතානව් දොම්නසින් පිරි නිල්, අළු පැහැති නෙත්වලින් අවට බලමින් තමාගෙන්ම ප්‍රශ්න කරගනී. ඔහුගේ මුහුණ අවලස්සනය, මහල්ලකුගේ මෙනි. එහෙත්, ඔහුගේ දෙනෙත් පැහැදිලිය. කරුණාවන්තය.

සිතානව් මා කෙරෙහි මිතුරු ආකල්පයක් දක්වයි. මෙම මිත්‍ර ආකල්පය නිසා මා ණයගැති විය යුත්තේ මා කවි පිටපත් කරන මගේ මහත කොපි පොතටය. සිතානව් දෙවියන් විශ්වාස නොකරන්නෙකි. එහෙත් ඇත්ත වශයෙන්ම ලරිඕනිච් හැරුණු විට චිත්‍රාගාරයේ දෙවියන් විශ්වාස කරන්නේ කවුරුන්දැයි සිතා ගැනීම අපහසුය. බොහෝ දෙනා දෙවියන් ගැන විහිළු, එමෙන්ම උපහාසාත්මක කතා කියති. චිත්‍රාගාරය අයිතිකාරිය ගැනත් එවැනිම කතා කීමට ඔවුන් කැමැතිය. එසේ වුවද, හැමදෙනම දිවා සහ රාත්‍රී භෝජනයට පෙර කුරුසියේ ලකුණ ඇඳ ගනිති. රාත්‍රී නින්දට පෙර යාච්ඤා කරති. උත්සව දවස්වලට පල්ලි යති.

සිතානව් මේවා කිසිවක් නොකරයි. ඔහු අදේවවාදියෙකියි අනික් සගයන් කියන්නේ මේ නිසාය.

"දෙවියන් නැහැ." සිතානව් කියයි.

"එහෙනම් මේවා සියල්ල කොහෙන්ද?" ඔහුගෙන් අසති.

"දන්නෙ නැහැ."

"දෙවියන් නැහැයි කියන්නෙ කොහොමද?" මා ඔහුගෙන් ඇසූ විට, ඔහු විස්තර කරන්නට විය.

"දෙවියන් කියන්නෙ උසට, නුඹට තේරුණාද!"

ඔහු, ඔහුගේ දිගැති අත හිසට ඉහළින් ඔසවා ඉන් අනතුරුව, අත පොළොවේ මට්ටමට වඩා අඟල් කිපයක් ඉහළින් තබා මෙසේද පැවසීය:

"මිනිහා පහළයි, නීචයි. හරිද? ඒ වුණාට බයිබලයේ මෙහෙම ලියලා තියෙනවා. 'මිනිහාව මවලා තියෙන්නේ දෙවියන්ගේ රූපය අනුවයි, ඔහුට සමානවයි.' නාකි ගෝගලෙව් වඩුරාල සමාන කාටද?"

එයින් මම අන්දමන්ද වීමි. කුණු පෙරා ගෙන සිටි බේබද්දකු වූ මහලු ගෝගලෙව්, තම මහලු වයස නොබලා

ස්වයං මෛථුනයෙහි යෙදෙයි, ව්‍යාත්කාහි සෙබළාද, යෙර්මෝහින්ද, ආච්චිගේ නැගණියද මට සිහිවේ. ඔවුන් දෙවියන් වහන්සේට සමානද?

"නුඹ දන්නා පරිදි මිනිසුන් ඌරන්ට සමානයි." සිතානව් එසේ කියා සැණෙකින් මා අස්වසාලීමට ඉදිපත් වෙයි.

"මක්සීමිච්, ඒ වුණාට හොඳ මිනිසුන් ඉන්නවා. ඔව්, හොඳ මිනිසුන්."

ඔහුත් සමඟ ලෙහෙසිය. පහසුය. ඔහු කිසිවක් නොදත් විට ඒ බව එළිපිටම පවසයි.

"මම දන්නෙ නැහැ. මා ඒ ගැන සිතුවෙ නැහැ."

එය පවා අසාමාන්‍ය දෙයකි. ඔහු හමුවීමට පෙර මා දත් හැම කෙනෙක්ම හැම දෙයක් ගැනම දන්නා අය වූහ.

ඔහු කවි පිටපත් කළ කොපි පොත බැලීම අපූරු දෙයක් විය. හදවත කිතිකවන ඉතා හොඳ කවි අසලින් ඔහු ලජ්ජාව පමණක් ඇති කරවන, නීච කවි බොහොමයක් ලියා තිබුණේය. මා ඔහුට පුෂ්කින් ගැන කී විට, ඔහු කොපි පොතේ ලියා තිබුණු 'ගව්රිලියාදා' කවි පෙළ ඇඟිල්ලෙන් පෙන්වීය.

"පුෂ්කින් කවුද? නිකම් විහිළුකාරයෙක් විතරයි. ඒ වුණාට මක්සීමිච්, බෙනෙදික්තව් ගැන, විශේෂ අවධානයක් යොමු කරන්න ඕන!"

ඔහු දෙනෙත් වසාගෙන සෙමින් කවි කිව්වේය.

බලනු මැන මෙන්න ගැහැනිය සුන්දර
කාමය කියන පයෝධර ...

කිසියම් හේතුවක් නිසා ඔහු කවි පේළි තුනක් කියුවේ විශාල ප්‍රීතියකින් හා ආඩම්බරයකිනි.

රාජාලියාට වුව එය නොපෙනේ
බැලිය නොහැකි එම සිදුරෙන්
හදවතට කා වැදී හැකිනම් බලාපන්

"තේරුණද?" ඔහු මගෙන් ඇසීය.

ඔහු ප්‍රීති වන්නේ කිනම් හේතුවක් නිසාද යන්න මට වටහා ගැනීමට නොහැකි බව පිළිගැනීම ඉතාම අසීරු විය.

XIV

චිත්‍රාගාරයේ මට අයත් වැඩ කොටස එතරම් විශාල නොවීය. උදෑසන චිත්‍ර ශිල්පීන් තවමත් නිදා සිටින විට ඔවුන් සඳහා සමවාරය පිළියෙල කිරීමත්, ඔවුන් කුස්සියට වී තේ පානය කරන විට පාවෙල් සමඟ එකතු වී චිත්‍රාගාරය ඇමද පවිත්‍ර කිරීමත්, සායම්වලට අවශ්‍ය බිත්තර කහමද පිළියෙල කිරීමත්ය. ඉන් පසුව මම ඉකෝන වෙළඳාම් කඩයට යමි. හවසට සායම් වර්ග දිය කිරීමත්, ඒ අතර 'ඇඳීමේ ශිල්පය' දැක බලා ගැනීමත් මට අයිති වැඩ විය. මුලදී මම ඉමහත් ආසාවෙන් 'ඇඳීමේ ශිල්පය' දැක බලා ගතිමි. ඉකෝන චිත්‍ර ඇඳීම කොටස්වලට වෙන් කර ඇති අතර, ඒවා අඳින චිත්‍ර ශිල්පීන් ඒ ගැන කෙහෙත්ම සැලකිලි නොදක්වන බවත්, ඒ නිසා ඔවුන් වේදනා සහගත කනස්සල්ලකින් පසුවන බවත් මට අවබෝධ විය.

හවස් කාලයේ මට වැඩක් නොතිබිණි. මගේ නාවික ජීවිතය ගැනත්, පොත්වලින් මා දැනගත් විවිධ කතා ආදියත් ඔවුනට කීම සිරිතක් බවට පත්විය. මටම නොදැනුවත්වම මම චිත්‍රාගාරයේ කිසියම් විශේෂ තැනක්, කතා කියන්නා සහ පොත් කියවන්නාගේ ස්ථානයට පත්වීමි.

මේ මිනිසුන් සියලු දෙනා මට වඩා අඩුවෙන් දැක, අඩුවෙන් දන්නා බව මට ඉක්මනින්ම වැටහිණි. මේ හැම කෙනෙක්ම පාහේ ළමා වියේ සිටම කුරුලු කූඩුවක බහා ලූ කලෙක මෙන් චිත්‍රාගාරයට හසුවී එහිම සිටිති. අපේ චිත්‍රාගාරයේ සියලු දෙනා අතරින් මොස්කව් නගරය දැක ඇත්තේ ෂිහර්යොව් පමණකි. ඔහු ඒ නගරය ගැන කතා කළේ ඒත්තු යන පරිදි සහ උදාසීන ලෙසිනි.

"මොස්කව් නගරය ඇසින් බලා ඉවර කරන්න බැහැ. එහිදී බොහොම පරෙස්සම් විය යුතුයි."

අනික් ශිල්පීහු ෂූය සහ ව්ලදීමීර් නගරවලට පමණක් ගිය අය වූහ. කසාන් නගරය ගැන කියන විට මගෙන් විපරම් කළහ.

"ඒ නගරයේ රුසියන්කාරයන් බොහොම ඉන්නවද? පල්ලි තියෙනවද?"

පෙර්ම් නගරය සයිබීරියාවේ තිබේ යැයි සිතූ ඔවුහු සයිබීරියාව උරාල කඳු වැටියට එහා තිබෙන බව විශ්වාස නොකළහ.

"උරාල් සුදාක් සහ ඔසේත්ර් මාළුවන් ගේන්නේ කැස්පියන් මුහුදේ ඉඳලා නේද?[1] එහෙනම් උරාලය තියෙන්නේ මුහුදේ!"

එංගලන්තය මුහුදට සහ සාගරයට ඔබ්බෙන් පිහිටා ඇතැයිද නැපෝලියන් බොනපාට් රුසියාවේ කලූගා පළාතේ සිටු පවුලකට අයිති කෙනෙකැයිද, ඔවුන් කියන විට ඔවුන් මා සිනහවට ලක් කරන බවක් සිතේ. මා ඇසින් දුටු දේ කී විට ඔවුන් මා විශ්වාස කළේ අල්ප වශයෙනි. එහෙත්, ඒ අතරම ඔවුහු බියජනක සහ ව්‍යාකූල කතා ඇසීමට ආසා කළහ. වයසක මිනිස්සු පවා සත්‍යයට වඩා සිතින් මැවූ කතා අගය කළහ. සිද්ධියක් සත්‍ය නොවන තරමට, සිතින් මැවූ දේ වැඩිවූ තරමට ඔවුන් වඩාත් වැඩි සැලකිල්ලකින් මට සවන් දෙන සැටි මම ඉතා හොඳින් දුටුවෙමි. යථාර්ථය ගැන ඔවුන් සැලකිලි දැක්වූයේ මඳ වශයෙනි. එහෙත්, ඒ අතර ඔවුන් අනාගතය ගැන සුන්දර සිහින දැකීමට ආසා කළේ වර්තමානයේ දුගී බව සහ විකෘති භාවය දැකීමට අකැමැත්තක් දක්වමිනි.

සැබෑ ජීවිතයත්, පොතින් මවන ජීවිතයත් අතර ඇති පරස්පරතාව දුටු මට මෙය මවිතයට හේතුවක් විය. මා ඉදිරියේ ජීවමාන මිනිසුන්ය. පොතෙහි එවැන්නන් නැත. ස්මූරි කෝකියා, ගිනි උදුන්කරු යාකොව්, පලායන ආගම්වාදී අලෙක්සාන්දර් වසීල්යෙව්, චිත්‍ර ශිල්පී ෂිහර්යොව්, රෙදි අපුල්ලන නතාලියා ආදීහු පොතෙහි නැත්තාහ.

දවීදව්ගේ පෙට්ටගමෙහි ගොලීත්සින්ස්කිගේ කතාද, බුල්ගාරින්ගේ 'ඉවාන් වීෂිගින්' කතාවද, බැරන් බ්‍රම්බේඋස්ගේ වෙළුමක්ද තිබුණෙන් මම ඒවා අපේ චිත්‍ර ශිල්පී සගයන්ට කියැවීමි. හැම දෙනාම සතුටු වූහ. ලරිඕනිච් මෙසේ පැවසීය:

---

1 උරාල් ගංගාව සහ උරාල් කඳුවැටිය වරදවා තේරුම් ගැනීම නිසා මෙලෙස ප්‍රශ්න කරයි. -අනුවාදක.

"පොත කියවනවා අහගෙන හිටියාම සණ්ඩු දබරත් නැහැ. කෑකෝ ගැසීමත් නැහැ. ඒ නිසා ඒක හොඳ වැඩක්."

මම ඉමහත් වුවමනාවෙකින් පොත් සොයන්නට වීමි. ඒවා සොයාගෙන හැම සැන්දෑවකම පාහේ කියැවීමි. එවැනි සන්ධ්‍යාවන් යහපත් විය. චිත්‍රාගාරයේ නිහඬතාව ඇතිවූයේ රාත්‍රියේ මෙනි. මේසවලට ඉහළින් එල්ලෙන වීදුරු බෝල ශීතල තරුවලට සමානය. ඒවායේ රැස් මේසයට ඇලී ඇති. අවුල් වූ හිසකෙස් සහ තට්ට හිස් ආලෝකවත් කළේය. අසන්නන් සන්සුන්ය. කල්පනාකාරීය. සමහර විට අසන්නෙක් පොතේ කතුවරයාට, නැතිනම් වීර චරිතයට ප්‍රශංසා කරයි. අවධානය සහිත ඔවුහු, ඔවුනට ආවේණික ලක්ෂණයක් වන ශාන්ත බවෙන් යුක්ත වෙති. එවැනි වේලාවලදී මම ඔවුන්ට බෙහෙවින් ඇලුම් කරමි. ඔවුහු ද මට යහපත් ලෙස සලකති. මට පහසු ගතියක් දැනිණි.

"පොත් කියවන විට අපට දැනෙන්නේ හිම කාලේ ඉවරවෙලා වසන්තය ආපු හැටියේම ජනේල රාමු ගලවලා ජනේල නිදහසේ අරිනවා වගෙයි." වරක් සිතානව් පැවසීය.

පොත් ලබාගැනීම අසීරු කරුණක් විය. පුස්තකාලයෙක සාමාජිකයකු වීමට තරම් වැටහෙන නුවණක් එවකට මට නොතිබිණි. එහෙත්, පොත් ලබාගැනීම සඳහා මම නොයෙකුත් දේ කළෙමි. හිඟාකන හිඟන්නකු මෙන් පොත් සොයා ඇවිදීම මගේ සිරිතක් විය. දවසක් දා ගිනි නිවන හමුදාවේ නිලධාරියෙක් මට ලේර්මන්තව්ගේ පොතක් දුන්නේය. කවියේ බල මහිමය මේ යැයි මම එයින් හඟින්නට වීමි. ජනතාව මත එය ප්‍රබල ලෙස බල පෑවේය.

'යකා' පිළිබඳ කවියේ ප්‍රථම පෙළෙහි සිටම සිතානව් පොත දෙසත්, අනතුරුව මගේ මුහුණ දෙසත් බැලූ සැටි මට මතකය. පින්සලය මේසය මත තබා දිගැති දෑත් දණහිස මත තබාගෙන ඔහු යම්තමින් වැනෙමින් මඳ සිනා පෑවේය. පැද්දෙන පුටුවෙන් හඬක් නිකුත් විය.

"සෝයුරනි නිහඬ වෙයල්ලා!" යැයි කී ලරිඕනිච් කරමින් සිටි වැඩ නවත්වා. මා පොත කියවමින් සිටි මේසය අසල වාඩිවී හුන් සිතානව් වෙත පැමිණියේය. ලේර්මන්තව්ගේ එම කවිය සුමිහිරි වේදනාවෙකින් මා සිත කලඹාලීය. මගේ කටහඬ පවා දෙදරුම් කන්නට විය. මට අකුරු පේළි පවා හරිහැටි නොපෙනුණේ දෙනෙත් කඳුළින් පිරුණු බැවිනි. එසේවතුදු වඩාත් මා සිත කැලඹුණේ චිත්‍රාගාරයෙහි සිටියවුන්ගේ පරෙස්සම්කාරී හැසිරීම නිසාය. ඔවුන් සියලු දෙනා චුම්බක ක්ෂේත්‍රයකින් මා වෙත ඇදගත්තාක් මෙනි. මා ප්‍රථම වෙළුම් කියවා අවසන් කරන විට ඔවුහු සියලු දෙනා මා වටා අඩ කවාකාරව රැස්වී, එකිනෙකාට හේත්තු වී වැලඳගෙන මඳ සිනා පෑවෝය.

"කියවපන්. කියවපන්" යැයි ෂිහර්යොව් කියුවේ පොත දෙසට හිස හරවමිනි.

මා කියවා අවසන් වත්ම, ඔහු පොත අරගෙන, එහි සිරස්තලය දෙස බලා, පොත කිහිලි ගන්නා ගෙන මෙසේ පැවසීය:

"මේ කවි කතාව ආපහු කියවන්න ඕන. හෙට නුඹ අපට කියවන්න ඕන! පොත මම හංගන්නම්."

ඔහු ලේර්මන්තව්ගේ කවි පොත මේස ලාච්චුවේ දමා යතුරු ලා වැඩ පටන් ගත්තේය. චිත්‍රාගාරයේ හැම තැනම නිහඬතාවකි. මිනිස්සු පරෙස්සමින් තම මේස වෙත ගියහ. සිතානව් ජනේලය අසලට ගොස්, නළල වීදුරුවට හේත්තු කොට ගෙන ගල් ගැසුණු විටෙක මෙන් සිටියේය. ෂිහර්යොව් යළිත් පින්සලය මේසය මත තබා දැඩි ලෙස කතා කළේය.

"ඔන්න ජීවිතයක හැටි, දෙවියන්ගේ වහලුනි... ආ!"

ඔහු දෙවුර ඔසවා හිස සඟවාගෙන දිගටම තම අදහස් කියා පෑවේය.

"ඒ කවි කතාවේ යක්ෂයාව මට අඳින්න වුණත් පුළුවනි. උගේ ශරීරය කළුයි. මවිල් පිරිලා. ඒවා දිගයි. උගේ පියාපත් දෙක රතු කහ ගිනි දලුවල පාටයි. මුහුණයි, අත් දෙකයි, දෙපයයි පෝයදාට පායන හඳ වගේ සුදු නිලට හුරුයි."

ඔහු රාත්‍රී ආහාරය ගැනීමට වේලාව එළැඹෙන තුරු නොසන්සුන් වූයේ ඔහුට නුපුරුදු ගතියෙකිනි. බංකු පුටුවේ වාඩිවී වටේට කරකැවෙමින් සිට ඇඟිලිවලින් ක්‍රීඩා කරමින් යකුන් ගැනත්, ගැහැනුන් ගැනත්. ඒවා සහ ස්වර්ග ලෝකය ගැනත්, සාන්තුවරයන් පවු කළ සැටිත් කියන්නට විය.

"මේ හැම දෙයක්ම ඇත්ත තමයි. සාන්තුවරයෝ පව්කාර ගැහැනුන් සමඟ පව් කරනවා නම්, පව්කාර යකාට පවිත්‍ර ගැහැනියක සමඟ උණුහුමට ඉන්න ආසා ඇතිවීම ඇත්තක් තමයි." හේ කිව්වේය.

ඔහුගේ කතාවට හැම දෙනාම නිහඬව සවන් දුන්හ. මට මෙන් අනික් අයටත් කතා කිරීමට ආසාවක් නැති වූවා විය හැකියි. ඔවුන් වැඩ කළේද කැමැත්තකින් නොවේ. වේලාව රාත්‍රී නවය වූ විගස චිත්‍ර ඇඳීම නැවැත්වූයේ එකවරමය.

සිතානව් සහ ෂිහර්යොව් ගෙමිදුලට ගිය විට මමද ඔවුන් පසු පසින් ගියෙමි. අහසේ තරු බලා සිතානව් මෙසේ පැවසීය:

ඇදෙති තවලම් සෙමින්, සෙමින්
විසුරුණු තරුකැල ඇති අවකාශයේ...

"මේ වගේ දෙයක් හිතින් හිතාගන්න බැහැ!"

"මට එක වචනයක්වත් මතක නැහැ." යි ෂිහර්යොව් කිව්වේ දැඩි ශීතල නිසා වෙවුලමිනි. "කිසි දෙයක් මතක නැති වුණාට මට ඒ දර්ශන පේනවා. පොත් කතුවරයා යකා ගැන අනුකම්පා කිරීමට අපට සැලැස්වූයේ මහ පුදුමාකාර විදිහටයි. නේද? ඇත්තටම යකා නිසා දුකක් ඇති වුණා නේද?"

"දුක සිතුණා" යැයි සිතානව් එකඟ විය.

"ඔන්න නියම මිනිහකුගේ හැටි." ෂියහර්යොව් කිව්වේ වැදගත් ලෙසිනි.

ගබඩා කාමරයට පැමිණි ඔහු, මට අනතුරු ඇඟවීය.

"කඩේට ගියාම නුඹ මේ පොත ගැන කාටවත් කියන්න එපා, මක්සීමිව්. මේ පොත සත්තකින්ම තහනම් කරපු එකක්!"

මම ප්‍රීතියට පත්වීමි: මීට කලකට පෙර පාපෝච්චාරණයට ගිය විට පූජකයා මගෙන් විමැසුවේ කිනම් පොත් ගැනද යන්න මට එවිට අවබෝධ විය.

එදින රාත්‍රී ආහාරය ගත්තේද මන්දෝත්සාහි ලෙසිනි. කෑකෝ ගැසීම් හා කතාබහවලින් තොරවය. ඉතා ගැඹුරු ලෙස කල්පනා කළ යුතු යම් කිසිවක් සිදුවූ විටෙක මෙනි. රාත්‍රී ආහාරයෙන් ඉක්බිතිව හැම දෙනාම නින්දට ගිය විට, ෂිහර්යොව් මට පොත දෙමින් මෙසේ පැවසීය:

"ඔන්න, ආයෙ පාරක් ඒ කතාව කියවාපන්. ඉක්මනට නොවෙයි හෙමිහිට...."

එවිට නිදා සිටියවුන්ගෙන් කීපදෙනෙක් නැඟිට ෂිහර්යොව් අසලින් මේසය වටේ වාඩිවුණේ රාත්‍රී කමිස පිටිනි. ඔවුහු කකුල් නමාගෙන වකුටු වූහ.

මා නැවතත් පොත කියවා අවසන් වූ විට, ෂිහර්යොව් ඇඟිල්ලකින් මේසයට තට්ටු කොට කතා කළේය.

"අනේ ජීවිතයක හැටි! යකා, තමයි යකා... කොහොමද උගේ හැටි ආ?"

සිතානව් මගේ උරහිසට උඩින් බලා යමක් කියවා, සිනාසෙමින් තම අදහස් පැවසීය.

"ඔය කොටස මගේ පොතේ ලියා ගන්නම්."

ෂිහර්යොව් නැඟිට පොත ගෙන ඔහුගේ මේසය වෙත යන්නේ, සැණෙකින් නැවතී අමනාපයෙන් මෙන් කතා කිරීමට පටන් ගත්තේ බිඳුණු හඬකිනි.

"අපි ජීවත් වන්නේ පොට්ට බලු පැටවුන් වගෙයි. කිසිම දෙයක් දන්නෙ නැතුවයි. අපව දෙවියන්ටත්, යකාටත් එපාවෙලා! දෙවියන්ගේ වහලා වන ඉඹව්, දෙවියන් සමඟ කතා කරලා තියෙනවා. දෙවියෝ මෝසස් සමඟත් කතා කරලා තියෙනවා. මෝසස්ට නම් තබනු ලැබුවේ දෙවියන් විසින්මය. එම නමේ තේරුම දේවගැතියා යනුයි. නමුත් අපි කාගෙද?"

පොත පෙට්ටියේ දමා වසා, කබාය හැඳගත් ෂිහර්යොව් සිතානව්ගෙන් ඇසුවේය.

"නුඹ තැබෑරුමට එනවද?"

"නැහැ, මම මගේ කෙල්ල ළඟට යනවා" යැයි ඔහු සෙමින් පිළිතුරු දුන්නේය.

ඔවුන් ගිය පසු, මම දොර අසල නිදා සිටින පාවෙල් ඔදින්සොව් ළඟින් වැතිර ගතිමි. ඔහු බොහෝ වේලාවක් දඟලා, නාසයෙන් හඬක් පිට කොට, සෙමින් අඬන්නට විය. "නුඹට මක් වෙලාද? මම ඇසුවෙමි.

"මට නුඹලා ගැන බොහොම කනගාටුයි. මම ඔවුන් සමඟ අවුරුදු හතරක් තිස්සේ ජීවත් වෙනවා. ඔවුන්ව හොඳට දන්නවා."

ඒ මිනිසුන් ගැන මසිතෙහිද දැඩි අනුකම්පාවෙක් උපනි. අපි දෙදෙනා බොහෝ වේලාවක් නොනිදා ඔවුන් ගැන මුමුන, මුමුනා කතා කළෙමු. ඔවුන්ගේ යහපත් සාධු ගතිගුණ ගැන කතා කළ අපි, එමඟින් අපේ ළමා අනුකම්පාව තවත් ගැඹුරු කළෙමු.

පාවෙල් ඔදින්සොව් සමඟ මම ඉතා මිත්‍ර ලෙස වාසය කළෙමි. පසු කලෙක ඔහු දක්ෂ චිත්‍ර ශිල්පියෙක් විය. එහෙත්, වැඩි කලකට නොවේ. ඔහුට වයස තිහක් වන විට ඔහු බේබද්දකු බවට පත් විය. ඉන් පසු කලෙක මොස්කව් නගරයේ හිත්රොව් වෙළඳ පොළේ පාදඩයකු මෙන් ඔහු රස්තියාදු වන සැටි මම දැක ඇත්තෙමි. ඔහු උණ සන්නිපාතයට හසුව මිය ගියහයි මේ නොබෝදා මට දැන ගන්නට ලැබිණි. මගේ ජීවිත කාලයේදී කිසිම තේරුමක් නැතිව මිය ගිය යහපත් මිනිසුන්ගේ සංඛ්‍යාව කොපමණදැයි සිතීම පවා බිය ගෙන දෙයි! මිනිස්සු සියලු දෙනා මහලු වී ජරාවට පත් වෙති. මෙය ස්වාභාවිකය. එහෙත්, අපේ මේ රුසියාවේ තරම් ඉතා ඉක්මනින් සහ තේරුම් විරහිතව මිනිසුන් ගෙවී ගොස් ජරපත්වී මිය යන තවත් වෙනත් රටක් නැත.

එහෙත්, එවකට ඔහු මට වඩා අවුරුදු දෙකක් වැඩිමල්, වටකුරු හිසක් ඇති කොලුපැංචෙක් විය. ඔහු කලහකාරයෙකි, නුවණැත්තෙකි. අවංක කෙනෙකි. ඔහුට සහජ කුසලතාවක්ද තිබිණි. ඔහු ඉතා ලස්සනට කුරුල්ලන්, බළලුන්, බල්ලන් ඇන්දේය. චිත්‍ර ශිල්පීන් හාස්‍යයට ලක් කරමින් ඔවුන්ගේ කාටුන් රූප ඇඳීම ඔහුගේ දීප්තිමත් හැකියාවක් විය. ඔහු ඔවුන් හැමදාම කාටූනයට නැඟුවේ පක්ෂීන්ගේ වේශයෙනි. සිතානව් එක කකුලෙන් සිටගත් 'කුලික්' කුරුල්ලකු ලෙසිනුත්,

ෂිහර්යොව් කරමලය කැඩුණු තට්ට හිසක් ඇති කුකුළකු ලෙසිනුත්, රෝගී දවීදව් ළිහිණියකු ලෙසිනුත් ඔහු ඇන්දේය. එහෙත්, ඔහුගේ ඉතාම හොඳ කාටූනය වූයේ කැටයම් ශිල්පී මහලු ගෝගලෙව් වවුලකු ලෙස විශාල කන්, වකුටු නාසය, නියපොතු හයක් බැගින් වූ කුඩා වවුලු පාද සහිතව ඇඳීමය. ඔහුගේ වටකුරු කළුවන් මුහුණේ සුදුවන් ඇස් තියුණු විලාසයක් මවා පෑවේය. ඇස්වල කණීනිකා කුඩා මෑ ඇටයකට සමානය. මේ කණීනිකා නිසා ජීවමාන එමෙන්ම, නීච බැල්මක් ගෝගලෙව්ගේ කාටූන චිත්‍රයට ලැබිණි.

චිත්‍ර ශිල්පීහු පාවෙල්ගේ කාටුන් නිසා අමනාප නොවූහ. එහෙත්, ගෝගලෙව්ගේ කාටූනය නිසා දැඩි අමනාපයක් අතිවූයෙන් ඔවුහු පාවෙල්ට උවදෙස් දුන්හ. "නුඹ ඕක ඉරාදාපන්! නැතිනම් නාකියා නුඹට පහර දේවි!"

කුණු පෙරාගෙන සිටි කුණු මහල්ලා නිතර බීගත් ගමන්ය. පුහු ආඩම්බරයෙකින් සහ නපුරු ගතියෙන් යුක්ත ඔහු චිත්‍රාගාරයේ සියලු දෙනාටම විරුද්ධව අයිතිකාරියට සහ කළමනාකරුවාට කේලාම් කීමට පුරුදුව සිටියේය. කළමනාකරුවා අයිතිකාරියගේ යෙහෙළිය සමඟ විවාහ වීමට ගිවිසගෙන සිටියෙන්, ඔහු චිත්‍රාගාරයේ සහ එහි වැඩ කරන සියලු දෙනාගේ හාම්පුතා යැයි සිතාගෙන ක්‍රියා කළේය. චිත්‍රශිල්පීහු මේ මිනිහාට වෛර කළ අතර ඔහුට බියවූ නිසා ගෝගලෙව්ටද බිය වූහ.

ගෝගලෙව්ට විනාඩියක හෝ සැනසීමක් නොදී, ඔහු නොයෙකුත් විදියේ අමාරුකම්වලට හෙළීමට නිතර ඉතා දැඩි ලෙස ක්‍රියා කළේ පාවෙල්ය. මමද නිතර පාහේ පාවෙල්ට උදව් දුනිමි. චිත්‍රාගාරයේ අනික් අය අපේ වැඩ නිසා විනෝදයක් ලැබූහ. අපේ එම විනෝද ක්‍රියා නිතරම වාගේ අනුකම්පා විරහිත, ගොරහැඩි ඒවා විය. චිත්‍ර ශිල්පියෝ නිතර අපට අනතුරු ඇඟවීමට ඉදිරිපත් වූහ.

"කොල්ලනේ, නුඹලාට ගුටි බැට ලැබේවි, කුස්කා කැරපොත්තා නුඹලාව එළවා දමාවි!"

කළමනාකරුට චිත්‍රාගාරයේ මිනිසුන් තබා ඇති විකට නාමය කුස්කා - කැරපොත්තාය.

ඔවුන්ගේ අනතුරු ඇඟවීම නිසා අපි බිය නොවීමු. නිදා සිටින මහල්ලාගේ මූණ අපි පාට කළෙමු. දවසක් කට ගොන්නක් බීගෙන නිදා සිටි ඔහුගේ නාසය අපි රත්රන් පාටින් ආලේප කළෙමු. දවස් තුනක් පසුවුණද, ඔහුගේ නාසයේ සිදුරුවලට කා වැදුණු එම ආලේපය ඉවත් කිරීමට ඔහුට නොහැකි විය. එහෙත්, මහල්ලාව කෝප කරවීමට අප සමත්වන හැම වාරයකදීම මට නැවේ වැඩකළ ව්‍යත්කා සෙබළා සිහිවිය. එවිට මසිතෙහි එක්තරා කලකිරීමක් හට ගත්තේය. ගෝගලෙව් මහල්ලකු වුවද, අපට පහර දීමෙහි ඔහු සමත් විය. ඔහු අපට මෙලෙස පහර දුන්නේ හිටිහැටියේම අප වෙත කඩා පනිමිනි. මෙලෙස පහර දීමෙන් අනතුරුව, ඔහු අපට විරුද්ධව අයිතිකාරියට දුක් ගැනවිලි ඉදිරිපත් කරයි.

හැමදාම මත්පැන් පානය කළ ඈ, එම හේතුව නිසාම කරුණාවක් පෙන්වමින් අප බිය ගැන්වීමට තැත් කරමින්, ඉදිමුණු අතින් මේසයට ගසා කෑ ගැසුවාය.

"යක්ෂයනේ. තොපි ආයෙමත් දඟ කරනවා නේද? ඒ මිනිහා මහල්ලා. ඔහුට ගරු කරන්න ඕන. වයින් වෙනුවට එයාගේ වීදුරුවට පොතොගෙන් වක්කළේ කවුද?"

"අපි තමා"

අයිතිකාරිය මවිතයට පත්වූවාය.

"අනේ දෙවියනි, මුන් බය නැතුව පිළිගන්න හැටි! ශාපලත් යක්ෂයනි. මහල්ලන්ට ගරු කළ යුතුයි!"

ඈ අප පන්නා දැමුවා. හවස කළමනාකරුවාට අපට විරුද්ධව චෝදනා කළාය. එවිට ඔහු මට සැරවිය.

"ඒ කෙහොමද නුඹ පොත් කියවනවා. ශුද්ධ වූ බයිබලය පවා කියවනවා. නමුත්, නුඹට මේතරම් මුරණ්ඩුකම් කොහින්ද? නුඹ පරෙස්සමින් හිටපන්!"

වැන්දඹු ගැහැනියක වූ අයිතිකාරිය දුකින් තැවුණාය. සුම්හිරි නලීවිකා පානය බී වෙරිමත් වී කවුළුව අසල වාඩිවන ඈ ගායනය පටන් ගනී.

කවුරුත් නැත මට අනුකම්පාවක්,
කවුරුත් නැත මගේ දුක දන්නේ.
මසිතෙහි ඇති දුක දන්නේ කවුරුන්ද?
දුක්බර දොම්නස කාට කියන්නද?

මහලු කට හඬෙකින් ඈ දිගටම අදින්නට පටන් ගනී.

"උ උඹ උඹ..."

වරක් ඈ තැම්බූ කිරි බඳුනක් අතින්ගෙන පඩි පෙළ අසල එමින් සිටියදී ඈ හිටි හැටියේම පය පැටලී බිම වැටුණාය. එවිට ඈ පඩි පෙළ දිගේ බිමට රෑට්ටා ගියේ ඇය අතින් ගෙන සිටි කිරි බඳුන අත නොහරිමිනි. මේ නිසා බඳුනේ කිරි ඇගේ ඇඳුම්වල තැවරිණි. ඈ දෑත් දිග හරිමින් කිරි බඳුන පණ ඇති සතෙකැයි සිතා එයට තරහෙන් කෑ ගැසුවාය.

"මොකද නුඹට යකා වැහිලාද? යන්නෙ කොහිද?"

ඇගේ ශරීරය ස්ථූල නොවූවද, ඉදිමීම නිසා මෘදුව එල්ලා වැටිණි. තවදුරටත් මීයන් ඇල්ලිය නොහැකි, එහෙත්, බඩ කට පුරා කා බී සිටින නිසා යම්තමින් මුරු මුරු ගාන, තම ජයග්‍රහණ සහ තෘප්තිමත් සිද්ධීන් ගැන මිහිරි ලෙස කල්පනා කරන, මහලු බැළලියකට ඕ සමාන වූවාය.

සිතානව් මුහුණ ඇඹුල් කර ගනිමින් තම අදහස් කියා පෑවේය.

"ඔන්න හොඳ චිත්‍රාගාරයක් තිබුණා. හොඳට වුවමනාවෙන් වැඩ කළා. 'මෙහි' වැඩ කටයුතු සියල්ල මෙහෙයැවූවේ හොඳ නුවණ ඇති මිනිහෙක්. දැන් ඉතින් ඒවා සියල්ල යකාට ගිහිල්ලා. වැඩපොළත් කුස්කාට අයිති වේවි! කොච්චර වැඩ කළත්, ඒවායේ පල ප්‍රයෝජන ලැබෙන්නේ පිට මිනිසුන්ටයි. ඔන්න ඒ ගැන කල්පනා කළාම, ඔළුවේ ඉස්කුරුප්පු ඇණයක් බුරුල් වෙනවා. එතකොට වැඩ කරන්න කිසිම සිතක් නැතුව යනවා. ගිම්හාන කාලයට වහල උඩට නැඟලා අහස දිහා බලා ගෙන ඉන්න තමයි සිතෙන්නේ..."

පාවෙල් ඔදින්සොව්ද සිතානව්ගේ එම චින්තනයට හවුල්කරුවෙක් විය. වැඩිහිටියකු මෙන් සිගරැට්ටුව උරමින් ඔහු දෙවියන්, බේබදුකම සහ ගැහැනු ගැනත්, එකතු කරන වැඩේ අනිකා අගය නොකරමින් සහ අවබෝධ නොකර ගනිමින් එය විනාශ කරන නිසා සියලු නිර්මාණ අතුරුදහන් වන බවත්, දාර්ශනික ලෙස විග්‍රහ කරන්නට පටන් ගත්තේය.

එවැනි අවස්ථාවලදී ඔහුගේ තියුණු මිහිරි මුහුණ වක රැලිවලින් පිරි මහල්ලකුගේ වෙස් ගත්තේය. ඔහු බිම දමාගත් මෙට්ටය මත දණහිස් බදාගෙන වාඩිවී, කවුළුවෙන් එපිට පෙනෙන නිල්වන් අහස දෙස බලාගත්වනම සිටියේය. හිම කැටිවලින් පිරී ඇති මඩුවේ වහල දෙසත්, ශීත සමයේ තරු දෙසත් ඔහු මෙලෙස බැලීමට පුරුදුව සිටියේය.

නිදා සිටින චිත්‍රශිල්පීහු ගොරවති. නින්දෙන් හඬ නඟති, වචන ගිලිමින් යමක් කියති, පොලාතිය හෙවත් පියස්සට යටින් සවි කර ඇති ලී මැස්සේ වැතිර සිටින කාස රෝගියෙකු වූ දවීදව් තම ජීවිතයේ ඉතිරි ටිකත් ගෙවීයන සේ කහින්න පටන් ගෙන ඇත. එක් මුල්ලක "දෙවියන්ගේ වහලුන්" වන කපෙන්දූහින්, සරෝකින් සහ පෙර්ෂින් එකට ඇලී නිදති. බිත්තියේ එල්ලා ඇති මුහුණ සහ අත්පා රහිත ඉකෝන රූප අප දෙස බලන විටෙක මෙනි. සායම් හා තීන්ත වර්ගවලත්, කුණු බිත්තරවලත්, ගෙබිමෙහි සිදුරු හා පැල්ම වැසී ඇති කුණු රොඩුවලත් දුගඳ නිසා හුස්ම ගැනීම පවා අපහසුය.

"මේගොල්ල නිසා මගේ සිත අනුකම්පාවෙන් පිරිලා! අනේ දෙවියනි!" යැයි පාවෙල් පවසයි.

මිනිසුන් නිසා ඔහුගේ සිතෙහි හටගන්නා මෙම අනුකම්පාව මගේ අසහනයට හේතු විය. අප දෙදෙනාගේම දැනීම අනුව, මා යට කී පරිදි, චිත්‍ර ශිල්පීහු යහපත් අය වූහ. එහෙත්, ඔවුනට තරම් නොවන මේ ජීවිතය අයහපත්ය, ඉසිලිය නොහැකි තරම් පාළුය. ශීත කාලයේ මහා හිම කුණාටු හමන විට මිහිපිට ඇති හැම දෙයක්ම ගෙවල්, ගස් ආදිය වැනෙමින්, සෙලවෙමින්, හඬනඟා විලාප ගසන විටත්, දේවස්ථානයේ සීනු හඬ පාස්කු මහා උපවාසය ළං වන බව දන්වමින් හඬ නඟන විටත්, චිත්‍රාගාරයේ වැඩ කරන මිනිසුන්ගේ සියලු ජෛවමය ගුණයන් පාගා දමමින් මූසල පාළු ගතිය ඊයම් බරු මෙන් ඔවුන් මත පතිත විය. එවිට ඔවුන් තැබෑරුමටත්, ගැහැනුන් වෙතටත් ඇදී ගියේ සියල්ල අමතක කරවන වොඩ්කා මෙන්, තැබෑරුම සහ ගැහැනුන් සේවය කළ බැවිනි.

එවැනි සැන්දෑවෙක පොත්වලින් පිටිවහලක් නොවීය. එවිට පාවෙලුත්, මමත් වෙනත් මාධ්‍යයන් මගින් මිනිසුන් විනෝදවත් කිරීමට උත්සාහ ගතිමු. අපි මුහුණු අළු සහ තීන්තවලින් පාට කරගතිමු. ලණුපටවලින් සැරසී අප විසින්ම ගොතන ලද විකට ජවනිකා රඟ පාමින්, මූසල පාළු ගතියට විරුද්ධව වීරෝදාර ලෙස රඟපාමින් මිනිසුන්ට සිනාසීමට සැලැස්වීමු. සෙබළෙකු විසින්, 'මහා ප්‍රයෝතර් රජු ගලවාගන්නා ලද සැටි අරබයා වූ කතාව' මතක් වී මම ඒ කතාව කට බසට නංවා, කාස රෝගී දවීදව් වැතිර සිටින පොලාතියට හෙවත් ලී මැස්සට නැඟ පාවෙල් සමග එක්වී රඟ පෑවෙමි. සිතින් මවා ගත් ස්වීඩන් ජාතික සතුරන්ගේ බෙලි කපන විට ප්‍රේක්ෂකයෝ මහ හඬින් සිනාසුණහ.

අපේ ප්‍රේක්ෂකයන්ගේ සිත් විශේෂයෙන්ම ඇද ගත්තෙ ත්සිගාන් යු.තොන්ග් නමැති චීන යකාගේ කතාවය. පාවෙල්, හොඳ යමක් කිරීමට තැත් කරන චීන යකාගේ කොටස රඟ පෑ අතර, මම ඒ කතාවට අයත් ඉතිරි චරිත රඟ පෑවෙමි. ස්ත්‍රී පුරුෂයන්ගේ චරිතද, කතා කරන අප්‍රාණික දේ පමණක් නොව, යකා විවේක ගන්නා ගල් කැටයද රඟ පා පෙන්වීම මට අයිති විය. චීන යකා හොඳ යමක් කිරීමට ගොස් එය වැරැදුණු විට සිත් තැවුලෙන් යුතුව විවේක ගන්නේ මේ ගල් කැටය මතය.

ප්‍රේක්ෂකයෝ මහ හඬින් සිනාසුණහ. ඔවුන් මේ තරම් ලෙහෙසියෙන් සිනාසීම විසින් මම මවිතයට පත්වීමි. එම ලෙහෙසි පහසු බව මසිතෙහි අමනාපයක් පවා ඇති කළේය.

"අනේ කවටයෝ, හරිම යක්පැටව්" ඔවුහු අපට කෑගැසූහ.

මේ මිනිසුන්ගේ සිතට ප්‍රීතියට වඩා දුක සමීපය යන මතය මෙවැනි දේ වැඩියෙන් කරත්ම මසිතට වඩාත් තදින් ඇතුළු විය.

ප්‍රීතිය හැමදාම තනිවම ජීවත්වන්නේ නැති අතර, එය අගය කිරීමද ඉඛේට සිදු නොවෙයි. රුසියානුවන්ගේ නිදිබර කාන්සිය මරාදැමීම පිණිස මාධ්‍යයක් ලෙස එය ගුප්තමය ස්ථානයෙකින් ගොඩගත යුතුය. සැක කටයුතු

අභ්‍යන්තරික බලයක් වන ප්‍රීතිය ඉබේටම පැන නඟින්නේ නෑ. එය ජීවත්වීමට ආසා නැති නිසා නොවෙයි. කනගාටුදායක දවස්වලදී කරන ඉල්ලුම අනුව පමණක් එය ඉදිරිපත් වන බැවිනි.

රුසියානු ප්‍රීතිය නිතර පාහේ බලාපොරොත්තු රහිත ලෙස දුෂ්ට නාට්‍යයක් බවට පරිවර්තනය වෙයි. මිනිහෙක් ඔහු බැඳ ඇති යදම් බිඳින්නාක් මෙන්, එයින් නිදහස් වී නටයි. එවිට ඔහු, ඔහුගේ අභ්‍යන්තරයෙහි සිටින එම තිරිසනා මුදාලයි. තිරිසනකුගේ පාළු, කාන්සියෙන් යුතුව ඔහු හැම කෙනෙකුටත්, හැම දෙයකටත් පහර දෙයි. කඩා, සපා කා විනාශ කරයි.

තටමමින් ලබන මෙම ප්‍රීතිය ඇති වන්නේ අභ්‍යන්තරයේ සිට පැන නඟින පිම්වලිනි. ස්වයං අමතකවීමක් සහිත කිපීමක් දක්වා මෙය මා පොලඹවයි. මසිතෙහි හිටි හැටියේම පැන නඟින දේ මම කතාවකට ගොතා කියන්නත්, නාට්‍ය විලාසයකින් රඟපෑමටත් ඉදිරිපත් වෙමි. මිනිසුන් තුළ සැබෑ, නිදහස් සහ සැහැල්ලු ප්‍රීතියක් ඇති කරලීම මගේ ඉමහත් අභිලාෂය විය. යමක් කිරීමට මා සමත් වූ විට මට පැසසූහ. එයින් මම මවිතයට පත්වූයෙමි. එසේ වුවද, සොලවා දැමීමට මා සමත් වූ ඒ මූසල පාළු බව යළිත් සෙමින්, සෙමින් සනවී, ශක්තිමත් වී මිනිසුන් ඇද ගැනීමට පටන් ගත්තේය.

දුක්මුසු ලරිඕනිච් සුරතල් ලෙස මට කතා කළේය.

"නුඹ නම් හරිම දඟකාර කොලුපැංචෙක්. නුඹට දෙවි පිහිටයි!"

ඔහුගේ අදහස අනුමත කළ ෂිහර්යොව් මෙසේ පැවසීය:

"මක්සීමිච්. නුඹ සර්කස් මඩුවට නැතිනම් නෘත්‍ය ශාලාවට පලයන්. නුඹට දක්ෂ නළුවෙක් වීමට පුළුවනි!"

නත්තල් නිවාඩු හා වසන්ත උත්සව දවස්වල දී චිත්‍රාගාරයේ සියලු දෙනාගෙන් නෘත්‍ය බැලීමට ගියේ කපෙන්දූහින් සහ සිතානව් පමණකි. අනික් අය " ජෝර්දානයේ" ජල උල්පත්වලින් ස්නානය කොට පව් සමාකර ගන්නා ලෙස මේ දෙදෙනාට උපදෙස් දුන්හ. සිතානව් මට නිතර, නිතර ඒත්තු ගැන්වීමට උත්සාහ

කළේය.

"ඕව සේරම අතහැර දමලා, නළුවකු වීමට ඉගෙන ගනින්!"

ඔහු කැලඹීමෙන් යුතුව 'යාකොව්ලෙව් නළුවාගේ ජීවිතය' අරබයා වූ දුක්බර කතාව මට කිව්වේය.

"ඔන්න ඔවැනි දේ වෙන්න පුළුවනි!"

ඔහු මරියා ස්ටූවට් රැජින ගැන කතා කීමට ආසා කළ අතර, ඇය හැඳින්වූයේ 'තක්කඩි ගෑනි' නමිනි. ඒ අතර ඔහු 'ස්පාඤ්ඤ ජාතික රදල ප්‍රභුවරයා' නිසා ඉමහත් ප්‍රබෝධයක් හා උද්දාමයක් ලැබීය.

"දොන් සෙසර් දෙබසාහ් ඉතාම උදාර පුද්ගලයෙක්, පුදුමාකාර පුද්ගලයෙක්. මක්සීමිච්!"

සිතානව්ද සමහර චරිත ලක්ෂණ අතින් ඒ ස්පාඤ්ඤ ප්‍රභුවරයාට සමාන විය. දවසක් දා චතුරශ්‍රයේ ගිනි නිවන හමුදා කණුව අසල, ගිනි නිවන හමුදා භටයෝ තිදෙනෙක් අහිංසක ගැමියෙකුට පහර දෙමින් විනෝද වූහ. මේ පහර දීම බලා සිටි මිනිස්සු හතළිහක් පමණ වූ පිරිස භටයන්ට ප්‍රශංසා කරමින් ආවැඩූහ. සිතානව් ඉදිරියට පැන තම දිගැති අත්වලින් භටයන්ට වේගවත් ලෙස පහර දී වැටී සිටි ගැමියා ඔසවා රැස්ව සිටියවුනට භාර දී මෙසේ පැවසීය:

"මේ මිනිහාව ගෙනියපල්ලා!"

සිතානව් භටයන් තිදෙනාට විරුද්ධව තනිවම සටන් කළේය. එහෙත්, ගිනි නිවන හමුදා කඳවුර තිබුණේ අඩි දහයක් පමණ ඈතිනි. එකකු හමුදා කඳවුරේ භටයන්ට අඬ ගැසුවේ නම්, සිතානව් මරණය තෙක් ගුටි කෑමට වුව ඉඩ තිබිණි. එසේ වුවද, බිය වූ භටයෝ තිදෙනා පලා ගියහ.

"තොපි බල්ලෝ!" යැයි පලා යන භටයන්ට ඔහු කෑගැසීය.

ඉරිදා දවස්වලට අපේ තරුණයන් ලෙස්නි වත්තට ගියේ, රාත්‍රී මුරයේ වැඩ කරන කසළසෝධක කම්කරුවන්ට සහ අවට ගම්වල ගොවීන්ට විරුද්ධව බොක්සිං මල්ලව ක්‍රීඩාවේ යෙදීමටය. ලෙස්නි වත්ත පෙත්රොපාව්ලව්ස්කි සුසාන භූමියට එපිටින් පිහිටියේය.

නගරයේ තරුණයන්ට විරුද්ධව රාත්‍රී මුරයේ වැඩ කරන කම්කරුවෝ මොර්ද්වින් ජාතික යෝධයකු ඉදිරිපත් කළෝය. කුඩා හිසක් සහ කඳුළු ගලන රෝගී ඇස් ඇති යෝධයකු වූ ඔහු, කුණු සහිත කෙටි කප්තාන් කබායෙන් ඇස් පිසදමාගෙන, කම්කරු පිරිස ඉදිරියෙන් සිටගෙන සුහද සිතින් අභියෝග කළේය.

"එනවා නම් වරෙල්ල! හීතලට ඇඟ රත් කර ගනිමු!"

ඔහුට විරුද්ධව හැමදාම අපේ පැත්තෙන් සටනට ඉදිරිපත් වූයේ කපෙන්දූහින්ය. එහෙත්, ඔහු හැමදාම මෝර්ද්වින් ජාතිකයාගෙන් ගුටි කෑවේය. ලේ පෙරමින්, හතිලමින් කපෙන්දූහින් සිය අධිෂ්ඨානය පළ කළේය.

"මොර්ද්විනයාව පරද්දන්නේ නැතිනම් මට ජීවත් වෙලා පලක් නැහැ!"

අවසානයේදී කපෙන්දූහීන්ගේ ජීවිතයේ අරමුණ වූයේ මොර්ද්විනයා පරාජය කිරීමය. ඔහු වොඩ්කා පානය කිරීම පවා අතහැර හැමදාම රාත්‍රී නින්දට පෙර සිරුර හිමවලින් පිරි මැදීමටද පටන් ගත්තේය. මාංස පේශීන් වර්ධනය කිරීම සඳහා බොහෝ සේ මස් අනුභව කරමින් ඔහු රාත්තල් 70 ක් බරැති යකඩ බෝලවලින් ව්‍යායාම් කිරීම ඇරඹීය. එහෙත්, එය පවා ඔහුට ආධාර නොවීය. එවිට ඔහු අත්වැසුම්වලට යටින් ඊයම් කැබැලි දමා මසමින් සිතානව් ඉදිරියේ වහසි බස් දොඩවන්නට විය.

"දැන් ඉතින් මොර්ද්විනයාගේ අවසානය ළං වුණා!"

සිතානව් ඔහුට දැඩි ලෙසම අනතුරු ඇඟවීය.

"ඒක වීසි කරපන්! නැතිනම් මම නුඹව පාවා දෙනවා!"

එහෙත්, කපෙන්දූහින් ඔහුගේ කීම විශ්වාස නොකළේය. ඔහු බොක්සිං මල්ලව පොරයට පැමිණි විට, සිතානව් ඉදිරියට පැන මොර්ද්වින් ජාතික යෝධයා අමතා මෙසේ පැවසීය:

"වසීල ඉවානිච්, අද නුඹ වෙනුවට මම කපෙන්දූහින් සමඟ පොරයට ඉදිරිපත් වෙනවා!"

එවිට කපොන්දූහින්ගේ මුහුණ දම් පැහැ ගත්තෙන්, ඔහු කෑ ගැසීය.

"මම නුඹත් සමඟ පොරයට කැමැති නැහැ. පලයන් යන්න!"

"වරෙන්! වරෙන්" යැයි කියමින් කපෙන්දූහින් දෙස එක එල්ලේ බලමින් සිතානව් ඉදිරියට යත්ම, ඔහු එක තැන නැවතී සිට අත්වැසුම් ඇතුළේ තිබුණු ඊයම් කෑලි ගලවා ඒවා කමිසය යට දමාගෙන ඉවත් විය.

අපේ පිලත්, සතුරු පිලත් අසතුටින් මවිත විය. ගරු කටයුතු මහල්ලෙක් සිතානව් අමතා කතා කළේ කෝපයෙනි.

"නුඹලාගේ අභ්‍යන්තර වැඩ දෙනෝදහක් ඉදිරිපිට සටනකින් තීරණය කිරීම නීත්‍යානුකූල නොවෙයි. මල්ලී!"

එවිට සිතානව් වෙත හැම පැත්තෙන්ම කඩා පනින්න වූහ. ඔහු බොහෝ වේලාවක් නිහඬව සිට, අවසානයේදී ගරු කටයුතු මහල්ලාට පිළිතුරු දුන්නේය.

"හෙඳයි. මම මිනී මැරුමකින් මිනිහකුව ගලවා ගත්තා නම්!"

එවිට ඒ මිනිහා ඔහුගේ කතාවේ අරුත් තේරුම් ගත්තෙන්, හිස් වැස්ම ගලවා සිතානව්ට ආචාර කොට මෙසේ පැවසීය:

"එහෙනම් නුඹට අපේ පැත්තෙන් කෘතඥතාව පුද කරනවා!"

"මාමේ නුඹ මේ ගැන ඕනෑවට වැඩිය දොඩවන්න එපා!"

"ඒ මොකද? කපෙන්දූහින් ඉතා හොඳ මල්ලව පොර කාරයෙක්. එහෙත්, හැමදාම පරාජයට පත් වුණාම මිනිහෙක් කෝපයට පත් වෙනවා. දැන් ඉතින් අපි පොරය පටන් ගන්න පෙර ඔහුගේ අත් වැසුම් හොඳට හොදිසි කරනවා" යැයි මහල්ලා පැවසීය.

"ඒක ඔය ගොල්ලන්ගේ වැඩක්!"

මහල්ලා ඉවත්ව ගිය පසු අපේ පිල සිතානව්ට දොස් නඟන්නට විය.

"නුඹට මොන යකා වැහුණද! අපේ එකාට ජය ගන්න තිබුණා. දැන් ඉතින් අපි පැරදිලා බුම්මාගෙන ඉන්න ඕන...."

අපේ පිලේ මිනිස්සු ඔහුට බොහෝ වේලාවක් තිස්සේ ඉමහත් තෘප්තියෙකින් බැණ වැදුණහ.

එවිට සිතානව් සුසුම් ලා මෙසේ පැවසීය:

"නුඹලා වැදගැම්මකට නැති එවුන්...!"

හැම දෙනකුම බලාපොරොත්තු නොවූ පරිදි ඔහු මොර්ද්වින් යෝධයාට සටනකට අභියෝග කළේය. මොර්ද්විනයා සටනට සුදුසු ඉරියව්වෙකින් සිට ගනිමින්, ඉමහත් සතුටින් දෑත් වනමින් වහසි බස් දොඩවන්නට විය.

"බොක්සිං ගහලා ඇඟ රත් කරගනිමු."

එවිට අවට සිටියහු අත්වැල් බැඳගෙන කවාකාරව සිට ගත්හ.

පොරකරුවන් දෙදෙනා එකිනෙකා දෙස තියුණු ලෙස බලමින් මිට මෙළවූ දකුණත දිගු කර ගෙන, වමත පපුව ඉදිරියේ තබා ගනිමින් පොරයට සූදානම් වූහ. සිතානව්ගේ දෑත්, මොර්ද්විනයාගේ දෑත්වලට වඩා දිගු බව පළපුරුදුකරුවන්ට පෙනිණි. දෙදෙනාගේ පයට පෑගෙන හිම 'කර කර' හඬක් නැඟීය. යමෙකුට නොසන්සුන්තාව උහුලා ගැනීමට නොහැකි වූයෙන්, දුක් ගැනවිල්ලක් ලෙසින් හා ගිජු ලෙසින් මුමුනන්නට විය.

"දැන්වත් ඉතින් පටන් ගත්තා නම්..."

සිතානව් දකුණත එල්ල කරත්ම, මොර්ද්වින් යෝධයා ආරක්ෂාව සඳහා වමත එසවීය. එවිට සැණෙකින් මොර්ද්විනයාගේ පපුවට සිතානව් ගැසුවේ බලවත් වමත් පහරකි. ඔහු හඬක් නඟා පසු බසින්නේ තෘප්තියෙකින් මෙසේ පැවසීය.

"මූ තරුණ වුණාට මෝඩයෙක් නොවෙයි!"

දෙදෙනා එකිනෙකාට එරෙහිව පනිමින් ඔවුනොවුන්ගේ පපුවලට අනින්නට වූහ. විනාඩි කීපයක් තිස්සේ මෙලෙස ඔවුන් එකිනෙකාට පහර දෙන්නට වූ විට, අපේ පිලත් සතුරු පිලත් කෑ ගසන්නට වූයේ නොසන්සුන් ලෙසිනි.

"දේව රූප පින්තාරුකාරයා උගේ මූණ චප්ප කරපන්, සිත්තරා අරූගේ මූණට වැඩ දාපන්!"

මොර්ද්වින් යෝධයා, සිතානව්ට වඩා බෙහෙවින් ශක්තිමත් විය. එහෙත්, ඔහු බරින් වඩාත් වැඩි වූයෙන්, ඔහු ගහන එක පහරකට, සිතානව්ගෙන් ඔහුට පහර දෙක, තුනක්ම ලැබිණි. මොර්ද්වින්ගේ සිරුර පහර ලැබුවද, එයින් ඔහු පීඩා විඳින සැටියෙක් පෙනෙන්නට

නොතිබිණි. පහර කන ඔහු 'නුහ්' ශබ්දය නඟමින් මඳ සිනාපාන්නේ හිටි හැටියේම සිතානව්ගේ උරහිසට වැරෙන් පහරක් ගැසුවෙන් ඔහුගේ උර ඇටය දොට්ට පැන්නේය.

"සටන නවත්වාපල්ලා! හරි පොර! ජය පරාජයක් නැහැ" යි රැස්ව සිටියවුන්ගෙන් වැඩි දෙනෙක් කෑ ගැසූහ.

මෝර්ද්වින් යෝධයා සුහද සිතින් තම අදහස් කියා පෑවේය.

"පින්තාරුකාරයාට හයිය මඳි, නමුත්, මිනිහා බොහොම කඩිසරයි. හොඳ බොක්සිංකාරයෙක් වේවි. මම එහෙම කියන්නේ දෙනෝ දහක් ඉදිරිපිට."

ඉන් අනතුරුව ගැටවරයෝ සමූහ වශයෙන් පොර කෑමට ඉදිරිපත් වූහ. මම සිතානව් කැඩුම් බිඳුම්වලට වෙදකම් කරන ඇපෝතිකරි වෙත ගෙන ගියෙමි. සිතානව්ගේ මේ උදාර ක්‍රියාව නිසා ඔහුට ඇති මගේ ගෞරවය තවත් වැඩි විය. එයත් සමඟම සුහද මිත්‍රත්වයද වඩාත් තහවුරු විය.

සිතානව් බෙහෙවින්ම, සත්‍යවාදී, අවංක පුද්ගලයකු වූ අතර, එය ඔහුගේ යුතුකමක් නැතිනම් රාජකාර්යයක් ලෙස ඔහු දුටුවේය. එහෙත්, කපෙන්දූහින් දක්ෂ ලෙස ඔහු සිනහවට හසු කළේය.

"අනේ ජේන්යා සිතානව්, නුඹ බොරු ප්‍රදර්ශනයට ජීවත් වෙනවා. උත්සවයට ඉස්සෙල්ලා මදින සමවාරය වගේ අධ්‍යාත්මය පවිත්‍ර කරගත්තා. ඉතින් නුඹ දිලිසෙනවා කියලා ආඩම්බර වෙලා කයිවාරු ගහනවා. ඒ වුණාට නුඹේ අධ්‍යාත්මය තබක්ක වගෙයි. නුඹව ආශ්‍රය කිරීම මහ ගෝතකරුමයක්."

සිතානව් සන්සුන් ලෙස නිහඬ වෙමින් ඉමහත් වුවමනාවෙකින් වැඩ කළේය. නැතිනම් ලෙර්මන්තව්ගේ කවි කොපි පොතක ලියා ගන්නට විය. ඔහුගේ මුළු නිවාඩු කාලයම යෙදවූයේ කවි ලියා ගැනීමටය.

"නුඹට සල්ලි තියෙන හන්දා පොතක් මිලදී ගනින්" යැයි මා කී විට ඔහු එම යෝජනාව බැහැර කළේය.

"නැහැ, වඩාත් හොඳයි අතින් පිටපත් කරගන්නවා."

කුඩා ලස්සන අත් අකුරුවලින් කවි පිටපත් කරගන්නා සිතානව් ඒවාට විසිතුරු වැඩ දමයි. තීන්ත වේළෙන තුරු බලා සිටිමින්, ලෙර්මන්තව්ගේ කවියක් සෙමින් කියවයි.

දුකින් තොර, ඇසුරෙන් තොර
බලනු ඇත නුඹ මිහිතලය.
නැත. එහි සැබෑ වාසනාව,
නැත එහි සදාකාලික අලංකාරය

අනතුරුව ඔහු දෙනෙත් හකුළුවා ගනිමින් මෙසේ පවසයි:

"ඒ කතාව ඇත්ත! මේ කවියා සැබෑ සත්‍යය බොහොම හොඳට දන්නවා!"

සිතානව් සහ කපෙන්දූහින් අතර ඇති සබඳතාව මා නිතර මවිතයට පත් කළේය. කට ගොන්නක් බී ගත් කපෙන්දූහින් හැමදා ගුටි කෙළියට ඉදිරිපත් විය. සිතානව් බොහෝ වේලාවක් තිස්සේ බීගත් කොසාකයා නවත්වා ලීමට උත්සාහ ගත්තේය.

"නිකම් ඉඳපන්, ඇඟේ එල්ලෙන්න එපා!"

අනතුරුව සිතානව් කොතරම් නපුරු ලෙස කපෙන්දූහින්ට පහර දුන්නේදයත්, සගයන් දෙදෙනා අතර වූ මේ ගුටි කෙළිය මුලදී විනෝදයක් ලෙස සැලකූ ජ්‍යෙෂ්ඨ ශිල්පීහු, මේ දෙදෙනා දෙපැත්තට වෙන්කිරීමට පවා ඉදිරිපත් වූහ.

"සිතානව්ව වේලාසනින් නැවැත්වූයේ නැතිනම් ඌ අනිකාට මැරෙනතුරු පහර දේවි. අනුකම්පා නැතුව ගුටි අනීවි" යි ඔවුහු පැවසුවෝය.

කපෙන්දූහින් මත්පැන් නොබී සිටින විටදී පවා සිතානව්ට සිනාසීමට ඉදිරිපත් විය. හේ ඔහුගේ කවි ලිවීමේ ආසාවත්, අවාසනාවත් ආලයත් කැත විදිහට විවේචනය කළද, සීතානව්ගේ ඊර්ෂ්‍යාව කුප්පාලීමට අසමත් විය. කොසාකයාගේ උපහාසයන්ට සිතානව් සවන් දුන්නේ නිහඬවය, අමනාපයෙන් තොරවය. සමහර විට ඔහු කපෙන්දූහින් සමඟ එකතු වී සිනාසුණේය.

දෙදෙනා ළඟින් රෑට එක තැන නිදාගත් අතර, බොහෝ වේලාවක් යන තුරු කසුකුසු ගාමින් කතා කළහ.

ඔවුන්ගේ මේ කසුකුසුව මසිතට අස්වැසිල්ලක්

නොදිණි. එකිනෙකාට හාත්පසින්ම ප්‍රතිවිරුද්ධ ගති ගුණ ඇති දෙදෙනෙක් මෙලෙස කසුකුසු ගාමින් කතා කරන්නේ මොනවා ගැනද? එහෙත්, මා ඔවුන් අසලට යත්ම කොසාක කපෙන්දූහිනයා බුරන්නට විය.

"නුඹට ඕන මොනවද?"

සිතානව් මා නොදුටු විටෙක මෙන් සිටියේය.

එහෙත්, දවසක් ඔවුන් මා කැඳවූ අතර, කොසාකයා මගෙන් ප්‍රශ්න කළේය.

"මක්සීමිච්, නුඹ පොහොසතෙක් වුණොත් කරන්නේ මොනවාද?"

"පොත් ගොඩක් සල්ලිවලට ගන්නවා."

"ඉතින් ඊට පස්සෙ?"

"දන්නෙ නැහැ" මම කිව්වෙමි.

"අනේ බං" යැයි කී කපෙන්දූහින් මගෙන් ඉවත් වූයේ දිරිසුන් දොම්නසිනි. එහෙත්, සිතානව් සන්සුන් ලෙස කතා කළේය.

"ජේනවා නේද මහල්ලොත්, පොඩි එවුනුත් මේ ගැන දන්නෙ නැහැ! ධනය තනිකර ගත්තාම එයින් ඇති පලයක් නැහැ කියල මම නුඹට කියනවා. මේවා යම් කිසි අරමුණකට යොදවන්න ඕන."

"කතා කරන්නෙ මොනවා ගැනද?" මම ඔවුන්ගෙන් විමැසීමි.

"නිදාගන්න හිතක් නැහැ. ඒ නිසා කතා කරනවා." යැයි පිළිතුරු දුන්නේ කපෙන්දූහින්ය.

පසු කලෙක ඔවුන්ගේ කතාබහවලට මා සවන් දුන් විට, මිනිසුන් දිවා කාලයේ කතා කරන දේ ගැනම ඔවුන් රාත්‍රී කාලයේදීත් කතා කරන බව මම දැනගතිමි. දෙවියනි, සත්‍යය, වාසනාව, ස්ත්‍රීන්ගේ මෝඩකම් සහ මායම්. ධනවතුන්ගේ කෑදරකම ආදී දේ ගැන එනම්, මුළු මහත් ජීවිතයම ව්‍යාකූල කොට, අවබෝධ කරගත නොහැකි තත්ත්වයකට ඇද දමා තිබෙන දේ ගැන ඔවුන් කතා කරන සැටි මට ඇසිණි.

මා හැමදාම එම කතාවලට සවන් දුන්නේ ගිජු බවකිනි. ඒ කතා මගේ සිත කලඹාලීය. සියලු මිනිසුන් එක හා සමාන ලෙස කතා කිරීම මගේ සිත් ගත්තේය. ජීවිතය

අයහපත්ය. වඩාත් හොඳට ජීවත් විය යුතුය! එහෙත්, වඩාත් හොඳින් ජීවත් වීමේ අභිලාෂය කිසි දෙයකට බල නොපාන සැටිත්, චිත්‍රශිල්පීන් එකිනෙකා අතර ඇති සබඳතාවන් අනුව චිත්‍රාගාරයේ කිසිවක් වෙනස් නොවන සැටිත් ඒ අතර මට පෙනෙන්නට විය. මේ සියලු කතා බහ මා ඉදිරියේ ඇති ජීවිතය ආලෝකවත් කරමින්, එය පිටුපසින් යම් කිසි මූසල කුසීත පුහුබවක් පෙන්වාලීය. මෙන්න මේ පුහුබවෙහි මිනිසුන් අඳෝ සංසාරයක් නැතිව පාවෙමින්, මෙලෙස හැසිරීම තේරුම් විරහිත යැයි කියමින් එකිනෙකා අමනාප කරගන්නේ, විශාල ජලාශයක අරමුණක් රහිතව පාවෙන කුණු රොඩු ලෙසිනි.

බොහෝ සෙයින් හා බොහෝ කැමැත්තෙන් තර්ක කරන ඔවුහු කිසිවකු හෙළා දුටුවහ. දිවුරා බණිමින් තමන් ගැනම පුරසාරම් දෙඩූහ. පුහු දේවල් මුල් කරගෙන සණ්ඩු කර ගත්හ. එකිනෙකාට එරෙහිව දැඩි අමනාපකම් පෑවෝය. තම මරණයෙන් මතු කුමක් වෙතිදැයි සිතුවෝය. එහෙත්, චිත්‍රාගාරය අසල කුණු බක්කිය තිබෙන තැන පොළොව දිරාපත්වී තිබිණි. පොළොව යටින් තිබුණු ඒ දිරාපත් දුගඳ හමන තෙතමනය සහිත සිදුරෙන් ශීතල බිම් ගඳ සහිත සුළඟක් හැමීය. එයින් අපේ දෙපා ශීතල විය. පාවෙල් සහ මම එකතු වී එම සිදුරු පිදුරු සහ පාන්කඩවලින් වැසීමු. බිමට අල්ලා ඇති ලී වෙනුවට අලුත් ලී සවිකළ යුතු බව නිතර පාහේ මතක් කළද, එම සිදුර වඩාත් විශාල විය. හිම කුණාටු හමන විට, එයින් බටයකින් මෙන් දැඩි ශීතල පිටවිය. ඒ නිසා මිනිසුන්ට සෙම්ප්‍රතිෂ්‍යාව සැදුණෙන්, ඔවුහු කහින්නට පටන් ගත්හ. ජනේලය මුල්ලෙහි වූ කුඩා කවාටයෙන් ඉතා අමිහිරි හඬක් පිටවිය. එම හඬ පිටවන විට එය අසා එයට බැණ වැදුණහ. වරක් මම එම කවාටයේ කුඩා සරණේරුවට තෙල් ගෑවෙමි. එවිට ෂිහර්යොව් හඬ පිට නොවන සැටි අසා මෙසේ පැවසීය:

"කවාටය හූ කියන්නෙ නැහැ. හරිම පාළුයි!"

උතුරන වතුර නා ගෙන එන ඔවුහු කුණු සහ දූලි සහිත ඇඳන්වල වැතුරුණහ. කුණු සහ දහදිය ගඳ ඔවුන් ගණන් ගත්තේවත් නැත. ජීවිතයට බාධා කරන බොහෝ කුඩා

දේ තිබුණු අතර, ඒවා නැති කරලීමටද හැකියාවක් තිබුණු නමුදු, කිසිවෙක් එවැන්නක් කිරීමට ඉදිරිපත් නොවූහ.

නිතර ඔවුහු මෙසේ කීමට පුරුදුව සිටියහ.

"මිනිසුන්ට කිසිවෙක් අනුකම්පාව දක්වන්නේ නැහැ. දෙවියන්වත්, තමන්වත් තමන් ගැන නැත කිසි අනුකම්පා...."

අප, එනම් පාවෙල් සහ මා කුණු සහ මකුණන්ගෙන් පීඩා විඳිමින් සිටි දවීදව්ගේ සිරුර සෝදා පවිත්‍ර කළ විට, චිත්‍රාගාරයේ අනික් අය අපට සරදම් සිනා පෑහ. ඔවුන් ඔවුන්ගේ කමිස ගලවමින් එහි ඇති මකුණන් සොයන ලෙස ඉල්ලා සිටියේ, අප නාන ගෙදර ඇඟ අතුල්ලන්නන් යැයි කියමිනි. පොදුවේ අප අවඥාවට ලක් කරමින්, අප නින්දා සහගත එමෙන්ම, ඉතා හාස්‍යජනක යමක් කළ බව කියමින් සමච්චල් කළෝය.

නත්තල් සමයේ සිට පාස්කු කාලය දක්වා කාස රෝගී දවීදව් පොලාති මැස්සේ වැතිරගෙන දිගින් දිගටම කහිමින් ලේ මුසු සෙම කැටි සමඟ බිමට කෙළ ගැසීය. කුණු බාල්දිය දෙසට කෙළ ගැසුවද, ලේ කැටි බිමට විහිදිණි. රාත්‍රී කාලයේ ඔහු විකාරයෙන් කෑ ගසන විට අපි අවදි වීමු.

"මොහුව රෝහලට ගෙනියන්න ඕනෑ" යැයි ඔවුහු නිතර පාහේ කිව්වෝය.

මුලදී දවීදව්ගේ දේශීය පාස්පෝට් බලපත්‍රයේ කාල සීමාව අවලංගු වී තිබිණි. අනතුරුව ඔහුට එක්තරා සුවයක් ලැබී තිබෙන සැටියෙක් පෙනිණි. එහෙත්, පසුවන විට ඔවුන්ගේ තීරණය මෙසේ විය:

"දැන් ඉතින් දවීදව් ඉක්මනට මැරිල යාවි."

"ඔව්, මම ඉක්මනට මැරෙනවා!" යැයි හේ පැවසීය.

ඔහු ද විහිළුවෙහි දක්ෂයෙක් වූයෙන්, චිත්‍රාගාරයේ ඇතිවන නපුරු මූසල ගති වළක්වාලීම සඳහා නිතර පරිශ්‍රම දැරීය. විහිළු කතා කියමින් ඔහු, ඔහුගේ හිස පහළට දමාගෙන අපට ඇසෙන සේ කතා කරයි.

"ජනයනි, ඉහළ සිට පහළට එල්ලෙන ඔළු ගෙඩියට සවන් දෙනු..."

ඉනික්බිතිව කටට ආ පළියට ඔහේ දොඩවන්නට විය.

බෙල්ල මගේ පහළ වැටෙයි.
උදේ රැයින් මට ඇහැරෙයි
මගෙ මරණෙත් බොහොම ළඟයි.
කැරපොත්තෝ මගෙ ඇඟ කයි...

"කොල්ලාගේ හිත අධෛර්ය වෙලා නැහැ." චිත්‍රාගාරයේ සගයෝ පවසති.

සමහර දාට මා සහ පාවෙල් ඔහුගේ නිදන මැස්සට නැඟ ගත් විට ඔහු අපට විහිළු කරන්නට පටන් ගනී.

"ආදරණීය අමුත්තන්ට සංග්‍රහ කරන්නේ මොනවාවලින්ද? අලුත් පහේ මකුළුවකු අල්ලා දෙන්නද?"

ඔහු මියගියේ සෙමිනි. එය ඔහුගේ සිතට වධයක් විය. ඔහු කතා කළේ අවංක සිත් තැවුලකිනි.

"ඉක්මනට මැරෙන්න කොහොමටවත් බැහැ නොවැ. හැබෑ ගෝතකරුමයක්!"

මරණය ඉදිරියේ දවීදව්ගේ නිර්භයත්වය නිසා පාවෙල් බෙහෙවින් බියවිය. මහ රෑ මා අවදි කරන පාවෙල් මගේ කනට කොඳුරයි.

"මක්සීමිච් මට හිතෙන්නේ දවීදව් මළා වගෙයි. මිනිහා රෑ මළොත් පහළ පොලාතියේ අපි නිදා ඉන්නවා. අනේ දෙවියනි. මම මළ මිනීවලට බොහොම බයයි."

සමහරදාට ඔහු මට මෙසේ කියයි.

"අනේ ඔහු දැක්කේ මොනවාද? අවුරුදු විස්සක් සම්පූර්ණ වුණේ නැහැ. පණ අදිනවා."

දවසක් දා හඳ බැබළෙන රාත්‍රියෙක, පාවෙල් මා අවදිකොට බියගත් දෙනෙත් මහත් කර ගෙන මට කතා කළේය.

"ඇහුම් කන් දීපන්!"

අපට ඉහළින් ඇති ලී මැස්සේ දවීදව් කහිමින් කලබලයෙන් නමුදු පැහැදිලි ලෙස කතා කළේය.

"මෙහාට දීපන්, මෙ හා ට..."

අනතුරුව ඔහු ඉක්කා ගසන්නට විය.

"අනේ දෙවියම්පා ඔහු පණ අදිනවා!" යැයි කී පාවෙල් කැලඹිණි.

මම එදින උදේ සිට ගෙවත්තේ ගොඩ ගැසී තිබුණු හිම කැටි ඈත කමතට ගෙන ගිය නිසා ඉමහත් ලෙස විඩාපත් වී සිටියෙමි. මට නිදාගැනීමට තද වුවමනාවක් තිබිණි. එහෙත්, පාවෙල් මගෙන් අයැද සිටින්නට විය.

"නිදාගන්ට එපා, ජේසු තුමාගේ නාමෙට නිදා ගන්නට එපා!"

හිටි හැටියේම ඔහු යහන මත දණ ගසා වාඩිවී, අමනුස්ස හඬකින් කෑ ගැසීය.

"නැඟිටපල්ලා. දවීදව් මළා!"

කිසිවෙක් නින්දෙන් අවදි වූහ. එකෙක් දෙන්නෙක් නැඟිට්ටාහ. කෝපාන්විත ලෙස ප්‍රශ්න නඟන සැටිද ඇසිණි.

කපෙන්දූහින් දවීදව් නිදා සිටි මැස්සට නැඟ අත ගා බලා මෙසේ පැවසීය:

"මැරිලා වෙන්න ඕන. නමුත්, එයාගෙ ඇඟ තවමත් උණුහුමට තියෙනවා."

නිහඬතාව පැතිරිණි. ෂිහර්යොව් කුරුසියේ ලකුණ ඇඳගෙන, කම්බිලිය පොරවාගෙන හඬ නඟා කතා කළේය.

"අනේ ඉතින්. ඔහුට ස්වර්ග රාජ්‍යයේ සැප සම්පත් ලැබේවා!"

"එයාගේ මළමිනිය ඉස්සරහ කාමරයට ගෙනියන්න ඕන" යැයි කිහිප දෙනෙක් මුමුනන්නට වූහ.

කපෙන්දූහින් ඔහුගේ මැස්සෙන් බිමට පැන ජනේලයෙන් එපිට බලා තම මතය මෙසේ පැවසීය:

"ඔහුගේ මළ සිරුර උදේ වනතුරු තිබුණාවේ. ඔහු ජීවත්වන කාලෙදි පවා කාටවත් කරදර කළේ නැහැ නෙව...."

පාවෙල් කම්බිලියෙන් හිස වසාගෙන අඬන්නට පටන් ගත්තේය.

එහෙත්, සිතානව් අවදි වූයේවත් නැත.

XV

බිම වසා පැතිර තිබුණු හිම තට්ටු දිය විය. අහසේ පාවූ හිම සමයේ වලාකුළු දියවී, තෙතමනය සහිත හිම කැට බවට පත්විය. දිවා කාලය වැඩිවෙමින්, හිරුගේ උණුසුම වැඩියෙන් දැනෙන්නට පටන් ගත්තද, මේ ක්‍රියාදාමය සිදුවූයේ ඉතා සෙමිනි. වසන්ත සමයේ ප්‍රීතිය ඇවිත් තිබෙන අතර, එය කොහේදෝ සැඟවී අපට විසුළු කරන සැටියෙක් දැනිණි. නගරයෙන් එපිට සැඟවී තිබෙන මෙම වසන්තය හිටි හැටියේම අප මත කඩා වැටෙනු ඇත. මහ පාර වැසී තිබුණු හිම කැට දියවීමත් සමඟම රත් පැහැති කුණු ගොඩවල් දකින්නට ලැබිණි. කුඩා දිය පාරවල් ගලා බසින්නට විය. ඇරස්තාන්ත් චතුරශ්‍රයේ හිම දියවුණු තැන්වල වී කුරුල්ලෝ ප්‍රීතිමත් ලෙස හඬ නැඟුහ. මිනිසුන් ද වී කුරුල්ලන් මෙන් යුහුසුලු වන සැටියෙක් පෙනෙයි. වසන්ත හඬ දසත පැතිරෙත්ම, උදෑසන සිට හවස් වන තුරුම ප්‍රියංකර ශබ්දයක් ඇසේ. එයින් හදවතෙහි මිහිරි ගැස්මක් ඇතිවේ. එහෙත්, එම ශබ්දයෙහි කිසියම් අමනාපය මුසු හැඟීමක් සැඟවී තිබෙන සැටියෙකි. සීනු හඬක්, හැම දෙයක් ගැන උදාසීන හඬෙකින් ගයන විටෙක මෙනි.

"තිබුණා... තිබුණා... ඉස්සර කාලේ..."

මගේ නාම සාන්තුවරයාගේ උපන් දින චිත්‍රාගාරයේ මගේ මිතුරෝ මට ඇලෙක්සේයි මුනිවරයාගේ පින්තූරයක් තෑගි කළහ. ෂිහර්යෝව් වශීවනසුලු දිගු කතාවක් කළේ, මගේ මතකයෙහි විශේෂ හැඟීමක් ඇති කරවමිනි.

"නුඹ කවුද?" යන ප්‍රශ්නය ඔහු නැඟුවේ අතේ ඇඟිලි නටවමින්, බැම සඟළ සොලවමිනි. "අවුරුදු දහතුනක් වයසැති කොල්ලෙක් විතරයි. නුඹට වඩා හතර ගුණයක් වැඩිමහලු මම අද නුඹේ ගුණ ගයන්නේ මක්නිසාද? නුඹ කිසිම වැඩකදී මඟ හරින්නේ නැතුව කෙළින්ම මූණ පාන නිසා! අන්න එහෙම හැමදාම මුහුණ දීපන්. ඒක ඉතාම හොඳ දෙයක්!"

ඔහු ඊළඟට දෙවියන් වහන්සේගේ වහලුන් සහ දෙවියන්ගේ මිනිසුන් ගැන කතා කරන්නට විය. මිනිසුන්

සහ වහලුන් අතර ඇති වෙනස ගැන ඔහු යමක් කී නමුදු, එය වටහා ගැනීමට මම අපොහොසත් වීමි. ඔහු කී ඒ කතාව ඔහුට පවා පැහැදිලිද යන්න ගැන කීමට මට නොහැකිය. ඔහු පාළු කපන කතාවක් කරන්නට වූයෙන්, චිත්‍රාගාරයේ අනික් අය ඔහුට සිනහසෙන්නට පටන් ගත්හ. මා එම කතාවට සවන් දී, මට තෑගි දුන් ඉකෝනය අත ඇතිව සිටියේ බලවත් හැඟීමෙකින් සහ ලජ්ජා සහගත කුළුටි ගතියෙකින් කුමක් කළ යුතුදැයි නොදැනය. කොපෙන්හූහින්ට ඉවසා සිටීමට නොහැකි වූයෙන්, ඔහු කතිකයාට එරෙහිව කෑ ගැසීය.

"ඔය කොල්ලගේ ගුණ ගායනය නවත්වනවා, ජේනවද උගේ කන් දෙකත් නිල්පාට වෙලා."

අනතුරුව ඔහුද මගේ උරහිසට තට්ටු කොට මට පැසසීය. "නුඹ හොඳයි, නුඹ හැම කෙනෙකුගේම කිට්ටු හිතවතකු වීම ඉතා හොඳ දෙයක්. නුඹ වරදක් කළාම නුඹට ගහන එක කොහොම වෙතත්, නුඹට බැණ වැදීමට පවා සිතක් ඇතිවන්නේ නැහැ!"

හැම දෙනකුම මා දෙස බැලුවේ සුරතල් සිනාපාන නෙත්වලිනි. ඒ නිසා මගේ කුළුටි ගතිය තවත් වැඩි විය. එය තවත් වැඩිවූයේ නම්, ඒ මිනිසුන්ට මා අවශ්‍යය යන හැඟීම නිසා ඇතිවන බලාපොරොත්තු විරහිත ප්‍රීතිය විසින් මා අඬා වැලපෙන්නට වුව ඉඩ තිබුණි. එහෙත්, එදින උදෑසන කළමනාකරුවා ප්‍රයෝතර් වසීල්යෙව්ට මා ඇසින් පෙන්වමින් මට බැණ වැදුණේය.

"මහ නරක කොල්ලා. මූට කිසිම වැඩක් බැහැ!"

හැමදාම මෙන්ම, එදත් මා පින්තූර විකුණන කඩයට ගිය විට, ඔහු මට මෙසේ අණ කළේය:

"ගෙදර ගිහිල්ලා ගබඩා වහලේ තියෙන හිම කැටි බිම දාලා ඒවාවලින් බිම්ගෙය පුරවාපන්..."

එදින මගේ නාම සාන්තුවරයාගේ උපන්දිනය බව ඔහු නොදත්තේය. චිත්‍රාගාරයේ සගයන්ද එය නොදත් බව මම විශ්වාස කළෙමි. මට ඉකෝනය තෑගි කිරීමේ උත්සවය අවසන් වූ විගස, මම වෙනත් ඇඳුම් ඇඳගෙන වහලට නැඟ ඉතා බරැති හිම කැටි බිම දමන්නට වීමි. එහෙත් කැලඹීමට පත්ව සිටි මට වේලාසනින් බිම්ගෙයි දොර

හැරීමට අමතක විය. මා කළ වරද දුටු විගස මම බිමට පැන බිම්ගෙයි දොර අසල ගොඩ ගැසී තිබුණු, තවමත් ගල් මෙන් තදැති හිම කැටි ඈතට වීසි කරන්නට පටන් ගතිමි. බරැති හිම කැටි ලී මුවා උදැල්ලෙන් ඉවත් කිරීම ලෙහෙසි වැඩක් නොවීය. යකඩ උදැල්ලක් නොවූයෙන්, එය ඔරොත්තු නොදෙන ලීමුවා උදැල්ලෙන් වීසි කරන විට එය කැඩිණි. හරියට මෙන්න මේ වේලාවටම කළමනාකරුද එතැනට පැමිණියේ, "සොම්නස පසුපසින් දොම්නස ලුහු බඳිනවා" යන රුසියන් ආප්තෝපදේශයක් සනාථ කරමිනි.

ඔහු මා වෙත පැමිණ සාවඥ ලෙස මට බැණ වදින්නට විය. "නුඹ වගේ වැඩකාරයකු යකාට ගියත් කමක් නැහැ. මම තොගේ පිස්සු වැටිච්ච ඔළුගෙඩිය අල්ලා ගෙන..."

එසේ කියමින් ඔහු කැඩුණු උදැල්ලේ මිට වනන්නට විය.

"මම තමුසෙගේ ගෙවත්ත සුද්ද කරන කුලීකාරයා නොවෙයි." මම තරමක් ඈත්වී කෝපයෙන් ඔහුට කිව්වෙමි.

ඔහු අතැති ලී කෑල්ලෙන් මගේ දෙපාවලට ගැසූ විට මම හිම ගුළියක් රැගෙන ඔහුගේ මුහුණට දමා ගැසුවෙමි. ඔහු හඬක් නංවමින් පැන ගිය පසු මම චිත්‍රාගාරය දෙසට ගියෙමි. විනාඩි කීපයක් ගතවත්ම, උඩුමහලේ සිට කළමනාකරුගේ අනාගත මනමාලිය පහළට දුවගෙන ආවාය. අඟර දඟර කාරියක් වූ ඈ කුරුලෑ සහිත පුහු මුහුණක් ඇත්තියකි.

"මක්සීමිච් උඩු මහලට නැඟපන්!"

"මම යන්නෙ නැහැ!" පිළිතුරු දුනිමි.

එවිට ලරිඕනිච් ප්‍රශ්න කළේ සෙමින් සහ මවිතයෙනි.

"එහෙම නොගිහින් ඉන්නෙ කොහොමද?"

මම ඔහුට සිදුවූ දේ ගැන විස්තර කළෙමි. ඔහු උඩු මහලට නැංගේ අඩ ස්වරයෙන් මගේ ක්‍රියාවට දොස් පවරමිනි.

"මල්ලී, නුඹ මහ මුරණ්ඩු කොල්ලෙක්..."

කළමනාකාරුට බැණ වැදුණු චිත්‍රාගාරයේ මිනිස්සු කැලඹී ගත්හ. කපෙන්දූහින් මට අනතුරු ඇඟවීය.

"නුඹව දැන් ඉතින් එළවා දමාවි!"

එවැන්නකට මම බිය නොවීමි. කළමනාකරුවා මා වෙත දක්වන ආකල්පය බොහෝ කලෙක සිට මට නොරුස්සයි. ඔහු මට වෛර කළේ වඩාත් මුරණ්ඩු ලෙසත්, තියුණු ලෙසත්ය. මට ඔහු නොරුස්සයි. එසේ වුවද, ඔහු එතරම් අමන ලෙස මට වෛර කරන්නේ මන්දැයි වටහා ගැනීමට වුවමනා විය.

ඔහු ඉකෝන වෙළඳහලේදී තඹ කාසි බිම වීසි කළේය. මම පොළොව අමදින විට, ඒ කාසි අහුලා හිඟන්නන්ට දීමට තිබෙන තඹ කාසි සහ ධාන්‍ය ඇට සහිත පිඟානට දැමීම සිරිතක් කර ගතිමි. මෙලෙස ඔහු කාසි වීසි කිරීමේ හේතුව මා දැනගත් විට මම ඔහුට මෙසේ පැවසීමි.

"තමුසෙ මට තඹ කාසි වීසිකිරීම පලක් නැති වැඩක්!"

ඔහු කිපී දුරදිග නොබලා කෑ ගැසීය.

"තෝ මට උගන්වන්න එන්න එපා! මා කරන දේ මා දන්නවා."

වහාම ඔහු වරද හරිගස්සා ගත්තේය.

"පලක් නැති වැඩක් වන්නේ කොහොමද? සල්ලි ඉබේටම වැටෙනවා..."

වෙළඳහලේදී පොත් කියවීම තහනම් කරමින් ඔහු මට මෙසේ පැවසීය.

"පොත් කියවීම නුඹේ වැඩක් නොවෙයි. නුඹ තක්සේරු කරුවෙක් වෙන්න හදනවද? පින් බතා..."

තඹ කාසි විසි කොට මට චෝදනා කිරීමට ඔහුගේ ඇති ආසාව සිඳී නැති බැව් මට පෙනිණි. ලීමුවා බිම අමදින විට ඔහුගේ තඹ කාසියක් එහි ඇති සිදුරකට වැටුණහොත්, එය මා සොරකම් කර ගත් බවට ඔහු සිතනවා සිකුරුයි. කාසි වීසිකිරීමේ කෙළිය නවත්වන ලෙස මම ඔහුට තව වරක් කියා සිටියෙමි. එදිනම උතුරන වතුර සහිත කේතලය මා රැගෙන එන විට, ඔහු අල්ලපු කඩේ වෙළඳ සේවකයාට මෙසේ කියන සැටි මට ඇසිණි.

"ප්සල්තීර් යාච්ඤා පොත් සොරකම් කිරීමට තමුසෙ ඌට උගන්වනවා. අද හෙටම අපට පොත් පෙට්ටි පහක් ලැබේවි."

ඔවුන් මා ගැන කතා කරන බව මට අවබෝධ විය.

මා වෙළඳහල තුළට යනවිට ඔවුන් දෙදෙනා ලජ්ජා වූහ. මෙය හැරුණු විට, කළමනාකරුවා මට විරුද්ධව කුමන්ත්‍රණය කරන බවට සැක කිරීමට මට හේතු තිබිණි.

අල්ලපු වෙළඳහලේ වෙළෙඳ සේවකයා අපේ කළමනාකරු යටතේ ඉස්සර සේවය කළ කෙනෙකි. ඔහු දක්ෂ වෙළඳ සේවකයකු ලෙස ගණන් ගත්තද, සුරා සොඬකු නිසා පීඩා වින්දේය. ඔහු දවස් ගණන් එක දිගට සුරා පානය කරන විට සේවයෙන් අස්කොට ඉන් අනතුරුව යළිත් සේවයට ගත් අයෙකි. මේ බේබද්දා කෙට්ටුය. දුර්වලය, කපටි නුවණක් ඇත්තෙකි. බාහිර වශයෙන් ඔහු ඉතා කීකරුය. හාම්පුතාගේ වචනය මුදුනෙන් පිළිගන්නෙකි. ඔහු නිතරම තම යටි රැවුළ දෙස බලාගෙන මඳ සිනා පායි. ඉන් බුද්ධිමත් බවක් පළවෙයි. තියුණු වචන බිණීමට කැමැත්තක් දක්වයි. ඔහුගේ කටින් දත් සහ වීදුරු මස් කුණු වූ මිනිසුන්ගෙන් වහනය වන දුගඳක් පැතිර ගියද, ඔහුගේ දසන් ශක්තිමත් විය.

දවසක්දා ඔහු මා අතිමහත් ලෙස පුදුමයට පත් කළේය. ඔහු මා ළඟට විත් සුරතල් ලෙස මඳ සිනා පා හිටිහැටියේ මගේ තොප්පිය ගලවා, කෙස්වැටියෙන් ඇද පහර දෙන්නට වූයෙන්, අපි දෙදෙනා පොර කන්නට වීමු. ඔහු මා උඩුමහල් ආලින්දයේ සිට වෙළඳහල තුළට තල්ලු කොට ලොකු ඉකෝන පින්තූර වෙතට මා තල්ලු කිරීමට විශාල මහන්සියක් දැරීය. ඔහුගේ එම පරිශ්‍රමය සාර්ථක වී නම්, මා නිසා කණ්ණාඩිය කැඩී, කැටයම් රාමුව පලුදු වී ඉකෝන චිත්‍රය පවා විනාශ වීමට ඉඩ තිබිණි. ඔහු කායික වශයෙන් දුර්වල නිසා මට ඔහුගේ එම පරිශ්‍රමය වළක්වාලීමට හැකි විය. එවිට මා ඉමහත් ලෙස මවිතයට පත් කරමින් ඒ යටි රැවුළුකාරයා බිම වාඩිවී කටුක ලෙස කඳුළු වගුරවමින් ඔහුගේ බිඳුණු නහය පිසදමන්නට විය.

දෙවැනි දවසේදී අපේ වෙළඳහල්වල ලොක්කන් බැහැර ගිය විට, ඔහුගේ ඇස ළඟ පිහිටි කුරුලෑ ගෙඩියක් අතගාමින් මිතුරු ලීලාවෙන් මට මෙසේ පැවසීය:

"නුඹ සිතනවද මම මගේ වුවමනාවට නුඹත් සමඟ සණ්ඩු කරනවයි කියල. මට තියෙන රුදාව මොකක්ද? මම මෝඩයෙක් නොවෙයි. මම දැනගෙන හිටියා නුඹ

මට පහර දේවි කියලා. මම දුර්වල මිනිහෙක්. බේබද්දෙක්. නුඹේ මැනේජරයාගේ අදහස තමයි මම ක්‍රියාවට යෙදුවේ. එයා මට කිව්වා නුඹත් සමග පොර කෑමක් පටන් අරගෙන ඒ වේලාවේදී පුළුවන් තරම් වටිනා දේවලට අලාභ හානි කරන්නයි කියලා. ඒ පාඩු සියල්ලටම නුඹට ගෙවන්න වේවියි කියලත් කිව්වා. මට කිසිම වුවමනාවක් නැහැ, නුඹත් සමඟ ගහ බැණ ගන්න. ඔන්න බලාපන් නුඹ මගේ මූණ තුවාල කරපු හැටි."

මා ඔහුගේ කතාව විශ්වාස කළ අතර, ඔහු නිසා මට අනුකම්පාවක්ද උපනි. ඔහු අඩක් කුසගින්නේ සිටින අතර, ඔහුත් සමඟ වාසය කරන ගැහැනිය ඔහුට පහර දෙන බවත් මම දැන සිටියෙමි. එසේවතුදු මම ඔහුගෙන් ප්‍රශ්න කළෙමි.

"නුඹට කිව්වොත් මිනිහකුට වහ දෙන්නයි කියල නුඹ වහ දෙනවද?"

"නුඹලගෙ මැනේජරයා බල කරාවි" යි ඔහු කිව්වේ අනුකම්පාව මුසු නරුම සිනාවෙකිනි. "ඔහුට එය කළ හැකියි."

ඊට දින කීපයකට පසුව ඔහු මට මෙසේ කියුවේය:

"මේ අහපන්. මගේ අත තඹ සතයක්වත් නැහැ. ගෙදර කන්න දෙයක් නැහැ. ගෑනි මගේ ඇඟට කඩා ගෙන පනිනවා. ගබඩාවේ ඉඳලා ඉකෝනයක් හොරකම් කරගෙන වරෙන්. මම ඒක විකුණන්නම්, හොඳද? නුඹ ගේනවද? ප්සල්තීර් පොතක් වුණත් ගේනවද?" ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළ නොහැකි විය. මම ඔහුට ඉකෝනයක් දුනිමි. එහෙත්, ප්සල්තීර් පොතක් සොරකම් කර දීමට මා තීරණය නොකළේ එය අපරාධයක් ලෙස මා සිතූ බැවිනි. මොනවා කරන්නද? සදාචාරය තුළ හැමදාම අංක ගණිතය සැඟවී ඇත. පෞද්ගලික අයිතිය නමැති මහා බොරුව පිටුපස සැඟවී ඇති කුඩා රහස පාවා දෙන්නේ "අපරාධකාරයන්ට දඬුවම් දීමේ නීතිය" නමැති ශුද්ධ වූ ළාමකත්වය තුළය.

ප්සල්තීර් යාච්ඤා පොත සොරකම් කිරීමට මට උගන්වන ලෙස මෙම නීච මිනිසාට කළමනාකරුවා කියන සැටි ඇසුණු විට, මම බිය වීමි. අන් සතු දේ

පිනට දෙමින් මා දක්වන කරුණාව ගැන කළමනාකරුවා දන්නා බවත්, ඉකෝනය ගැන අල්ලපු කඩේ වෙළඳ සේවකයා කියා ඇති බවත් මම වටහා ගතිමි.

අන් සතු දේ පිනට දීමෙන් දක්වන කරුණාවේ නීචත්වය මට උගුලක් බවට පත්විය. මෙයත් අන් සියලු දේත් එකතු වූ විට මට මා කෙරෙහිත් අන් හැම කෙනෙකුම කෙරෙහිත් කෝපයක් සහ පිළිකුලක් හට ගත්තේය. යාච්ඤා පොත් සහිත පෙට්ටිය කවදා එතිදැයි සිතමින් මම වේදනා විඳින්නට වූයෙමි. අවසානයේදී එය පැමිණි විට, මා ඒවා ගබඩාවේ අසුරන්නට පටන් ගත් අතර, අල්ලපු කඩේ වෙළඳ සේවකයා විත් ඔහුට පොතක් දෙන ලෙස ඉල්ලා සිටියේය.

"මම නුඹට ඉකෝනයක් දුන්නයි කියල නුඹ මැනේජරයාට කිව්වද?" මම ඔහුගෙන් ඇසුවෙමි.

"කිව්වා මල්ලියේ මට කිසිම රහසක් තියා ගන්න බැහැ...." යි ඔහු කිව්වේ කාන්සිය මුසු හඬෙකිනි.

මම තුෂ්ණීම්භූත වී දෙනෙත් මහත් කර ගෙන ඔහු දෙස බලන්නට වූයෙමි. මට ඉබේටම ඉන්දැවිණි. ව්‍යාකූලත්වයට පත් ඔහු යමක් කියමින් දොඩවන්නට වූයේ, මහත් වූ කනගාටුවෙකිනි.

"නුඹලගේ මැනේජරයා දැනගත්තා, ඒ කියන්නේ මගේ හාම්පුතා දැනගෙන නුඹලගෙ මැනේජරයාට කිව්වා."

මා විනාශයට පත් විණැයි මට සිතිණි. මුන් එකතු වී මා බාලාපරාධකාරයන්ගේ බන්ධනාගාර ජනවසමට යැවීමට කුමන්ත්‍රණය කළ බව මට හැඟිණි. දැන් ඉතින් මොනවා වුණත් මට එකයි. ගිලෙනවානම් ගිලෙන්න ඕන ගැඹුර වැඩි තැනෙක. මම වෙළඳ සේවකයාට ජ්සල්තීර් යාච්ඤා පොතක් දුනිමි. ඔහු එය හිම කබායට යටින් තබා ගෙන ඉවත ගියද, යළිත් හැරී ආ විට යාච්ඤා පොත මගේ දෙපා ළඟ වැටිණි. වෙළඳ සේවකයා ඇතට යමින් කතා කළේය.

"මම ගන්නෙ නැහැ! නුඹත් සමඟ විනාශ වෙන්න මට සිද්ධ වෙනවා."

මාත් සමඟ විනාශ වන්නේ කෙසේද යන්න වටහා ගැනීමට මම අපොහොසත් වීමි. ඔහු එම පොත

නොගැනීම මගේ සතුටට හේතු විය. මෙම සිද්ධියෙන් පසු අපේ කඩේ කළමනාකරුවා වන මිටි මිනිහා මා දෙස බලන්නට වූයේ, වඩාත් වැඩි කෝපයකින් හා සැකයෙකිනි.

ස්වාමිදුව දකිනු පිණිස ලරිඕනිච් උඩුමහලට නඟින විටය, මේ සියල්ල මට සිහිවූයේ. ඔහු මඳ වේලාවක් එහි සිට ආපසු ආවේ වඩාත් පෑගුණු සහ නිහඬ ලෙසිනි. රාත්‍රී ආහාරයට පෙර ඔහු මා දෙස එක එල්ලේ බලා මෙසේ පැවසීය:

"නුඹව කඩේ වැඩවලින් නිදහස් කරලා චිත්‍රාගාරයේ වැඩවලට ගැනීමට මම මහන්සි ගත්තා. ඒක හරි ගියේ නැහැ! මැනේජරයා විරුද්ධ වුණා. ඒ මිනිහා නුඹට බොහොම වෛර කරනවා."

චිත්‍රාගාරය පිහිටි නිවසේ ද මට හැතිරියක් සිටියාය. ඈ මැනේජරයා බඳින්න පොරොන්දු වී සිටින තරුණියය. ඈ සීමාව ඉක්මවූ අඟර දඟරකාරියකි. චිත්‍රාගාරයේ සිටින සියලු තරුණයෝ ඇයත් සමග නැටූහ. ඉදිරිපස ඇඳිරි කාමරයේ රැක සිට ඔවුන් ඇය බදාගත් විට ඈ අමනාප නොවූවාය. කුඩා බලුපැටවකු මෙන් යම්තම් ඈ කෙඳිරි ගෑවා පමණකි. ඈ නිරතුරුවම මොනවා හෝ සපන්නට වූවාය. ඇගේ ගවුමේ සාක්කුවල විස්කෝතු, රොටි කෑලි ආදිය තිබිණි. නිතර ඇගේ හකු පාඩා ක්‍රියාකාරී වූ අතර, බළල් ඇස් සහිත ඇගේ පුහු මුහුණ බැලීමට පවා අප්‍රියජනකය. ඈ මටත් පාවෙල්ටත් තේරවිලි තෝරන ලෙස කිව්වද, ඒවා හැමදාම ලජ්ජාරහිත අමන අදහස් සහිත විය. කැත වචන එකට පැටලී තිබෙන අක්ෂර මාලා ඉක්මනින් කියවීමට ඕ අප පුරුදු කළාය.

දවසක් දා වැඩිමහලු චිත්‍ර ශිල්පීන්ගෙන් කෙනෙක් ඇයට දොස් පැවරීය.

"නුඹ තරුණියක් වුණාට නුඹට ලජ්ජා නැහැ!"

ඇය ඊට පිළිතුරු දුන්නේ දඟකාරී ගීතයක වචනවලිනි.

ලජ්ජාකාරියක් නම් තරුණිය.
මහ ගෑනියක් නොවේමය.

මා මෙවැනි තරුණියක් දුටු ප්‍රථම අවස්ථාව මෙය විය.

මා ඇයට කැමැති නොවූ නමුදු, ඈ මා බිය කළාය. ඈ මට ගොරහැඩි ලෙස කොලොප්පම් කළ අතර, මා ඒවාට අකැමැති බව දත්තී, වඩාත් ගොරහැඩි වූවාය.

ආහාර ගබඩා කරන බිම් ගෙයි ක්වාස් පානය සහිත පීප්ප සහ ලුණු දැමූ කැකිරි සහිත පීප්ප සුද්ද කිරීම සඳහා මා සහ පාවෙල් එහි ගිය විට, කළමනාකරුගේ මනාලිය වන මේ තරුණිය අපට යෝජනාවක් ඉදිරිපත් කළාය.

"කොල්ලනේ, නුඹලාට දෙතොල් සිප ගන්නා සැටි උගන්වන්න නුඹලා කැමතිද?"

"නුඹට වැඩියෙ හොඳට මට පුළුවනි" යි පාවෙල් කිව්වේ සිනාවෙමිනි. "සිප ගැනීම සඳහා මනමාලයා ළඟට පලයන්" යැයි මා ඇයට කිව්වේ තරමක ගොරහැඩි ලෙසිනි. එවිට ඈ කෝප වූවාය.

"තෝ මහ ගොරහැඩි කොල්ලා! නෝනා කෙනෙක් එයත් එක්ක හොඳට කතා කරන කොට ඌ ආඩම්බර වෙනවා. මුගේ ආඩම්බරයක හැටි!"

අනතුරුව ඕ ඇඟිල්ලක් දිගු කරමින් තර්ජනය කළාය.

"හිටපිය මම තොට හොඳ පාඩමක් උගන්වන්නම්!"

පාවෙල් මට පක්ෂව කතා කරමින් ඇයට තරවටු කළේය.

"නුඹේ ඔය කැත වැඩවලට නුඹට මනමාලයා බැට දේවි!"

ඈ ඇගේ පුහු මුහුණ උද්දච්ච ලෙස රැලි ගන්වා ගත්තාය.

"මම එයාට බය නැහැ. මට තියෙන දෑවැද්ද බලන කොට එයාට වැඩිය හොඳ මනමාලයන් දහ දෙනෙකු වුණත් හොයා ගන්න පුළුවනි. විවාහයට පෙර කෙල්ලකට කොල්ලන් සමඟ කාමුක ලෙස හැසිරීමට ඉඩකඩ තියෙනවා."

ඈ පාවෙල් සමඟ සිපගැනීම ආරම්භ කළ අතර, මගේ හැසිරීම නිසා ඈ මට විරුද්ධව කේලාම් කියන්නියක බවට පත්වූවාය.

වෙළඳහලේ වැඩ කටයුතු වඩාත් අසීරු විය. එහි විකිණීමට තබා ඇති සියලු යාච්ඤා පොත් මේ වන විට මම කියවා අවසන් කළෙමි. තක්සේරු කරන්නන්ගේ වාද

විවාද සහ කතා බහ මසිත තව දුරටත් නොගත්තේය. එකම දෙයක් ගැනය, ඔවුන් හැමදාම කතා කළේ. ඇඳිරි මිනිස් ජීවිතය අරබයා ප්‍රයොතර් වසිල්යෙව්ගේ දැනීම විසින්, පෙර මෙන්ම, ඔහු මගේ සිත තදින් ඇද ගනු ලැබූ අතර, ඔහු කතා කළේත් සිත් ඇදගන්නාසුලු දක්ෂතාවකිනි. දිවැස් කියන යෙලිසේයි, ප්‍රයොතර් වසිල්යෙව්ට බෙහෙවින් සමාන බවත්, ඔහු මෙන්ම, හුදෙකලාව සහ ගූඨවාදීව සිටි බවත් මට සිතිණි.

මහල්ලාත් සමඟ මගේ අදහස් සහ මිනිසුන් ගැනත් මා කතා කරන හැම වාරයකදීම ඔහු ඉතා සුහද ලීලාවෙකින් මට සවන් දී, අනතුරුව ඒවා සියල්ල කළමනාකරුට දන්වා සිටීමට පසුබට නොවීය. එවිට ඔහු මා දෙස බලා මට සරදම් ලෙස සිනාසුණේය. නැතිනම් මට බැණ වැදුණේය.

කවි සහ නොයෙක් පොත්වලින් උපුටා ගත් කොටස් සහිත මගේ කොපි පොතේ, ඔහු කළ කතාවලින් කොටස්ද ලියා ඇති බැව් මම මහල්ලාට වරක් පැවසීමි. එවිට මහල්ලා ඉමහත් ලෙස බියට පත්වූයේ, අනතුරකට මූණ පෑ විටෙක මෙන් මගෙන් ඉල්ලා සිටීමට පටන් ගත්තේය.

"නුඹ එහෙම ලියන්නේ මොකටද? අනේ කොල්ලෝ, ඒක හොඳ වැඩක් නොවෙයි. මතක සටහන් හැටියටද? නැහැ, ඒක නුඹ වීසි කරපන්! නුඹ හරි කොල්ලෙක් නොවැ. නුඹේ කොපි පොත මට දීපන්, හොඳද?"

මගේ පොත ඔහුට දෙන ලෙසත්, නැතිනම් එය පුලුස්සා දමන ලෙසත්, ඔහු මගෙන් ඉල්ලා සිටියේය. ඉනික්බිතිව කෝපයෙන් යුතුව කළමනාකරුගේ කනට කොඳුරන්නට විය.

අප හවස ගෙදර යමින් සිටින විට, කළමනාකරුවා දැඩි ලෙස මගෙන් ප්‍රශ්න කළේය.

"නුඹ මොනවදෝ පොතක ලියනවලු නේද? ඒවා වහාම නවත්වාපන්. ඇහුණද? ඒවා කරන්නේ පොලිස් ඔත්තුකාරයෝ විතරයි."

එවිට මා ප්‍රශ්න කළේ සුපරීක්ෂාකාරීත්වයෙන් තොරවය.

"එහෙනම් සිතානවිට එහෙම කරන්න හොඳයි නේද? එයාත් මා වගේම ලියනවා..."

"ඌත් ලියනවද? මෝඩ දිගංචියා..."

බොහෝ වේලාවක් නිහඬව සිට ඔහු අසාමාන්‍ය ලෙස මුදු ගතියක් දක්වමින් මෙසේ පැවසීය:

"මේ අහපන්, මට නුඹේ පොතයි, සිතානව්ගේ පොතයි පෙන්වාපන්. මම නුඹට පනහේ කාසියක් දෙන්නම්. හැබැයි නුඹ සිතානව්ට හොරෙන් එයාගෙ පොත ගෙනෙන්..."

ඔහුගේ ඉල්ලීම මා ඉටු කරතියි ඔහු තුළ දැඩි විශ්වාසයක් තිබුණෙන්, ඔහු වචනයකුදු නොදොඩා ගමන ඉක්මන් කොට මගෙන් ඈත් විය.

ගෙදර පැමිණි පසු කළමනාකරුගේ යෝජනාව ගැන මම සිතානව්ට දන්වා සිටියෙමි. ඔහු බැම හකුළුවා ගත්තේය.

"නුඹ ඔය කතාව කීම මෝඩ වැඩක්... දැන් ඔය මැනේජරයා කාව හරි ලවා මගේ පොතත්, නුඹේ පොතත් සොරකම් කරවාවි... නුඹේ පොතත් මට දීපන් මම හංගන්නම්, ඒකා නුඹව ඉක්මනටම පන්නා දමාවි. බලාපන්!"

මාත් ඒ ගැන ස්ථිරව දැන සිටියෙන්, ආච්චි නගරයට පැමිණි විගස මෙතැනින් අස්වී යාමට ඉටා ගතිමි. තරුණියනට රේන්ද ගෙත්තම් උගැන්වීම සඳහා ඇයට බලාහ්නවලට ආරාධනා කොට තිබුණෙන්, ඈ නගරයෙහි නොවූවාය. සීයා නැවත කුනාවිනොවල වාසය කළද, මම ඔහු බැලීමට නොගියෙමි. එමෙන්ම, සීයාත් නගරයට ආ නමුදු මා බැලීමට ආවේ නැත. දවසක්දා අපි දෙදෙනා මහ පාරේදී හමු වීමු. ඔහු යෙනෝත ලොමින් කළ වටිනා හිම කබාය ඇඳගෙන පූජකයකු මෙන් වැදගත් ලීලාවෙන් ගමන් කළද, මම ඔහුට සුබ පැතීමි. ඔහු නළලට අතක් තබා මා දෙස කල්පනාකාරී ලෙස බලා මුමුනන්න විය.

"ආ ඒ නුඹද... දැන් ඉතින් පින්තාරුකාරයෙක් වෙලා. ඔව්, ඔව්.. ඉතින් පලයන්, පලයන්!"

ඔහු මා සෙමින් පසෙකට තල්ලු කර, වැදගත් ලෙස සෙමින් ඇතට යන්න ගියේය.

මා ආච්චි දුටුවේ ඉඳ හිටලාය. ඈ වෙහෙස නොබලා වැඩ කරමින්, මහලු විය නිසා දුබල කල්පනා ශක්තියෙන්

පෙළුණු සීයාටත්, මගේ මාමලාගේ ළමයින්ටත් ආහාර සපයා දුන්නාය. මිහයිල් මාමාගේ පුත් සාෂා ඇයට විශේෂ කරදර ඇති කළ කෙනෙකි. කඩවසම් කොල්ලෙකු, සිහින දකින්නෙකු සහ පොත් ගුල්ලෙකු වූ ඔහු තීන්ත - සායම් සාදන කම්හල්වල වැඩ කළේ නිතර, නිතර අයිතිකරුවන් මාරු කරමිනි. එසේ එක් තැනක සිට තවත් තැනකට මාරු වීමේ අතරතුර කාලය තුළදී, ඔහු ආච්චි ළඟට වී සන්සුන් ලෙස සිටියේ ආච්චි අලුත් ස්ථානයක් ඔහුට සොයා දෙන තුරුය. බේබදු සායම් ශිල්පියකු සමඟ අවාසනාවන්ත ලෙස විවාහ වූ සාෂාගේ අක්කාද ආච්චිගෙන් නිතර යැපෙන්නට වූවාය. ඇගේ සුරාසොඬ සැමියා ඇයට නිතර පහර දී ගෙදරින් පන්නා දැමීම සිරිතක් බවට පත්වී තිබිණි.

ආච්චි මුණගැසුණු විට මම වඩ වඩාත් ඇගේ අධ්‍යාත්මය නිසා ඉමහත් ලෙස ප්‍රබෝධයට පත්වීමි. එහෙත්, සුන්දර අධ්‍යාත්මයක් ඇති මේ කාන්තාව කතන්දර ලෝකය නිසාම අන්ධ ඇස් ඇතිව සිටින අතර, කටුක යථාර්ථය දැකීමට හෝ අවබෝධ කර ගැනීමට හෝ අසමත් බවත්, මගේ බිය සහ කැලඹීම් ඇයට පිටත්තර දේ බවත්, ඒ වන විට මම වටහා ගතිමි.

"ඉවසන්න ඕන, ඔලෝෂා."

නින්දිත ජීවිත ගැන මා කී කතාවලටත්, මිනිසුන් විඳින දුක, මගේ සිතෙහි හටගෙන ඇති පාළු බව ආදිය ගැන කී විටත් ඇගේ එකම පිළිතුර වූයේ එය පමණකි.

ඉවසීමට මා සතුව තිබූ ශක්තිය එතරම් යහපත් නොවීය. සතකු මෙන් නැතිනම් ගසක් හෝ ගලක් මෙන් හෝ මම සමහර විට ඒ ඉවසීමේ යහගුණය පෙන්වාලූයේ නම්, මා එසේ කළේ ස්වයං ව්‍යායාමයක් ලෙසිනි. මගේ ශක්තියේ සංචිතය සහ මිහිපිට ස්ථිරත්වයේ ප්‍රමාණය දැන ගැනීමේ ආසාවෙනි. සමහර අවස්ථාවලදී ගැටවරයෝ ඔවුන්ගේ මුග්ධ යෞවනත්වය නිසාත්, වැඩිහිටියන්ගේ ශක්තිය කෙරෙහි ඔවුන් තුළ ඇති වන ඊර්ෂ්‍යාව නිසාත්, ඔවුන්ගේ මාංස පේශීවල සහ ඇටකටුවල ශක්තියට උසුලාගත නොහැකි වැඩි බරක් එසවීමට තැත් කරති. එමෙන්ම, ඔසවති. වැඩිහිටි ශක්තිමත් මිනිසුන් රාත්තල්

65ක් බැගින් වූ යකඩ බෝල දෙකකින් ව්‍යායාම් කරන සැටි බලා එලෙස අනුකරණය කරති.

මමද එය වක්‍ර අරුත් අනුවත්, වචනයේ පරිසමාප්ත අරුත් අනුවත් සැබැවින්ම කායික ලෙසත්, ආධ්‍යාත්මික ලෙසත් කර ඇත්තෙමි. අහඹුවේ භාග්‍යයට පින්සිදු වන්නට මරණයට මූණ නොපා, ඉතිරි ජීවිතය පුරා අබ්බගාතයකු නොවී, බේරුණෙමි. ඉවසීම සහ බාහිර තත්ත්වයන්ගේ බලයට යටවීම තරම් බියජනක ලෙස අන් කිසිවක් මිනිසා විකෘති නොකරයි.

කෙසේ හෝ අවසානයේදී මා විකලාංග වූවකු සේ මිය යන්නේ නම්, අවුරුදු හතළිහක් තිස්සේ වැඩිමහලු සද්ගුණවත් මිනිසුන් මගේ අධ්‍යාත්මය විනාශ කිරීමට බැරෑරුම් ලෙස කටයුතු කළ බවත්, ඔවුන්ගේ දඟකාරී පරිශ්‍රමය එතරම්ම සාර්ථක නොවූ බවත් මා ප්‍රකාශ කරන්නේ උඩඟුවෙන් තොරව නොවේ.

දඟකිරීමටත්, මිනිසුන් විනෝද කරවීමටත්, ඔවුන් සිනැස්සවීමටත් මා තුළ ඇතිවූයේ අති මහත් ආසාවෙකි. නිෂ්නී කඩපොළේ වෙළෙඳුන් ගැන කතා කරමින් මා රඟ පෑ විටත්, අපේ කඩයට එන ගැමි පිරිමින් හා ගැමි ගැහැනුන් ඉකෝන මිලදී ගන්නා සැටි අංග චලනයෙන් කියා පෑ විටත්, අපේ කළමනාකරුවා ඔවුන් රවටන සැටි සහ තක්සේරුකරුවන් වාද විවාද කරන සැටි රඟපෑමෙන් විස්තර කළ විටත්, ඔවුහු ඉතා සතුටින් ප්‍රීතියට පත් වූහ.

චිත්‍රාගාරයේ මිනිසුන් බක බක ගා සිනාසෙන්නට වූයේ කරමින් සිටි වැඩ පවා නවත්වා ලමිනි. එහෙත්, හැමදාම එවැනි රඟපෑමකින් අනතුරුව ලරිඕනිච් මට උපදෙස් දුන්නේය.

"නුඹගේ රඟපෑම රාත්‍රී කෑමෙන් පසුව ප්‍රදර්ශනය කරපන්. නැතිනම් අපේ වැඩවලට බාධා වෙනවා."

එවැනි රඟපෑමකින් ඉක්බිතිව මගේ හදවත සැහැල්ලු වූයේ කරින් ගෙනගිය විශාල බරක් මුදාලූ විටෙක මෙනි. පැයක් පමණ හිස ප්‍රීතිය මුසු පුහු බවකින් පිරී තිබිණි. එහෙත්, ඉන් පසුව, මගේ හිස තුළ තියුණු ඉදිකටු ගොඩක් තිබෙන බව සහ ඒවා රත්වෙමින් පවතින බවත් හැඟෙයි.

මා වටේට කිසියම් කුණු සහිත කැඳ වැනි යමක්

කැකෑරෙමින් තිබෙන අතර, එහි මා තැම්බී දියවී යන සැටියක් දැනෙයි.

මට මෙසේ සිතිණි.

"ඇත්තටම මුළු මහත් ජීවිතයම මේ වගේද, මටත් මේ මිනිසුන් වගේ ජීවත් වීමට සිදුවේද? මෙයට වඩා යහපත් දේ දැකීමට මට නොහැකි වේද?"

"මක්සීමිච්, නුඹට ජුවල් නඟිනවා නේද?" ෂිහර්යොව් මට කියන්නේ මා දෙස අවධානයෙන් බලමිනි.

සිතානවිද මගෙන් නිතර ප්‍රශ්න කරන්නට විය.

"නුඹට මක්වෙලාද?"

ජීවිතය, මගේ ඉතාම හොඳ සිතුම්, පැතුම් මගේ අධ්‍යාත්මයෙන් අකා මකා දැම්මේ මුරණ්ඩු ලෙස හා ගොරහැඩි ලෙසය. ඒ වෙනුවට එය මගේ සිතට කුරිරු ලෙස අනවශ්‍ය කුණු රොඩු පුරවාලීය. මේවායේ හිංසනයට විරුද්ධව මම කෝපයෙන් සහ දැඩි ලෙස නැඟී සිටියෙමි. අනික් අය පීනන ජීවන ගංගාවේ මාත් පිහිනුවද, අන් අයට වඩා එම ජීවන ගංගාවේ ජලය ශීතල බවක් මට දැනිණි. එය අනික් අය මෙන් ලෙහෙසියෙන්, මා උසුලා නොගත්තේය. මා එම ජීවන ගංගාවේ පතුලට ගිලෙන සැටියෙක් මට දැනිණි.

මිනිසුන් මා කෙරෙහි වඩාත් හොඳ ආකල්පයක් දැක්වූ අතර, පාවෙල්ට මෙන් මට කැනොගැසූහ. මට පියාගේ නම අනුව (මක්සීමිච් යනුවෙන්) ඇමතුවේ ඔවුන් මට වඩාත් ගරු කරන බවක් පෙන්වමිනි. එහෙත්, මිනිසුන් අතිමහත් සංඛ්‍යාවක් වොඩ්කා බොන සැටිත්, ඔවුන් නීච බේබද්දන් මෙන් හැසිරෙන සැටිත්, ඔවුන් ස්ත්‍රීය කෙරෙහි දක්වන ව්‍යාධිමය ආකල්පයත් දැකීම මට සිත් වේදනාව ගෙන දිණි. එසේ වුවද, මේ ජීවිතයේ එකම අස්වැසිල්ල වොඩ්කා සහ ස්ත්‍රීය බව මට නොවැටහුණා නොවේ.

බුද්ධිමත්, නිර්භය නතාලියා කස්ලොව්ස්කයා පවා ගැහැනිය විනෝදයක් ලෙස නම් කිරීම ගැන මා නිතර කල්පනා කළේ, දොම්නසකින් යුතුවය.

එසේනම් ආච්චි ගැන කොහොමද? මර්ගෝ රැජින ගැන කොහොමද?

මර්ගෝ රැජින ගැන මා කල්පනා කළේ බියට ආසන්න

වූ හැඟීමෙකිනි. ඇය හැම දෙයකටම පිටත්තර වූ අතර, මා ඇය දුටුවේ සිහිනෙකින් මෙනි.

ගැහැනුන් ගැන මම ඕනෑවට වැඩියෙන් කල්පනා කරන්නට පටන් ගතිමි. මීළඟට එන උත්සව දවසේදී අනික් හැම දෙනාම යන තැනට මමත් යම්ද? එය කායික අවශ්‍යතාවක් පිරිමසා ගැනීමේ ආසාවක් නොවීය. මගේ ශරීර සෞඛ්‍යය යහපත් වූ අතර, පවිත්‍රතාව ගැන විශේෂ සැලකිල්ලක් මම දැක්වීමි. එහෙත්, කිසියම් සුරතල්, බුද්ධිමත් කෙනෙකු වැලඳගැනීමටත්, ඇයත් සමඟ මවුට මෙන් දීර්ඝ සහ විවෘත ලෙස කතා කිරීමටත්, ඇයට මසිතෙහි ඇති බිය ගැන කීමටත්, මට ඇති වූ ආසාව නිම්හිම් නැති තරම්ය.

හැමදාම රෑට පාවෙල් මට ඔහුගේ පෙම් හබය ඉස්සරහ ගෙදර ගෘහ මෙහෙකාරිය සමඟ ඇති ආදරය ගැන කියන විට මම ඔහුට සුහද සිතින් ඊර්ෂ්‍යා කළෙමි.

"මල්ලී ඔන්න බලාපන් වැඩක හැටි. මීට මාසයකට ඉස්සෙල්ලා මම ඇයට හිම ගුළිවලින් ගැහැව්වා. ඒ කාලෙදි ඒකි මගේ හිතට එතරම් ඇල්ලුවේ නැහැ. දැන් බංකුව උඩ වාඩිවෙලා ඒකිට තුරුලු වුණාම, ඒකි තරම් වටිනා කෙනෙකු මට මේ ලෝකෙම නැහැ."

"නුඹලා කතා කරන්නෙ මොනවා ගැනද?"

"සත්තකින්ම හැම දෙයක් ගැනම. එයා මට එයා ගැන කියනවා. මම ඇයට මා ගැන කියනවා. ඉතින් අපි සිපගන්නවා. එයා බොහොම අවංකයි. එයා බොහොම හොඳයි. ඒක තමයි ලොකුම කරදරය. ඇයි බං නුඹ පරණ සෙබළෙක් වගේ දුම් බොනවා නෙව!"

මම බොහෝ සේ දුම් බොමින් දුම්කොළ මඟින් නොසන්සුන් අදහස් සහ කුපිත හැඟීම් මොට්ට කර දැමීමි. වොඩ්කාවල ගඳ සහ රසය, වාසනාවකට මෙන් මා කුප්පාලීය. එහෙත්, පාවෙල් ආසාවෙන් කට ගොන්නක් වොඩ්කා බී වෙරිවී දුක් ගැනවිලි ඉදිරිපත් කරමින් අඬන්නට විය.

"මට ගෙදර යන්න ඕන. මට ගෙදර යන්න ඉඩ දීපල්ලා!"

එහෙත්, පාවෙල් දෙමාපියන් නැති අනාථ දරුවකු බව මම දැන සිටියෙමි. ඔහුගේ මව සහ පියා බොහෝ

කලකට පෙර මිය ගියහ. ඔහුට සහෝදර සහෝදරියන් නොවීය. වයස අවුරුදු අටේ සිට ඔහු ඇති දැඩි වුණේ පිට මිනිසුන්ගේ ඇසුරෙනි.

මගේ මේ අසතුටුදායක හැඟීම් වසන්තය පැමිණීමත් සමඟම තවත් වැඩිවූයෙන්, යළිත් නැවේ රැකියාවට යාමටත්, එතැන් සිට ආස්ත්‍රහාන්වලට ගොස් අනතුරුව පර්සියාවට පැන යාමටත් මම තීරණය කළෙමි.

අන් කිසි රටකට නොව, පර්සියාවට පැනයාමට ආසාවක් ඇතිවූයේ මන්ද? සමහර විට නීෂ්නි නොව්ගොරොද් වෙළඳ පොළට පැමිණ සිටින පර්සියානු වෙළෙන්දන් මගේ සිත් ගත්තා විය හැකිය. ඔවුන්ගේ පාට කළ යටි රැවුළු අව්වට වේළමින්, ඔවුන් වාඩිවී සිටින්නේ ගලින් නෙළූ රූප මෙනි. ඔවුහු 'කල්යාන්' නමැති දිගැති දුම් කෝවයක් උරති. ඔවුන්ගේ නෙත් විශාලය. කළු පැහැතිය. හැම දෙයක්ම දන්නා බවක් ඒවායින් පළ වේ.

සමහර විට මා කොහේ නමුදු පැන යාමට ඉඩ තිබුණද, ඒ පාස්කු උත්සව සතියේදී චිත්‍රාගාරයේ ශිල්පීන්ගෙන් එක් කොටසක් තම ගම් රටවල් බලා ගිය නිසාත්, අනික් කොටස මත්පැන් පානය කරමින් සිටි නිසාත්, එදින ඔකා නදිය සහ අවට වතුපිටිවලට හිරු පායන්නට පූයෙන් මම එහි ඇවිදින්නට ගියෙමි. අතරමඟදී මට මගේ හිටපු හාම්පුතා, ආච්චිගේ බෑනා හමුවිය.

අළුවන් සැහැල්ලු වසන්ත කබායක් ඇඟ ලා ගෙන, කලිසම් සාක්කුවලට දෑත් ඔබා ගෙන, දෙතොලට සිගරැට්ටුවක් හිර කරගෙන, තොප්පිය හිසේ පසු පස වැසෙන සේ දමාගෙන පැමිණි ඔහු මා දෙස බලා මඳ සිනා පෑවේ, සතුටු සිතිනි. ඔහුගේ පෙනුම නිදහස්ය. ප්‍රීතිමත්ය. ඔකා නදිය අසල පිටියෙහි අප දෙදෙනා හැරුණු විට අන් කිසිවෙක් නොසිටියහ.

"ආ පෙෂ්කෝව්, ක්‍රිස්තුන් වහන්සේ මළවුන්ගෙන් නැඟිට්ට සේක!"

මමත් ඔහු අනුකරණය කරමින් ජේසුතුමාට ස්තෝත්‍ර ගැයීමි. ඔහු මගේ ජීවන තතු විමැසූ විට, චිත්‍රාගාරයත්, නගරයත්, අනික් හැම දෙයක්මත් මට එපාවී තිබෙන බව මම ඔහුට විවෘත ලෙස කිව්වෙමි. පර්සියාවට පලා යාමේ

අදහසද හෙළි කළෙමි.

"ඔය පිස්සු කතා දොඩවන්න එපා. නුඹට පර්සියාව, මොන යකාටද? මම දන්නවා මාත් නුඹේ වයසේදී හැම දෙයක්ම දාලා පැනලා යන්න කල්පනා කළා."

ඔහු හැම දෙයක්ම යකාට දමා කතා කරන සැටි මගේ සිත් ගත්තේය. ඔහුගේ සිත සතුටිනි. වසන්තයේ උද්යෝගය ඔහුට ආවේශ වී ඇත. ඔහුගේ මුහුණ මදක් ඇලවෙලාය.

"දුමක් අදිනවද?" ඔහු මෙසේ අසමින් ඔහුගේ දිරිමය සිගරැට් කොපුව මා වෙත දිගු කළේ, එහි ඇති මහත පැපිරොස් සිගරැට් සමඟය.

ඔහුගේ මෙම ක්‍රියාව නිසා මා ඔහු කෙරෙහි බෙහෙවින් පැහැදුණෙමි.

"පෙෂ්කෝව්, නුඹ මා ළඟ ආයෙමත් වැඩට වරෙන්..." යැයි ඔහු යෝජනා කළේය. "මේ අවුරුද්දේ මම සල්පිලේ මඩු හදන්න රූබල් හතළිස් දාහක ඇණවුම් අරගෙන තියෙනවා. නුඹට තේරුණාද? මම නුඹට සල්පිලේ වැඩ බාර දෙන්නම්. මගේ නඩයේ ලොක්කා හැටියට නුඹ වැඩ කරපන්. බඩු බාහිරාදිය භාර ගනින්. ඕන කරන දේ ඕන වේලාවට සපයන්න ඕන. කම්කරුවන්ට හොරකම් කිරීමට ඉඩ තියන්න එපා. නුඹ කැමතිද? පඩිය මාසයකට රූබල් පහයි. දවල් කෑමට කොපෙක් පහයි. ගෙදර ගෑනු අම්මණ්ඩිලත් සමඟ නුඹට ඇති ගනුදෙනුවක් නැහැ. උදේට ගෙදරින් පිට වුණා, හවස ගෙදර ආවා. ගෑනු අතේ දුරින්! අපි මෙහෙම හමුවෙලා කතා කරපු බව ඒගොල්ලන්ට කියන්න ඕන නැහැ. ඉරිදාට නුඹ අපේ ගෙදරට වරෙන්. පොමා මුනිවරයාගේ උත්සවයට. එකඟද?"

ඔහු මිතුරකුට මෙන් මට අතට අත දී ආචාර කොට, මා ඉවත යත්ම තොප්පිය වැනීය.

මා චිත්‍රාගාරයෙන් ඉවත්ව යන බව ශිල්පීන්ට කී විට, ඔවුන් මගේ සිත සතුටු කරවන අන්දමින් ඔවුන්ගේ කනගාටුව පළ කළ අතර, පාවෙල් විශේෂයෙන් නොසන්සුන් විය.

"අපෙන් පසුව වෙනත් මූෂිකයින් සමඟ නුඹට ජීවත්

වෙන්න පුළුවන්ද? නුඹම කල්පනා කරලා බලාපන්. වඩුවන්, හුනු ගාන්නන්... අනේ බාං... ඔවැනි වැඩවලට කියන්නේ, පල්ලියේ සුවාමි ළඟ ඉඳලා අන්නවිරාල ළඟට ගියා වගේ කියලා."

ෂිහර්යොව් ඇනුම් පදයක් එල්ල කළේය.

"මාළුවා කැමැති ගැඹුරු ජලයට, තරුණ වීරයා කැමැති වඩාත් අමාරු දේවලට."

චිත්‍රාගාරයේ සගයන් මගෙන් සමුගැනීම සඳහා පැවැත්වූ උත්සවය කනගාටුදායක මෙන්ම අප්‍රියජනක විය.

"සත්තකින්ම හැම දෙයක්ම අත්හදා බලන්න ඕන. වැඩියත්ම හොඳයි එක පාරටම මොකක් හරි එක දෙයක් තදින් අල්ලා ගැනීම..." වෙරිවීමෙන් කහ පැහැගෙන සිටි ෂිහර්යොව් පැවසීය.

"මුළු මහත් ජීවිතයටම" ලරිඕනිච් සෙමින් එකතු කළේය.

ඔවුන් එසේ කතා කරන්නේ ඉමහත් පරිශ්‍රමයකින් හා යුතුකමක් හැටියට බව වටහාගත් මට ඔවුන් සමඟ මා මෙතෙක් බැඳී සිටි හුය පට එකවරම දිරාපත් වී කැඩුණු බව අවබෝධ විය.

පොලාති ලී මැස්ස උඩ වෙරි වී වැතිර සිටි ගෝගලෙව් දොඩවන්නට විය.

"මට ඕන නම් තොපි ඔක්කෝමල්ලව සිර ගෙදරට යවන්න පුළුවනි. මම එක රහසක් දන්නවා. දෙවියන්ව විශ්වාස කරන්නේ කවුද? ආ. දැක්කද?"

හැමදා මෙන්ම, එදත් බිත්තියේ මුහුණු රහිත ඉකෝන රූප එල්ලා තිබිණි. සීලිමේ වීදුරු බෝල සවි කරලාය. පාන් පත්තු කරගෙන වැඩ කිරීම දැන් බොහෝ කලක සිට නවත්වා තිබුණු බැවින් වීදුරු බෝල දුඹුළුවලින් සහ දූවිලි තට්ටුවලින් වැසී තිබිණි. එහි ඇති හැම දෙයක්ම මට කොතරම් හොඳින් මතක තිබේදයත්, දෙනෙත් පියාගෙන අඳුරේ වුවද අප වාසය කළ පොළොවෙන් යට තට්ටුවේ පිහිටි බිම් ගෙය දැකිය හැකිය. එවිට එහි ඇති මේසත් ජනෙල් පඩිවල ඇති තීන්ත සහ සායම් බඳුන්, පින්සල් පොකුරු, ඉකෝන චිත්‍ර, මුල්ලේ තිබෙන කුණු

බක්කියද ගිනි නිවන හමුදා භටයකු ගේ තොප්පියක් වැනි පිත්තලමුවා මුහුණ සෝදන බේසමද, පොලාති මැස්සෙන් දොට්ට පැන ඇති, නිල් පැහැති, දියේ ගිලී මැරුණු මිනිහකුගේ බඳු ගෝගලෙව්ගේ දෙපාද මට පෙනෙයි.

ඉක්මනින් චිත්‍රාගාරයෙන් පිට වීමට මට අවශ්‍ය වූවද රුසියාවේ මිනිස්සු සමුගැනීමේ දොම්නස සහිත කාලය දිග්ගැස්සවීමට ආසා කරති. සමුගනිමින් මිනිසුන් හැසිරෙන්නේ දුක් පූජාවට සවන් දෙන විටෙක මෙනි.

ෂිහර්යොව් බැම නටවා මට මෙසේ පැවසීය:

"අර යක්ෂයා ගැන කතාව තියෙන පොත මම නුඹට දෙන්නෙ නැහැ. නුඹට ඕන නම් මම දහයේ කාසි දෙකක්ම දෙන්නම්. නුඹ කැමතිද?"

ඒ පොත මා සතු වස්තුවකි. ලෙර්මන්තව් විසින් ලියන ලද ඒ පොත ගිනි නිවන හමුදාවේ හිටපු බ්‍රන්දෙමෙයිස්තර් නිලධාරියා මට තෑගි කළේය. එය වෙනත් කෙනෙකුට දීම මට නොරිසි විය. මා මුදල් ප්‍රතික්ෂේප කළ විට ෂිහර්යොව් සන්සුන් ලෙස එය පසුම්බියේ දමාගත්තේ ස්ථිර ලෙස මෙසේ කියමිනි.

"නුඹට කැමැති විදිහක්. මම ඒ පොත ආපහු දෙන්නේ නැහැ! ඒ පොත නුඹට සරිලන එකක් නොවෙයි. ඒක එයින් නුඹ අමාරුවේ වැටෙන්න පුළුවනි."

"ඔය පොත කඩේ විකුණනවා මම දැක්කා!"

ඒ වර ඔහු කතා කළේ ඒත්තු ගන්වන ආකාරයෙනි.

"ඉතින් ඒ කතාවේ කිසිම තේරුමක් නැහැ. කඩේ පිස්තෝල පවා විකුණනවා නොවැ..."

එලෙස ඔහු මට ලෙර්මන්තව්ගේ පොත ආපසු නොදුන්නේය.

චිත්‍රාගාරයේ සහ වෙළඳහලේ අයිතිකාරිගෙන් සමු ගැනීම සඳහා මම උඩුමහලට නැංගෙමි. ඉදිරිපස කාමරයේදී මට ඇගේ ලේළිය හමුවූවා, ඈ මගෙන් ප්‍රශ්න කළාය.

"නුඹ අස්වී යනවයි කියන්නෙ හැබෑද?"

"යනවා"

"නුඹට අස්වී යන්න ඉඩ නොදී, නුඹව පන්නා දැම්මා

නම් තමයි හොඳ" ඇය එසේ කිව්වේ ආචාරශීලී ලෙස නොවූවද, ඉතා අවංක ලෙසිනි.

පදමට වෙරි වී සිටි ස්වාමි දුව මට කතා කළාය.

"ආයුබෝවන් නුඹට ජේසුගේ පිහිටයි! නුඹ නරක කොල්ලෙක් ලු. දඟකාරයෙක් ලු! නුඹ නරක වැඩක් කරනවා මා නොදුටුවාට හැම දෙනාම කියනවා නුඹ නරක කොල්ලෙක් කියලා."

හිටිහැටියේම අඬමින් මෙසේද කිව්වාය.

"මැරිච්ච මගේ මිහිරි, රත්තරන් මහත්තයා හිටියා නම්, නුඹට හොඳ පාරවල් දෙකතුනක් දේවි. හොඳට ටොකු අනීවි. එළවන්නේ නැතිව තියාගනීවි! දැන් මෙතන වැඩ සේරම වෙනින් විදිහකටයි සිද්ධ වෙන්නේ. වරදක් දැක්ක හැටියේම එළවලා දමනවා. අනේ කොල්ලෝ නුඹ කොහේ යනවද?"

XVI

අනාගත සල්පිල් භූමිය හිම දියවීමත් සමඟම ගං වතුරට යටවී ඇති බැවින් මම මගේ හාම්පුතාත් සමඟ ඔරුවෙන් යමි. දෙමහල් ගොඩනැඟිල්ලක් තරම් උසට ජලය පිරී ඇත. හාම්පුතා අවරයේ වාඩි වී නුහුරු ලෙස සුක්කානම මෙහෙයවන අතර, මම හබල්වලින් ඔරුව පදවමි. ඔරුව මෙහෙයවන සුක්කානම දිය යටට කිමිදී ඇති බැවින් ගමන සෙමින් සිදුවේ. වතුරෙන් පිරී ඇති වීදියක් පාසා අපි ඔරුව පැදීමු.

"මේ පාර වතුර කොතරම්ද! මහ යක්ස කෙළියක් නොව! අපේ වැඩවලට මේක අවහිරයක්!" සුරුට්ටුවක් උරන හාම්පුතා මැසිවිලි දොඩවයි. ඒ සුරුට්ටු දුම රෙදි පිච්චෙන දුමට පුසුඹෙන් සමානය.

"හෙමින්! නැතිනම් ලාම්පු කණුවකට හැප්පේවි." හාම්පුතා බියෙන් කෑගසයි.

මම ඔරුව නිසි මඟට ගෙන ගිය විට, ඔහු බැණ වදින්නට පටන් ගත්තේය.

"ඔන්න මට දීපු ඔරුවක හැටි, නීචයෝ!"

වසන්ත දිය කඳ බැස ගිය පසු, කඩපෙළ සාදන

තැන් ඔහු මට පෙන්වයි. ඔහුගේ කොපුල් නිල් පැහැවන තරමට ඔහු රැවුළ බා ඇත. ඔහුගේ උඩු රැවුළ කොටට කපලාය. ඔහුගේ බාහිර පෙනුම කොන්ත්‍රාත්කරුවකුට සමාන නොවේ. සම්මුවා කබායක් ඇඟලාගෙන, දණහිස දක්වා උසැති සපත්තු කුට්ටමක් පයලා ගෙන. පතොරම් සහිත පෙට්ටියක් උරහිසින් ගෙන. 'ලේබේල්' වර්ගයට අයත් කානු දෙකේ තුවක්කුවක් අතින් ගෙන, දෙකොපුල් පුම්බා ගෙන අසහනයකින් ඔහු වට පිට බලයි. තොප්පිය හිසේ පිටුපස වැසෙන සේ දමාගෙන, යම් කිසි ප්‍රියමනාප දෙයක් ගැන සිතමින් උඩු රැවුළ දෙස බලා මඳ සිනා පාන විට ඔහුගේ මුහුණේ තරුණ බවක් මැවෙයි. ඔහුට වැඩ අධික බවත්, වතුර සෙමින් බැස යාම ඔහු ගේ සිතට නොසන්සුන්තාවක් ගෙන දෙන බවත් සිතා ගැනීම ලෙහෙසි නොවේ. ව්‍යාපාරික කටයුතුවලට අයිති නැති හැඟීම් මාලාවක් ඔහුගේ සිතෙහි මැවී ඇතිවාක් සේය.

නිහඬ මවිතය මුසු හැඟීම් මා පාගා ගෙන ඇත. ජීවය රහිත මේ නගරයේ කෙළින් වීදියේ ඇති ගොඩනැඟිලිවල ජනේල සියල්ල වසා තිබීමත්, අපේ ඔරුව පැදවෙන අවට ප්‍රදේශ ජලයෙන් යටවී තිබීමත් නිසා පැන නැඟී ඇති දර්ශනය පුදුමාකාරය.

අහස අළු පැහැතිය. හිරු වලාකුළුවලට වැසිලාය. ඉදහිට වලා අතරින් පෙනෙන හිරු හිම කාලයේදී දකින රිදීවන් ලපයකට සමානය.

ජලයද අළු පැහැතිය, ශීතලය, ගලා බසින ජලය පහර ඇසට නොපෙනෙයි. හිස් නිවාස පන්තිත්, කුණු සහිත කහ පැහැති තීන්ත ගෑ කඩපෙළත් සමඟ ජලය නිද්‍රාවට හසුවූවාක් වැන්න. වලා අතරින් හිරු යම්තමින් හෝ පැහැදිලිව පෙනෙන විට, අවට හැම දෙයක්ම තරමක් ආලෝකවත් වෙයි. ජලය ඇඳිරි අහස පිළිබිඹු කරයි. එවිට ආකාශ දෙකක් අතර අපේ ඔරුව එල්ලී සිටින්නාක් මෙනි. ගලින් කළ විශාල ගොඩනැඟිලි පවා වොල්ගා සහ ඔකා නදී දෙසට ළංවන සැටියෙකි. ඔරුව වටා පීප්ප, පෙට්ටි, වට්ටි, ලී පතුරු, පිදුරු පාවෙයි. සමහර විට මිය ගිය ගැරඬියකුගේ මළකුණක් වැනි රිටක්, ලී කොටයක් වැනි දේද පාවෙයි.

සමහර ගෙවල්වල ජනේල විවෘත කර ඇත. වහල උඩ වැල් ඇද රෙදි වේළන සැටි පෙනේ. හිම කාලයට අදින වාලෙන්කි සපත්තු අච්චේ වේළෙයි. එක් කවුළුවක් අසල ගැහැනියක් සිටගෙන ජලය දෙස බලයි. පියස්සක් අසල යකඩ කණුවකට ඔරුවක් බැඳ ඇත. ඒ ඔරුවේ රතු පාට බඳය ජලයෙන් පිළිබිඹු වන්නේ තෙල් සහිත මස් කැබැල්ලක් මෙනි.

ජීවිතය පිළිබඳ සලකුණු කියන ඒ දර්ශනය මට ඉඟියෙන් පෙන්වන හාම්පුතා මෙසේ විස්තර කරයි.

"මෙතැන තමයි සල්පිලේ මුරකරුවා වාසය කරන්නෙ. ජනේලයෙන් පියස්සට නැඟ ඔහු ඔරුවට බසී. ඔරුවෙන් ගිහිල්ලා හොරුන් ගැන හොයනවා. හොරුන් නැත්ද? නැතිනම් මුරකරුවාම හොරකම් කරනවා."

ඔහු කුසීත ලෙසත්, සන්සුන් ලෙසත් කතා කරන්නේ වෙනත් යමක් ගැන සිතමිනි. අවට නිසලය. පාළුය, නිදිබර සිහිනයක් මෙනි. වොල්ගා සහ ඔකා නදී දෙකම එකට හාවී යෝධමය විලක් මැවිලාය. ඈත කඳු මුදුනේ පිහිටා ඇති නගරය විවිධ වර්ණවලින් යුක්තය. නගරයේ උයන් වතුවල ගස් තවමත් කළු පැහැයෙන් පෙනුණද පොහොට්ටු යම්තම් වැවී කොළ පැහැගෙන ඇත. මේ උයන වතු හරිත වර්ණ තුරු අතුවලින් පිරුණු විට ඒවා නගරයේ නිවාස පන්ති සහ දේවස්ථාන සරසාලයි. එය උණුසුම් සහිත හරිත වර්ණ කබායක් වැන්න. වසන්ත ගංවතුරට ඉහළින් පාස්කු සමයේ හඬ පැතිර යයි. නගරයේ හඬ ඇත ඇසෙතුදු මෙතැන සොහොන් පිටියෙක මෙන් නිහඬතාවකි.

චේර්නි ගස් දෙකක් අතරින් අපේ ඔරුව පැද්දෙයි. අපි දැන් මහ මාවතේ ඇති පැරණි දේවස්ථානය වෙතට ඔරුව පදවමු. හාම්පුතාගේ සුරුට්ටුවෙන් පිට වන දුම්වලා ඔහුට බාධා කරයි. ඔහුගේ දෑසින් කඳුළු ගලයි. අපේ ඔරුවේ ඇණියේ, අවරයේ සහ බඳයෙන් ඇතුළට වතුර කාන්දු වෙයි. හාම්පුතා කෝපවෙයි.

"උන් දීපු ජරා ඔරුවක හැටි!"

"ඔබ සුක්කානම කරකවන්න එපා."

"මේ වගේ ඔරුවක එය කරන්නේ කොහොමද?" ඔහු

අසයි. "ඔරුවක දෙන්නෙක් ඉන්නවනම් එකෙක් හබල් වලින් ඔරුව පදිනවා. අනිකා සුක්කානම කරකවනවා. ඔන්න බලාපන් චීන කඩපේළිය..."

මම මේ කඩපෙළ බොහෝ කලෙක සිට ඉතා හොඳින් දනිමි. අමන පියසි සහිත විකට කඩපෙළ මා දැක ඇත. පියසි මත එරමිණියා ගොතාගත් චීන පිඟන් මැටි රූප තිබිණි. සමහර රූපවල නාස, අත් පා සහ මුහුණු බිඳ දමනු ලැබ ඇත්තේ මා විසින් වුවද, දැන් නම් මම එවැනි හපන්කම් ගැන ආඩම්බර නොවෙමි. ඒ කාලයේදී කොලු රංචුව සමග එකතු වී ඒ රූපවලට ගල් ගැසීම අපේ විනෝදාංශයක් විය.

"මොන ගොන් වැඩක්ද"යි ඔහු අසන්නේ චීන කඩපෙළ දෙස අතක් දිගු කරමිනි. "මේවා හදන්ට මට භාරදුන්නා නම්...."

තොප්පියෙන් හිසේ පසු පස කොටස වසාගෙන ඔහු උරුවම්බායි.

ඔහුද මේ ගල්මුවා නගරයේ අවුරුදු පතා නදී දෙකක ගංවතුරින් යටවන පහත් බිමෙහි, මෙවැනිම පහත් රුචියෙකින් මඩු ආදිය සාදනු ඇතැයි යම් කිසි හේතුවක් නිසා මට සිතෙයි. චීන කඩපෙළ ගැනත් එසේම සිතනු ඇත.

සුරුට්ටුව ජලයට වීසි කොට, කාරා කෙළ පිඬක් ගසා කතා කිරීමට පටන් ගත්තේය.

"හරිම පාළුයි. පෙෂ්කොව්, හිතට කාන්සිය. උගත් මිනිසුන් නැහැ. කතා කරන්න මිනිහෙක් නැහැ. පුරසාරම් දොඩවන්න කැමතියි. නමුත්, කා ඉදිරිපිටද? මිනිසුන් නැහැ. ලී වඩුවෝ, ගල් වඩුවෝ, ගමයෝ, පල්හොරු...."

ඔහු දකුණු පස කඳු ගැටය මත ගොඩනඟා ඇති සුදුවන් මුස්ලිම් පල්ලිය දෙස බලයි. අමතක වූ යටගියාව මතක් කරන්නාක් මෙන් කතා කරයි.

"මම බීර බොන්නයි, සුරුට්ටු දුම් උරන්නයි පටන් ගත්තා. ජර්මන්කාරයෙක් වගේ. ජර්මන්කාරයෝ දක්ෂ බිස්නස්කාරයෝ. හරිම තිරිසන් කුකුළන් වගයක්. බීර බීම හිතට සැපක්. සුරුට්ටුවලට තවම පුරුදු වී නැහැ. සුරුට්ටු උරපුවාම ගෑනි දොඩවන්න පටන් ගන්නවා. 'ඔයා ළඟ

බොහොම ගඳයි. සත්ත්ව හම්වල ගඳක් නේද?' ඔව්. මල්ලී ජීවත් වෙනවා. කපටි වැඩ කරනවා. ඔන්න නුඹම සුක්කානම කරකවාපන්...."

ඔහු හබල ඔරුවේ තබා තුවක්කුවෙන් චීන වහලේ ඇති පිඟන් මැටි රූපයකට වෙඩි තැබීය. පතොරොම් කැබැලි අවට පැතිරී දුමක් නංවා වහල මත පැතුරුණද, රූපයට හානි නොවීය.

"ඉලක්කය වැරදුණා" යැයි කියන හාම්පුතා කනගාටුවෙන් තොරව යළිත් තුවක්කුවට පතොරම් පුරවයි.

"නුඹ තවම කෙල්ලන් ගැන හිතන්නෙ නැත්ද...? නැත්ද? මම නම් මට වයස අවුරුදු දහතුනේදී ආලය කරන්න පටන් ගත්තා."

ඔහු සිය කුලුඳුල් ආලය ගැන විස්තර කරන්න පටන් ගත්තේ සිහිනයකින් මෙනි. ඔහු වාස්තු ශිල්පියකු යටතේ ඉගෙන ගන්නා කාලයේදී, එම ශිල්පියාගේ මෙහෙකාරියට ආලය කරන්නට විය. ගොඩනැගිලි සෝදා හරිමින් වසන්ත ජල කඳ සෙලවෙයි. දේවස්ථානයට එපිට ඇති ජලකතර අපැහැදිලි ලෙස දිලිසේ. තැනින් තැන කළු පැහැති රිටි වැනි දේ මතුවී පෙනෙයි.

ඉකෝන රූප අඳින චිත්‍රාගාරයේ නිතර ගැයූ ගීතයකි, පූජකාරාමයේ ගීතය.

නිල්වන් මුහුද
කැරැලිකාරිය...

ඒ නිල්වන් මුහුද සිත කය පාළු කළා විය යුතුය.

"රෑට මට නින්දක් නැහැ. රෑට ඇඳෙන් නැඟිටලා ඇගේ දොර ළඟට ගිහිල්ලා බලුපැටවකු වගේ වෙවුලනවා. ඒ ගෙදර බොහොම හීතලයි! රෑට ගෙදර අයිතිකාරයා ඒකි ළඟට එනවා. මාව අහුවෙන්ට වුණත් පුළුවනි. ඒත් මම බය වුණේ නැහැ. ඔව්..."

පැරැණි, දිරාපත් වුණු කබායක් ආයෙමත් ඇඟලා ගත හැකිද නැත්ද යන්න ගැන කල්පනා කරමින් කතා කරන සැටියකි. ඔහු මවා පෑවේ.

"ඈ මාව දැක්කා, මට අනුකම්පා කළා. දොර ඇරලා

කතා කළා. මෝඩපැටියා, මෙහෙ වරෙන් කියලා."

මා එවැනි කතා බොහොමයක් අසා ඇත. ඒවායෙහි කිසියම් සතුටුදායක ලක්ෂණයක් තිබුණද ඒවා මට එපා විය. මිනිසුන් තම කුලුඳුල් ආලය ගැන නිතර පාහේ කතා කළේ, පුරසාරම් දෙඩීම්වලින් තොරවය. කැතකමින් තොරවය, නිතර පාහේ සුරතල් සහ දොම්නස් ලෙසිනි. කතාකරුවන්ගේ කුලුඳුල් ආලය ඔවුන්ගේ ජීවිතයේ ඉතාම උසස් දෙය බව මම එයින් වටහා ගතිමි. බොහෝ දෙනෙකුගේ එකම යහපත් දෙයද එය පමණකි.

සිනාසී හිස සලමින් හාම්පුතා තම අදහස් කියා පෑවේ මවිතයෙනි.

"මගේ ගෑනි ගැන එහෙම කියන්න බැහැ. බැහැ බැහැමයි. ඉතින් හේතුව මොකක්ද කියන්න එහෙම දෙයක් නැහැ. ඔන්න ඔහොමයි කෙරුවාව..."

ඔහු දැන් කතා කරන්නේ මට නොව, ඔහුටමය. ඔහු නිහඬව සිටියේ නම් මා කතා කරනු ඇත. ඒ නිහඬතාව සහ පුහු බව තුළ කතා කිරීම, ගී ගැයීම, ඇකෝඩියන් වාදනය වැනි දෙයක් කිරීම අවශ්‍යය. අළු පැහැති ශීතල වතුරෙහි සොහොනක් බවට පත්වී තිබෙන එම නගරයෙහි සදාකාලික මර නින්දේ නිදා ගැනීමට අපට සිදුවනු ඇත.

"ප්‍රධාන කරුණ ඉක්මනට බඳින්න එපා!" හාම්පුතා මට උපදෙස් දීමට පටන් ගත්තේය. "කසාදය ඒක බොහොම වැදගත් දෙයක්. කොහේ නමුදු, කැමැති විදිහට ජීවත් වීමට පුළුවන්. ඒක තමාගේ හිතේ හැටියට! පර්සියාවට ගිහිල්ලා මුස්ලිම් ගෑනියක් එක්ක වුණත් ජීවත් වෙයන්. මොස්කව්වල නගරෙ පොලිස්කාරයකු හැටියටත් ජීවත් වෙන්න පුළුවනි. අඬාපන් බැරිනම් හොරකම් කරපන්. මේවා සියල්ල හරිගස්සන්න පුළුවනි. ඒ වුණාට කසාද ගෑනි, මල්ලී හරියට කාලගුණය වගෙයි. ඒක හරිගස්සන්න බැහැ. කකුලේ දාලා වීසි කරන සපත්තුවක් වගේ නොවෙයි."

ඔහුගේ මුහුණේ පෙනුම වෙනස් විය. හේ අළුවන් ජලය දෙස බැලීය. බැම සඟළ හකුළුවාගෙන ඇඟිල්ලකින් වකුටු නාසය අතගාමින් මුමුනන්න පටන් ගත්තේය.

"ඔන්න මල්ලී, හොඳට පරෙස්සම් වෙයන්. නුඹව හැම

පැත්තටම නැවුවත්, නුඹ කෙළින් ඉන්නවයි කියා සිතමු. ඒවා කොහොම වුණත්. හැම ඒකාටම උගුලක් බැගින් අටවා තිබෙනවා."

අපි දැන් මෙෂේර්ස්කය විලේ පඳුරු වෙතට ඔරුව පැදවීමු. මේ විල වොල්ගා නදී ජලය සමඟ එකට සම්බන්ධ වී ඇත.

"නුඹ හෙමිහිට ඔරුව පැදපන්" යැයි කී ඔහු තුවක්කුව පඳුරු දෙසට එල්ල කළේය.

කෙට්ටු කුලික් පක්ෂීන් කීප දෙනෙකු මරා ගත් ඔහු අනතුරුව අණ දුන්නේය.

"අපි යමු කුනාවිනොවලට! මම එහි රෑ වන තුරු නවතිනවා. නුඹ ගෙදර අයට කියාපන් මම කොන්තරාත් කාරයන් හොයාගෙන ගියයි කියලා."

වසන්ත ගංවතුරට යටවී ඇති ජනවසමේ වීදියක් අසලින් ඔරුව නවත්වා හාම්පුතාට ගොඩ බැසීමට මම සලස්වාලීමි. යළිත් ඔරුව පැදගෙන ඊයක් වැනි මෝයකට විත්, එහි ඔරුව කණුවක බැඳ ගංගා දෙක එකට එක්වී ඇති ස්ථානය දෙසත්, නගරය, ගංගා තරණයෙහි යෙදී සිටින නැව් සහ අහස දෙසත් බලන්නට වූයෙමි. වලාකුළු දෙකක් අතර ඇති නිල්වන් අහසෙහි වැඩ සිටින රන්වන් සූර්යාගේ එක බැල්මෙකින් ලෝකයේ හැම දෙයක්ම සැණෙකින් වෙනස් වෙයි. අහස විශාල පක්ෂියකු මෙනි. පිහාටු වෙනුවට ඇත්තේ ඝනැති වලාකුළුය. හිරු රැස් නිසා හැම දෙයක්ම ප්‍රබෝධයෙන් යුතුව චලනය වෙයි. ලී කඳන් සහිත පහුරු විශාල සංඛ්‍යාවක් ජල ප්‍රවාහය විසින් ඇදගෙන යනු ලැබෙයි. යටි රැවුළු වවාගත් මිනිස්සු ඒ පහුරු දිගැති හබල්වලින් ක්‍රියා කරමින් එකිනෙකා අමතමින්ද, ඉදිරියට එන නැව් අමතමින්ද කෑ ගසති. කුඩා යාන්ත්‍රික බෝට්ටුවක් හිස් පාරුවක් ඇදගෙන ජල ප්‍රවාහයට විරුද්ධව යාත්‍රා කරයි. ජල ප්‍රවාහයට විරුද්ධව මෙම පාරුව ඉදිරියට ඇදෙන්නේ පෙරළෙමින් ඇඹරෙමින්, නටමින් පීනන කාවයියකු මෙනැයි මට සිතේ. පාරු කඳට පාද තබාගෙන එහි වාඩි වී සිටින ගැමියන් සතර දෙනෙකුගේ උරහිස් එකිනෙකට වැදී ඇත. එකෙක් රතු කමිසයක් ඇඳ සිටී. සතර දෙනාම

ගීයක් ගයතුදු එහි වචන මට නෑසේ. එසේවතුදු, මම ඒ ගීතයේ වචන දනිමි.

ජීවමාන මේ නදියේ හැම දෙයක්ම මා දන්නා බවත්, හැම දෙයක්ම මට සමීප බවත්, හැම දෙයක්ම මට වැටහෙන බවත් හැඟෙයි. එහෙත්, දැන් මට පසුපසින් වසන්ත සමයේ ගංවතුරට යටවී ඇති නගරය මගේ නොව, හාම්පුතාගේ සිහිනයක්, චිත්ත නිර්මාණයක් බඳුය. එයද ඔහු මෙන්ම, මට වටහාගත හැක්කේ අල්ප වශයෙනි.

එපාවන තුරු මේ සියල්ල නැරඹූ ඉක්බිතිව මා ගෙදර ගියේ හැම වැඩක්ම කළ හැකි වැඩිහිටියකුගේ හැඟීමෙකින් යුතුවය. ගෙදර යන ගමන් බළකොටු කන්දේ සිට මම වොල්ගාව නැරඹීමි. කන්දේ සිට බලන විට අවට මහා භූමිය පෙනෙන්නේ හැම දෙයක්ම ජනිත කළ හැකි බලයක් මෙනි.

ගෙදර කියැවීමට මට පොත් ඇත. ඉස්සර මාර්ගෝ රැජින පදිංචි වී සිටි කාමරවල දැන් වාසය කරන්නේ ලොකු පවුලකි. මෙහි තරුණ නෝනලා පස් දෙනෙකි. රූප සම්පත් අනුව නම් එකියක් අනිකාට දෙවැනි නැත. තවත් තරුණයෝ දෙදෙනෙක් විද්‍යාලයෙක ඉගෙන ගනිති. ඔවුහු මට පොත් දුන්හ. ඉමහත් ගිජු බවෙකින් යුතුව මම තුර්ගේනිව්ගේ නවකතා කියවමි. කෙතරම් පැහැදිලිද, සරලද, සරත් සමයේ මෙන් විනිවිද පෙනෙනසුලු ද, ඔහුගේ චරිත කෙතරම් පවිත්‍රද. එහි හැම දෙයක්ම කොතරම් යහපත්ද, ඔහු කෙතරම් අපූරු සංයමයකින් ඒවා දන්වා සිටින්නේද යන්න ආදියෙන් මම මවිතයට පත්වූයෙමි.

පොම්යාලොව්ස්කිගේ 'බුර්සා' නවකතාව කියවන මම ඉමහත් ලෙස පුදුම වීමි. ඉකෝන චිත්‍ර අඳින චිත්‍රාගාරයේ ජීවිතයට එය බෙහෙවින්ම සමානය. සිත කය පුරා වැලඳෙන පාළු ගතියත්, එහි විපාක පලයක් වශයෙන් ක්‍රෑර ලෙස දඟකිරීමට ඇති ඉමහත් ආසාවත් මට ඉතා හොඳින් තේරුම් ගත හැකි වූයේ එය මා ඉතා හොඳින් දන්නා බැවිනි.

රුසියන් නවකතා පොත් කියැවීම යහපත් දෙයක් විය.

ඒවායින් මා දන්නා දොම්නස පිරි යමක් හැඟිණි. එය පාස්කු මහා මංගල්‍යයේ ඝණ්ටාර නාදය සැඟවී තිබෙන සැටියෙක් පළ කරයි. පොතක් අතට ගත් විගස එය සෙමින් හඬ නැංවෙයි.

'මළගිය ආත්ම' ගැන මා කියැවූයේ එතරම් ආසාවෙකින් නොවේ. 'මියගිය නිවසෙකින් ලැබුණු දිනපොත' ත් මගේ සිත් නොගති. 'මළගිය ආත්ම', 'මියගිය නිවෙස', 'මරණය', 'මරණ තුනක්', 'සුද්ද වස්තු' ඒකතානමය මෙම පොත් නිසා සිතට විරුද්ධව වුවද, ඒවා ගැන එක්තරා අප්‍රියජනක හැඟීමක් හටගනී. 'කාලයාගේ ධජය', 'පියවරෙන් පියවර', 'මොනවා කරන්නද' 'ස්මූරින් ගමේ කාලසටහන' වැනි නවකතාද එම ගණයට අයත් වෙනත් පොත් මගේ සිත් නොගත්තේය.

එසේවතුදු චාල්ස් ඩිකන්ස්ගේ සහ වෝල්ටර් ස්කොට් ගේ නිර්මාණ, සාහිත්‍ය මගේ සිත් බෙහෙවින් ඇද ගත් බව කිව යුතුය. ඔවුන්ගේ එක් එක් පොතක් මම දෙතුන් වරක් බැගින් කියවමින් ඉමහත් රසයක් වින්දෙමි. වෝල්ටර් ස්කොට්ගේ පොත් දේවස්ථානයේ පැවැත්වෙන මංගල්‍යය පූජාවකට සමාන විය. අනවශ්‍ය ලෙස දිග්ගැස්සී, කාන්සියක් ගෙන දුන්නද ඒවායේ උත්සවාකාරී ගතියක් තිබිණි. ඩිකන්ස් ඉදිරියේ මම ගෞරවයෙන් යුතුව හිස නමා ආචාර කළෙමි. මිනිසුන්ට ආදරය කිරීම නමැති ඉතා අසීරු කලාව අසිරිමත් ලෙස දැනගත් කෙනෙකි ඔහු.

හවස නිවෙසේ ආලින්දයේ සෑහෙන පිරිසක් එකතු වූහ. ක.සහෝදරවරු, ඔවුන්ගේ සොහොයුරියෝ, බොත්තමක් වැනි නාසයක් ඇති විද්‍යාල ශිෂ්‍ය ව්‍යාවෙස්ලාව් සිමාෂ්කෝ, මෙලෙස එක් රැස් වූවෝය. මේ පිරිසට සමහර දවස්වලට ලොකු නිලධාරියකුගේ දුවක වන ජ්තීත්සිනාද එකතු වූවාය. ඔවුන් ගද්‍ය සාහිත්‍යය සහ පද්‍ය සාහිත්‍යය ගැන කතා කළ අතර, එය මගේ සිතට ඉතා සමීප දෙයක් විය. ඔවුන් සියලු දෙනාටම වඩා මා පොත් කියවා ඇති බව එහිදී මම වටහා ගතිමි. එහෙත්, වැඩි වශයෙන් ඔවුන් එකිනෙකා අමතා කතා කළේ විද්‍යාල කටයුතු ගැනය. ඔවුහු ගුරුවරුන්ට විරුද්ධව දුක් ගැනවිලි ඉදිරිපත් කළහ.

ඔවුන්ගේ කතාවලට සවන් දෙන මම ඔවුනට වඩා නිදහස් බව වටහා ගතිමි. ඔවුන්ගේ ඉවසීමේ ශක්තිය ගැන මම මවිතයට පත් වූයෙමි.

මගේ සගයන් මට වඩා වයසින් වැඩිමහලු වූ අතර, මාද වැඩිහිටියකු බවට පත්වී, ඔවුනට වඩා පැසුණු බුද්ධියක් සහ පළපුරුදු ඇති කෙනෙකු බවට පත්වී ඇතැයි සිතිණි. මේ නිසා මා තරමක ලජ්ජාවට පත්වූ නමුදු, මම ඔවුනට වඩාත් සමීප වී ඇති බවක් හඟින්නට වීමි. මා රෑ වී ගෙදර ආවේ අලුත් ක්‍රමය නිසා පිරුණු හදවත් ඇතිව, කුණු සහ දූලි පෙරාගෙනය. ඔවුන්ගේ ඒකතානමය හැඟීම්වලට වඩා මා ලබන හැඟීම් පොහොසත් විය. ඔවුන් තරුණ නෝනාවරුන් ගැන බොහෝ දේ කතා කළ අතර, වරින් වර එක් එක් නෝනා කෙනෙකුට ආලය කරන බවක් කියන සැටිත්, කවි පද බැඳීමට තැත් කරන සැටිත් මා අසා ඇත. කවි පද බැඳීමේ කාර්යයේදී නිතරම පාහේ මගේ ආධාරයද අවශ්‍ය විය. කවි ගෙතීමට ඉතා කැමැත්තෙන් ඉදිරිපත් වූ මම ලෙහෙසියෙන්ම පබැඳුම්වල රිද්මය අල්ලා ගතිමි. එහෙත්, කිසියම් හේතුවක් නිසා ඒවා හාස්‍යජනක වූ අතර, ඒ කවිවලින් මම ප්තීත්සිනා මෙණෙවියව එළවළුවලටත්, ලූනුවලටත් සමාන කළෙමි.

සීමාෂ්කෝ මට මෙසේ පැවසීය:

"මේ කවි මොනවද? හරියට සපත්තු ඇණ වගෙයි."

ඔවුන්ගෙන්, කිසිවකින් ඇත්වීමට අකැමැති වූ මම ද ප්තීත්සිනා මෙණෙවියට ආලය කරන්නට වීමි. එම ආලය ප්‍රකාශ වුණේ කෙසේදැයි කීමට මා නොදත් අතර, එය අවසන් වූයේ අයහපත් ලෙසිනි. ස්වෙස්දින් පොකුණේ කුණු සහිත කොළ පැහැති ජලයේ ලොකු ලීයක් පාවෙමින් තිබිණි. ප්තීත්සිනාව ඒ ලීයේ නංවා ගෙන 'ඔරු පැදීමට' මා යෝජනා කළ විට ඕ කැමැත්ත පළ කළාය. මා එම ලීය පොකුණු ඉවුරට ගෙනැවිත් එය මත නැංඟ විට මගේ තනි බර උසුලා සිටීමට එයට හැකිවිය. එහෙත්, රේන්ද සහ පීත්ත පටි සහිත විසිතුරු ඇඳුමක් ඇඟලාගෙන සිටි තරුණ කාන්තාව අනික් කෙළවරට පය තැබූ විගස ඒ ශාපලත් ලෑල්ල යට ගියෙන්, ඈ පොකුණේ ගිලුණාය. මා වහාම පොකුණට පැන ඇය ගොඩගත්තද, ඒ වන විට

ඈ බියවීම සහ කොළ පැහැති කුණු සහිත ජලය නිසා විරූපි වී සිටියාය!

තෙතබරිත අතක් ඔසවා ඈ මට තර්ජනය කරන්නී, බැණ වැදුණාය.

"නුඹ ඕනෑවට මාව පොකුණේ ගිල්ලුවා!"

මගේ නිරවද්‍යතාව පෙන්වාලීමට මා ඉදිරිපත් කළ විස්තරයේ අවංකත්වය විශ්වාස නොකළ, ඈ මා කෙරෙහි සතුරු ආකල්පයක් දක්වන්නට පටන් ගත්තාය.

කෙසේවතුදු, නගරයේ වාසය කිරීම එතරම් සිත් ගත්තේ නැත. හාම්පුතාගේ අම්මා එනම් මැහැල්ල මා කෙරෙහි දැක්වූයේ පැරැණි සතුරු ආකල්පයමය. ඔහුගේ බිරිඳ මා දෙස සැක සිතින් බලන්නට වූවාය. වික්තර්ගේ මුහුණ කුරුලෑ නිසා වඩාත් රත් පැහැගත් අතර, ඔහු හැම දෙනා නිසාම අමනාප වෙමින් නිතර ගොරවන්නට විය.

ගෙදර හාම්පුතාට සැලැස්ම ඇඳීමේ වැඩ බොහෝ විය. ඔහුට සහ ඔහුගේ මල්ලීට ඒ වැඩ සපුරාලීමට නොහැකි වූයෙන්, මගේ බාප්පාගෙන් ඔවුහු ආධාර ලබා ගත්හ.

දවසක් දා මම සල්පිල් වැඩ බිමේ සිට සවස පහට පමණ පැමිණි විට, මට බොහෝ කලක් තිස්සේ අමතක වූ ඒ පුද්ගලයා, ගෙහිමියා අසලින් තේ මේසයට වාඩිවී සිටින සැටි දුටුවෙමි. මා දුටු විගස ඔහු, එනම් මගේ බාප්පා නැඟිට මට අත දිගු කළේය.

"ආයුබෝවන්...."

බලාපොරොත්තු විරහිතභාවය නිසා මම අන්දමන්ද වීමි. අතීතය මගේ හදවත අවුළුවාලූයේ ගින්නක් මෙනි.

"බයවෙලා වගෙයි." ගෙහිමියා කෑ ගැසීය.

බාප්පා මා දෙස බැලුවේ මඳ සිනාවෙකිනි. ඉතා භයානක ලෙස කෙට්ටු ඔහුගේ මුහුණේ කළුවන් දෙනෙත් වඩාත් විශාල ලෙස පෙනේ. විඩාපත් සහ පැගුණු ගතියකින් ඔහු පීඩා වින්දේය. ඔහුගේ කෙට්ටු ඇඟිලි මත මම අත තැබීමි. ඒවා ඉතා උණුසුම්ය.

"ඔන්න ඉතින් අපි හමුවුණා." යැයි ඔහු කිව්වේ කහිමිනි.

දුර්වල වී පහර කෑ විටෙක මෙන් මම එතැනින් ඉවත ගියෙමි.

අප අතර කිසියම් අපැහැදිලි, පරෙස්සම්කාරී සබඳතාවක් ඇති වූයෙන්, ඔහු මගේ පියාගේ නමත් සහිතව මට අමතන්නට වූයේ සමාන කෙනෙකුට මෙනි.

"ඔබ කඩයට යන විට කරුණාකර මට ලපේර් දුම්කොළ රාත්තල් කාලකුයි, සිගරට් ඔතන වික්ටර්සන් කොළ සියයකුයි, තම්බාපු කොල්බසා රාත්තලකුයි ගේන්න."

ඔහු මට දුන් මුදල් රත්වී තිබුණෙන් එය අප්‍රියජනක විය. ඔහු කාස රෝගයෙන් පෙළුණු නිසා ඉක්මනින් මෙලොව හැර යනු ඇතැයි පැහැදිලිව පෙනිණි. ඔහුද ඒ ගැන දැන සිටියෙන් ඔහුගේ කළුවන් තියුණු යටි රැවුළ අතගාමින් සන්සුන් ලෙසින් ඔහු මරණය ගැන කතා කළේය.

"මගේ මේ රෝගය කොහෙත්ම පාහේ සුව කළ නොහැකියි. කොහොම වුණත් මස්, බොහොම කෑවොත්, සමහර විට එය සනීප කළ හැකියි."

ඔහු මහ ගොඩක් ආහාර අනුභව කරමින් නොනවත්වාම සිගරට් උරන්නට විය. ආහාර ගන්නා වේලාවට පමණක් ඔහු දුම් බීම නොකළේය. මම හැමදාම ඔහුට කොල්බසා සහ සාඩින් මිලදී ගත් අතර, මගේ ආච්චිගේ නංගී කිසියම් හේතුවක් නිසා දුෂ්ටමය ප්‍රීතියකින් යුතුව නිතර මෙසේ කියන්නට වූවාය.

"මාරයාට කෑම දීලා සතුටු කරන්න බැහැ! මාරයාව රවට්ටන්න බැහැ."

ගෙහිමියෝ ඔහු කෙරෙහි ඇති මහත් සැලකිල්ලක් දැක්වූහ. ඔහුට එකක් හෝ තවත් ඖෂධයක් ගන්නා ලෙස ඇවටිලි කළහ. එහෙත්, ඔහු නැති විට සමච්චලයට භාජනය කළෝය.

"අර හාමු මහත්තයා නිතර කියනවා කුඩා පාන් කුඩු මේසයෙන් පිහලා දාන්න ඕනෑ කියලා. නැත්නම් මැස්සන් බෝවෙනවලු" ගෙහිමියාගේ තරුණ බිරිඳ මැහැල්ලට කීවේය.

"අපොයි හාමු මහත්තයාගේ කෝට් කබල ගෙවිලා පරණ වෙලා. ඒ වුණාට මිනිහා ඒක බුරුසුවෙන් පිහදානවා. දූවිලි නැති සුද්දවන්තයා!" යැයි මැහැල්ල දුෂ්ට සිතින් ඇනුම් පද එල්ල කළාය.

එවිට ගෙහිමියා ඔවුන් අස්වසාලීමට මෙන් මෙසේ පැවසීය.

"තිරිසන් කිකිළියනි, සැනසියල්ලා, ඔහු ඉක්මනට මැරිලා යාවි!"

රදලයකු කෙරෙහි අවරසික මධ්‍යම පාන්තිකයන් දක්වන මේ තේරුම් විරහිත සතුරු ආකල්පය නිසා ඉබේටම මෙන් මම බාප්පාට සමීප වීමි. මුහමෝර් බිම්මල ආහාරයට සුදුසු නොවූවද, බාහිර පෙනුම අනුව නම් ලස්සනය.

මේ මිනිසුන් අතර මිය යමින් සිටින බාප්පා කුකුළු කොටුවකට අහම්බෙන් වැටුණු මාළුවකු මෙනි. මෙම මුග්ධ සන්සන්දනය, ජීවිතය මෙන්ම මුග්ධය.

'හොරෝෂයෙ දේලෝ' හෙවත් 'හොඳ වැඩේ' නමින් ළමා වියේදී මා හඳුනාගත් අමතක නොවන පුද්ගලයාට දැන් මගේ බාප්පා සමානතාවක් දැරීය. 'හොරෝෂයෙ දේලෝ' සහ මර්ගෝ රැජින මගේ ළමා මනැසේ උසස් අලංකාර ස්ථානයක් හිමි කර ගෙන සිටියාය. මගේ එම ළමා චිත්ත ලෝකය උපන්නේ පොත් කියවීමේ ප්‍රතිඵලයක් වහයෙනි. බාප්පාද, හෙරෝෂයෙ දේලෝ මෙන් පිටත්තර, ආදරයට පාත්‍ර නොවූ පුද්ගලයෙකි. ගෙදර හැම කෙනෙකු සමඟම එක හා සමාන ලෙස සබඳකම් පැවැත්වූ බාප්පා කිසිම දවසක කතාවට මුල පිරුවේ නැත. ඇසූ ප්‍රශ්නවලට විශේෂ ආචාරශීලිත්වයකින් සහ කෙටියෙන් පිළිතුරු සැපයීය. ගෙහිමියාට ඔහු ගුරුහරුකම් දෙන සැටි ඇසීම මට ප්‍රීතියෙකි. ඔහු දෙකට නැමී ගෙන මේසය මත ඇති කඩදාසියට වියළි ඇඟිලිවලින් තට්ටු කරමින් සන්සුන් ලෙස කතා කරයි.

"මෙන්න මෙතැන දී විරාම කපාටය යතුරත් සමඟ සම්බන්ධ කරන්න ඕන. එතකොට තාප්පයට බලපාන පීඩනය අඩු වෙනවා. නැතිනම් විරාම කපාටය තාප්පය දෙබෑ කරාවි."

"හරියට හරි, ඇත්ත තමයි!" ගෙහිමියා මුමුනන්නට විය. බාප්පා ගිය පසු බිරිඳ ගෙහිමියාට දොස් පැවරුවාය.

"අර මිනිහා ඔයාට උගන්වන විට ඔයා නිකම් බලාගෙන ඒ මිනිහාට ඉඩ දෙන සැටි තමයි පුදුම."

රාත්‍රී ආහාරයෙන් පසු බාප්පා සිහින් කුඩා ලී පතුරකින් දත් සුද්ද කිරීමත්, උගුරු දණ්ඩ නටවමින් උගුර සේදීමත් ගෙහිමි බිරිඳගේ විශේෂ නොරිස්සුමට හේතු විය.

ඇඹුල් කටහඬකින් මගේ බාප්පා අමතන ඈ මෙසේ පැවසුවායඃ

"යෙව්ගේනි වසීලවිච්, මගේ අදහස අනුව ඔය විදිහට හිස නැමීම ඔබට හොඳ නැහැ!"

ඔහු විමසන්නට වූයේ ආචාරශීලී ලෙස මඳ සිනා පාමිනි.

"හේතුව මොකක්ද?"

"නැහැ... ඒක එහෙම තමා...."

උල් කරගත් කුඩා කටුවකින් ඔහු ඔහුගේ නිල්වන් නියපොතු සුද්ද කරන්නට විය.

"බලාපල්ලා වැඩක හැටි, වළ පයයි ගොඩ පයයි. ඒ වුණාට නියපොතු පවා සුද්ද කරනවා."

"අනේ බාං නුඹලා! තිරිසන් කිකිළියනේ. නුඹලා ගේ මෝඩකමක හැටි!...." ගෙහිමියා සුසුම් ලෑවේය.

"ඔයා මේ දොඩවන්නේ මොනවාද?" බිරිඳ කෝපය පළ කළාය.

ඒ අතර මැහැල්ල සැමදාම රෑට දෙවියන් වහන්සේට දුක් ගැනවිලි ඉදිරිපත් කරන්නට වූවාය.

"අර පණ අදින මිනිහාව මගේ ඔළුව උඩට දමලා, මගේ ආදර පුතා වික්තර් මගෙන් ඈත් වෙලා...."

වික්තර් මේ අතරතුර මගේ බාප්පා අනුකරණය කරන්නට පටන් ගත්තේය. ඔහුගේ සෙමින් ගමනත්, රදලයකු සේ ඔහු සෙමින් හා වැදගත් තාලෙට අත දිගු කරන සැටිත්, අලංකාර ලෙස ටයිපටිය බඳින සැටිත්, කටින් හඬ පිට නොකර ආහාර සපන සැටිත් වික්තර් අනුකරණය කරයි. ඔහු බාප්පාට ගොරහැඩි ලෙස කතා කරමින් ප්‍රශ්න අසයි.

"මක්සීමොව්, ප්‍රංශ භාෂාවෙන් දණහිස් කියන්නේ කොහොමද?"

"මගේ නම යෙව්ගේනි වසීලවිච්" බාප්පා ඔහුට සන්සුන් ලෙස පහදා දෙයි.

"ඔව් හරි, පපුව?"

රාත්‍රී ආහාරයෙන් පසුව වික්තර් ඔහුගේ මවුට අණ කළේ ප්‍රංශ බසිනි.

"මා මේ. දෙන්නේ මූසන්කෝර් උෑරු මස්!"

"අනේ මගේ ප්‍රංශ පැටියෝ" යැයි ඔහුගේ අම්මා කිව්වේ ප්‍රීතියෙනි.

බාප්පා බිහිරි ගොළුවකු සේ අනුභව කළේ කිසිවක් නොදුටු විටෙක මෙනි.

දවසක් ගෙහිමියා තම මල්ලීට උපදෙස් දුන්නේය.

"වික්තර් දැන් නුඹ ප්‍රංශ දන්නවා නොවැ දැන් ඉතින් ආලය කිරීමට ගැනියක් හොයා ගනින්!"

මගේ බාප්පා නිහඬව මඳ සිනා පෑ එකම වාරය එය විය.

එවිට ඔහුගේ බිරිඳ කෝපයෙන් හැන්ද මේසයට විසි කරමින් සිය සැමියාට කෑ ගැසුවාය.

"ඔය වගේ කැත කතා මා ඉදිරියේ කියන්න ඔයාට ලජ්ජා නැතිද?"

සමහර දාට බාප්පා මා නිදන ඇඳිරි කුටියට ආවේය. සොල්දර පඩිපෙළට යටිනි, එය පිහිටා තිබුණේ. කුටියේ කවුළුවේ ආලෝකයෙන් පොත් කියැවීම මගේ සිරිතක් විය.

"පොත් කියවනවාද?" ඔහු ප්‍රශ්න කළේ කටින් දුම් ගුළි පිටකරමිනි. ඔහුගේ පපුවේ ගොර ගොර ශබ්දයක් ඇසෙන්නට විය. "ඔය පොත මොකක්ද?" හේ විමැසීය.

මම ඔහුට එය පෙන්වීමි.

"ආහ්, මට මතක හැටියට මා ඒ පොත කියැව්වා. දුම් බොන්න ඕනද?"

ජනේලයෙන් එපිට ඇති කුණු ගොඩ ගැසුණු ගෙවත්ත දෙස බලමින් අපි දුම්වැටි උරන්නට පටන් ගතිමු.

"බොහොම කනගාටුයි ඔබට ඉගෙන ගැනීමට හැකියාවක් නොමැති වීම ගැන. ඉගෙන ගැනීමට ඔබට දක්ෂතාවක් තිබෙන හැඩයි...."

"මම පොත් කියවමින් ඉගෙන ගන්නවා."

"ඒක මදි. පාසලට ගිහිල්ලා අධ්‍යාපන පරිපාටියක් අනුව ඉගෙන ගන්න ඕන..." හේ පැවසීය.

ඔහුට මෙසේ කීමට මට සිත්විය.

"ඉතින් මහත්මයා, ඔබට පාසලක් සහ අධ්‍යාපන පරිපාටියක් තිබුණා. ඒකට වුණේ මොනවාද?"

එහෙත්, ඔහු කතා කරන්නට වූයේ මගේ යටි අදහස් දැන ගත්තාක් මෙනි.

"චරිත ශක්තිය තිබෙනවා නම් පාසල ශික්ෂණයට හොඳ තැනක්, සමාජය ඉදිරියට ගෙනයන්නට පුළුවන් මිනිසුන්ට විතරයි."

බාප්පා මට නිතර පාහේ උවදෙස් දෙන්නට විය.

"ඔබ මෙතැනින් පිටවීම හොඳයි නේද, මෙතැන ඔබ වැඩ කිරීම තේරුමක් නැති, එමෙන්ම ප්‍රයෝජනයක් නැති දෙයක්."

"කම්කරුවන්ට මම කැමතියි." මම කිව්වෙමි.

"හේතුව කුමක්ද?"

"ඔවුන් මගේ සිත් ගන්නවා."

"සමහර විට..."

දවසක් දා ඔහු මට මෙසේද පැවසීය.

"අපේ හාම්පුතාලා කොතරම් නීච මිනිසුන්ද, හැබෑම නීච..."

මගේ අම්මා එම වචනය කවදා කාට එදිරිව පාවිච්චි කළේද යන්න මට මතක් වූයෙන්, මම ඔහුගෙන් ඉබේටම මෙන් ඈත් වීමි. එහෙත්, ඔහු මගෙන් ප්‍රශ්න කළේ මඳ සිනා පාමිනි.

"ඔබ එහෙම හිතන්නෙ නැතිද?"

"එහෙම හිතනවා."

"ඔව්. ඇත්තටම.... මටත් එය පෙනෙයි."

"කොහොම වුණත් ගෙදර ලොක්කට මා කැමැතියි." මම ඔහුට කිව්වෙමි.

"ඇත්ත තමයි. ඔහු කරුණාවන්ත මිනිහෙක්.... ඒ වුණාට විහිළුකාරයෙක්..."

මට ඔහුත් සමඟ පොත් ගැන කතා කිරීමට වුවමනා විය. එහෙත්, ඔහු පොත්වලට ඇලුම් නොකළා විය යුතුය. හේ නිතර පාහේ මට උවදෙස් දුන්නේය.

"ඔබ පොත්වලට තදින් ඇලුම් කරන්න එපා. ඒවායේ ජීවිතය අලංකාර කරලා තියෙනවා. එකක් හෝ තවත් පැත්තකට විකෘති කරලා. පොත් ලියන අයගෙන්

වැඩිදෙනා අපේ හාම්පුතා වගේ උදවිය. පුංචි මිනිස්සු."

මෙවැනි නිගමන නිර්භය ඒවා සේ මට හැඟුණු නිසා මසිත ඔහු වෙත ඇදී ගියේය.

එක දවසක් ඔහු මගෙන් මෙසේ ප්‍රශ්න කළේය.

"ඔබ ගන්චරොව්ගේ පොත් කියවා තියෙනවද?"

" 'ප්‍රෙගාට් පාල්ලාදා' පොතද?'

"ඒ පොත බොහොම සවුත්තුයි. නමුත්, පොදුවේ බලන විට රුසියාවේ ඉතාම බුද්ධිමත් ලේඛකයා තමයි ගන්චරොව්. ඔහු ලියාපු 'ඔබ්ලෝමව්' කියවන්න. එයා ලියාපු පොත්වලින් වැඩියෙන්ම ඇත්ත තියෙන නිර්භය කෘතිය ඒකයි. පොදුවේ බලන විට රුසියන් සාහිත්‍යයේ ඉතාම හොඳ පොතත් එය තමයි."

චාල්ස් ඩිකන්ස් ගැන ඔහු කිව්වේ මෙසේය:

"ඒවා වල්පල්. මම ඔබට සහතික කරන්නම්. ඔන්න 'නෝවොයෙ විරේමියා' සඟරාවේ බොහොම වැදගත් අතිරේකයක් පළවෙලා තියෙනවා. 'ශුද්ධවූ අන්තෝනිගේ පරීක්ෂාවන්.' එය කියවා බලන්න. ඔබ පල්ලියටත්, පල්ලියේ දේවල්වලටත් කැමතියි නොවෙද. ඔබට ඒ පොත වැදගත් වේවි."

ඔහු මට සඟරාවේ 'අතිරේක' ගොඩක් ගෙනැවිත් දුන්නේය. ප්ලෝබෙර්ගේ බුද්ධිමත් කෘති කියැවීමට එයින් මම සමත් වීමි. මුනිවරයන්ගේ ජීවිතය අරබයා අසංඛ්‍ය කරුණු රාශියක් එය මට මතක් කළේය. ඉන් සමහර දේ ඉකෝන චිත්‍ර තක්සේරු කරන්නන් විසින් කියන ලද කතාය. එසේවතුදු, ඒවා ගැඹුරු හැඟීම් ඇති කරවීමට සමත් නොවීය. ඒ කතා අසලින් සතුන් මෙල්ල කරන්නකු වූ 'විපිලියෝ ප්ආයිමලිගේ මතක සටහන්' මගේ සිත් බෙහෙවින් ඇද ගත් බව කිව යුතුය.

බාප්පාට මගේ හැඟීම් විස්තර කළ විට ඔහු සන්සුන් ලෙස ඔහුගේ අදහස් දැන්වීය.

"එහි තේරුම, ඒ වගේ දේ කියවීමට ඔබට තවම කල් වැඩි බවයි. ඒ වුණාට මේ පොත ගැන අමතක කරන්න එපා..."

සමහරදාට ඔහු මා අසලින් බොහෝ වේලාවක් වාඩිවී සිටියේ වචනයකුදු කතා නොකරමින්, දුම් වැටි උරමින්

සහ නොකඩවා කහිමිනි. ඔහුගේ ලස්සන නුවන් ගිනි ගත් කලෙක මෙන් විය. මෙතරම් අවංක ලෙසත්, සරල ලෙසත්, දුක්ගැනවිලි රහිතවත් මිය යන මේ මිනිසා මගේ මවුට ඉතා කිට්ටුවෙන් සිටි අතර, ඇයට නින්දා කළ බව අමතක කරමින් මම ඔහු දෙස සෙමින් බලන්නට වීමි. ඇඳුම් මසන ගැහැනියක් සමඟ ඔහු ජීවත් වන බව මා දැන සිටි අතර, ඇය ගැන මා කල්පනා කළේ අරුත් වටහා ගත නොහැකිව, අනුකම්පාවෙකිනි. දිගැති මේ කටු ගොඩ ඇය බදා ගන්නේත්, කුණු ගඳ සහිත ඔහුගේ දෙතොල් සිප ගන්නේත් කෙසේද? 'හෙරෝෂයේ දේලො' නමින් හැඳින්වූ මිනිසා මෙන්ම, මගේ බාප්පා ද බලාපොරොත්තු රහිත ලෙස ඔහුටම ආවේණික වූ යමක් කියන්නට විය.

"රේස් දුවන බල්ලන්ට මම කැමැතියි. උන් මෝඩ බල්ලන් වුණාට උන්ට මම ආදරෙයි. උන් ලස්සනයි. ලස්සන ගෑනුන් නිතර පාහේ මෝඩයි."

"මොහු මර්ගෝ රැජින දැන ගෙන සිටියා නම්...." යැයි මා සිතුවේ උඩඟුවෙන් තොරව නොවේ.

"එකම නිවෙසක බොහෝ කලක් තිස්සේ මිනිසුන් එකට ජීවත් වෙනවා නම් ඔවුන්ගේ මුහුණු එක හා සමාන වෙනවා." යැයි වරක් ඔහු පැවසූ මතය මගේ කොපි පොතේ ලියා තැබීමි.

එවැනි අදහස් මා බලාපොරොත්තුවෙන් සිටියේ අස්වැසිල්ලක් මෙනි. ජීවය රහිත, ගෙවීගිය, ඒකතානමය වචන නිතර කතා කළ මේ ගෙදර අසාමාන්‍ය අදහස් පවසන සැටි ඇසීම පවා ප්‍රිය උපදවන දෙයකි.

බාප්පා කිසි දිනෙක මගේ මවු ගැන කතා නොකළේය. කිසිවිටෙක ඇගේ නම පවා මතක් නොකිරීම මගේ සතුටට හේතු වූයෙන්, ඔහුට මගේ ඇති ගෞරවය වැඩි විය.

වරක් මම ඔහුගෙන් දෙවියන් ගැන විමැසීමි. ස්ථිර වශයෙන්, කුමක් අරබයාද යන්න මට අමතකය. ඔහු මා දෙස බලා ඉතා සන්සුන් ලෙස පිළිතුරු දුන්නේය.

"මම දන්නෙ නැහැ. මම දෙවියන්ව විශ්වාස කරන්නෙ නැහැ."

මට සිතානවි ගැන මතක් වූයෙන්, මම බාප්පාට ඔහු ගැන විස්තර කළෙමි. ඔහු ඕනෑකමින් සවන් දී පිළිතුරු දුන්නේද සන්සුන් ලෙසිනි.

"ඔහු තර්ක කරනවා. තර්ක කරන මිනිහා යමක් ගැන විශ්වාස කරන්නෙක්... මම නිකම්ම නිකම් විශ්වාස කරන්නෙ නැහැ!"

"එහෙමත් කළ හැකිද?"

"බැරි මක්නිසාද? ඔන්න පේනවා නොවැ මා විශ්වාස කරන්නෙ නැහැ."

මා දුටුවේ ඔහු මියයමින් සිටින සැටි පමණකි. මා ඔහුට අනුකම්පා කළ නැති තරම්ය. මිය යන, එමෙන්ම මරණය පිළිබඳ අබිරහසට ළං වී සිටින මිනිහකු අරබයා මම ප්‍රථම වරට තීව්‍ර ලෙසත්, ස්වාභාවික ආකර්ෂණයක් ඇතිවත් හඟින්නට වීමි.

මේ මිනිහා මා ළඟින් වාඩිවී කල්පනා කරමින් සිටී. ඔහුගේ දණහිස මගේ ඇඟේ වැදෙත්ම එහි උණුසුම මට දැනෙයි. ඔහු දරන ආකල්පය අනුව ඔහු මිනිසුන් ඉතා විශ්වාසවන්ත ලෙස බෙදා වෙන් කරයි. ඔහු ඔවුන් ගැන කතා කරන්නේ ඔවුන් ගැන විනිශ්චය කිරීමට හා නඩු විසඳාලීමට බලය ඇතිවාක් මෙනි. ඔහුගෙන් මට ගත හැකි අවශ්‍ය දෙයක් ඇත. නැතිනම් අවශ්‍ය නොවන දෙයක සේයා සහ සීමා එයින් පෙනේ. එය සිතිය නොහැකි තරම් ව්‍යාකූලත්වයකින් යුක්තය. එය චින්තන ප්‍රවාහයේ අනන්තය මෙනි. මා ඔහු වෙත නිකම් ආකල්පයක් දැරුවද, ඔහු මගේම කොටසක් මෙන් මා තුළ ජීවත් වන්නාක් මෙනි. මා ඔහු ගැන සිතන විට ඔහුගේ සෙවණැල්ල මගේ අධ්‍යාත්මයෙහි වැටී ඇතිවාක් මෙනි. හෙට වන විට ඔහුත්, ඔහුගේ මොළයේ සහ හදවතෙහි සැඟවී ඇති හැම දෙයක්ම අතුරුදහන් වනු ඇත. එසේවතුදු, එම රහස් මට ඔහුගේ දෙනෙතින් කියවිය හැකිවාක් මෙනි. ඔහු අතුරුදහන් වන විට, ලෝකය සමඟ මගේ ඇති සම්බන්ධකම්වලින් එක් හුයපටක් කැඩී ගියද, එය පිළිබඳ මතකය ශේෂ වනු ඇත. එහෙත්, එය මා සතුව සදහටම ඓන්ද්‍රිකව නොවෙනස්ව පවතිනු ඇත. ජීවමාන වෙනස්වනසුලු දේ වෙන්වී යයි.

එහෙත්, මෙය චින්තනය පමණකි. එයට පසු පසින් එම චින්තනය නිර්මාණය කරන, ඒවා පෝෂණය කරන, ජීවන ප්‍රපංචයෙහි පිරික්සුමට ලක් කරන බලයක්ද ඇත. එම චින්තන ප්‍රවාහයෙහි සෑම එකකටම 'මන්ද?' යන ප්‍රශ්නයට පිළිතුරු අවශ්‍ය වෙයි.

"මට හිතෙන්නෙ, මම ඉක්මනටම ඉස්පිරිතාලෙට යනවයි කියල. මම බොහොම දුර්වල වෙලා. මට කිසිදෙයක් කිරීමට හිතෙන්නෙ නැහැ." ඔහු වැසි සහිත දවසකදී මට පැවසීය:

ඊට පසු දින හවස තේ පානය කරද්දී ඔහු මේසයෙන් හා ඔහුගේ දණහිස්වලින් පාන් කුඩු ඉවත දැම්මේ අති මහත් පරිශ්‍රමයකිනි. ගෙහිමියාගේ අම්මා, මැහැල්ල ඔහු දෙස බලා තම ලේළියගේ කනට කොඳුළාය.

"පේනවද හොටයකින් සුද්ද කරනවා වගේ සුද්ද කරනවා."

දින දෙකක් ඉකුත් වත්ම, ඔහු වැඩට පැමිණීමද ඇත හිටිණි. අනතුරුව මැහැල්ල මට ලොකු, සුදු පැහැති ලියුම් කවරයක් දෙමින් මෙසේ කිව්වාය.

"ඊයේ දවල් තරුණ ගෑනියක් මේක ගෙනාවා. මෙය නුඹට දීමට මට අමතක වුණා. ලස්සන කෙල්ලක්. ඒකි නුඹේ කවුද කියන එක මම දන්නෙ නැහැ."

ලියුම් කවරය තුළ බහා තිබූ රෝහල් කඩදාසි කොළයක ලොකු අකුරින් මෙසේ ලියා තිබිණි.

"නිවාඩු ඇති වෙලාවක මා බැලීමට පැමිණෙන්න. මම මර්තීනව් රෝහලේ. යෙ. ම."

පසුදා උදෑසන මම රෝහලේ බාප්පාගේ ඇඳ අසල වාඩි වී සිටියෙමි. ඔහුගේ සිරුර රෝහල් ඇඳට වඩා දිගින් වැඩිය. ඇඳේ තිරස් යකඩ කුරු අතරින් ඔහුගේ පාදවල ඇඟිලි ඉදිරියට නෙරා තිබිණි. ළා කහ පැහැයෙන් යුත් බිත්ති දෙස බැලූ ඔහුගේ අලංකාර නෙත් මගේ මූණ වෙතටත්, ඔහුගේ හිස අසල වූ බංකු පුටුවේ වාඩි වී සිටි තරුණියගේ දෑත් වෙතටත් යොමු වී තිබිණි. ඈ අතක් කොට්ටය මත තබත්ම, ඔහු එය කම්මුලෙන් පිරිමැද්දේය, කට ඇරියේය. ඒ තරබාරු තරුණිය ඇඳ සිටියේ කළුවන් සේද ගවුමකි. අණ්ඩාකාර ඇගේ මුහුණ දිගේ කඳුළු

බින්දු රෑරා වැටෙන්නට විය. කඳුළු පිරි දෙනෙතින් ඈ බාප්පාගේ මුහුණ දෙස බලාගත්වනම සිටියාය. රෝගියාගේ පෑදුණු ඇටකටුද, වක්වූ තියුණු නාසයද, කළුවන් කටද ඇගේ නෙත්වලට හසුවිය.

"පූජකයකුව ගේනවා නම් හොඳයි. නමුත්, එයා එපයි කියනවා. එයාට කිසිම දෙයක් තේරුම් ගන්න බැහැ..." ඕ මුමුනන්නට වූවාය.

කොට්ටය මත තිබූ දෑත් ගෙන තම පපුව මත තබා ගත් තරුණිය දෙවියන්ට යාච්ඤා කරන්නාක් වැනි ඉරියව්වක් මවා පෑවාය.

ඔහුට විනාඩියකට පියවි සිහිය ලැබිණි. ඔහු සීලිම දෙස බලමින් බැරෑරුම් ලෙස නළල රැලිගන්වා ගෙන යමක් මතක් කරන්නාක් මෙන් සිට, අනතුරුව කටු පෑදුණු ඔහුගේ අතක් මවෙත දිගු කළේය.

"ඒ ඔබද? ස්තූතියි!... පේනවා නේද... මහ මෝඩ හැඟීමක්..." ඒ වචන දෙක තුන නිසා ඔහු හෙම්බත් විය. ඔහු දෙනෙත් වසා ගත් විට මම ඔහුගේ අතේ ඇඟිලිත්, නිල්වන් නිය පොතුත් අත ගාන්නට වූයෙමි. තරුණිය සෙමින් ප්‍රශ්න කළාය.

"යෙව්ගේනි වසීලවිච් පූජකයකුට ආරාධනා කරනවට එකඟවන්න. අනේ කරුණාකරලා..."

"ඔන්න හැඳිනගන්නැ" යි ඔහු කීවේ දෙනෙතින් තරුණිය පෙන්වමිනි. "බොහොම හොඳ ළමයෙක්..."

ඔහු නිහඬව කට පළල් ලෙස හැරගෙන හිටි හැටියේම බැරැඬි හඬින් කපුටකු මෙන් කෑ ගැසීය. ඔහු දඟලමින් දෑතින්ම සිරුර කසන්නාක් මෙන් හැසිරෙන්නට වූ අතර, ඔහුගේ සිරුර පොරවා තිබුණු පොරෝනයද ඇත්, මැත් විය. එවිට තරුණියද ඔහුගේ කොට්ටයට හිස තබාගෙන හඬා වැලපෙන්නට වූවාය.

බාප්පා ඉක්මනින් මිය ගියේය. මිය ගිය විගස ඔහුගේ මළ සිරුරේ පෙනුම යහපත් විය.

තරුණිය අතින් අල්ලාගෙන මම රෝහලින් පිටවීමි. රෝගියකු සේ වැනෙමින් ගමන් කළ ඈ, අඬා වැලපීම නොනැවත්වූවාය. ඇගේ අතක තිබූ ලේන්සුව ගුළිකොට මිරිකා තිබිණි. ගුළිකොට ගත් එම ලේන්සුවෙන් ඈ

දෙනෙත් පිස දමමින්, එය දෙස බැලුවේ එය ඇය සතු ඉතාම වටිනා වස්තුව මෙනි.

හිටිහැටියේම නැවතී, මගේ ඇඟට හේත්තු වී, දොස් පවරන විටෙක මෙන් කතා කළාය.

"ශීත කාලය වනතුරු ජීවත්වීමට එයාට බැරි වුණා. අනේ දෙවියනි, දෙවියනි. මේකේ තේරුම මොකක්ද?"

ඉනික්බිතිව ඈ මට අතක් දිගු කරන්නී, කඳුළු පිරි දෙනෙතින් යුතුව කතා කළාය.

"අපි දැන් සමුගනිමු. එයා ඔබ ගැන බොහොම හොඳ කිව්වා. හෙට භූමදාන කරනවා."

"ඔබව ගෙදරට ගෙනගොස් හැරලන්නද?"

එවිට ඕ මා දෙස බැලුවාය.

"ඒ මොකටද? දැන් රාත්‍රිය නොවේ මහ දවල්"

වීදිය අයිනට වී මම ඇය දෙස බැලීමි. ඇය ගමන් කළේ ඉතා සෙමිනි. ඉක්මන්වීමට අවශ්‍යතාවක් නැති කෙනෙකු මෙනි.

ඒ අගෝස්තු මාසය, තුරු ලියවලින් කොළ හැලෙන්නට පටන් ගෙන ඇත.

බාප්පාගේ අවමඟුලට සහභාගි වීමට මට අවස්ථාවක් නොලැබිණි. එදවසින් පසු මම ඒ තරුණිය කිසිදිනෙක නොදුටිමි.

XVII

හැමදාම උදේ පාන්දර හයට මම මගේ රැකියාව සඳහා සල්පිලට පිටත්වී යාමට පුරුදු වීමි. එහිදී මට මුණ ගැසුණේ සිත් ගන්නාසුලු මිනිසුන්ය. ශුද්ධ වූ නිකොලායි මුනිවරයාට සමාන වූ පැසුණු හිසකේ සහිත ඕසිප් වඩුරාල දක්ෂ වැඩකරුවකු මෙන්ම, තියුණු උපහාස කතා කීමෙහි හපනෙකි. වකගැසුණු පිටිකොන්දක් සහිත තහඩු ශිල්පී යෙපීමුෂ්කා, කල්පනාකාරී මිනිහකු සහ ගරු කටයුතු කෙනෙකු වන ප්‍යොතර් ගල් වඩු තැන, මුනිවරයකු සිහිගන්වන, රතුවන් යටි රැවුලක් සහිත, නිල්වන් ලස්සන නෙත් සහිත, සන්සුන් කරුණාවන්ත කැටයම් ශිල්පී ග්‍රිගෝරි ෂිෂ්ලින්ද මින් සමහරෙකි.

සැලැස්ම අදින්නා යටතේ සේවය පටන් ගත් දෙවැනි වාරයේදී මම ඔවුන් හඳුනා ගතිමි. හැම ඉරිදාවකම ඔවුන් කුස්සියට ආවේ වැදගත්, උසස් ආකාරයෙකිනි. මා නොදත් රසබර වචන සහිත පසන් කතා කියමිනි. එදා මේ වැඩිහිටි පිරිමින් මට පෙනුණේ හිස සිට පතුල දක්වා දයා ගුණයෙන් පිරුණු පුද්ගලයන් සේය. මේ එක් එක් මිනිහෙක් සිත් ඇද ගන්නා ආකාරයකට ස්වයං චරිත ඇත්තෝ වූහ. කුනාවිනො ජනවසමේ හොරුන්ගෙන් සහ බේබදු අවරසිකයන්ගෙන් වෙන් කොට කැපී පෙන්වන යහපත් මිනිස්සුද වූවෝය.

කැටයම් ශිල්පී ෂිෂ්ලින් මගේ සිත් කොතරම් තදින් ඇද ගත්තේදයත්, ඔහුගේ අර්ටේලයට හෙවත් ශිල්පාගාරයට බැඳී වැඩ පුහුණුවීමට කැමැති බැව් ඔහුට දන්වා සිටීමට මම ඉදිරිපත් වීමි. රන්වන් ඇහි බැම ඇඟිලිවලින් කසමින් ශිල්පියා මගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළේ මෘදු ලෙසිනි.

"අපේ වැඩට නුඹ තවමත් ළපටි වැඩියි. තව අවුරද්දක් විතර නැවතියන්...."

අනතුරුව ඔහු ඔහුගේ ලස්සන හිස සොලවා මගෙන් ඇසුවේය.

"ආ නුඹේ ජීවිතය අමාරුද? ඒකට කමක් නැහැ. ඉවසාගෙන ඉඳපන්. නුඹේම ජීවිතයක් ගත කරන්න ඉගෙන ගත්තොත් නුඹට එය දරාගන්න පුළුවන් වේවි."

ඒ යහපත් උවදෙස මට කිනම් වාසියක් ලබා දුන්නද යනු මා නොදත් නමුදු, කෘතඥතාවෙන් යුතුව මම එය පිළිගතිමි.

ඔවුහු දැනුදු හැම ඉරිදාවක් පාසාම මගේ හාම්පුතාගේ ගෙදර කුස්සියට විත්, මේසය වටේ වාඩි වී ඔහු එනතුරු වැදගත් ලෙස කතාබහ කරති. හාම්පුතා හඬ නඟමින් හා ප්‍රීතියෙන් ඔවුනට ආචාර කොට, ඉදිරිපස මුල්ලේ වාඩි වෙයි. ගණන් හිලව් ලියූ කඩදාසිද මුදල් නෝට්ටු මිටිද මේසය මත තබයි. ශිල්පියෝ තමන් ගේ ගණන් ලියූ පොඩි වුණු කුඩා පොත් ඉදිරිපත් කළහ. සතියේ වැටුප් ගෙවීම අරබයා වූ හෙට්ටු කිරීම ආරම්භ විය.

විහිළු කරමින් සහ පල්හැලි දොඩවමින් හාම්පුතා ඔවුනට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය අඩුකිරීමට තැත් කළ අතර, ශිල්පීහු වැඩියෙන් ලබා ගැනීමට පරිශ්‍රම දැරූහ. සමහරදාට ඔවුන් සැර වචන දොඩමින් බැණ ගත්තද, වැඩි වශයෙන් ඔවුන් මිතුරු ලෙස සිනාසීමට සමත් වූ බැව් කිව යුතුය.

"අනේ යහපත් මනුස්සයෝ, නුඹ උපන්නේ වංචාකරුවකු ලෙසයි." වරක් එක් ශිල්පියෙකු හාම්පුතාට කිව්වේය.

ඔහු පිළිතුරු දුන්නේ ව්‍යාකුල ලෙස සිනාපාමිනි.

"අනේ බොලව් තොපි. කකුල් දෙකේ තිරිසන්නු නුඹලාත් සෑහෙන වංචාකාරයෝ!"

"යහළුවා, එහෙම නැතුව කොහොමද?" යෙපිමුෂ්කා පිළිගත්තේය. එවිට බැරෑරුම් ප්‍රයෝතර් මෙසේ පැවසීය.

"ජීවත් වන්නේ හොරකම් කරමින්. වැඩ කරමින් උපයන ඒවායින් තමයි දෙවියන්ටයි සාර්ටයි පුදන්නේ!"

"ඔව්, ඉතින් මා කැමතියි නුඹලාගෙන් හොරකම් කරන්න!" හාම්පුතා සිනාසුණේය.

ඔවුහු සුහද සිතින් සිනාසුණහ.

"බාගෙට බාගෙ හොරකම් කරන්ටද?"

"බාගෙට බාගෙ රිවට් කරන්ටද?"

ග්‍රිගොරි ෂිෂ්ලින් ඔහුගේ විශාල යටි රැවුළ පපුවට වැදෙන සේ අතගාමින් ගීතයක් ගයන්නාක් මෙන් ඉල්ලා සිටියේය.

"සොයුරනි, වංචා කරන්නෙ නැතුව අපේ වැඩ කටයුතු කරමු. හොඳද, සන්සුන්ද? මගේ දයාබර සගයනි."

ඔහුගේ නිල්වන් දෙනෙත් බොර පැහැගත් අතර, ඒවා කඳුළින් තෙමිනි. ඒ මොහොතේදී ඔහු මවිත කරවන තරම් යහපත් විය. ඔහුගේ ඉල්ලීම නිසා හැම දෙනාටම තරමක ලජ්ජාවක් ඇති වුණාක් මෙනි. ඔවුහු ව්‍යාකුල ලෙස ඔහුගෙන් ඈත් වූහ.

"මූෂිකයා වැඩිය වංචා කරන්නේ නැහැ." යි ඕසිප් වඩුරාල කිව්වේ සුසුම් ලමිනි.

කළුවන් ගල්වඩුවා පිටිකොන්ද නවා ගනිමින් බැරැඩි හඬින් කතා කළේය.

"පව් හරියට මඩ ගොඩක් වගෙයි, යන්න යන්න එරෙනවා වැඩියි."

හාම්පුතාද ඔවුන්ගේ කතාවට සරිලන පරිදි පිළිතුරු දෙයි.

"මම මොනවා කරන්නද? ගිලෙනකොට කෑ ගහනවා."

දාර්ශනික ලෙස වචන දොඩවීමෙන් ඉක්බිතිව, යළිත් එකිනෙකාගෙන් සොරකම් කිරීමට මහන්සි ගත්හ. වැටුප් මුදල් ලබාගෙන දහදිය පෙරමින් සහ නොසන්සුන්තාවකින් යුතු විඩාවෙන් ඔවුන් තේ කඩය දෙසට පා තබන්නේ, හාම්පුතාටද ආරාධනය කරමිනි.

සල්පිලේදී මගේ වැඩ කොටස වූයේ, ඇණ, ගඩොල්, ලෑලි සොරකම් කිරීම නවත්වාලීමය. මේ හැම ශිල්පියකුම මගේ හාම්පුතාගේ වැඩ කරන අතර, තවත් වෙනත් කොන්තරාත්කරුවන්ගේ වැඩද කළ නිසා ඔවුන්ගේ වෑයම වූයේ මට හොරෙන් ගත හැකි හැම දෙයක්ම ගෙනයාමය.

ඔවුහු මා සුරතල් ලෙස පිළිගත්හ. එහෙත්, ෂිෂ්ලින් මට මෙසේ කිව්වේය:

"නුඹ මගේ අර්ටේලයට එන්ට හැදුවා, නුඹට මතකද? දැන් ඉතින් බලාපන් නුඹ ඉහළ ගිය සැටි. මගෙත් වැඩ බලන ලොක්කා වුණා නේද?"

"ඉතින්, ඉතින්, මුර කරපන් බේරා ගනින්, දෙවියන්ගේ පිහිට ලැබෙයි!" ඕසිප් විහිළු කළේය.

ප්යොතර් කතා කළේ මිතුරු ලීලාවෙන් තොරවය.

"නාකි මීයන්ට අණ කිරීමට තරුණ වටුවකු හොයාගෙන..."

මගේ යුතුකම් නිසා මම ලජ්ජාවට පත්වීමි. යම්, යම් විශේෂ දේ දන්නා මේ මිනිසුන් ඉදිරිපිට මා ලජ්ජාවට පත්වීමේ තත්ත්වයකට වැටී ඇත්තේ, ඔවුනට නොදැනුවත්ව ඔවුන් හොරුන් සහ වංචාකාරයෙකැයි සිතාගෙන ඔවුන් ගැන ඔත්තු බැලීමේ කටයුත්ත මට පැවරී ඇති බැවිනි. මුල් දවස්වලදී ඒ කටයුතු සපුරාලීම ඉතා අසීරු විය. එහෙත්, ඕසිප් මගේ ක්‍රියා ඉක්මනින්ම දැනගත්තෙන් දවසක් දා ඔහු මගේ මූණටම මෙසේ කීවේය:

"කොලුපැංචා, නුඹ ඕනෑවට වඩා පිම්බෙන්න එපා. තේරුණාද?"

සත්තකින්ම මට කිසිදෙයක් නොවැටහුණද, මා වැටී ඇති මුග්ධ තත්ත්වය ගැන මහල්ලා අවබෝධ කරගත් බව මට හැඟිණි. ඉන් පසු අප දෙදෙනා අතර විවෘත සබඳතාවන් ඇති විය.

ඉඳහිට ඔහු මට දැනමුතුකම් දෙන්නට විය.

"අප අතර ඉන්න ලොකුම හොරා නුඹට දැනගන්න ඕනද? ඒ තමයි පෙත්රූහා ගල්වඩුරාල. එයාට ළමයි ගොඩක් ඉන්නවා. ඒ වගේම මිනිහා කෑදරයා, මිනිහා දිහා ඇස් දෙකම ඇරගෙන බලා ඉඳපන්. මිනිහා අතට අහුවන ඕනෑම දෙයක් හොරකම් කරාවි. යකඩ ඇණ රාත්තලක්, ගඩොල් කැට දහයක්, හුනු මල්ලක්, ඕනෑම දෙයක් ගෙනයාවි. මිනිහෙක් හැටියට ඔහු හොඳයි. දෙවියන් වඳිනවා. හොඳට උගත් ලෙස කල්පනා කරනවා. නමුත්, හොරකම් කරන්න කැමතියි! යෙපීමුෂ්කා ගෑනු රජා. මිනිහා සන්සුන්. මිනිහාගෙන් නුඹට අනතුරක් නැහැ. එයාත් මොළේ ඇති මිනිහා! කුදා සහ අනික් අය මෝඩයෝ නෙවේ. ග්‍රිගේරි ෂිෂ්ලින් ටිකක් මෝඩ පහේ මිනිහෙක්. මිනිහා අනුන්ගේ දේ ගන්නා එක කොහොම වෙතත්, තමාගේ දේ වුණත් දීලා දමාවි. එයාගෙ වැඩ කරන්නේ පල ප්‍රයෝජන නැති විදිහටයි. ඕනෑම මිනිහකුට පුළුවනි මිනිහම රවටන්න, නමුත්, මිනිහට බැහැ කිසිවකු රවටන්න. මොළේ නැතිවයි මිනිහා ක්‍රියා කරන්නේ...."

"එයා කරුණාවන්තද?"

එවිට ඕසිප් මා දෙස බැලුවේ ඈත සිට බලන විටෙක මෙනි. අනතුරුව මට සදහටම මතක සිටින අදහසක් ඔහුගේ කටින් පිටවිය.

"ඇත්ත තමයි, එයා කරුණාවන්තයි. කම්මැළියාට කරුණාවන්තයකු වීම බොහොම ලෙහෙසි දෙයක්. කරුණාවන්ත වීමට බුද්ධිය ඕන නැහැ."

"ඔබ ගැන ඔබට කියන්න තියෙන්නෙ මොනවාද?" මම ඕසිප්ගෙන් ඇසීමි.

ඔහු සාවඥ ලෙස සිනාපා පිළිතුරු දුන්නේය.

"මමද, මම හරියට මැහැල්ලක් වෙන්න ඉන්න තරුණිය වගෙයි. මැහැල්ලක් වුණාට පස්සෙ මා ගැන කියන්නම්. නුඹ එතෙක් බලාගෙන ඉඳපන්! මා සැඟවී ඇත්තේ කොහේද කියලා නුඹ බුද්ධියෙන් හොයා බලාපන්!"

ඔහු ගැනත්, ඔහුගේ මිතුරන් ගැනත් මසිතෙහි තිබූ හැඟීම් සියල්ල ඔහු උඩුයටිකුරු කොට පෙරළුවේය. ඔහුගේ නිගමන ගැන සැක කිරීමට මට බෙහෙවින්ම අසීරු විය. යෙෂිමුෂ්කාත්, ප්‍රොතර් සහ ග්‍රිගොරිත් මේ ගුණවත් මහල්ලා වඩාත් බුද්ධිමත්, දෛනික ජීවිතයේ ප්‍රශ්න ගැන දන්නා කෙනෙකු ලෙස, පිළිගන්නා සැටි මා දැක ඇත. ඔවුහු හැම දෙයකදීම ඔහුගෙන් උවදෙස් ලබා ගත්හ. ඔහුගේ දැනමුතුකම්වලට අවධානයෙන් සවන් දුන්හ. ඔහුට නිතර ගරු කළහ.

"කරුණාකරලා මෙන්ම, මේ ගැන ඔබේ අදහස කුමක්ද?" ඔවුහු ඔහුගෙන් නිතර ඇසූහ. එවැනි උවදෙසකින් පසුව ඔවුන් විසිර ගිය විට, ගල්වඩුවා ග්‍රිගෝරිට රහසක් කියන්නාක් මෙන් මෙසේ පැවසීය:

"පාෂාණ්ඩයා"

ග්‍රිගොරි මඳසිනා පා මෙසේ එකතු කළේය.

"කෝණංගියා!"

කැටයම් ශිල්පියා මට මිතුරු ලීලාවෙන් අවවාද කළේය.

"නුඹ නාකියත් සමඟ පරෙස්සමින් කටයුතු කරපන්, මක්සීමිච් නාකියා නුඹව ගොනාට අන්දවාවි. නාකි මහා අමාරුකාරයෝ. දෙවියනි, අපව උන්ගෙන් ආරක්ෂා කරත්වා!"

මට කිසිවක් වටහාගත නොහැකි විය.

මේ පිරිසෙන් ඉතාම අවංක ඉතාම හොඳ මිනිසා ප්‍රොතර් යනු මගේ හැඟීම විය. ඔහු හැම දෙයක් ගැනම කෙටියෙන් හා ඒත්තු ගැන්වෙන පරිදි කතා කළද, නිතර ඔහුගේ චින්තනය අවධාරණය කළේ දෙවියන්, නිරය සහ මරණය ගැනය.

"අනේ කොල්ලනි, සගයනි, අපි මොනවා කළත්, කොහොම කළත් මරණයට පිටුපාන්න බැරි බව මතක තියාගනිල්ලා!"

ඔහු හැමදාම උදර වේදනාවෙන් පීඩා වින්දේය, සමහර දාට ඔහුට කුඩා පාන් කෑල්ලක් පවා ආහාර ලෙස ගත නොහැකි විය. එවැනි ආහාරයෙකින් වුව ඇතිවන කැක්කුම නිසා ඔහු වේදනාවෙන් වෙවුලමින් වමනය දැම්මේය.

කුදු යෙපීමුෂ්කාත් ඉතා කරුණාවන්ත සහ අවංක පුද්ගලයකු ලෙස මට පෙනිණි. එහෙත්, ඔහු හැමදාම සිනහා උපදවයි. සමහර විට, තරමක පිස්සකු සේය. නැතිනම් නිහඬ මෝඩයකු මෙනි. ඔහු නිත්‍ය වශයෙන් එකියකට හෝ තවත් ගැහැනියකට හෝ ආලය කිරීමට පටන් ගත්තද, ඔවුන් ගැන විස්තර කරන්නේ එකම ආකාරයෙකිනි.

"මම කෙළින්ම කියන්නම්, ඒකි ගෑනියක් නොවෙයි. වෙඩරුවල දාපු ලස්සන මලක්, දෙවියම්පා...."

කුනාවිනොවල සිට අඟර දඟරකාර පහත් මධ්‍යම පන්තියේ ගැහැනුන් විත්, සෑදූ කඩබක්කි සෝදා පවිත්‍ර කරන විට යෙපීමුෂ්කා වහලේ සිට බිමට බැස මුල්ලකට වී, ඔහුගේ ජීවමාන බළල් ඇස් හකුළුවා ගෙන දෙකන් දක්වා පුළුල් ලෙස කට හැර ගෙන ඔවුන් දෙස බලමින් මුමුනයි.

"අනේ දෙවියනි, මට ගෑනියෙකුව ලබා දෙන්න. මටත් එවැනි ප්‍රීතියක් ඕනෑ. අන්න අර බලන්න වෙඩරුවල දාපු ලස්සන මල. මගේ ඉරණම මට එවැනි වාසනාවක් ගෙනැත් දෙන්නෙ නැත්ද? එවැනි රූපයක් හන්දා මාව පණ පිටින් පිච්චිලා යාවි."

මුලදී ගැහැනු එකිනෙකා පරයන ලෙස කෑගසමින් සිනාසුණහ.

"ආං බලාපල්ලා! අර කුදා සෙවල හලන හැටි! අනේ දෙවි පියාණෙනි!"

කොතරම් උපහාස කළත්, යෙපීමුෂ්කා ඒවායින් අධෛර්යයට පත් නොවීය. ඉදිරියට හකු ඇට නෙරා ගිය ඔහුගේ මුහුණ නිදිබර කලෙක මෙනි. අඩ නින්දෙන් මෙන් ඔහු රසබර වචන දොඩවමින් ගැහැනු පසසන්නට විය. මීපැණි වැනි ඔහුගේ වචන නිසා ගැහැනු මත්වූහ. අවසානයේදී වයසින් වැඩිමහලු ගැහැනියක් මවිතයට

පත්වී මෙසේ තෙපලායඃ

"ඔන්න අහපල්ලා මිනිහකුගේ හිතේ වේදනාවක සැටි! ගැහැනියකගේ පහස නොලැබූ තරුණයෙක්."

"කුරුල්ලකු වගෙයි ඔහු ගයන්නේ."

"අල්තාරය ඉදිරිපිටට ආපු හිඟන්නකු වගෙයි." දඟකාර ගැහැනියක් විරුද්ධත්වය පෑවාය.

එහෙත්, යෙපීමුෂ්කා හිඟන්නකුට සමාන නොවීය. ඔහු දැඩි ලෙස දෙපා පොළොවේ ගසා සිටියේ ගසක කඳක් මෙනි. ඔහුගේ කටහඬ වඩාත් මෘදු විය. ඔහුගේ කන්නලව්ව වඩාත් සිත් කම්පා කරවනසුලු විය. ගැහැනු නිහඬව ඔහුට සවන් දුන්හ. සුරතල්, සිත් වශී කරන කතාවෙක ඔහු දියවූ විටෙක මෙනි.

රාත්‍රී ආහාර වේලාවේදී නැතිනම් සෙනසුරාදා උත්සවයට පසුව යෙපීමුෂ්කා තම කුදු පිටිකොන්ද අග පිහිටි හිස නටවමින් සිය සගයන් අමතා කතා කළේ මවිතයෙනි.

"අනේ කොතරම් රසවත් ගැහැනියක්ද? කොතරම් මිහිරිද! මගේ ජීවිතයේ පළමුවැනි වරට මම එහෙම කෙනෙකුට අත තැබුවා!"

තම ජයග්‍රහණ ගැන කී යෙපීමුෂ්කා වහසි බස් දෙඩුවේ නැත. අනික් පිරිමින් මෙන් තමාට යට වූ ගැහැනිය උපහාසයට ලක් කළේ නැත. ඔහු එම ගැහැනියට කෘතඥ වෙමින් ආනන්දයට පත්වූවා පමණකි. මවිතය පළකළ ඔහුගේ බළල් ඇස් පුළුල් විය.

ඕසිප් හිස වනමින් කෑ ගැසීය.

"අනේ බං නුඹ මහ පුදුම එකෙක්! නුඹට දැන් වයස කීයද?"

"මට දැන් වයස අවුරුදු හතළිස් හතරයි. ඒකට කමක් නැහැ! අද මම අවුරුදු පහකින් බාල වුණා වගෙයි. ජීවමාන ජලය ඇති ගංගාවක නෑවා වගේ ලොකු සනීපයක් දැනෙනවා. හදවත බොහොම සන්සුන්. ඔන්න බලාපල්ලා කොතරම් හොඳ ගෑනු ඉන්නවද කියලා."

ගල්වඩුවා ඔහුට දැඩි ලෙස කතා කළේය.

"නුඹට අවුරුදු පනස් පහ වුණාම, නුඹේ ඔය පුරුද්ද නිසා තිත්ත කඳුළු බොන්න සිද්ධ වේවි!"

"යෙපීමුෂ්කා නුඹ ලජ්ජා නැති මිනිහෙක්." ග්‍රිගොරි ෂිෂ්ලින් සුසුම් ලෑවේය.

කඩවසම් පුරුෂයා කුදාගේ වාසනාව නිසා ඔහුට ඊර්ෂ්‍යා කරන සැටියෙකි. මට පෙනුණේ.

ඕසිප් ඔහුගේ පැසුණු බැම සඟළට යටින් රැස්වූවන් දෙස බලමින්, කවට කතා ඇද බාන්නට විය.

"හැම ගෑනියක්ම මායාකාරියක්. එක ගෑනියක් පිඟන් කෝප්පවලට තවත් ගෑනියක්, රිදී රත්තරන්වලට අද ගැහැනු හෙට වන විට ආච්චිලා වෙනවා."

ෂිෂ්ලින් විවාහකයකු වුවද, ඔහුගේ බිරිඳ ඈත ගමක සිටින නිසාදෝ ඔහුත් කඩ බක්කි සෝදන ගෑනියක් දෙස විමැසිලිමත්ව බලන්නට විය. මේ ගැහැනුන් අල්ලා ගැනීම ලෙහෙසි වූ අතර, එයින් හැම ගැහැනියකටම 'අමතර ආදායමක්' ලැබිණි. කුසගින්නේ සිටි කම්කරු ජනවසමෙහි මේ රැකියාවටද දැක්වූයේ අනික් රැකියාවන් කෙරෙහි දක්වන ස්වාධීන ආකල්පයමය. එහෙත් රූප සම්පත්තියෙන් හෙබි පුරුෂයා ඒ ගැහැනුන් අල්ලා ගැනීමට ඉදිරිපත් නොවී, ඈත සිට ඔවුන් දෙස බැලුවේ, ඔවුන් කෙරෙහි නැතිනම් තමා කෙරෙහි අනුකම්පාවක් දැක්වෙන විශේෂ බැල්මෙකිනි. ගැහැනුන් ඔවුන්ගේ මායම්වලට ඔහු ඇද ගැනීමට ඉදිරිපත් වී අඟර දඟර පෑ විට, ඔහු ඔවුන් දෙස ව්‍යාකූල ලෙස බලා ඈත යන්නේ මෙසේ පැවසීය.

"අන් බාං නුඹලා..."

"නුඹ පුදුම මිනිහෙක් නොවැ? මේ වගේ අවස්ථාවක් අත හරින්න පුළුවන්ද?" මවිතයට පත් යෙපීමුෂ්කා ප්‍රශ්න කළේය.

"මම කසාද බැඳපු මිනිහෙක්..." ග්‍රිගොරි මතක් කළේය.

"කසාද ගෑනි දැනගන්නේ කොහොමද?"

"කසාද පුරුෂයා වෙනින් ගෑනියෙකු ආශ්‍රය කළොත් කසාද ගෑනි ඒ ගැන දැනගන්නවා. ඒකිව රවට්ටන්න බැහැ."

"දැන ගන්නේ කොහොමද?"

"කොහොමද කියන එක මම දන්නෙ නැහැ. එයා අවංකව ජීවත්වෙනවයි කියල මම දන්නෙ කොහොමද?

මම අවංකව ජීවත්වන විට, එයා පව් කළොත් මම ඒ ගැන දැනගන්නවා."

"කොහොමද දැනගන්නෙ?" යෙපීමුෂ්කා කෑ ගසමින් ඇසූ අතර, ග්‍රිගොරි පිළිතුරු දුන්නේ සන්සුන් ලෙසිනි.

"ඒ ගැන මම දන්නෙ නැහැ."

තහඩු ශිල්පී යෙපීමුෂ්කා කෝපයෙන් දෑත් වනයි.

"ඔන්න බලාපල්ලා! අවංකවම දන්නෙ නැහැ. අනේ බාං නුඹේ ඔළුගෙඩිය."

ෂිෂ්ලින් යටතේ වැඩ කරන කම්කරුවන් හත්දෙනා, ඔහුට සැලකුවේ හාම්පුතාට ලෙස නොව සාමාන්‍ය කෙනෙකුට මෙනි. ඔවුහු, ඔහු ඉදිරිපිට ඔහුට 'වහුපැටියා' යැයි ඇමතූහ. වැඩට පැමිණි කම්කරුවන් කම්මැළියන් සේ රස්තියාදු වන සැටි දකින ෂිෂ්ලින් ගල්කටුව සහ උදැල්ල රැගෙන රඟපාන කලෙක මෙන් වැඩ කිරීමට පටන් ගනී.

"වැඩ කරපියව් කොල්ලනේ, වැඩ කරපියව්!"

දවසක් දා මගේ හාම්පුතාගේ නපුරු අණ ඉටුකරමින් මම ග්‍රිගොරිට මෙසේ කිව්වෙමි.

"නුඹේ වැඩකරුවෝ බොහොම නරකයි."

ඔහු මවිතයට පත්වූ විටෙක මෙන් කතා කළේය.

"ඔය ඇත්තටද?"

ඔය වැඩේ ඊයේ කරලා ඉවර කරන්න ඕන. අදයි ඒක පටන් අරගෙන තියෙන්නෙ. අදත් උන්ට ඉවර කරන්න බැහැ."

"ඒක ඇත්ත, අදත් ඉවර කරන්න බැහැ." යි එකඟ වූ ඔහු, මඳ වේලාවක් නිහඬව සිට පරෙස්සමින් මෙසේ පැවසීය.

"මට තේරුම් ගන්න පුළුවනි. මගේ හිත දෙන්නෙ නැහැ උන්ව එළවා දමන්න. උන් හැම දෙනාම මගේම ගමේ උදවිය. නුඹම කල්පනා කර බලාපන්. දෙවියන් වහන්සේ අපට අණ කරලා තියෙනවා දහදිය මහන්සියෙන් හම්බ කරලා ආහාර ලබා ගන්න. දෙවියන්ගේ නියමය හැම දෙනාටම එකවගේ බලපානවා. මටත් එය බලපානවා. නුඹයි මායි උන්ට වඩා අඩුවෙන් වැඩ කරනවා. උන්ගෙන් වැඩියෙන් වැඩ ගන්න මගේ හිත ඉඩ දෙන්නේ නැහැ..."

ඔහු ජීවත්වූයේ කල්පනාකාරී ලෙසිනි. සල්පිලේ ජනයා රහිත මාර්ග ඔස්සේ ගමන් ගත් ඔහු, හිටිහැටියේම ඇලක් හරහා දමා ඇති පාලමක් උඩ නැවතී එහි වැට අල්ලා ගෙන, ජලය දෙසත්, අහස දෙසත්, ඈත ඔකා නදිය දෙසත් බලන්නට විය. ඔහුට සමීප වූ මම ඔහුගෙන් ඇසුවෙමි.

"තමුසෙට මක්වෙලාද?"

"ආ? නැහැ නිකම්. ටිකක් වට පිට බැලුවා..." යැයි ඔහු කීවේ නින්දෙන් පිබිදුණු විටෙක මෙන් ලජ්ජා සහගතව මඳ සිනා පාමිනි.

"දෙවියෝ ලෝකය අපූරු ලෙස මවලා තියෙනවා." ඔහු නිතර කියන්නට විය. "අහස, පොළොව, ගලා බසින ගංගා, දුවන නෞකා, නැවක නැංගාම ඕනෑ තැනකට යන්න පුළුවනි. රියාසාන් නැතිනම් රිබින්ස්ක්වලට යන්න පුළුවනි. එහෙමත් නැතිනම් පර්මි ඉඳලා ආස්ත්‍රාහාන්වලට! මම රියාසාන්වලට ගියා, නගරය නරක නැහැ. හරිම පාළු නගරයක්. නීෂ්නී නගරයටත් වැඩිය සවුත්තුයි. අපේ නීෂ්නිය සිදාදි නගරයක්, අස්ත්‍රාහාන්වලත් හරිම පාළුයි. අස්ත්‍රාහාන්වල කල්මීක් ජාතිකයන් බොහොම ඉන්නවා. ඒකට මම කැමති නැහැ. ඒ වගේම මම මොර්ද්වරුන්ට, කල්මීක්වරුන්ට, පර්සියානුන්ට, ජර්මානුන්ට, ඒ වගේ ජන කොටස්වලට මම කැමති නැහැ."

ඔහු කතා කළේ සෙමිනි. චින්තකයකු ලෙස ඔහු කතා කරන්නේ හැම වචනයක්ම කිරා බලන්නාක් මෙනි. ගල්වඩු ප්යොතර් ඒ වචනවලට බොහෝ ගරු කරයි.

"උන් ජන කොටසක් නොවෙයි. බූතයන් කොටසක්. උන් උපන්නේ ජේසු ක්‍රිස්තු අනුකරණය කරන්න නොවෙයි. ජේසුගේ පිහිට නැතිව උන් මැරිලා යනවා....." යැයි ප්යොතර් කීවේ විශ්වාසයකින් සහ කෝපයකිනි.

ග්‍රිගොරි ප්‍රීතියෙන් ඉපිලෙයි.

"එහෙම වුණත්, නූනත් සහෝදරවරුනි, මම පවිත්‍ර මිනිසුන්ට ආදරෙයි. රුසියානු ජනතාවට, කෙළින් බලන්න පුළුවන් එවිට පමණයි. යුදෙව්වන්ටත් මම ආදරය කරන්නෙ නැහැ. දෙවියෝ මෙතරම් ජාති මැවුවේ මොකටද කියලා අවබෝධ කරගන්න බැහැ. බොහොම

සියුම් විදිහට මේ මැවිල්ල කරලා තියෙන්නෙ..."

ගල්වඩුවා මුඩුම ලෙස කතා කරන්නට විය.

"සියුම් වෙන්න ඇති. නමුත් ඕනෑවට වැඩියි..."

ඔවුන්ගේ කතාවට සවන් දෙන ඕසිප් මැදිහත් වන්නේ උපහාසාත්මක ලෙසත්, නරුම ලෙසත්ය.

"ඕනෑවට වැඩියෙ තියෙන්නේ නුඹලාගෙ කටින් පිටවන පල් හෑලි විතරයි. නුඹලා හරියට නිකායක් වගෙයි. නුඹලාට කස පහර දෙන්න ඕන!"

ඔසිප් නිතර තනිව සිටී. ඔහු එකඟ මොනවාටද තර්ක කරන්නේ කිනම් දේට විරුද්ධවද යන්න වටහා ගත නොහැකිය. සමහර දාට ඔහු මන්දෝත්සාහී ලෙස සියලු මිනිසුන් සමඟත්, සියලු මත සමඟත් එකඟ බවක් පෙන්වයි. ඔහුට මිනිසුන් එපා වී ඇත. ඔහු ඔවුන් දෙස බලන්නේ අර්ධ මුග්ධයන් ලෙසිනි. ඔහු ප්යොතර්ට, ග්‍රිගොරිට සහ යෙපීමුෂ්කාට මෙසේ කියයි:

"අනේ බාං, නුඹලා ඌරන්ගෙන් ඉපදුණු බලු පැටව්."

එවිට ඔවුන් සිනාසෙන්නේ එතරම් ප්‍රීතියෙන් සහ වුවමනාවෙන් නොවේ. එසේවතුදු ඔවුහු යම්තමින් සිනාසෙති.

හාම්පුතා මගේ ආහාර සඳහා දවසකට කොපෙක් පහක් බැගින් දුන්නේය. එය ප්‍රමාණවත් නොවූ බැවින් මම තරමක කුසගින්නේ පසුවන්නට වීමි. එය දුටු කම්කරුවෝ උදේ සහ රාත්‍රී ආහාර සඳහා මට අඩ ගැසූහ. උප කොන්ත්‍රාත්කරුවෝ සමහර දාට තේ බීම සඳහා මට තේ කඩයට පවා ආරාධනා කළෝය. මා ඔවුන්ගේ ආරාධනා පිළිගත්තේ ඉතා කැමැත්තෙනි. ඔවුන් සෙමින් කතා කරන සැටි ඇසීමටත්, ඔවුන්ගේ පුදුම කතා ඇසීමටත් මම ආසා කළෙමි. මා කියවා ඇති පොත් ප්‍රමාණයත්, යාච්ඤා පොත් හා බයිබලය ආදිය ගැන මගේ ඇති දැනීමත් නිසා ඔවුනට සතුටක් ඇති විය.

"නුඹ මහා උගතෙක් වන තරමට පොත් කියවා තියෙන හැඩයි." ඕසිප් කියන්නේ මා දෙස අඳුරු නිල්වන් නෙත්වලින් අවධානයෙන් යුතුව බලමිනි. ඔහුගේ බැල්මෙන් ප්‍රකාශ වන හැඟීම මේ යැයි නිගමනය කිරීම අසීරුය. ඔහුගේ ඇස්වල කණිනිකා දියවී යන්නාක් මෙනි.

"නුඹ වැඩි වැඩියෙන් පොත් කියවාපන්. ඒවායින් නුඹට ප්‍රයෝජනයක් ඇති වේවි. එක්කෝ නුඹ පූජකයකු වෙලා මිනිසුන් සනසන කතා කියාවි, දේශනා කරාවි. නැතිනම් කෝට්පතියකු වේවි."

"මිෂනාරි කෙනෙකු වීමට..." ගල්වඩුවා අමනාපය මුසු කටහඬකින් කතා කරන්නේ කිසියම් හේතුවක් නිසාය.

"මොනවාද?"

"මිෂනාරි කියල කිව්වා. නුඹට ඇහුණා නෙව, නුඹ බිහිරකු නොවෙයි."

"ඔය මදෑ මිෂනාරිවරුන්, පාෂාණ්ඩයන් සමඟ තර්ක කිරීම. නුඹට ඕන නම් පාෂාණ්ඩයෙක් වෙන්නත් පුළුවනි. හොඳ වාසි ඇති රස්සාව. නුවණ තියෙනවා නම් පාෂාණ්ඩයකු හැටියට වුණත් ජීවත් වෙන්න පුළුවනි."

ග්‍රිගොරි ව්‍යාකූල ලෙස සිනා පෑවේය. ප්‍යොතර් යටි රැවුළ දෙස බලමින් මුමුනන්නට විය.

"විජ්ජාකාරයොත් හොඳින් ජීවත් වෙනවා. උනුත් දෙවියන් අදහන්නේ නැහැ."

එවිට ඕසිප් වහාම විරුද්ධත්වය ප්‍රකාශ කරයි.

"විජ්ජාකාරයා උගතෙක් නොවෙයි. විජ්ජා සහ මායාවලට උගත්කමක් ඕන නැහැ."

ඉන් අනතුරුව ඔහු මට විස්තර කරන්න විය. ඔන්න මම කියන දේ අහපන්. අපේ ගම් පළාතේ හිටියා එක කසාද නොබැඳපු ගෑනු පිස්සෙක්, එයාගෙ නම තුෂ්කා. මිනිහට ඇති වැඩකුත් නැහැ. නැති වැඩකුත් නැහැ. මිනිහා ලියන්නෙක්. වැඩ නොකරන්නෙත් නැහැ. කරන්නෙත් නැහැ. මිනිහාට වැඩක් නැති නිසා ඔහු වන්දනා ගමනක් ගියා. එයින් සිද්ධ වුණේ ඔහුට අවුරුදු දෙකකට හිරගෙට යාමටයි. මිනිහා ආපහු ගමට ආවේ පූජක තොප්පියක් දමාගෙන, ලෝගුවක් ඇඟලා ගෙන, ඒක පරණයි. රතු පාටයි. ඒක වැස්සට නොතෙමෙන කැන්වස් රෙදි ලෝගුවක්. මිනිහා හැම එකා දිහා බීගත්තු නෙත්වලින් බලාලා 'තුන් වරක් ශාපලත් පවුකාරයනි, දෙවියන්ගෙන් සමාව ඉල්ලාපියව්! කියා කියන්න වුණා. ඔහු විශේෂයෙන්ම ගෑනුන්ගෙන් එහෙම ඉල්ලා සිටියා. ඉතින් ඔහුගේ වැඩ ටික සාර්ථක වුණා. තුෂ්කාට බඩපුරා

කෑම ලැබෙනවා. තුෂ්කා හොඳට අඩි ගහනවා. තුෂ්කාට ඕනෑවටත් වැඩිය ගෑනු ඉන්නවා."

එවිට ගල්වඩුවා කෝපයෙන් ඔහුට බාධා කළේය.

"ලොකුම දෙය බඩ පුරා කාලා අඩි ගැසීම විතරද?"

"නැතිනම් වෙන මොනවද?"

"ප්‍රධාන ඔහුගේ කතාවයි."

"ඒ මිනිහා වචන හරඹ කරන්න ගියේ නැහැ. වචන අනුව නම් මාත් බොහොම පොහොසත් මිනිහෙක්." ඕසිප් කීවේය.

"අපි තුෂ්නිකෝව් ද්මිත්‍රි වසිල්යෙවිච්ව සෑහෙන තරම් හොඳින් දන්නවා." යැයි ප්‍යොතර් කීවේ හිත් අමනාපයෙනි. ග්‍රිගොරි හිස පහතට හරවාගෙන අතැති වීදුරුව දෙස බලන්නට විය.

"මම තර්ක කරන්න ඉදිරිපත් වන්නෙ නැහැ. මම ඒවා කියුවේ මේ අපේ මක්සීමිච්ගේ යහපතටයි. මිනිහකුට ගමන් කිරීමට බොහෝ මාර්ග තිබෙනවා." යැයි ඕසිප් සමකාමී ලෙස කතා කළේය.

"වෙනත් පාරවලින් ගියාම හිරගෙට වුණත් යන්න පුළුවනි."

"එහෙමත් නොවෙයිද? සුවර්ග ලෝකයට යන්න හැම පාරකින්ම නොහැකියි. නියම වංගුවලින් හැරෙන්නට ඕන" යැයි ඕසිප් කීවේ එකඟ වෙමිනි.

ඕසිප් නිතරම යහපත් මිනිසුන් වන කැටයම්කරුවාට සහ ගල්වඩුවාට ඇනුම් පද අල්ප වශයෙන් එල්ල කරමින් කතා කරයි. ඕසිප් ඔවුනට අකැමැති වුවද, ඉතා දක්ෂ ලෙස එය සඟවාලයි. මිනිසුන් කෙරෙහි ඔහු දක්වන ආකල්පය මේ යැයි තිරකොට කිව නොහැකිය.

එහෙත්, එපීමුෂ්කා කෙරෙහි ඔහු එක්තරා ප්‍රමාණයක මුදු දයාවක් දක්වන සැටියෙකි. යෙපීමුෂ්කා ඔහුගේ මිතුරන්ගේ ජනප්‍රිය තේමාවන දෙවියන්, සත්‍යය, නිකායයන්, මිනිස් දුක අරබයා ඕසිප් සමඟ සාකච්ඡා නොකරයි. වක ගැසුණු ඔහුගේ පිටිකොන්දට පුටු ඇන්ද නොවැදෙන සේ තබා යෙපීමුස්කා තේ වීදුරු කීපයක් එක පිට එක සන්සුන් ලෙස පානය කරයි. එහෙත්, හිටි හැටියේම සුපරීක්ෂාකාරී වී ප්‍රීතිය රහිත කටහඬ ඇසෙන

දුමෙන් පිරි කාමරය දෙස බලා වහා නැඟිට පිටවී යයි. එහි තේරුම ඔහුගෙන් මුදල් ලැබිය යුතු ණය හිමියෙකු තැබෑරුමට පැමිණි බවයි. ඔහු ණය දිය යුතු එවැනි අය බොහෝය. සමහරු ඔහුට පහර දෙති. ඔහු ඔවුන්ගෙන් පලා යයි.

"උන් කෝප වෙනවා පුදුම මිනිස්සු. මා ළඟ සල්ලි තිබුණානම් මම උන්ට නොදී ඉන්නවද? යෙපීමුෂ්කා මවිතවෙයි.

"අනේ නුඹ කාලකණ්ණියා..." ඕසිප් ඔහුට අනුකම්පා කරයි.

සමහරදාට යෙපීමුෂ්කා වාඩිවී සිටින්නේ කිසිවක් නොදකින, කිසිවක් නෑසෙන කල්පනාවෙකිනි. හකු ඇට ඉදිරියට නෙරා ඇති ඔහුගේ මුහුණ මෘදු වෙයි. ඔහුගේ දයාන්විත දෙනෙත් වඩාත් දයාබර වෙයි.

"යාළුවා කල්පනා කරන්නේ මොනවා ගැනද?"

"අනේ මා පොහොසතකු වෙලා හිටියා නම්. රදල පරම්පරාවකින් පැවැත එන හැබෑ ළමාතැනී කෙනෙකුව කසාද බඳිනවා. ඔන්න උදාහරණයක් හැටියට කර්නල් නිලධාරියකුගේ දුවකට මා ආලය කරනවා. දෙවියම්පා ආලය කරනවාමයි. ඇය ළඟට වෙලා ආලය නිසා පණපිටින් ඇවිළෙන්ට පටන් ගන්නවා. අනේ සගයනි. මම එක කර්නල් කෙනෙකුගේ ගෙදර වහලට තහඩු සවි කළා."

"ඒ කර්නල්ට දුවක් හිටියා. ඒකි වැන්දඹුවක්. අපි ඔය කතාව මීට ඉස්සෙල්ලත් අහලා තියෙනවා." ප්යොතර් ඔහුට බාධා කරන්නේ මිතුරු නොවන ලීලාවෙකිනි.

එහෙත්, යෙපීමුෂ්කා දණහිස් දෑතින් මදිමින්, හිසවනා හුස්ම ඉහළට ඇද දිගටම කතා කළේය.

"ඔන්න ගෙවත්තට ගියාම සුදට සුදේ හංස ධේනුවක් වගේ ඉන්නවා. මම එයා දිහා වහල උඩ ඉඳලා බලනවා. මට හිරු එළිය ඕන නැහැ. මට සූරියාලෝකය මොකටද? පරෙවියෙක් වෙලා එයාගේ දෙපා ළඟ ඉන්න ඇත්නම් ඒ ඇති. හරියට වෙඩරුවල දමාපු ලස්සන මලක් වගෙයි. ඒ වගේ ස්වාමි දුවකට මගේ ජීවිතය වුණත් පුදන්නට

ලෑස්තියි. එයා ළඟට වෙලා වහලෙක් වගේ ඉන්ට මා කැමතියි!"

එතකොට නුඹට කෑම දෙන්නෙ කවුද? ප්‌යොතර් දැඩි ලෙස ප්‍රශ්න කළද, යෙපීමුෂ්කාට එය බාධාවක් නොවීය.

"අනේ දෙවියනි. අපට බොහොම දේවල් ඕනද? ඒ විතරක්ද එයා පොහොසත් නොවැ."

ඕසිප් සිනාසෙන්නට විය.

"එතකොට යෙපීමුෂ්කා ඔය වැඩවලදී නුඹ ඉබේටම ගෙවිලා යාවි නේද?"

යෙපීමුෂ්කා ගැහැනුන් ගැන මිස වෙනත් දෙයක් ගැන කතා නොකළේය. ශිල්පියකු ලෙස ඔහුගේ දක්ෂතාව එතරම් ස්ථිර නොවීය. වරෙක ඔහු හොඳින් වැඩ කරයි. වරෙක ඔහු වැඩ අතපසු කරයි. තහඩු එකට පූට්ටු කරමින් ඔහු ලී මිටිය ක්‍රියා කරවන්නේ තහඩු අතර හිඩැස් තබමිනි. ඔහුගේ සිරුරෙන් තෙල් සුවඳක් වහනය වෙයි. එය ඔහුට ආවේණික සුවඳකි. මේ දැන් කපාදැමූ ගසකින් පැන නඟින නැවුම් සුවඳකි, එය.

ලී වඩුවා සමඟ හැම දෙයක්ම කතා කිරීම රුචියක් උපදවයි. එහෙත්, ඔහුගේ කටින් පිටවන වචන හදවතෙහි එක්තරා බියක් ඇති කරවයි. ඔහු බැරෑරුම් ලෙස කතා කරතිද, නැතිනම් විහිළු කරතිද යන්න වටහා ගැනීම ලෙහෙසි නැත.

ග්‍රිගොරි වඩාත් කැමැති දෙවියන් ගැන කතා කිරීමටය. එම තේමාවට ඔහු කැමැති අතර, ඔහුගේ අදහස් ස්ථිරය.

"ග්‍රිගොරි තමුසෙ දන්නවද දෙවියන් විශ්වාස නොකරන මිනිසුන් ඉන්න බව?"

ඔහු සන්සුන්ව මඳ සිනා පා ප්‍රශ්න කළේය.

"එහෙමත් පුළුවන්ද?"

"දෙවියන් නැතැයි කියලා ඔවුන් කියනවා."

"ආ ඒ ගැනද! ඒක මම දන්නවා."

අදිසි මැස්සකු එළවා දමන්නාක් මෙන් ඔහු අතක් ගසා දමා මෙසේ පැවසීය:

"දාවිත් රජ්ජුරුවන්ගේ කාලෙදී මෙහෙම කියලා තියෙනවා. නුඹට මතකද පිස්සකුගේ හදවත තුළ දෙවියන් නැති බව ඔහුගේ කතාවෙන් පෙනෙයි. පිස්සන් ඒ ගැන

කතා කරලා තියෙනවා. දෙවියන් නැතුව කිසිවක් කළ නොහැකියි."

ඕසිප් ඔහු සමඟ එකඟ වූ විටෙක මෙනි.

ප්‍රොතර්ගෙන් ලස්සන මුහුණට දැඩි ගතියක් ආරූඪ වෙයි. වේළුණු හුනු සහිත නියපොතුවලින් යුත් ඇඟිලිවලින් යටි රැවුළ අතගාන ඔහු ගුප්තමය ලෙස කතා කරයි.

"හැම ශරීරයකමත්, හෘද සාක්ෂියකමත්, අභ්‍යන්තර න්‍යෂ්ටියකමත් දෙවියන් වහන්සේ වැඩ සිටී.

"එතකොට පව් ගැන කොහොමද?"

"පව් ශරීරයෙන් ඇතිවේ. සාතන්ගෙන් පව් කියන්නේ වසූරිය වගේ පිටත්තර දෙයක්. පව් ගැන වැඩියෙන්ම සිතන මිනිහා තමයි වැඩියෙන් පව් කරන්නේ. පව් මතක් නොකළොත් එය කරන්නේ නැහැ. පව් පිළිබඳ අදහස සාතන්ගෙන්, එනම් ශරීරයට අධිපතියාගෙන් තමයි ඇතිවන්නේ..."

ගල්වඩුවා එය සැකයට ලක් කරයි.

"ඒ කතාව එතරම් හරියි කියල කියන්න බැහැ."

"නුඹ හිතන්නෙ පව් නොකරන, මනස්තාප නොවන, මනස්තාප නොවුණාම ගැලවීමක් නැහැ එහෙමද? ඕසිප් ප්‍රශ්න කරයි.

"එහෙම වෙන්න ඕන. යකාව අමතක වුණාම දෙවියන්ට කියන්න තියෙන ආදරයත් නැතිවෙනවා කියලා ඉස්සර කාලේ මහල්ලෝ කිව්වා..."

ෂිෂ්ලින් මත්පැන් නොබොයි. කුඩා වීදුරු දෙකක් පානය කළ පසු ඔහුගේ මුහුණ රතු පැහැ ගනී. දෙනෙත් හීනි වෙයි. කටහඬ ගීතමය ස්වරයකට පරිවර්තනය වෙයි.

"සොයුරනි, කොතරම් හොඳද! ජීවත් වෙනවා, පොඩ්ඩක් වැඩ කරනවා, බඩ පිරිලා. දෙවියන්ට සදා කීර්තිය අත් වේවා! අනේ කොතරම් හොඳද!"

ඔහු ඇඬුවේය. ඔහුගේ යටි රැවුළ දිගේ ගලා ගිය කඳුළු කැට කුඩා වීදුරු පබළුවලට සමාන විය.

ඔහු නිතර ජීවිතය ගැන සතුටුවීමත් සහ ඔහුගේ වීදුරු පබළු වැනි කඳුළු කැටත් මගේ සතුටට හේතු නොවීය. මගේ ආච්චි ජීවිතයට ප්‍රශංසා කළේ වඩාත් වැඩි ඒත්තු

ගන්වන ආකාරයෙනි. වඩාත් සරල ලෙසින් මිස බාහිර ආටෝප සහිතව නොවේ.

මේ කතා නිසා මා නිත්‍ය අසහනයකින් පෙළුණු අතර, ඒවා අපැහැදිලි බියක් මසිතෙහි ඇති කළේය. මුෂිකයන් හෙවත් ගම්මුන් ගැන මා බොහෝ කතා කියෙව්වද, පොත් වල ඇති ඒ චරිත මා සැබැවින් දකින අයට වඩා අහසට පොළොව මෙන් වෙනස් බව මට පෙනිණි. පොතේ එන මුෂිකයා හෙවත් ගැමියා දෙවියන් ගැනත්, නිකායයන් සහ පල්ලිය ගැනත් අඩුවෙන් කතා කළේ ලොක්කන්. ඉඩම් සත්‍යය සහ ජීවිතයේ බර ගැන වැඩියෙන් කතා කළේය. පොතින් මවන මුෂිකයා ගැහැනිය ගැන කතා කළේත්, වඩාත් අඩුවෙනි. එතරම් ගොරහැඩි ලෙස නොවන අතර, වඩාත් මිතුරු ලීලාවෙකිනි. එහෙත්, ජීවමාන මූෂිකයාට ගැහැනිය විනෝදයක් නමුදු, එක්තරා බියජනක විනෝද ක්‍රීඩාවෙකි. ඇය පැරද වීමට කුට ප්‍රයෝග යෙදිය යුතුය. නැතිනම් ඈ ඔහුගේ ජීවිතය අවුල් කරනු ඇත. පොතින් මැවූ මුෂිකයා එක්කෝ හොඳය, නැතිනම් නරකය.

ඔහු පොතින් එහෙම පිටින්ම දැකීමට පිළිවන. එහෙත් ජීවමාන මුෂිකයා නරක හෝ හොඳ හෝ පුද්ගලයකු නොවූවද, මවිත උපදවන තරම් සිත් ගන්නාසුලුය. ඔබ ඉදිරියේ ජීවමාන මුෂිකයා කොතරම් දොඩවමින් අදහස් හෙළි කළද, ඔහු තුළ තවත් යමක් ඉතිරි වී ඇති සැටියෙක් පෙනෙයි. එය ඔහු සඳහා පමණකි. මෙසේ නොකියූ දෑ තුළ ගුප්තමය හෙවත් ඉතා ප්‍රධාන දේ ගැබ්වී ඇත.

පොත්වලින් මවා පාන මුෂිකයන් අතුරෙන් මා වඩාත් කැමති ප්‍රයොතර්ගේ 'වඩුමඩුව' නව කතාවටය. ඒ පොත මගේ මිතුරනට ඇසෙන සේ කියවීමට මට සිතක් ඇති වූයෙන්, මම එය සල්පිල් භූමියට ගෙනාවෙමි. එහි ශිල්පියකුගේ වැඩ ශාලාවක මට නිතර පාහේ රැය ගත කිරීමට සිදුවිය. මන්දයත්, දිවා කාලයේ වැඩ නිසා හෙම්බත් වන මට ගෙදර යාමට තරම් ශක්තියක් නොමැති වූ බැවිනි.

වඩුවන් ගැන කියන නවකතාවක් මා ළඟ තිබෙන බව මා කී විට, මගේ මිතුරෝ සහ විශේෂයෙන්ම ඕසිප් ප්‍රබෝධයට පත්වූහ. ඔහු මා අතින් පොත ගෙන එහි

පිටු පෙරළා බලා ඉකෝන චිත්‍රයකට සමාන ඔහුගේ හිස සැලුවේ අවිශ්වාස සහගතවය.

"එහෙනම් අප ගැන කෙළින්ම ලියලා තියෙනවා. අනේ උන් හරිම කපටියෝ. මේක ලියුවේ කවුද බාරින් කෙනෙක්ද? ඔය බාරින්ලා සහ නිලධාරි මහත්තුරු ඕන දේකට දක්ෂයි. දෙවියන් වහන්සේටවත් කල්පනා කරන්න බැරි දේවල් නිලධාරියාට කල්පනා වෙනවා. නිලධාරීන් ජීවත් වෙන්නෙ ඒකට තමයි."

"ඕසිප් නුඹ පරෙස්සමින් නොවෙයි, දෙවියන් ගැන කතා කරන්නෙ" ප්‍යොතර් ඔහුට දොස් පවරන්නාක් මෙන් කතා කළේය.

"ඒකට කමක් නැහැ. දෙවියන් වහන්සේට මගේ වචනය හරියට මගේ තට්ට හිසට වැටෙන කුඩා හිම කැටයක් වගෙයි. නැතිනම් වැහි බින්දුවක් වගෙයි. නුඹ සැක කරන්න එපා. නුඹටයි, මටයි බැහැ දෙවියන්ට අත තියන්න..."

ඔහු හිටිහැටියේම ගිනි පුපුරු වැනි වචන පාවිච්චි කරමින් ක්‍රීඩා කරන්න විය. ඔහුට විරුද්ධ හැම දෙයකටම ඔහු තියුණු පිහි තුඩු වැනි වචන පාවිච්චි කරන්නට විය. දවස පුරා ඔහු කිහිප වරක්ම මගෙන් ප්‍රශ්න කළේය.

"මක්සීමිච් කියවමු නේද? ඉතින් වැඩක් තමයි. ඒක හොඳ කල්පනාවක්."

අපි කතා කොට ඉක්බිතිව රාත්‍රී ආහාරය සඳහා අර්ටේලයට හෙවත් වඩුමඩුවට ගියෙමු. ප්‍යොතර් ඔහුගේ වැඩකරුවකු වන අර්දල්යොන් සමඟත්, ෂිෂ්ලින් තරුණයකු වන පොමා සමඟත් ආවෝය. අර්ටේල් කම්කරුවන් රෑට නිදා ගන්නා ශාලාවේ පහනක් දල්වා මම පොත කියවන්නට පටන් ගතිමි. නිහඬව, නොසල්වී ඔවුහු මට සවන් දුන්හ. එහෙත්, ඉක්මනින්ම අර්දල්යොන් කතා කළේ කෝපයකිනි.

"මට අහගෙන හිටියා ඇති!"

ඔහු පිටවී ගියේය. ප්‍රථමයෙන්ම නිදා ගත්තේ ෂිෂ්ලින්ය. කට හැරගෙන නිදන ඔහු ළඟින්ම වඩුවෝද නිදා ගත්හ. එහෙත්, ප්‍යොතර් ඕසිප් හා පොමා මට වඩාත් ළං වී කතාවට නොසන්සුන්තාවෙන් සවන් දුන්හ.

මා කියවා අවසන් කළ විගස ප්‍යොතර් ලාම්පුව නිවා දැම්මේය. අහසේ තරු අනුව දැන් මැදියම් රෑ පසුවෙලාය.

ප්‍යොතර් කළුවරේම මගෙන් අසන්නට විය.

"මේ පොත ලියා තියෙන්නෙ මොකටද? කාට විරුද්ධවද?"

"දැන් ඉතින් නිදා ගනිල්ලා!" යැයි ඕසිප් කිව්වේ සපත්තු ගලවමිනි.

පොමා නිහඬව අහකට ගියේය.

ප්‍යොතර් යළිත් දැඩි ලෙස මෙසේ ඉල්ලා සිටියේය.

"මේ පොත ලියා තියෙන්නෙ කාට විරුද්ධවද?"

"උන් ඒ ගැන දන්නවා!" යැයි ඕසිප් කිව්වේ තම ලී ඇඳ මත දිගාවෙමිනි.

"කුඩම්මලාට විරුද්ධව නම් ඒක මහා පුහු වැඩක්. ඔය පොත නිසා කුඩම්මලා හොඳ අය වන්නෙ නැහැ." යි ගල්වඩුවා දැඩි ලෙස කියා සිටියේය. ප්‍යොතර්ට විරුද්ධ නම් ඒකත් පුහු වැඩක්. ඔහුගේ පව්වලට ඔහු වග කිව යුතුයි. මිනී මැරුවානම් සයිබීරියාවට යවාවි. එච්චරයි! මේ වගේ පවකට පොතක් ලිවීම අමතර දෙයක්. අමතර දෙයක් තේරුණාද?'

ඕසිප් නිහඬව සිටියෙන් ගල්වඩුවා දිගටම කතා කළේය.

"උන්ට වැඩක් නැති නිසා උන් අනුන්ගෙ දේ අවුස්සනවා. පල්හැලි දොඩවන ගෑනු අම්මණ්ඩිලා වගේ. සුබ රාත්‍රියක්! මට නිදා ගන්න ඕන."

ඔහු දොර අසල විනාඩියක් රැඳී සිට අනතුරුව ප්‍රශ්න කළේය.

"ඕසිප් නුඹේ අදහස කුමක්ද?"

"මට නිදිමතයි." ඔහු අඩ නින්දෙන් පිළිතුරු දුන්නේය.

"නුඹ නිදා ගනින්!"

ෂිෂ්ලින් වාඩිවී සිටි තැනම පැත්තකට පෙරළී නිදන්නට විය. පොමා මා අසලින් පිදුරු ගොඩ මත වැතිර ගත්තේය. ජනවසම නිදි ගෙන ඇත. ඈත සිට දුම්රිය යන්ත්‍ර වාෂ්ප පිට කරන සැටිද, යකඩ රෝද ගැටෙන හඬද, යකඩ පටි එකිනෙකට වැදෙන හඬද ඇසෙයි. වඩුමඩුවේ නිදන්නෝ විවිධ හඬ නඟති. මා පොත ගැන කිසියම් සාකච්ඡාවක්

බලාපොරොත්තු වූ නිසාත්, එවැන්නක් ඇති නොවූ නිසාත්, මසිතට අසීරුතාවක් දැනිණි.

එහෙත්, හිටිහැටියේම ඕසිප් සෙමින් සහ පැහැදිලි ලෙස කතා කරන්නට පටන් ගත්තේය.

"කොල්ලනේ, නුඹලා ඔය පොතේ තියෙන කිසිවක් විශ්වාස කරන්න එපා. නුඹලාට බොහෝ කාලයක් ජීවත්වීමට ඉඩ තියෙනවා. නුඹලාගේ බුද්ධිය එක්රැස් කරගනිල්ලා! තමාගේ නුවණ අනුන්ගේ නුවණට වඩා දෙගුණයක් වටිනවා! පොමා නුඹ නිදිද?"

"නැහැ" යි පොමා කියනවා ඇසිණි.

"එහෙම නම් හොඳයි! නුඹලා දෙදෙනාම අකුරු දන්නවා. ඒ නිසා කියවාපල්ලා, හැබැයි කිසිවක් විශ්වාස කරන්න එපා. උන්ට ඕන දෙයක් අච්චු ගහන්න පුළුවනි. ඒවා සියල්ලම උන්ගේ අතේ තියෙන්නේ."

ඔහු නිදා සිටි ලී ඇඳෙන් නැඟිට ලෑල්ලේ අයින දෑතින් අල්ලා ගනිමින් වාඩි වී, අප දෙසට නැවී තම අදහස් කියා පාන්නට විය.

"පොතක් කියවා තේරුම් ගන්න ඕන කොහොමද? පොත ජනතාවට පණිවුඩයක් ගේනවා. ඔන්න බලාපල්ලා වඩුවා නැතිනම් වෙනින් කෙනෙක් කවුද කියලා. නමුත්, රදල බාරිනයා වෙනත් මිනිහෙක්. පොතක් නිකම් ආවට ගියාට ලියන්නෙ නැහැ. කාගේ නමුත් ආරක්ෂාව සඳහා."

පොමා පොතේ සිද්ධියක් ගැන සිය අදහස් පළ කළේය.

"ප්යොතර් කොන්තරාත්කාරයාව මරාපු එක හරි."

"ඒ කතාව තේරුමක් නැහැ. මොනම හේතුවක් නිසාවත් මිනිහකු මරා දැමීම හරි වැඩක් නොවෙයි. නුම ග්රිගොරිට අකැමැති බව මම දන්නවා. නමුත්, නුඹ ඔය අදහස අත හැර දාපන්. අපි සල්ලිකාරයෝ නොවෙයි. අද මා යටතේ සමහරු වැඩ කළාට, හෙට මා නැවත කම්කරුවකු බවට පත්වෙන්න පුළුවන්"

"ඕසිප් මාමේ, මා නුඹ ගැන නොවෙයි කිව්වේ."

"කොහොම වුණත් අදහස එකයි."

"මාමා සාධාරණයි."

පොමාගේ කෝපාන්විත කතාවට බාධා කරමින් ඕසිප් යළිත් කතා කළේය.

"හිටපන්, මම නුඹට පොතක් ලියන්නේ කුමක් සඳහාද කියල කියන්නම්. මේ රචනය බොහොම කපටි වැඩක්. ඔන්න මුෂිකයා නැතුව රදල බාරිනයා ඉන්නවා. තවත් තැනෙක බාරිනයා නැතුව මුෂිකයා ඉන්නවා. ඔන්න ඉතින් බලාපන්. රදල බාරිනයාට අමාරුයි. ඒ වගේම මුෂිකයාටත් හොඳ නැහැ. බාරිනයා දුර්වල වෙලා. මෝඩ වුණා. මුෂිකයා ආඩම්බර වුණා. බේබද්දකු වුණා. ලෙඩ වුණා. අමනාප සිතක් ඇත්තකු වුණා. ඔන්න ඔහොමයි තත්ත්වය හොඳයි. ඔහුට ප්‍රවේණිදාස මුෂිකයාගේ පිටිකොන්දට මුවා වෙලා බේරෙන්නට පුළුවනි. මුෂිකයා බාරිනයාට මුවාවෙලා බේරුණා. ඔය දෙන්නා ඔහොම එකිනෙකාට මුවාවෙලා සන්සුන් වෙලා ජීවත් වුණා. මම තර්ක කරන්නේ නැහැ. ප්‍රවේණි රදල හාම්පුතා යටතේ දාසයාගේ තත්ත්වය නරක් වුණේ නැහැ. ප්‍රවේණි දාසයා දුප්පත් වී හිටියා නම් එය රදලයාගේ වාසියට හේතු වුණේ නැහැ. ප්‍රවේණි දාස මූෂිකයා පොහොසත් නම්, ඒ වගේම මෝඩ නම්, රදලයාට ගජ වාසියි. මම ප්‍රවේණිදාස ක්‍රමය යටතේ අවුරුදු හතළිහක්ම ජීවත් වුණා. මා බොහෝ අත්දැකීම් ලබා තියෙනවා."

සිය දිවි හානි කරගත් අස්රියකරු ප්යොතර් මට මතක් කරනු ලැබුවේ ඕසිප්ගේ මේ විවරණය විසිනි. ඕසිප්ගේ අදහස් ඒ නපුරු මහල්ලාගේ අදහස්වලට බොහෝ සෙයින් සමීප වීම නිසා මසිතෙහි ඇතිවූයේ අප්‍රිය ජනක හැඟීමෙකි.

ඕසිප් මගේ කකුලකට තට්ටු කොටැ දිගටම සිය මතය ඉදිරිපත් කරන්නට විය.

"පොත්වල තියෙන ප්‍රබන්ධ කතා තේරුම් ගන්න ඕන. කිසිවෙක් නිකම් කිසිදෙයක් කරන්නෙ නැහැ. බොරු වැඩවලින් කාටවත් පලක් නැහැ. පොත් ලියන්නේ මිනිසුන්ගේ මොළ අවුල් කරන්න නොවෙයි. හැම දෙයක්ම නිර්මාණය කරන්නේ බුද්ධියෙන්. බුද්ධියක් නැතිනම් පොරොවෙන් කපන්නට බැහැ. උදැල්ලෙන් හාරන්නත් බැහැ...."

ඔහු බොහෝ වේලාවක් කතා කොට නිදා ගැනීමට සැරසුණද, යළිත් නැඟිට කතා කළේය. අඳුර සහ

නිහඬතාව මධ්‍යයේ ඔහු තම වචන මාලාව සෙමින්, සංගතික ලෙස විහිදුවා හැරියේය.

රදල හාම්පුතාලා, මහත්තුරු ගම්මුන්ට පිට අය කියලා කියනවා. නමුත්, ඒ කතාවේ තේරුමක් නැහැ. අපි ඇවිත් තියෙන්නේ ඒ මහත්තුරුන්ගෙන්ම තමයි. ඒ ගොල්ල උඩින්. අපි යටින්. බාරින් පොතින් ඉගෙන ගන්නවා. අපි ගතින් ඉගෙන ගන්නවා. 'බාරිනයගෙ වටකුරු පස්ස, ඒකතමා එකම කොස්ස. නැහැ කොල්ලනේ ලෝකයේ වෙනත් විදිහකට ජීවත් වන්න ඕන. අලුත් විදිහට පොත් ලියන්න ඕන. හැම දෙනෙක්ම තමන්ගෙන් ප්‍රශ්න කළ යුතුයි. මම කවුද? මිනිහෙක්. ඔහු කවුද? ඔහුත් මිනිහෙක්. දැන් මොකද දෙවියන් වහන්සේ එයාගෙන් වැඩියෙ මුදල් ඉල්ලනවද? නැහැ. එතැනදී අපි දෙන්නම දෙවියන් ඉදිරියේ එක හා සමානයි."

අවසානයේදී උදෑසන අරුණෝදය විසින් සියලු තරු නිවා දමනු ලැබීමෙන් ඉනික්බිතිව ඕසිප් මට කතා කොට මෙසේ පැවසීය:

"පේනවද මගේ ප්‍රබන්ධවල හැටි? ඔන්න මම කියපු දේ මීට පෙර කිසිම දාක සිතලාවත් නැහැ. කොල්ලනේ නුඹලා මා කියන දේ බැරෑරුම් ලෙස විශ්වාස කරන්න එපා. මම ඔයවගේ දේ කියන්නේ බැරෑරුම් කමට වඩා නිදි නැති කමටයි. ඇලවෙලා ඉඳගෙන මොනවා හරි විහිළුවක් කල්පනා කරනවා. හරියට කපුටාගේ කතාව වගෙයි. එකොමත් එක කාලෙක කපුටෙක් හිටියා. ඌ කුඹුරේ ඉඳලා කඳුවලට පියාසර කළා. එතැනින් මෙතනට, මෙතැනින් එතනට ගියා. උගේ කාලය පැමිණියාම ඌ මළා! ඉතින් එම කතාවේ තේරුමක් තියෙනවද? කිසිම තේරුමක් නැහැ. දැන් ඉතින් නිදාගනිමු. ඉක්මනට නැඟිටින්න ඕන."

XVIII

නැවේ වැඩ කළ ගිනි උදුන්කරු යාකොව් මෙන්ම ඕසිප්ගේ ප්‍රතිරූපයද මගේ නෙත් ඉදිරියේ ශීඝ්‍ර ලෙස වැඩෙමින් අනික් මිනිසුන් වසා දැම්මේය. ඕසිප් සමහර

ලක්ෂණ අනුව නැවේ ගිනි උදුන්කරුවාට සමාන වූ අතර, ඔහු මට මගේ සීයාත්, ඉකෝන චිත්‍ර වෙළඳහලේ තක්සේරුකරු ප්‌යොතර් වසීලවිචුත්, නැවේ කෝකි තැන වූ ස්මුරීත් එකවර මතක් කළේය. මගේ මතකයෙහි දැඩි ලෙස සටහන් තැබූ මිනිසුන් යළි මට මතක් කළ ඕසිප් පිත්තල ඝණ්ටාරයෙක කළ කැටයමක් මෙන් මසිතෙහි ගැඹුරු සටහන් තැබීය. ඕසිප්ට චින්තන පද්ධති දෙකක් තිබෙන්නාක් මෙන් විය. එකක් දිවා කාලයේ වැඩ කරන විටත්, මිනිසුන් ඉදිරියේ ඔහු ප්‍රකාශ කරන තීක්ෂණ, සරල, ව්‍යාපාරික අදහස්ය. මේවා අවබෝධ කැර ගැනීම ලෙහෙසිය. අනික් චින්තන පද්ධතිය ඔහු විවේක ගන්නා විටත්, හවස ඔහු මාත් සමඟ නගරයට යන විටත්, වෙල්ලවැහුම් වෙළෙඳාම් කරන ඔහුගේ කුමා (ඥාති සොයුරිය) හමුවීමට යන විටත්, රාත්‍රී කාලයේදී නිදි නැති විටත්, පවසන අදහස්වලින් පිරී පවතී. රාත්‍රී කාලවලදී ඔහු කියන දේ බහු පාර්ශ්වී යැයි කිව හැකිය. එය ලන්තෑරුමක කුඩා වීදුරු ජනේල රාශියකට සමානය. ඒ හැම වීදුරු ජනේලයකින්ම ආලෝකය විහිද ගියද, එහි මූණත කිනම් පැත්තක තිබේද යන්න කිව නොහැකිය. ඕසිප්ට වඩාත් කිට්ටු කිනම් මාර්ගය ද?

ඕසිප්, මා හමු වූ සියලු මිනිසුන්ට වඩා බොහෝ සෙයින් බුද්ධිමත් බව මට සිතිණි. ගිනි උදුන්කරු යාකොව් වටා මා ගමන්ගත් එම හැඟීමෙන් සහ මනෝභාවයෙන් යුතුව මම ඕසිප් වටේ යන්නට වීමි. මා නැවේදී යාකොව් වටේ යමින් ඔහු දැනගැනීමට සහ වටහා ගැනීමට තැත් කළ විට ඔහු ලිස්සා යයි. ඔහු අල්ලාගත නොහැකි පුද්ගලයකු බවට පත් වෙයි. ඔහුගේ සත්‍යය සැඟවී තිබෙන්නේ කොහිද? එය විශ්වාස කළ හැක්කේ කෙසේද?

ඔහු මට කී සැටි මතක් වෙයි.

"මම හැංගිලා ඉන්නේ කොහිද කියලා නුඹම හොයාපන්. එතකොට හොයාගන්න හැකි වේවි!"

මගේ ආත්මාඩම්බරයට පහරක් වැදී ඇත. එහෙත්, මා තුළ ආත්මාඩම්බරයට වඩා වැඩි යමක් ගැප්වී ඇත. මහල්ලාව සම්පූර්ණයෙන්ම වටහා ගැනීම මගේ ජීවිතයට අත්‍යවශ්‍යයෙන්ම බලපාන්නකි.

ඔහු අල්ලාගත නොහැකිවාක් මෙන්ම, මුරණ්ඩුය. ඔහු තවත් අවුරුදු සියයක් මෙලොව ජීවත් වුණද, පුදුමාකාර ලෙස චපල මිනිසුන් මැද ඔහු ඔහුගේ ස්වීයත්වය ආරක්ෂා කර ගනු සහතිකය. ඉකෝන චිත්‍ර වෙළෙඳහලේ තක්සේරු කරන්නාද මෙවැනිම ස්ථිරත්වයේ හැඟීමක් මා තුළ ඇති කළද, එය මසිතෙහි එක්තරා අසතුටක් ඇති කළේය. ඕසිප්ගේ ස්ථිරත්වය මසිතෙහි සතුට මුසු හැඟීමක් ඇති කිරීමට සමත් විය.

මිනිසුන්ගේ චපල ගති හොඳ හැටි කැපී පෙනෙයි. එක් තත්ත්වයක සිට තවත් තත්ත්වයක් දක්වා ඔවුන් පනින පිම් නිසා මම විස්මයට පත්වීමි. පසුකලෙක විස්තර නොකළ හැකි එම පිම් නිසා මම විඩාපත් වීමි. ඒ ලක්ෂණ නිසා මිනිසුන් කෙරෙහි මා දැක්වූ ජෛවමය වුවමනාවත්, ඔවුන් කෙරෙහි මා දැක්වූ ආදරයත් ක්‍රමයෙන් තුනී විය.

දවසක් දා ජූලි මුල් දවස්වලදී අප වැඩ කරමින් සිටි ස්ථානයට වේගය පාලනය කළ නොහැකි අස්රියක් පැමිණියේය. රිය එළවන ආසනයෙහි වාඩිවී සිටි අස්රියකරුවා දොම්නසින් ඉක්කා ගැසීය. කට ගොන්නක් බී ගෙන සිටි ඔහුට යටි රැවුළක් තිබුණද, හිසෙහි තොප්පියක් නොවීය. ඔහුගේ යටි තොල පැළී තුවාල වෙලාය. ග්‍රිගොරි ෂිෂ්ලින් අස්රියෙහි පැත්තකට ඇලවී සිටියේය. ඔහුද වෙරිමතිනි. ඔහුගේ අතකින් අල්ලා ගත් රතු පැහැති තරුණ කතක් රතු පැහැති පීත්ත පටියක් සහ වීදුරු වෙරි ගෙඩි සහිත පිදුරු තොප්පියක් හිස ලා ගෙන සිටියාය. ඇගේ අනික් අතෙහි කුඩයකි. මේස් රහිත පාදවල කලෝෂි නමැති පාවහන් කවරය. කුඩය වනමින්, පැද්දෙමින්, හඬ නඟා සිනාසෙමින් ඈ කෑ ගැසුවාය.

"හරිම යක්කු වගයක්! සල්පිල ඇරලා නැහැ. පටන් අරගෙන නැහැ. උන් මාව සල්පිලට ගෙනාවා."

ඇඳුම්වල කුණු තවරාගෙන, හිස අවුල් කරගෙන සිටි ග්‍රිගෝරි රියෙන් බිමට පැන බිම වාඩිවී, කඳුළු පිරි දෙනෙතින් යුතුව අපට ආයාචනය කළේය.

"දණ ගහලා මම දන්වා සිටිනවා. පොඩ්ඩක් පව් කළා. කල්පනා කරලා පව් කළා! යෙපීමුෂ්කා මෙහෙම කිව්වා. ග්‍රීෂා, ග්‍රීෂා, කියලා කිව්වා. එයා එහෙම කියාපු කතාව

හරි. නුඹලා මට සමාවෙයල්ලා! නුඹලා සියලු දෙනාටම සංග්‍රහ කිරීමට මම සූදානම්! එයාගෙ කතාව හරි. අපි ජීවත් වන්නේ එක වරයි. එකවරට වඩා ජීවත් විය නොහැකියි."

තරුණ කත මහ හඬින් කෑගසමින් අඩි පොළොවේ හප්පන්නට වූවා, කලෝෂි නැති කර ගත්තාය. රියකරුවා මූසල හඬකින් කෑ ගැසුවේය.

"අපි තවත් දුර යමු. හර්ලාම්වලට යමු. අශ්වයට නිකම් ඉන්ට බැහැ."

වෙහෙසට පත් මහලු අශ්වයාගේ ඇඟ දහදියෙන් තෙමිලාය. උගේ සැටි බලන හැම දෙනකුටම සිනා වී සිටිය නොහැකි විය. ග්‍රිගොරිගේ මෙහෙකරුවෝ ස්වාමියාත්, ඔහුගේ තරුණ කතත්, කට ගොන්නක් බී ගෙන සිටි අස්කරුවාත් දෙස බලමින් හඬ නඟමින් සිනාසුණහ.

මා අසලින් දොර ළඟ නැවතී සිටි පොමා පමණක් සිනහ නොවී, මුමුනන්නට විය.

"ඌරු විසේ නැඟලා... ගෙදර එයාට බිරිඳ ඉන්නවා. එයා ලස්සන ගෑනියක්..."

රියකරු පිටත් වී යාමට උනන්දු විය. තරුණිය රියෙන් බිමට බැස බිම වාඩි වී සිටි ග්‍රිගොරි ඔසවා යළි රියෙහි නංවා ගෙන, කුඩය වනා කෑ ගැසුවාය.

"කරත්තය දක්කාපන්!"

මිනිස්සු ග්‍රිගෝරිට සුහද සිතින් ඉරිසියා කරමින් පොමාගේ අණ අනුව යළිත් වැඩ පටන් ගත්හ. ග්‍රිගොරි විකටයකු වී සිටිනු බැලීමට පොමා අකැමැති වූ විටෙක මෙනි.

"හරිම හාම්පුතෙක් තමයි! වැඩ තියෙන්නෙ මාසයකට වඩා අඩු කාලයකටයි. ඊට පසුව ගමට යනවා.... උහුලාගෙන ඉන්න බැරිවුණා..."

ග්‍රිගොරි නිසා මගේ සිත කලකිරිණි. වීදුරුවලින් තැනූ වෙරි ගෙඩි පැලඳ සිටි ඒ තරුණිය ඔහු අසලින් සිටිනු දැකීම මුග්ධ දර්ශනයක් විය.

මම නිතර පාහේ මෙසේ සිතන්නට වීමි. ග්‍රිගොරි ෂිෂ්ලින් අයිතිකරුවාත්, පොමා තුච්කොව් වැඩ කරුවාත් වීමේ හේතුව කුමක්ද?

යහතින් වැඩුණු සුදුවන් සිරුරක් ඇති පොමා, මුදු වැනි හිසකේ ඇති, උකුසු නාසයක් සහ බුද්ධිමත් බළල් ඇස් ඇති, වටකුරු මුහුණක් ඇත්තෙකි. ඔහු මුෂිකයකුට සමාන නොවීය. ඔහු හොඳ ඇඳුම්වලින් සැරසුණ හොත්, හොඳ පවිලකට අයත් පොහොසත් වෙළෙන්දෙකුගේ පුතකුට බෙහෙවින් සමාන වනු ඇත. බැරෑරුම් විලාසයක් මවා ගෙන සිටි පොමා කතා කළේ මඳ වශයෙනි. අවශ්‍ය ප්‍රමාණයට පමණකි. අකුරු දත් ඔහු කොන්ත්‍රාත් කටයුතු වල ගණන් තැබීය. කළ යුතු වැඩ නිගමනය කළේය. සගයන්ගෙන් වැඩ ගැනීමට දක්ෂතාවක් පෙන්වූ ඔහු වැඩ කළේ වැඩි කැමැත්තෙකින් නොවේ.

"සියලු වැඩ සම්පූර්ණ කරන්න බැහැ." යි ඔහු කිව්වේ සන්සුන් ලෙසිනි. ඔහු පොත් ගැන උදාසීනත්වයෙකින් කතා කළේය." ඕනෑම දෙයක් මුද්‍රණය කරන්න පුළුවනි. මටත් ඕනෑම කතාවක් හිතින් මවලා කියන්න පුළුවනි. ඒක පුහු වැඩක්...."

එහෙත්, ඔහු හැම දෙයටම සාවධානව සවන් දුන්නේය. ඔහු යම් කිසි දෙයක් ගැන උනන්දුවක් දැක්වූයේ නම්, එය ගැන විස්තරාත්මක ලෙසත්, දැඩි ලෙසත් විමසමින් නිතරම ස්වයං දෙයක් ගැන කල්පනා කරමින් හැම දෙයක්ම ස්වකීය මිම්මෙන් මැනීමට ඉදිරිපත් විය.

කොන්ත්‍රාත්කරුවකු ලෙස වැඩ නොකරන්නේ මන්දැයි මම වරක් පොමාගෙන් ඇසීමි. එවිට ඔහු කුසීත ලෙස මෙසේ පැවසීය:

"එතකොට එක පාරටම දහස් ගණනින් හොරකම් කරන්නයි වෙන්නෙ. තවත් කරදර ඇතිවේවි. බොරු වැඩවලට, තඹයට පවා හෙට්ටු කරන්න සිද්ධ වේවි. මම හොඳට වට පිට බලා. පසුව ඔරාන්කිවල පූජකාරාමයට ඇතුළු වෙනවා. මම ලස්සන හයිය ඇති කෙනෙක්. හිටි හැටියේම ලොකු සල්ලිකාර වෙළෙන්දකුගේ වැන්දඹුවක් මාව දැකලා මට කැමැති වුණොත්. එහෙම දේත් සිදු වෙනවා. සෙර්ගාත්ස්ක්වල එක ඉලන්දාරියෙක් අවුරුදු දෙකකදී වාසනාව ලබා ගත්තා. නාගරික තරුණියකුව කසාද බැඳගත්තා. ඉලන්දාරියා ඉකෝන චිත්‍ර ගෙවල් ගානේ ගෙනිහින් විකුණුවා. ඉතින් අර කෙල්ල මේ

කොල්ලාව තෝරා ගත්තා."

ඔහු ඒ ගැන සිතා තීරණයක් ගත් කෙනෙක් විය. පූජකාරාමවල තරුණ පූජක සිසුන් මෙවැනි සැපවත් ජීවිතවලට හිමිකරුවන් වීම අරබයා වූ කතා බොහොමයක් පොමා දැන සිටියේය. ඔහුගේ කතා මා සිත් නොගත් අතර, ඔහුගේ චින්තන රටාවටද මම ඇලුම් නොකළෙමි. එසේ වුවද, ඔහු පූජකාරාමයට යනු ඇතැයි මම දැඩි ලෙසම විශ්වාස කළෙමි.

සල්පිල විවෘත වූ විගසම, පොමා බොහෝ දෙනෙකු මවිතයට පත් කරවමින්, අවන් හලෙක වේටරයකු ලෙස වැඩ පටන් ගත්තේය. මවිත වීම කෙසේවතුදු ඔහුගේ සගයෝ ඔහුට අවඥා සහගත ලෙස සැලකීමට පටන් ගත්හ. උත්සව දවස්වලදී අවන්හලට යාමට සූදානම් වූ ඔවුහු එකිනෙකා දෙස බලා සිනාසෙමින්, මෙසේ කියා ගත්හ.

"අපේ වේටරයා ළඟට යමු!"

අවන්හලට ගොඩවන ඔවුහු ස්වාමිවරුන් සේ කෑ ගැසූහ.

"කෙස් කැරැලි තියෙන වේටර්, මෙහෙ එනවා!"

ඔහු, ඔවුන් ළඟට විත් හිස ඔසවා ඇසුවේය.

"මොනවද ගේන්න ඕන"

"පරණ යාළුවන්ව අඳුනන්න බැරිද?"

"හඳුනාගන්න වේලාවක් නැහැ."

ඔහුගේ සගයන් ඔහුට නිගා කරන බව හඟින ඔහු, ඔවුන් විහිළු කරන බවද දනී. එනිසා ඔහු ඔවුන් දෙස බැලුවෙ පාළුව මුසු බලාපොරොත්තු සහගත නෙත්වලිනි. එවිට ඔහුගේ මුහුණ ලීමුවා රූකඩයක වෙසක් ගත්තද, එය කතා කරන්නාක් මෙන් විය.

"ඉතින් නුඹලට ඕන නම් හිනා වෙයල්ලා. ඉක්මන් කරපල්ලා..."

"නුඹට සන්තෝසමක් දෙන්නද?" මෙසේ අසන ඔවුහු වුවමනාවෙන්ම බොහෝ වේලාවක් මුදල් පසුම්බි අතගා බලා අවසානයේදී ඔහුට තඹයකුදු නොදී පිටවී ගියෝය.

පූජකාරාමයට ඇතුළු වීමට සූදානම් වූ ඔහු, වේටර් කෙනෙකු වූයේ මන්දැයි මම පොමාගෙන් විමැසුවෙමි.

"මම පූජකයකු වීමට සූදානම් වුණේ නැහැ. වේටර් වැඩේ කරන්නෙ ටික කලකටයි."

ඊට වසර හතරකට පසුව මම ඔහු ට්සරිට්සින්වල දී හමුවීමි. එවකටත් ඔහු වේටර් කෙනෙකු ලෙස සේවය කරමින් සිටියේය. අනතුරුව පොමා තුච්කොව් ගෙවල් බිඳීමට තැත් කිරීමේදී සිරභාරයට ගත් බව පුවත්පතකින් මම දැක ගතිමි.

ප්යොතර්ගේ අර්ටේලයේ ඉතාම හොඳ ශිල්පියා මෙන්ම, ජ්‍යෙෂ්ඨයා වන අර්දල්යොන්ගේ කතාව නිසා මම ඉමහත් ලෙස මවිතයට පත් වීමි. හතළිස් හැවිරිදි වයසැති, කළුවන් යටි රැවුළක් සහිත ප්‍රිය මනාප පුද්ගලයකු වූ ඔහු, ඉබේටම මෙන් මෙවන් ප්‍රශ්නයක් ඉදිරිපත් කළේය. මෙහි අයිතිකරු විය යුත්තේ මා ය, එහෙනම් ප්යොතර් අයිතිකරු වූයේ කෙසේද? ඔහු වොඩ්කා පානය කළේ කලාතුරකිනි. එහෙත්, වෙරිමත් වීමට තරම් නොවේ. වැඩ ඉතා හොඳින් දත් ඔහු, වැඩ කළේත් තෘප්තියෙකිනි. ඔහු තාප්ප බැන්දේ කොතරම් වේගයකින්දයත්, ඔහු අතින් ගිලිහෙන ගඩොල් කැට ඉගිළෙන රතු පරවියන්ට සමාන විය. ඔහු අසලින් සිටි කේදෑරි ප්යොතර් අනවශ්‍ය අමතර මිනිහකුට සමාන බවක් දැරීය. ඔහු වැඩ ගැන නිතර කී සැටි මෙසේ විය:

"මිනිසුන්ට අපි ගඩොල්වලින් ගෙවල් බඳිනවා. නමුත් අපට ලැබෙන්නේ ලීයෙන් හදාපු මිනි පෙට්ටියක් විතරයි."

අර්දල්යොන් ගඩොල් එක පිට එක ඉතා වේගයෙන් සහ දක්ෂ ලෙස තබමින් කෑ ගැසීය.

"කොල්ලනේ වැඩ කරපියව්. දෙවියන්ට කීර්තිය අත්වේවා!"

ලබන වසරේ වසන්තය වන විට ටොම්ස්ක් නගරයට ගොස් එහි දේවස්ථානයක් ඉදිකරන බව ඔහු හැම දෙනාටම කිව්වේය. ඔහුගේ බෑනා කෙනෙක් ලොකු කොන්ත්‍රාත්තුවක් රැගෙන ඇති නිසා ඔහුටත් එහි වැඩ බිමේ නඩ නායකයකු ලෙස වැඩ කිරීමට එන ලෙස බෑනා ඉල්ලා සිටින බව දැන්වීය.

"මම ඒක තීරණය කරලා ඉවරයි. දේවස්ථාන ඉදිකිරීමට මම බොහොම කැමතියි." ඔහු මටත් එන ලෙස අඩ

ගසන්නේ මෙසේද පැවසීය. "මාත් සමඟ සයිබීරියාවට යමු. එහි අකුරු දන්නා අය බොහොම අඩුයි. උගත්කම එහි ලොකු තුරුම්පුවක්!"

මා එකඟ වූ විට අර්දල්යොන් ජයග්‍රාහී ලෙස කෑ ගැසීය.

"අන්න ඒක නියම වැඩක්. විහිළුවක් නොවෙයි."

ප්යොතර් සහ ග්‍රිගොරි කෙරෙහි ඔහු දැක්වූයේ වැඩිහිටියකු ළමයින් කෙරෙහි දක්වන සුහද උපහාසයෙකි. ඔහු ඒ ගැන ඕසිප්ට දැන්වූ සැටි මෙසේය:

"පුරසාරම් දොඩවන්නේ උන් හරියට එකිනෙකාට තුරුම්පු පෙන්වන්නා වගේ. එකිනෙකාට තම තමන්ගේ පණ්ඩිතකම් පෙන්වනවා! එකෙක් කියනවා මෙන්න බලාපන් මගේ හාරත ආසියා, එවිට අනිකා කියනවා මෙන්න බලාපන් මගේ ඉස්කෝප්ප ආසියා කියලා."

ඕසිප් ස්ථිරත්වයෙන් තොරව නිගමනයන් කළේය.

"එහෙම නැතුව කොහොම පුරසාරම් දෙඩීමට එක් මිනිස් ගුණයක් හැම තරුණියක්ම දෙතන ඉස්සරහට දාගෙන තමයි ගමන් කරන්නේ."

"උන් බොරුවට කෑ කෝ ගහනවා. දෙවියන් ගැන කියනවා. නමුත්, සල්ලි ගොඩ ගහනවා." අර්දල්යොන් කිව්වේ ඉවසිලි රහිතවය.

"ග්‍රිගොරි සල්ලි එකතු කරන්නෙ නැහැ."

"මම කිව්වේ මගේ එකා, ප්යොතර් ගැනයි. කැලෑවට හරි කාන්තාරයට හරි ගිහිල්ලා දෙවියන්ට යාච්ඤා කළාවේ... අපොයි. අම්මේ, මට මේ වැඩ එපා වෙලා. ලබන වසන්තයේ දී මම සයිබීරියාවට යනවා."

අර්දල්යොන් කෙරෙහි සුහද ඉරිසියාවක් දැක්වූ කම්කරුවෝ තම අදහස් පළ කළහ.

"එයාට වගේ හයිය ඇති බෑනලා අපටත් ඉන්නවා නම්, අපිත් බය නැතුව සයිබීරියාවට යනවා."

හිටිහැටියේම අර්දල්යොන් අතුරුදහන් විය. ඉරිදා අර්ටෙලයෙන් පිටතට ගිය ඔහු ගැන දවස් තුනක් යනතුරුත් කිසිදු තොරතුරක් නොවීය.

මිනිස්සු අස්ථිර ලෙස නිගමනවලට එළැඹුණහ.

"කවුරු හරි මිනිහව මරා දමලද?"

"නාන්න ගිහිල්ලා ගිලිලා මළාද?"

එහෙත්, යෙපීමුෂ්කා ඇවිත් ව්‍යාකූල ගතියෙකින් කතා කළේය.

"අර්දල්යොන් බීගෙන නටනවා!"

"බොරු කියන්නෙ මොකටද?" අවිශ්වාස ලෙස ප්යොතර් කෑ ගැසීය.

"මිනිහා බීගෙන නටනවා. හිටිහැටියේම කඳ මැදින් කැඩිච්ච ගහක් වගේ. එයා බීගෙන හැසිරෙන්නේ ගෑනි මැරිච්ච දුක නිසාලු."

"එයාගෙ ගෑනි මැරිලා බොහෝ කල් වෙනවා. දැන් ඔහු කොහිද?"

ප්යොතර් අර්දල්යොන් බේරා ගැනීම සඳහා ගියේ කෝපයෙනි. එහෙත්, ඔහු ප්යොතර්ට පහර දී පන්නා දැමීය.

එවිට ඕසිප් දෙතොල් තදින් වසාගෙන දෑත් සාක්කු වල ඔබා ගෙන මෙසේ කිව්වේය:

"ගිහිල්ලා බලන්නම්, මිනිහට මොනවද වෙලා තියෙන්නෙ කියලා."

මමත් ඕසිප් සමඟ ගියෙමි.

යන ගමන් ඕසිප් කතා කරන්නට පටන් ගත්තේය. "ඔන්න මිනිහෙක් නිකම් නිවී හැනේ ඉන්නවා.

නමුත්, හිටිහැටියේම ඔහුට යකා වැහෙනවා. බීගෙන නටනවා. ඔන්න මක්සීමිච් නුඹ ඉගෙන ගනින්..."

ප්‍රීතිමත් කුනාවිනා ගමේ එක් ඉතා ලාබ ගණිකා කුටියකට අපි පැමිණියෙමු. හෙරක් බඳු මැහැල්ලක් අප පිළිගත්තාය. ඈ අප කැටුව ඉතා කුඩා ඇඳිරි, කිලිටි, තනි අශ්වයකුගේ කොටුවක් බඳු කාමරයකට ඇතුළු වූවාය. එහි වූ මැස්සක වැතිර සිටි තරබාරු ගැහැනියකට මිටින් ඇන්න මැහැල්ල මෙසේ තෙපලාය:

"නැගිටපිය, මුඩුම ගෑනියේ නැගිටල පල!"

බිය වූ ගැහැනිය වහාම නැගිට සිට දෑතින් දෙනෙත් පිස දමමින් විමසන්නට වූවාය.

"දෙවියනේ කවුද මේ? මොකක්ද මේ?"

"රහස් පොලීසියෙන් ආවා" යැයි ඕසිප් කිව්වේ දැඩි ගතියක් පාමිනි. ගැහැනිය සැණෙකින් අතුරුදහන් වූ

අතර, ඕසිප් ඇය දෙසට කෙළ පිඬක් ගසා මට මෙලෙස විස්තර කළේය.

"මුන් යකුන්ට තරම්ම රහස් පොලීසියට බයයි."

බිත්තියේ එල්ලා තිබූ කුඩා කණ්ණාඩියක් ගැලවූ මැහැල්ල බිත්ති කඩදාසියක් මෑත් කොට ඕසිප්ට එම සිදුරෙන් එබී බලන ලෙස කිව්වාය.

"බලාපන් නුඹ සොයන්නේ ඒ මිනිහවද?"

ඕසිප් පිළිතුරු දුන්නේ සිදුරෙන් එබී බලමිනි.

"ඒකා තමයි. ඔහු ළඟ ඉන්න කෙල්ලව එළවාපන්!"

මම සිදුරෙන් බැලීමි. අප පැමිණි කාමරය මෙන්ම, ඉතා කුඩා කාමරයක ජනෙල් දොර වසා ඇත. ජනෙල් පඩිය මත දැල්වෙන භූමි තෙල් කුප්පි ලාම්පුවකි. එය අසලින් නිරුවතින් සිටගත් සිහින් දෙනෙත් ඇති තතාර් ජාතික තරුණ ගැහැනියක් කමිසයක් මසයි. ඇයට පසුපසින් කොට්ට දෙකක් සහිත ඇඳක වැතිර සිටින අර්දල්යොන්ගේ ඉදිමුණු මුහුණත්, අවුල්වූ යටි රැවුළත් උඩට නෙරා ඇති සැටි මම දුටිමි. තතාර් ගැහැනිය තිගැස්සී, කමිසය හැඳ ගෙන ඇඳ අසලින් ගොස් සැණෙකින් අප සිටින තැනට පැමිණියාය.

ඕසිප් ඇය දෙස බලා යළිත් කෙළ පිඬක් ගසා බැණ වැදුණේය.

"ලජ්ජා නැති ගැනි..."

"ඔයා තමයි නාකි මෝඩයා!" තතාර් ගැහැනිය කිව්වේ සිනා පාමිනි.

ඕසිප්ද සිනාසෙමින් ඇඟිල්ලක් ඔසවා ඇයට තර්ජනය කළේය.

අපි තතාර් ගැහැනියගේ කාමරයට පිවිසියෙමු. ඕසිප් අර්දල්යොන්ගේ දෙපා අසල, ඇඳ මත වාඩි වී, බොහෝ වේලාවක් තිස්සේ ඔහු කුද්දන්නට විය.

"හිටපිය, පොඩ්ඩක් හිටපිය! යමු!" යි නිදිමතින් සිටි අර්දල්යොන් පැවසීය.

අවසානයේදී අවදි වූ ඔහු ඕසිප් දෙස බැලුවේ අති මහත් විමතියෙනි. ඔහු මා දෙසත් බලා රතු පැහැති නෙත් වසා ගනිමින් කතා කළේය.

"ඉතින්, ඉතින්..."

"මේකේ තේරුම මොකක්ද?" ඕසිප් ප්‍රශ්න කළේ සන්සුන් ලෙස සහ දොස් නඟමින් නොවූවද, එහි සතුටක් නම් නොවීය.

"පිස්සු නැටුවා!" යැයි අර්දල්යොන් කියුවේ බැරැඩ් කට හඬකින් කහිමිනි.

"හේතුව කුමක්ද?"

"හේතුවක් නැහැ. නිකම්..."

"හිතේ අමාරුවට වගෙයි..."

"සතුටු වීමට හේතුවක් නැහැ" යි අර්දල්යොන් එකඟ විය.

අනතුරුව ඔහු මේසය මත තිබුණු බ්‍රැන්ඩි බෝතලය අතට ගෙන එය කටේ තබා ගෙන උගුරු කීපයක් බී, ඕසිප්ට ටොඩිකා බීමට යෝජනා කළේය.

"බොනවද? මෙතන කට ගැස්මට මොනවා හරි තියෙන්න ඕන..."

මහල්ලාත් ටොඩිකා උගුරු කීපයක් බී, අවධානයෙන් යුතුව පාන් කෑල්ලක් සපන්නට විය. අර්දල්යොන් කතා කළේ ඈලි මැළි ගතියෙකිනි.

"ඔන්න මම තතාර් කෙල්ල එක්ක නිදාගන්නවා. යෙපීමුෂ්කා තමයි මෙය ජෝඩු කළේ. මේකි තරුණයි. දෙමාපියන් නැති අනාත කෙල්ලක්, කසීමව්වල ඉඳලා සල්පිලට එන්න ලෑස්ති වෙලා හිටියා."

එවිට බිත්තිය එහි සිටි තරුණිය සිනහ උපද්දවන බිඳුණු බසින් කතා කරන්නට වූවාය.

"තතාර් කෙල්ල අරිම ඔදයි, තරුණ කිකිළියක් වගෙයි. ඔය මිනිහව එළවාපන්. ඔය මූනියා නුම්බේ තාත්තා නොවෙයි..."

"ඔය කෙකර ගාන්නේ ඒක තමයි." අර්දල්යොන් කිව්වේ අපැහැදිලි ලෙස බිත්තිය දෙස බලමිනි.

"මම ඒකිව දැක්කා..." ඕසිප් පැවසීය.

අර්දල්යොන් මා දෙස බලා කතා කළේය.

"ඔන්න බලාපන් මල්ලී මගේ හැටි!"

දැන්, දැන් ඕසිප් අර්දල්යොන්ට බැණ වැදීමටත්, උවදෙස් දීමටත් පටන් ගනිතියි මා සිතුවද, එවැන්නක් නොවූ අතර, ඔහු කුළුටි ගතියෙන් පසුවිය. දෙදෙනා

කුලුපගව, උරෙන් උර ගැටී වාඩි වී ඉතා සන්සුන් ලෙස කෙටි වචන හුවමාරු කර ගනිමින් කතා කළහ. ඒ ඇදිරි, කිලිටි කුටියෙහි ඔවුන් දෙස බැලීම දොම්නස උපදවන දර්ශනයක් විය. තතාර් ජාතික තරුණිය සිදුරෙන් බලා සිනා උපදවන වචන කිව්වද, ඔවුහු එය ගණන් නොගත්හ. ඕසිප් මේසය මත තිබුණු වෝඛ්ලා කරවල කුරියකු ගෙන එය සපත්තුවට ගසා බුරුල් කර ගෙන සෙමින් කෑලි ගලවමින් ඔහුගෙන් ප්‍රශ්න කළේය.

"සල්ලි ඔක්කොම ඉවරද?"

"ප්‍යොතර් ළඟ මගේ සල්ලි ටිකක් තියෙනවා."

"බලාපන් නුඹට මෙතැනින් ගොඩ එන්න පුළුවන්ද? නුඹට ටොම්ස්ක්වලට යන්න ඕන නේද?"

"මොන ටොම්ස්ක්ද?"

"නොයන්න තීරණය කළාද?"

"මට කරපු ආරාධනයක් නැහැ."

"ඇයි මොකක්ද?"

"නංගී ඉන්නවා. බෑනා ඉන්නවයි කිව්වේ."

"ඉතින්"

"තමුන්ගේ එවුන් යටතේ වැඩ කරන්න හිතක් නැහැ."

"ලොක්කා හැම තැනම එක වගෙයි."

"කොහොම වුණත්"

ඔවුන් මිතුරු ලීලාවෙන් බැරෑරුම් ලෙස කතා කළ නිසා තතාර් ගැහැනිය ඔවුනට විසුළු කිරීම නවත්වා කාමරයට නිහඬව විත් ගවුම රැගෙන අතුරුදහන් වූවාය.

"ඒකි තරුණයි" ඕසිප් කිව්වේය.

අර්දල්යොන් ඇය දෙස මන්දෝත්සාහී ලෙස බලා මෙසේ පැවසීය:

"මේ සියල්ල කළේ යෙපීමුෂ්කා. ඒකා ගෑනුන් ඇරුණාම වෙන කිසිවක් ගැන දන්නෙ නැහැ. මේ තතාර් කෙල්ල ප්‍රීතියෙන් ඉන්නවා. මෝඩ විහිළු කරනවා."

"බලාගෙන නුඹට ගොඩ එන්න බැරිව යාවි."

ඕසිප් ඔහුට අනතුරු ඇඟවීය. වෝඛ්ලා කරවල කුරියා කෑල්ලෙන් කෑල්ල කඩා ගෙන කා දැමූ, ඕසිප් අර්දල්යොන්ගෙන් සමු ගත්තේය.

ගෙදර යන ගමන් මම ඕසිප්ගෙන් විමසන්නට වීමි.

"ඕසිප් එයා හමුවීමට ගියේ මොකටද?"

"නිකම් බලන්න ගියා. මම මිනිහව අඳුනනවා නොවැ. මම ඔය වගේ සිද්ධීන් බොහොම දැකලා තියෙනවා. මිනිහෙක් ජීවත් වෙනවා. වැඩ කරනවා, ඔන්න හිටි හැටියේම එයාගේ ඇඟ ඇතුළේ ඉන්න යක්ෂයා එළියට පනිනවා." යැයි කී ඕසිප් මීට පෙර කී අදහස් යළිත් වරක් ඉදිරිපත් කළේය. "වොඩ්කා බීමෙන් වැළකී ඉන්න ඕන."

එහෙත්, විනාඩියකට පසු ඔහු මෙසේද එකතු කළේය.

"ඒ වුණාට ඒක නැතුව ඉන්න හරි අමාරුයි!"

"වොඩ්කා නැතුවද?"

"ඔව්. ඇත්තටම. අඩි තුන හතරක් ගැහුවම වෙනත් ලෝකයක ගමන් කරනවා වගේ...."

අර්දල්යොන්ට ගොඩ එන්නට නොහැකි විය. දවස් කීපයකට පසුව ඔහු වැඩට පැමිණියද, යළිත් ඉක්මනින්ම ඔහු අතුරුදහන් විය. ඊළඟ වසන්තයේදී ඔහු පාදඩයන් අතර සිටින සැටි මම දුටිමි. ඔහු විශාල පාරුවක් වටා තිබුණු අයිස් තට්ටු බිඳ දමමින් සිටියේය. අප දෙදෙනාගේ හමුවීම සුහදත්වයක් දැරුවෙන් අපි තේ බීමට ගියෙමු. ඔහු එහිදී වහසි බස් දොඩවන්නට විය.

"මම කොහොම වැඩකාරයෙක්ව හිටියද කියල නුඹට මතකද? ඇත්ත කියන්නම්, මේසන් වැඩට මම විජ්ජා කාරයෙක් වගේ! සිය ගණනක් වුණත් හම්බ කරන්න පුළුවන්..."

"ඒ වුණාට හම්බ කළේ නැහැ."

ඔව්, හම්බ කළේ නැහැ. යන යකාට ගියාවේ" යැයි ඔහු කෑ ගැසුවේ ආඩම්බරයෙකිනි.

ඔහු හඬ නඟා කතා කරමින් දෑත් වනමින් හැසුරුණෙන්, තේ කඩේ සිටියහු ඔහුගේ කතාවට අවධානයෙන් සවන් දුන්හ.

"අර පල්හොරා කියපු කතාව නුඹට මතකයි නේද? වෙන මිනිසුන්ට ගලින් බැඳපු ගෙවල්. මට ලීයෙන් හදාපු මිනී පෙට්ටියක්. ඔන්න අපේ වැඩවල හැටි!"

"ප්යොතර් අසනීපෙන්, මැරෙන්න බයේ ඉන්නවා." යැයි මම ඔහුට කිව්වෙමි.

එහෙත්, අර්දල්යොන් කෑ ගැසීය.

"මාත් රෝගියෙක්. මගේ ආත්මයත් වධ විඳිනවා."

උත්සව දවස්වලදී මම නගරයේ සිට මිලියොන්නායා වීදියට යාමට පුරුදුව සිටිමි. අර්දල්යොන්, එහි වාසය කළ පාදඩයන් සමඟ එකතු වී ඔවුන්ගේ "ස්වර්ණ සේනාංකයේ" පිළිගත් මිනිහකු බවට පත්වී සිටින සැටි මම දුටිමි. මීට වසරකට පෙර ප්‍රීතිමත් සහ බැරෑරුම් මිනිහකුව සිටි අර්දල්යොන් දැන් කෑ කෝ ගසන, පැද්දෙමින් ගමන් කරන, මිනිසුන් සමඟ වාද විවාද කිරීමට සහ ඔවුන් සමඟ කලහ කිරීමට සූදානම්, ඔවුනට අභියෝග කරන නිතරම පුරසාරම් දොඩවන්නකු බවට පත් විය.

"නුඹ බලාපන් මාව මිනිසුන් පිළිගන්නා හැටි. මම හරියට උන්ගෙ නායකයා වගේ."

ශ්‍රමය වැය කොට හම්බ කළ මුදල් නිර්ලෝභී ලෙස පාදඩයන්ට වියදම් කළ ඔහු, ගුටි කෙළිවලදී නිතරම දුබලයාගේ පැත්ත ගෙන උවදෙස් දෙන්නට පටන් ගත්තේය.

"කොල්ලනේ ඒක හරි නැහැ! හරි විදිහට නියම ලෙස ක්‍රියා කරන්න ඕන."

ඔහුගේ මේ කතාව නිසා ඔහු 'නියම මිනිහා' යන නමින් හැඳින් විණි. එයින් අර්දල්යොන්ගේ සිත සතුටට පත්විය.

ගලින් සෑදූ මේ පැරණි දූලි සහිත වීදියේ රොක්වී සිටින මිනිසුන් දෙස මා බැලුවේ සානුකම්පිත සිතකිනි. ඔවුන්ගේ ජීවිත පොදු ප්‍රවාහයෙන් කැඩී බිඳී ගියද, හාම්පුතුන් රහිත ප්‍රීතිමත්, ස්වාධීන ජීවිතයක් ඔවුහු ගොඩ නැඟුහ. වගකීම් රහිත, දක්ෂ මේ මිනිසුන් පල්හොරුන් සහ සිරකරුවන් බවට ලෙහෙසියෙන් පරිවර්තනය වූ සීයා කී බුර්ලාක්වරුන් පිළිබඳ කතා මට සිහි ගැන්විය. රැකියා නොමැති විට, ඔවුන් බිය සැක නැතිව පාරුවලින් සහ නැව්වලින් සොරකම් කිරීම මගේ අප්‍රසාදයට හේතු නොවීය. ලෝගුවක් මසා තිබෙන නූල් පටවල් මෙන් ඔවුන්ගේ මුළු මහත් ජීවිතයම හොරකමින් පිරී පවතින සැටි දුටු මා, ඒ අතරම මේ පාදඩයන් හදිසියෙන් බඩු බෑමේදී සහ පැටවීමේදීත්, ගිනි හටගත් වේලාවලදීත්, අයිස් තට්ටු පාවෙන විටදීත්, ඉතා දක්ෂ ලෙසත්, ඉමහත්

වුවමනාවෙකිනුත් වැඩ කරන සැටි මම දැක ඇත්තෙමි. පොදුවේ ගත් විට ඔවුහු අනික් අයට වඩා උත්සවාකාරී ලෙස ජීවත් වූහ.

එහෙත්, අර්දල්යොන් සහ මාත් අතර ඇති මිත්‍රත්වය දකින ඕසිප් මට පුතෙකුට මෙන් උවදෙස් දුන්නේය.

"ඔන්න මගේ හොඳ කොල්ලෝ, නුඹ මොකටද ඔය තරම් තදින් මිලියොන්නයා වීදිය දෙසට ඇදී යන්නෙ? පරෙස්සම් වෙයන්. එයින් නුඹට වරදක් සිදු වන්නට පුළුවනි."

ඒ මිනිසුන් මගේ සිත් ගෙන ඇති බවත්, ඔවුනට රැකියා නැති වුණද, ඔවුන් සතුටු සිතින් ජීවත් වන බවත් මට හැකි පමණින් මම ඔහුට විස්තර කළෙමි.

"උන් නිකම් අහසින් වැටිච්ච කුරුල්ලන් වගේ ජීවත් වන්නේ. උන් කම්මැළි පුහු මිනිස්සු හන්දා. උන් වැඩ කිරීම සලකන්නේ මහ දුකක් හැටියට." යැයි මගේ කතාවට බාධා කළ ඕසිප් පැවසීය.

"වැඩ කරනවයි කියන්නේ මොකක්ද? අවංකව වැඩ කරන එකාට මුදලුත් නැහැ, ප්‍රශංසාවත් නැහැයි කියල කට කතාවක් තියෙනවා නොවේද!"

මට එය ලෙහෙසියෙන් කිව හැකි වූයේ, මා ඒ ප්‍රස්තාව පිරුළ නිතර ඇසූ බැවිනි. එමෙන්ම, එහි ඇති සත්‍යතාව වැටහුණු බැවිනි. එහෙත්, ඕසිප් මා සමග උරණ වී මට කෑගැසීය.

"එහෙම කියන්නේ කවුද? මෝඩයොයි, කම්මැළියොයි, විතරයි. අනේ බලුපැටියො, නුඹට ඒවා ඇසීමට ඕන නැහැ. ඔය මෝඩ කතා කියන්නෙ අනුන්ට ඉරිසියා කරන උදවිය. අවාසනාවන්ත, කාලකණ්ණි. නුඹ ඉස්සෙල්ලා වටපිට බලාපන්. පස්සෙ කතා කරපන්. පාදඩයන් සමඟ නුඹේ ඇති මිත්‍රත්වය ගැන මම නුඹේ හාම්පුතාට දන්වන්නම්. නුඹ තරහ වෙන්න එපා!"

ඔහු එසේම හාම්පුතාට වාර්තා කළේය. හාම්පුතා ඕසිප් ඉදිරිපිට මට අවවාද කළේය.

"පෙෂ්කෝව්, නුඹ මිලියොන්නයා වීදියට යාම නවත්වාපන්! එතැන හොරු, ගණිකාවො, එතැනට යන අය ගිහින් නවතින්නෙ සිරගෙදරයි. ඉස්පිරිතාලෙයි. ඔය

වැඩේ නවත්වාපන්!"

මිලියොන්නයා වීදියට යාම මා හොරෙන් කළද, ඉක්මනින්ම එය අතහැර දැමීමට මට සිදුවිය.

රෑට නිදාගන්නා මඩුවක වහලය මත නැඟ සිටි අර්දල්යොන් සහ ඔහුගේ සගයකු වන රොබෙනොක් වරක් මම හමුවීමි. දොන් නදීබඩ රොස්තොව් නගරයේ සිට මොස්කව් දක්වා පා ගමනින් පැමිණි සැටි රොබෙනොක් විස්තර කළේ සිත් කා වදින ආකාරයකටය. සාර් රජුගේ ඉංජිනේරු භට හමුදාවේ සෙබළකු වූ ඔහු, ගියෝර්ගි පදක්කම් ලැබ සිටියෙකි. තුර්කි යුද්ධයේදී ඔහුගේ කකුලක දණ පොල්කටුව බිඳී ගියෙන් ඔහු නොණ්ඩි ගසයි. මිටි, පුළුල් උරතල සහිත මිනිහෙකු වූ ඔහුගේ දැත්වල ශක්තිය අති මහත් විය. නොණ්ඩියකු වූ ඔහුට වැඩ කළ නොහැකි වූ බැවින්, ඔහු සතු කායික ශක්තිය ඔහුට ප්‍රයෝජනවත් නොවීය. කිසියම් රෝගයක් නිසා ඔහුගේ හිසකේ හා මුහුණේ රැවුළු ගස් වැටුණෙන්, ඔහුගේ හිසත් මුහුණත් බිලිඳකු සිහි ගැන්වීය.

රතු පැහැති ඔහුගේ ඇස් දිලිසෙන්නට සලස්වමින් ඔහු කතා කළේය.

"ඔන්න ඉතින් සෙර්පුහොව් පූජකතුමා පුටුවේ වාඩි වෙලා ඉන්නවා. අනේ පියතුමනි, තුර්කි යුද්ධයේ වීරයකුට පිනට යමක් දෙන්න කියලා මම ඉල්ලා හිටියා.

"බොරු ඇදබාපන්." යැයි අර්දල්යොන් හිස වනමින් ඔහුගේ කතාවට බාධා කළේය.

"මම බොරු කියන්නෙ මොකටද?" රොබෙනොක් අමනාප නොවී ප්‍රශ්න කරයි. එවිට අර්දල්යොන් උවදෙස් දෙන ලීලාවෙන්, අලස ලෙස මෙසේ කියයි:

"නුඹේ ක්‍රියාව හරි නැහැ. නුඹ මුර වැඩක් ඉල්ලන්න ඕන. කකුල නොණ්ඩි අය හැමදාම මුර වැඩ තමයි කරන්නෙ. නුඹ තේරුමක් නැතිව රස්තියාදු වෙනවා. ඒ මදිවට බොරු කියනවා."

"මම බොරු කියන්නෙ හිනහවෙන්න, මිනිසුන්ව හිනස්සන්න..."

"නුඹ නුඹටම හිනාවෙයන්...."

එදින කාලගුණය වියළි එමෙන්ම, හිරු රැස් සහිත

වුවද, ගෙවත්ත ඇදිරිය. කිලිටිය. ගැහැනියක් ගෙවත්තට විත් කිසියම් ඇඳුමක් වනමින් කෑ ගැසුවාය.

"කවුද සායක් මිලදී ගන්නෙ? යෙහෙළියනේ..."

සැණෙකින් අවට ගෙවල්වල සිටි ගැහැනු ඇය වට කරගත්හ. මම ඇය වහාම හඳුනාගත්තෙමි, බිමට පැන්නෙමි. ඈ රෙදි සෝදන නතාලියාය. එහෙත්, පළමුවෙන්ම ඉල්ලූ ගැහැනියට සාය විකුණා දැමූ නතාලියා සෙමින්, සෙමින් ගෙවත්තෙන් ඉවතට පා තැබුවාය.

ගෙවත්තේ වැට අසලදී ඇයට ළං වූ මම ප්‍රීතියෙන් සුබ පැතීමි.

"ආයුබෝවන්!"

"ඉතින් ඊළඟට තවත් මොනවද කියන්නෙ?" නෙත් කොනින් බලා ඈ මගෙන් ප්‍රශ්න කළද, වහාම නැවතී කෝපයෙන් කෑ ගැසුවාය.

"දෙවියන්ගෙ පිහිටයි. නුඹ මෙතැන කරන්නෙ මොනවද?"

බියෙන් ඇය කළ කෑ ගැසීම නිසා මගේ හදවත ගැස්සුණු අතර, අනුකම්පාවක්ද ඇති විය. ඇය මා නිසා බිය වූ බව මම තේරුම් ගතිමි. ඇගේ බුද්ධිමත් මුහුණෙහි බිය සහ මවිතය පැහැදිලිව පෙනිණි. මා මෙම වීදියෙහි පදිංචි නැති බවත්, ඉඳහිට මෙය බැලීමට පැමිණෙන බවත් මම ඇයට හණිකට විස්තර කළෙමි.

"බලන්නද?" උපහාසාත්මක ලෙසත්, කෝපාන්විත ලෙසත් ඕ කෑ ගැසුවාය. "ඒ මොකද නුඹ බලන්නේ මොනවද? පාරෙ යන්නන්ගේ සාක්කුද? නැතිනම් ගෑනුන්ගේ හැට්ටද?"

ඇගේ මුහුණ තැළී, පොඩිවී තිබුණු අතර, දෙනෙත්වලට යටින් කළුවන් ලප මතුවී, දෙතොල් අප්‍රාණික වී තිබිණි.

තේ කඩයේ දොර අසල නැවතී ඈ මට කතා කළාය. "යමු, මම නුඹට තේ අරන් දෙන්නම්! නුඹ පිරිසිදුවට ඇඳලා ඉන්නවා. මේ වීදියේ අය වගේ නොවෙයි. නමුත් විශ්වාස කරන්න අමාරුයි!"

තේ කඩයේ වාඩි වූ පසුව ඈ මා විශ්වාස කළ බවක් පෙන්වමින්, මට තේ වක්කරමින්, මන්දෝත්සාහී ලෙස

කතා කරමින්, ඇය නින්දෙන් අවදි වූයේ මීට පැයකට පෙර බවත්, ඈ කිසිවක් කෑවේවත්, බිවුවේවත් නැති බවත් කිව්වාය.

"ඊයේ මම නිදාගත්තේ බොහොම බීලා, කණමදා වගේ බීලා. කොහෙදීද බීවේ, කාත් සමඟද බීවේ? කිසිවක් මතක නැහැ."

ඇය නිසා මසිතෙහි කනගාටුවක් උපන් අතර, ඇගේ දුව පිළිබඳ විස්තර ඇසීමට මම මැළි වීමි. එහෙත්, උණු තේ සමඟ වොඩ්කා මිශ්‍රකොට පානය කළ විගස ඈ ප්‍රබෝධයට පත් වූවා, ඒ වීදියේ පදිංචි අනික් ගැහැනුන් මෙන්ම, සාහසික ලෙසත් ගොරහැඩි ලෙසත් කතා කරන්නට වූවාය. එහෙත්, මා ඇගේ දුව ගැන විමසූ වහාම ඈ ප්‍රකෘති සිහිය ලැබ කෑ ගැසුවාය.

"ඒ ගැන දැන ගැනීමට නුඹට ඇති හේතුව මොකක්ද? අපොයි යාළුවා. නුඹට මගේ දුවව අල්ලන්න බැහැ."

තවත් වොඩ්කා පානය කොට ඈ කට මැත දොඩවන්නට වූවාය.

"මගේ දුවට මාත් සමඟ ඇති ගනුදෙනුවක් නැහැ. මම කවුද? රෙදි අපුල්ලන ගෑනියක්! මම ඒකිට අම්මා වෙන්නෙ කොහොමද? එයා දැන් උගත් ගෑනියක්. ඔන්න ඔහොමයි ළමයා කෙරුවාව! එයා මගෙන් වෙන්වෙලා සල්ලි තියෙන ගුරුවරියක් ළඟට ගියා වෙන්න ඕන..."

තරමක් නිහඬව සිට ඈ පහත් හඬින් ප්‍රශ්න කළාය.

"ඔන්න ඔහොමයි! රෙදි අපුල්ලන ගැහැනියක් ඕන නැත්ද? ගණිකාවක් ඕනද?"

ඈ ගණිකාවක් වී සිටින සැටි මම සත්තකින්ම එකවර දැනගතිමි. මන්දයත්, ඒ වීදියේ වෙනත් ගැහැනුන් නොසිටි බැවිනි. එහෙත්, ඈ ඇගේ කටින්ම මට ඒ ගැන කී විට, ලජ්ජාව හා අනුකම්පාව නිසා මගේ දෙනෙත් කඳුළින් පිරිණි. මෑතක් දක්වාම ඈ ස්වාධීන, නිවහල් නිර්භය බුද්ධිමත් කාන්තාවක්ව සිටි බව දැන සිටි මගේ හෘදය සාක්ෂිය එයින් ගිනි ගත් කලෙක මෙන් විය.

"අනේ බාං!" යැයි ඈ කිව්වේ මා දෙස බලා සුසුම් ලමිනි. "මෙතැනින් පලයන් යන්න. නුඹට මම කියනවා වහාම පිටවෙයන් කියලා. නැතිනම් නුඹ අමාරුවේ

වැටේවි."

ඉනික්බිතිව, ඈ තමාටම කතා කරන විටෙක මෙන්, වචනයෙන් වචනය වෙන් කරමින්, හිස මේසයට හරවා ගෙන ඇඟිල්ලකින් බන්දේසිය මත අදිමින් දොඩවන්නට වූවාය.

"මගේ ඉල්ලීම සහ උපදෙස් නුඹට මොකටද? මගේ කුසින් උපන් දුව මගේ කීම ඇහුවේ නැති විට? මම ඒකිට මෙහෙම කිව්වා. නුඹව වදාපු නුඹේ අම්මාව නුඹ එළවා දමනවද? ඒකට කමක් නැහැ කියල ඒකි කිව්වා. වින්නඹු අම්මා කෙනෙකු වීමට ඒකි කසාන් නගරයට ගියා. ඉතින් ඒක හොඳයි. හොඳයි... මා ගැන කොහොමද? මම මෙහෙම ජීවත් වෙනවාද? මම කාගේ ඇඟේ හේත්තු වෙන්නද? පාරේ යන එවුන් ඇඟේ...."

ඇය යම් කිසිවක් ගැන බොහෝ වේලාවක් කල්පනා කොට, ශබ්ද පිට නොවන සේ තොල් මතුරමින් සිටියේ මා ගැන අමතක කරමින් විය යුතුය. දෙතොල් දෙකොනින් පහත වැටුණේ ඇගේ කට දෑකැත්තක හැඩයක් මවා පාමිනි. ඇගේ දෙතොල් නිහඬව නැටවෙන සැටි දැකීම පවා සිත රිදවයි. ඇගේ මුහුණේ මතුවන රැලි ඇය නිහඬව යම් කිසිවක් පවසන බවක් කියයි. එවිට ඇගේ මුහුණ ළාමක අමනාපයක් පළ කළේය. නළලින් වැටුණු කෙස් රොදක් කම්මුල පහළට වැටී ඇගේ කුඩා කනට ළං ව රැලි ගැසී ඇත. ඇගේ ඇසින් ගලා ගිය කඳුළු කැට නිවුණු තේ සහිත කෝප්පයට වැටිණි. එය දුටු නතාලියා කෝප්පය පසෙකට ඇත් කොට දෙනෙත් වසාගත් විට, තවත් කඳුළු කැට දෙකක් වැටිණි. අනතුරුව ඈ දෙනෙත් ලේන්සුවෙන් පිසදමා ගත්තාය.

"මේ දර්ශනය නැරඹීමට තරම් ඉවසීමක් මට නොතිබුණෙන්, මම සෙමින් නැඟිට ඇගෙන් සමු ගත්තෙමි.

"ආයුබෝවන්. මම යන්නම්!"

"ආ පලයන්, යන යකාට පලයන්!" ඈ අතක් වනමින් කිව්වේ ඇයට මා ගැන අමතක වූවාක් මෙනි.

අර්දල්යොන් මාත් සමඟ ඉස්සන් ඇල්ලීමට යාමට සූදානම් වී සිටි නිසා මා ඔහු සොයමින් ගෙවත්තට ගියද ඔහු එහි නොසිටියේය. නතාලියා අරබයා වූ කතාව

ඔහුට කීමටද මට අවශ්‍ය විය. එහෙත්, අර්දල්යොන් සහ රොබෙනොක් වහල උඩ නොසිටියහ. වට වංගුවක් වැනි ගෙවත්තේ මා ඔවුන් සොයමින් ඇවිදින විට, ඒ පෙදෙසේ සාමාන්‍ය දෙයක් වූ කෑ කෝ ගැසීමක් හා පහර දීමක් ආරම්භ විය.

මා ගෙවත්තේ ගේට්ටුව ළඟට යත්ම, එයින් පිටවන නතාලියා මට හමුවිය. තුවාල වූ මුහුණ හිස බැඳි ලේන්සුවෙන් පිසදා ගනිමින්, අනික් අතින් අවුල් වූ හිස කෙස් හරිගස්සා ගනිමින්, වැට දිගේ ඈ ගමන් කළාය. ඇය පිටුපසින් අර්දල්යොන් සහ රොබෙනෙක් ගමන් ගත් අතර, ඔහු අර්දල්යොන්ට මෙසේ කියන සැටි ඇසිණි.

"ඒකිට තවත් එකක් ඇනපන්! ඇනපන්!

අර්දල්යොන් මීට මෙළවූ අතක් වනමින් ඇයට ළංවත්ම, ඈ පපුව ඉස්සරහට දමමින් ඔහු වෙතට හැරුණාය. ඇගේ දෙනෙත් ඇවිළෙන වෛරය නිසා දිලිසිණි.

"ඉඳා ගහපිය යකෝ!" ඈ ගුගුළාය.

මම වහාම අර්දල්යොන්ගේ අතේ එල්ලුණෙමි. ඔහු මවිතයට පත්ව මා දෙස බැලීය.

"නුඹට මක්වෙලාද?"

"නුඹ ඇයට අත තියන්න එපා!" මා එසේ කියත්ම ඔහු හඬ නඟමින් සිනාසුණේය.

"ඒකි නුඹේ ආදරවන්තියද? නතාලියා වෙසඟන, මුගේ ආදරේ දිනාගෙන!"

රොබෙනොක් දෙපැත්තට තට්ටු කර ගනිමින් කොක් සන් දෙමින් සිනාසුණේය. ඒ දෙදෙනා කුණු ගොඩේ නටමින් මා අවඥාවට ලක් කරමින් මට මඩ ගැසූහ. එය ඉතා වේදනා ගෙන දෙන්නක් විය. ඔවුන් මෙලෙස හැසිරෙමින් යකා නටන්නට වූ අතර, නතාලියා ඔවුන්ගෙන් ඈත් වී ගියෙන්, මට ඔවුන්ගේ සරදම ඉවසා ගත නොහැකි ව හිසෙන් රොබෙනොක්ගේ පපුවට ඇන ඔහු බිම පෙරළා මම පැන දිව්වෙමි.

එදා සිට බොහෝ කලක් යන තුරු මිලියොන්නයා වීදිය දෙසට මා නොගියද, ගං තොටුපළේ පාරු පාලමේදී මට අර්දල්යොන් හමුවිය.

"නුඹ මෙච්චර කල් කොහෙ හිටියද?" ඔහු මගෙන්

ඇසුවේ සතුටකිනි.

ඔහු නතාලියාට පහර දීමත්, මට අවඥා සහගත ලෙස විහිළු කිරීමත් නිසා මා ඉතා තදින් කලකිරුණු බව ඔහුට කී විට, ඔහු සුහද සිතින් සිනාසෙන්නට විය.

"එහෙම කළේ බැරෑරුම් ලෙසද? අපි නුඹට මඩ ගැහුවෙ විහිළුවට! ඒ ගෑනිට ගැහුවට තියෙන වරද මොකක්ද? ඒකි වේසියක් නොවේද? කසාද ගෑනිට ගහනකොට අනුන්ට ඇති රුදාව කුමක්ද? මේ සියල්ලම විනෝදයට කරපු වැඩ. මට තේරුම් ගන්න පුළුවන්. අතින් පයින් ගුටි ඇනීම පාඩමක් නොවෙයි."

"ඒ ගෑනිට උගැන්වීමට නුඹට තියෙන අයිතිය කුමක්ද? නුඹ එයාට වැඩිය හොඳද?"

ඔහු මගේ උරහිස් බදාගෙන සොලවා උපහාසාත්මක ලෙස මෙසේ පැවසීය:

"අපේ මේ නීච ජීවිතයෙහි එකෙක් අනිකාට වඩා උසස් නොවේ, මල්ලී මට තේරුම් ගන්න පුළුවන්. මතුපිටත්, ඇතුළතත් මට තේරුම් ගත හැකියි. මම ගමයෙක් නොවෙයි."

ඔහු තරමක් මත්පැන් පානය කර සිටියෙන්, ඔහු මා දෙස බැලුවේ මෝඩ සිසුවකු දෙස බලන ගුණවත් ගුරුවරයකුගේ සුරතල් බැල්මෙකිනි.

"ඉඳහිට ඉකෝන චිත්‍ර අඳින පාවෙල් ඔදින්ට්සොව් මට හමුවිය. ඔහු වඩාත් වැඩියෙන් පොර කුකුළකු මෙන් හැසිරෙන්නට වූ අතර, වඩාත් ජේත්තු ලෙස ඇඳුම් අඳින්නටද විය. ඔහු මට කතා කළේත් අනුකම්පා සහගත ලෙසින් සහ දොස් පවරන ලීලාවෙනි.

"නුඹ හොයාගත්තු රස්සාවක හැටි බලාපන්, උන් මෝඩ ගමයො..."

අනතුරුව ඔහු දොම්නසින් යුතුව, චිත්‍රාගාරයේ වැඩ ගැන මට විස්තර කළේය.

"ෂිහර්යොව් අර එළදෙනත් එක්ක තවමත් නිදා ගන්නවා. සිතානව් හිතේ දුකින් පසුවෙනවා වෙන්ට ඕන. ඔහු වැඩියෙන් බොන්න පටන් අරගෙන, ගෝගලෙව්ව වෘකයෝ කාලා දැම්මා. මංගල්ලෙ දවසෙ ඔහු ගෙදර ගියේ හොඳටම බීගෙන. අතරමඟ දී වෘකයෝ මිනිහව

අල්ලාගෙන කා දමලා.

පාවෙල් මහ හඬින් සිනාසෙමින්, විහිළු කතා කියන්නට විය.

"උන් ගෝගලයාව කාපු හැටියෙම උනුත් වෙරි වෙලා. ඉතින් වෙරිවෙච්ච වෘකයෝ දෙපසින් යන්න පටන් අරගෙන, හරියට පණ්ඩිත බල්ලෝ වගේ. උන් වෙරි මරගාතේ හූ තියලා පහුවදා මැරිලා ගිහින්..."

ඔහුගේ කතාව අසා මාත් සිනාසීමට පටන් ගත්තද, චිත්‍රාගාරයත්, එහි වැඩ කටයුතුත් මගෙන් බොහෝ ඈත් වී තිබෙන බව මට දැනෙන්නට විය.

XIX

හිම සමයේදී සල්පිලේ වැඩ සම්පූර්ණයෙන්ම පාහේ නතර වූයෙන්, පෙර මෙන්ම, සුළු වැඩ ගොඩක් කිරීමට මට සිදුවිය. මේ වැඩ සඳහා මුළු දිවා කාලය ගෙවී ගියද, හවස් කාලවලදී වැඩක් නොතිබූ නිසා මම බෙහෙවින්ම අකැමැති 'නිවා' සඟරාවේ සහ 'මොස්කව්ස්කි ලිස්තොක්' පුවත්පතේ නවකතා හාම්පුතාටත්, ඔහුගේ බිරිඳට සහ මහලු මවුටත් කියවන්නට වීමි. රාත්‍රී කාලවලදී මා තෝරා ගත් හොඳ පොත් කියවීමට ඉඩ කඩ ලබාගැනීමට මට හැකි විය.

දවසක් දා හවස දේව මෙහෙයට ගැහැනුන් ගියද, හාම්පුතා නොගියේ ඔහු අසනීපයෙන් සිටි බැවිනි.

"පෙෂ්කෝව් නුඹ කවි ලියන්න පටන් අරගෙනැයි කියලා වික්තර් විහිළු කරනවා. ඒක ඇත්තද? ඉතින් නුඹ ලියාපු කවි මට කියවාපන්." යැයි හේ මට කිව්වේය.

එය මට අපහසුවක් ගෙන දුන් නමුදු, මම කවි පන්ති කීපයක් කියැවූවෙමි. මගේ පබැඳුම් ඔහුගේ සිත් නොගත්තා විය යුතුය. කෙසේ වුවද, ඔහු මා අස්වසාලීය.

"ලියාපන්, ලියාපන්, සමහර විට නුඹත් පුෂ්කින් කෙනෙකු වේවි. පුෂ්කින්ගේ කවි කියවා තියෙනවද?

අවමඟුල ගෙවලයාගේද?
දීග දෙන්නේ යකින්නියවද?

ඔන්න ඒ කාලෙදි ගෙවල යකුන් ගැන විශ්වාස කළා.

නමුත්, පුෂ්කින් විශ්වාස කළේ නැහැ. උන්ට විහිළු කළා විතරයි."

"ඔව් මල්ලියේ. නුඹට හොඳ අධ්‍යාපනයක් ලබා දිය යුතුව තිබුණා. දැන් ඉතින් පමා වුණා වැඩියි. නුඹ කොහොම ජීවත් වෙයිද කියල දන්නෙ මොන යකාද? නුඹේ කවි පොත හොඳට හංගාපන්. නැතිනම් ගෑනු ඒක හොයා ගත්තොත් නුඹට හිනා වේවි. ගෑනු, පිරිමින් අමනාප කිරීමට උපන් එවුන්..."

ටික කලෙක සිට හාම්පුතා නිහඬව කල්පනාකාරී වූ අතර, බියෙන් මෙන් වටපිට බලන්නට විය. ගෙදර සීනුව නාද වීම පවා ඔහුගේ බියට හේතු විය. සමහරදාට පුහු දේ නිසා ඔහු කිපුණේ බියජනක ලෙසිනි. ඔහු හැම දෙනාටම බැණ වදිමින් ගෙදරින් පිටවී ගොස් යළි පැමිණියේ රෑ බෝ වූ පසුවය. ඔහු පමණක් දත්, අන් අය නොදත් කිසියම් වෙනසක් ඔහුගේ ජීවිතයේ සිදුවී තිබෙන සැටියෙකි. ඔහුගේ හදවත දුබල වූවාක් මෙනි. දැන් ඔහු ජීවත් වූයේ විශ්වාසයෙන් තොරවය. වුවමනාවෙකින් නොව, ඇබ්බැහි වූ පුරුද්ද නිසාය.

උත්සව දවස්වලදී දිවා ආහාරයෙන් ඉක්බිතිව ඔහු රාත්‍රී නවය වන තුරු ඇවිදීමට ගියේය. හවස් කාලය ඔහු ගත කළේ යාම්ස්ක්යා වීදියේ තැබෑරුමේය. නිතර දහදියෙන් තෙමී සිටි, තරබාරු තැබෑරුම්හිමියා ගීතිකා ගායනය ඇසීමට අති මහත් ආසාවක් දැක්වූවෙකි. දේවස්ථානවල ගීතිකා ගයන මිනිසුන් මෙය දැන සිටියෙන්, ඔවුහු නිතර මේ තැබෑරුමේ රැස්වූහ. තැබෑරුම් හිමියා ඔවුනට වොඩ්කා, බීර සහ තේවලින් සංග්‍රහ කළේය. මේ ගායකයෝ බේබද්දෝය. මන්දෝත්සාහි ගති ඇත්තෝය. ඔවුන් ගායනය කළේත් වැඩි කැමැත්තකින් නොවේ. සංග්‍රහය බලාපෙරොත්තුවෙන් පමණකි. පල්ලියෙහි ගයන ගීතිකා පමණකි, ඔවුන් ගායනය කළේ. තැබෑරුම ඔවුනට සුදුසු ස්ථානයක් නොවන බව ඔවුන් සිතූ නිසා, තැබෑරුම්හිමියා ඔවුන් ඔහුගේ කාමරයට ආරාධනය කළේය. ඔවුන්ගේ ගායනය මට ඇසීමට හැකිවූයේ දොර හිඩැස්ස අතරින් පමණකි. නිතර ගම්වලින් පැමිණි මුෂිකයෝද, ශිල්පියෝද ගායනය කළහ. තැබෑරුම් හිමියාද

නගරය පුරා ගොස් ගායකයන් සොයන්නට විය. සල්පිල පැවැත්වෙන දිනවලදී ගම්වලින් පැමිණෙන ගොවීන්ගෙන් ගායකයන් ගැන තොරතුරු අසන තැබෑරුම් හිමියා ඔවුනට ආරාධනය කළේය.

සිරිතක් වශයෙන් ගායකයා වාඩිවූයේ වොඩ්කා පිරි පීප්පය අසල වූ බංකු පුටුවේය. එවිට ඔහුගේ හිසට, වොඩ්කා පීප්පයේ අඩිය සහිත කොටස පසුතලය බවට පත්වෙයි. එය ඔහුගේ හිස වටේට ඇති වටකුරු රාමුවක් මෙනි.

අන් හැමටම වඩා, විශේෂ හොඳ ගීත ගායනය කළේ මිටි, කෙට්ටු ක්ලෙෂොච්ය. හේ සම්පටි සාදන්නෙකි. පොඩිවුණු ඇඳුම්ද, කැඩුණු දත්ද, ලඩ ගැසුණු රතුවන් හිසකේද සහිත ඔහුගේ නහය දිලිසුණේ මළ එකකුගේ මෙනි. ඔහුගේ නිදිබර කුඩා දෙනෙත් අචලය.

ඔහු වොඩ්කා පීප්පයේ අඩියට හිස තබාගෙන, විජයග්‍රාහී සිහින් කට හඬෙකින් තාලය අල්ලා හුස්ම ඉහළට ඇද ගෙන වචන ඉක්මනින් ගයයි.

පිරිසුදු මිහිතලය මීදුම සිප ගත්තා.
ඈත මංමාවත් ඉන් වැසී ගියා...

එතැනදී ඔහු නැඟිට සිට දෑත් දෙපැත්තේ තබා ගෙන තරමක් පස්සට වාරුවී, හිස උඩට හරවා ගෙන, හෘදයංගම ලෙස ගායනය ඇරඹීය.

අහෝ, මම යන්නේ කොහිද, යන්නේ කොහිද?
යායුතු මඟට වැටෙන්නේ කවදාද?

ඔහුගේ කටහඬ බලවත් නොවූවද, විඩාපත් නොවීය. ඔහු තැබෑරුම පුරා ඔහුගේ රිදීමය ගීත නාදය පතුරුවා හැරියේය. තාලයට උචිත ලෙස ඔහු කියන ශෝකාන්විත වචනද, සුසුම් ලෑම්ද, කෑගැසීම්ද එහි වූ සියලු මිනිසුන් වශී කළේය. වෙරිමත් වූවෝ පවා මවිතව බැරෑරුම් වෙස් මවාගෙන තමන් ඉදිරියෙහි ඇති මේසය දෙස පමණක් බලන්නට වූහ. මගේ හදවත වේදනාවෙන් හැකිළිණි. උසස්, යහපත් සංගීතය පුදුමාකාර ලෙස අධ්‍යාත්මයෙහි ගැඹුරට වැද, පුබුදුවාලන පරිදි එම ගීතය මසිත පුරවාලීය.

තැබෑරුම දේවස්ථානයක් මෙන් නිහඬ ස්ථානයක් බවට පරිවර්තනය විය. දැන් ගායකයා සද්ගුණවත් පූජකයකුගේ ස්ථානය ගෙන සිටී. ඔහු ආගම දේශනා නොකරයි. මුළු මහත් ජනතාව සඳහා ඔහු අවංක ලෙසත්, හෘදයංගම ලෙසත් යාච්ඤා කරයි. දුප්පත් මිනිස් සංහතියේ සියලු දුක් කරදර ගැන ඔහු අවංකව හඬ නඟා කල්පනා කරයි. යටි රැවුළු වවා ගත්තෝ ඔහු දෙස හැම දෙසින්ම බලති. ඔවුන්ගේ තිරිසන් මුහුණුවල ඇති ළමා නෙත් බබළයි. කිසිවෙක් හිටිහැටියේ සුසුම් ලති. එයින් ගීතයේ ජයග්‍රාහී ශක්තිය අවධාරණය වෙයි. එවන් මොහොතකදී මට වැටහෙන්නේ සියලු මිනිසුන් ව්‍යාජ, සිතින් මවාගත් ජීවිතයක් ගත කරන බවකි. සැබෑ මිනිස් ජීවිතය ගීතමය ලෝකය විවෘත කළ ජීවිතය වේ.

තරබාරු විශාල මුහුණකින් යුත් වෙළෙන්දියක වන ලිසුහා මුල්ලක වාඩිවී සිටී. ඈ කලහකාරියකි. ලජ්ජා රහිත ගණිකාවකි. තෙල් බේරුණු උරහිසක් මත මුහුණ තබාගෙන ඈ සුසුම්ලයි. ඇගේ අහංකාර දෙනෙත්වල කඳුළු පිරිලාය. මට ඈතින් වාඩිවී සිටින්නේ ඔක්තාවිස්තයකු[1] වන මූසල මිත්‍රපෝල්ස්කි, මවිල්වලින් ගහන තරුණයකු වූ ඔහු පදවියෙන් අස් කළ අන්නවිරාල කෙනෙකුට සමානය. වෙරිමත් ඔහුගේ මුහුණේ දෙනෙත් විශාලය. ඔහු ඉදිරිපිට ඇති වොඩ්කා වීදුරුව දෙස බලන ඔහු, එය ගෙන පානය කිරීමට සැරසුණද, එසේ නොකර ආපසු වීදුරුව මේසය මත නිහඬව තබයි. යම් කිසි හේතුවක් නිසා ඔහුට එය පානය කළ නොහැකිය.

තමන් ඉතා අගය කරන, තමනට ඉතා සමීප අමතක වූ දෙයක් යළිත් අසන විටෙක මෙන් තැබෑරුමේ මිනිස්සු නිහඬව ගල් ගැහී සිටිති.

ක්ලෙෂොව් ගායනය අවසන් කොට නිහතමානී ලෙස පුටුවේ වාඩි වෙත්ම, තැබෑරුම්හිමියා ඔහුට වොඩ්කා වීදුරුවක් වක්කොට පිළිගන්වමින්, තෘප්තිය මුසු මඳ සිනාවෙකින් මෙසේ පැවසීය:

"ඔව්, සත්තකින්ම හොඳයි. නුඹ ගයනවට වැඩි කතාවක්

1 අටදෙනෙකුගේ සමූහ කණ්ඩායමක ගායකයා. ඉතා බැරෑරුම් හඬක් ඇති ගායකයා යන අරුත් දෙයි. -අනුවාදක

කියනවා. හැබැයි නුඹ ඒ කතාව කීමට උපන් පුතෙක්. ඒ ගැන සැකයක් නැහැ. ඒ බොහොම ඉස්තරම් කලාවක්..."

ක්ලෙෂොව් කලබල නොවී වොඩ්කා පානය කරමින්, පරෙස්සෙමින් උගුර පාදාගෙන, සෙමින් කතා කළේය.

"කටහඬ තියෙනව නම් කාටත් ගායනය කළ හැකියි. ගීතයේ සැඟවී තිබෙන ආත්මය පෙන්වන්න පුළුවන් කාටද. ඒ වරම තියෙන්නෙ මට විතරයි."

"ඒ වුණාට නුඹ පුරසාරම් දොඩවන්න එපා!"

"නැති එකාට පුරසාරම් කියන්ට බැහැ නොවැ." ගායකයා පහත් හඬින් නමුදු, මුරණ්ඩු ලෙස කිව්වේය.

"නුඹ අහංකාර මිනිහා, ක්ලෙෂොව්" තැබෑරුම අයිතිකරුවා කිව්වේ දොම්නසිනි.

"ආත්මයට වැඩියෙ ඉහළින් අහංකාර වෙන්න බැහැ නොවැ."

මුල්ලේ වාඩි වී සිටි ඔක්තවිස්තයා ගොරවන්නට විය.

ඒයි, අඬු කැඩිච්ච දේවදූතයා. පණුවා, පෙඳයා, නුඹ දන්න සංගීතයක් තියෙනවද?"

ඔහු හැමදාම හැම දෙනාටම විරුද්ධව තර්ක කරයි. හැම උත්සව දවසකදීම පාහේ ඔහුට මිනිස්සු එකතුවී පහර දුන්හ. එම පහර දීමට කැමැති හැම දෙනෙක්ම පාහේ එකතු වූවෝය.

තැබෑරුම්හිමියා ක්ලෙෂොව්ගේ ගීතවලට බෙහෙවින් ඇලුම් කළද, මිනිහකු හැටියට ඔහු පිළිකුල් කළේය. ඔහු හැම මිනිහකු වෙතම ගොස් ගායකයා අවඥාවට ලක් කරන ලෙසත්, ඔහු සිනහවට ලක් කරන ලෙසත් ඉල්ලා සිටියේය. නිතර තැබෑරුමට යන්නෝත්, ක්ලෙෂොව්ත් මෙය දැන සිටියහ.

"ගායනය හොඳයි. නමුත්, මිනිහා අහංකාරයි. ඔහුගෙ හිත රිදවන්න ඕනෑ" යැයි තැබෑරුම්හිමියා කියන විට සමහරු ඔහුත් සමඟ එකඟ වෙති.

"කතාව ඇත්ත. හාදයා උඩඟුයි."

"උඩඟුකමක් මොකටද? කටහඬ ලැබිලා තියෙන්නෙ දෙවියන්ගෙන්. එයා විහින් හදාගත් දෙයක් නොවෙයි. ඒ විතරක් නොවෙයි. එයාගෙ කටහඬ එතරම් ප්‍රබල නොවේ. එහෙම නේද?" තැබෑරුම්හිමියා මුරණ්ඩු ලෙස

කියා සිටී.

රුස්වූවෝ ඔහුගේ කතාවට එකඟ වෙති.

"ඇත්ත තමයි. මෙතන ප්‍රධාන දේ කටහඬ නොවෙයි. ගීත ගායනයේ දක්ෂතාවයි."

දවසක් දා ගායකයා උකටලී ලෙස තැබෑරුමෙන් ඉවත්ව ගිය විට, තැබෑරුම්හිමියා ලියුහා කැමැති කරවා ගැනීමට ඉදිරිපත් විය.

"මරියා යෙව්දකීම්නා නුඹ ක්ලෙෂොව්ට පොඩ්ඩක් ආදරය කරපන් හොඳද? නුඹට ඒක ලොකු වැඩක් නොවෙයි නේද?"

"අනේ, මම පොඩ්ඩක් තරුණ වී හිටියානම්." යැයි වෙළෙන්දිය සිනහපාමින් තෙපලාය.

එවිට තැබෑරුම්හිමියා උණුසුම් ලෙසත්, හඬ නඟාත් කෑ ගසන්නට විය.

"තරුණියන්ට පුළුවන් මොනවාද? නුඹ එයාව බාර ගනින්! එයාව නුඹ ළඟට ඇද ගනින්. අන්න එතකොට එයාගෙ හදවත දුකෙන් තැවෙන්න පටන් ගනීවි. අන්න එවිට එයා යසට ගායනය කරවි. අනේ ඒ වැඩේ බාර ගනින්. හොඳද? යෙව්දකීම්චිනා මම නුඹට ගෙවන්නම් හොඳද?

එහෙත්, ඒ ගැහැනිය ඒ වැඩේ බාර නොගත්තාය. නෑබුළු, තරබාරු ඈ දෙනෙත් පහත දමාගෙන පපුව වසා ඇති වැල්වට් තුවායට ඇඟිලිවලින් තට්ටු කරමින් ඒකතානමය ලෙසත්, කුසීත ලෙසත් මෙසේ තෙපලාය:

"ඔය වැඩේට තරුණ ගෑනියක් ඕන. මම තරුණ වෙලා හිටියා නම් කල්පනා නොකර ඔය වැඩේට මම ඉදිරිපත් වෙනවා."

හැමදාම පාහේ ක්ලෙෂොව්ට වොඩ්කා දී ඔහු වෙරි කරවීමට තැබෑරුම්හිමියා තැත් කළද, ගායකයා ගීත දෙක තුනක් ගයා එක්, එක් ගීතයකට වොඩ්කා වීදුරුවක් බැගින් පානය කොට, ගෙතූ වුලන් මප්ලරයකින් බෙල්ල ඉතා හොඳින් ඔතා ගෙන තොප්පිය හිස දමාගෙන පිට වී ගියේය.

ඉඳහිට තැබෑරුම්හිමියා ක්ලෙෂොව්ට විරුද්ධ තරගකරුවන් ඉදිරිපත් කිරීමට මහන්සි ගත්තේය.

ක්ලෙෂොව්ගේ ගායනයට තුති පුදන ඔහු කැලඹුණු හඬකින් මෙසේ කියයි:

"මෙන්න අද තවත් ගායකයෙක් ඇවිල්ලා. දැන් ඉතින් ඉදිරියට ඇවිත් දක්ෂතාව පෙන්වාපන්!"

මෙවැනි ගායකයෝ සමහර විට යහපත් කටහඬක් පෙන්වූහ. එහෙත්, ක්ලෙෂොව්ගේ තරගකාරී ගායකයෝ, මේ කුඩා අවලස්සන, ශිල්පියා තරම් සරල ලෙසත්, හෘදයංගම ලෙසත් කිසිදිනෙක ගායනා නොකළහ.

ඔව්, ඒක තමා, සත්තකින්ම ඒ ගායකයාගේ කටහඬ නම් හොඳයි. නමුත්, ඔහුගේ ආත්මය ගීතයෙන් දකින්න බැහැ..."

රැස්වූවෝ සිනාසුණෝය.

"නැහැ. හම්පටි සාදන්නාව පරදවන්න බැහැ."

ක්ලෙෂොව් ඔහුගේ රතුවන් බැම සඟළට යටින් බලමින්, සන්සුන් ලෙසත්, ආචාරශීලී ලෙසත් තැබෑරුම් හිමියා ඇමතීය.

"ඔබ නැළවෙනවා. මාව පරද්දන්න හැකි ගායකයකු සොයාගන්න බැහැ. මගේ දක්ෂතාව මට දෙවියන්ගෙන් ලැබුණු දෙයක්."

"අපි සියල්ලෝම දෙවියන්ගේ දරුවෝ!"

"වොඩ්කා නැති වුණොත්, හොයා ගැනීමට බැරුව යාවි."

තැබෑරුම්හිමියාගේ මුහුණ රතු වූ අතර, ඔහු මුමුනන්නට විය.

"දන්නෙ කවුද, දන්නෙ කොහොමද?..."

එහෙත්, ක්ලෙෂොව් දැඩි ලෙස තම මතය ඉදිරිපත් කරන්න විය.

"හොඳයි, ගායනය නිදසුනක් වශයෙන් කුකුළු පොරයක් නොවන බව මා ඔබට කිව්වොත්..."

"මම දන්නවා. නුඹ මොකද මගේ ඇඟේ එල්ලෙන්න හදන්නෙ..."

"මම එල්ලෙන්ට හදන්නෙ නැහැ. ගායනය විනෝදයක් නම් ඒක මදාවි අදහසක්. මම ඔප්පු කරන්න හැදුවේ ඒකයි."

"නුඹ ඔය මනස්ගාත අතහැරලා, තවත් සින්දුවක්

කියාපන්."

"ඕන වෙලාවකට, නින්දෙන් වුණත් ගායනය කිරීමට මට පුළුවනි."යි එකඟවන ක්ලෙෂොව් පරෙස්සෙමින් උගුර පාදා ගායනය ආරම්භ කළේය.

සියලු පුහු කතා සහ පුහු දේවල්. කැත වචන හා අදහස්, තැබෑරුමට අයත් ජඩ දේ සියල්ල අපූරු ලෙස අතුරුදහන් විය. හැම දෙනෙක්ම කල්පනාකාරී, පිවිතුරු, පවිත්‍ර, ආදරය සහ දොම්නස පිරි ලොවකට පිවිසුණහ.

මම ඒ මිනිසාට සුහද සිතින් ඊර්ෂ්‍යා කළෙමි. ඔහුගේ කුසලතාව නිසාත්, මිනිසුන් මත ඔහුගේ ඇති පාලනය නිසාත්, මසිතෙහි උපන්නේ ඊර්ෂ්‍යා පරවශ කෝපයෙකි. ගායකයා හඳුණා ගැනීමටත්, ඔහුත් සමඟ යම් යම් දේ ගැන බොහෝ වේලාවක් කතා කිරීමටත් මට ආසාවක් ඇති වුවද, ඔහු ඉදිරියට යාමට තරම් මට ධෛර්යයක් නොවීය. ක්ලෙෂොව් හැම දෙනාම දෙස බැලුවේ, ඔහු ඉදිරියේ සිටින කිසිවකු නොදකින විටෙක මෙන්, නෙත්වල සුදු ඉංගිරියාවලිනි. ඔහුට ඇලුම් කිරීමට බාධා කරන අප්‍රියජනක යමක් ඔහු තුළ තිබෙන සැටි මට පෙනිණි. ඔහු ගායනය කරන විට පමණක් නොව, පොදුවේ ඔහුට ඇලුම් කිරීමටය මගේ කැමැත්ත වූයේ. ඔහු මහල්ලකු සේ තොප්පිය හිස ලා ගන්නා සැටිත්, හැම දෙනකුටම පෙනෙන පරිදි රතු පාට වුලන් මප්ලරයකින් ගෙල ඔතා ගන්නා සැටිත් බැලීම සතුටක් නොවීය.

"මේ මප්ලරය මට මගේ සුන්දරිය ගොතලා දුන්නා."

ඔහු ගායනය නොකළේ නම් වැදගත් බවක් ආරූඪ කර ගෙන මළගිය එකකුගේ බඳු හීතල නාසය ඇඟිලි තුඩින් පිරිමදින්නට විය. ඔහුගෙන් අසන ප්‍රශ්නවලට ඔහු උත්තර දුන්නේ 'ඔව්' හෝ 'නැත' හෝ යන වචනවලින් පමණකි. එයද වැඩි කැමැත්තෙකින් නොවීය. දවසක් දා මම ඔහු අසලට ගොස් ඔහුගෙන් යමක් ගැන විමසන්නට වීමි. ඔහු මා දෙස නොබලමින් සැර කළේය.

"කොලුපැංචා පල යන්න!"

මිත්‍රපොල්ස්කි ඔහුට වඩා මගේ සිත් ගත්තේය. ඔහු තැබෑරුම තුළට එන්නේ බරැති යමක් කරින් ගෙන යන මිනිහකුගේ ගමන් විලාසයකිනි. ඔහු පයකින් පුටුවක් අද

එහි වාඩිවෙයි. වැළමිටි මේසය මත තබාගෙන දෑතේ අත්ලෙන් දිගැති හිසකේ සහිත හිස අතගායි. නිහඬව වොඩ්කා වීදුරු දෙක තුනක් බොන ඔහු, හඬ නගා උගුර පාදයි. එවිට තැබෑරුමේ සිටින්නෝ තිගැස්සී ඔහු දෙස බලති. ඔහු අත්ල මත නිකට තබාගෙන මිනිසුන් දෙස බලන්නේ අභියෝග කරන ලීලාවෙනි. ඔහු දුඹුරුවන් මුහුණ වටේට අවුල්වූ හිසකේ විහිදී ඇති නිසා එය තිරිසන් විලාසයක් මවා පායි.

"නුඹලා බලන්නෙ මොනවාද? බොලව් නුඹලාට පෙනෙන්නෙ මොනවාද?" බැරැඩ් ගොරෝසු හඬෙකින් ප්‍රශ්න කරයි.

සමහරු ඔහුට පිළිතුරු දෙති.

"අපට යකෙකුව පේනවා!"

සමහරදාට ඔහු නිහඬව පැමිණ, නිහඬව වොඩ්කා බී, ගාටමින් නිහඬව පිට වී යයි. එහෙත්, දවස් කීපයක්ම ඔහු දිවැස් කියන්නෙකුගේ විලාසයක් මවා ගෙන මිනිසුන්ට බැණ වදින සැටි මා අසා ඇත.

"දෙවියන්ගේ අවංක සේවකයා වන මම උන්වහන්සේගේ නාමයෙන්, ඉසායි වෙනුවෙන් මෙසේ පවසා සිටිමි: කැත, නීච, ජඩ මිනිසුන් ලෝකයේ වාසය කරන හෙයින් ඔවුන්ට අතිමහත් විපත් ළඟා වනු ඇත. ලෝකයේ පියාපත්වලට මහා විනාශයක් අත්වන්නේය. මන්දයත්, ආත්මාර්ථකාමී කුහකයන් මෙලොව වසන බැවිනි. බේබද්දෙනි, බඩජහරියෙනි, ලෝකයට එපා වූ ජඩයනි, තොපට මම මෙසේ දන්වා සිටිමි. ශාපලත් පව්කාරයනි, මිහිකත තොපේ සිරුරු පිළිගන්නේ නැත!"

ඔහුගේ කටහඬ කොතරම් ගොරෝසුද යත්, තැබෑරුමේ ජනේල වීදුරු පවා දෙදරුම් කෑවේය. තැබෑරුමේ වාඩිවී සිටින්නන්ට ඔහුගේ කතා විලාසයට රිසි වූයෙන්, ඔවුහු අනාවැකි දොඩන්නාට පැසසූහ.

"සෑහෙන්න දෙසා බානවා. බූවලු බලුපැටියා!"

ඔහු හඳුණා ගැනීම ඉතා ලෙහෙසි වැඩකි. ඔහුට සංග්‍රහ කිරීමට යෝජනා කළ විගස, ඔහු වොඩ්කා පිරි ඩිකැන්ටරයක් සහ රතු මිරිස් සමඟ හරක් (අක්මාව) පීකුදු කෑල්ලක් ඉල්ලා සිටී. එය ඔහුගේ ප්‍රියතම ආහාරය

විය. එය කෑ විට කටත්, බඩත් දැවෙන්නට පටන් ගනී. අවශ්‍යයෙන්ම කියැවිය යුතු පොත් මොනවාදැයි වරක් මා ඔහුගෙන් ඇසූ විට ඔහු ඉලක්කයට වෙඩි තබන්නාක් මෙන් ප්‍රති ප්‍රශ්නයක් නැඟීය.

"කියවන්නේ මොකටද?'

එහෙත්, මා ලජ්ජා වී සිටි නිසා ඔහු තරමක මුදු ගතියක් පෙන්වීය

"එක්ලෙසියාස්ත් පොත කියෙව්වද?"

"ඔව්. කියෙව්වා."

"එක්ලෙසියාස්ත් කියවාපන් වෙන මොනවත් ඕන නැහැ. ලෝකයේ තියෙන සියලු බුද්ධිය එහි තියෙනවා. හතරැස් බූරුවන්ට පමණක් එය තේරුම් ගන්න බැහැ. එහි තියෙන භාෂාව උන්ට තේරුම් ගන්න බැහැ. නුඹ කවුද? ගායකයෙක්ද?"

"නැහැ"

"නැත්තේ මන්ද? ගයන්න ඕන. ඒක තමයි ඉතාම අමන රස්සාව."

එවිට යාබද මේසයේ වාඩිවී සිටි මිනිහා ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසීය.

"නුඹත් සින්දු කියනවද?"

"ඔව්. මම වැඩක් නැති එකෙක්. ඉතින්?"

"මොකුත් නැහැ."

"ඒක අලුත් දෙයක් නොවේ. නුඹේ ඔළුගෙඩියේ මොනවත් නැති බව හැම දෙනාම දන්නවා. ඉදිරියටත් නුඹේ ඔළු ගෙඩිය පුස්සක්ව පවතීවි. ආමෙන්!"

ඔවැනි බස් වහරකින් ඔහු හැම දෙනා සමඟ කතා කළ අතර, මටද දැක්වූයේ එවැනිම සැලකිල්ලකි. දවස් දෙක තුනක් මා ඔහුට සංග්‍රහ කළ විට, ඔහු මා කෙරෙහි මුදු ආකල්පයක් දැක්වූවා පමණක් නොව, වරක් ඔහු මවිතය පළ කරමින් මෙසේ පැවසීය:

"මම නුඹ දිහා බලනවා. නමුත්, තේරුම් ගන්න බැහැ. නුඹ කවුද? මොකටද? කොහොම වුණත් නුඹ යන යකාට පලයන්!"

ක්ලෙෂොව් කෙරෙහි ඔහු දැක්වූයේ පැහැදිලි ආකල්පයෙකි. ඔහු ක්ලෙෂොව්ගේ ගීතවලට සවන්

දුන්නේ අති මහත් සතුටකිනි. සමහර දාට ගීතයට සවන් දෙමින් ඔහු සුරතල් ලෙස මඳ සිනා පෑමක් පවා කළේය. එහෙත්, ඔහු හඳුනා ගැනීමට පවා ඉදිරිපත් නොවී, ඔහු ගැන ගොරහැඩි ලෙසත්, නින්දා සහගත ලෙසත් කතා කළේය.

"ඒකා මෝඩයෙක්. ඔහුට හුස්ම ගන්න දන්නවා. ගයන දේ ගැන ඔහුට වැටැහීමක් තියෙනවා. ඒ වුණත් ඌ බූරුවා!"

"මක් නිසාද?"

"උගේ උපන් ස්වභාවය අනුව."

ඔහු මත්පැන් පානය නොකළ විටෙක ඔහු සමඟ කතා කිරීමට මම අදහස් කළෙමි. එහෙත්, ඔහු ප්‍රකෘති ගතියෙන් සිටින විට අපැහැදිලි, පාළු නෙත්වලින් බලමින් 'හ්ම්' යන හඬ පමණක් නැඟීය. මුළු මහත් කාලය තිස්සේම බේබද්දකු ලෙස හැසිරෙන මේ මිනිහා කසාන් දේව ධර්ම විද්‍යා ඇකැඩැමියේ ඉගෙන ගත් බවත්, අග රජ ගුරු කෙනෙකු වීමට සිටි බවත් කෙනෙකු මට කී විට මම එය විශ්වාස නොකළෙමි. එහෙත්, දවසක් දා මම ඔහුට මා ගැන කියන විට, අගරජගුරු හ්රිසාන්ප්ගේ නම මම මතක් කළෙමි. එවිට ඔස්ටා විස්තයා හිස වනා කතා කළේය.

"හ්රිසාන්ප්. මම එයාව දන්නවා. එයා මගේ ගුරුතුමා. මගේ යහපත පතන්නා. කසාන්වල ඇකැඩැමිය මට මතකයි. හ්රිසාන්ප් කියන්නේ රන්වන් පාටට. පාම්වා බෙර්දිනා ඒ ගැන නියම ලෙස කියා තියෙනවා. ඔව්, ඇත්තටම හ්රිසාන්ප් රන්වන් පාටයි."

"පාම්වා බේර්දිනා කියන්නේ කවුද?" යි මා මිත්‍රපොල්ස්කිගෙන් ඇසූ විට, ඔහු කෙටි පිළිතුරක් දුන්නේය.

"ඒක නුඹට අයිති වැඩක් නොවෙයි."

ගෙදර ගිය මම මගේ සටහන් පොතේ මෙසේ ලියා තැබීමි. "පාම්වා බෙර්දිනාගේ පොත අනිවාර්යයෙන්ම කියවිය යුතුයි." මගේ සිතට වධ දෙන බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු බෙර්දිනා පෙන්වා දෙතියි යන විශ්වාසයක් මට ඇති විය.

ඔක්තාවිස්ත ගායකයා මා නොදත් නම් පාවිච්චි කිරීමට පුරුදුව සිටියේය. ඒ පුදුමාකාර වචන ගැළපීම නිසා මම කිපීමට භාජනය වීමි.

"ෂිෂ්න් නි අනීස්යා" යැයි හේ පැවසීය.

"අනීස්යා" කියන්නේ කාටදැයි මම ඔහුගෙන් ඇසුවෙමි.

"ප්‍රයෝජනවත්" යැයි ඔහු කී විට මගේ ව්‍යාකූලත්වය වැඩි වූයෙන් එය ඔහුගේ හුදු විනෝදය පිණිස වූයේය.

ඒ වචන නිසාත්, ඔහු ඇකැඩමියේ ඉගෙන ගත් නිසාත්, ඔහු බොහෝ දේ දනිතියි සිතීමට මා පෙලඹිණි. ඔහු කිසිවක් ගැන කතා කිරීමට කැමැති නැති අතර, ඔහු කතා කළොත්, කතා කරන්නේ නොතේරෙන බසකින් නිසා මම ඉමහත් ලෙස අමනාපයට පත්වීමි. සමහර විට ඔහුගෙන් ප්‍රශ්න කරන සැටි මා නොදනීද?

කෙසේවතුදු. මගේ අධ්‍යාත්මයෙහි කිසියම් සටහනක් තැබීමට ඔහු සමත් විය. දිවැස් කියන ඉසායෙව්ගේ බසින් ඔහු මිනිසුන්ට දොස් පැවරීමේ බේබදු නිර්භයත්වය මගේ සිත් ගත්තේය.

"අහෝ, මිහිතලයේ අපවිත්‍ර නීචයනි, තොප අතරින් ජඩයනට කීර්තිය ලැබී ඇත. හොඳ එවුනට පලා යාමට සිදුවී ඇත. ලෝකාන්තිම වන ඒ භයංකර දවසේදී තොපි දුක් මනස්තාප වනු ඇත. එවිට පමාවනු ඇත. පමාවනු ඇත!" යි ඔහු බුරන්නාක් මෙන් ගොරෝසු හඬින් කියන්නට විය.

ඔහුගේ එම ගෙරවීමට සවන් දෙන මගේ මනැස ඉදිරියේ "හොරොෂයේ දේලො" හෙවත් හොඳ වැඩේ නමැති මිනිසාත්, ඉතා දුක්බරිත ලෙස සහ ලෙහෙසියෙන් මියගිය නතාලියා රෙදි අපුල්ලන්නියත්, කැත කතාවලට භාජනය වූ මර්ගෝ රැජිනියත් මැවී පෙනිණි. ඒ වනවිට පවා මතක් කිරීමට මට දේ තිබිණි.

ඒ මිනිසාත් සමඟ මා ඇති කරගත් ඒ කෙටි ඇඳුනුම්කම කුතුහලයෙන් යුතුව අවසන් විය.

වසන්ත සමයෙහිදී, කඳවුරු අසල එළිමහන් පිටියෙක මම ඔහු හමුවීමි. ඔහු ඔටුවකු සේ හිස වනමින් හුදෙකලාව ගමන් කළේය.

"ඇවිදිනවද?" ඔහු මගෙන් ප්‍රශ්න කළේ ගොරෝසු

බැරැඬි හඬිනි. "එකට ඇවිදිමු. මාත් ඇවිදිනවා. යාළුවා මා අසනීප වෙලා."

අපි දෙදෙනා නිහඬව පියවර කීපයක් ගමන් කළෙමු. කඳවුරුවලට ඈතින් ඇති වළක මිනිහකු වැටී සිටින සැටි හිටිහැටියේම අපට පෙනිණි. යම්තමින් පැත්තකට හැරෙමිනි, ඔහු වළ පතුලේ වාඩිවී සිටියේ, ඔහුගේ එක අතක් අගල් බිත්තියට වාරු වී ඇත. ඔහුගේ උඩු කබාය එක් උරයකින් කනටත් වඩා ඉහළ ගොස් තිබුණේ, හරියට ඔහු එය ගලවා දැමීමට උත්සාහ කළද, එසේ කළ නොහැකි වූ බවක් පෙන්වාලමිනි.

"බීලා වෙරිවෙලා" යැයි මිත්‍රපෝල්ස්කි තීරණය කළේය.

එහෙත්, ඔහු අසල ළපටි තණ මත ලොකු රිවෝල්වරයක් විය. තරමක් ඈතින් ඔහුගේ හිස් වැස්ම තිබිණි. ඔහුට ළඟින් තරමක බණ්ඩි වොඩ්කා බෝතලයක්ද විය. බෝතල කට තණ පඳුරුවල සැඟවිලාය. ඒ මිනිහාගේ මුහුණ ලජ්ජා සහගත ලෙස කබායට මුවාවූ විටෙක මෙනි.

අපි විනාඩියක් පමණ ඒ මිනිසා දෙස බලා සිටියෙමු. අනතුරුව මිත්‍රපෝල්ස්කි දෙපා පළල් කොට තබාගෙන මෙසේ පැවසීයඃ

"වෙඩි තියාගෙන මැරිලා."

ඒ මිනිහා වෙරිවී සිහි නැති වූවකු නොව, සිය දිවි නසාගත්තකු බව මට එකවර වැටහුණද, එය විශ්වාස කිරීම ලෙහෙසි නොවූයේ එය බලාපොරොත්තු විරහිත දර්ශනයක් වූ බැවිනි. උඩුකබායෙන් වැසී නැති ඔහුගේ විශාල තට්ට හිසත්. නිල් පැහැති කනත් දෙස බැලූ මට බියක් හෝ දුකක් හෝ නොවීය. මෙවැනි සුරතල් වසන්ත දවසක මිනිහකු සිය දිවි හානි කර ගනිතියි විශ්වාස කළ නොහැකිය.

ඔක්තාවිස්ත ගායකයා රැවුළු වැවී ඇති තම දෙකොපුල් පිරිමැද්දේ ඔහුට ශීතලක් දැනුණු විටෙක මෙනි. ඔහු ගොරෝසු හඬින් කතා කළේය.

"වයසක මිනිහෙක්. එක්කෝ ගෑනි පැනලා ගිහින්, නැතිනම් අනුන්ගේ සල්ලි වියදම් කරලා..."

පොලිස්භටයා කැඳවාගෙන එන ලෙස මා පිටත් කර යැවූ ඔහු, වළ තුළට පාද දමා ගෙන ගැට්ටෙහි වාඩි

විය. ඊට පෙර ඔහු, ඔහුගේ පාද උඩු කබායෙන් ඔතා ගත්තේය. ප්‍රදේශය භාර පොලිස්භටයාට එම සිද්ධිය දැන්වූ මා වහාම මිත්‍රපොල්ස්කි වෙත හැරී ආ විට, ඔහු පණ නසාගත් මිනිසාගේ වොඩ්කා බෝතලයේ තිබුණු මත් පැන් සියල්ල පානය කොට, හිස් බෝතලය වනමින් මා පිළිගත්තේය.

"මෙන්න මේක තමයි, ඒ මිනිහාව මැරුවේ!" ඔහු ගුගුළේය. මම කෝපයෙන් යුතුව බෝතලය උදුරාගෙන එය බිම ගසා කැලිවලට බිඳ දැම්මි.

මා පසුපසින් දිවගෙන ආ පොලිස්භටයා වළ දෙස බලා අතීරණාත්මක ලෙස කුරුසියේ ලකුණ ඇඳගෙන මිත්‍රපොල්ස්කිගෙන් ප්‍රශ්න කළේය.

"නුඹ කවුද බාන්?"

"ඒක නුඹේ වැඩක් නොවෙයි."

පොලිස්භටයා තරමක් කල්පනා කොට වඩාත් ආචාරශීලී ලෙස ප්‍රශ්නයක් නැඟීය.

"මෙතන මළ මිනියක්. ඒක ළඟ තමුසේ බීගෙන ඉන්නවා. ඒ කොහොමද?"

"මම අවුරුදු විස්සක් තිස්සේම බීගත් බේබද්දෙක්!" යැයි කී මිත්‍රපෝල්ස්කි ඔහුගේ පපුවට ගසා ගත්තේය.

අනුන්ගේ වොඩ්කා සොරකම් කර බීම නිසා ඔහු සිරභාරයට ගනු ඇතැයි සහතික ලෙසින්ම මම විශ්වාස කළෙමි. මේ වන විට නගරයේ සිට මිනිස්සු දිවැ ආවෝය. අස්රියකින් පැමිණි ප්‍රදේශ භාර පොලිස්භටයා වළ තුළට බැස පණ නසාගත් මිනිහාගේ කබාය ඔසවා මළ සිරුර දෙස බලා ප්‍රශ්න කළේය.

"මේ මිනිය පළමුවෙන් දුටුවේ කවුද?"

"මම" යි මිත්‍රපෝල්ස්කි පිළිතුරු දුන්නේය.

ප්‍රදේශය භාර පොලිස්භටයා ඔහු දෙස බලා නපුරු ලෙස ඇද පැද කතා කළේය.

"ආ ආ, ආයුබෝවන් මහත්තයා."

මේ වන විට රැස්වූ ගණන පහළොස් දෙනෙකු පමණ විය. ඔවුහු වළ වටේට රැස්වී මළමිනිය දෙස බලමින් ප්‍රබෝධයකින් යුතුව කතා කරන්නට වූහ. හිටි හැටියේම එකෙක් කෑ ගැසුවේය.

"මේ මිනිහා අපේ වීදියේ හිටිය ලිපිකරුවෙක්. මම එයාව හඳුනනවා."

මිත්‍රපෝල්ස්කි තොප්පිය අතට ගෙන ප්‍රදේශය භාර පොලිස් භටයා ඉදිරියේ සිටගෙන තේරුම් ගැනීමට අපහසු වචන ඇද බාමින්, ගොරෝසු බැරැඩි හඬකින් කෑ ගසමින්, ඔහු සමඟ තර්ක කරන්නට විය. අනතුරුව ප්‍රදේශය භාර පොලිස්භටයා ඔහු තල්ලු කරත්ම, ඔහු වැනී බිම ඇද වැටුණේය. එවිට පොලිස්භටයා කලබල නොවී, සාක්කුවෙන් හයිය ඇති ලණුවක් ගෙන මිත්‍රපෝල්ස්කිගේ දෑත් පිටිතලහා කොට බැඳ දැම්මේය. ප්‍රදේශය භාර පොලිස්භටයා රැස්වූ පිරිස දෙස බලා ගුගුළේය.

"රස්තියාදුකාරයනි, පලයව්!"

තවත් මහලු පොලිස්භටයෙක් එතැනට දිවැගෙන ආවේය. ඔහුගේ රතුවන් දෙනෙත් කඳුළුවලින් පිරිලාය. මහන්සිවීම නිසා ඔහුගේ කටේ පහළ ඇන්ද පහත වැටී, කට විවෘත වී ඇත. ඔහු මිත්‍රපෝල්ස්කිගේ දෑත් බැඳ ඇති ලණු පොටේ කොනක් අතින් ගෙන, ඔහු නගරයට ගෙන ගියේය.

දොම්නසින් යුතුව මම ඉවත්ව ගියෙමි. කපුටු හඬකට සමාන වූ හඬකින් රැව් දුන් වචන මගේ සිතෙහි තදින් ඇදිණි.

"අර්රිලාට මහා විපතක්!"

දෙනෙත් ඉදිරිපිට දුක්බරිත දර්ශනයකි. පොලිස්කාරයා කලබල නොවී සාක්කුවකින් ලණුවක් අතට ගනී. අනාවැකි කියන මිත්‍රපෝල්ස්කි සුවච කීකරු ලෙස, රතුවන් මවිල්වලින් ගහන දෑත් පිටිතලහා කොට ගනී. ඔහු දෑත් කතිර හැඩයට තබා ගත්තේ ඉතා සුපුරුදු ආකාරයකටය. ඔක්තාවිස්ත ගායක, අනාවැකි කියන, මිත්‍රපෝල්ස්කි නගරයෙන් එපිට පෙදෙසකට පන්නා දැමූ බැව් පසුව මම දැන ගතිමි. ඉනික්බිතිව වාසිසහගත ලෙස විවාහයක් කර ගත් ක්ලෙෂොව් පදිංචිය සඳහා ප්‍රාදේශීය නගරයකට ගොස් එහි සම් භාණ්ඩ සාදන වැඩ පොළක් විවෘත කළ බව දැන ගන්නට ලැබිණි.

ක්ලෙෂොව්ගේ ගායනය අරබයා මා කීපවරක්ම මගේ හාම්පුතා වර්ණනා කළ බැවින් ඔහු වරක් සිය අදහස

ප්‍රකාශ කළේය.

"තැබෑරුමට ගිහිල්ලා සංගීතය අහන්ට ඕන."

දැන් තැබෑරුමට විත් මා ඉදිරියේ වාඩිවී සිටි මගේ හාම්පුතා මවිතයෙන් බැම සඟළ ඔසවාගෙන කට හැරගෙන ගායනයට සවන් දුන්නේය.

අප දෙදෙනා තැබෑරුමට යමින් සිටින විට ඔහු මා සිනාවට ලක් කළ අතර, එහි ගොස් වාඩිවූ මුල් විනාඩි කීපය තුළදීත්, එහි රැස්ව සිටියවුන් සහ එහි පැතිරි ගිය හුස්ම හිර කරවන සුවඳ නිසා ඔහු මා අවඥාවට ලක් කරන්නට විය. ක්ලෙෂොව් ගායනය පටන්ගත් විට ඔහු උපහාසාත්මක ලෙස මඳ සිනාවකින් මුව සරසාගෙන බීර වක්කරන්න පටන් ගත්තද, අඩක් වීදුරුව පුරවා එය නවත්වා ගායනයට සවන් දෙමින් විස්මය පළ කළේය.

"ඔහෝ... යක්ෂ වැඩක්!"

බීර බෝතලය සහිත ඔහුගේ අත වෙවුලන්නට වූයෙන්, ඔහු එය සෙමින් මේසය මත තබා ඉමහත් වුවමනාවෙකින් සවන් දුන්නේය.

"ඔව් මල්ලී, ඒ මිනිහා නම් සැබෑ ගායකයෙක්." යැයි මගේ හාම්පුතා කිව්වේ සුසුම් ලමිනි. "මහ යක්ෂ කෙළියක් මගේ ඇඟට රස්නය දැනුණා."

ක්ලෙෂොව් හිස සීලිම දෙසට හරවා ගෙන යළිත් තාලය අල්ලා ගායනය පටන් ගත්තේය.

පසල් දනව්වක් මැදින් පෝසත්
ගියා ලස්සන තරුණිය දුප්පත්

"ගයනවා" යැයි කී හාම්පුතා හිස වනා සිනා පෑවේය. ක්ලෙෂොව් බටනළාවක් මෙන් සුමිහිරි ලෙස ගැයීය.

තරුණිය ලස්සන ඔහු දෙස බලන්නී,
අනාත දැරියක බව තෙපලන්නී...

"හොඳයි" කී හාම්පුතා රතුවන් නෙත්වලින් ඉඟිපායි. "ෂා, ෂා, බොහොම හොඳයි!"

මම ඔහු දෙස බලා සතුටට පත්වීමි. තැබෑරුමේ හඬ මැඩ නැඟ එන, දුක්බර ගීතය වඩාත් බලවත් ලෙසත්, අලංකාර ලෙසත්, හෘදයංගම ලෙසත් රැව් දෙයි.

පසල් දනව්වේ ජනයා නරක නැත.
හවස සාදයට මා අඬ ගසනු නැත.
නැත්තේ හොඳ ඇඳුම් මා දුප්පත් බැවිනි.
තරුණ ගම්පති බලන්නේ මා දෙස කෝපයෙනි.
කණවැන්දුම් මිනිහෙක් මට අත වැනුවා.
ඔහුගේ වහලියක් වීමට මට බැරුවා!"

මගේ හාම්පුතා හිස පැත්තකට හරවා ගෙන අඬන්නට වූයේ ලජ්ජාව පවා නොතකමිනි. ඔහු සිය වකුටු නාසයෙන් හඬක් පිට කරමින් අඬන්නේ, කඳුළු කැට ඔහුගේ දණහිසට වැටිණි.

තෙවැනි ගීතයෙන් පසුව ඉමහත් සේ කැලඹුණු ඔහු මෙසේ පැවසීය:

"මට මීට වැඩිය මෙතැන වාඩිවෙලා ඉන්න බැහැ. තැබෑරුම් ගඳ උනුලන්ටත් බැහැ. යමු ගෙදර."

අතර මඟදී ඔහු මට මෙසේ යෝජනා කළේය.

"පෙෂ්කොව් අපි හෝටලයකට ගිහිල්ලා හොඳට මොනවා හරි කමු. ගෙදර යන්න හිතක් නැහැ!"

ඔහු අස්රියකට නැංගේ රියකරුවා සමඟ හෙට්ටු කිරීමක් පවා නොකරමිනි. හෝටලයට යන තුරු නිහඬව සිටි ඔහු එහි ගිය පසු මුල්ලක වූ මේසයක් අසල වාඩිවී, වටපිට බලමින් කෝපය මුසු මූසල ගතියක් පෙන්වමින් අඩ ස්වරයකින් කතා කරන්නට විය.

"අර ගායක එළුවා මාව අවදි කළා. මගේ හිතට විශාල දොම්නසක් ඇති කළා. ඔන්න නුඹ පොත් කියවන මිනිහා. තර්ක විතර්ක කරනවා. මේ ගායකයා යකාගෙන් වරම් අරගෙනද? ඔන්න ජීවත් වෙනවා අවුරුදු හතළිහක් ගෙවුණා. බිරිඳ, ළමයින් හිටියට කතා කරන්න කෙනෙක් නැහැ. සමහර විට මට මුළු ආත්මයම පිටතට ඇද දමලා සියලු දේ ගැන කතා කරන්න සිතෙනවා. නමුත්, කෙනෙක් නැහැ. ගෙදර ගැනි එක්ක කතා කරන්ටද? එයාට ඒවා තේරුම් ගැනීමට බැහැ. ගෑනි මිනිහගේ මිතුරිය වන්නේ පළමුවැනි ළමයා වදන්න කලියෙන් විතරයි. ඔන්න ඊට පස්සෙ මගේ ගැනි පොදුවේ... නුඹ එයාව දන්නවා නොවැ. එයාට ළමයි ඉන්නවා. ගෙදර වැඩ කටයුතු තියෙනවා. ඒකිව නටවන්න හැකි තාලයක්

නැහැ. පණ නැති මස් ගොඩක්... යන යකාට පල! හරිම මුඩුම පාළු ගතියක් මල්ලි..."

ශීතල, තිත්ත බීර ඔහු බිව්වේ වෙවුලමිනි. දිගැති කෙස් වැටිය අතගාමින් නිහඬව සිට, යළි කතා කරන්නට පටන් ගත්තේය.

"පොදුවේ බලන විට මිනිස්සු නීච වල් සත්තු. ඔන්න බලාපන් නුඹ මුෂිකයින් එක්ක කතා කරනවා. නොයෙක් දේ ගැන මට තේරුම් ගත හැකියි. වැරැදි දේ බොහොම තියෙනවා. නීච දේ තියෙනවා. ඒවා සේරම එහෙම තමයි මල්ලී. උන් ඔක්කොමල්ලා හොරු. නුඹ හිතන්නේ නුඹේ කතාව උන්ගේ හිතට වදිනවා කියලද? අබ මල් රේණුවක් තරම් වත්, වදින්නෙ නැහැ. උන් ඔක්කොමල්ලා, ප්‍රොතර්, ඕසිප්, පල්හොරු. නුඹ මා ගැන කියන දේ සේරම උන් මට ඇවිත් වාර්තා කරනවා. ඉතින් මල්ලී කොහොමද?"

මවිතයට පත් වූ මම නිහඬවූයෙමි.

"කෙරුවාව ඔන්න ඔහොමයි." කී හාම්පුතා සිනාසුණේය. "නුඹ පර්සියාවට යන්න හැදුවා නේද, ඒක හරි වැඩක්. ඒ රටේ උන්ගේ බාෂාව නොතේරෙන නිසා කිසිම දෙයක් තෝරා බේරා ගන්න බැරුව යාවි. තමුන්ගේ ජන්ම බාෂාවෙන් නීච කතා විතරයි කියන්නේ..."

"ඕසිප් මා ගැන ඔබට වාර්තා කළාද?" මම ඔහුගෙන් ඇසුවෙමි.

"ඔව්. ඇත්තටම! නුඹ සිතුවේ මොනවාද? එයා අන් අයට වැඩියෙන් කතා කරනවා. වාචාලයා. මිනිහා බොහොම ලොකු කපටියෙක්. නැහැ. පෙෂ්කෝව්! දේශනා කරලා මිනිසුන්ව හදන්න බැහැ. ඇත්ත නේද? මොන ඉලව්වකටද ඒක ඕන? ඒක හරියට සරත් සමයේ වැටෙන හිම වගෙයි. කුණුගොඩ උඩට හිම රොදක් වැටිලා දියවෙලා ගියාම, කුණු ගොඩ තවත් ලොකු වෙනවා. එච්චරයි. නුඹ කටවහගෙන ඉඳපන්. ඒක වඩාත් හොඳයි.

ඔහු බීර වීදුරු එක පිට එක බොන්නට වුවද, වෙරි නොවූයෙන්, වඩාත් ඉක්මනින් සහ කෝපයෙන් කතා කරන්නට විය.

"මෙහෙම කතාවක් තියෙනවා. 'කට වචනය පිහියක් නොවෙයි. කැපෙන, රත්රන් වැනිය නිහඬ වීම, සැනසෙන්න. 'අපේ ගමේ දනව්වේ මිනිස්සු නපුරු සතුන්' කියලා අර මිනිහා ගයපු ගීතය හරියට හරි. මුළු මිනිස් සංහතියම අනාත වෙලා...."

ඔහු වටපිට බලා පහත් හඬින් මෙසේ කියන්න පටන් ගත්තේය:

"මගේ හිතට කිට්ටු මිතුරියක මට හොයාගන්න පුළුවන් නම්, මට මේ ළඟදී "කණවැන්දුම්" ගෑනියක් හමුවුණා. හොර සල්ලි අච්චු ගහලා එයාගේ මහත්තයාව සයිබීරියාවට යවන්න තීරණය කරලා. ඔහු දැනට මේ හිරගෙදර ඉන්නවා. මම ඒකිව හඳුණා ගත්තා. ඒකි අත තඹ සතයක්වත් නැහැ. නමුත්, ඒ වුණාට ඒකිගෙ නෑයෙක් මට ඒකිව හඳුන්වා දුන්නා. මොන විදිහේ ගෑනියෙක්ද කියල මම එයා දිහා හොඳට බැලුවා. ගෑනි ලස්සනයි. තරුණයි. අගේ ඇති කාන්තාවක්! මම එයාත් සමඟ දෙතුන් වරක් ලිංගික සබඳතාවන් ඇති කරගත්තා. ඔන්න ඊට පස්සෙ දවසක් දා මම එයාට මෙහෙම කිව්වා. ඔයාගේ මහත්තයා හොර සල්ලි අච්චු ගහපු වංචාකාරයෙක්. ඔයා මෙහෙම ජීවත් වෙනවා. ඉතින් එහෙනම් මොකටද ඔයා ඔහු සොයාගෙන සයිබීරියාවට යන්නෙ? ඒ ගෑනි එයාගේ මිනිහව හොයාගෙන සයිබීරියාවට යන්න ලෑස්ති වෙනවා. නුඹට තේරුණාද! ඉතින් ඒ ගෑනි මගේ ප්‍රශ්නයට මෙලෙස පිළිතුරු දුන්නා. මගේ මහත්තයා මොකා වුණත් මම එයාට ආලය කරනවා. මට එයා කොහොමත් හොඳයි. ඔහු හොර සල්ලි අච්චු ගැහුවේ මා නිසා වෙන්න පුළුවන් නේද? මම නුඹත් එක්ක නිදාගත්තෙ මගේ මහත්තයට සල්ලි ඕන නිසා. එයා රදලයෙක්, එයාට හොඳට සැප පහසුවට ජීවත් වෙන්න ඕන. මම තනිවම හිටියානම්, මම අවංකව ජීවත් වෙනවා. ඔයත් හොඳ කෙනෙක්. ඔයාට මම කැමතියි. නමුත්, ඒ ගැන විතරක් කතා නොකරන්න. හරිම යක්ෂ කෙළියක් නොවැ. මම මගේ අතේ තිබුණු මුදල් සියල්ල ඒකිට දීලා දැම්මා. රූබල් අසූ ගණනක් වෙන්ට ඕන. මට ඔයාත් සමඟ මීට පස්සේ ඔය වැඩවලට හිතක් නැහැ. මට සමාවෙයන්. ඔන්න මම ගියා. ඉතින්

ඒකිව දාලා එන්න ආවා."

නිහඬව සිටි ඔහු හිටි හැටියේම වෙරි මතින් මෙන් හිස පහතට හරවා ගෙන මුමුනන්නට විය.

"මම ඒකි ළඟට හය පාරක්ම ගියා. නුඹට එය තවම වටහා ගැනීමට බැහැ. සමහර විට තවත් හය වරක් පමණ එයාගේ ගෙය ළඟටම ගියා. නමුත්, ගේ ඇතුළට යාමට තීරණය කළේ නැහැ. මට බැහැ! පසුව එයා යන්න ගියා..."

ඔහු දෑත් මේසය මත තබා ඇඟිලි සොලවමින් රහසක් කතා කරන විටෙක මෙන් මෙසේ කිව්වේය:

"අනේ දෙවියනේ, මට එයාව ආයෙමත් හමුවීමට ඉඩ තියන්න එපා. දෙවියනි, ඉඩ නොතබන්න. බැරි වෙලාවත් හමුවුණොත් හරිම විනාශයක් තමයි! දැන් ඉතින් අපි ගෙදර යමු. යමු."

ඔහු වැනෙමින්, දොඩවමින් ගමන් කළේය.

"මල්ලී, ඔන්න ඔහොමයි."

ඔහු කී කතා නිසා මා මවිතයට පත් නොවූයේ, ඔහු අසාමාන්‍ය දෙයකට මුහුණ පා සිටින බවක් බොහෝ කලෙක සිට මා අනුමාන වශයෙන් දැන සිටි බැවිනි.

ඔහුගේ ජීවිතය අරබයා ඔහු කී විස්තරය නිසාත්, විශේෂයෙන්ම ඕසිප් ගැන ඔහු කී නිසාත් මම පෑගුණු තත්ත්වයකට ඇද වැටුණෙමි.

XX

ඒ මළගිය නගරයේ වැඩ බිමේ නඩ නායකයා ලෙස ගිම්හාන තුනක් වැඩ කළ මම වැසි සහිත සරත් සමය එළැඹෙන විට, කම්කරුවන් කළ පේළි නුහුරු ලෙස කඩා බිඳ දමන සැටිත්, යළිත් වසන්තයේ දී ඒවා සාදන සැටිත් නිරීක්ෂණය කළෙමි.

මට මසකට ගෙවන රූබල් පහට මා ලවා ඉතා හොඳින් වැඩ කරවාගැනීමට හාම්පුතා දක්ෂ ලෙස ක්‍රියා කළේය. යම් කිසි කඩයක පොළොවට ලී සවි කළ යුතු නම්, එම බිමෙහි ඇති පස් රියනක් ගැඹුරට අස් කර දැමිය යුතුය. පස් හෑරීම සඳහා පාදඩයන් වැඩට ගන්නේ රූබලයක් ගෙවීමට පොරොන්දු වෙමිනි. මට ඒ වැඩ සඳහා තඹයකුදු

නොගෙවීය. පස් කැපීම සොයා බලන විට, වඩුවන්ගේ වැඩ ගැන පිරික්සීමට මම අපොහොසත් වෙමි. එයින් ප්‍රයෝජනය ගන්නා වඩුවෝ දොර ඉබ්බන්, දොර මිටි, ආදිය ගලවා ගැනීම සහ වෙනත් නොයෙක් සුළු දේ සොරකම් කරති.

කම්කරුවෝත්, කොන්ත්‍රාත්කරුවෝත් නොයෙක් දේ විවෘත ලෙසම වාගේ හොරකම් කරමින්, මා රැවටීමට උත්සාහ ගත්හ. ඔවුන්ගේ යුතුකමක් ලෙස සලකා ඔවුන් එය කළ විට, ඔවුහු මගේ අතට හසුවෙති. එවිට ඔවුන් කතා කරන්නේ කෝපයෙන් නොව. මවිතයෙනි.

"නුඹේ පඩිය රුබල් පහයි. නමුත්, නුඹ වැඩ කරන්නේ හරියට රුබල් විස්සක් පඩි ලබන මිනිහෙකු වගෙයි. නුඹ දිහා බලනවිට හිනා යනවා."

මගේ ශ්‍රමයෙන් රුබලයක් ලාබ ලබන හාම්පුතා රුබල් දහයක් පාඩු විඳින බව ඔහුට මා විස්තර කළ විට ඔහු ඇසක් අඩවන් කොට මෙසේ පැවසීය:

"ඉතින් නුඹ නොදැක්කා වගේ ඉඳපන්!"

හොරකම්වලට මාත් හවුල් වෙතියි යන සැකයක් ඔහු තුළ තියෙන බව මා වටහාගෙන සිටියෙන්, මම ඔහු පිළිකුල් කරන්නට වීමි. එහෙත්, එය ඔහුගේ අමනාපයට හේතු නොවීය. හාම්පුතාත් අනුන්ගේ දේ සොරා ගැනීමට ආසා කළේය.

සල්පිලෙන් ඉක්බිතිව කඩ යළිත් අලුත් වැඩියා කිරීමට භාර ගන්නා විට, අමතක වීමෙන් එහි දමා ගිය විවිධ දේ සමවාර, පිඟන් කෝප්ප, පලස්, කතුරු, සමහර විට විවිධ බඩු සහිත පෙට්ටි නැතිනම් තනි, තනි භාණ්ඩ ආදිය හාම්පුතා ප්‍රීතිමත් සිනාවක් පා මට මෙසේ කියයි:

"මේ බඩුවල ලේඛනයක් හදලා ඒවා සේරම ගබඩාවට ගෙනියපන්."

විවිධ භාණ්ඩ රැස්කිරීමට ආසාවක් මට නොවීය. පොත් එකතු කිරීම පවා මට බරකි. බෙරන්ෂෝගේ පොතක් සහ හයිනේගේ ගීත හැර අන් කිසිවක් මා සතු නොවීය. පුෂ්කින්ගේ පොතක් මිල දී ගැනීමට මා කැමැති වූ නමුදු, නගරයේ එකම පරණ පොත් වෙළෙන්දා වන දුෂ්ට මහල්ලා මගෙන් ඒ පොතට ලොකු මුදලක් ඉල්ලා සිටියේය.

හාම්පුතාගේ ගෙදර ගොඩ ගසා ඇති ගෘහ භාණ්ඩ, පලස්, මූණ බලන කණ්ණාඩි ආදී කිසිවක් මා සිත ගත්තේ නැත. ලී බඩුවල මුග්ධ හැඩයත්, ඉන් පිටවන වාර්නිෂ් සුවඳත් මා කුප්පාලීය. හාම්පුතාගේ තට්ටු නිවාසයේ අනවශ්‍ය, වැඩිපුර දේ ගොඩ ගසා ඇති පෙට්ටගම් සිහියට නැංවූ අතර, එය මගේ සිත් නොගත්තේය. ගබඩාවේ සිට තම ගෙදරට අනුන්ගේ බඩු ගෙනැවිත් ගොඩ ගසන හාම්පුතා මගේ පිළිකුලට හේතුවිය. ඔහු අමතර දේ ගොඩ ගසා ගත්තේය. මාර්ගෝ රැජිනගේ කාමරවල බඩු බොහෝ තිබුණද, එහි තදබදය නොතකා අලංකාරයක් පැවැතුණි.

ජීවිතය පොදුවේ ගත් විට සබඳකම්වලින් අල්පය. අමනය, මිනිස් ජීවිතයෙහි මෝඩකම් රාශියකි. අපි සල්පිලට අවශ්‍ය කඩ සාදමු. එහෙත්, වසන්තයේදී හිම දියවන විට ගංවතුර ඇති වේ. කඩ සියල්ල යටවේ. දොර පළු විකෘති වෙයි. ජලය බැස ගිය පසු පරාල සහ රීප්ප දිරන්න පටන් ගනී. වසර දහස් ගණනක් තිස්සේ, අවුරුදු පතා ඇති ජල ගැල්ම නිසා සල්පිල් භූමිය යට වී ගොඩනැඟිලි මංමාවත් විනාශ වෙයි. මේ නිසා මිනිසුන්ට අතිවිශාල පාඩු සිදුවේ. මේ ජල ගැල්ම ඉඛේටම නොනවතින බව හැම දෙනම දනිති.

වසන්තයේදී විශාල අයිස් තට්ටු කැඩී පාවීම නිසා ගංගා තරණ නැව්, බෝට්ටු, ඔරු, පාරු, ආදියට හානි සිදුවේ. මිනිස්සු හානිවන සැටි දැක සුසුම් ලා යළිත් ඒවා සාදති. මෙය එකම තැනෙක පල්වීමක් වැනි මුග්ධ ක්‍රියාවෙකි.

මම මේ ගැන ඕසිප්ගෙන් ඇසූවිට ඔහු මවිතයට පත්වෙමින් සිනාසුණේය.

"අපොයි, නුඹ හරි හපනා, පටස් ගාලා හැදුවා! ඉතින් ඒ වැඩවලින් නුඹට ඇති පලේ කුමක්ද? ඉතින් ඒ හන්දා නුඹට මොකද? ආ!"

ඕසිප් සැණෙකින් වඩාත් බැරෑරුම් ලෙස කතා කරන්න වූයේ, මහල්ලකුට තරම් නොවන පැහැදිලි නිල්වන් දෙනෙත්වල උපහාසය සහිත බැල්ම මැකීයාමට ඉඩක් නොතබමිනි.

"නුඹගේ ඒ කතාව වැඩකට ඇති එකක්! බැලූ බැල්මට ප්‍රයෝජනයක් නැතත්, එයින් ප්‍රයෝජනයක් තියෙන්න පුළුවනි. නුඹ තවත් හොඳට හෝදිසියෙන් බලාපන්..."

බුද්ධිමත් ප්‍රස්ථාව පිරුළු බහුල වශයෙන් යොදමින්, බලාපොරොත්තු විරහිත සන්සන්දනයන් කරමින්, විවිධ වාචාල කතා ඇඳමින්, ඕසිප් වියළි වචන දිගටම තෙපලන්නට විය.

"ඔන්න බලාපන් මිනිස්සු දුක් ගැනවිලි ඉදිරිපත් කරනවා. ඉඩම් කුඩාය. නමුදු වෙල්ගා නදිය ඉඩම් සෝදා පස දිය කර හරිනවාය. ඔන්න එවිට අනික් අය මෙහෙම කියනවා. වොල්ගා ගඟේ ගැඹුර අඩු වෙනවා. වසන්ත ගං වතුර සහ ගිම්හාන මහ වැසි නිසා විශාල අගාධ ඇති වෙනවා. පස සෝදා පාළු වෙනවා!"

ඕසිප් කතා කරන්නේ දුක් ගැනවිලි ස්වරූපයෙන් හෝ කෝපයෙන් හෝ නොවේ. ජීවිතය අරබයා වූ සියලු දුක් ගැනවිලි දන්නා නිසා ඇති වූ තෘප්තියෙකින් මෙනි. ඔහුගේ වචන මා සිත තුළට රිංගා ගත්තද, ඒවා ඇසීමට මට ප්‍රිය නොවේ.

"ඔන්න තවත් ලක්ෂණයක් තියෙනවා. ගිනි හට ගැනීම්..."

සෑම ගිම්හානයකදීම වොල්ගා නදීබඩ ගිනි ඇවිළෙන සැටි මා දැක ඇත. වසරක් පාසා ජූලි මාසයේදී බොර කහ පැහැති දුමෙන් අහස වැසී යයි. රැස් රහිත දම් රතු සූර්යයා මහ පොළොව දෙස බලන්නේ රෝගී ඇසිනි.

"කැලෑවල ඇති වටිනාකම් නැහැ. ඒක රදලයකුගේ ඉඩමක්. මුෂිකයාට කැලෑ නැහැ. නගරවලත් ගිනි හටගන්නවා. ඒකත් එතරම් ලොකු පාඩුවක් නොවෙයි. නගරවල ජීවත් වන්නේ පොහොසත් එවුන්. ඔවුන්ට අනුකම්පා කිරීම අවශ්‍ය නැහැ. ඔන්න ගම් ගැන බලාපන්! එක වසරකට ගම් කොච්චර ගිනි ගන්නවද? ගම් සිය ගණනකට අඩු නැහැ. අන්න එය මහා විශාල පාඩුවක්!"

ඔහු නිහඬව සිනාසෙයි.

"ඉඩකඩම් තිබුණට හැකියාව නැහැ. අපි දෙන්නාගේ මේ කතාව අනුව අපි වැඩ කරන්නේ අපටත්, මිනිසුන්ටත්, ඉඩම්වලටත් නොවෙයි. ගින්දරට සහ ජලයටයි!"

"ඕසිප්, ඔබ හිනාවෙන්නේ මක්නිසාද?"

"ඉතින් මොකද? ඇඹූ කඳුළුවලින් ගිනි නිවන්න පුළුවන්ද? කඳුළු හන්දා ගං වතුර වැඩි වේවි."

මෙතෙක් මා හමුවූ සියලු මිනිසුන් අතුරෙන් ඉතාම බුද්ධිමත් මිනිසා මේ උදාර මහල්ලාය. ඔහු ආදරය කරන්නේ මොනවාටද, වෛර කරන්නේ මොනවාටද?

මා ඒ ගැන කල්පනා කළ විට, ඔහු මගේ සිතේ ගිනි තවත් ඇවිළවීම පිණිස තවත් වියළි දර වැනි වචන දමයි.

"මිනිසුන් තමන්ගේත්, අනුන්ගේත් ශක්තිය කොතරම් අඩුවෙන් රැකගන්නවාද කියල බලපන්. නුඹේ හාම්පුතා නුඹව මඩවන හැටි පේනවා නේද? වොඩ්කා නිසා මිනිසාට වෙන හානිය කොතරම්ද? ගණන මෙපමණයි කියා කීමට තරම් දක්ෂ උගත් මිනිහෙක් මේ ලොව නැහැ. ගෙයක් ගිනි ගත්තාම තවත් ගෙයක් හදන්න පුළුවනි. නමුත්, හොඳ මිනිහෙක් මළාම, එයාට හරියට සමාන කෙනෙකු හොයා ගන්න බැහැ. හොඳ උදාහරණයක් තමයි අර්දල්යෝන්. මිනිහකු හැටියට පිපිරිච්ච ග්‍රීෂා දිහා බලාපන්! ග්‍රීෂා මෝඩපහේ මිනිහෙක් වුණාට හොඳ හිත ඇති එකා. පිදුරු ගොඩක් වගේ මිනිහා ඇවිළිලා යනවා. කැලේ මැරිච්ච මිනිහගෙ ඇඟට පණුවො වදිනවා වගේ ගෑනු කට්ටිය මිනිහ ගෙ ශරීරය කනවා."

එවිට මම ඔහුගෙන් අමනාපයෙන් තොරව එනමුදු කුතුහලයෙන් යුතුව විමසන්නට වීමි.

"ඕසිප් මගේ අදහස් ගැන හාම්පුතාට දැන්වූයේ කුමක් නිසාද?"

සන්සුන් ලෙස පමණක් නොව, සුරතල් ලෙස පවා විස්තර කිරීමට ඔහු ඉදිරිපත් විය.

"නුඹේ අදහස් කොතරම් නරකද කියල හාම්පුතා දැනගත්තාවේ. ඔහු නුඹට උගැන්විය යුතුයි. හාම්පුතා හැරුණු විට නුඹට උගැන්විය හැක්කේ වෙන කාටද? මම කේලාම් කියන්නේ නුඹට තියෙන වෛරය නිසා නොවෙයි. අනුකම්පාව හන්දා. නුඹ නරක කොල්ලෙක් නොවෙයි. නමුත්, නුඹේ ඔළුගෙඩිය ඇතුළේ යකා නටනවා. නුඹ හොරකම් කළානම්, ගෑනුන් හොයා ගෙන ගියා නම්, වොඩ්කා බිව්වා නම් මම ඒ ගැන කාටවත්

කියන්නෙ නැහැ. නමුත්= නුඹේ එය අදහස් උදහස් ගැන මම හාම්පුතාට හැමදාම කියන බව දැනගනින්!"

"මීට පස්සේ ඕසිප් සමඟ මම කතා කරන්නෙ නැහැ..."

ඔහු නිහඬව ඔහුගේ අත්ලෙහි බැඳී ඇති මැලියම් නිය පොතුවලින් ඉවත් කරමින් සිට, අනතුරුව මා දෙස සුරතල් නෙත්වලින් බලා කතා කළේය.

"ඒ බොරු, නුඹ ආයෙමත් කතා කරාවි. නුඹ කතා කරන්නේ කා සමඟද? වෙන කිසිවෙක් නැහැ...."

පවිත්‍ර, නිසි ලෙස ඇඳ ගෙන සිටි, ඕසිප් හිටි හැටියේම නැවේ වැඩ කළ ගිනි උඳුන් කරු හැම දෙයක් කෙරෙහිම මන්දෝත්සාහි ලෙස බලන යාකොව්ට සමාන බව මට වැටහිණි.

සමහර විට ඕසිප් ඉකෝන චිත්‍ර තක්සේරුකරු ප්‍යොතර් වසීලෙවිච්ටත්, තවත් සමහර විටෙක අස්රියකරු ප්‍යොතර්ටත් සමාන අතර, වෙනත් විටෙකදී ඔහු මගේ සීයාටත් සමාන බවක් හැඟෙයි. කෙසේවතුදු ඔහු හා අන් සියලු මහල්ලන් අතර සමානතාවක් ඇති බැව් පෙනේ. මොවුහු හැම දෙනෙක්ම මවිත වන තරමට සිත් ඇද ගන්නාසුලු මහල්ලෝය. එහෙත්, ඔවුන් ඇසුරු කිරීම ඉතා වෙහෙස ගෙනදෙන ජුගුප්සාජනක දෙයක් බව මම හඟින්නට වීමි. ඔවුන් අධ්‍යාත්මයට කා වදින සැටියෙකි. ඔවුන්ගේ බුද්ධිමත් කතා හදවත වසාලන්නේ මලකඩ සැට්ටයෙකිනි. ඕසිප් කරුණාවන්තද? නැත. ඔහු නපුරුද? නැත. ඔහු බුද්ධිමත් බව පමණක් මම පැහැදිලි ලෙස දැනගතිමි. එහි නම්‍යතාව නිසා මා මවිතයට පත් කර එම බුද්ධිය මා මරා දැම්මේය. එහෙත්, අවසානයේදී මට හැඟී ගියේ ඔහු මට සෑම අතින්ම සතුරු බවකි.

මගේ හදවතෙහි නපුරු අදහස් පහළ විය.

සුරතල් කතා සහ මඳ සිනා නොතකා මිනිස්සු එකිනෙකාට පිට අය වෙති. ඔව්, සත්තකින්ම සියලුම මිනිස්සු මිහිපිට පිටත්තර පුද්ගලයෝය. මහ පොළොවට දැඩි ලෙස ආදරයෙන් බැඳී සිටින එකකු වත් නැත. ජීවත්වීමට ආසා කරන්නේත්, හැම දෙයටම ආදරය කරන්නේත් මගේ ආච්චි පමණකි. ආච්චි සහ අනර්ඝ මර්ගෝ රැජින පමණකි.

සමහරදාට මේ අදහස් සහ මෙයට සමාන අදහස් කළු වලා මෙන් මා ඉදිරියේ නැඟී සිට ජීවත්වීමට අපහසු සහ අසීරුතා ඇති කළේය. වෙනත් විදිහකට ජීවත් වන්නේ කොහොමද? යන්නේ කොහිද? ඕසිප් හැරුණු විට කතා කිරීමට පවා වෙනත් කෙනෙකු නැත. එනිසා වඩාත් වැඩියෙන් නිතර මම ඔහු සමඟ කතා කළෙමි.

"කොට්ටෝරුවා මුරණ්ඩු වුණාට භයානක නැහැ. ඌට කිසිවෙක් බය නැහැ. මගේ මුළු සිතින් මම නුඹට උපදෙසක් දෙන්නම්. නුඹ පූජකාරාමයකට ගිහිල්ලා වයස සම්පූර්ණ වනතුරු එහි නැවතී සිටපන්. බැතිමතුන්ව අස්වසාලීමට නුඹට හොඳට පුළුවනි. නුඹේ හිතට සැනසීමක්, ඒ වගේම පූජකයන්ට ලාබ ලැබේවි. මම නුඹට කියන්නේ මුළු හිතින්. ලෞකික කටයුතුවල යෙදෙන්න නුඹට පුළුවන්කමක් නැතුවා වගෙයි..."

මගේ උණුසුම් දෙඩවීමට ඉමහත් වුවමනාවෙකින් සවන් දුන් ඕසිප් යමක් පැහැදිලි කර ගැනීමේ අටියෙන් ප්‍රති ප්‍රශ්න අසා ශාන්ත ලෙස කිව්වේය.

පූජකාරාමයකට ඇතුළු වීමට මට අභිලාෂයක් නොවීය. කරුණු පටලවාගෙන උරචක්‍ර මාලාවක් වැනි කවයක මා කරකැවෙන බව මට දැනිණි. පාළුව මුසු කාන්සිය වැඩිණි. ජීවිතය සරත් සමයේ බැද්දකට සමාන විය. බිම්මල් තවත් නැත. කොළ, මල්, ගෙඩි ආදිය නැති නග්න පුහු බැද්දේ කළ හැකි කිසිවක් නොමැති අතර, එම බැද්ද සම්පූර්ණයෙන්ම මා දන්නා සැටියෙකි.

මම වොඩ්කා පානය නොකළෙමි. කෙල්ලන් සමඟ හාදකම් නොපැවැත්වීමි. ආත්මය පණ ගැන්වීමේ මෙම ක්‍රම දෙක වෙනුවට පොත් කියැවීම ආදේශ කළෙමි. එහෙත්, පොත් කියවන තරමට පුහුලෙසත්, අනවශ්‍ය ලෙස ජීවත්වීම අපහසු විය. ජීවමාන මිනිසුන් මට පෙනුණේ එවැනි පුහු සහ අනවශ්‍ය පුද්ගලයන් ලෙසිනි.

මට අවුරුදු පහළොවක් සම්පූර්ණ වූයේ මේ නොබෝදාය. එහෙත්, සමහර විට මහල්ලකු ලෙස මම හඟින්නට වීමි. මා අත්දුටු දේ සහ කියැවූ දේ නිසාත්, නොසන්සුන් ලෙස කල්පනා කළ දේ නිසාත් මගේ අභ්‍යන්තරය ඉදිමී, බර වැඩි වූවාක් මෙනි. මගේ

අභ්‍යන්තරය ඇඳිරි ගබඩා කාමරයකට සමාන විය. එහි නොයෙක් දේ එහෙන් මෙහෙන් පුරවා ඇත. මෙහි ඇති දේ නිසි ලෙස සොයා බලා පිරික්සීමට ශක්තියක් හෝ හැකියාවක් හෝ මට නොවීය.

බරපතළ හා අසීරු දේ විශාල වුවද, ඒවා ශක්තිමත් ලෙස පදනම් වී නොතිබුණු අතර, ඒවා නිසා මා සෙලවී වැනෙන්නට වූයේ, ජලය හොඳින් රැඳී නොසිටින බඳුනක් මෙනි.

ක්‍රෑරකම්, රුධිරය සහ කලහ කිරීම පමණක් නොව වාචික ලෙස මිනිහකු අවඥාවට ලක් කිරීමේදී පවා අවාසනාවන්ත, රෝගීමය, දුක්ගැනවිලි මම පිළිකුල් සහගත ලෙස ප්‍රතික්ෂේප කළෙමි. එය මා තුළ චෙන්ද්‍රියමය ජුගුප්සාවක් ඇති කළේය. එය යම් කිසි උණුසුම් රහිත පිස්සුවකට පරිවර්තනය විය. මා ද මෘගයකු ලෙස පොරකා ගත් අතර, ඉනික්බිතිව මට දැනුණේ වේදනා ගෙන දෙන ලජ්ජාවකි.

වධ දෙන මිනිහකුට පහර දීමට මට සමහර දාට ඇති වූයේ ඉමහත් ආවේගයකි. මා කොතරම් අන්ධ ලෙස ගුටි කෙළ ගැනීමට ඉදිරිපත් වූයේදයත්, දුබලත්වය නිසා උපන් වලිප්පුව වැනි ඒ හැඟීම ගැන දැන් සිතෙන විට පවා මට ලජ්ජාවක් සහ උකටලී ගතියක් ඇති වේ.

මා තුළ පුද්ගලයන් දෙදෙනෙකි. එකෙක් නීචකම් හා කුහකකම් බොහෝ දැනගත් නිසා තරමක් අධෛර්ය වූවෙකි. එදිනෙදා ඇතිවන බියජනක දේ නිසා පෑගුණු හැඟීමක් ඇතිව, ජීවිතය හා මිනිසුන් කෙරෙහි අවිශ්වාසයෙන් හා සැක කටයුතු ලෙස බලමින් හැම දෙයක් කෙරෙහිත්, තමා කෙරෙහිත් මන්දෝත්සාහී දුක් ගැනවිලි සහිත ආකල්පයක් දක්වයි. ඔහු ජනයා රහිත, පොත් සහිත නිසල හුදෙකලා ජීවිතයක් බලාපොරොත්තු වෙයි. පූජකාරාමය ගැනත්, කැලෑ මුරකරුවකු ලෙසත්, දුම්රිය මුර කපොල්ලකත්, පර්සියාවේත්, නැතිනම් නගරයෙන් ඈත පෙදෙසක හුදෙකලා මුරකරුවකු ලෙසත් වැඩ කිරීමට කැමැත්තක් දක්වයි. මිනිසුන් අඩුවූ තරමට, ඔවුන්ගෙන් ඈත් වූ තරමට යහපත්ය.

අනිකා අවංක සහ බුද්ධිමත් පොත් කියැවීම නිසා ලැබූ ශුද්ධ වූ අධ්‍යාත්මයක් සහිතව, එදිනෙදා බිය ජනක දේ මැඩ ජයගන්නා බලය නිරීක්ෂණය කරමින්, එම බලය කොතරම් ලෙහෙසියකින් ඔහුගේ හිස ගලවා දමතිද, කිලිටි අවියකින් හදවත පොඩිකරතියිද යන්න හඟින්නට විය. ඔහු දත්මිටි කමින්, දෑත් මිට මොළවා ගනිමින් නිතර වාද විවාද කිරීමට සහ සටන් කිරීමට සූදානම්ය. ඔහු ප්‍රංශ නව කතාවල එන වීර ධීර සෙනෙවියකු මෙන් කොපුවෙන් අසිපත ඇදගෙන නිතර සටනට සූදානමින් සිටීමට ආසා කළේය.

මාලයා පක්රොව්ස්කයා වීදියේ එක් ගණිකා නිවාසයෙක, ගෙවත්ත අතුගාන මිනිහෙක් ඒ කාලයේ සිටම මගේ ජන්ම හතුරකු බවට පත්වී සිටියේය. එක් උදෑසනක සල්පිලට යමින් සිටි මම ඔහු හඳුනා ගතිමි. ගණිකා නිවස අසල නවතා තිබුණු රියෙකින් ඔහු සිහි නැතිවන තරමට මත්පැන් බී සිටි ගැහැනියක පිටතට අදිමින් සිටියේය. ඇගේ කකුල්වල මේස් ගැල වී යන පරිදි ඔහු ඇය එළියට ඇද්දේ, ඇගේ ඉඟටිය දක්වා නග්න බවට පත් කරමින් ලජ්ජා විරහිත ලෙසිනි. ඔහු කෑගසමින්, සිනාසෙමින් ඇගේ ඇඟට කෙළගැසීය. වෙරි වී සිටි ගැහැනිය රියෙන් පැමිණියේ රිය ගැස්සෙන තාලයට නැටවෙමිනි. ඇගේ ඇඳුම් සියල්ල පොඩිවෙලාය. දෙනෙත් වැසී ඇති අතර, කට ඇරී ඇත. විසන්ධි වූ සැටියක් පෙන්වන ඇගේ මෘදු දෑත් මත ඇගේ හිස වැටී ඇත. ඇගේ නිල්වන් මුහුණ සහිත හිස අස්රියේ ඇන්ද මත උඩුබැලි අතට හැරවී තිබිණි. ගෙවත්ත අතු ගාන මිනිහා විසින් අදිනු ලැබූ මේ ගැහැනිය පදික වේදිකාවට ඇද වැටුණේ, එහි වූ ගල් ගෙඩියක වැදී ඇගේ හිස තුවාල කර ගනිමිනි.

රියකරුවා අශ්වයාට කස පහරක් දෙත්ම පිටතට ඇදිණි. ගෙවත්ත අතුගාන්නා ඇගේ පස්සා පැත්ත පොළොවේ වද්දමින් ඇගේ දෙපාවලින් ඇය ඇදගෙන ගියේ මළ සිරුරක් ඇදගෙන යන විටෙක මෙනි. මේ දර්ශනය දුටු මා වියරු වූයෙන්, ඔහු දෙසට දිව යන විට මා අත තිබුණ මට්ටම බලන උපකරණය බිම වැටීම නිසා අතුගාන මිනිහාත් මාත් විශාල අනතුරකින් බේරිණි.

වේගයෙන්ම දිව ආ මා අතුගාන්නාට පහරක් ගසා ඔහු බිම පෙරළා දමා ගණිකා නිවාසයේ සීනුව හැඬවීමි. තිරිසනුන්ට සමාන මිනිස්සු කීපදෙනෙක් දිව ආහ. ඔවුනට කිසිදු විස්තරයක් ඉදිරිපත් කළ නොහැකිවූයෙන්, මම බිම වැටුණු උපකරණය අහුලා ගෙන යන්නට ගියෙමි.

වැට අසලදී රියකරුට ළංවීමට මට හැකි විය. ඔහු රිය පදවන ආසනයේ සිට මා දෙස බලමින්, මගේ ක්‍රියාව අනුමත කරමින් කතා කළේය.

"නුඹ ඌව බිම පෙරළුවේ බොහොම දක්ෂ විදිහටයි."

ගැහැනියකට මිලේච්ඡ ලෙස සලකන ගෙවත්ත අමදින්නාට ඉඩ දී නිකම් බලා සිටියේ මන්දැයි මම ඔහුගෙන් කෝපයෙන් විමැසීමි. ඔහු මට පිළිතුරු දුන්නේ සන්සුන් ලෙසින් සහ පිළිකුල් සහගත ලෙසිනි.

"මට ඇති රුදාවක් නැහැ! මහත්තුරු මට ගතමනාව ගෙව්වා. ඒකිව මගේ රියට නංවන විට. කවුරුන් කාට ගැහැව්වත් මට ඇති කාරියක් නැහැ."

"ඒ ගෑනිව මරා දැම්මා නම්?"

"අපොයි ඔව්. ඒ වගේ ගෑනියකුව මරා දැමීම ලෙහෙසි නැහැ." යැයි රියකරුවා කිව්වේ බේබදු ගැහැනුන් මරා දැමීමට කීපවරක්ම උත්සාහ කළ එකකු මෙනි.

මම ඒ ගෙවත්ත අමදින්නා එදා සිට හැමදාම උදෑසන හමුවීමි. මා එම වීදිය ඔස්සේ ගමන් කරන විට, එක්කෝ ඔහු ගෙවත්ත අසල පාර අතුගායි, නැතිනම් ඉස්තෝප්පු පඩිය මත වාඩිවී සිටී. හේ මා එනතුරු බලා සිටියේය. මා ඔහු වෙතට යත්ම, ඔහු නැඟිට දෑතේ කබාය ඉහළට නවා ගනිමින් මට අනතුරු අඟවයි.

"හිටපිය, මම තොගේ ඇට කටු කඩන්නම්."

ගෙවත්ත අමදින්නාගේ වයස අවුරුදු හතළිහකටත් වඩා වැඩිය. ඔහුගේ බඩගෙඩිය ගැබිනි මාතාවක් සිහියට නංවාලයි. ඔහු සරදම් ලෙස සිනා පාමින් මා දෙස බැලුවේ රැස් විහිදුවන ඇස්වලිනි. ඔහුගේ දෙනෙත්වල කරුණාවක් සහ ප්‍රීතියක් දකින මට අරුම පුදුම හැඟීමක් ඇති විය. ඔහු පහර දෙන සැටි නොදත්තෙකි. එපමණක් නොව, ඔහුගේ දෑත් මගේ අත්වලට වඩා දිගින් අඩුය. දෙතුන් වරක් පොර කා ගැනීමෙන් ඉක්බිතිව ඔහු මට

යටවෙයි. විඩාපත් වන ඔහු බිත්තියට පිට දී හේත්තු වී මවිතයෙන් කෙඳිරි ගායි.

"ඉතින් ඔය ඇති. නවත්වාපන්!"

මේ පොර කා ගැනීම් මට එපා වූයෙන් මම දවසක් දා ඔහුට මෙසේ පැවසීමි:

"ඒයි මෝඩයා, නුඹ මේ වැඩේ අතහැරලා දාපන්!"

"නුඹගේ බලාපොරොත්තුව මොකක්ද?" ඔහු ප්‍රශ්න කළේ දොස් පවරන අටියෙනි.

අර ගැහැනියට නීච ලෙස පහර දුන්නේ මන්දැයි මම ඔහුගෙන් ඇසුවෙමි.

"ඉතින් නුඹට මොකද? නුඹට ඇය නිසා කනගාටුද?"

"සත්තකින්ම කනගාටුයි."

ඔහු නිහඬව දෙතොල පිසදමා ගෙන මෙසේ ඇසීය:

"නුඹ බළලුන්ටත් අනුකම්පා කරනවද?"

"ඔව්. අනුකම්පා කරනවා."

"නුඹ මෝඩයෙක්. වංචාකාරයෙක්. හිටපිය මම නුඹට හොඳ වැඩක් පෙන්වන්නම්...." යැයි ඔහු එවිට මට කිව්වේය.

සල්පිල දක්වා වැටී ඇති ඉතාම කෙටි මාර්ගය වූ එම වීදිය ඔස්සේ නොගොස් සිටීමට මට නොහැකි විය. ඒ මිනිහා මුණ නො ගැසෙනු වස්, වඩාත් පාන්දරින් නැඟිට මම එම වීදිය ඔස්සේ ගමන් කළෙමි. එසේ වුවද, දවස් කීපයකට පසු ඔහු මට හමුවිය. ඔහු ගණිකා නිවාසයේ පඩියක් මත වාඩි වී අළුවන් බළලකු අතගාමින් සිටියේය. මා ඔහුට පියවර තුනකින් ළං වත්ම, ඔහු බළලාගේ පසු පස ගාත්වලින් ඔසවා අසල තිබුණු ගල් කණුවක කොතරම් තදින් ගැසුවේදයත්, උගේ ඔළුව පැළී නික්මුණු උණුසුම් ලේ ධාරා මගේ ඇඟේ තැවරිණි. අනතුරුව බළල් කුණ මගේ දෙපා ළඟට වීසි කොට ඔහු ගේට්ටුව අසලින් සිටගත්තේ, මගෙන් මෙසේ අසමිනි.

"ඉතින් මොකද?"

මෙතැනදී මා කුමක් කළ යුතුද? අපි බලු පැටවුන් දෙදෙනකු සේ ගෙමිදුලේ පොර කා ගතිමු. අනතුරුව මම ගෙවැට අසල වාඩිවී ඉතා දැඩි කෝපය මුසු පාළු ගතිය නිසා පිස්සු වැටී කෑ ගැසිම හෝ සුසුම්ලෑම්

හෝ වළක්වාලනු වස් දෙතොල් තදින් සපා ගත්තෙමි. දැනුදු මා එය සිහි කරන්නේ වේදනාකාරී පිළිකුලෙන් වෙවුලමිනි. මා උම්මත්තකයකු නොවූයේ මන්ද? කිසිවකු මරා නොදැමුවේ මන්ද?

මේ නීච දෙය ගැන මා ඔබට කියන්නේ මන්ද? හිතවත් පාඨකය මෙය අතීතයේ දෙයක් පමණක් නොවන අතර, තවමත් එය ගෙවී නොගිය බැවිනි. හිතින් මවා ගත් බියජනක දේවලට ඔබ කැමැතිය. ගොතා කියන ලස්සන බියජනක කතාවලට ඔබ කැමැතිය. හිතින් මවා ගත් බියජනක කතා ඔබගේ සිත කලඹාලන්නේ ප්‍රීතියක් ඇති කරමිනි. එහෙත් මම සැබෑ, යථාර්ථවාදී ත්‍රාසයන්, එදිනෙදා හටගන්නා බියජනක දේ දනිමි. එබැවින්, ඔබේ සිත ජුගුප්සාජනක ලෙස නොසන්සුන් කරවීමට මට ඇත්තේ තර්ක නොකළැකි අයිතියකි. ඔබ ජීවත් වන්නේ කෙසේද, කිනම් දේ සමඟද යන්න ගැන කල්පනා කිරීමට ඔබව සලස්වාලමිනි.

අප ජීවත්වන්නේ නීච සහ ජඩ ජීවිතයකිනි. එය ප්‍රතික්ෂේප කළ නෙහැකිය.

මා මිනිසුන්ට බොහෝ ආදරය කළ අතර, කිසිවකුට වධ හිංසා කිරීමට කැමැති නැත. එසේවතුදු අනුරාගික හැඟීම්වලින් යුක්ත වීම සුදුසු නැත. බියජනක සත්‍යය ලස්සන බොරු නමැති වෛවර්ණ වචනවලින් සැඟවීම යුතු නැත. අප ජීවිතයට වඩාත් ළංවිය යුතුය. වඩාත් සමීප විය යුතුය. අපේ සිත්වලත්, මොළයේත්, ඇති සියලු හොඳ දෑ සහ මානව හිතවාදී ගුණය ජීවිතයට එක් කළ යුතුය.

ගැහැනිය කෙරෙහි දක්වන ආකල්පය මගේ අති විශේෂ කෝපයට හේතු විය. නවකතා කියවා එයින් ලැබූ ආභාසය නිසා ජීවිතයේ ඉතා හොඳ සහ වැදගත් ලෙස ගැහැනිය ලෙස මම සැලකුවෙමි. මගේ ආච්චිත්, දේවමෑණියන් සහ බුද්ධිමත් වසිලීසා ගැන ඇය කී කතාත්, අවාසනාවත් නතාලියා (රෙදි අපුල්ලන්නිය) ත්, අල්පමය ප්‍රීතියෙකින් සහ අල්පමය ආලයකින් යුත් මේ ජීවිතය අලංකාර කරන ජීවන මාතාවන්ගේ, මහිලාවන්ගේ බැලීම් සහ මදහසත් මගේ හැඟීම් සනාථ කළේය.

තුර්ගේනිව්ගේ නිර්මාණ කෘති කාන්තාවගේ කීර්තිය අරබයා ගීත ගැයීය. කාන්තාවන් ගැන මා දත් සියලු යහපත් දේ මගේ සිතින් මැවුණු මර්ගෝ රැජිනගේ රූපය අලංකාර කළේය. මට මෙවැනි හැඟීමක් ඇති කර ගැනීමට විශාල සේවයක් කළේ හෙයිනේ සහ තුර්ගේනිව්ය.

සල්පිලේ සහ හවස ගෙදර යන ගමන් මම බළකොටුවේ ප්‍රාකාර අසල වූ කන්දෙහි නවතිමි. වොල්ගා නදියට එහා හිරු බැස යන සැටිත්, එය රතුවන් අග්නිමය ගංගා අහසේ මවාලන සැටිත්, එයින් මගේ ආදරණීය භෞමික නදී තොමෝ දම්පාටට හුරු වී අනතුරුව නිල් පාටට හැරෙන සැටිත් එහි සිට මම නරඹමි. එවන් මොහොතකදී මුළු මහත් පෘථිවියම මට දැනෙන්නේ හිරකරුවන් රැගත් විශාල පාරුවක් මෙනි. අදිසි කඹයකින් නැවක් විසින් කුසීත ලෙස ඇදගෙන යනු ලබන විශාල ඌරකුට එය සමානය.

එහෙත්, පොත්වලින් මා දැනගත් මහා පොළොවේ ශ්‍රේෂ්ඨත්වය ගැනත්, නගර ගැනත්, වෙනත් විදිහකට මිනිසුන් ජීවත්වන පිටරටවල් ගැනත් මම නිතර සිතන්නට වීමි. මා වටේ ඉතා සෙමින් ඒකතානමය ලෙස පවතින ජීවිතයට වඩා පවිත්‍ර ලෙසත්, දයාබර ලෙසත්, වඩාත් අඩු අසීරුතා සහිතවත් ජීවිතය පොත්වලින් පෙන්වා දීමට විදේශීය ගත්කරුවෝ ඉදිරිපත් වූහ. මේ නිසා මසිතෙහි වූ අවදානම් සහිත හැඟීම සන්සුන් විය. වෙනත් ජීවිතයක හැකියාව පිළිබඳ මුරණ්ඩු සහගත සිහිනයක් ඒ නිසා මැවිණි.

මට පුළුල් පැහැදිලි මාර්ගය පෙන්වීමෙහි සමත්, සරල, බුද්ධිමත් මිනිහකු හමුවෙතියි මට නිතර සිතිණි.

බළකොටු ප්‍රාකාරය අසල වූ බංකුවක මා වාඩිවී සිටින විටෙක බලාපොරොත්තු රහිත ලෙස මට යාකොව් මාමා හමුවිය. ඔහු මා වෙත පැමිණි සැටි මා නොදත් අතර, එකවර ඔහු හඳුනා ගැනීමට මම අපොහොසත් වීමි. අවුරුදු කීපයක් තිස්සේ අප එකම නගරයක ජීවත් වුණද, හමුවූයේ කලාතුරකිනි. අහම්බෙන් සහ යම්තම්නි.

"මදෑ නුඹ උස ගිහිල්ලා තියෙන තරම" ඔහු යම්තම්න්

මා තල්ලු කරමින් විහිළුවට මෙන් කිව්වේය. අපි එකිනෙකා බොහෝ කලක් තිස්සේ හඳුනන, එනමුදු, පිට අය මෙන් කතා කළෙමු.

මේ කාලය තුළ දී යාකොව් මාමා නැත්තටම නැතිවූ බවත්, අත තිබුණු හැම දෙයක්ම නාස්ති කළ බවත්, ආච්චිගේ කතාවලින් මම දැන සිටියෙමි. ඔහු හිරගෙදර සුළු මුලාදෑනියකුගේ සහකරුවකු ලෙස වැඩ කළ නමුදු, එයත් අවාසනාවන්ත ලෙස නිමාවට පත්වූ සැටිත් අසන්නට ලැබිණි. මුලාදෑනියා අසනීප වූයෙන්, සිරකරුවන් සඳහා විශාල සාදයන් යාකොව් මාමා සිය නිවසෙහි සංවිධානය කරන්නට විය. මේ ගැන ආරංචි වූ නිසා ඔහු රාත්‍රී කාලයේ දී සිරකරුවන්ට නගරයෙහි 'ඇවිදීමට' නිදහස දුන්හයි යන චෝදනාව ඔහුට විරුද්ධව ඉදිරිපත් කොට ඔහුට නඩු පැවැරීය. සිරකරුවන්ගෙන් එකකුවත් පැන නොගිය නමුදු, එකෙක් අන්නවියකුගේ ගෙල මිරිකන විට ඔහු අල්ලා ගත්තේය. නඩු පැවරීම සඳහා කරුණු එකතු කිරීම බොහෝ කලක් තිස්සේ දිග් ගැස්සුණද සිරකරුවෝත්, මුලාදෑනිවරුත් සද්ගුණවත් යාකොව් මාමා ආරක්ෂා කළෝ, එම නඩුවෙන් ඔහු බේරාගැනීමට සමත් වූහ. ඔහුට රැකියාවක් නැති වූයෙන්, ඔහුගේ පුතාගේ ආදායමෙන් ඔහු යැපෙන්නට විය. එවකට දේවස්ථානයේ සුප්‍රසිද්ධ රැකවිෂ්නිකොව්ගේ ගායක කණ්ඩායමේ ඔහුගේ පුතා ගායකයෙකුව සිටියේය. ඔහු පුතා ගැන විස්තර කළේ අපූරු තාලයකටය.

"මගේ පුතා බොහොම බැරෑරුම්, වැදගත් කෙනෙක් වෙලා. දැන් එයා ගායක කණ්ඩායමේ ඒක පුද්ගල ගායකයෙක්. වෙලාවට තේ හදලා දුන්නේ නැතිනම්, වෙලාවට රෙදි ටික මැදලා දුන්නේ නැතිනම් එයාට බොහොම කේන්ති යනවා. එයා දැන් බොහොම පිරිසිදුයි...."

යාකොව් මාමා බොහෝ මහලු වී, කිලිටි, වියළි, දුබල මිනිහකු බවට පත්වී සිටී. ඔහුගේ බොකුටු හිසකේ බොහෝ දුරට හීන වී තිබිණි. දෙකන් ඉදිරියට නෙරා ඇති අතර, ඔහුගේ නෙත්වල සුදු ඉංගිරියාවත්, රැවුළු රහිත සේදවන් හමක් ඇති දෙකොපුල්වලත් රත් පැහැති ලේ

නහර දක්නට තිබිණි. ඔහු කතා කළේ විහිළු කරන්නාක් මෙන් වුවද, ඔහුගේ කට තුළ යමක් ඇති නිසා ඔහුගේ කතාවට බාධා විය. එසේ වුවද, ඔහුගේ දත් දෙපෙළ ප්‍රකෘතිව තිබිණි.

ප්‍රීතිමත් ජීවිතයක් ගත කිරීමෙහි සමත්, බොහෝ දේ දුටු එමෙන්ම, බොහෝ දේ දැනගත යුතු මිනිහකු සමඟ කතාබහ කිරීමේ හැකියාවක් ලැබීම ගැන මම සතුටු වීමි. ඔහුගේ නිර්භය විහිළු ගීත මට මතක් විය. සීයා ඔහු ගැන නිතර කී දේ මගේ දෙකන්වල රැව් දිණි.

"සින්දු කියන්න නම් ගුණවත් දාවිත් රජ්ජුරුවෝ වගෙයි, හැබැයි වැඩට නම් අබ්සලොම් නපුරා වගෙයි."

අපට ඉදිරියෙන් ඇති මහා මාර්ගය දිගේ වැදගත් මිනිස්සු ගමන් ගත්හ. මහත කාන්තාවෝද, නිලධාරීහුද ඔවුන් අතර වූහ. යාකොව් මාමා හැඳ සිටියේ සරත් සමයට ඔබින ගෙවීගිය කබායකි. ඔහුගේ හිස ලා ඇති තොප්පිය පොඩිවෙලාය. සපත්තුවල කුණු තැවරිලාය. ඔහුගේ ඇඳුම් නිසා ඔහු ලජ්ජාවන බවක් පෙන්වමින් ඔහු බංකුවට ඇලී සිටින විටෙක මෙන් දර්ශනයක් මවා පෑවේය. අපි පොචායින්ස්කි මාකඳුර අසල කඩයකට ගොස් ජනේලය අසල වූ මේසයක වාඩි වීමු.

"මාමා ඒ කාලේ කියාපු සිංදු මතකදැ" යි මම ඇසීමි.

හිඟන්නෙක් දැම්මා කලිසම වේළෙන්ට,
අනිකා සමත් විය, එය සොරකම් කරන්නට.....

මා එය කියත්ම, ප්‍රථම වරට එහි ඇති උපහාසාත්මක අදහස මට වැටහිණි. ප්‍රීතිමත් මාමා නපුරු මෙන්ම බුද්ධිමත් බවද මට සිතිණි.

එහෙත්, ඔහු වොඩ්කා බෝතලයකින් වීදුරුවට ටිකක් වක්කරගෙන කල්පනාකාරී ලෙස කතා කළේය.

"ඔව් මා ජීවත්වුණා, ප්‍රීතිමත් වුණා, නමුත්, එය මදියි! ඒ ගීත මගේ නොවෙයි. ඒවා ප්‍රබන්ධ කළේ පූජකාරාමයෙක ගුරුවරයෙක්. එයා මළා. එයාගේ නම මොකක්ද? දැන් මට මතක නැහැ. එයා මගේ හොඳ මිතුරෙක්. බීලාම ඔහු මළා. බීලා වෙරිවෙලා හිම කාලෙ දී හීතලට අහුවෙලා මළා. බීලාම මැරිච්ච මිනිසුන් කොච්චර මම දැකලා

තියෙනවද. ගණන් කරන්නත් අමාරුයි! නුඹ බොන්නෙ නැත්ද? බොන්ට එපා. තව කලකට අතපසු කරපන්! සීයාව නිතර පාහේ දකිනවද? මහල්ලා දුක් වෙනවා. එයාට පිස්සු හැදීගෙන එන හැඩයි."

වොඩ්කා පානයෙන් ඉක්බිතිව ඔහුට නව පණක් ලැබිණි. ඔහු හරිබරි ගැසුණු අතර, ඔහුගේ බාහිර පෙනුමද තරුණ විය. ඔහුගේ කට හඬද ප්‍රාණවත් විය.

සිරකරුවන් පිළිබඳ සිද්ධිය මම ඔහුගෙන් විමැසීමි.

"නුඹටත් අහන්න ලැබුණද?" ඔහු වටපිට බලමින් ප්‍රශ්න කළේය. පහත් කට හඬකින් ඔහු කතා කරන්න විය.

"ඉතින් උන් හිරකරුවන් වුණාට මොකද? මම ඔවුන්ගේ නඩුකාරයා නොවෙයි. ඒ ගොල්ලන් අනික් අය වගේමයි. ඉතින් මම ඔවුන්ට මෙහෙම කිව්වා. සොයුරනි අපි මිත්‍රකමින් ජීවත්වෙමු. අර සින්දුවකින් කියන විදිහට අපි ජොලිපිට ජීවත්වෙමු.

නොවෙයි සතුට අවහිරයක් ඉරණමට!
පාගා දමන්න ඉරණමට නොදෙමු ඉඩ
සිනාසෙමු, එය සතුටකි ජීවිතෙට
නැතිනම් එය තේරුම් නැති වැඩකි මෝඩ!

ඔහු සිනාසෙමින් අගාධයේ ඇති අඳුරු කවුළුව දෙස බැලීය. එහි පතුලේ කඩ පෙළකි.

ඔහු තම විස්තරය දිගටම කරගෙන ගියේ උඩු රැවුළ අතගාමිනි.

"උන් සතුටු වුණා. හිරගෙදර හරිම මුඩුම පාළුවක්. අපි හිරකරුවන්ගේ නම් අඬ ගහලා සටහන් කරලා, ඉන් පස්සෙ මම උන්ව මගේ ගෙදරට අඬගහනවා. වොඩ්කා, කට ගැස්මට කෑම. සමහරදාට මගෙන්. සමහර දාට හිරකරුවන්ගෙන්. ඉතින් අපි රුසියන් මාතාවගේ නමින් ගීත ගයලා නටනවා. මම බොහොම කැමතියි ගයන්න, නටන්න, හිරකාරයෝ බොහොම අපූරු ගායකයෝ, ඉස්තරම් නැට්ටුවෝ. සමහරුන්ගෙ අත පය යදම්වලින් බැඳලා. ඉතින් ඒ වගේ අයට නටන්න බැහැ. මම උන්ගේ යදම් ඉවත් කිරීමට අවසර දීපු බව නම් ඇත්ත තමා. උන්ට ඒ යදම් යකඩ බාස් නැතුව වුණත් ගලවා

දමන්ට පුළුවනි. උන් ඒ තරම් බොහොම දක්ෂ මිනිස්සු. මංකොල්ල කෑමට මම උන්ව නගරයට යැව්වා කියන කතාව නම් අලිබොරු. එය ඔප්පු කරන්න අරුන්ට බැරි වුණා..."

අගාධයේ ඇති පරණ බඩු වෙළෙන්දන්ගේ කඩ වසන්නට පටන් ගෙන ඇති සැටිත්, යකට ඉබ්බන් ගේ හඬ නැගෙන සැටිත්, යකඩ මල කා ඇති පුරුක්වලින් ශබ්ද පිටවන සැටිත්, බොල් හඬක් නංවමින් කිසියම් ලෑලි වගයක් වැටෙන සැටිත් ජනේලය දෙස බලමින්, අසා සිටි ඔහු මා දෙස බලා සතුටින් ඉඟිමරා පහත් හඬින් කතා කරන්නට විය.

"නුඹට ඇත්ත කියන්නම්. එකෙක් රෑ කාලෙදි නගරයට ගිය එක නම් ඇත්ත තමයි. පාදවලට විලංගු දාපු හිරකරුවෙක් නොවෙයි. අපේ නගරයේ නිෂ්නි ගොරොද්වල හොරෙක්. මේ ළඟ පෙළෝර්කාවල උගේ ආදරවන්තිය හිටියා. අන්නවිරාලව මැරීමට තැත් කිරීම අත්වැරැද්දක්. අන්නවිරාලගෙ බෙල්ල මිරිකුවේ එයා පෝසත් වෙළෙන්දෙක් කියලා හිතාගෙනයි. ඔය දේ සිද්ද වුණේ හිම කාලෙදී. හිම කුණාටුව පවතින කාලෙදී. හැම මිනිහම හිම කබා ඇඳුගෙන. ඉතින් එකෙක් අන්නවිරාල අනිකා වෙළෙන්දා කියලා හඳුනා ගන්නේ කොහොමද?"

ඒ කතාව නිසා මා සිනාසෙන විට, ඔහුත් මාත් සමඟ එකතුව සිනාසුණේය.

"දෙවියන්ගේ පිහිටයි. යකාට තමයි ඒක තෝරා ගන්න පුළුවන්."

ඔහු හිටිහැටියේම බලාපොරොත්තු විරහිතව තරමක් කෝපයට පත්වී, කෑම සහිත පිඟාන යම්තමින් තල්ලු කළේය. මුහුණ ඇඹුල් කර ගනිමින් සිගරට් දුමක් ඇද බැරැඩි කට හඬකින් මුමුනන්ට විය.

"උන් එකිනෙකාගෙන් හොරකම් කරනවා. ඊට පස්සෙ එකිනෙකාව අල්ලා ගන්නවා. හිරගෙට දමනවා. සයිබීරියාවට පිටුවහල් කරනවා. ඉතින් මෙතැනට මා මොන හේතුවකටද? උන් ඔක්කොමල්ලා මක බෑ වෙලා ගියත් මට මොකද? මට මගේම අධ්‍යාත්මයක් තියෙනවා."

නැවේ වැඩ කළ මව්ල්වලින් ගහන ගිනි උදුන්කරුවා

මා ඉදිරියේ මැවී පෙනිණි. ඔහු නිතර "මකබෑ වෙලා ගියාදෙන්"යැයි කිව්වේය. ඔහුගේ නමත් යාකොව් විය.

"නුඹ කල්පනා කරන්නේ මොනවා ගැනද?" යි ඔහු මගෙන් ප්‍රශ්න කළේ මුදු හඬෙකිනි.

"හිරකරුවන් නිසා දුකක් ඇති වූයේ නැත්ද?"

"උන්ට ලෙහෙසියෙන්ම අනුකම්පා කරන්න පුළුවනි. සමහර තරුණ හාදයෝ බොහොම අනුකම්පා කටයුතු පුද්ගලයෝ. සමහර දාට ඔවුන් දිහා බලා මම මෙහෙම හිතනවා. මම උන්ගෙ සපත්තු පිහදාන්නවත් වටින්නේ නැහැ. නමුත්, මම උන්ගේ ලොක්කා. උන් බොහොම බුද්ධිමත්. දක්ෂ යක්පැටව්..."

වොඩ්කා සහ අතීතය විසින් ඔහු යහපත් කුප්පාලීමකට හසුවිණි. ජනෙල් පඩිය මත වැළමිටි තබාගෙන එක් අතක ඇඟිලි දෙකක් අතරින් සිගරට් වැටිය අල්ලා ගෙන අතක් වනමින් ඔහු උද්යෝගයෙන් යුතුව කතා කළේය.

"එකැස් කණෙක් හිරගෙයි හිටියා. මිනිහා ඔර්ලෝසු අලුත්වැඩියා කරන්නෙක්. මිනිහා කතා කරන හැටි ඇහුවාම පුදුම හිතෙනවා. හරිම දක්ෂ කතිකයා. මිනිහා ගීත ගයන්නේ සැලළිහිණියකු වගෙයි. එයා හොර සල්ලි අච්චු ගහලා අහුවුණා. ආණ්ඩුවේ භාණ්ඩාගාරයට සල්ලි අච්චු ගහන්න පුළුවන් නම් මට බැරි මොකද? විස්තර කරපල්ලකෝ! ඔහුට ඒ ගැන විස්තරයක් කිරීමට කාටවත් බැහැ. උන්ගේ ලොක්කා වන මටත් බැහැ. අනිකා මොස්කව් නගරයේ සුප්‍රසිද්ධ හොරෙක්. බොහොම නිහඬයි. ජේත්තුකාරයෙක්. බොහොම ආචාරශීලී ලෙස කතා කරනවා. මිනිස්සු හෙම්බත් වන තුරු වැඩ කරනවා. මට එහෙම බැහැ කියලා ඔහු කියනවා. මම එය අත්හදා බලා තියෙනවා. හෙම්බත් වුණාම මෝඩයකු බවට පත් වෙනවා. ඔන්න එතකොට පොඩි අඩියක් ගහනවා. කාඩ් සෙල්ලම් කරලා කොපෙක් කීපයක් පරාද වෙනවා. ගෑනියකු සමඟ නිදාගෙන ඒකිටත් පොඩි සන්තෝසමක් දෙනවා. ඊට පස්සෙ ආයෙමත් බඩගින්න. ආයෙමත් දුප්පත්කම..."

යාකොව් මාමා මේසය ඉදිරියට නැමී කතා කරන්නට විය. ඔහුගේ මුහුණ ජම්බු ගෙඩියක් මෙන් රතු වෙලාය.

ඔහු කොතරම් උද්යෝගයකට පත් වී සිටියේදයත්, ඔහුගේ කුඩා දෙකන් පවා නැටවෙන්නට විය.

"බෑනෝ, සිරකරුවන් මෝඩයි එහෙම නොවෙයි. ඔවුන් නිවැරැදි ලෙස කරුණු තෝරා බේරා ගන්නවා. දැන් ඉතින් ඒ කරදර සියල්ල යකාට ගියාදෙන්. ඔන්න බලාපන් මම ජීවත් වුණේ කොහොමද? හිතනවිට පවා ලජ්ජාවක් ඇති වෙනවා. හැම හොඳ දෙයක්ම බොහොම යටින්, හොරෙන් වගේ තමයි ඇති වුණේ. දුක් දොම්නස නම් පිරෙන්න තිබුණා. ප්‍රීතිය හොරකම් කරලා. තාත්තා බණිනවා. අත තියන්න එපා කියලා. මගෙ බිරිඳ කෑගහනවා අරක කරන්න එපා, මේක කරන්න එපා කියලා. මම රූබලයක් හම්බ කරන්න බෙල්ල කඩා ගන්න වුණත් ඉදිරිපත් වුණා. ඔන්න මගේ ජීවිතය මම ගෙවා දැම්මේ ඔය ආකාරයටයි. සඟවන්නේ මොකටද? මගේම පුතාගේ මෙහෙකරුවා බවට දැන් මා පත්වෙලා. මම ඉතින් බොහොම යටත්ව ඔහුට සේවය කරනවා. ඔහු මාත් සමඟ කතා කරන්නේ රදල හාම්පුතකු හැටියටයි. ඌ මට කෑ ගහනවා. ඌ මට තාත්තා කීවත් එය මට ඇහෙන්නෙ 'මෙහෙකරුවා!' යන වචනය හැටියටයි. මා උපන්නෙත්, මෙතරම් කරදරවලට මූණ පෑවේත්, මගේම පුතාගේ මෙහෙකාරයා හැටියට වැඩ කිරීමටද? මේක මෙහෙම නූනත්, මම ජීවත් වන්නේ, ජීවත් වූයේ කුමටද? මේ ජීවිතයෙන් මා ලබාගත් ප්‍රීතිය කුමක්ද?"

මා ඔහුට සවන් දුන්නේ අවධානයෙන් තොරවය. ඔහුගෙන් පිළිතුරක් බලාපොරොත්තු නොවූවද අකැමැත්තෙන් මම ඔහුට මෙසේ පැවසීමි.

"මාත් දන්නෙ නැහැ. ජීවත් වන්නේ කොහොමද කියලා."

ඔහු නහයෙන් පිඹ සිනාසුණේය.

"ඉතින්... ඒක දන්නෙ කවුද? ජීවත්වන හැටි දැනගත් මිනිසුන් ගැන මම අහලා නැහැ. පුරුද්ද අනුව ඔහේ ජීවත් වෙනවා..."

"ඔහු යළිත් අමනාපයෙන් සහ කෝපයෙන් කතා කරන්නට විය.

"හිරගෙදර හිටියා ඔර්යෝල් නගරයේ මිනිහෙක්. ඒකා ස්ත්‍රී දූෂණය නිසා හිරගෙට වැටිලා. හාමු මහත්තයෙක්. නටන්න උපන් පුතා. මිනිහා වාන්කා ගැන සින්දු කියන්නේ මිනිසුන්ව හිනස්සමින්.

ඇවිදින්නට මිනී පිට්ටනියේ වාන්කා සූරයා,
ලෙහෙසි වැඩකි එය වාන්කා, වීරයා!
අනේ බොල හරවපිය නහය තොගෙ අහකට
මිනී ගඳැති පිටියෙන් ඉවතට....!

"මම සිතන්නේ මේක විහිළුවක් හැටියට නොවෙයි, ඇත්තක් හැටියටයි. මොනවා කළත්, කොහොම කළත් මිනී පිට්ටනියට තමයි අන්තිමට ඇවිත් නවතින්නෙ. ඉතින් ඒ නිසා මට කොහොමත් එකයි. හිරකාරයකු වගේ හෝ හිරකරුවන්ගේ ලොක්කකු හැටියට හෝ ජීවත්වීම...."

ඔහු විඩාපත් විය. වොඩ්කා සියල්ල පානය කොට තනි ඇසකින් බලන පක්ෂියකු සේ හිස් බෝතලය දෙස බැලීය. නිහඬව දුම් වැටියක් අදිමින් ඔහු උඩු රැවුළ දෙසට දුම් ගුළි පිට කළේය.

"කොහොම දැඟලුවත්, මොනවා බලාපොරොත්තු වුණත්, මිනී පෙට්ටියයි, මිනී පිටියයි වළක්වන්න කාටවත් බැහැ." යි ප්‍රයොතර් ගල්වඩුරාල නිතර කිව්වේය. එසේවතුදු ඔහු යාකොව් මාමාට කොහෙත්ම සමාන නොවීය.

ඒ වනවිටත් එවැනි ආප්තපද මා කොතරම් දැන සිටියේද!

මාමාගෙන් වෙනත් දෙයක් විමැසීමට මට සිතක් නොවූ අතර, ඔහුත් සමඟ කතාබහ කිරීම දොම්නසට හේතුවක් විය. ඔහු නිසා මසිතෙහි හට ගත්තේ අනුකම්පාවෙකි. ඔහුගේ අපූරු ගීත, ඔහුගේ ගිටාර් වාදනය, මුදු දොම්නසක් තුළින් ප්‍රීතියක් ඇති කළේය. ප්‍රීතිමත් ට්සිගනොක්ද මට කොහෙත්ම අමතක නොවීය. හැකිළී ඇති යාකොව් මාමාගේ රූපය දෙස බලන මට ඉබේටම මෙන් මෙසේ සිතිණි.

"මම බරැති කුරුසියක් කරේ පටවා ට්සිගනොක් මරා දැමූ සැටි ඔහුට මතකද?"

එසේ වුවද, ඒ ප්‍රශ්නය ඔහුගෙන් ඇසීමට මම ඉදිරිපත් නොවීමි.

අගෝස්තු මාසයේ මීදුමෙන් පිරි පවතින මාකඳුර මගේ නෙතට හසුවිය. එහි සිට කොමඩු සහ ඇපල් සුවඳක් වහනය විය. නගරයට ඇතුළු වන පටු මාර්ගය ඔස්සේ පහත් දැල්විණි. දැන් රිබින්ස්ක් බලා යන නැවත්, ඊළඟට පර්මි වෙත යන නැවත් නළා හඬ නඟනු ඇත.

"දැන් ඉතින් මම යන්නම්!" යැයි මාමා පැවසීය.

තැබෑරුමේ දොර අසලදී ඔහු මගේ අතක් ගෙන සොලවා විහිළු කරන විටෙක මෙන් උවදෙස් දුන්නේය.

"නුඹ උදාසීන වෙන්න එපා. නුඹ නිකම් නහයෙන් අඬනවා වගෙයි. නේද? ඕවා ගණන් ගන්න එපා. නුඹ තවම ළපටියි. ප්‍රධාන දේ මතක තබා ගනින්: "නොවෙයි සතුට අවහිරයක් ඉරණමට, ඉතින් ආයුබෝවන්. මම උස්පෙන්ස්කි පල්ලියට යනවා."

පියකරු මාමා මගෙන් ඉවත්ව ගියේ, ඔහුගේ කතාවලින් මසිත වඩාත් අවුල් කරවමිනි.

මම පිටිය හරහා ගමන් කරමින් නගරය දෙසට පා තැබීමි. එදින චන්ද්‍රයා පූර්ණව පායා ඇති දවසකි. අහසේ විශාල වලා පාවීය. ඒ වලාකුළු මගේ සෙවණැල්ල ඒවායේ විශාල සෙවණැලි විසින් මකා දමන ලදි. මෙලෙස පිටිය හරහා ගමන් කරමින් නගරය මඟ හැර මම වොල්ගා නදියේ ඔත්කොස්[1] වෙත පැමිණියෙමි. දූලි සහිත තණ බිස්ස මත වාඩිවී, නදිය දෙසත්, දෙණි බිම දෙසත් නොසැලී තිබෙන මහ පොළොව දෙසත් බලන්නට වීමි. වොල්ගාව හරහා වලාකුළුවල සෙවණැලි ගියේ ඉතා සෙමිනි. දෙණිබිම් හරහා පාවී යන විට ඒවා වඩාත් පැහැයෙන් වැඩි වූයේ. ඒවා වොල්ගා නදී ජලයෙන් සේදූ විටෙක මෙනි. අවට හැම දෙයක්ම අඩ නින්දේය. හැම තැනම ගොළු බවකි. හැම දෙයක්ම චලනය වූයේ වැඩි කැමැත්තකින් නොවේ. අවශ්‍යතාව නමැති බර නිසායි. ඒවා එලෙස චලනය වූයේ, ජීවිතය කෙරෙහි ඇති උණුසුම් ආදරය නිසා නොවේ.

1 ගඟ බඩ ඉතාම අලංකාර පෙදෙස මෙනමින් හැඳින්විණි - අනුවාදක

මටත්, මා අවට භූමියටත් හොඳ පා පහරක් දීමට මට සිතෙයි. සුන්දර, උද්යෝගිමත්, අවංක වඩාත් හොඳ වෙනත් ජීවිතයක් සඳහා එකිනෙකාට ආලය කරන්නන් උත්සවාකාරී ලෙස නටන පරිදිය. එවිට මාත් ඇතුළු අවට හැම දෙයක්ම ප්‍රීතියෙන් භ්‍රමණය වීමට පටන් ගනු ඇත.

මා යම් කිසිවක් නොකළහොත්, මා විනාශ වෙතියි මට සිතිණි.

සරත් සමයේ ඇඳිරි දවස්වලදී හිරු නොදකිනවා පමණක් නොව, එය තිබෙන බවක් නොහැගෙන විට, ඒ ගැන අමතක වෙයි. මේ නිසා මා කැලෑවේ වල්මත් වුණු වාර අපමණය. මාර්ග සොයාගත නොහැකිව ළතැවෙන මම විඩාපත් වීමි. එවිට මම දත්මිටි කා ගෙන, කැලෑ පඳුරු අස්සෙන් සහ දුගඳ හමන ගොහොරු බිම් මැදින් ගමන් ගන්නෙමි, අවසානයේ නිසි මාර්ගයට වැටීමට සමත් වීමි.

මගේ තීරණයද එසේ විය.

එම වසරේ සරත් සමයේදී මා කසාන් නගරය බලා පිටත්වූයේ, එහිදී ඉගෙන ගැනීමට ඉඩ පහසුවක් ලබාගත හැකිවෙතියි යන ගුප්තමය බලාපොරොත්තුවෙනි.

1914

(අනුවාදය රුසියන් මුල් පිටපතිනි)